323 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 323 - இல. 08
Volume 323 - No. 08

2025 නොවැම්බර් 24වන සඳුදා
2025 நவம்பர் 24, திங்கட்கிழமை
Monday, 24th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ ක්‍රමවේදය [තීරුව 1517]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1518]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1519]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1521-1538]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
සියලු සිසුන් සඳහා සමාන අධ්‍යාපන අවස්ථා සැලසීම [තීරුව 1538]

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සවි කර ඇති නාම පුවරු නීති විරෝධී ලෙස ඉවත් කිරීම:**
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1541]

**ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ප්‍රතිලාභ සහ "එට්කා" ගිවිසුම පිළිබඳ සාකච්ඡා:**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1544]

**"මා පිය රැකවරණ" දීමනාව අත්හිටවූ බවට පළවන මාධ්‍ය වාර්තා:**
නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ ප්‍රකාශය [තීරුව 1554]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [දහහතරවන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 117, 306, 307, 336 (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා); ශීර්ෂ 123, 309 - 311, 332 (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස); ශීර්ෂය 176 (වරාය සහ සිවිල් ගුවන් සේවා)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 1560-1720]

**සිවිල් ගුවන් සේවා පනත:**
නියෝග [තීරුව 1721]

**සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත:**
නියෝග [තීරුව 1721]

**කල්තැබීමේ යෝජනාව:**
වෙරුගල් ප්‍රා.ලේ. කොට්ඨාසයේ ඉඩම් ගැටලු තීරු [1722-1736]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
வாய்மூல விடைக்கான வினாக்கள் ஒழுங்குப் பத்திரத்தில் உள்ளடக்கப்படும் நடைமுறை [ப: 1517]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1518]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1519]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1521-1538]

**தனி அறிவித்தல் மூல வினா:**
சகல மாணவர்களுக்கும் சமமான கற்கை வாய்ப்பளித்தல் [ப: 1538]

**தொல்பொருள் திணைக்களத்தால் நிறுவப்பட்ட பெயர்ப் பலகைகளை சட்டவிரோதமாக அகற்றியமை:**
பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1541]

**இந்திய-இலங்கை சுதந்திர வர்த்தக ஒப்பந்தத்தின் நன்மைகள் மற்றும் ETCA தொடர்பான பேச்சுவார்த்தைகள்:**
வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 1544]

**'மா பிய ரெகவரன' கொடுப்பனவு நிறுத்தம் குறித்த ஊடக அறிக்கைகள்:**
பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று [ப: 1554]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பதினான்காம் நாள்]:**
[தலைப்புக்கள் 117, 306, 307, 336 (போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள்); தலைப்புக்கள் 123, 309-311, 332 (நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு); தலைப்பு 176 (துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள்)] – குழுவில் ஆராயப்பட்டது [ப: 1560-1720]

**குடியியல் வான்செலவுச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1721 ]

**இலங்கை சிவில் விமானப் போக்குவரத்து அதிகாரசபைச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1721 ]

**ஒத்திவைப்புப் பிரேரணை:**
வெருகல் பிரதேச செயலாளர் பிரிவிலுள்ள காணிப் பிரச்சினைகள் [ப: 1722-1736]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Procedure on Placing Questions for Oral Answers in the Order Paper [Col. 1517]

AUDITOR-GENERAL'S REPORT [Col. 1518]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1519]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1521-1538]

QUESTION BY PRIVATE NOTICE:
Assurance of Equal Educational Opportunities for All Students [Col. 1538]

ILLEGAL REMOVAL OF NAME BOARDS PUT UP BY DEPARTMENT OF ARCHAEOLOGY:
Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 1541]

BENEFITS OF INDO-SRI LANKA FREE TRADE AGREEMENT AND NEGOTIATIONS ON ETCA:
Statement by Minister of Trade, Commerce, Food Security and Co-operative Development [Col. 1544]

MEDIA REPORTS ON HALT OF "MAA PIYA REKAWARANA" ALLOWANCE:
Statement by Deputy Minister of Defence [Col. 1554]

APPROPRIATION BILL, 2026 – [Fourteenth Allotted Day]:
Considered in Committee – [Heads 117, 306, 307, 336 (Transport, Highways, Ports and Civil Aviation); Heads 123, 309–311, 332 (Urban Development, Construction and Housing) Head 176 (Ports and Civil Aviation)] [Cols. 1560-1720]

CIVIL AVIATION ACT:
Regulations [Col. 1721]

CIVIL AVIATION AUTHORITY ACT:
Regulations [Col. 1721]

ADJOURNMENT MOTION:
Land Issues in Verugal DS Division [Cols. 1722-1736]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 24වන සඳුදා***
*2025 நவம்பர் 24, திங்கட்கிழமை*
*Monday, 24th November, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ ක්‍රමවේදය
### வாய்மூல விடைக்கான வினாக்கள் ஒழுங்குப் பத்திரத்தில் உள்ளடக்கப்படும் நடைமுறை
### PROCEDURE ON PLACING QUESTIONS FOR ORAL ANSWERS IN THE ORDER PAPER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2025 නොවැම්බර් 21 දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චමින්ද විජේසිරි මහතා විසින් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ දී මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කිරීමට කැමැත්තෙමි.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සම්බන්ධව දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය සකස් කර ඇත්තේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ දී එතෙක් අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය හේතුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වනු ලබන සෑම දිනකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් කිහිප දෙනෙකුට පමණක් එම ප්‍රශ්න ඇසීමේ අවස්ථාව හිමිව තිබීම හේතුවෙන් ප්‍රශ්න ඉදිරිපත් කරනු ලබන අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට සමානව එම ප්‍රශ්න ඇසීමේ අවස්ථාව නොලැබෙන බවට නවවැනි පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසි දෙදෙනෙකු (22) විසින් එවකට ගරු කථානායකතුමා වෙත කරන ලද ලිඛිත අභියාචනයක් 2022.03.16 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ විශේෂ අවධානයට යොමු කරවීම මගිනි.

ඒ අනුව, 2022.03.16 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් මේ වනවිට න්‍යාය පත්‍රයට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් කරනු ලබන ක්‍රමවේදය ඇතුළත් යෝජනාව ඉතා ගැඹුරින් හා දීර්ඝ වශයෙන් අධ්‍යයනය කොට එය ඒකමතිකව අනුමත කර ඇති අතර, එම ක්‍රමවේදය කිසිදු පක්ෂයක් නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයෙකුට වැඩි අවස්ථාවක් සැලසෙන පරිදි සකස් කරන ලද ක්‍රමවේදයක් නොවන බවත්, ඒ සඳහා කිසිදු නිලධාරියෙකුගේ මැදිහත්වීමක් සිදු වී නොමැති බවත් මෙහිලා විශේෂයෙන් අවධාරණය කරමි.

වාචික ප්‍රශ්න සම්බන්ධව දැනට අනුගමනය කරනු ලබන මෙම ක්‍රමවේදයේ සාර්ථකත්වය සැලකිල්ලට ගෙන මන්ත්‍රීවරයන් විසින් ඉදිරිපත් කරනු ලබන "පෞද්ගලික මන්ත්‍රී යෝජනා" න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී මෙම පදනමම යොදා ගන්නා ලෙසට ගරු මන්ත්‍රීවරයන් විසින් කරන ලද ඉල්ලීම සලකා බලා ඒ සඳහා ද මෙම පදනම යොදා ගැනීමට 2025.11.18 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තීරණය කර ඇති බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

ඒ අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චමින්ද විජේසිරි මහතා විසින් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් කිරීමේ දැනට පවතින ක්‍රමවේදය සම්බන්ධයෙන් සිදු කරන ලද ප්‍රකාශය හා එහිදී නිලධාරින් විසින් පක්ෂග්‍රාහීව කටයුතු කොට ඇති බවට කරන ලද ප්‍රකාශය සාවද්‍ය මෙන්ම මුළුමනින්ම පදනම් විරහිත ප්‍රකාශයක් බවද මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXX කොටස සහ නවවැනි කාණ්ඩයේ XVII කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Regulations made by the President under Section 35 read with Sections 6(b), (c) and (j), 16 and 31 of the Public Debt Management Act, No. 33 of 2024 and the proviso to Article 44(3) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, on the recommendation of the Public Debt Coordination Committee and published in Gazette Extraordinary No. 2459/52 of 24th October, 2025.

I move that these Regulations be referred to the Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 8 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2) වගන්තියේ (ඩ) සහ (ණ) ඡේද යටතේ නියෝග; සහ

(ii) 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 වගන්තියේ (ජ) සහ (ඝ) ඡේද සහ 9 වගන්තිය සමඟ කියවිය යුතු 39 වගන්තිය යටතේ නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

සිවිල් ගුවන් සේවා අධිකාරියට තමයි අයිති වෙන්නේ, මත්තල හැරෙන්න කොළඹ, කටුනායක, රත්මලාන, යාපනය, මඩකලපුව Airports තිබෙන ඉඩම් ටික, aerodromes. මේවා Civil Aviation Authority එක දීලා තිබෙනවා, lease එකට airports පවත්වාගෙන යන්න. සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් Airport and Aviation Services (Sri Lanka) (Pvt.) Limited එකට මේවා බැහැර කරනකොට හෙක්ටෙයාරයකට අවුරුද්දකට රුපියල් 50,000ක බද්දක් ගහන්න ඕනෑ කියලා තමයි මේකේ ඉදිරිපත් කර තිබෙන්නේ. මේක පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න ඕනෑ නිසා කාරක සභාවේ අනුමැතිය ලබා දුන්නාට අපි ඔවුන්ට කිව්වා, රජයේ ඉඩම් බැහැර කරනකොට ඒකේ වාණිජ වටිනාකම හොයා ගන්න ඕනෑ කියලා.

ඒ ප්‍රදේශවල සමහර විට පර්චස් එකක් මිලියන එකක් විතර වටිනවා කියලා කියා තිබෙනවා. උදාහරණයක් කිව්වොත්, කටුනායක ප්‍රදේශය. නමුත්, හෙක්ටෙයාර බර ගණනක් -200ක් විතර- දෙන්නේ අවුරුද්දකට රුපියල් 50,000කට. යම් සහනාධාරයකට, නැත්නම් සහන මිලකට Airport and Aviation Services (Sri Lanka) (Pvt.) Limited එකට මේ ඉඩම් දෙනවා නම් ඒකේ වාණිජමය වටිනාකම හොයාගෙන ඒවා බැහැර කිරීම සඳහා යම්කිසි ක්‍රමවේදයක් සොයා ගන්න කියලා තිබෙනවා. මෙතැනට විතරක් නොවෙයි, රජයේ ඉඩම් බැහැර කරන කොට හැමෝටම අදාළව යම් ප්‍රතිපත්තියකට අනුව එය කිරීමට එකඟ විය යුතුයි කියන මතය අපි ඉදිරිපත් කරලා, මුදල් අමාත්‍යාංශයට එය යොමු කළා.

බොහොම ස්තුතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, ඒ කාරණය මතු කළාට. රජයේ ඉඩම් බැහැර කරන කොට සමහර වෙලාවට ඒවායේ වාණිජමය වටිනාකම සැලකිල්ලට ගන්නවා වාගේම ඒ ඉඩම් බැහැර කරන්නේ මොන වාගේ කාරණයකටද, ඒ වාගේම ඒක ආර්ථිකයට මොන වාගේ බලපෑමක් කරනවාද කියන කරුණු ද සැලකිල්ලට ගන්න ඕනෑ, ඒවා ද සැලකිල්ලට ගෙන මේ ප්‍රතිපත්තිය සකස් වෙන්න ඕනෑ කියලා ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා ඔබතුමාට මතක ඇති. ගරු ජනාධිපතිතුමාගේ කථාවේ පැහැදිලිව සඳහන් වුණා, එම කරුණු සැලකිල්ලට ගනිමින් ඉදිරියේදී ඒ ඉඩම් බැහැර කිරීමේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි විවාදයකට නොයා ඉදිමු, ගරු මන්ත්‍රීතුමා.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) වත්තල, එඬේරමුල්ල, සම්පාය මාවත, අංක 564 යන ලිපිනයෙහි පදිංචි ඒ.ඩී. ලීනස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) වත්තල, එඬේරමුල්ල, පල්ලියවත්ත, අංක 431/15 'ඒ' යන ලිපිනයෙහි පදිංචි එම්.ටී.එම්. හුසේන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) රාගම, කැන්දලියද්දපාළුව, අංක 656 යන ලිපිනයෙහි පදිංචි පී.ආර්. සිරියාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) වැබඩ, වැබඩ දකුණ, අංක 327/සී යන ලිපිනයෙහි පදිංචි සමීර කුමාර ගුණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) මීරිගම, වල්බෝතලේ, අංක 102 'ඒ' යන ලිපිනයෙහි පදිංචි ජී.පී. තුසිත ප්‍රමෝද් විජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කොස්ගොඩ, හැගල්ල, අංක 181 යන ලිපිනයෙහි පදිංචි ඒ.එච්.ජී. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1272/2025- (2), ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1348/2025- (1), ගරු උපුල් කිත්සිරි මහතා.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අම්පාර දිස්ත්‍රික්කයේ වගා කළ හැකි පාරම්පරික ඉඩම්: නිදහස් කිරීම
## அம்பாறை மாவட்டத்தில் செய்கை பண்ணக்கூடிய பூர்வீகக் காணிகள்: விடுவித்தல்
## CULTIVABLE ANCESTRAL LANDS IN AMPARA DISTRICT: RELEASE

1396/2025

**3. ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1990 දශකය වන විටත් ගොවිතැන් කටයුතු සිදු කරන ලද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ලද, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළු අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පාරම්පරික ඉඩම් පසුගිය රජය විසින් අදාළ පාර්ශ්ව වෙත නිදහස් කිරීම සඳහා මූලික පියවර ගනු ලැබූ බව දන්නේද;

(ii) එසේ නම්, ආමවට්ටුවාන්, බේගාමම්, පල්ලියඩිවට්ටෙයි, කිරාන්කෝවයි, පාලයියඩිවට්ටෙයි, කුම්මාවෙලි, කාට්ටුමඩු සහ තුක්කොල්ලයි යන ගම්මානවල ඇති, වී ගොවිතැන් කරනු ලබන කුඹුරු ඉඩම්, අදාළ පුද්ගලයන්ට නිදහස් කිරීමට පියවර ගන්නේද;

(iii) ඒ තුළින් ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය ඉහළ නැංවීමට එම පුද්ගලයන්ගේ දායකත්වය ලබා ගැනීමට පියවර ගන්නේද;

(iv) ඉහත කුඹුරු ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග, වාරිමාර්ග කානු පද්ධති, බෝක්කු සහ කුඩා පාලම් ආදිය ඉදි කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1990ஆம் ஆண்டு காலப்பகுதியில் பயிர்ச் செய்கை நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்ட, வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் மற்றும் வனப் பாதுகாப்புத் திணைக்களத்துக்கு கையகப்படுத்திய பொத்துவில் பிரதேச செயலாளர் பிரிவு உட்பட அம்பாறை மாவட்டத் திலுள்ள பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள பூர்வீகக் காணிகளை கடந்த அரசாங்கம் உரிய தரப்பினர்களுக்கு விடுவிப்பதற்கான ஆரம்ப கட்ட நடவடிக்கைகளை மேற்கொண்டதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், ஆமவட்டுவான், பேகாமம், பள்ளியடிவட்டை, கிரான்கோவை, பாளையடி வட்டை, கும்மாவெளி, காட்டுமடு மற்றும் துக்கொல்லை ஆகிய கிராமங்களில் காணப் படுகின்ற நெற்பயிர்ச்செய்கை மேற்கொள்கின்ற வயல் நிலங்களை உரிய தரப்பினர்களுக்கு விடுவிப்பதற்கான நடவடிக்கைகள் மேற் கொள்ளப்படுமா என்பதையும்;

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

(iii) இலங்கையின் நெல் உற்பத்தியை அதிகரிப்பதற்காக மேற்படி தரப்பினர்களின் பங்களிப்பைப் பெற்றுக்கொள்வதற்கு இதனூடாக நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) மேற்படி வயல் நிலங்களுக்கான நுழைவுப் பாதைகள், நீர்ப்பாசன வடிகான் கட்டமைப்புகள், மதகுகள் மற்றும் சிறிய பாலங்கள் ஆகியவற்றை அமைப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that preliminary steps had been taken by the previous Government to release to the relevant parties their ancestral lands in the Divisional Secretaries' Divisions of the Ampara District including the Pottuvil Divisional Secretary's Division, which were under cultivation even in the 1990s and were taken over by the Department of Wildlife Conservation and the Department of Forest Conservation;

(ii) if so, whether steps will be taken to release the paddy lands to the relevant persons in the villages of Amawattuwan, Begamam, Palliyadiwattai, Kirankowai, Palaiyadiwattai, Kummavelli, Kattumadadu and Thukkollai, which had been cultivated by them;

(iii) whether steps will be taken thereby to get the contribution of those individuals to increase the paddy production in Sri Lanka; and

(iv) whether steps will be taken to provide facilities such as access roads, irrigation channels, drainage systems, culverts and small bridges for the above-mentioned paddy lands?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) අදාළ ඉඩම් නිදහස් කිරීම සඳහා සමාලෝචනය කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සඳහා අදහසක් ඉදිරිපත් කරන්න පුළුවන්. මේ ඉඩම් අතරින් පල්ලියඩිවට්ටෛ ඉඩම් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන ඇති නිසා එම ඉඩම් නිදහස් කිරීම සම්බන්ධව කටයුතු කිරීමට හැකියාවක් නැහැ.

(iii) ඔව්.

(iv) මහ ජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් සහ ඒ ප්‍රදේශයේ අදාළ ආයතනවල ඉල්ලීම් පිළිබඳව සමාලෝචනය කිරීමෙන් අනතුරුව, අධිකරණ ක්‍රියාමාර්ගයත් සැලකිල්ලට ගනිමින් මේ ආයතන සම්බන්ධීකරණය කර ගැනීමෙන් අනතුරුව ඒ කටයුතු කරන්න හැකියාවක් පවතින බව සඳහන් කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, பொத்துவில், லகுகலை பிரதேச செயலக எல்லைக்குள் அமைந்திருக்கின்ற சுமார் 502 ஏக்கர் நெற்காணிகள் பல ஆண்டு காலமாக பொத்துவில் விவசாயிகளால் செய்கை பண்ணப்பட்டு வந்த நிலையில், 2000ஆம் ஆண்டு முதல் சுமார் 25 ஆண்டுகளாக செய்கை பண்ணப்படாமல் விடப்பட்டுள்ளன. வன இலாகாவுக்கோ, வனசீவராசிகள் திணைக்களத்துக்கோ சொந்தமில்லாத இந்த நெற் காணிகள், மேற்குறித்த இரண்டு பிரதேச செயலாளர் பிரிவு மக்களாலும் உரிமை கோரப்பட்டு வருகின்றன. கடந்த அரசாங்க காலத்தில், இதனைப் பிரித்து வழங்க வேண்டுமென பாராளுமன்றக் கட்டிடத் தொகுதியில் மாண்புமிகு சனாதிபதி அவர்களின் செயலாளர் உட்பட இதனுடன் தொடர்புபட்ட திணைக்களங்களின் அதிகாரிகள் முன்னிலையிலும் தீர்மானம் எடுக்கப்பட்டது. அரசாங்கம் மாறிவிட்டதன் காரணமாக, தற்போது இந்தக் காணிகளை நியாயமானதோர் அடிப்படையில் தலா 250 ஏக்கர் வீதம் லகுகலை, பொத்துவில் பிரதேச மக்களுக்குப் பிரித்து வழங்க பிரதேச செயலாளர்களும் விவசாயிகளும் இணக்கம் கண்டுள்ளனர். அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் இது தொடர்பில் தீர்மானிக்கப்பட்டுள்ளது. இக்காணிகளை விரைவாக பயிர்ச் செய்கைக்குப் பயன்படுத்தும் பொருட்டு, அரசாங்க அதிபர், லகுகலை பிரதேச செயலாளர், பொத்துவில் பிரதேச செயலாளர், DCC Chairman போன்றோரை உள்ளடக்கிய குழுவொன்றை நியமித்து, இவற்றைப் பிரித்து வழங்குவதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ ඉල්ලීම අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්නම්. ඊට පසුව ඔබතුමා සම්බන්ධ කරගෙන මේ කටයුතු පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්කම ලැබේවි.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த பல ஆண்டுகளாக பொத்துவில், லகுகலை விவசாயிகளால் பயிர்ச்செய்கை

செய்யப்பட்டு வந்த 'இறத்தல் மேற்கு பள்ளியடிவட்டை' என அடையாளப்படுத்தப்பட்டு இருக்கின்ற காணிகள், கடந்த 8 வருடங்களாக வன இலாகாவால் நீதிமன்றக் கட்டளைமூலம் செய்கை பண்ணவிடாமல் தடுக்கப்பட்டுள்ளது. இதனால் சுமார் 63 குடும்பங்களைச் சேர்ந்த விவசாயிகள் தங்களது வாழ்வாதாரத்தை இழந்திருக்கிறார்கள். இதனுள் சுமார் 180 ஏக்கர் அடங்கும். 1978ஆம் ஆண்டு முதல் செய்கை பண்ணப்பட்டு வந்த இந்தக் காணிகள், DAD/16/18/40ஆம் இலக்கத்தின்கீழ் விவசாய அமைப்பாக 2015.04.09இல் பதிவு செய்யப்பட்டுள்ளன. 2015/16 போகத்தில் விவசாயம் செய்வ தற்கு பிரதேச செயலாளர் அனுமதி கோரி சிபாரிசு செய்ததன் அடிப்படையில், வன இலாகாவானது 2014.11.27ஆம் திகதி அதற்கு அனுமதியளித்தது.

2015.10.23ஆம் திகதி நடைபெற்ற விவசாயக் கூட்டத்தில் 180 ஏக்கரில் விவசாயம் செய்வதற்கு அனுமதி வழங்கப்பட்டது. லகுகலை பிரதேச செயலாளர் பிரிவில் இது சம்பந்தமான கூட்டங்கள் நடைபெற்று இருக்கின்றன. குறித்த விவசாயி களில் 17 பேருக்கு எதிராக நீதிமன்றில் 25684/F/2018ஆம் இலக்க வழக்கும் நடைபெற்று வருகின்றது. கடந்த 30 ஆண்டுகளுக்கும் மேலாக விவசாயம் செய்து வந்த இந்தக் காணிகள், சாதாரண காடுகளாகப் பிரகடனப்படுத்தப்பட்ட பின்னரும் செய்கை பண்ணுவதற்காக அனுமதிக்கப்பட்டு இருக்கிறது. இந்தக் காணிகளில், விவசாயம் செய்து வந்த காணிகள் சுமார் 70 ஏக்கர் அளவில் இருக்கின்றது. அந்தக் காணிகளையும் செங்காமம், சர்வோதயபுரத்தில் இருக்கின்ற காணிகளையும் நீங்கள் அமைச்சரவையில் எடுக்கின்ற தீர்மானங்களின் அடிப்படையில் விடுவிப்பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක් මට ලබා දෙන්න බැහැ. යළිත් වතාවක් ප්‍රශ්නය විමසන්න ගියොත් කල් ගත වෙන නිසා අදාළ අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේදී මම මේ ප්‍රශ්නය අමාත්‍යවරයාට යොමු කරන්නම්, ඒකට සාධාරණ පිළිතුරක් ලබා දෙන්න කියලා.

## යාපනය සහ වවුනියාව තාක්ෂණ විද්‍යාල: යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
## யாழ்ப்பாணம் மற்றும் வவுனியா தொழில்நுட்பக் கல்லூரிகள்: உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்தல்
## COLLEGES OF TECHNOLOGY IN JAFFNA AND VAVUNIYA: IMPROVEMENT OF INFRASTRUCTURE FACILITIES

1504/2025

**4. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය තාක්ෂණ විද්‍යාලයේ බොහෝ ගොඩනැඟිලි කඩා වැටීමේ අවදානමට ලක්ව ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට හෝ නව ගොඩනැඟිලි ඉදිකිරීමට ගන්නා කඩිනම් පියවර කවරේද;

(iii) යාපනය සහ වවුනියාව තාක්ෂණ විද්‍යාලවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට මෙම වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර තිබේද; යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වසර 30ක් පමණ පැරණි තාක්ෂණය මත පදනම්වූ මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ පාඨමාලා සඳහා දෙමුහුන් හෝ නවීන වාහනවල තාක්ෂණික ක්‍රම එක් නොකිරීමට හේතු කවරේද;

(ii) වර්තමාන ප්‍රමිතීන්ට අනුකූලව එම පාඨමාලාවල විෂය නිර්දේශ සංශෝධනය කරනු ලබන දිනය කවරේද;

(iii) මැහුම් පුහුණු මධ්‍යස්ථාන ඇතුළු නවීන යන්ත්‍රෝපකරණ නොමැති තාක්ෂණික විද්‍යාලවලට ඒවා ලබා දීමට ගෙන ඇති පියවර කවරේද; යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) තාක්ෂණ විද්‍යාලවල සුදුසුකම්ලත් කථිකාචාර්යවරුන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදු කරන්නේද;

(iii) වෘත්තීය පුහුණු අධ්‍යාපනයේ ගුණාත්මකභාවය දිවයින පුරා සම මට්ටමක පවතින බව සහතික කරනු ලබන ආකාරය කවරේද; යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம் தொழில்நுட்பக் கல்லூரியில் பல கட்டிடங்கள் இடிந்துவிழும் அபாயத்தை எதிர்கொண்டுள்ளதை அறிவாரா;

(ii) ஆமெனில், அவற்றை மறுசீரமைப்பதற்கு அல்லது புதிய கட்டிடங்களை நிர்மாணிப்பதற்கு மேற்கொள்ளப்படும் துரித நடவடிக்கைகள் யாவை;

(iii) யாழ்ப்பாணம் மற்றும் வவுனியா தொழில்நுட்பக் கல்லூரிகளின் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்த இந்த ஆண்டில் நிதி ஒதுக்கீடு மேற்கொள்ளப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சுமார் 30 வருடங்கள் பழைமை வாய்ந்த தொழில்நுட்பத்தை அடிப்படையாகக் கொண்ட மோட்டார் வாகன புதுப்பித்தல் பாடநெறி களுடன் கலப்பின அல்லது நவீன வாகனங் களின் தொழில்நுட்ப முறைகள் இணைக்கப் படாமைக்கான காரணங்கள் யாவை;

(ii) இன்றைய தரநியமங்களுக்கு இணங்க, மேற்படி பாடநெறிகளின் பாடவிதானங்களைத் திருத்தம் செய்யும் திகதி யாது;

(iii) தையல் பயிற்சி நிலையங்கள் உட்பட நவீன இயந்திரோபகரண வசதிகள் இல்லாத தொழில் நுட்பக் கல்லூரிகளுக்கு அவற்றை வழங்க மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

(இ) (i) தொழில்நுட்பக் கல்லூரிகளில் தகுதிவாய்ந்த விரிவுரையாளர்களுக்குப் பற்றாக்குறை நிலவுகின்றது என்பதை அறிவாரா;

(ii) மேற்படி வெற்றிடங்களுக்கான ஆட்சேர்ப்புகள் மேற்கொள்ளப்படுமா;

(iii) தொழில் பயிற்சிக் கல்வியின் தரம் நாடெங்கிலும் சமமான மட்டத்தில் காணப்படுவதை உறுதி செய்யும் முறை யாது;

என்பதை மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that most of the buildings of the Jaffna College of Technology are at risk of collapse;

(ii) if so, the urgent steps that will be taken to renovate the said buildings or construct new buildings; and

(iii) whether funds have been allocated this year to improve the infrastructure facilities of the Colleges of Technology in Jaffna and Vavuniya?

(b) Will she also inform this House the -

(i) reasons for not incorporating hybrid or modern vehicle technologies into the automotive repair courses that are still based on 30-year old technology;

(ii) date on which the syllabus of the courses concerned will be revised in accordance with the current standards; and

(iii) steps that have been taken to provide modern machinery to Colleges of Technology including textile training centres, which do not have them?

(c) Will she further inform this House -

(i) whether she is aware that there is a shortage of qualified lecturers in Colleges of Technology;

(ii) whether recruitments will be made for the said vacancies; and

(iii) the manner in which it is ensured that the quality of vocational training education is maintained Island-wide at an equal level?

(d) If not, why?

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) යාපනය තාක්ෂණ විද්‍යාලයේ එක් ගොඩනැඟිල්ලක වහල පමණක් අබලන් තත්ත්වයේ පවතී.

(ii) 2026 වර්ෂයේ අදාළ ගොඩනැඟිල්ලෙහි අවශ්‍ය නවීකරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා මේ වනවිටත් පියවර ගෙන ඇත.

(iii) යාපනය තාක්ෂණ විද්‍යාලය සඳහා රුපියල් මිලියන 3.5ක් හා වවුනියාව කාර්මික විද්‍යාලය සඳහා රුපියල් මිලියන 3.149ක් ලෙස එම විද්‍යාලයන්හි 2025 වර්ෂය තුළ යටිතල පහසුකම් නවීකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කර ඇත. ඒ යටතේ ඇතැම් ව්‍යාපෘති මේ වන විටත් නිම කර ඇති අතර, අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී.

(ආ) (i) දෙමුහුන් හා නවීන වාහන අලුත්වැඩියා පාඨමාලා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික පහසුකම් මේ වන විටත් විද්‍යාලයන්හි ස්ථාපිත කර ඇත. ඒ යටතේ යාපනය තාක්ෂණ විද්‍යාලය සඳහාද දෙමුහුන් මෝටර් යාන්ත්‍රික පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සහිත වැඩහල් ස්ථාපිත කර ඇත.

(ii) සියලු තාක්ෂණ/කාර්මික විද්‍යාල තුළ ක්‍රියාත්මක වන පාඨමාලා බහුතරයක් ජාතික වෘත්තීය සුදුසුකම - NVQ - පිරිනැමෙන පාඨමාලා වන අතර, එම පාඨමාලා විෂය නිර්දේශ සියල්ල තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් අවශ්‍ය කාලරාමුව ඇතුළත නවීකරණය කිරීම සිදු කරනු ලබයි.

(iii) පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය නවීන යන්ත්‍රෝපකරණ නොමැති විද්‍යාල සඳහා අදාළ යන්ත්‍රෝපකරණ 2026 වර්ෂය තුළදී මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.

(ඇ) (i) මේ වන විටත් ලැබී ඇති අනුමැතිය ප්‍රකාරව ස්ථිර පදනමින් උපදේශකවරුන් 100ක් හා කොන්ත්‍රාත් පදනමින් උපදේශකවරුන් 100ක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ii) මේ වන විටත් ලැබී ඇති අනුමැතිය ප්‍රකාරව ස්ථිර පදනමින් උපදේශකවරුන් 100ක් හා කොන්ත්‍රාත් පදනමින් උපදේශකවරුන් 100ක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(iii) සියලුම වෘත්තීය අධ්‍යාපන ආයතනයන්හි පාඨමාලාවල ගුණාත්මක බව හා තත්ත්ව කළමනාකරණය ඇතුළු නියාමන කටයුතු සියල්ල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව පුරා සියලු වෘත්තීය අධ්‍යාපන ආයතනයන්හි සම මට්ටමේ පාඨමාලා සඳහා පොදු විෂය මාලාවක් ක්‍රියාත්මක කිරීම, එකම පිළිගැනීමක් සහිත සහතිකයක් - NVQ - ලබා දීම හා පොදු ඇගයීම් ක්‍රමයක් භාවිත කිරීම මඟින් පාඨමාලාවල ගුණාත්මකභාවය දිවයින පුරා සම මට්ටමක පවතින බව තහවුරු කරනු ලබයි.

(ඈ) අදාළ නොවේ.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ தொழிற்கல்விப் பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் கடந்த ஒன்றரை மாதங்களுக்கு முன்பு, வவுனியா, மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி, யாழ்ப்பாணம் மாவட்டங்களுக்கு மூன்றாம் நிலைக் கல்வி நிலையங்களைப் பார்வையிடுவதற்காக வருகை தந்தீர்கள். அந்தவேளை, வவுனியா தொழில்நுட்பக் கல்லூரியின் பிரதான மண்டபமும் அதனுடைய கூரையும் பலத்த சேதங்களுக்கு உள்ளாகி இருந்ததை நாங்கள் அவதானித்தோம். அதனைப் புனரமைப்பதற்குரிய வேலைத்திட்டங்கள் 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கப்பட்டுள்ளதா? எனக் கேட்க விரும்புகின்றேன். மேலும், அங்குள்ள மைதானம் திருத்தியமைக்கப்பட வேண்டியிருக்கின்றது. அது தொடர்பான விபரங்களையும் கூற முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ආයතන 50ක් වැඩිදියුණු කිරීම සඳහා 2026 වසරට රුපියල් මිලියන 2,000ක මුදලක් අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ යටතේ අපි අනිවාර්යයෙන්ම ඔබතුමා කියන වවුනියාවේ ඒ ආයතනය දියුණු කිරීම සඳහා මුදල් යෙදවීමට අපේක්ෂා කරනවා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

VTA மற்றும் NAITA ஆகிய நிறுவனங்களில் இளைஞர்களுக்கான தொழிற்பயிற்சிப் பாடநெறிகள் நடைபெறுகின்றன. எனினும், அங்கு ஊழியர் பற்றாக்குறை பாரியளவில் நிலவுகின்றது. மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களுக்கான NAITA நிறுவனத்தின் காரியாலயம், மன்னாருடன் சேர்த்து வவுனியாவில் மட்டுமே இயங்குகின்றது. எனவே, மன்னார் மாவட்டத்துக்கான NAITA நிறுவனத்தின் காரியாலயத்தை மன்னாருக்குக் கொண்டு செல்வதற்கான ஏதாவது ஏற்பாடுகள் இருக்கின்றனவா? இளைஞர்களைத் தற்போதைய வேலை உலகுக்கு ஏற்ற விதத்தில் தயார்செய்யும் பொருட்டு, புதிய பாடநெறிகள் இணைக்கப்பட்டுள்ளனவா? அதாவது, வேலைவாய்ப்பை விரைவாகப் பெற்றுக்கொள்வதற்குரிய பாடநெறிகள் புதிதாக இவ்வருடத்தில் இணைக்கப்பட்டுள்ளனவா? எனக் கேட்க விரும்புகின்றேன்.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ගරු මන්ත්‍රීතුමනි, ලබන වසරේ සිට වෘත්තීය අධ්‍යාපන විෂය නිර්දේශය පාසල් මට්ටමින් ක්‍රියාත්මක කරන නිසා අපට ආයතන පද්ධතිය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට සිද්ධ වෙනවා.

ඒ යටතේ ඔබතුමා කියන කාරණාවත්, විශේෂයෙන්ම NAITA එකට අදාළව ආයතන කිහිපයක් එකම නගරයට කේන්ද්‍රගතවීමත් අපි හඳුනා ගත් කාරණාවක් හැටියට තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම, අපේ කාර්ය මණ්ඩලවල විශාල හිඟයක් තිබුණා. හැබැයි, මේ වෙනකොට අපිට අනුමැතිය ලැබිලා සැලකිය යුතු ප්‍රමාණයක් බඳවා ගනිමින් තිබෙනවා. මේ දවස්වල ඒ කටයුතු සිදු කරමින් පවතිනවා. ඒ නිසා අවශ්‍ය කාර්ය මණ්ඩලය යම් ප්‍රමාණයක් ඔබතුමන්ලාගේ ආයතනවලට ලබා දෙන්න පුළුවන් වෙයි. ඔබතුමා කියපු NAITA එකට අදාළ කාරණාවත් අපි ලබන අවුරුද්ද ඇතුළත වෙනස් කරන්න බලාපොරොත්තු වෙනවා.

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප: විස්තර
திருகோணமலை மாவட்டத்திலுள்ள கல்வி வலயங்கள்: விபரம்
EDUCATION ZONES IN TRINCOMALEE DISTRICT: DETAILS

1553/2025

**5. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති අධ්‍යාපන කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) එම කලාප කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තිබෙන පාසල් වාර්ගිකත්වය අනුව අධ්‍යාපන කලාප තුනකට බෙදා ඇති බවත්;

(ii) මුස්ලිම් පාසැල් කින්නියා අධ්‍යාපන කලාපයටත්, දෙමළ පාසල් ත්‍රිකුණාමලය අධ්‍යාපන කලාපයටත් සහ සිංහල පාසල් කන්තලේ අධ්‍යාපන කලාපයටත් සම්බන්ධ කර ඇති බවත්;

(iii) ත්‍රිකුණාමලය අධ්‍යාපන කලාපයේ කුච්චවෙලි කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය යටතේ තිබෙන බොහෝ පාසල්, කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට කිලෝමීටර 50 කට අධික දුරින් පිහිටා ඇති බවත්;

එතුමිය පිළිගන්නේද?

(ඇ) ත්‍රිකුණාමලය අධ්‍යාපන කලාපයේ භූගෝලීය දුර සහ තඹලගමුව ප්‍රදේශයේ පාසල් වාර්ගික පදනමින් වෙන් කර තිබීම සැලකිල්ලට ගෙන, අනාගතයේදී නව අධ්‍යාපන කලාප ඇති කිරීමේදී මෙම ප්‍රදේශ සඳහා වෙනම අධ්‍යාපන කලාප ඇති කිරීමට පියවර ගන්නේද, යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்திலுள்ள கல்வி வலயங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி வலயங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தம்பலகாமம் பிரதேச செயலாளர் பிரிவிலுள்ள பாடசாலைகள் இனத்துவத்தின் அடிப்படையில் மூன்று கல்வி வலயங்களாகப் பிரிக்கப் பட்டுள்ளன என்பதையும்;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(ii) முஸ்லிம் பாடசாலைகள் கிண்ணியா கல்வி வலயத்துடனும், தமிழ் பாடசாலைகள் திருகோணமலை கல்வி வலயத்துடனும், சிங்களப் பாடசாலைகள் கந்தளாய் கல்வி வலயத்துடனும் இணைக்கப்பட்டுள்ளன என்பதையும்;

(iii) திருகோணமலை கல்வி வலயத்தில், குச்சவெளி கோட்டக் கல்வி அலுவலகத்தின் கீழுள்ள பெரும்பாலான பாடசாலைகள், வலயக் கல்வி அலுவலகத்திலிருந்து 50 கிலோ மீற்றருக்கும் அதிகமான தொலைவில் அமைந்துள்ளன என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) திருகோணமலை கல்வி வலயத்தின் புவியியல் ரீதியான தூரத்தையும் தம்பலகாமம் பிரதேசத்திலுள்ள பாடசாலைகள் இனத்துவ அடிப்படையில் பிரிக்கப் பட்டுள்ளதையும் கருத்திற்கொண்டு, எதிர்காலத்தில் புதிய கல்வி வலயங்களை உருவாக்கும்போது மேற்படி பிரதேசங்களுக்கென தனிக் கல்வி வலயங்களை உருவாக்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ஈ) அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of education zones in the Trincomalee District; and

(ii) names of those education zones?

(b) Will she accept that-

(i) schools in the Thambalagamuwa Divisional Secretary's Division are divided into three education zones based on ethnicity;

(ii) Muslim schools have been linked to the Kinniya Education Zone, Tamil schools to the Trincomalee Education Zone and Sinhala schools to the Kantale Education Zone; and

(iii) most of the schools under the Kuchchaveli Divisional Education Office in the Trincomalee Education Zone are located more than 50 kilometres away from the Zonal Education Office?

(c) Will she also inform this House, taking into consideration the geographical distance of the Trincomalee Education Zone and the ethnic segregation of schools in the Thambalagamuwa area, whether steps will be taken to create separate education zones for above-mentioned areas when creating new education zones in the future?

(d) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති අධ්‍යාපන කලාප සංඛ්‍යාව 05කි.

(ii) 1. ත්‍රිකුණාමලය කලාපය

2. ත්‍රිකුණාමලය උතුර කලාපය

3. මුතූර් කලාපය

4. කන්තලේ කලාපය

5. කින්නියා කලාපය

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) කුච්චවේලි කොට්ඨාසයට අයත් මුළු පාසල් සංඛ්‍යාව 30කි. ඉන් පාසල් 7ක් ත්‍රිකුණාමලය නගරයේ සිට කිලෝමීටර 50කට අධික දුරින් පිහිටා ඇත.

(ඇ) වෙනම අධ්‍යාපන කලාපයක් ඇති කිරීම සඳහා ප්‍රමාණවත් පාසල් සංඛ්‍යාවක් හෝ ශිෂ්‍ය ප්‍රජාවක් නොමැති අතර, මේ පිළිබඳව මෙයට පෙර ඉල්ලුම් කිරීමක් නැත.

(ඈ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දැනට පවතින කලාප අධ්‍යාපන කාර්යාලවලට අයත් වනුයේ ද ඉතා සීමිත පාසල් සංඛ්‍යාවකි. ඒවා පහත පරිදි වේ.

| | |
|---|---|
| • ත්‍රිකුණාමලය උතුර | 35 |
| • කන්තලේ | 44 |
| • කින්නියා | 67 |
| • ත්‍රිකුණාමලය | 83 |
| • මුතූර් | 88 |

ඉහත සංඛ්‍යාවන්ට සාපේක්ෂව පාසල් සංඛ්‍යාව 150 ද ඉක්මවමින් තනි කලාප අධ්‍යාපන කාර්යාලයක් යටතේ පාලනය සිදු වන අධ්‍යාපන කලාපද දිවයිනේ පිහිටා ඇත. උදාහරණ හැටියට;

| | |
|---|---|
| • දෙහිඕවිට | 213 |
| • මිනුවන්ගොඩ | 161 |
| • ගම්පහ | 150 |

ඉතා විශාල භූගෝලීය ප්‍රදේශයක් ආවරණය වන පරිදි මෙන්ම, ප්‍රවේශ වීමේ ප්‍රායෝගික අපහසුතා රැසක් පවතිද්දී මෙවැනි වූ අධ්‍යාපන කලාප රැසක පාසල් සියල්ලෙහිම පරිපාලන කටයුතු සිදු කරමින් පවතින අතර, බහුවාර්ගික තත්ත්වයන් සහිත වෙනත් දිස්ත්‍රික්ක/ ප්‍රදේශ ගණනාවක් තුළද පාසල්වල පරිපාලනය මෙහෙයවනුයේ අනෙකුත් නිර්ණායක හා සාධක මත පදනම්ව පොදුවේ තනි කලාප අධ්‍යාපන කාර්යාලයක් හරහාය.

එවැනි වාතාවරණයක් මත, නව අධ්‍යාපන කලාප ඇති කිරීමේදී සුවිශේෂීතාවක් ඇති කිරීමේ හැකියාවක් නොමැත.

ගරු කථානායකතුමනි, අපි ඉදිරියේදී කරන ප්‍රතිසංස්කරණ තුළදී මේ පරිපාලන ව්‍යුහය පිළිබඳ සමාලෝචනයක්

කරන්න බලාපොරොත්තු වෙනවා. එතැනදී අධ්‍යාපන සේවාව දරුවන්ට සහ ඒ පාසල්වලට හොඳටම ලැබෙන විධියට තිබිය යුතු ව්‍යුහය ගැන නිර්ණායක ගණනාවක් ඔස්සේ සාකච්ඡා කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට මේ මතු කරන කාරණා සියල්ලත් අපට සලකා බලන්න පුළුවන්. එම සාකච්ඡාවේදී මේ පිළිබඳව තව යෝජනා ඉදිරිපත් කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி! கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இன்று நான் இந்த வினாவைக் கேட்பதன் பிரதான நோக்கம், கௌரவ அமைச்சர் அவர்கள் சொன்னதுபோன்று, ஏனைய மாவட்டங்களைவிட எங்களுடைய மாவட்டத்தில் காணப்படுகின்ற கல்வி வலயங்கள் பின்தங்கிய நிலையில் இருப்பதனால்தான். அதிலும் குறிப்பாக, தம்பலகாமம் பிரதேசத்துக்கென தனிக் கல்வி வலயமொன்றைக் கேட்பதன் பிரதான நோக்கம், இன்று அங்குள்ள பாடசாலைகள் இனவாத அடிப்படையில் பிரிக்கப்படுவது போன்றதொரு நிலைமை காணப்படுவதனால்தான். அதாவது, தம்பலகாமம் பிரதேசத் திலுள்ள தமிழ்ப் பாடசாலைகள் எல்லாம் திருகோணமலை கல்வி வலயத்துடனும், சிங்களப் பாடசாலைகள் எல்லாம் கந்தளாய் கல்வி வலயத்துடனும், முஸ்லிம் பாடசாலைகள் எல்லாம் கிண்ணியா கல்வி வலயத்துடனும் இணைக்கப்பட்டு இருக்கின்றன. இது இனவாத அடிப்படையிலே பார்க்கப் படுகின்றது. அதனால்தான் நாங்கள் சொல்கின்றோம், புதியதொரு கல்வி வலயத்தை ஏற்படுத்தி, தம்பலகாமத்தில் இருக்கின்ற எல்லா பாடசாலைகளையும் அதன்கீழ் கொண்டுவர வேண்டும் என்று. அது ஆரோக்கியமான ஒரு விடயமாக இருக்கும்.

கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார், இது சம்பந்தமாக எந்தவித முன்னெடுப்பும் எடுக்கப்படவில்லை என்று. ஆனால், சென்ற அரசாங்க காலத்தில் கிழக்கு மாகாண கல்வி அமைச்சினால், குச்சவெளிப் பிரதேசத்துக்கென தனியான தொரு கல்வி வலயத்தை உருவாக்குவது தொடர்பில் EP/03/PL/01/NEW ZONE என்ற இலக்கமுடைய கடிதமொன்று அனுப்பப்பட்டு இருக்கிறது. நான் ஏற்கெனவே இந்தக் கடிதத்தின் பிரதியை கௌரவ அமைச்சருக்கு வழங்கி யிருக்கிறேன். அந்தக் கடிதத்தின் பிரதியை ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

எது எவ்வாறு இருந்தபோதிலும், திருகோணமலை மாவட்டத்தில் கல்வி விடயத்தில் காணப்படுகின்ற இனவாதம் ஒழிக்கப்பட வேண்டும். சென்ற காலங்களில் இனவாதம் இருந்ததனால்தான் அதற்குரிய முயற்சிகள் எடுக்கப்பட வில்லையென நான் நினைக்கின்றேன். இனவாதமற்ற, பிரதேசவாதமற்ற உங்களுடைய அரசாங்கத்தால் இதற்கு ஒரு தீர்வை வழங்க முடியுமா? எனக் கேட்கின்றேன்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, කාරණා ගණනාවක්, නිර්ණායක ගණනාවක් මත තමයි අධ්‍යාපන කලාප සම්බන්ධව තීන්දු තීරණ ගන්නේ. එහිදී සම්පත් බෙදී යාම පිළිබඳවත්, තිබෙන පාසල් ප්‍රමාණය පිළිබඳවත්, භූගෝලීය සාධකත්, සමාජයීය සහ ආර්ථික සාධකත් කියන සියල්ලම සලකා බලන්න ඕනෑ.

මම නැවත වතාවක් කියනවා, අපි ඉදිරියට කරන්න යෝජිත සමාලෝචනය තුළ මෙම නිර්ණායක සියල්ල ගැන සලකා බලා අවශ්‍ය පරිදි හොඳම විසඳුමක් මේ කාරණාව සම්බන්ධවත් ගෙනෙන්න උත්සාහ කරමු කියලා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

திருகோணமலை மாவட்டமானது முஸ்லிம்கள் அதிகமாக வாழுகின்ற ஒரு மாவட்டமாகக் காணப்படுகின்றது. திருகோணமலை கல்வி வலயத்திலும் கந்தளாய் கல்வி வலயத்திலும் உள்ள எந்தவொரு முஸ்லிம் பாடசாலையும் மத்திய அரசாங்கத்தின்கீழ் இல்லாத நிலைப்பாடு காணப்படுகின்றது. சென்ற அரசாங்க காலத்தில் 1,000 தேசிய பாடசாலைகளை உருவாக்குவதாகச் சொன்னார்கள். எனினும், இப்பொழுது அந்தச் செயற்பாடு அப்படியே இடைநிறுத்தப் பட்டு இருக்கிறது. கௌரவ அமைச்சர் அவர்களே, நான் கேட்கின்ற விடயம் என்னவெனில், திருகோணமலை கல்வி வலயத்தில் காணப்படுகின்ற ஸாஹிரா கல்லூரி எல்லா விதத்திலும் தகுதிவாய்ந்த ஒரு பாடசாலையாகக் காணப்படுகின்றது. அதேபோன்று, கந்தளாய் கல்வி வலயத்திலும் சிறந்த பெறுபேறுகளைப் பெறுகின்ற, விளையாட்டுச் செயற்பாடுகளில் சிறந்து விளங்குகின்ற முஸ்லிம் பாடசாலைகள் காணப்படுகின்றன. இந்த இரண்டு கல்வி வலயங்களிலும் தேசிய பாடசாலைகளை உருவாக்கு வதற்கு ஏதாவது நடவடிக்கைகளை முன்னெடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, සේවාවන් ලබා දීමේදීත්, සම්පත් ලබා දීමේදීත්, ජාතික පාසල් සහ පළාත් පාසල් කියලා වෙන් කිරීම අපි ඇත්තටම ප්‍රතික්ෂේප කරනවා. තව ජාතික පාසල් හදන එක නොවෙයි, අපේ පරමාර්ථය. ඒ සියලුම පාසල්වලට සමව සම්පත් ලබා දීමත්, ඒවායේ අවශ්‍යතා හඳුනාගෙන ඒවාට මැදිහත් වෙන්නත් තමයි අපි බලාපොරොත්තු වන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළ ආකාරයට ගුරු පත්වීම්ද, යටිතල පහසුකම්ද, අවශ්‍ය අනිකුත් සම්පත්ද බෙදා දෙනකොට එම පාසල ජාතික පාසලක්ද, පළාත් පාසලක්ද කියලා අපි බලන්නේ නැහැ. අවශ්‍යතාව මත ඒ දේවල් ලබා දීම සිදු කරනවා. ඒ වාගේම ජාතික පාසල් හැටියට අලුතෙන් පාසල් නම් කිරීමේ බලාපොරොත්තුවකුත් අපට නැහැ; දැනට එහෙම තීරණයක් අරගෙනත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## ශික්ෂණ රෝහල්: විස්තර
## போதனா வைத்தியசாலைகள் : விபரம்
## TEACHING HOSPITALS: DETAILS

1272/2025

**1. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මේ වන විට ස්ථාපිත කර ඇති ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපනය කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ශික්ෂණ රෝහලක් ස්ථාපනය කිරීමේ අරමුණු කවරේද;

(iv) එම රෝහලක තිබිය යුතු ප්‍රධාන පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සෑම ශික්ෂණ රෝහලකටම වෛද්‍ය පීඨයක් අනුබද්ධ කර තිබේද;

(ii) එම සෑම ශික්ෂණ රෝහලකම මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(iii) මහාචාර්ය ඒකකයක් පිහිටුවා ඇති සහ නොමැති ශික්ෂණ රෝහල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම රෝහල්වලට අනුබද්ධ කර ඇති වෛද්‍ය පීඨ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කුලියාපිටිය රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමේදී, වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුව සඳහා මහාචාර්ය ඒකකයක් ස්ථාපිත කිරීමට අදහස් කර තිබුණේද;

(vi) එසේ නම්, එම ඒකකය ඉදිරියේදී ස්ථාපනය කරන්නේද;

(vii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(viii) කුලියාපිටිය ශික්ෂණ රෝහල සඳහා වර්තමාන රජය විසින් ලබාදී ඇති පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் தாபிக்கப்பட்டுள்ள போதனா வைத்தியசாலைகளின் எண்ணிக்கை யாது;

(ii) இவை தாபிக்கப்பட்டுள்ள பிரதேசங்கள் யாவை;

(iii) போதனா வைத்தியசாலை ஒன்றை நிர்மாணிப்பதன் நோக்கங்கள் யாவை;

(iv) அவ்வைத்தியசாலை ஒன்றில் காணப்படவேண்டிய முதன்மை வசதிகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சகல போதனா வைத்தியசாலைகளுக்கும் மருத்துவ பீடமொன்று இணைக்கப்பட்டுள்ளதா;

(ii) அந்த ஒவ்வொரு போதனா வைத்தியசாலையிலும் பேராசிரியர் பிரிவொன்று தாபிக்கப்பட்டுள்ளதா;

(iii) பேராசிரியர் பிரிவொன்று தாபிக்கப்பட்டுள்ள மற்றும் தாபிக்கப்படாதுள்ள போதனா வைத்தியசாலைகள் வெவ்வேறாக யாவை;

(iv) மேற்படி வைத்தியசாலைகளில் இணைக்கப்பட்டுள்ள மருத்துவ பீடங்கள் வெவ்வேறாக யாவை;

(v) குளியாப்பிட்டிய வைத்தியசாலையை போதனா வைத்தியசாலையாக மாற்றுகையில், வயம்ப பல்கலைக்கழக மருத்துவ மாணவர்களின் பிணியாய்வு பயிற்சிக்காக பேராசிரியர் பிரிவொன்றைத் தாபிப்பதற்கு உத்தேசிக்கப்பட்டு இருந்ததா;

(vi) ஆமெனில், குறிப்பிட்ட பிரிவு எதிர்காலத்தில் தாபிக்கப்படுமா;

(vii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

(viii) குளியாப்பிட்டிய போதனா வைத்தியசாலைக்கு தற்போதைய அரசாங்கத்தால் வழங்கப்பட்டுள்ள வசதிகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of teaching hospitals established to date;

(ii) areas where the said hospitals have been established;

(iii) objectives of establishing a teaching hospital; and

(iv) basic facilities that should be available in such a hospital?

(b) Will he also inform this House -

(i) whether a medical faculty has been linked to every teaching hospital;

(ii) whether a professorial unit has been established in every such hospital;

(iii) the teaching hospitals that have and those that do not have a professorial unit established, separately;

(iv) separately, the medical faculties that are linked to the said hospitals;

(v) whether it had been intended to establish a professorial unit at the Kuliyapitiya Teaching Hospital for clinical training of medical students of the Wayamba University when that Hospital was turned into a teaching hospital;

(vi) if so, whether that unit will be established in due course;

(vii) if not, the reasons; and

(viii) the facilities that have been provided by the present Government to the Kuliyapitiya Teaching Hospital?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) 20කි. (ජාතික රෝහල් තුනද ඇතුළත්ව)

(ii) **ඇමුණුම 01**** මඟින් දක්වා ඇත.

(iii) ප්‍රධාන අරමුණ - වෛද්‍ය සිසුන් හා විශේෂඥ පුහුණුව ලබන වෛද්‍යවරුන් සඳහා අවශ්‍ය සායනික පුහුණුව ලබා දීම සහ ඉගැන්වීම් කටයුතු සිදු කිරීම.

අනෙකුත් අරමුණු - සියලු විශේෂඥ වෛද්‍ය සේවාවන් ලබා දීම.

(iv) **ඇමුණුම 02**** මඟින් දක්වා ඇත.

**(ආ)** (i) ඔව්.

(ii) සෑම ශික්ෂණ රෝහලකම මහාචාර්ය ඒකක පිහිටුවිය යුතුය.

මෑතකදී ශික්ෂණ රෝහලක් බවට උසස් කරන ලද කුලියාපිටිය සහ බදුල්ල රෝහල්වල මහාචාර්ය ඒකක පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(iii) කුලියාපිටිය සහ බදුල්ල ශික්ෂණ රෝහල් හැර අනෙකුත් සියලු ශික්ෂණ රෝහල් සඳහා මහාචාර්ය ඒකක පිහිටුවා ඇත. (ශික්ෂණ රෝහල් ලේඛනය ඇමුණුම 03 මඟින් දක්වා ඇත.)

(iv) ඇමුණුම 03 මඟින් දක්වා ඇත, එය මෙසේය.

| රෝහලේ නම | අනුබද්ධ කර ඇති වෛද්‍ය පීඨයේ නම |
|---|---|
| ශ්‍රී ලංකා ජාතික රෝහල | කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| ගාල්ල ජාතික රෝහල | රුහුණු විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| මහනුවර ජාතික රෝහල | පේරාදෙණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| අනුරාධපුර ශික්ෂණ රෝහල | රජරට විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| බදුල්ල ශික්ෂණ රෝහල | ඌව විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| මඩකලපුව ශික්ෂණ රෝහල | නැඟෙනහිර විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| රාගම ශික්ෂණ රෝහල | කැලණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| දකුණු කොළඹ ශික්ෂණ රෝහල - කළුබෝවිල | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| යාපනය ශික්ෂණ රෝහල | යාපනය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| කළුතර ශික්ෂණ රෝහල | මොරටුව විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| කුලියාපිටිය ශික්ෂණ රෝහල | වයඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| කුරුණෑගල ශික්ෂණ රෝහල | වයඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| පේරාදෙණිය ශික්ෂණ රෝහල | පේරාදෙණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| රත්නපුර ශික්ෂණ රෝහල | සබරගමුව විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| ශික්ෂණ රෝහල - දන්ත ආයතනය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| සිරිමාවෝ බණ්ඩාරනායක රෝහල | පේරාදෙණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| රිජ්වේ ආර්යා ළමා රෝහල | කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| කාසල් වීදියේ කාන්තා රෝහල | කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| ද සොයිසා කාන්තා රෝහල | කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |
| ජර්මන් - ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල | රුහුණු විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය |

(v) ඔව්.

(vi) ඔව්.

අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීමෙන් පසු මහාචාර්ය ඒකක ස්ථාපිත කිරීම සිදු කරනු ලැබේ.

(vii) අදාළ නොවේ.

(viii) අවශ්‍ය පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා සිදු කරමින් පවතී.

(ඇ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### සියලු සිසුන් සඳහා සමාන අධ්‍යාපන අවස්ථා සැලසීම
### சகல மாணவர்களுக்கும் சமமான கற்கை வாய்ப்பளித்தல்
### ASSURANCE OF EQUAL EDUCATIONAL OPPORTUNITIES FOR ALL STUDENTS

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரிடம் கேள்வி கேட்க அனுமதித்தமைக்கு நன்றி.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

'சகல மாணவர்களுக்கும் சமமான கல்வி' என்பது நமது கோட்பாடாகும். பாடசாலை மாணவர்கள் எச்சந்தர்ப்பங்களிலும் சமமான வாய்ப்புகளை அடையக்கூடியதாக இருத்தல் வேண்டும். மிகவும் பின்தங்கிய பிரதேச மாணவர்கள், சொல்லொணாத் துயரங்களுக்கும் இன்னல்களுக்கும் மத்தியில் கல்வி கற்கின்றனர். அவர்களின் மனநிலை பாதிக்கப்படாமல் இருப்பதை உறுதிசெய்துகொள்ள வேண்டியது நமது கடமையும் மிக முக்கியமான பொறுப்புமாகும் எனக் கருதுகின்றேன். அதனடிப்படையில், பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்:

1. காலணிகள் மற்றும் கற்றல் உபகரணங்கள் என்பன கஷ்டப் பிரதேசப் பாடசாலைகள் அல்லாத பாடசாலைகளில் கற்கின்ற, வறுமைக்கோட்டுக் கீழுள்ள மாணவர்களுக்கு வழங்கப்படவில்லை என்பதை அறிவீர்களா? அவ்வாறான மாணவர்கள் உளரீதியாகப் பாதிக்கப்படுவதுடன், அவர்களது உரிமையும் மறுக்கப்படுகின்றது என்பதை அறிவீர்களா?

2. பாடசாலை மாணவர்கள் என்போர் முதிர்ச்சியடையாத பருவத்தினர் ஆவர். அவர்களை எவ்விதமான கோட்பாடுகளின் அடிப்படையிலும் பிரித்துப் பார்ப்பது பொருத்தமாகாது. பாடப் புத்தகங்கள், சீருடைத் துணி மற்றும் காலணிகள் வழங்குதல் போன்ற எவ்வகையான சலுகைகளாக இருந்தாலும், அனைத்து மாணவர்களுக்கும் சமமான முறையில் எதிர்வரும் காலங்களில் கிடைக்கும் வகையில் இத் திட்டங்களைச் செயற்படுத்துவதற்குரிய முடிவுகளை எடுக்க முடியுமா?

3. இந்த வருடத்துக்கான க.பொ.த. சாதாரண தரப் பரீட்சை நடாத்தப்படத் திட்டமிடப்பட்டுள்ள காலப்பகுதியானது, முஸ்லிம்களின் புனித நோன்புக் காலம் என்பதை அறிவீர்களா? அந்தக் காலப்பகுதியானது முஸ்லிம் மாணவர்களின் பரீட்சைச் செயற்பாடுகளில் தாக்கம் செலுத்தும் என்பதை அறிவீர்களா? நோன்புக் காலங்களில் பரீட்சைக்குச் சமுகமளிப்பதில் உள்ள சிரமங்களை அறிவீர்களா? எதிர்காலத்தில் பரீட்சைத் திகதிகளைத் தீர்மானிக்கும் போது இவற்றைக் கருத்தில் எடுப்பீர்களா?

4. புனித நோன்புக் காலத்தில் முஸ்லிம் மாணவர்கள் இரவில் கண் விழித்து வணக்கம் செய்ய வேண்டிய தேவைகள் இருப்பதால், படிப்பதற்குரிய சந்தர்ப்பம் குறைகிறது. இது அவர்களின் பெறுபேற்றில் பாரிய தாக்கத்தை ஏற்படுத்தும் என்பதைக் கருத்தில் எடுத்து, குறித்த பரீட்சையை நோன்பு காலத்துக்கு முன்னரோ அல்லது பின்னரோ நடாத்துவதற்கு ஏற்பாடு செய்வதன்மூலம் அம்மாணவர்கள் பதற்றம் இல்லாமல் நிதானமாகப் பரீட்சைக்கு முகங்கொடுக்கக்கூடிய சூழ்நிலையை உறுதிசெய்ய முடியுமா?

5. இன்றேல் ஏன்?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් මා ඉල්ලා සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග ගණනාවක් යටතේ මම මේ කාරණය අහන්නේ. ඒ, ස්ථාවර නියෝග 92, ස්ථාවර නියෝග 28 (උ) හා ස්ථාවර නියෝග 31 යටතේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එකක් කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමාට මා ස්තුතිවන්ත වනවා, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳව අද උදේ යම් මහ පෙන්වීමක් කිරීම සම්බන්ධයෙන්. හැබැයි, ඒ වාගේම මම සතුටු වනවා, 2022දී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සම්බන්ධයෙන් පැවති ගැටලු පිළිබඳවත් සාකච්ඡා කරලා තීරණයක් ගැනීම සම්බන්ධයෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඒක ගැන නොවෙයි මම කථා කරන්න යන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණාව ගැන කථා කරනවා නම්,- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම කියන්න හදන්නේ ඒ කාරණය නොවෙයි. ගරු කථානායකතුමනි, ප්‍රශ්න භාර දෙන පිළිවෙළට තමයි ඒවා ඉදිරිපත් කරන්නේ. නලින්ද ජයතිස්ස මැතිතුමා විපක්ෂයේ සිටියදීත් ප්‍රශ්න භාර දෙන පිළිවෙළට තමයි ඒවා ඉදිරිපත් කරන්න තිබුණේ. දැන් 159දෙනෙක් ප්‍රශ්න අහලා ඉවර වුණාමද, විපක්ෂයේ අපි ප්‍රශ්න අහන්න ඕනෑ? ඒක වැරදියි නේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධව මම දැනුම් දීමක් කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதமர் அவர்களிடம் 27(2)இன்கீழ், இம்முறை O/L பரீட்சையை எதிர்வரும் பெப்ருவரி 17 முதல் 26ஆம் திகதி வரை நடாத்தத் திட்டமிட்டிருப்பதால், புனித நோன்பும் பெப்ருவரி 17 அல்லது 18ஆம் திகதி ஆரம்பமாக இருப்பதன் அடிப்படையில் இக்கேள்வியைக் கேட்டிருந்தேன். அதற்குப் பதில் தரவில்லை.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ගත්තා.

අමාත්‍යාංශ නිවේදන, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා.

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සවි කර ඇති නාම පුවරු නීති විරෝධී ලෙස ඉවත් කිරීම: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## தொல்பொருள் திணைக்களத்தால் நிறுவப்பட்ட பெயர்ப் பலகைகளை சட்ட விரோதமாக அகற்றியமை: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று
## ILLEGAL REMOVAL OF NAME BOARDS PUT UP BY DEPARTMENT OF ARCHAEOLOGY: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, නැඟෙනහිර පළාතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සවි කරන ලද නාම පුවරු කිහිපයක් ඉවත් කිරීම සම්බන්ධයෙන් ගරු සභාවට පැහැදිලි කිරීමක් කරන්නට අවශ්‍යයි. ගරු කථානායකතුමනි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වාලච්චේන හා කොක්කඩිචෝලය පොලිස් වසම්වල හඳුනා ගත් පුරාවිද්‍යා ස්ථානවලට ගමන් ගන්නා මාර්ග හඳුනා ගැනීම සඳහා සවි කර තිබූ නාම පුවරු කිහිපයක් කිසියම් පිරිසක් විසින් ගලවා ඉවත් කර ඇති බවට වාලච්චේන හා කොක්කඩිචෝලය පොලිස් ස්ථානවලට පැමිණිලි ලැබී තිබෙනවා.

වාලච්චේන පොලිස් වසමේ දේවිමලෙයි පුරාවිද්‍යා ස්ථානයට යන මාර්ගය හඳුනා ගැනීම සඳහා තිහිලිවට්ට හන්දිය, පල්ලච්චේන, කොණ්ඩුකච්චේන, සාරාවලී යන ස්ථානවල පුරාවිද්‍යා සලකුණු සහිත නාම පුවරු 6ක් 2025.11.22වන දින ගලවා ඉවත් කර ඇති බවට කිරාන් පුරාවිද්‍යා කාර්යාලයේ සංවර්ධන නිලධාරි ලෙස රාජකාරි කරනු ලබන සිවලෝග කණ්නන් සිලෝජනී යන අය විසින් 2025.11.23වන දින වාලච්චේන පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර තිබෙනවා.

මෙම නාම පුවරු වාලච්චේන ප්‍රාදේශීය සභාවේ සභාපති එස්. සුදාකරන්, උප ලේකම් පද්මනිදන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආනන්ද සිවරාසා හා සෙල්ව නගර්, පුලිපංචිකල්, කිරාන් ලිපිනයේ පදිංචි සුන්දර්ලිංගම් යන අය විසින් ගලවා ඇති බවට පොලීසියට කරන ලද පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වෙනවා.

ඒ අනුව, මෙම සිද්ධියට අදාළව 2025.11.24වන අද දින වාලච්චේන ගරු අධිකරණයට කරුණු වාර්තා කර වැඩිදුර විමර්ශන සිදු කර සැකකරුවන් හා අදාළ දේපළ අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලෙස මේ වන විට පොලිස්පතිවරයා විසින් සහකාර පොලිස් අධිකාරි - වාලච්චේන මූලිකත්වයෙන් විමර්ශනයක් ආරම්භ කර තිබෙනවා.

කොක්කඩිචෝලය පොලිස් වසමේ පුරාවිද්‍යා ස්ථානයක් ලෙස හඳුනාගත් තාන්දාමලය කෝවිලට පිවිසෙන මාර්ගය දැක්වෙන 40 වත්ත හන්දිය හා තාන්දාමලය කෝවිලට හැරෙන හන්දියේ සවි කර තිබූ පුරාවිද්‍යා නාම පුවරු දෙකක් 2025.11.20 දින කිසියම් පිරිසක් විසින් ඉවත් කර ඇති බවට පට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුරාවිද්‍යා නිලධාරියෙකු වශයෙන් කටයුතු කරන සුන්දරම් සන්ද්‍රකාන්තන් මහතා විසින් 2025.11.23වන දින කොක්කඩිචෝලය පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා.

මෙම පුවරු ඉවත් කිරීම සම්බන්ධයෙන් 2025.11.24, එනම් අද දින මඩකලපුව ගරු අධිකරණයට කරුණු වාර්තා කර මෙම නාම පුවරු ගලවන ලද පුද්ගලයින් හඳුනාගෙන අත්අඩංගුවට ගැනීම සඳහා සහකාර පොලිස් අධිකාරි - කළුවාංචිකුඩි මූලිකත්වයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇති බව පොලිස්පතිවරයා මේ වනකොට දැනුම් දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, නීතිය රටේ කාටත් පොදුයි. සමහර අය හිතාගෙන ඉන්නවා තම තමන්ට ප්‍රාන්ත රාජ්‍ය තිබෙනවා කියලා. එහෙම කටයුතු කරන්න කිසිදු හැකියාවක් නැහැ. උතුරටත්, දකුණටත්, නැඟෙනහිරටත්, බටහිරටත් නීතිය කාටත් පොදුයි. ඒ නිසා මේ වාගේ ක්‍රියාමාර්ග ගන්න ඉඩකඩ දෙන්න හැකියාවක් නැහැ.

පුරාවිද්‍යා ස්ථාන සලකුණු කරන නාම පුවරු දීර්ඝ කාලයක් තිස්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ඒවා. මේක රජයේ නීතිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම තැනක

[ගරු ආනන්ද විජේපාල මහතා]

නාම පුවරුවක් භාවිත කිරීමට රජයට හැකියාව තිබෙනවා. ඒවා ගලවා ඉවත් කිරීමෙන් යම් ජාතිවාදී ප්‍රශ්නයක් ඇති කර ගැනීම සඳහා යම් යම් පිරිස් උත්සාහ කරන අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ සභාවට නිරන්තරයෙන් අපි ප්‍රකාශ කරන පරිදි, ජාතිවාදයට කිසිදු ඉඩකඩක් නැහැ. නීතිය හැමෝටම පොදුයි, උතුරටත්, දකුණටත්, නැඟෙනහිරටත්, බටහිරටත්. අද උදෑසන පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කරනවා. අධිකරණයේ තීන්දුව අනුව ඒ ඒ භාණ්ඩ සහ ඒකට වගකිවයුතු පුද්ගලයන් අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය උපදෙස් පොලිසියට ලබා දීලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ அமைச்சர் அவர்கள் மட்டக்களப்பில் நடந்த சம்பவம் பற்றி குறிப்பிட்டார். ஆனால், நானும் பத்திரிகை மூலமாக -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක කියන්න.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
நான் மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர். கௌரவ அமைச்சர் அவர்கள் மட்டக்களப்பில் நடந்த சம்பவம் தொடர்பாகக் குறிப்பிட்டார். நான் இந்தச் சம்பவம் தொடர்பில் விசாரித்த போது, குறித்த சபைகளுக்கு இந்த விடயம் எதுவும் தெரிவிக்கப்படாமல் இருந்ததாக -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

මීළඟට, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය, ගරු වසන්ත සමරසිංහ මහතා. 2025.11.08 වන දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ප්‍රතිලාභ සහ "එට්කා" ගිවිසුම පිළිබඳ සාකච්ඡා: වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## இந்திய-இலங்கை சுதந்திர வர்த்தக ஒப்பந்தத்தின் நன்மைகள் மற்றும் ETCA தொடர்பான பேச்சுவார்த்தைகள்: வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று

## BENEFITS OF INDO-SRI LANKA FREE TRADE AGREEMENT AND NEGOTIATIONS ON ETCA: STATEMENT BY MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, 2025.11.08 දින ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට මා පිළිතුර ලබා දෙනවා. මේ ප්‍රශ්නයට පිළිතුර පිටු 7ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. පිළිතුර කියවන්නද? සභාගත කරන්නද? කියවන්නත් පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලබා දෙන්න පුළුවන්. තිබෙන්නේ විනාඩි පහයි-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම එහෙම නම් පිළිතුර කියවාගෙන ගිහිල්ලා ඉතිරි වුණොත්, ඒ ඉතිරි කොටස සභාගත කරන්නම්. එහෙම හොඳයි ද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු අමාත්‍යතුමනි, කාලය ගත වෙන නිසා සභාගත කරන්න. නමුත්, වැදගත් ප්‍රශ්නවලට පිළිතුර කියවන්න පුළුවන් නම් ඒක හොඳයි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා ප්‍රශ්න 9ක් අහලා තිබෙනවා. ඔබතුමා කිව්වොත්, මට ඒ අදාළ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න පුළුවන්. නැත්නම් මම පිළිතුර කියවන්නද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පළමු ප්‍රශ්නයට පිළිතුර කියන්න. මම කියන්නම් සම්පූර්ණ පිළිතුර කියවන්න ඕනෑද, සභාගත කරන්න ඕනෑද කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඇමෙරිකානු ඩොලර් බිලියන 3.76ක ආනයන හා සැසඳීමේදී ඉන්දියාව වෙත කරන ශ්‍රී ලංකාවේ අපනයන 2024 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 884ක් පමණක් වී ඇති බව සත්‍යයක් වුවද, මෙම වෙළඳ පරතරය ඉන්දු-ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ ප්‍රතිඵලයක් නොවන බව මෙහි ලා සටහන් කිරීම වැදගත් වේ. ඊට ප්‍රතිවිරුද්ධව ඉන්දියානු වෙළෙඳ පොළ තුළ ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පවත්වා ගැනීමට හා පුළුල් කිරීමට අපගේ අපනයනකරුවන්ට හැකියාව ඇති කරමින්, වැදගත් වරණීය ප්‍රවේශයන් ලබා දෙන එම නිදහස් වෙළෙඳ ගිවිසුම ශ්‍රී ලංකාවට බෙහෙවින්ම වාසිදායක වී ඇත.

ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම් තීරු බදු සහන යටතේ 2024දී ශ්‍රී ලංකාව ඇමෙරිකානු ඩොලර් මිලියන 493.22ක වටිනාකමින් යුත් භාණ්ඩ ඉන්දියාවට අපනයනය කර තිබෙන අතර, එය ඉන්දියාව වෙත කළ ශ්‍රී ලංකාවේ මුළු අපනයනයන්ගෙන් සියයට 50කට ආසන්න වේ. මෙයින් පැහැදිලිව පෙන්නුම් කරනුයේ ඉන්දියානු වෙළෙඳ පොළ වෙත ශ්‍රී ලංකාවේ අපනයනයන්ගෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් ගිවිසුම හරහා සපයනු ලැබූ වරණීය ප්‍රවේශය මත සෘජුවම පරායත්ත වී ඇති බවයි. මෙම ගිවිසුම නොතිබුණේ නම්, අපනයන ඉපැයුම්වලින් ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන භාගයක් පමණ අපට අහිමි වීමට තිබුණි.

අනෙක් අතට, ඉන්දියාවෙන් අප සිදු කළ සමස්ත ආනයනවලින් වෙළෙඳ ගිවිසුම් තීරු බදු සහන යටතේ පිවිසියේ සියයට 8.6ක් (ඇමෙරිකානු ඩොලර් මිලියන 324.78ක්) පමණි. මෙයින් අදහස් වනුයේ, එම ගිවිසුම ඉන්දියානු අපනයනකරුවන්ට වඩා ඉතා ඉහළ ප්‍රතිලාභ ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට ලබා දී ඇති බවයි.

භූගෝලීය සමීපත්වය, සැපයුම් විශ්වසනීයත්වය, ඓතිහාසික හා සංස්කෘතික බැඳීම්, ආර්ථික ඌනපූරකතා, කලාපීය සම්බන්ධතාව, ආයෝජන සබැඳි හා උපාය මාර්ගික පෙළගැස්ම වැනි විවිධ හේතූන් නිසාවෙන්, වෙළෙඳ ගිවිසුම නොමැති වුවද, ඉන්දියාව ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෙළෙඳ පාර්ශ්වකරුවෙක් වේ.

එබැවින් ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමට එරෙහිව සාක්ෂි ලෙස ආනයන සංඛ්‍යාලේඛන සලකා බැලීම නිවැරදි නොවේ. දත්ත මගින් පැහැදිලිව පෙන්නුම් කරනුයේ ගිවිසුම ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය ශක්තිමත් කොට අපගේ නිෂ්පාදකයන් සඳහා වෙළෙඳ පොළ ප්‍රවේශය ආරක්ෂා කර දී ඇති බවයි.

ශ්‍රී ලංකාව හමුවේ ඇති අභියෝගය වනුයේ වෙළෙඳ ගිවිසුම නොව එමගින් සපයනු ලබන අවස්ථාවන්වලින් මීටත් වඩා වාසියක් ලබා ගැනීම පිණිස අපගේ අපනයන තරගකාරිත්වය සහ විවිධාංගීකරණය වැඩි දියුණු කර ගැනීමයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, 3වන සහ 4වන ප්‍රශ්නවලට පිළිතුර කියවන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

හොඳයි.

3. ඉන්දියාව සමඟ ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම ඉදිරියට රැගෙන යාමට වර්තමාන රජය කැපවී සිටියි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් වන කවර හෝ අනාගත මැදිහත් වීමක් මැනවින් දැනුවත්ව, උපායමාර්ගික පෙළගැස්මක් සහිතව හා ජාතික වශයෙන් අනන්‍ය ආකාරයෙන් සිදු කරනු ලැබීම අත්‍යවශ්‍ය වේ.

මේ උදෙසා මම දැනටමත් සඳහන් කර ඇති පරිදි, පවතින සියලු නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳව පුළුල් සමාලෝචනයක් සිදු කර ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම් ඇතුළුව අනාගත වෙළඳ ගිවිසුම් සඳහා උපායමාර්ගික දිශානතිය, ප්‍රමුඛතා සහ සාකච්ඡා රාමුවක් පිළිබඳව පැහැදිලි නිර්දේශ සැපයීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් ඉහළ මට්ටමේ කමිටුවක් පත් කර තිබේ. එම කමිටුවේ නිර්දේශ ලැබීමෙන් අනතුරුව ප්‍රධාන සාකච්ඡාකරුවන් පත් කිරීම හා විස්තරාත්මක සාකච්ඡා විධිනියෝගයක් ස්ථාපිත කිරීම අවසන් කරනු ලැබේ. පැහැදිලි අරමුණක් හා ඒකාබද්ධ ජාතික ස්ථාවරයක් සහිතව ශ්‍රී ලංකාව මීළඟ සාකච්ඡා වටයට එළඹීම මෙම ප්‍රවේශය මඟින් තහවුරු කරනු ඇත. ඒ අනුව, එකී කමිටුව මඟින් සපයනු ලබන මග පෙන්වීම මත පදනම්ව ඉන්දියාව ඇතුළුව අපගේ ද්විපාර්ශ්වික පාර්ශ්වකරුවන් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡාවන් රජය විසින් මුල පුරා යළි ආරම්භ කරනු ඇත.

4. ඉන්දියාවේ ශීඝ්‍ර ආර්ථික වර්ධනය සහ ප්‍රධාන ගෝලීය ආර්ථික කේන්ද්‍රස්ථානයක් ලෙස එහි නැඟී සිටීම නිසැකවම ශ්‍රී ලංකාවට සුවිශේෂී අවස්ථා නිර්මාණය කරනු ඇත. අන්‍යෝන්‍යව ප්‍රතිලාභ ලැබෙන ආකාරයෙන් ඉන්දියාවේ අගය දාමය, කාර්ය සම්පාදන ක්ෂේත්‍රයන්ට හා සේවා පද්ධති සමඟ අපගේ ඒකාබද්ධ වීම ශක්තිමත් කිරීමේ උපාය මාර්ගික වැදගත්කම රජය පූර්ණව අවබෝධ කොට ඇත.

කෙසේ වෙතත්, වඩා පුළුල් ඒකාබද්ධතාවක් සඳහා සුපරීක්ෂාකාරී සැලසුම්කරණය, ශක්තිමත් දේශීය පූර්ව සූදානම සහ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ පෙළ ගැසීම අවශ්‍ය වේ. එය කඩිනමින් හෝ එම අවස්ථාවලින් අපගේ දේශීය කර්මාන්ත, නියාමන රාමු සහ ආයතනික ධාරිතා ප්‍රතිලාභ ලැබීමට සූදානම් බව සහතික කිරීමෙන් තොරව සිදු කළ හැකි නොවේ.

ඒ අනුව, ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාවේ වෙළඳ හා ආයෝජන රාමුව ශක්තිමත් කිරීම පිණිස වූ ව්‍යූහගත ක්‍රියාදාමයක රජය වර්තමානයේ නියැළී සිටී. ජාතික අභිලාෂයන් සහ තරගකාරිත්වය සුරක්ෂිත කරන අතරම, කලාපීය වශයෙන් පවතින අවස්ථාවන්, විශේෂයෙන්ම ඉන්දියාවේ ආර්ථික ප්‍රසාරණය මඟින් පැන නඟින අවස්ථාවන් වඩා වාසිදායක අන්දමින් ශ්‍රී ලංකාවට යොදා ගත හැක්කේ කෙසේද යන්න හඳුනා ගැනීමේ අරමුණ ඇතිව, මා කලින් සඳහන් කළ අමාත්‍ය මණ්ඩලය පත් කළ ඉහළ මට්ටමේ කමිටුව විසින් දැනට සිදු කරමින් පවතින සියලු වෙළඳ ගිවිසුම් සමාලෝචනය කිරීම මීට ඇතුළත් වේ.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

මීට සමගාමීව, සේවා සැපයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, වෙළෙඳ පරිපාටි සරල කිරීම හා ආයෝජන පරිසරය ශක්තිමත් කිරීම පිණිස රජය ප්‍රතිසංස්කරණ සිදු කරමින් සිටී. මෙම ක්‍රියාමාර්ග සැලසුම් කරනු ලැබ ඇත්තේ ඉන්දීය වෙළෙඳ පොළට සම්බන්ධ අගය දාම ඇතුළුව කලාපීය හා ගෝලීය අගය දාම තුළට ඒකාබද්ධ කිරීමට වඩා හොඳින් ශ්‍රී ලංකාව ස්ථානගත කරනු පිණිසය.

එබැවින්, ශක්තිමත්, මනා සූදානමක් සහිත දිගු කාලීන ජාතික ප්‍රතිලාභ අත්කර ගැනීමේ තත්ත්වයක සිට ඉන්දියාවේ වර්ධනය වන ආර්ථික පරාසය සමඟ ශ්‍රී ලංකාව කටයුතු කිරීම සහතික කරමින්, අපගේ එළඹුම උපායමාර්ගික වේගයකින් ඉදිරිය කරා යැමයි.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයෙහි 2, 5, 6 සහ 7 යන කොටස්වලට අදාළ පිළිතුරු මම **සභාගත*** කරනවා.

8. ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිවිසුම් රාමුව පිළිබඳ පුළුල් ඇගැයීමක් සිදු කර, එම ප්‍රතිඵල මහ ජනතාව සහ පාර්ලිමේන්තුව වෙත දැනුම් දීමේ වැදගත්කම රජය හඳුනාගෙන තිබේ. ඒ අනුව, නිශ්චිතව එවැනි සමාලෝචනයක් සිදු කිරීම පිණිස ව්‍යුහගත ක්‍රියාදාමයක් වත්මන් රජය දැනටමත් ආරම්භ කර තිබේ.

මම දැනටමත් සඳහන් කර ඇති පරිදි ඉන්දු-ලංකා වෙළෙඳ ගිවිසුමේ 25 වසරක කාර්ය සාධනය ඇතුළුව පවතින සියලු නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳ පූර්ණ, තාක්ෂණික ඇගැයීමක් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය ඉහළ මට්ටමේ කමිටුවක් පත් කර තිබේ.

මෙම සමාලෝචනය ආංශික වාසි හා අභියෝග, සේවා නියුක්ති බලපෑම්, ආයෝජන ගලා ඒම්, අපනයන විවිධාංගීකරණය සහ සමස්ත වෙළෙඳ ශේෂය වැනි පුළුල් ක්ෂේත්‍ර මාලාවක් ආවරණය කරයි. මෙම කාර්යයේ අරමුණ වන්නේ, ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම පිළිබඳව සිදු කරන කවර හෝ කටයුතක් ඇතුළුව, අනාගත වෙළෙඳ සාකච්ඡා නිවැරදි දත්ත, ස්වාධීන විශ්ලේෂණ සහ ජාතික අභිලාෂයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් මඟින් මඟ පෙන්වනු ලබන බව සහතික කිරීමයි.

පාරදෘශ්‍ය සාකච්ඡාවකට හා දැනුවත් තීරණ ගැනීමට පහසුකම් සැලසීම පිණිස කමිටුවේ අනාවරණයන් පාර්ලිමේන්තුව ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් සමඟ බෙදා හදාගත හැකි විස්තීර්ණ ප්‍රතිපත්ති සාකච්ඡාවක පදනම නිර්මාණය කරනු ඇත.

9. සංචාරක ව්‍යාපාරය, වරාය සංවර්ධනය සහ මූල්‍ය අංශයේ සම්බන්ධතා යනු, ඉන්දියාව දැනටමත් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන ක්ෂේත්‍ර වන අතර, ශ්‍රී ලංකාවට ඉහළ ඉපැයීම්, ආයෝජන සහ රැකියා උත්පාදනය කළ හැකි ආකාරයෙන් සහයෝගීතාව පුළුල් කිරීමට ඇති විභවය රජය පිළිගනී.

කෙසේ වෙතත්, ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම යටතේ විස්තරාත්මක ආංශික බැඳීම් තවමත් සාකච්ඡා කරමින් පවතින බව මෙහිලා සටහන් කිරීම වැදගත් වේ. සාකච්ඡා සිදු කරමින් පවතින බැවින්, මෙම අවස්ථාවේදී නිශ්චිත විධිවිධාන පිළිබඳ කරුණු දැක්වීමට තව කල්ගත වනු ඇත. මට මෙම සභාවට සහතික කළ හැක්කේ, මෙම ක්ෂේත්‍රවල කවර හෝ සහයෝගයක් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබනුයේ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රමුඛතා, නියාමන අවශ්‍යතා සහ අදාළ අංශයන්හි ධාරිතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතා මඟින් මඟ පෙන්වනු ලබන ඉතා සැලකිලිමත් ආකාරයකින් බවයි.

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය, වරාය හා සේවා සැපයුම් සංවර්ධනය සහ මූල්‍ය අංශයේ සම්බන්ධතාව තුළ ඉන්දියාව සමඟ වඩා ඉහළ සහයෝගීතාවක් සඳහා ඇති අවස්ථා, එවැනි සහයෝගීතාවක් ආර්ථික වර්ධනයට සෘජුවම දායක වන බවත්, තරගකාරිත්වය ඉහළ නංවන බවත්, ශ්‍රී ලංකාවේ රැකියා නිර්මාණයට උපකාර වන බවත් සහතික කිරීමේ අරමුණින් විමර්ශනය කිරීම රජය අඛණ්ඩව සිදු කරනු ඇත.

* ***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

2. නිෂ්පාදන පරීක්ෂා කිරීමේ අවශ්‍යතා, ප්‍රමිති සහතිකකරණ පරිපාටි සහ කලාතුරකින් සිදු වන රේගු ප්‍රමාදවීම් වැනි තීරු බදු නොවන ක්‍රියාමාර්ග ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී කලින් කලට සැබවින්ම පැන නඟී. එවැනි ගැටලු රජයේ අවධානයට යොමු කරන ඕනෑම අවස්ථාවකදී, වාණිජ දෙපාර්තමේන්තුව නවදිල්ලියේ, චෙන්නායි සහ මුම්බායිහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල හරහා අදාළ ඉන්දියානු බලධාරීන් සමඟ වහාම සම්බන්ධ වී කටයුතු කරයි. එම මාර්ග තාක්ෂණික උපදේශන සඳහා මං සලසන අතර මෙහෙයුම් බාධක සිදුවීමෙන් නිරාකරණය කිරීම කඩිනම් කරයි.

මෙම මෙහෙයුම් කරුණුවලට අමතරව, ඉන්දියාව විසින් පනවා ඇති ඇතැම් ප්‍රතිපත්ති මට්ටමේ තීරු බදු නොවන ක්‍රියාමාර්ගවලට ද ශ්‍රී ලංකා අපනයනකරුවන් මුහුණ දෙයි. ඇඟලුම් වැනි තෝරාගත් ශ්‍රී ලාංකික නිෂ්පාදන මත කෝටා පැනවීම මෙන්ම කිරිගරුඬ සහ ගම්මිරිස් වැනි භාණ්ඩ සඳහා අදාළ කරගනු ලබන අවම විකිණිය හැකි මිල ආදිය මීට අයත් වේ. මෙම ක්‍රියාමාර්ග නිදහස් වෙළෙඳ ගිවිසුමේ තීරුබදු බැඳීම්වලින් පරිබාහිරව පවතින්නේ වුවද, ගිවිසුම යටතේ පවතින තීරුබදු නිදහස් ප්‍රවේශය පූර්ණය උපයෝජනය කිරීම එමඟින් සීමා කරනු ඇත.

සුදුසු අවස්ථාවන් පැන නඟින කවර හෝ විටකදී, අපගේ අපනයනකරුවන් සඳහා අවහිර කිරීම් අවම කිරීමේ සහ පුරෝකථනය කළ හැකි බව ශක්තිමත් කිරීමේ අරමුණින්, ජ්‍යෙෂ්ඨ නිලධාරි සහ තානාපති මට්ටමින් ඉන්දියාව සමඟ මෙම කරුණ සාකච්ඡා කිරීම ශ්‍රී ලංකාව අඛණ්ඩව සිදු කරයි.

5. ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම් යටතේ සිදු කරන කවර හෝ අනාගත මැදිහත්වීමකදී අවධානමට ලක්විය හැකි දේශීය අංශ සහ සංවේදී වෘත්තීමය සේවා ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව රජය මුළුමනින්ම පිළිගනී. සාකච්ඡා තවමත් සිදු වන බැවින්, රජය කිසිදු අවසන් බැඳීම්වලට එළඹ නොමැත. කෙසේ වෙතත්, අන්තර්ජාතික වෙළෙඳ ගිවිසුම්වල සම්මතයන් වන මැනවින් ස්ථාපිත යන්ත්‍රණ මාලාවක් හරහා ශ්‍රී ලංකාවේ අභිලාෂයන් ආරක්ෂා කරනු ලබන බවට රජය වගබලා ගනු ඇත.

පළමුව, ලිහිල්කරණය සඳහා සූදානම් නොමැති සංවේදී අංශ ආරක්ෂා කිරීම පිණිස නිෂේධන ලැයිස්තුවක් - Negative List - පවත්වාගෙන යනු ලබන බවට රජය සහතික වනු ඇත. අඛණ්ඩ ප්‍රතිපත්ති අවකාශයක් අවශ්‍ය වන කර්මාන්ත ආරක්ෂා කිරීම පිණිස නම්‍යතාව මෙමඟින් සපයනු ඇත.

දෙවනුව, සිදු කිරීමට අපේක්ෂිත යම් වෙළෙඳ පොළ විවෘත කිරීමක් අදියරගතව හා අනුක්‍රමිකව සිදු කරනු ඇත. දේශීය නිෂ්පාදකයන්ට තම තරගකාරිත්වය උචිත ලෙස සකසා ගැනීමට හා ශක්තිමත් කිරීමට ප්‍රමාණවත් කාලය ලබා දෙමින් ලිහිල්කරණය ක්‍රමක්‍රමයෙන් සිදු වන බවට රජය වග බලා ගනු ඇත.

තෙවනුව, සේවාවන් වෙළෙඳාම් ක්ෂේත්‍රයෙහි රජය ප්‍රවේශම්කාරී සහ නියාමන පාදක ප්‍රවේශයක් යොදා ගැනීම අඛණ්ඩව සිදු කරනු ඇත. යම් අනාගත බැඳීමක්, ශ්‍රී ලංකාවේ දැනට පවත්නා දේශීය නීති, නියාමන අවශ්‍යතා සහ ආගමන පාලනවලට සවිමත්ව බැඳී පවතිනු ඇත.

---

**** පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

සිව්වනුව, විදේශීය සේවා සපයන්නන්ගේ සහභාගිත්වයට අවස්ථාව ලබා දෙනුයේ නියාමනය කරනු ලබන සහ ආයෝජන සබැඳි තත්ත්වයන් යටතේ පමණක් වන බවට රජය සහතික කරන අතර, ඒ අනුව වෙළෙඳ පොළ ප්‍රවේශය දේශීය ආර්ථික සංවර්ධනයට අර්ථාන්විතව දායක වනු ඇත.

පස්වනුව, සේවාවන්හි යම් අනාගත ලිහිල් කිරීමක් සුපරික්ෂාකාරීව කළමනාකරණය කරනු ලබන බවට සහ උචිත ආරක්ෂණයන්ට යටත් බවට රජය වගබලා ගන්නා අතර, ඒ අනුව ශ්‍රී ලංකාවේ දේශීය අභිලාෂයන්, වෘත්තීය ප්‍රමිති සහ නියාමන ඒකීයත්වය පූර්ණව පවත්වාගනු ඇත.

සයවනුව, ස්වාභාවික පුද්ගලයන්ගේ සංචරණයන්ට අදාළව, කවර හෝ බැඳීමක් සුපරික්ෂාකාරීව අර්ථ නිරූපණය කරන බවටත්, ශ්‍රී ලංකාවේ ආගමන නීති සහ නියාමන රාමුවලට පූර්ණව යටත් වන බවටත් රජය වගබලා ගනු ඇත.

අවසාන වශයෙන්, 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත හා අංක 3 දරන ආරක්ෂණ පියවර පනත හරහා ශ්‍රී ලංකාව සිය වෙළෙඳ ප්‍රතිකර්ම රාමුව ශක්තිමත් කර ඇත. මෙම පනත් දෙක අසාධාරණ මිලකරණය, සහනාධාර සැපයූ ආනයන හා ආනයන ශීඝ්‍රව ඉහළ යෑමට එරෙහිව දේශීය කර්මාන්තවලට මූලිකවම ආරක්ෂාව සපයයි.

6. ශ්‍රී ලංකාවේ දිගු කාලීන වර්ධන උපායමාර්ගය තුළ පුනර්ජනනීය බලශක්තිය, ඩිජිටල් තාක්ෂණය, නාවික කටයුතු හා සේවා සැපයුම් සහ උසස් අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවල කේන්ද්‍රීය කාර්යභාරය සැලකිල්ලට ගනිමින් එම ක්ෂේත්‍ර ඇතුළු ක්ෂේත්‍රවලට උසස් ගුණාත්මක බවින් යුතු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ වැදගත්කම රජය හඳුනා ගනියි.

විශේෂිත ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුමක් හරහා ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම් රාමුවට පරිබාහිරව ආයෝජන සහයෝගිතාව ලබා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව මෙම සභාවට දැනුම් දීමට මම කැමැත්තෙමි. කෙසේ වෙතත්, ආයෝජන ගලා ඒම් සහ වෙළෙඳාම් ලිහිල්කරණය සංසක්ත හා අන්‍යෝන්‍යව ශක්තිමත් වන ආකාරයකින් ඉදිරියට යෑමට හැකි වන පරිදි ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම අවසන් කිරීමට පෙර ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම අවසන් කරනු ලැබීම අපගේ ප්‍රමුඛතාව ලෙස පවතී.

එම ගිවිසුම් දෙකම පිළිබඳ සාකච්ඡා තවමත් සිදු වෙමින් තිබෙන බැවින්, මෙම අවස්ථාවේදී අංශ අනුව විශේෂිත විස්තරාත්මක සැලසුම් සභාගත කිරීමට තව කල් වේලා තිබේ. එනමුදු, ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම හරහා ඉදිරියට රැගෙන යනු ලබන හෝ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම යටතේ අනුපූරක විධිවිධාන මඟින් සහාය දෙනු ලබන, ඉන්දියාව සමඟ කවර හෝ අනාගත ආයෝජන සහයෝගිතාවක්, ශ්‍රී ලංකාවේ නියාමන රාමුව, ආංශික ප්‍රමුඛතා සහ ජාතික සංවර්ධන උපායමාර්ග සමඟ පූර්ණව අනුගතව පවතින බවට රජය සහතික වෙයි. සියලු නියාමන අවශ්‍යතා සහ ජාතික අභිලාෂයන් පූර්ණව සැලකිල්ලට ගන්නා බවට වගබලා ගනිමින් ප්‍රමාණවත් පාර්ශ්වකාර උපදේශන ද රජය පවත්වනු ඇත.

රජය පාරදෘශ්‍යභාවය කෙරෙහි කැප වී සිටින අතර, සාකච්ඡා ඉහළ අදියරකට එළැඹි විට සහ කෙටුම්පත් ලේඛන සමාලෝචනය සඳහා ලබාගත හැකි විට යෝග්‍ය අවස්ථාවේදී ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

7. ඉන්දියානු වෙළෙඳ පොළ ඇතුළුව විදේශයන්හි රැකියා අවස්ථා සොයන ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වෘත්තීය සුදුසුකම් අන්‍යෝන්‍යව පිළිගැනීම වැදගත් කරුණක් වේ. ඇතැම් නියාමන හා පරිපාටිමය බාධක පවතින බව රජය පිළිගන්නා අතර, ඉන්දියාව සමඟ සිදු කරන අපගේ සේවා ආශ්‍රිත සාකච්ඡාවල වඩා පුළුල් සංදර්භය තුළ මෙම කරුණු සුපරික්ෂාකාරීව විමර්ශනය කරමින් පවතී.

කෙසේ වෙතත්, සහයෝගිතා ගිවිසුම යටතේ හෝ වෙනත් සහයෝගිතා රාමු හරහා වෘත්තීමය සංචලතාව ආශ්‍රිත කවර හෝ සැකසුමක් අවශ්‍යයෙන්ම අන්‍යෝන්‍ය, සමබර හා ශ්‍රී ලංකාවේ නියාමන අවශ්‍යතා, දේශීය ධාරිතාව සහ ශ්‍රම වෙළෙඳ පොළ තත්ත්වයන් සමඟ පූර්ණව සංගත විය යුතු බව අවධාරණය කිරීමට මම කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේ වෘත්තිකයන්ට හෝ සේවා අංශවලට අවාසිදායක වන බැඳීම්වලට අපි නොඑළඹෙන්නෙමු.

අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් යනු, දෙරටෙහිම අදාළ නියාමන හා වෘත්තීය ආයතන අතර විස්තරාත්මක මැදිහත්වීම් අවශ්‍ය කරන්නා වූ, බෙහෙවින්ම තාක්ෂණික සාධන පත්‍ර වේ. එවැනි ක්‍රියාදාම හදිසියෙන් හෝ වෙළෙඳ සාකච්ඡා මඟින් පමණක් සිදු කිරීමට නොහැකිය. ඒවා තත්ත්ව ආරක්ෂණය සහතික කළ යුතුය, දේශීය වෘත්තීය ප්‍රමිති ආරක්ෂා කළ යුතුය, විශේෂයෙන්ම සෞඛ්‍ය හා ඉංජිනේරු වැනි සංවේදී ක්ෂේත්‍රවල පොදු අභිලාෂ ආරක්ෂණ පවත්වාගත යුතුය.

ඒ අනුව, වෘත්තීය සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා සිදු කරමින් පවතින අතර, මෙම අවස්ථාවේදී කාලරේඛා නිශ්චිතව ප්‍රකාශ කිරීමට හෝ අනුගම්‍ය අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වලට බැඳීමට කල් වේලා වැඩිය. කවර හෝ අනාගත සැකැස්මක් සකස් කරනු ලබනුයේ විස්තීර්ණ පාර්ශ්වකාර උපදේශන මඟින් වන අතර, ඒවා දේශීය නියාමන අඛණ්ඩතාව ශක්තිමත් කර ශ්‍රී ලාංකික වෘතිකයන්ට පැහැදිලි හා ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභ සපයනු ඇත.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳමයි, ගරු කථානායකතුමනි.

වෙළෙඳ ඇමතිතුමනි, එම ප්‍රශ්නයට උත්තර දීම සම්බන්ධයෙන් ස්තුතියි. ඇමෙරිකාවත් එක්ක trade tariff එකට අදාළ එකඟතාවකට තවම අත්සන් කරලා නැති නිසා ඇඟලුම් නිෂ්පාදන අපනයනය අපේක්ෂා කරන්න පුළුවන් market එකක් ලෙස ඉන්දියාව දිහා බලන්න හැකියාව තිබෙනවා. ඒගොල්ලෝ කියලා තිබෙන්නේ, ETCA එකට අදාළ කටයුතු පුළුවන් තරම් ඉක්මන් කළොත් ඉන්දියාවට වැඩිපුර අපනයනය කරන්න පුළුවන් වෙයි කියලායි. නමුත් ඔබතුමාගේ පිළිතුර තුළ සඳහන් වුණේ නැහැ, කවදාද ඒක පටන් ගන්නේ කියන එක. අපට ETCA එක වටිනවා. ඒ නිසා ඒක කවදා වන විට පටන් ගන්න පුළුවන්ද? ලංකාවට වාසි වන විධියට ඒක ආරම්භ කරන්නේ කවදාද කියලා ඔබතුමා කිව්වොත් ඒක රටට ගුණයි කියලායි මා හිතන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ETCA එක විතරක් නොවෙයි, අප අත්සන් කරපු ගිවිසුම් දෙකකුත්, එනම් සිංගප්පූරු වෙළඳ ගිවිසුම සහ තායිලන්ත වෙළඳ ගිවිසුම කියන දෙකම නතර වෙලා තිබුණා. සිංගප්පූරු ගිවිසුමට නඩුවක් දමලා තිබුණා. මම හිතන විධියට, ඒ නඩුව දැන් අවසන් වෙලා තිබෙනවා. අමාත්‍ය මණ්ඩලය විසින් ඉහළ විශේෂඥ කමිටුවක් පත් කරලා තිබෙනවා, මේ සියලු ගිවිසුම් පිළිබඳව පසුවිපරම් කරලා කඩිනමින් සාකච්ඡා පටන් ගන්න. ඒ අනුව අපි වෙළෙඳ ගිවිසුම්වල තිබෙන අඩුපාඩුත්, කඩිනම් කළ යුතු ක්ෂේත්‍රත් හඳුනාගෙන අවශ්‍ය කටයුතු කඩිනමින් පටන් ගන්නවා. අපි ජනවාරි මාසයේ සිට මේ සියලු ගිවිසුම්වල තිබෙන අඩුපාඩු හඳුනාගෙන, අදාළ කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දෙන්න කියලා ජනාධිපතිතුමා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවට අවශ්‍ය උපදෙස් ලබා දීලා තිබෙනවා. මේ සඳහා වන සාකච්ඡාවලට ප්‍රවිෂ්ට වීමේ අවශ්‍යතාවක් රජය හඳුනාගෙන තිබෙනවා. ලබන වසරේ මුල් කාර්තුවේදී මේ සාකච්ඡා සඳහා ප්‍රවිෂ්ට වීමට හැකියාව තිබෙනවා නම් හොඳයි කියන අදහසේ තමයි රජය ඉන්නේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර තිබෙන එම කමිටුව ඒ සඳහා අපට අවස්ථාව ලබා දෙනවා නම්, අපි ඒ සඳහා සූදානම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,-

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න සම්බන්ධයෙන් පක්ෂ නායක රැස්වීමට ලේකම් මණ්ඩලය ඉදිරිපත් කරපු මාර්ගෝපදේශය ගරු අමාත්‍යවරුන්ටත් යවන්න කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් න්‍යාය පත්‍රයේ සඳහන් නොවීම ගැන අපි Parliamentary Business Committee එකේදීත් කිව්වා. සාමාන්‍යයෙන් මෙතෙක් කල් තිබුණු ක්‍රමය තමයි, අහවල් දින අහවල් මන්ත්‍රීවරයා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ නඟන ලද ප්‍රශ්නයට පිළිතුර අහවල් අමාත්‍යවරයා විසින් ලබා දෙනවා කියලා න්‍යාය පත්‍රයේ සඳහන් කරන එක. එතකොට සභාවේ සිටින සියලුම මන්ත්‍රීවරු දන්නවා, ඒ ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන බව. එදා, Parliamentary Business Committee එකේදී ඒක පිළිගත්තා. ඒ නිසා කරුණාකර ඒක ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඒක ඇතුළත් කරන්න බැහැ. ඔය ඔබතුමා ළඟ තිබෙන්නේ Order of Business එකයි; පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය නොවෙයි. ඔබතුමාට ලබා දෙන ඔය ලේඛනයට එය ඇතුළත් කරන්න පුළුවන්. ඔබතුමා න්‍යාය පත්‍රය වශයෙන් හඳුන්වන්නේ- *[බාධා කිරීමක්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි එදා Parliamentary Business Committee එකේදී මේ ගැන කථා කළා. ඊට පස්සේ මීට පෙර ඉදිරිපත් කරපු ප්‍රශ්නවලට මොන ආකාරයෙන්ද උත්තර දීලා තිබෙන්නේ කියා බලලා ඒක ඊළඟ රැස්වීමේදී ගන්නවා කියලා කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දීමට අදාළව අද දින කළ Announcement එකේදී මම කිව්වා, "2025.11.08 වැනි දින ගරු රවි කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම" කියලා. ඔබතුමාගේ ප්‍රශ්නය ගැන කියන්න ගිහින්, ආපහු ප්‍රශ්න නවයක් sort out කරන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ ප්‍රශ්නය ඒක නොවෙයි, ගරු කථානායකතුමනි. මගේ ප්‍රශ්නය තමයි, අපි එදා Parliamentary Business Committee එකේ කථා කළා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, Parliamentary Business Committee එකේදී අපි තීරණය කළා, විනාඩි 5ක් ඇතුළත ප්‍රශ්නය ඇසිය යුතුයි, විනාඩි 5ක් ඇතුළත ප්‍රශ්නයට පිළිතුරු ලබා දිය යුතුයි කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ ප්‍රශ්නය ඔබතුමා දන්නවා නම් මට අහන්න අවශ්‍යතාවක් නැහැ නේ. මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. අපි එදා කිව්වා, මීට පෙර හිටපු මන්ත්‍රීවරුන් සහ පක්ෂ නායකවරුන් තීන්දු ගත් ආකාරය බලලා ඊට පසුව පැවැත්වෙන රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා කියලා. ඒක උදාහරණයක් වශයෙන් අරගෙන, වැරදි නිවැරදි කරලා ඉදිරියට කටයුතු කරගෙන යන එක ගැන තමයි එදා කථා කළේ. ඊට පසුව දවසකින් ඒකේ Minutes එවලා, ඊට පස්සේ ඒක ක්‍රියාත්මක කරන්න බැඳී සිටිනවා. ඒ අනුව කටයුතු කළ යුතුයි. *[බාධා කිරීමක්]* එදා කථා කරපු එක සම්බන්ධයෙන් අප කොහොමද ඉදිරියට යන්නේ කියන ප්‍රශ්නයට

මේ අවස්ථාවේ උත්තරයක් ලැබුණේ නැහැ. ඉතින්, අප ප්‍රශ්න අහන ආකාරය මෙතරම් ඉක්මනට වෙනස් කරන්න අවශ්‍ය නම්, අපි අහපු ප්‍රශ්නවලටත් උත්තරයක් සැපයිය යුතුයි නේද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා හිතන විධියට අපට යම්කිසි discipline එකක් අවශ්‍යයි. අප යම්කිසි සභාවක කථා කරලා යම්කිසි තීරණයකට ආවාට පස්සේ අඩු ගාණේ දේශපාලන නායකයන් වශයෙන්වත් අපි ඒ තීරණය රකින්න ඕනෑ. Parliamentary Business Committee එකේදී මේ සම්බන්ධව ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ විරෝධයක් තිබුණා. ඒක minute කළා. ගරු විපක්ෂ නායකතුමාගේත් අදහස් තිබුණා. ඒවාත් minute කළා. නමුත්, ලේකම් මණ්ඩලය ඔවුන්ගේ අත්දැකීම් මත එවපු guidelines අපි පිළිගත්තා. එහෙම පිළිගත්තාට පසුව ඒකට සහභාගි වුණු මන්ත්‍රීවරයෙක් මෙතැන නැවත ඒ ගැන ප්‍රශ්න මතු කරනවා නම්, මා හිතන්නේ සභාවක් එහෙම කරගෙන යන්න බැහැ කියලායි. ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ඔක්කෝම ප්‍රශ්නවලට උත්තර දීමේ අරමුණ තමයි අපට තිබෙන්නේ. ඒක ලේකම් මණ්ඩලයයි සකස් කළේ; ඒක අපි සකස් කරපු දෙයක් නොවෙයි. ඒක මම දුටුවේත් ඒ වෙලාවේයි. නමුත්, අපි ඒක adopt කළා. එම නිසා මම කරුණාවෙන් ඉල්ලා සිටින්නේ අපි ඒ විධියට යමු කියලායි. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. අද අමාත්‍යවරුන් තුන්දෙනෙකුගේ අමාත්‍යාංශවලට අයත් වැය ශීර්ෂ පිළිබඳ විවාදය තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදනය, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ගරු මේජර් ජෙනරාල් විශ්‍රාමික අරුණ ජයසේකර මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද ඔබතුමා කියන්නේ, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කරුණාකරලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අපි එදා කථා කළා නේ, Parliamentary Business Committee එකේදී, එය කෙසේ විය යුතුද කියලා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ කථා කරපු එක සම්බන්ධයෙන් තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි සභාව ඉදිරියට පවත්වා ගෙන යමු. *[බාධා කිරීමක්]* ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා.

## "මා පිය රැකවරණ" දීමනාව අත්හිටවූ බවට පළවන මාධ්‍ය වාර්තා: නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ ප්‍රකාශය
## 'மா பிய ரெகவரன' கொடுப்பனவு நிறுத்தம் குறித்த ஊடக அறிக்கைகள்: பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று
## MEDIA REPORTS ON HALT OF "MAA PIYA REKAWARANA" ALLOWANCE STATEMENT BY DEPUTY MINISTER OF DEFENCE

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත ප්‍රකාශය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, රණවිරුවන්ගේ දෙමව්පියන් වෙත ගෙවනු ලබන "මා පිය රැකවරණ" රුපියල් 750ක දීමනාව හිමි ගැන්වීම අත්හිටුවා ඇති බවට පසු ගිය දා මාධ්‍යයෙන් අසත්‍ය ප්‍රචාරයක් ගෙන ගියා. රණවිරුවන්ගේ දෙමව්පියන් වෙත ගෙවනු ලබන රුපියල් 750ක මාසික දීමනාව අත්හිටුවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය කිසිදු තීරණයකට එළඹී නොමැති බව ප්‍රකාශ කරන අතර, මෙම දීමනාව දැනටමත් ත්‍රිවිධ හමුදා මඟින් සහ රණවිරු සේවා අධිකාරිය මඟින්, මේ සඳහා හිමිකම් ලබන රණ විරුවන්ගේ දෙමව්පියන් වෙත ගෙවීම සිදු කරන අතර එහිදී අදාළ ප්‍රතිලාභීන් ජීවත්ව සිටින බවට වාර්ෂිකව -වසරකට දෙසැරයක්; පළමුවැනි මාස 6ට සහ දෙවැනි මාස 6ට - තහවුරුවක් ලබා ගැනීම සිදු කරනවා. මෙලෙස ජීවත් වීමේ තහවුරුව ඉදිරිපත් නොකරන ලද ප්‍රතිලාභීන් වෙත මෙම දීමනාව ගෙවීමට අවශ්‍ය වන අදාළ තහවුරුව ඉදිරිපත් කරන තෙක් පමණක් තාවකාලිකව අදාළ ගෙවීම සිදු කරන ආයතන විසින් නතර කර ඇති අතර, අදාළ තහවුරුව ඉදිරිපත් කර මෙම දීමනාව ඔවුන් වෙත ලබා ගත හැකිය. මෙම දීමනාව කොහෙත්ම අත්හිටුවා නොමැත.

මෙම පියවර පවතින මූල්‍ය කළමනාකරණ අවශ්‍යතාවන් මත ගෙන ඇති ආරක්ෂණයක් බවත්, මෙම දීමනාව අත්හිටුවා ඇති බවට විවිධ පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලබන සාවද්‍ය තොරතුරුවලට නොරැවටෙන ලෙසත්, ආරක්ෂක අමාත්‍යාංශය රණවිරු ප්‍රජාව සහ මහ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. රණවිරු සේවා අධිකාරිය වෙතින් දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලත්

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

ප්‍රතිලාභීන් ගණන 32,867යි. ජුනි මස අවසන් වන විට පළමුවන අඩ වසර ගෙවීම් සිදු කරන ප්‍රතිලාභීන් ගණන 17,636යි. ජූලි මස සිට දෙවන අඩ වසර සඳහා ජීවන සහතික එවා ඇති ගණන 4,727යි. ඒ අනුව මේ වන විට දෙවන අඩ වසර සඳහා ජීවන සහතික එවා නොමැති හිමිකම්ලාභීන් සංඛ්‍යාව 28,140යි. එහෙත් සානුකම්පිකව සලකා බලා රණවිරු සේවා අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය විසින් පළමු අඩ වසර සඳහා ඉදිරිපත් කොට ඇති ජීවන සහතික වලංගු සේ සලකා එම 17,636 දෙනාටම දෙවන අඩ වසර සඳහා ද මෙම දීමනාව ගෙවීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව පසුගිය 20 සහ 21 දිනයන්හි මුදල් බැංකුගත කර ඇත.

මීට අමතරව, රණවිරු සේවා අධිකාරිය මඟින් දිවයිනේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුළ පදිංචි සියලු ප්‍රතිලාභීන්ගේ විස්තර ඉදිරිපත් කොට ඔවුන් දැනුවත් කරන ලෙස සහ ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් හැකි කඩිනමින් ඔවුන්ගේ ජීවත් වීමේ සහතික ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත. මේ වන විට එයටද ප්‍රතිචාර ලැබෙමින් පවතී.

ප්‍රතිලාභියකු මිය ගිය වහාම ඒ මිය යෑම පිළිබඳව මරණ සහතිකයක් සමඟ රණවිරු සේවා අධිකාරිය වෙත දැනුම් දෙන ලෙස ඥාතීන් වෙත පොදු උපදෙස් ලබා දී ඇතත්, මේ දීමනාව වෙනත් අයවලුන්ට ලබාගත නොහැකි බැවින් ඒ පිළිබඳව ඥාතීන් දක්වන උනන්දුව ඉතාම අල්ප බව නිරීක්ෂණය වේ. ඒ නිසාම මිය ගිය පසු මරණ සහතිකය නොලැබීමෙන් සහ මිය ගිය බව දැන ගැනීමට නොහැකි වීමෙන් මෙම දීමනාව ගෙවීමේදී බොහෝ ගැටලුකාරී තත්ත්වයන් ඇති වී තිබේ.

මිය ගිය අයෙකු වෙත මුදල් බැර වුවහොත් එය රාජ්‍ය විගණනයේදී රාජ්‍ය මුදල් අවභාවිතාවක් ලෙස නිරීක්ෂණය වනු ඇත. දිස්ත්‍රික්ක වැඩසටහන් සම්බන්ධයෙන් නිලධාරීන් මාර්ගයෙන් සහ රණවිරු සංසද මාර්ගයෙන් ප්‍රතිලාභීන් දැනුවත් කොට ඇත.

ඉහත පණිවුඩය විකෘති කර මාධ්‍ය හරහා සමාජගත කිරීම සුදුසු නොවේ. මෙසේ සාවද්‍ය තොරතුරු මාධ්‍යගත කිරීම, මේ රජය විසින් රණ විරුවන්ට වෙනසක් කරනවා කියන තත්ත්වයක් නිර්මාණය කර ඔවුන් අතර රජය කෙරෙහි වැරැදි අවබෝධයක් ඇති කිරීමකි. එය කොහෙත්ම සුදුසු නොවේ.

ගරු කථානායකතුමනි, රණවිරු ප්‍රජාව ඉතාම විනයගරුකව, බුද්ධිමත්ව කටයුතු කරන බව අපට විශ්වාසයි. රණ විරුවන් මේ දේශය රැකපු සුවිශේෂී ජන කොටසක් බව අප රජය ඉතාම හොඳින් අවබෝධ කරගෙනයි සිටින්නේ. අපි බොහොම බුද්ධියෙන්, අමාරුවෙන් මේ අතිශය අසාධ්‍ය වූ රට ගොඩනැඟීමට යන මේ අවස්ථාවේ සියලු මාධ්‍ය සහ ජනමාධ්‍යවලින් ඉල්ලා සිටිනවා, සදාචාරාත්මකව මේ කටයුතු කරන ලෙස.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ ක්‍රියාකාරී දින 16 සනිටුහන් කිරීමේ ගෝලීය ව්‍යාපාරය සංකේතවත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් අද දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්හට නිල ලාංඡන පැළඳවීමට කටයුතු කරන අතර, ඒ සම්බන්ධව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපති සහ අමාත්‍ය ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය විසින් සභාවේ අවසරය ඇතුව කරනු ලබන අදහස් දැක්වීම.

ගරු අමාත්‍යතුමියනි, ඔබතුමියට විනාඩි 4ක් ලබා දෙනවා.

**ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිටු දැකීම සඳහා වන දින 16ක වැඩසටහන අද දවසෙන් ආරම්භ වෙනවා. ඒක නිල වශයෙන් හෙට දවසෙන් -25වැනිදායින්- ආරම්භ වෙලා දෙසැම්බර් 10වැනිදා දක්වා පවතිනවා. දෙසැම්බර් 10 කියන්නේ, ලෝකයේ මානව හිමිකම් පිළිබඳව කථා කරන දිනයයි. එහෙම නම්, ලෝක මානව හිමිකම් දිනයෙන් තමයි එය අවසන් වෙන්නේ.

ප්‍රචණ්ඩත්වයෙන් තොරව ජීවත් වීම, පීඩා විරහිතව ගෞරවයෙන් ජීවත් වීම මනුෂ්‍ය හිමිකමක් කියන එක පදනම් කරගෙන 1991 වර්ෂයේ පටන් ලෝකය පුරාම මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. පීඩාවකින් තොරව ජීවත් වීම මනුෂ්‍ය හිමිකමක් කියන එක ලෝකයම පිළිගන්නා කාරණයක්. ඒක කාන්තාවන්ට පමණක් අදාළ වුවක් නොවෙයි. අද දවසේ අප මේ කාරණය ප්‍රකාශයට පත් කළාම අපේ සහෝදර මන්ත්‍රීවරුන් බොහෝදෙනෙකු කියපු දෙයක් තමයි, "කාන්තාවන්ට විතරක් නොවෙයි, ඇත්තටම හිංසනයෙන් තොරව අපිටත් ජීවත් වෙන්න ඕනෑ" කියන එක. අපි පිළිගන්නවා ඒක. මුළු පාර්ලිමේන්තුවම පිළිගන්නවා, ගැහැනු පිරිමි භේදයක් නැතිව, අපි සියලුදෙනාටම පීඩාවෙන් තොරව සමානාත්මතාවෙන් යුතුව ජීවත් වෙන්න ඕනෑ කියන එක.

මම මේ වෙලාවේ කියන්න ඕනෑ මෙම වැඩසටහනෙහි මෙවර -2025 වර්ෂයේ- තේමාව ගැන. Online අවකාශය, එහෙම නැත්නම් ඩිජිටල් අවකාශය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගෙන සිදු වන හිංසනය පිටු දැකීම සඳහා, තාක්ෂණය භාවිත කරමින් සිදු වන හිංසනයන් වළක්වා ගැනීම සඳහා මේ වසර නම් කරලා තිබෙනවා. එහිදී අපට කථා කරන්න තිබෙන්නේ මේකයි. දේශපාලන වේදිකාවේදී, දේශපාලනයේදී අපට පරස්පර මත තිබෙන්න පුළුවන්; ප්‍රතිපත්තිවලින් අපි වෙනස් වෙන්න පුළුවන්. ඒ ඕනෑම දෙයක් අපි භාර ගන්න කැමැතියි. ඒ පරස්පරතා හා මතවාද එක්ක හැප්පෙන්නත් අපි කැමැතියි. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අද අපි මේ පාර්ලිමේන්තුවට යෝජනා කරනවා, "අපි මතවාදීව ගැටෙමු. ඒක ගැටලුවක් නැහැ. ප්‍රතිපත්ති ගැන සාකච්ඡා කරලා ඒ පරස්පරතාවලින් අපි හැප්පෙමු. ඒක ගැටලුවක් නැහැ. හැබැයි, ඒ තුළ කෙනෙකුගේ ස්ත්‍රීත්වයට හෙවත් ගැහැනුකමට සහ පිරිමිකමට එහා ගිහිල්ලා -ගැහැනිය හෝ පිරිමියා කියන තැනින් එහාට ගිහිල්ලා- ජීවිතය, පවුල, පරිසරය, සමාජය තුළ එකිනෙකාගේ පෞද්ගලිකත්වයට හානි වන විධියේ අප අතර වන හිංසනය, එහෙම නැත්නම් ඒ ආකාරයේ වන වෛරී ප්‍රකාශ, සාකච්ඡා අපි පිටු දකිමු. විශේෂයෙන්ම මේ උත්තරීතර සභාව තුළ එය පිටුදැකීම සඳහා අපි එකිනෙකා වගවෙමු; ඒ වගකීම භාර ගනිමු" කියලා. ඒක තමයි අප මේ අවස්ථාවේ යෝජනා කරන්නේ.

ඊයේ පෙරේදා පුවත් පතක වාර්තා වෙලා තිබුණා, 2024 වර්ෂයේ ලෝකයේ කාන්තාවන්ගෙන් මිලියන 315ක් ලිංගික හිංසනයට ලක් වෙලා තිබෙන බව. ඒ, ලෝකයේම! මේක ලංකාවට විතරක් ආවේණික දෙයක් නොවෙයි. ලෝකයේම කාන්තාවන් මිලියන 315ක් ලිංගික හිංසනයට ලක් වෙලා තිබෙනවා කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ නිසාම අපි මේ ප්‍රචණ්ඩත්වය අවසන් කරමු. මේ ගැටලුව අතීතයේ පටන් ආවාට විසඳුම අනාගතයට භාර දෙන්න අපට බැහැ. හිංසනය වැළැක්වීම, හිංසනය පිටු දැකීම කියන කාරණාව ගත්තොත්, එය අතීතයේ පටන් පැවැත එන ප්‍රශ්නයක්. ඒ වුණාට එහි විසඳුම අපි අද අපෙන් ආරම්භ කරමු. ඒ යෝජනාව තමයි මට කරන්න තිබෙන්නේ.

කාන්තාවන්ට සහ ගැහැනු ළමයින්ට එරෙහි ඩිජිටල් හිංසනය අවසන් කිරීම සඳහා මේ දින 16 වැඩසටහනට එකතු වෙන්න කියන යෝජනාව UNFPA එක සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය එකතුව අද දවසේ අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. අපි හෙට සිට මේ පිළිබඳව ලංකාව පුරා විවිධ වැඩසටහන් මඟින් දැනුවත් කිරීමේ කටයුතු සිදු කරමින් යනවා.

ඒ වාගේම, ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය මඟින් ලිංගික හිරිහැර කිරීම අපරාධමය වරදක් බව පිළිගන්නවා. වාචික හිංසනවලින්, සයිබර් අවකාශය තුළ සිදු වන හිංසනවලින්, සකලවිධ ප්‍රචණ්ඩත්වයන්ගෙන් තොර කාන්තා සමාජයක්, දරු පරපුරක් අපට අවශ්‍යයි. මොකද, ඉදිරි අනාගතයේදී මේ සමාජය ඇතුළේ අපට අදහස් ප්‍රකාශ කිරීමට තිබෙන අයිතිය ආරක්ෂා කරලා දෙන්න ඕනෑ කියලා අපි හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමිය, දැන් අවසන් කරන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මට තවත් එක විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

இவ்விடயத்தை நான் தமிழிலும் வெளிப்படுத்த வேண்டுமென்று நினைக்கின்றேன். ஏனென்றால், சிங்கள மக்களுக்கு மட்டுமல்லாமல், சிங்கள, தமிழ், முஸ்லிம் ஆகிய அனைத்துச் சமூகங்களிலும் வாழ்கின்ற பெண்களும் சம உரிமையுடன் அரசியலில் ஈடுபடுவதற்கான உரிமையைப் பாதுகாத்துக் கொடுப்பதற்கும், சமூக ஆரோக்கியத்துடன் வாழக்கூடிய - சமூகப் பாதுகாப்புடைய - சமுதாயத்தை உருவாக்குவதற்குமான ஒரு திட்டமாக, சகலவித வன்முறைகளையும் தவிர்க்குமுகமாக, 'பால்நிலை சார் வன்முறைகளுக்கு எதிரான 16 நாட்களைக் கொண்ட செயற்பாட்டுத் திட்டம்' இன்று ஆரம்பிக்கப்படுகின்றது. ஆண்-பெண் சமத்துவம் என்பது முக்கியமானது என்ற வகையில் பெண்களை இலக்காகக்கொண்டு இழிவுபடுத்தல், அவதூறு செய்தல் மற்றும் அவமானமிக்க பேச்சுகளுக்கு வழிவகுத்தல் போன்ற விடயங்களுக்கு எதிரான நடவடிக்கைகளை இதனூடாக நாங்கள் எடுக்க இருக்கின்றோம். அந்த வகையில், இலங்கையில் வாழுகின்ற பெண்கள் எவரேனும் இவ்வாறான நிலைமைகளுக்கு முகங்கொடுக்கவேண்டி ஏற்பட்டாலோ அல்லது எந்தவித வன்முறைக்கும் உள்ளாகினாலோ அவர்கள் தங்களுக்கு ஏற்படுகின்ற எந்தவித பால்நிலை சார் வன்முறைகளையும் பொலிஸ் திணைக்களத்தின் பெண்கள் மற்றும் சிறுவர் பணியக இலக்கம் 109, பெண்கள் மற்றும் சிறுவர்களுக்கான தேசிய உதவிச் சேவை இலக்கம் 1938 மற்றும் இலங்கைக் கணினி அவசர உதவி ஆயத்த அணி - SLCERT - இலக்கம் 101 ஆகிய எந்தத் தொலைபேசி இலக்கங்களூடாகவும்அறிவிக்கலாம்; நீதி கோரலாம் என்பதனை விழிப்புணர்வுக்காக நான் இந்த வேளையில் கூற விரும்புகின்றேன். ஆகவே, நாங்கள் அனைவருமே ஒன்றாகச் செயற்பட்டு இந்த வன்முறைகளைத் தவிர்ப்பதற்கும், ஒருவருக்கு ஒருவர் மரியாதை கொடுக்கின்ற சமுதாயம் ஒன்றைக் கட்டியெழுப்புவதற்கும் கட்டாயம் முன்வருவோம்! முக்கியமாக, இந்தப் பாராளுமன்றச் சபையினுள் எங்களுடைய கருத்துப் பரிமாற்றங்களின்போது தெளிவாக எங்களுடைய கருத்தியல்களை நாங்கள் முன்வைக்கலாம். அதேபோல, எங்களுடைய பாதுகாப்பு, எங்களுடைய தனித்துவம் மற்றும் எங்களுடைய அடையாளங்களை இழிவுபடுத்தாமல், சிங்கள, தமிழ், முஸ்லிம் ஆகிய அனைத்து இனங்களும் ஒன்றாகக் கூடி வாழக்கூடிய ஒரு நாடு எங்களுக்குத் தேவைப்படுகின்றது.

අවසාන වශයෙන් පසුගිය කාල පරාසය තුළ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමිය, දැන් අවසන් කරන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මට තව තත්පර 10ක් දෙන්න, මම ඉක්මනින් අවසන් කරන්නම්.

පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි හැම කෙනාම පුරුදුවලට තමයි ප්‍රතිචාර දක්වන්නේ. නමුත් අපේ වැරදි පුරුදු, අපේ වැරැදි ආභාෂයන් වෙනස් කර ගැනීම සඳහා අද දවස පදනමක් කර ගනිමු කියලා මම සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
Hon. Speaker, today marks the 16 Days of Activism Against Gender-based Violence, which has been declared by the United Nations. The 16 Days of Activism is an annual global campaign against gender-based violence, which runs from the 25th of November to the 10th of December. It begins on the International Day for the Elimination of Violence against Women and ends on the Human Rights Day with an aim to raise awareness and mobilize action to prevent and eliminate violence against women and girls globally. The 2025 global theme introduced by the United Nations highlights a modern human rights crisis and reminds us to "UNiTE! Ending Digital Violence Against All Women and Girls".

[ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය]

A study reveals that women, girls and others frequently experience various forms of online abuse. The most common form of abuse reported by respondents is the creation of fake profiles and sharing of obscene texts and videos, which stands at 36.9 per cent. Sir, amongst other abuses are doctored videos/images, which account for 25.2 per cent, unauthorized exposure of personal information also known as "doxxing", which account for 24.3 per cent, gender trolling, which is at 24.3 per cent and cyber blackmail also known as sextortion or revenge porn, which account for 20.4 per cent. So, when you look at these figures, Sir, you would notice that they are very alarming. In Sri Lanka, 20 per cent of women - that is, one in five women - always endure some form of violence. However, we are happy to note that Section 345 of the Penal Code makes sexual harassment a criminal offence punishable by imprisonment up to five years or a fine or both and allows for compensation to the victim.

ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිටු දැකීම සඳහා වන, දින දහසයේ වැඩසටහන ගෝලීය වශයෙන් නොවැම්බර් මස 25වැනි දින සිට දෙසැම්බර් මස 10වැනි දා දක්වා අපි පවත්වා ගෙන යනවා. ඒ අනුව අපේ ලංකාවේ පාර්ලිමේන්තුව ඇතුළත මෙන්ම පිටතදීත් මෙවැනි වැඩසටහන් රාශියක්, මේ දින දහසය ඇතුළත ක්‍රියාත්මක වෙනවා. මොකද, මේක අපේ කාන්තාවන්ට ඉතා වැදගත් කරුණක්. මම කලින් කියපු ආකාරයට අපේ රටේ කාන්තාවන්ගෙන් සියයට 20ක්, ඒ කියන්නේ කාන්තා ජනගහනයෙන් පහෙන් එකක් යම් කිසි හිංසනයකට ලක් වෙනවා. ඒ හිංසනය වාචික, කායික හෝ මානසික හිංසනයක් වෙන්න පුළුවන්. අපි දත්ත අරගෙන බැලුවොත්, ඇත්තටම මේ සම්බන්ධයෙන් ඉතාම කනගාටුදායක දත්ත තමයි ලංකාවේ තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් කථා කරන්නට මෙවැනි දින දහසයක වැඩසටහනක් ප්‍රමාණවත් මදි. මොකද, පාර්ලිමේන්තුව ඇතුළත වාගේම පාර්ලිමේන්තුවෙන් පිටතදීත් මෙවැනි කාන්තා හිංසන රාශියක් ගැන අපට දැන ගන්නට ලැබෙනවා. කාන්තාවක් ගත්තොත්, ගෙදර ඉඳලා බස් එකෙන් වැඩබිමට යනකොටත් කායික හා මානසික වශයෙන් නොයෙකුත් හිංසනයන්ට ලක් වෙන්නට සිදු වෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ගිය සතියේ පාර්ලිමේන්තුවේදී ප්‍රවීණ මාධ්‍යවේදිනියකට වාචික සහ මානසික හිංසනයකට ලක් වෙන්න සිදු වුණා. ඇත්තටම මේ ආණ්ඩුව වල් පැළ ගලවලා මල් පැළ සිටුවනවා කිව්වත්, අපිට පෙනෙන ආකාරයට ආණ්ඩු පක්ෂයේ සිටින සමහර නියෝජ්‍ය අමාත්‍යවරුන් කාන්තාවන් ගිලින, මඩේ හැදෙන බාඳුරා මල් හා සමානයි කිව්වොත් ඇත්තටම ඒක නිවැරැදියි. ඇත්තටම මල් පැළ නොවෙයි, මල් වටේ කැරකෙන බඹරුන් හා සමානයි කිව්වොත් නිවැරැදියි. මොකද, මමත් ඒ අවස්ථාවේ ඒ මාධ්‍යවේදිනියත් එක්ක හිටියා. ඒ අවස්ථාවේදී ඒ මාධ්‍යවේදිනියට ලොකු හිංසනයකට ලක් වෙන්න සිදු වුණා. මානසික වශයෙන් ලොකු පීඩාවක් එතුමියට ඒ සම්බන්ධයෙන් විඳින්නට සිද්ධ වුණා. මම ඒ සම්බන්ධයෙන් කනගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමියනි, දැන් අවසන් කරන්න.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය වැඩියෙනුත් විනාඩියක් අරගෙන තිබෙනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ඒ වාගේම, අපේ ගරු අගමැතිතුමිය පාර්ලිමේන්තුව ඇතුළතදී විශාල වශයෙන් මේ සම්බන්ධයෙන් කථා කරනවා. එතුමියගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරවනවා. මොකද, ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරියන්ට සිදුවන මේ හිංසන පිළිබඳවත් එතුමියගේ අවධානය යොමු කළොත් හොඳයි කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026 - කාරක සභා අවස්ථාව, දහහතරවන වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-***
***[ප්‍රගතිය: නොවැම්බර් 22]***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 22]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 22nd November]*
*[HON. SPEAKER in the Chair.]*

**117 වන ශීර්ෂය.- ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,044,000,000

**தலைப்பு 117.- போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,044,000,000

HEAD 117.- MINISTER OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,044,000,000

**123 වන ශීර්ෂය. -නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,310,000,000

**தலைப்பு 123.- நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,310,000,000

HEAD 123.- MINISTER OF URBAN DEVELOPMENT, CONSTRUCTION AND HOUSING

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,310,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - ශීර්ෂ 117, 306, 307 සහ 336 (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යනුවෙන් සංශෝධනය කිරීමට); නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය - ශීර්ෂ 123, ශීර්ෂ 309 සිට 311 දක්වා සහ ශීර්ෂ 332 (නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය යනුවෙන් සංශෝධනය කිරීමට); වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - ශීර්ෂය 176 (නව අමාත්‍යාංශය ඇතුළත් කිරීමට).

සලකා බැලීම - පූ.භා. 11.00 සිට අ.භා. 6.00 දක්වා.

ප්‍රථමයෙන්ම, ගරු කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පැහැදිලි කිරීම.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු සභාපතිතුමනි, අංක 2458/65 සහ 2025/10/18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව අමාත්‍යාංශ විෂයයන් වෙනස්වීම සහ නව අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීමට අදාළ විසර්ජන පනත් කෙටුම්පතට සිදු කළ යුතු සංශෝධන සම්බන්ධව 2025 ඔක්තෝබර් 24වන දින මා විසින් මෙම සභාවට කරන ලද කරුණු දැක්වීම හා සම්බන්ධව මෙම ගරු සභාවේ අවධානය නැවත යොමු කිරීමට කැමැත්තෙමි.

එකී ගැසට් නිවේදනය ප්‍රකාරව ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ නාමය ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යනුවෙන් සංශෝධනය කිරීම හා ඒ අනුව ශීර්ෂ 117, 306, 307, 311 සහ 336 සලකා බැලීමද, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ නාමය නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය යනුවෙන් සංශෝධනය කිරීම හා ඒ අනුව ශීර්ෂ 123, ශීර්ෂ 309 සිට 311 දක්වා සහ ශීර්ෂ 332 සලකා බැලීමද, තවද වරාය සහ සිවිල් ගුවන් සේවා විෂය ශීර්ෂ 176 ලෙස, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යනුවෙන් අලුත් අමාත්‍යාංශයක් යටතේ ඇතුළත් කිරීම හා ඒ අනුව ශීර්ෂ 176 සහ ශීර්ෂ 336 සලකා බැලීමද අද දින සිදු කරනු ලබන බවත්, ඒ අනුව මෙම සංශෝධනවලින් විසර්ජන පනත් කෙටුම්පතේ දක්වා ඇති සමස්ත පුනරාවර්තන සහ මූලධන වියදම්වල කිසිදු වෙනසක් සිදු නොවන බවත් මෙම ගරු සභාවට තවදුරටත් දැන්වීමට කැමැත්තෙමි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

කපා හැරීමේ යෝජනාව, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.47]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින, එනම් 2025.11.24වන සඳුදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ සහ ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලින්, අදාළ අංක 117, 306, 307, 336, 123, 309 සිට 311 සහ 332 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහනෙහි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අය වැයක් කියන්නේ ඇත්තවශයෙන්ම නොමමර පෙන්වීමේ ඉලක්කයක් නොවෙයි. ඉලක්ක සපුරා ගැනීම සඳහා ඇත්තටම සිදු කරන කාර්යයක්. අද දවසේ කථා කරන අමාත්‍යාංශ තුනම යටිතල පහසුකම්වලට අදාළයි. විශේෂයෙන්ම යටිතල පහසුකම් පිළිබඳ ඉලක්ක සපුරා ගන්න නම්, කාර්යක්ෂමතාව, විනය සහ කැපවීම තිබෙන්න ඕනෑ. නමුත් ඇත්තවශයෙන්ම 2025දී මේ අමාත්‍යාංශ සඳහා අය වැයෙන් වෙන් කර තිබෙන මුදල් පිළිබඳව බලද්දී එම අමාත්‍යාංශවලට මේ ඉලක්ක සපුරා ගන්න බැරි වෙලා තිබෙනවා. ඉස්සර අමාත්‍යාංශ දෙකක්; දැන් අමාත්‍යාංශ තුනක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට මේ අවුරුද්දට රුපියල් මිලියන 489,230ක් වෙන් කරලා තිබුණා. හැබැයි, රුපියල් මිලියන 240,805ක, නැත්නම් සියයට 43ක තමයි වැඩ කෙරිලා තිබෙන්නේ. මේ අවුරුද්දේ ඒ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා, පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් මිලියන 446,000ක්. අපි විශ්වාස කරනවා, මේ අවුරුද්දේවත් විනය, කාර්යක්ෂමතාව සහ කැපවීමත් එක්ක ඒ ඉලක්ක සපුරා ගන්න පුළුවන් වෙයි කියලා. මොකද අපි විපක්ෂය වුණාට, මේවා කඩාකප්පල් වෙන්න ඕනෑ, මේවා සිදු නොවෙන්න ඕනෑ, ඒ හරහා බලය ගන්න ඕනෑ කියන කාලකණ්ණි ආශාවක් අපට නැහැ කියන එකත් පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය සහ ඒ යටතේ තිබුණු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට 2025 වර්ෂයේදී රුපියල් මිලියන 104,532ක් වෙන් වෙලා තිබුණා. ඒකෙන් රුපියල් මිලියන 36,818ක, එහෙම නැත්නම් සියයට 35ක තමයි ප්‍රගතිය වාර්තා වන්නේ. මේ අවුරුද්දේත් එම කටයුතුවලට වෙන් වෙලා තිබෙනවා, රුපියල් මිලියන 103,500ක්. ඒ නිසා සියයට 35 ඒ ප්‍රගතිය අඩුම ගණනේ අමාත්‍යාංශ දෙකකට කඩලා තිබෙන නිසා සියයට 85 දක්වාවත් ගෙනයන්න කියලා අපි යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, අපි මේ ආයතන අතරින් RDA එකේ performance එක අරගෙන බැලුවොත්, ඇත්තවශයෙන්ම expressway development එකට වෙන් කරපු රුපියල් මිලියන 6,100න්, රුපියල් මිලියන 2,400ක් තමයි පාවිච්චි කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, ප්‍රගතිය සියයට 39යි. ඒ වාගේම අනෙකුත් මාර්ග සංවර්ධනයට වෙන් කරලා තිබ්බ මුදල්වලින් ප්‍රගතිය තිබෙනවා, සියයට 79ක. ඒ ප්‍රමාණය නම් අනික් ඒවාට සාපේක්ෂව හොඳයි. ඒ වාගේම road widening and

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

improvementවල ප්‍රගතිය තිබෙන්නේ සියයට 12.5යි. ඒ වාගේම පාලම් ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 16යි. ඒ නිසා විශේෂයෙන්ම අපි පැහැදිලිව කියන්න ඕනෑ, මේ අමාත්‍යාංශවල ඉන්න නිලධාරින්ගෙන් වැඩ ගැනීමේදී සානුකම්පිතව ඔවුන්ට ඇහුම්කන් දීමත් වැදගත් වන බව. ඒ වාගේම අකාර්යක්ෂම නිලධාරින්ව එළවා දැමීමත් අත්‍යවශ්‍ය වනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්න කැමැතියි, RDA එකේ ඉන්න ඉංජිනේරුවන් තමයි අද බුද්ධි ගලනයට මුහුණ පා තිබෙන්නේ කියලා. මොකද, ඒ ඉංජිනේරුවන් තමයි අඩුම වැටුපක් ලබන්නේ. ඒ නිසා ඔවුන් මේ වනකොට වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් කැඳවා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී ඊට අදාළ ලිපියත් **සභාගත*** කරනවා.

මේ අවස්ථාවේදී මම ගරු බිමල් රත්නායක ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ ඉංජිනේරුවන් ගැන විතරක් නොවෙයි, අනෙකුත් සේවකයින් ගැනත් සානුකම්පිතව බලන්න කියලා. මොකද, ඒ අයගේත් සහාය ඇතුව තමයි මේ වැඩ ටික කරන්න වෙන්නේ.

ගරු සභාපතිතුමනි, නවීන ආර්ථිකයක් රඳා පවත්වා ගන්න නම්, කාර්යක්ෂම සහ ඒකාබද්ධ සැලැස්මක් මේ යටිතල පහසුකම් සම්බන්ධව තිබෙන්න ඕනෑ. ඒ නිසා ඉදිරියේදී හෝ ක්‍රියාත්මක කිරීම සඳහා මේ අමාත්‍යාංශයට අදාළව අපි සැලසුමක් යෝජනා කළ යුතුයි. ඒ කියන්නේ අන්තර් පළාත්, නාගරික සහ අගනගර ප්‍රවාහන පද්ධති සඳහා master plan එකක් ගෙනෙන්න කියලා අපි ඇමතිතුමාට යෝජනා කරනවා. ඒ විතරක් නොවෙයි. අධිවේගී මාර්ග අලුතින් ආරම්භ කරනවා වාගේම දැනට තිබෙන සාමාන්‍ය මාර්ග පුළුල් කිරීමේ වැඩසටහනක් ද ආරම්භ කරන්න. ඒ වාගේම දුම්රිය සේවයත් ඇතුළත් කර ගනිමින් බහුවිධ ප්‍රවාහන පද්ධතියක් ද සකස් කළ යුතුයි. දුම්රිය සේවය අත් හැරලා SLTB සහ පෞද්ගලික අංශයේ බස් විතරක් මගී ප්‍රවාහනයට යොදා ගෙන මේ කටයුතු කරන්න බැහැ.

විශේෂයෙන්ම අපි නැවත වතාවක් කල්පනා කළ යුතු කාරණයක් තිබෙනවා. පසුගිය පාලන කාලවලදී අපේ රටේ ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගන්නේ නැතුව අධිවේගී මාර්ග ඉදිකිරීමේ මුවාවෙන් අධික පොලියට ණය අරගෙන තිබෙනවා. රටක සංවර්ධනයට යටිතල පහසුකම් අත්‍යවශ්‍යයි. හැබැයි, ගෙවන්න බැරි මට්ටමට ණය අරගෙන එම කටයුතු කරන්න පුළුවන්ද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා අපි යෝජනා කරනවා, විශේෂයෙන්ම PPP system එකට අනුව පෞද්ගලික ආයෝජකයන්ට ආරාධනා කරලා රුවන්පුර අධිවේගී මාර්ගය වෙන්න පුළුවන්, උතුරු අධිවේගී මාර්ගය වෙන්න පුළුවන්, දඹුල්ල දක්වා වන අධිවේගී මාර්ගය වෙන්න පුළුවන්, ඒ දේවල් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ආණ්ඩුව විසින් සිදුකර, ඒ සම්බන්ධව evaluation එකක් කරලා එම ආයෝජකයන්ට ඒවාට අදාළ ව්‍යාපෘති ලබා දෙන්න කටයුතු කරන්න කියලා. මොකද, මේ පාරවල් හැදුවාම රටේ ආර්ථිකයේ යටිතල පහසුකම් දියුණු වෙනවා. අදාළ කාල සීමාව ඉවර වුණාට පසුව ඒ සමාගම් මේවා ඔසවාගෙන යන්නේ නැහැ. උදාහරණයකට සිංගප්පූරුවේ Changi Airport එක ගන්න. ඒක හැදුවේ පෞද්ගලික ආයෝජකයන්. එම ව්‍යාපෘතියේ කාලය අවසන් වුණා කියලා ඒ පෞද්ගලික සමාගම විසින් ඒ airport එක ඔසවා ගෙන ගියේ නැහැ; ඒ airport එක තිබෙනවා. ඒකෙන් ඒ රටට ප්‍රතිලාභයක් තිබෙනවා. හොරකම් නවත්වන්න. හොරකම් කරන්නේ දේශපාලනඥයින් විතරක් නොවෙයි. නිලධාරින් ඊට වඩා හොරකම් කරනවා. මම ඒ පිළිබඳව උදාහරණ සහිතව මගේ කථාව තුළ සඳහන් කරන්නම්. මෙතැන ඇමතිවරුන් තුන්දෙනෙක් ඉන්නවා. දෙදෙනෙක් හඳුනනවා. අනෙක් ඇමතිවරයා නම් දන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, විශේෂඥයන් ගණන් හදා බලා තිබෙනවා, රථවාහන තදබදය වැඩි වීම නිසා දවසකට රුපියල් බිලියන 1.5ක් පමණ නාස්ති වෙනවා කියලා. මේ ගණන 365න් වැඩි කළාම, අවුරුද්දකදී රුපියල් බිලියන 500කට වඩා නාස්ති වෙනවා. භාණ්ඩාගාරය උතුරන්න සල්ලි තිබෙනවා කියලා අද පුරාජේරු කියවනවා. වාහන 220,000ක් ගෙනැල්ලා රුපියල් බිලියන 650ක පමණ අතිරේක ආදායම් මාර්ගයක් හොයාගෙන තිබෙනවා. මේ ආදායම් මාර්ගය ලබන අවුරුද්දේ ලැබෙන්නේ නැහැ. ඒක වෙනම කථාවක්. මොකද, අවුරුදු 5ක arrears එකකට නේ මේ වාහන ගෙනාවේ. හැබැයි, ඒ අලුතින් ගෙනා වාහනවලටයි, තිබෙන වාහනවලටයි අවශ්‍ය යටිතල පහසුකම් සපයා තිබෙනවාද කියන එක අපි පැහැදිලිව සලකා බලන්න වටිනවා.

විශේෂයෙන්ම Colombo metropolitan සීමාවට ඇතුළු වන corridors 7 - සමහර අය තර්ක කරනවා, corridors 8ක් කියලා - දියුණු කිරීම හරහා සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම යහ පාලන ආණ්ඩුව සමයේ ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු කරලා, පසුව උද්ධච්ච ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ ආණ්ඩුව විසින් බලෙන් නතර කළ ව්‍යාපෘති හතක් පිළිබඳව මම සඳහන් කරන්න කැමැතියි. විශේෂයෙන්ම මාලබේ - කොළඹ කොටුව සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය නැවැත්වුවා. ඒ නිසා අපි ඇමතිතුමාට මේ කාරණය යෝජනා කරනවා.

මට මතකයි, මම ඒ සම්බන්ධව මේ සභාවේදී ප්‍රශ්න කළාම ඔය පැත්තේ ඔය පුටුවේම හිටපු කෙනා තමයි ඒකට උත්තරය දුන්නේ. ඔය පුටුවේම හිටපු කෙනා උත්තරය දුන්නා. එතුමා උත්තරය දෙනකොටම, "හොරාට කලින් කෙහෙල් කැන වැට පැන්නා" කියලා මට තේරුණා. මොකද, ඒ සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතියෙන් කොමිස් ගහන්න බැහැ. ඒකට වෙනත් යෝජනාවක් ගෙනාපු නිසා ඒක සුදුසුද, නැද්ද කියන එක කල්පනා කරලා බලන්න. ඒ වාගේම තවත් අතිරේක සැහැල්ලු දුම්රිය මාර්ගවල අවශ්‍යතාව තිබෙනවාද කියාත් කල්පනා කර බලන්න.

ඊළඟ කාරණය තමයි, කැලණිවැලි දුම්රිය මාර්ගය. ගරු ඇමතිතුමනි, කැලණිවැලි දුම්රිය මාර්ගය සම්බන්ධව අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් කථා කළා. මම භය නැතුව කියනවා, දුම්රිය දෙපාර්තමේන්තුව නම් කිසි දෙයක් කරන්නේ නැහැ කියලා. ඔබතුමා අන්දන්න හදනවාද කියලා මට පොඩි සැකයක් තිබෙනවා. මොකද, මෙතැන අපට දේශපාලන භේදයක් නැහැ; රටට සිදු වීමට අවශ්‍ය දේ වෙන්න ඕනෑ. පසුගිය දිනවල පැවති දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අපි ප්‍රශ්නයක් ඇහුවාම "මල්ලේ පොල්" න්‍යායේ උත්තර තමයි ඔක්කෝම දුන්නේ. එම නිසා ඒ පිළිබඳවත් බලන්න කියලා අපි කියනවා. ඊළඟට, නව කැලණි පාලම හදද්දී ඒ ව්‍යාපෘතියේ Master Plan එක හැටියට තිබුණේ, ඔරුගොඩවත්ත දක්වා ඇවිල්ලා, ඊළඟ පියවර විධියට එතැනින් රාජගිරිය HSBC එක ළඟට ඇවිල්ලා, ඊට පස්සේ අතුරුගිරිය දක්වා යන්න. ඒ වැඩකටයුතු පසුගිය කාලයේ සිද්ධ වුණේ නැත්තේ හොරා කෑමේ වුවමනාව නිසාම ඇද-ඇද හිටි නිසා බව මම කියන්න කැමැතියි.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම කියන්න ඕනෑ MCC ගිවිසුම ගැනත්. මේ ආණ්ඩුව ඒ කාලයේ විපක්ෂයේ ඉන්නකොට විරෝධතා පැවැත්වූවා; සමාජවාදය කිව්වා; ලේ උතුරනවා, ලේ උනනවා කිව්වා නේද? MCC ගිවිසුමෙන් ඩොලර් මිලියන 500ක් හම්බ වෙන එක නතර වුණා. ඇත්තවශයෙන්ම එදා MCC ගිවිසුම අත්සන් කළා නම්, කොළඹ නගරයේ traffic junctions 332ක් improve කරන්න තිබුණා. එදා ඒ කටයුත්ත ආරම්භ කළා නම් අද මේ වෙනකොට ඒක ඉවරයි. එහෙම වුණා නම් අද මේ කොළඹ නගරයේ තිබෙන රථ වාහන තදබදයට සැලකිය යුතු මට්ටමක විසඳුමක් ලැබෙන්න තිබුණාය කියා අපි විශ්වාස කරනවා. නමුත් එදා විපක්ෂයේ ඉන්නකොට විරුද්ධ වෙච්ච ගොඩක් දේවල් ඔබතුමන්ලා අද කරනවා. එම නිසා ඒ ගැනත් සලකා බලන්න. මොකද, අය වැය ඉදිරිපත් කරනකොට අපි දැක්කේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ මුහුපුරා ඇවිල්ලා අය වැය ඉදිරිපත් කළා වාගේයි. ලලිත් ඇතුලත්මුදලිලා, ගාමිණී දිසානායකලා, ප්‍රේමදාසලා අත්පුඩි ගහපු අය වැයක් තමයි අපි දැක්කේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. ඇත්ත තේරුම් අරගෙන ප්‍රායෝගිකව කටයුතු කරන්න.

අද ජනාධිපතිතුමාගේ උපන් දිනය. ඒ නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. ජනාධිපතිතුමාට තමයි මේ ආණ්ඩුවේ sense එකක් තිබෙන්නේ. ඒ නිසා එතුමා experiment කරන්න යන්නේ නැහැ. එතුමා experiment කරලා වැඩේ වරද්දා ගන්න භයයි. ඒ නිසා එතුමා අර ක්‍රමයම දිගුවක් විධියට ගෙනෙන හින්දා MCC එක ගෙනාවාට අපි කවුරුවත් දැන් විරුද්ධ වෙන්නේ නැහැ කියන එක ඔබතුමන්ලාට මම මතක් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, කොළඹ නගරය සහ අවට ප්‍රදේශවල රථ වාහන තදබදය අවම කිරීම සඳහා කලින් ආරම්භ කරලා අතරමඟ දී නතර වෙච්ච හෝ ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු කරලා නතර වෙලා තිබෙන වැඩසටහන් කිහිපයක් පිළිබඳවත් අපි බිමල් රත්නායක ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. විශේෂයෙන්ම නාවල පාර සහ කිරි මණ්ඩල මාවත ගත්තාම, කිරි මණ්ඩල මාවතේ නාරාහේන්පිට පැත්තේ සිට පාලම ළඟ දක්වා මාර්ග කොටස widen කළා. ඉතුරු ටිකේ වැඩ කටයුතු නතර වෙලා තිබෙනවා. ඕනෑම දවසක උදේ වරුවක හෝ හවසට ගියාම ඔබතුමාට බලන්න පුළුවන්, එතැන තිබෙන අධික රථ වාහන තදබදය. රාජගිරිය සිට නුගේගොඩ දක්වා මාර්ග කොටස ගැනත් නැවත සොයා බැලීමක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඊළඟට, කොළඹට ඇතුළුවන corridors 7 පිළිබඳව ඔබතුමන්ලාගේ රජය තීරණාත්මකව සොයා බැලිය යුතුයි කියාත් අපි යෝජනා කරනවා. ඒ වාගේම තමයි, රාජගිරිය සිට බුත්ගමුව දක්වා මාර්ගය. බුත්ගමුව මාර්ගයේ පාලම ළඟ widen කළා නම් විශාල traffic එකක් avoid වෙනවා. විශේෂයෙන්ම කඩුවෙලට යන ජනතාව ඒ පැත්තෙන් යනවා. ඒ ටික පහු කරන්න විනාඩි 15කට වැඩිය ගත වෙනවා. අලුත් අය වැය තුළින් ඔබතුමා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි, Kelani Bridge එක අඹතලේ දක්වා යන මාර්ගය. ඒ කියන්නේ, අඹතලේ හන්දියේ සිට ග්‍රෑන්ඩ්පාස් දක්වා තිබෙන මාර්ගය පුළුල් කිරීම සඳහා යහ පාලන ආණ්ඩුව තිබියදී අපි ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක සාකච්ඡා කළා. මට මතක විධියට, මම නිවැරදි නම් රුපියල් මිලියන 747.5ක් ලබා දෙන්න ඔවුන් එකඟ වෙලා තිබුණා. අනතුරුව ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව ආවාට පස්සේ මොනවා වුණාද කියලා දන්නේ නැහැ. ඔබතුමාට මම මතක් කරන්න කැමැතියි, අපි Low-level මාර්ගය ඔය විධියට තමයි හැදුවේ කියන එක. ඒ, Austrian fund එකෙන් බිලියන 3.5ක් ගෙනැල්ලා, සවුදි අරාබි රජයෙන් සහ කුවේට් අරමුදලින්. පසුගිය දවසක මම සවුදි අරාබියේ තානාපතිතුමා හමු වූ වෙලාවේදීත් මේ සම්බන්ධයෙන් මතක් කළා. ඔවුන් පාලම් ටික හදලා දුන්නා. නමුත්, අදටත් පාලම් දෙකක් හදා ගන්න බැරිව ඉන්නවා. ප්‍රගති සමාලෝචනයෙන් පසුව කිව්වා, අවුරුද්දක් ඇතුළත ඒ කටයුතු අවසන් කරන්නම් කියලා. ඒ පාලම් හදන්න ආරම්භ කරද්දී ඒ වෙලාවේදී කිව්වා, වතුර බට දාන්න බැහැ කියලා. රවුෆ් හකීම් මැතිතුමනි, ඔබතුමාට මේ දේවල් මතකයි. අපි පාස්කරලිංගම් මැතිතුමා එක්ක එකතු වෙලා ඔස්ට්‍රියානු රජයෙන් රුපියල් බිලියන 6.5ක් ගෙනාවා, මුළු කොළඹටම වතුර සපයන line එක සවි කරන්න. කනගාටුයි කියන්න, 2017 ජනවාරි මාසයේ 12වැනි දා ආරම්භ කරපු ඒ ව්‍යාපෘතියෙන් සියයට සියයක ප්‍රගතියක් තවම අත්කර ගන්න බැරිවෙලා තිබෙනවා. කරපු ඔක්කෝම වියදම් අපරාදේ; පාලම් දෙක නිසා විශාල තදබදයක් ඇති වෙනවා.

ඒ වාගේම තමයි, දෙහිවල-කොහුවල මාර්ගය widen කිරීම. පසුගිය කාලයේ නිකම් කාපට් එකක් දාගෙන ගියා. ඒ මාර්ගය පුළුල් කිරීම අත්‍යවශ්‍ය වෙනවා. ඒ වාගේම, කොළඹ ආර්ථික නගරයේ තිබෙන, මැද කොළඹ තිබෙන මාර්ග ටික නවීන පද්ධතියට හැදීම අත්‍යවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු සභාපතිතුමනි, මැද කොළඹ මාර්ග වාගේම නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා තිබෙන ඒ අධිවේගී මාර්ගවලට යන extensions මෙන්ම මේ මාර්ග ටිකත් මහ කොළඹ රථ වාහන තදබදය අවම කිරීම සඳහා ඉතා අත්‍යවශ්‍ය වෙන බව මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

මේ යෝජනා ටික විතරක් කියලා ගියාම කිසි ගතියක් නැති නිසා මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. පසුගිය අය වැයේදී මේ අමාත්‍යාංශ විවාදයේදීම මම මතු කළා, නැඟෙනහිර පර්යන්තයට දාලා තිබෙන ටෙන්ඩර් එක නිවැරදි evaluation එකක් කරන්නේ නැතුව අවලංගු කර තිබෙනවා, අලුත් ටෙන්ඩර් එකක් දැම්මත් තව මාස 8ක්වත් ගත වෙනවාය කියලා. මට ඇමතිතුමා එතැන ඉඳලාම කිව්වා, "නැහැ, නැහැ, සියයට 50ක් වැඩකටයුතු ජූලි මාසයේ ආරම්භ කරනවා. ඔබතුමාටත් ඒ සඳහා ආරාධනා කරනවා" කියලා. මා ළඟ ඒ වීඩියෝව තිබෙනවා. නමුත්, මට ආරාධනාවක් ලැබුණේ නැහැ. ඒ නිසා මම දන්නේ නැහැ, වැඩේ වුණාද, නැද්ද කියලා. මම හිතනවා, ඒ සම්බන්ධයෙනුත් උත්තරයක් ලැබෙයි කියලා. මොකද, ජනාධිපතිතුමා පසුගිය මැතිවරණයේදී කිව්වා, 2030දී කන්ටේනර් මිලියන එකොළහමාරක් ගේන්න අවශ්‍ය කටයුතු කරන්න මේ East Container Terminal එක පටන් ගන්න එක අනිවාර්යයෙන්ම කරනවා කියලා. ගරු ඇමතිතුමනි, ඒ වුණාට සභාපතිතුමාට දේශපාලන පළිගැනීම් කරනවා හැර වෙන වැඩ කර කර ඉන්න වෙලාවක් නැහැ.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ඒ වාගේම, ගාලු වරාය ලාභ ලබන තත්ත්වයට ගේන්න අවශ්‍ය කටයුතු තවමත් මේ වරාය අධිකාරියට කර ගන්න නොහැකි වෙලා තිබෙනවා කියන එකත් මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

ඒ වාගේම අද පැවැත්වෙන විවාදයට අදාළ අමාත්‍යාංශයක් යටතේ තමයි විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරියත් තිබෙන්නේ. ඇත්තවශයෙන්ම construction industry එක තමයි 2018ට පෙර මේ රටේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 8කට වාගේ ආසන්න ප්‍රමාණයකට දායකත්වය ලබා දුන්නේ. නමුත්, කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය කියන කාරණා එක්ක ඒ industry එක කඩා වැටිලා තිබෙනවා. ඇත්තවශයෙන්ම UDA එකට තමයි විශාල ආදායමක් තිබෙන්නේ. ඇයි, ඒ? කවුරු හරි ආයෝජකයෙක් construction එකක් කරන්න ඉඩමක් මිලදී ගන්නකොට සියයට 4ක මුද්දර ගාස්තුවක් ගෙවන්න ඕනෑ. ඊළඟට, සිමෙන්ති, ගල් හා වැලි යනාදී දේවල් ගන්නකොට ඒවාටත් බදු එකතු වෙලා තිබෙනවා. ඒ construction එක හදලා විකුණන්න ගියාම සියයට 18ක VAT එකක් ගෙවන්න ඕනෑ. ඒක විකුණනකොට ආපසු සියයට 4ක මුද්දර ගාස්තුවක් ගෙවන්න ඕනෑ. ඊට පසුව ලාභයක් ලැබුවාම සමාගම් tax එක හැටියට සියයට 30ක් ගෙවන්න ඕනෑ. ඒකෙන් dividends ලැබුවාම තව සියයට 15ක් ගෙවන්න ඕනෑ. රුපියල් ලක්ෂ එකහමාරකට වඩා පඩි ගන්න අය සියයට 4 සිට සියයට 36 දක්වා උපයන විට ආදායම් බද්ද ගෙවන්න ඕනෑ. ඇත්තවශයෙන්ම ඒ project එකට වියදම් වන මුදලින් සියයට 40ක විතර ප්‍රමාණයක් නැවත රජයට ලැබෙන ක්‍රමයක් මේක. 2018 වෙද්දි අපේ රටේ construction ක්ෂේත්‍රය export level එකට ඇවිල්ලා තිබුණේ. නමුත්, එම ක්ෂේත්‍රය කඩාගෙන වැටුණා. ඒ කඩාගෙන වැටුණු වැටිල්ලේ හැටියට තවම ඔළුව උස්සා ගන්න බැරි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානයට මම මේ කාරණයත් යොමු කරනවා. Constructionsවලදී අත්‍යවශ්‍ය සාධකයක් තමයි, සිමෙන්ති. සිමෙන්ති මිල අඩු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ගත්තොත් මම හිතනවා, විශේෂයෙන්ම construction industry එකේ boost එකක් ඇති වෙලා ඒ හරහා රාජ්‍ය ආදායම වැඩි වෙයි කියලා. ඒ වාගේම, නාගරික සංවර්ධන අධිකාරියට විශාල කාර්යභාරයක් කරන්න තිබෙනවා, ඉදිරි කාලයේදී ණය ගෙවන්න වෙද්දී. රීරි යකා ලේ මාංස උරා බොනවා වාගේ, දැන් බෙල්ල මිරිකලා බදු ගහලා, බදු ගහලා රුපියල් ආදායම තිබෙනවා. හැබැයි, ජාත්‍යන්තරයෙන් ගත්ත ණය ගෙවන්න වෙන්නේ ඩොලර්වලින්. නමුත්, ඩොලර් ආදායම නැහැ. ඩොලර් ආදායම කලින් ආපු විධියමයි. සංචාරක කර්මාන්තය ගත්තාම, පසුගිය අවුරුද්දේ ලැබූ ආදායමට වඩා ඩොලර් මිලියන 100යි වැඩි වෙලා තිබෙන්නේ. Remittance පසුගිය අවුරුද්දට වඩා වැඩි වෙලා තිබෙන්නේ ඩොලර් මිලියන 100යි. හැබැයි, ණය ගෙවන්න ඒ ප්‍රමාණය මදි වනවා. එම නිසා ආදායම් උපයන තැනක් වන UDA එකට විශාල භූමිකාවක් පැවරී තිබෙනවා, ඒ ණය ගෙවීම සම්බන්ධව. මම ඒ සඳහා උදාහරණයක් ගන්නම්. කොළඹ නගරයේ, කොළඹ 01 සිට 15 දක්වා විතරක් UDA එකට අයිති ඉඩම් ගත්තොත්, දළ වශයෙන් අක්කර 800ක් විතර තිබෙනවා. අද මේ මොහොත වනතුරුත් ඒවා බෙදා වෙන් කරගෙන නැහැ. Relocationවලට කොච්චරද, තමන් විසින් කරන ඉදිකිරීම් මොනවාද, ඒ වාගේම රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරීත්වයෙන් මොනවාද වෙන්නේ කියලා බෙදා වෙන් කරගෙන නැහැ. UDA එකේ හිටපු සභාපතිතුමා concept එකක් ගෙනාවා, vertical integration කොළඹට ගෙනෙන්න කියලා. නමුත්, අද එතුමා නාගරික සංවර්ධන අධිකාරියේ නැහැ. ලෝකයේ දියුණු නගරවල 80:20 ratio එකට යන්නේ. ඉතින්, ඒක implement වෙන්න ඕනෑ; මහ පොළොවේ යථාර්ථයක් වෙන්න ඕනෑ. ඒක එහෙම වෙන්න නම් කොළඹ නගරයේ තිබෙන මේ භූමියෙන් ප්‍රයෝජන ගන්න ඕනෑ. අද ආර්ථිකයට දායකත්වය ලබාදෙන ආයෝජන ගෙනෙන්න හොඳ තෝතැන්නක් මේක. ඒ වාගේම තමයි, කොළඹ නගරයේ මේ වෙනකොට වතු නිවාස 53,000ක් විතර තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේක ආර්ථික මර්මස්ථානයක් කරන්න නම්, කොළඹ නගරයේ මේ වතු නිවාස relocate කිරීම අත්‍යවශ්‍යයි කියලා. උදාහරණයක් විධියට ගරු ඇමතිතුමනි, කොම්පඤ්ඤ වීදිය හන්දියේ කවුරුහරි හිටියොත් එහෙම, එතැනින් ගුවන් කිලෝමීටර 3ක්වත් නැහැ Royal College එකට. හැබැයි, කොළඹ නගරයේ ඉන්න දරුවන්ට කොළඹ නගරයේ තිබෙන ඒ උසස් පාසල්වලට යන්න බැහැ. ලංකාවේ ලොකුම කොම්පැනි ටික තිබෙන්නේ කොළඹ නගරයේ. කොළඹ නගරයේ දුප්පත් දෙමාපියන්ගේ දරුවන්ට ඒවායේ රස්සා නැහැ. වැඩිම වුණොත් ලැබෙන්නේ තේ හදන්න හෝ වැසිකිළි සෝදන්නයි. කොළඹ නගරයේ තමයි ලංකාවේ තිබෙන ලොකුම හෝටල් ටික තිබෙන්නේ. ඒවායින් කෑම වේලක් කන්න, මේ මිනිස්සුන්ට සහ ඒ අයගේ දරුවන්ට අයිතිවාසිකමක් නැහැ. කොළඹ නගරයේ තමයි ලංකාවේ තිබෙන හොඳම ඉස්පිරිතාල ටික තිබෙන්නේ. හැබැයි, ඔවුන් යන්න ඕනෑ මහ ඉස්පිරිතාලයට හරි නගර සභාවේ තිබෙන dispensary එකට හරි. මේ සමාජ ක්‍රමය වෙනස් කරන්න නම්, ඔවුන්ට තමන්ටම කියලා ඉන්න හිටින්න තැනක් ඕනෑ. ඔවුන්ට ඒ ඉන්න හිටින්න තැන UDA එක හරහා ලබා දීලා, ඒ ඉඩම් ටික ආර්ථික සංවර්ධනයට පාවිච්චි කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන්න. ඒක අවුරුද්දෙන් කරන්න බැහැ. ඒකට අවුරුදු 5ක්, 10ක්, 15ක් යයි. නමුත්, ඒක ආරම්භ කෙරුවොත් මේ අසමතුලිතතාව, මේ විෂමතාව නැති වෙයි. මරදාන railway station එකේ හරි, කොම්පඤ්ඤ වීදියේ railway station එකේ හරි උදේට මිනිස්සු දත් මැදගෙන බලාගෙන ඉන්නවා. ලක්ෂ ගණනක් කොළඹට පිටින් එනවා. අපි පිටින් එන්න එපා කියන්නේ නැහැ. හැබැයි, කොළඹ නගරයේ ජනතාවට මූලික අයිතිවාසිකම ලැබිය යුතුයි. ඒ සඳහා ආරම්භක පියවර ගන්නා ලෙස අපි ඔබතුමාට යෝජනා කරනවා.

ඒ වාගේම තව කාරණයක් කියන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. මේ subject එකේ - ඉදිකිරීම් ක්ෂේත්‍රයේ - මේ කලාපයේ දෙවැනියට අධික පිරිවැය තිබෙන්නේ ලංකාවේ. විශේෂයෙන්ම වර්ග මීටරයකට ඩොලර් 1,200ක් වැනි ප්‍රමාණයක් වියදම් වෙනවා. එක් පැත්තකින් රජයට ආදායම් ඕනෑ වාගේම, ආයෝජකයින් සහ ඉදිකිරීම්කරුවන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය සහන ලබා දීම මඟින් යටිතල පහසුකම් දියුණු වෙනවා, ආදායම් එනවා. මෙය ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන්ම බලපාන කාරණය නිසා ඒ පිළිබඳවත් ඔබතුමන්ලා සොයා බලන්න කියන ඉල්ලීමත් මම කරනවා.

ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා අය වැය දෙවැනි වර කියවීමේ විවාදයේදී මට චෝදනාවක් කළා. ඒ නිසා මම අද අය වැය පොත අරගෙන ආවා. මෙහි පිටු අංක 41හි තිබෙන්නේ, කොළඹ සහ තදාසන්න නගරවල නාගරික වතුවල ජීවත්වන ජනතාව වෙනුවෙන් නිවාස ඉදිකරන්න රුපියල් මිලියන 15,000ක් වෙන් කරනවා කියලා. ආරම්භයක් විධියට අවුලක් නැහැ. හැබැයි, ඒක ප්‍රායෝගික නැහැ. ගෙවල් 53,000කට මේ රුපියල් මිලියන 15,000 ගෙව්වොත්, එක් ගෙයකට ලැබෙන්නේ රුපියල් 300,000යි. එක්කෝ කියන්න ඕනෑ, "නැහැ, ඒක වැරදියි. අපි පළමු අවුරුද්දේ ගෙවල් 15,000යි හදන්නේ" කියලා. එහෙම කිව්වා නම් ඔන්න මිලියනයයි. මිලියනය හරිද, නැද්ද කියන එක වෙනම කථාවක්. දේශපාලන මඩ ගහනවා නම් අපි කැමැතියි, එහෙම fight එකකට ඔට්ටුයි. නමුත්, මේ පාර්ලිමේන්තුව හෝ කාරක සභා අපි එවැනි තැනකට ගෙනෙන්නේ නැහැ. අපි දේශපාලන වලි එළියේ වේදිකාවේ කරනවා. ජනතාව අපිව මේ පාර්ලිමේන්තුවට එවන්නේ ඕවා කථා කරන්න නොවෙයි. අපි තර්කානුකූලව විවාද කරමු.

ඒ වාගේම, එතුමා තව චෝදනාවක් කළා. අය වැය ලේඛනයේ 31:1 යටතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීමට රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා. ඔව්, එතුමා එක් කැල්ලක් කිව්වා. ඒ කැල්ලට මම එකඟ වෙන්නම්. එහි සඳහන් කර තිබෙනවා, "මේ අවුරුද්දේ වෙන් කළ රුපියල් මිලියන 7,200ට අමතරව" කියලා. ඒ කියන්නේ ඒ රුපියල් මිලියන 7,200ත් වැඩ කෙරිලා නැහැ. එතකොට ඔක්කොම රුපියල් මිලියන 10,200ක් ගෙවල් 10,000කට වෙන් කළොත් එක ගෙදරකට රුපියල් 1,020,000යි. මේ අයම තමයි සජිත් ප්‍රේමදාස මැතිතුමාට චෝදනා කළේ ගිනි පෙට්ටි වාගේ, කෝච්චි පෙට්ටි වාගේ ගෙවල් හදනවා කියලා. මම දන්නේ නැහැ රුපියල් 1,000,000කින් කොහේද ගෙවල් හදන්න පුළුවන් කියලා. මොකද, අර ගෝඨාභය රාජපක්ෂ මිනිස්සුන්ව බලෙන් එළවලා flats හදද්දී UDA එකේ cost එක වෙලා තිබෙනවා, වර්ග අඩි හාරසිය ගණනක නිවසකට රුපියල් මිලියන 3ක්. රුපියල් ලක්ෂ 30ක් cost වෙලා තිබෙනවා නම් ඒ දවස්වල, - මේ, කොවිඩ් වසංගතයට, ආර්ථික අර්බුදයට කලින් - අද ලක්ෂ 10න් ගෙයක් හදන්නේ කොහොමද කියන ගැටලුව තිබෙනවා. කවුරු හෝ එහෙම හදන්න පුළුවන් විධිය විස්තරාත්මකව, ඉංජිනේරුමය කරුණු අනුව පැහැදිලි කරනවා නම් අපි පිළිගන්නම්. මොකද, අපි මේ විවේචන ඉදිරිපත් කරන්නේ productive criticism ලෙසයි. දේශපාලනය කියන්න ඕනෑ නම් මට මෙතැන කියන්න පුළුවන්. මම එහෙනම් ඉස්සරවෙලාම බිමල් රත්නායක ඇමතිතුමාට ප්‍රහාරයක් එල්ල කරලායි පටන් ගන්නේ. "අසාර්ථකම ඇමති" වාගේ කථාවක් කියන්න පුළුවන්. එතැනට අපි ලඝු වෙන්නේ නැහැ කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. මොකද, මේ වාගේ විෂයයක් තුළ අපි අනවශ්‍ය දේශපාලනය කථා කරලා, නඟන්න තිබෙන තර්ක, ඉදිරිපත් කරන්න තිබෙන නිවැරදි විවේචන ඉදිරිපත් නොකිරීම අපරාධයක් කියලායි මම නම් විශ්වාස කරන්නේ.

ඊළඟට, මේ අමාත්‍යාංශයට තමයි SriLankan Airlines එක අයිති වෙන්නේ. ගරු සභාපතිතුමනි, දැන් සමහර අයගේ; ලිබරල්වාදීන්ගේ මතයක් තිබෙනවා මේ SriLankan Airlines එක රුපියලට හරි විකුණන්න ඕනෑ කියලා. සමහර අයගේ මතයක් තිබෙනවා, මේ රටට national carrier එකක් ඕනෑ, මේක ගොඩගන්න ඕනෑ කියලා. සංකල්පයක් විධියට දෙකම හරි. හැබැයි, මම පෞද්ගලිකව රුපියලට හෝ විකුණන එකට විරුද්ධයි. රටට national carrier එකක් ඕනෑ. එතකොට මේ national carrier එක ලාභ ලබන තත්ත්වයට ගෙනෙන්නේ නැතිව කිඹුලාට මැටි ගිල්වනවා වාගේ හැම අවුරුද්දේම අය වැයෙන් දෙන්න බැහැ.

රාජපක්ෂ පාලන කාලයේ ගුවන් යානා මිලදී ගත්ත එකේ කොමිස් තවම මේකෙන් එනවා. ඒ ආයතනය පාඩු ලබන්න ඒක ප්‍රධාන හේතුවක්. මොකද, ground handling අංශය profit ලබනවා නම්, catering එක profit ලබනවා නම්, ගණනත් අම්බානකට වැඩි නම් පාඩු ලබන්නේ කොහොමද? පාඩු ලබන්න ප්‍රධාන හේතු දෙකක් තිබෙනවා. එකක් තමයි, අර කොමිස් ටික තවම වාරිකවල එන එක. ඒ නිසා අපි පළමුව කළ යුත්තේ මොකක්ද? ඒ ණය restructure කරලා ඒ operative profit එකෙන් ගෙවන්න පුළුවන් ප්‍රමාණය ඔවුන්ට දීලා ඉතිරි ටික අනාගතයේ ගෙවන පදනමින් මහා භාණ්ඩාගාරය දරන්න ඕනෑ.

දෙවැනි කාරණය මේකයි. අද වන විට ඒ ආයතනයේ CEO කෙනෙක් නැහැ. මේකට CEO කෙනෙක් විතරක් නොවෙයි, COO කෙනෙකුත් ඉන්න ඕනෑ. මොකද, ගුවන් යානා 20ට අඩු ප්‍රමාණයක් තිබුණාට 6,000 ගණනක් සේවකයෝ ඉන්නවා. මේකට ඊළඟට වන නාස්තිය තමයි AOG- Aircraft on Ground - order එකට ගෙවන ගණන. ඉංජිනේරු අංශය කියන්නේ සියයට 27ක්, මේකට වියදම් කරනවා කියායි. සාමාන්‍යයෙන් ලෝකයේ පිළිගත් ඉහළ පෙළේ airlinesවල මේකට යන්නේ සියයට 3යි. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරලා මේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන ගමන් අනෙක් පැත්තෙන් වියදම පාලනය කිරීමත් අත්‍යවශ්‍ය වෙනවා bottom line එක වැඩි කර ගැනීම සඳහා.

ගරු සභාපතිතුමනි, මම කලිනුත් කිව්ව කාරණයක්, මේක. දැන් හැම වේදිකාවකම, හැම පක්ෂයකම, හැම තැනම කථා කරන්නේ දේශපාලනඥයෝ හොරකම් කරනවා කියලා. දේශපාලනඥයෝ හොරකම් කරන්නේ නැහැ කියලා මම කියන්නේ නැහැ. හැබැයි, දේශපාලනඥයන්ට හොරකම් කරන්න අනුබල දෙන්නේ කවුද? නිලධාරින්. පසුගිය දවසක අපි ගෙන්වලා බැලුවා, variationsවලින් යන වියදම මොකක්ද කියලා; contract claimsවලින් යන ඒවා. අපි දන්නවා, -මම නම කියන්නේ නැහැ- හිටපු ඇමතිවරයෙක් RDA එක භාර ඇමතිවරයා වශයෙන් ඉන්නකොට සිදු වුණු කාරණයක්. කොන්ත්‍රාත්කරු එනවා, කොන්ත්‍රාත් එක ඉවරයි, හැබැයි "අපි හිතුවා, පස් ටික බුරුල් කියලා. හැබැයි, ඝන පස් තිබුණේ. අපට වියදම වැඩියි, ඒ නිසා contingenciesවලට දමන සියයට 5 සිට සියයට 10 දක්වා තිබෙන මුදල්වලින් දෙන්න" කියන එක තමයි යටිතල පහසුකම්වලින් හොරකම් කරන ප්‍රධානතම ක්‍රමය. මේකට පුරුදු වෙලා තිබෙන්නේ. මේකට කාගෙවත් අවධානය යොමු වෙන්නෙම නැහැ. ඒ හිටපු ඇමතිවරයා ඉන්නකොට එක්තරා Chinese contractor කෙනෙකු ඇවිල්ලා ඇමතිතුමාට කියනවා, මිලියන 1,500ක් තිබෙනවා, අපිට මේ contingencies දෙන්න කියලා. ඉතින් එයා කියනවා, "නැහැ, නැහැ, අපි සල්ලි ගස්වලින් කඩනවාද, 1,500ක් බැහැ, 500යි දෙන්නේ" කියලා. අපි දන්නවා නේ, ඒ මිලියන 500 කොහේටද යන්නේ කියලා. මේ variationsවලට responsible officersලා නැහැ, හරියට. සමහර වෙලාවට තමන් ගෙවපු ගණන දන්නෙත් නැහැ, ඇමතිතුමනි. අපේ කාරක සභාවට අයිති ආයතන 47න් ගිය අවුරුදු 9, 10 ඇතුළත ගෙවපු ගණන් ඇහුවාම, ගණන කියන්න තේරෙන්නේ නැහැ, "දළ වශයෙන්" කියලා කියන්නේ. දළ වශයෙන් වුණත් ආසන්න අගයක් වෙන්න එපැයි. ඒ නිසා මම ඔබතුමාට වගකීමෙන් කියනවා, අවුරුද්දකට බිලියන 05ක්, 10ක් අතර ප්‍රමාණයක් මෙහෙම යනවා කියලා. මේකේ සමහර ඒවා දේශපාලනඥයෝ දන්නේත් නැහැ. නිලධාරින් තමයි දන්නේ. ඇත්ත වශයෙන්ම රට ඉස්සරහට යන්න නම්, මේ technical evaluation process එක common ක්‍රමයකට ගෙනෙන්න ඕනෑ. වගන්ති නැත්නම්, items 10කට විතර සීමා කරලා රට පුරාම එකම ක්‍රමයකට ගෙනෙන්න ඕනෑ. එක එක්කෙනා එක එක හේතු ඉදිරිපත් කරලා ඒ bid එකේ තිබෙන error එකත් දාලා තමයි මේ මුදල් ලැබෙන්නේ. ඔබතුමාට ඒකට අවශ්‍ය තල්ලුවක් කමිටුව තුළින් අපට ලබා දෙන්න පුළුවන් නම් ඒක අපි ලබා දෙනවා. අපි ගණන් හිලව් ඉල්ලලා තිබෙනවා. ඒවායේ ඉතිහාසය බලන්න බලාපොරොත්තු වෙනවා. බලලා, ඒ නිර්දේශ නිල වශයෙන් අමාත්‍යාංශයටත්, ඔබතුමාට පෞද්ගලිකවත් ලබා දීමට අපි කටයුතු කරනවා.

ඒ වාගේම මම ඔබතුමාට තව යෝජනාවක් කරනවා. National Planning Department එකයි, Department of National Budgetයි ක්‍රියාත්මක වෙද්දී මේ අංශයට අදාළ වැඩ කටයුතු සඳහා තාක්ෂණික නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා. ඔවුන් හරියට procurement එක plan කරද්දී ඒ විෂය දැනුම තිබෙන අය අදාළ ආයතනවල නැත්නම් මේ වැඩ කටයුතු දිගට කරන්න පුළුවන් වෙයිද කියලා මට තේරෙන්නේ නැහැ. ඒ වාගේම තමයි variation එක තුළින් කට්ටිය මුදල් ගෙවනවා නම් ඒ සම්බන්ධව responsible පුද්ගලයෙක් පත් කරන්න. ඒ පුද්ගලයා එහි වගකීම ගන්න ඕනෑ. අපට පෙනෙනවා, පසුගිය දේවල් ටික විගණනය කරගෙන ගිහිල්ලා inquiry එකක් කරලා මේවා හොයන්න

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ගියොත් සමහර වෙලාවට වගකීම් ගන්න පුද්ගලයන් නැති බව. ඒ කරුණු ටික බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් මම කරුණු දෙකක් කියන්න ඕනෑ. ඊළඟට තව අවශ්‍යතාවක් තිබෙනවා. අන්තර් ආයතන අතර සම්බන්ධීකරණය කරන්න පුළුවන් රාමුවක් තිබෙන්න ඕනෑ. සමහර වෙලාවට RDA එකෙන් හරි නගර සභාවෙන් හරි ඇවිල්ලා පාර හදලා යනවා. ඊට පස්සේ National Water Supply and Drainage Board එකෙන් ඇවිල්ලා පාර හාරනවා. ඉවරෙටම ඉවරයි. ඒ නිසා මේවා සම්බන්ධීකරණය කිරීම සඳහා master plan එකක් ඇතිව, මොකක් හරි ක්‍රමවේදයක්, government body එකක් මේකට implement කරන්න කියලා මම යෝජනා කරනවා.

ඊළඟට, RDA එකට කොළඹ නගර සභාව සහ අවට තිබෙන මහ නගර සභා එක්ක ඒකාබද්ධව කොළඹ නගරයේ රථවාහන තදබදය අවම කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලාත් අපි යෝජනා කරනවා. අපේ සිවිල් ගුවන් සේවා ඇමතිතුමා සභාවේ ඉන්නවා. අපි දන්නවා, Katunayake Airport එකේ දෙවෙනි අදියර හදන එක රීරි යකෙක් ගිලගන්න ගිහිල්ලා නේ, කෙළ වුණේ. ඒ දවස්වල කළා නම් මේ වෙද්දී හදලා ඉවරයි. නමුත් සංචාරකයන් වැඩි වෙන්නත්, high-end සංචාරකයන් එන්නත්, ඒ ජාතියේ ගුවන් යානා එන්නත් අපට වැදගත් වනවා, airport එක ලොකු කරන එක. හැබැයි අපට දැන ගන්න තිබෙන විධියට ලබන අවුරුද්දේ අප්‍රේල් මාසයේ මෙහි කටයුතු ආරම්භ කළාම 2028 වසරේ අග තමයි අවසන් වෙන්නේ. තව අවුරුදු 3ක් තිබෙනවා. ඒ නිසා පුළුවන්ද කියලා බලන්න, එතෙක් සාමාන්‍යයෙන් budgeted touristsලාට රත්මලානේ ගුවන් තොටුපළ පාවිච්චි කරන්න පුළුවන්ද කියලා. අපි දන්නවා, අර marquees 12 දමන එක හරි. Marquees 12 දැම්මත් ගුවන්යානා එන්න පුළුවන් ප්‍රමාණය සීමාසහිතයි නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Hon. Chairman, please give me 30 seconds.

රත්මලාන ගුවන් තොටුපොළ පාවිච්චි කරන්න පුළුවන්ද කියන එක ගැනත් කල්පනා කරලා බලන්න. Tourism වැඩි වෙන එක අපට අත්‍යවශ්‍යයි. Per tourist invest කරන ගණන හොයලා බලන්න. High-end touristsලා පැමිණීම අවශ්‍යයි. පරාටා කාලා, ප්ලේන් ටී බොන touristsලාත් එනවා. ඒගොල්ලන් රත්මලානට යවන්න. High-end කට්ටිය කටුනායකට ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

මාධ්‍ය ක්ෂේත්‍රයේ හිටපු පුද්ගලයෙකු විධියට මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න ඕනෑ. භාෂණයේ නිදහස තිබෙන රටක්, මේක. කථා කිරීමේ, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබෙන රටක්, මේක. සමහර පුවත්පත්, සමහර මාධ්‍ය ඔවුන්ගේ පෞද්ගලික agendasවලට කටයුතු කරන එකට අපිත් විරුද්ධයි; අපිත් ඒකට එකඟ නැහැ. නමුත් මේ රටේ හතරවැනි ආණ්ඩුව වන මාධ්‍යයට වාරණයක් දමන්න නම් යන්න එපා කියලා අපි ආණ්ඩුවට කියන්න කැමැතියි.

"අරුණ" පුවත් පත පළ කරපු අදහසක් සම්බන්ධව CID එකට ගෙන්වනවා. ඒ අයගෙන් ඉල්ලීමක් කරන්න පුළුවන්, වැරදි නම් හරි දේ දාන්න කියලා. නමුත්, මාධ්‍ය වාරණය කරන එක කට වහලා කරන්න බැහැ කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ. ආණ්ඩුවට අවුරුද්දක් ඉවරයි. තවත් අවුරුදු 4ක්ම තිබෙනවා. භය වෙන්න එපා. අපි ආණ්ඩුවේ කටයුතු කඩාකප්පල් කරන්නේ නැහැ; ආණ්ඩුව වට්ටන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, would you please wind up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අපි සාධාරණ කාලයක් දෙනවා, වැඩ ටික කරන්න. ඒ නිසා ඒ කියපු කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Bimal Rathnayake. You have 20 minutes.

[අ.භා. 11.19]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු සභාපතිතුමනි, අද ඉතාම වැදගත් කාරණා දෙකක් යෙදී තිබෙනවා. එක පැත්තකින්, අපේ අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙනවා. ඒ වාගේම, අද දිනය gender-based violenceවලට විරුද්ධ විශේෂ දිනයක් ද වෙලා තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමියලාත්, අපේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ඇතුළු නිලධාරිතුමියලාත් අද orange colour ඇඳගෙනයි ඇවිල්ලා ඉන්නේ. හැබැයි, අපි පිරිමි කවුරුවත් ඒ පාටට ඇඳලා ඇවිත් නැහැ. ඒ නිසා අප ඉබේටම වැරැදිකරුවන් වෙලා වාගේ තමයි පෙනෙන්නට තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේක විශාල ප්‍රශ්නයක්. දරුවන්ට සහ කාන්තාවන්ට තමයි වැඩිපුරම මේ හිංසනය සිදු වෙන්නේ. මෙහි orange colour එක යොදා තිබෙන එකේ අදහස වෙලා තිබෙන්නේ, "Brighter future for women and girls" යන්නයි. නමුත්, ප්‍රවාහන ඇමතිතුමා විධියට මට මේක පෙනෙන්නේ traffic lights system එකේ orange colour එක විධියටයි. දැන් මේක මීට එහාට ගියොත් red වෙනවා. Orange colour එකෙන් එන්න තිබෙන්නේ, එක්කෝ greenවලට, එහෙම නැත්නම් redවලට. මා හිතන විධියට, දැන් මෙය සීමාවකින් එහා මට්ටමට ගිහිල්ලා තිබෙනවා; cyber bullying ආදියත් එකතු වෙලා. විශේෂයෙන්ම ප්‍රවාහය තුළ කාන්තාවන්ට සහ දරුවන්ට සිදු වන හිරිහැර ඇත්තටම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අපි අද දිනයේ සිට උපරිම වශයෙන් උත්සාහ කරමින් ඉන්නවා, ඒ

තත්ත්වය ටික ටික හෝ අඩු කරන්න. අපි විශේෂයෙන්ම school van guidelines සහ office van guidelines ජනවාරි මාසයේ declare කරනවා. විශේෂයෙන්ම school vansවලට CCTV අනිවාර්ය කරන්න යනවා. එතකොට තම දරුවන් ගැන parentsලාට බලන්න පුළුවන්.

මේ ප්‍රශ්නයට තිබෙන ප්‍රධානම උත්තරය තමයි මගීන් ශක්තිමත් කරන එක. කාන්තාවකට හෝ දරුවෙකුට හෝ අතවරයක් කරන්න කවුරු හරි උත්සාහ කරනවා නම්, ඒක නොදැක්කා වාගේ ඉන්නේ නැතුව ඒකට එරෙහිව solidarity එකක් පෙන්නුම් කරන මිනිස්සු - ගැහැනු හෝ පිරිමි - අවශ්‍යයි. නමුත්, අපේ බස් කර්මාන්තයේ තිබෙන සමහර නපුරු තත්ත්වයන් නිසා මිනිස්සු හයයි තව කෙනෙකු වෙනුවෙන් ඉදිරිපත් වෙන්න. බස් කර්මාන්තය වෘත්තීමය මට්ටමට ගෙනෙන එකත්, ත්‍රිරෝද කර්මාන්තය වෘත්තීමය මට්ටමට ගෙනන එකත් මේ orange colour එක red පැත්තට යන්නේ නැතුව green පැත්තට ගෙනෙන්න අප දරන උත්සාහයක්. ඒ ගැන තමයි මට ඉස්සෙල්ලාම කියන්න තිබෙන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, එතුමා වැදගත් විධියට පොළොවේ පය ගහලා අදහස් ඉදිරිපත් කිරීම පිළිබඳව. මම හිතනවා, එතුමාගේ ප්‍රශ්නවලට අපේ ගරු නියෝජ්‍ය ඇමතිවරුන් දෙදෙනාත්, අනෙක් මන්ත්‍රීතුමන්ලාත් උත්තර දෙයි කියලා. ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔබතුමා නිශ්චිත වශයෙන් කිව්වා අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳව. ගරු සභාපතිතුමනි, අපේ සමස්ත අමාත්‍යාංශයේ මාර්ග, ප්‍රවාහන සහ urban development කියන අංශ එකතු වුණාම අපි බලාපොරොත්තු වෙනවා, මේ වසරේ දෙසැම්බර් 31වන විට සියයට 82ත්, 88ත් අතර ප්‍රගතියකට අපට එන්න පුළුවන් වෙයි කියලා. නමුත් අපි එතුමා කියපු දේ පිළිගන්නවා. අපි එම කටයුතු මීට වඩා කාර්යක්ෂම කරන්න ඕනෑ. අපට මීට වඩා cover කරන්න තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම වගකීමෙන් කාරණයක් කියන්න කැමැතියි. දැනට අපේ Budget programme එකේ යෝජනා ගණනාවක් තිබෙනවා. සමස්තයක් වශයෙන් ගත්තොත්, ගරු ජනාධිපතිතුමා එතුමාගේ අය වැයෙහි යෝජනා 29ක් අපට දීලා තිබෙනවා. එම අය වැය යෝජනා යටතේ 2026 අය වැය ඇස්තමේන්තුව - කෙටුම්පත - මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් අමතර වශයෙන් රුපියල් බිලියන 52ක් අපට දීලා තිබෙනවා. ඒ වාගේම, එතුමා අය වැය යෝජනා මඟින් අපේ අමාත්‍යාංශයට ඍජුවම තවත් රුපියල් බිලියන 8.6ක් දීලා තිබෙනවා. මම මෙතැනදී විශේෂ කාරණයක් කියන්න කැමැතියි. මේවා estimate කරලා ජනවාරි 01වැනිදාට gear එක මාරු කරන එක තමයි මේ සඳහා වන එක solution එකක් වෙන්නේ. ඒ අනුව, අපි highways පැත්තෙන් දෙසැම්බර් 31 වන විට සියයට 90ක් estimate කරලා අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා, ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි. අපේ සම්පූර්ණ Ministry එකේ target එක, මූලික estimateවලින් සියයට 70ක් දෙසැම්බර් 31 වන විට හදලා ඉවර කරන්නයි. අපි එය ඉටු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි volunteer පදනමින් වැඩ කරන procurement specialistsලා විවිධ ආයතනවලින් අරගෙන අපේ අමාත්‍යාංශයේ නිලධාරින්ට අවශ්‍ය සහාය ලබා දෙන්නත් බලාපොරොත්තු වෙනවා. ගරු ජනාධිපතිතුමා සහ මුදල් අමාත්‍යාංශය සල්ලි ගොඩක් වෙන් කරනවා. සල්ලි වැඩි වෙන කොට, විශේෂයෙන්ම ගත්තොත් procurement කටයුතුවලදී ඊට ගැළපෙන විධියට අපට නිලධාරිනුත් අවශ්‍ය වෙනවා. ඒක ගරු ජනාධිපතිතුමාත් අපට කියපු දෙයක්. මොකද, procurement පැත්තෙන් තිබෙන ගැටලුව ගත්තාම, එය අපේ අමාත්‍යාංශය පොදුවේ මුහුණ දීලා තිබෙන අභියෝගයක්.

අය වැය යෝජනාවලට අදාළව ගත්තොත්, අමාත්‍යාංශ ලේකම්තුමාත්, මමත්, නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාත් සම්බන්ධ වෙලා දැනට සාකච්ඡා 3ක් පවත්වා තිබෙනවා. ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනා සම්බන්ධයෙනුත් අපි දැන් මූලික සැලසුම් හදාගෙන ගිහින් තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ අය වැය කථාවෙන් අපේ අමාත්‍යාංශයට වෙන් කරපු දේවල් මොනවාද කියලා මුදල් අමාත්‍යාංශයේ අය වැය දෙපාර්තමේන්තුවෙන් - Department of National Budget මඟින් - අපට නිශ්චිත වශයෙන් පෙන්වා දී තිබෙනවා. මොකද, අපි පසුගිය අවුරුද්දේ එක අත් දැකීමකට මුහුණ දුන්නා. ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී එතුමා ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රධාන කරුණක් ගැන කිව්වා. ඒක අයිති මොන අමාත්‍යාංශයටද, මොන දෙපාර්තමේන්තුවටද, කොපමණ ප්‍රමාණයක්ද කියලා දැන ගන්න සමහර විට අපට මාස දෙකතුනක් ලියුම් ලියන්න වෙනවා. නමුත්, අපි ඒක දැනටමත් අවසන් කරලා තිබෙනවා. මේක තමයි Budget Office එකෙන් එවලා තිබෙන article එක. මම මේ article එක **සභාගත*** කරනවා.

මේකෙන් අපට clear-cut ලෙස දීලා තිබෙනවා මෙන්න මේවා තමයි ජනාධිපතිතුමාගේ අය වැය යෝජනාවලින් අපේ අමාත්‍යාංශයට අයිති ඒවා කියලා. ඉතින් අපි homework කරගෙන යනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා ඔබතුමා කිව්ව විධියට අපට ඒ ප්‍රගතිය ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපේ අමාත්‍යාංශය යටතේ ආයතන ගණනාවක් තිබෙනවා. එකක්, මාර්ග සංවර්ධන අධිකාරිය. තවත් එකක්, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව. නාගරික සංවර්ධනය පැත්තෙන් තිබෙනවා, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය - UDA එක, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය. ප්‍රවාහන අංශය පැත්තෙන් තිබෙනවා, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, ලක්දිව ඉංජිනේරු (පෞද්ගලික) සමාගම. මේ ආයතන ප්‍රමාණය තමයි ජනාධිපතිතුමා අපට ගැසට් මඟින් පවරා දීලා තිබෙන්නේ. මම මේ ආයතන ගැන මතක් කළේ, මේ හැම ආයතනයක්ම ජාතික කර්තව්‍යයක් ඉටු කරන නිසා. හැබැයි, අපේ කථාවලදී මේ සෑම ආයතනයක් ගැනම කියන්න බැරිවෙයි. ඒ ආයතනවල සිටින ආයතන ප්‍රධානීන් ඇතුළු සියලු ම නිලධාරින්ට අපේ ගරුත්වය හිමි වෙනවා. අපි අගය කරනවා, ඒ ගොල්ලන් දරන මහන්සිය. අපි ඒ අයගෙන් ඉල්ලා සිටිනවා, 2026 අවුරුද්දේදී මීටත් වඩා කාර්යක්ෂමව කටයුතු කරලා තවත් ඉස්සරහට යන්න කියලා.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශයට අලුතින් එකතු වෙලා තිබෙනවා නාගරික සංවර්ධන කොටස. ඒක විශාල කොටසක්. ඒ කොටස තුළින් ලබාගත් සියලුම ජයග්‍රහණවල කීර්තිය, ගරු අරුණ කරුණාතිලක ඇමතිතුමාට තමයි හිමි වෙන්න ඕනෑ. මොකද, අපි තවම එහි මොනවත් කරලා නැහැ. එතුමා කරපු දේවල් නිසා තමයි ඒ සියලු ප්‍රගතිය, ශක්තිය ලැබිලා තිබෙන්නේ. එරංග නියෝජ්‍ය ඇමතිතුමා, එතුමාගේ කථාවේදී ඒ ගැන කියාවි. අපේ පවුලෙන් පොඩ්ඩක් ඈත් වුණත්, ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා අපිත් එක්ක අවුරුද්දක් වැඩ කළා. එතුමා, කලින් වාගේම වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය ඇමතිතුමා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

විධියට කටයුතු කරනවා. ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා, අපිත් එක්ක වැඩ කරද්දී වරාය සහ සිවිල් ගුවන් සේවා අංශයට අමතරව අපේ DMT එකට වාගේම අනෙක් හැම එකකටම මැදිහත් වුණා, හොඳ සහෝදරයෙක් වාගේ. අපි මොනවා හරි දෙයක් අත්පත් කරගෙන තිබෙනවා නම්, ඒවායේ ගරුත්වය එතුමන්ලාට ලැබිය යුතුයි.

ගරු සභාපතිතුමනි, මම තව කරුණු ටිකක් කියන්නම්. පසුගිය කාලයේ පැවති ආණ්ඩුවලින් නිලධාරින් බඳවා නොගැනීම, මානව සම්පත බඳවා නොගැනීම පිළිබඳව ගැටලුව සුවිශාල ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශයේ කළමනාකරණ කමිටු හැම එකකදීම, අනිවාර්යයෙන්ම සංවර්ධනය සහ කළමනාකරණ ගැටලු කියන ඒවා ගැන සම්පූර්ණයෙන් එකටම අපි කථා කරනවා. අපි කවදාවත් සංවර්ධන කටයුතු වෙනුවෙන් මුල් තැන දීලා, වැඩ කරන අයගේ කටයුතු කළමනාකරණ කමිටුවෙන් පිට තබලා නැහැ. අපි හැම දෙපාර්තමේන්තුවකම කළමනාකරණ කමිටුවක් පවත්වාගෙන යනවා. ඒ නිසා, පසුගිය වසර ඇතුළතදී - වසරකට අඩු කාලයකදී - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට 1,405ක්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට 762ක්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට 28ක්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවට 14ක්, මාර්ග සංවර්ධන අධිකාරියට 1,503ක්, නාගරික සංවර්ධන අංශයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට 71ක්, නාගරික සංවර්ධන අධිකාරියට 144ක්, සභාධිපත්‍යය කළමනාකරණ අධිකාරියට 48ක් වශයෙන් නිලධාරින් 3,975ක් බඳවා ගැනීමට අපිට පුළුවන් වෙලා තිබෙනවා. ඒ විධියට ඉදිරියටත් බඳවා ගැනීම් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු මරික්කාර් මන්ත්‍රීතුමා මට මේ ගැන කිව්වා. විශාල බරක් අදින RDA එකේ නිලධාරින් ගැන මට අවංකවම කම්පනයක්, දුකක් තිබෙනවා. ලංකාවේ capital budget එකෙන් සියයට 30ක් කරන්නේ ඒ ගොල්ලෝ. හැබැයි, ඒ ගොල්ලන්ගේ දීමනා සහ වැටුප් ඉතා පහළ මට්ටමක තමයි තිබෙන්නේ. මමත් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා ගොඩකට මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා තිබෙනවා. ඒ ගොල්ලන්ගේ සමුළුවලටත් ගිහිල්ලා මම කථා කරලා තිබෙනවා. මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වා, මගේ අනුකම්පාව ගැන. මගේ අනුකම්පාව විතරක් නොවෙයි, my whole heart is with them. ඒ ඇයි? ඒ ගොල්ලෝ මට postcards එවලා තිබෙනවා. Strike කරලා කඩාකප්පල්කාරී විධියට හැසිරෙන්නේ නැතිව ඉතා වැදගත් විධියට, decent විධියට එවලා තිබෙනවා. මොකද, පොඞ්ඩ ඇත්නම්, හොස්ස ළඟින් මැස්සා යනකොට strike කරන සමහර අය ඉන්නවා. අපි ආණ්ඩුවක් විධියට මහන්සි වන බව, කැපවෙන බව, හොරකම් නොකරන බව නොතේරෙන රාජ්‍ය නිලධාරියෙක් වසරකට පස්සේ ඉන්න බැහැ කියලා මම හිතනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය මත මම මේ postcard එක **සභාගත*** කරනවා.

In it, they say, I quote:

> "Dear Sir/..., please resolve the salary issues of RDA Engineers. RDA Engineers deserve a fair and just pay. We request your urgent intervention."

RDA එකේ ඒ ප්‍රශ්නය තිබෙනවා. අපි මුදල් අමාත්‍යාංශයෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, ප්‍රගතියක් අවශ්‍ය නම් කරුණාකරලා මේ ප්‍රශ්නය විසඳලා දෙන්න කියලා. නීති කියන්නේ දෙවියන් වහන්සේ හදපු ඒවා නොවෙයි, මිනිස්සු හදපු ඒවා. අපි ඒවා පිළිගන්නවා. මේවායේ විශාල අවුල් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ දෙපාර්තමේන්තුව මේවා ඉතාම පිළිවෙළකට හදන්න මහන්සි වෙනවා කියලා අපි දන්නවා.

මේවා යම්කිසි uniformity එකකට ගෙනෙන්න අවශ්‍යයි. ගරු කථානායකතුමනි, හැබැයි අවුරුදු 25ක් තිස්සේ, අවුරුදු 30ක් තිස්සේ කරපු අවුල් එකපාර සියයට 100ක්ම balance කරන්න ගියොත් ඒකෙන් අසාධාරණයක් සිද්ධ වෙනවා. මේ ප්‍රශ්නය UDA එකේ engineersලාට තිබෙනවා. මම හිතන විධියට කරුණාතිලක ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් විශාල මහන්සියක් ගත්තා. ඒ වාගේම SLLDC එකේ engineersලාටත් ඒ ප්‍රශ්නය තිබෙනවා. පොදුවේ ගත්තොත් අපේ දෙපාර්තමේන්තු ඇතුළු අපේ අමාත්‍යාංශය තුළ සිටින හැම ඉංජිනේරුවෙකුම මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. අනෙක් වෘත්තීන්වලත් ගැටලු තිබෙන බව ඇත්ත. නමුත් මේ ඉංජිනේරුවන්ගේ ප්‍රශ්නය විසඳිය යුතුයි කියලා මම හිතනවා. කිසිම ගෝත්‍රික අදහසකින් නොවෙයි; ගෝත්‍රවාදයකින් නොවෙයි මම මේ කථා කරන්නේ. මට කවුරුත් එකයි. නමුත් මම පිළිගන්නවා; අපි තර්කානුකූලව ඔප්පු කරලා තිබෙනවා, ඔවුන්ට ගෙවන ගණන මදි, ඒක වෙනස් වෙන්න ඕනෑ කියලා. ගරු සභාපතිතුමනි, මම මේ තැපැල්පත හැන්සාඩ්ගත කළා. තැපැල්පතක් හැන්සාඩ් වාර්තාවට යන ලංකාවේ පළමුවැනි අවස්ථාව මෙය වෙන්න පුළුවන්. සියලුදෙනාගේම උදව්වෙන් ඉංජිනේරුවන්ගේ ගැටලුව අපට ඉතාම ඉක්මනින් විසඳා ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, මට තව කෙටි වෙලාවක් තිබෙන නිසා මහාමාර්ග ක්ෂේත්‍රය ගැනත් කථා කරන්න කැමැතියි. මහාමාර්ග ක්ෂේත්‍රය ගත්තොත්, ජනාධිපතිතුමා ග්‍රාමීය මාර්ග හදන්න විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අපි දැනට ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති සඳහා රුපියල් කෝටි 2,229ක -රුපියල් බිලියන 22.29ක- ඇස්තමේන්තු අනුමත කරලා තිබෙනවා. ඒ ඇස්තමේන්තුවල සමස්ත වටිනාකම රුපියල් බිලියන 22.29යි. අනුමත කරලා නොවෙයි, අනුමත කරපු ඒවායේ breakdown එකක් තිබෙනවා. නමුත්, ග්‍රාමීය මාර්ග වෙනුවෙන් අපි පසුගිය වසරේ රුපියල් බිලියන 22.29ක් වෙන් කරලා තිබෙනවා. දැන් ඒවායේ විස්තර කියන්න ගියොත් වෙලාව ගත වෙනවා. අපි ලබපු ලොකුම ජයග්‍රහණයක් තමයි මධ්‍යම අධිවේගී මාර්ගයේ කටයුතු පටන් ගන්න ලැබීම. ඔවුන් ඒක ඉතාම පිළිවෙළට කරනවා කියලා අපට තොරතුරු ලැබී තිබෙනවා. මුදල් අමාත්‍යාංශයෙන් අපට මුදල් ලබා දීලා තිබෙනවා, මධ්‍යම අධිවේගී මාර්ගයේ කටයුතු අවසන් කරන්න. මරික්කාර් මන්ත්‍රීතුමා කියපු මධ්‍යම අධිවේගී මාර්ගය ගිහිල්ලා වැටෙන ගලගෙදර සහ රඹුක්කනට අදාළ පාරවල් - ඒවාත් එක්කම - අපි හදනවා. එහෙම නැත්නම් එතැන traffic ඇති වෙන ප්‍රශ්නයක් එනවා.

ඊළඟට, රුවන්පුර අධිවේගී මාර්ගය ගත්තොත්, අපට තවම donor කෙනෙක් නැහැ. නමුත්, අපි ඉඩම් අත්පත් කර ගැනීම පටන් ගන්න සල්ලි දීලා තිබෙනවා. ඒ වාගේම අපි දඹුල්ල මාර්ගයේත් ඉඩම් අත්පත් කර ගන්න මුදල් වෙන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි ගෝල් ෆේස් ලෝටස් වටරවුමේ ඉඳලා මුහුද අයිනෙන් පාරක් ගෙනයාම සම්බන්ධයෙන් feasibility study එක කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම උතුරයි, නැඟෙනහිරයි එකතු කිරීම සඳහා Kokkilai Lagoon එකේ පාලමක් හැදීම සම්බන්ධව feasibility study එකක් කරන්න අපි කටයුතු ආරම්භ කරන්න යනවා. ඒ වාගේ ඉතාම වැදගත් තවත් මාර්ග සම්බන්ධයෙන් වැඩකටයුතු පටන් ගන්නවා. ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කරයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ වරායේ elevated highway එකත් ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ තිබෙන්නේ. ඒ contractor, ඒ කොම්පැනිය විශාල ආර්ථික අර්බුදවලට මුහුණ දීලා තිබෙනවා. ඇත්තටම ආණ්ඩුවේ අඩුපාඩුකම් වාගේම, නිලධාරින්ගේ අඩුපාඩුකම් වාගේම, ඊට වඩා contractorsලාගේ ප්‍රශ්න තිබෙනවා. නමුත්, අපේ ලේකම්තුමන්ලා මහන්සිවෙලා යම්කිසි solution එකක් දැන් ගෙනැවිත් තිබෙනවා. අඩු ගණනේ ලබන අවුරුද්ද මැද වෙනකොටවත් elevated highway එකේ කටයුතු අවසන් කරලා වරායේ ප්‍රයෝජනයට දෙන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, අපි ප්‍රථම වතාවට ලංකාවේ road safety කියන එක අපේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ඉහළටම අරගෙන තිබෙනවා. එම නිසා RDA එක විතරක් road safetyවලට රුපියල් බිලියන 2කට වඩා මුදලක් වෙන් කරනවා. ඒ ගොල්ලන් දැන් කඳුකර මාර්ගවල guardrails හදන්න පටන් ගෙන තිබෙනවා. සමහර තැන්වල පස් බැම් හදනවා. ඒ වාගේම ඒ ගොල්ලෝ බලාපොරොත්තු වෙනවා, වංගුවල - හැම වංගුවක්ම අපට පේන්නේ මෙහෙම නේ. එතකොට අපට කිසිම විශේෂත්වයක් නැහැ. හැබැයි සමහර වංගු තිබෙනවා, අංශක 70, 80, 90. එම නිසා ඒ වංගු තිබෙන විධියටම - as it is - පෙන්වන්න අපි බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි. එතකොට අපට යම්කිසි අවබෝධයක් එනවා. නිකම් හෝමාගම පැත්තේ තිබෙන වංගුවක් වාගේ නොවෙයි. හෝමාගම පැත්තේ තිබෙන වංගුවට තිබෙන්නෙත්, ගොඩගම හරියේ තිබෙන වංගුවට තිබෙන්නේත් එකම sign එක. ඉතාම දරුණු ඇල්ලේ වංගුවට තිබෙන්නේත් ඒකම තමයි. එම නිසා DMT එකේ නිලධාරින්ම තමයි ඒක යෝජනා කළේ. අපි ඒවාට මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි පසුගිය වතාවේ උතුරු පළාත වෙනුවෙන් විශාල මුදලක් වෙන් කළා. එහි ඉතාම දුෂ්කර ජීවිත ගත කරපු ජනතාවක් ඉන්නවා. ඒ අය යුද්ධය නිසා බැට කාපු ජනතාවක්. ඒ ප්‍රතිපත්ති අනුව අපි මේ වතාවෙත් උතුර සහ නැඟෙනහිර පළාත් දෙකටම මුදල් වෙන් කරලා තිබෙනවා. කිරාන් පාලමට ජනාධිපතිතුමා මුදල් වෙන් කළ බව මන්ත්‍රීතුමන්ලා දන්නවා. ඒ වාගේම අපි උතුරේත් විශාල සංවර්ධනයක් ඇති කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම ඔබතුමා දන්නවා, අපි - ආණ්ඩුවෙන් - මලෙයහම් ජනතාවට රුපියල් 200ක් පඩි වැඩි කළ බව. ඒකට සමහර අය විරුද්ධත් වුණා. නමුත් ඊට අමතරව අපි වෙන ව්‍යාපෘතියකින් ඉතුරු වෙච්ච මුදල් ප්‍රමාණයක් වන රුපියල් බිලියන 3.8ක් - රුපියල් කෝටි 380ක් - වතුකරයේ පාරවල් සඳහා වෙන් කර තිබෙනවා. නුවරඑළියට රුපියල් කෝටි 100ක්, බදුල්ලට රුපියල් කෝටි 100ක්, රත්නපුරයට රුපියල් කෝටි 100ක්, කෑගල්ලට රුපියල් කෝටි 80ක් වශයෙන් රුපියල් බිලියන 3.8ක් මලෙයහම් ජනතාව ජීවත් වෙන වතුකරයේ පාරවල් සෑදීම සඳහා පමණක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේ දේවල් ටිකක් අපි කරලා තිබෙනවා. කරගන්න බැරි වෙච්ච ඒවාත් තිබෙනවා. කිලෝමීටර් 100,000 මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ නතර වෙච්ච කටයුතු ටිකක් තිබෙනවා. නමුත් අපි ඒවා කරන්න පටන් ගන්නවා. මොකද, වැරදි තීන්දු වුණාට අපි ඒවා අත හරින්නේ නැති නිසා.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විශාල විනාශයකට ලක් වෙලා තිබෙන ආයතනයක්. ජනාධිපතිතුමා මෙවර එතුමාගේ අය වැයෙන් විතරක් රුපියල් බිලියන 6.5ක් දීලා තිබෙනවා කියලා ඔබතුමා දන්නවා. අපි ලංගම ගොඩනඟන්න මහන්සි වෙනවා. ඒකෙදි අපි විශේෂයෙන්ම ඒකට අනුබද්ධ Lanka Metro Transit (Pvt.) Limited එක පටන් ගෙන එහි මූලික වැඩ කටයුතු අවසන් කරලා තිබෙනවා. ලබන මාර්තු, අප්‍රේල් මාසවලදී Lanka Metro Transit (Pvt.) Limited එකට රියැදුරු සහ කොන්දොස්තරලා recruit කරලා, උපරිම ජූනි මාසය වෙනකොට Colombo metropolitan area එකේ සාමාන්‍ය මිනිස්සුන්ට යන්න පුළුවන් බස් 70ක වාගේ ප්‍රමාණයකින් pilot project එකක් විධියට metro service එක පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව දුර ගමන් සේවා සඳහා ලංගමයට බස් 600ක් ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, නාගරික සංවර්ධන අංශය ගැනත් වචනයක් කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අමාත්‍යාංශය පැත්තෙන් අපි මේ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. කොළඹ නගරයේ ප්‍රධාන මහල් නිවාස 25ක් තිබෙනවා. දුෂ්කර කොන්දේසි යටතේ තමයි එම නිවාසවල ජීවත් වෙන්නේ. ඒවායින් තෝරාගත් ප්‍රමාණයකට ඉතා ඉක්මනින්ම දෙන්න පුළුවන් පහසුකම් මාස තුනක්, හතරක් ඇතුළත දෙන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම, ප්‍රධාන නගර 10ක් සැලසුම් කරලා ගොඩනඟන්නත් ජනාධිපතිතුමා අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. අපි ඒකට අදාළ මූලික සාකච්ඡා හෙට, අනිද්දා පටන් ගන්නවා. ලංකාවේ නගර 100ක්වත් මේ අවුරුදු 5දී modernize කරන්න තමයි අපේ මූලික plan එක තිබෙන්නේ. නගර කියන්නේ කඩවල් දාන තැන් නොවෙයි, ජනතාවට ජීවත් වෙන්න පුළුවන් තැන්. Urban development සහ transport කියන අංශ එකතු වෙලා අවිස්සාවේල්ල, ඇහැලියගොඩ ඉන්න මිනිස්සු කොළඹට ගෙනැල්ලා මෙහේ කොහේ හරි මුඩුක්කුවක පදිංචි කරන එක නොවෙයි කළ යුත්තේ. ඒ වෙනුවට එම නගරවල හොඳ පහසුකම් ඇති කරලා, ඈත ප්‍රදේශවල modern cities හැදුවාට පස්සේ ඒ ගොල්ලන්ට එතකොට ගමේ ඉන්න පුළුවන්. ඒ ගොල්ලන්ට අවශ්‍ය වෙලාවට කොළඹට එන්න හොඳ පාරවල් තිබෙනවා, හොඳ කෝච්චි තිබෙනවා. නැත්නම් ඔක්කෝම කොළඹට ආවා නම් අපි මැනිලා හරි, කරකාස් හරි, සා ඕ පාවුලෝ හරි වාගේ disastrous level එකකට පත් වෙනවා.

ඒ වාගේම තමයි අපේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මේ මාස කීපයේදී විශාල වැඩ කොටසක් කරනවා. අනුර කරුණාතිලක මැතිතුමාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවත්, ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලාත් මහන්සි වෙලා කොළොන්නාවේ සහ ගම්පහ වාගේ දිස්ත්‍රික්කවල ගංවතුර පාලනය සැලකිය යුතු මට්ටමකට අඩු කරලා තිබෙනවා. "නාගරික ගංවතුර" කියන ප්‍රශ්නය තවදුරටත් විසඳන්න තිබෙනවා.

ඒ වාගේම අවසාන වශයෙන් මේ සම්බන්ධවත් මම කියන්න කැමැතියි. Condominiums සම්බන්ධයෙන් කියනවා නම් ඒක විශාල බිස්නස් එකක්. ඒක හොඳ දෙයක්, කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් Condominiumsවල ජීවත් වන මිනිස්සුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. ඒවා ආණ්ඩුවෙන් දුන්න ඒවා නොවෙයි කියලායි මම කියන්නේ. එකක වටිනාකම රුපියල් මිලියන 30යි, රුපියල් මිලියන 40යි, රුපියල් මිලියන 50යි. හැබැයි ඒවා හදන අය ඒවාට වගකියන්නේ නැහැ. Condominiumsවල මිනිස්සුන්ට අයිතිවාසිකම් නැහැ. One-year defect liability period එක විතරයි තිබෙන්නේ. මම බලලා උපදෙස් දුන්නා. සිංගප්පූරුව වාගේ රටක් ගත්තොත්, defect liability කියන්නේ වෙන දෙයක්. නමුත් අවුරුදු 3, 4කින් වෙන දෙයක් වෙන්න පුළුවන්. වතුර leak වෙන්න පුළුවන්. ඒ නිසා සිංගප්පූරුව ගත්තොත්, අවුරුදු 15ක් යනකම් වගකියන්න ඕනෑ කියලා condominium plansවල තිබෙනවා. ඒ නිසා ඒවා හදන්න කියලා ඒ අදාළ නිලධාරින්ට මම උපදෙස් දීලා තිබෙනවා. ගෙවල් 53,000ක් වන massive plan එකක් ගැන එස්. එම්. මරික්කාකර් මන්ත්‍රීතුමා කිව්වා. අපිට ඒවා ඔක්කෝම කරන්න සල්ලි ආලා නැහැ. නමුත් එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමාගේ නායකත්වයෙන් අපිට ක්‍රමානුකූලව සහ සැලැස්මක් ඇතුව මේක කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න කැමැතියි. මමත් එක්ක ත්‍රිවිධ හමුදාවම ඉන්නවා. එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා, ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. මම ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමාත් ගෙන්වා ගත්තා. අපිට දිස්ත්‍රික්ක 25 මන්ත්‍රීලා 25ක් ඉන්නවා උදවු කරන්න. එතුමාව තමයි representative විධියට ගත්තේ. මේ අභියෝගයට මුහුණ දෙන්න අපි ලැහැස්තියි. 2026 අවුරුද්ද අවසානයේදී අපිට හොඳ record book එකක් ගන්න පුළුවන් වෙයිද කියලා අපි බලමු. අවසාන වශයෙන් අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, ඒ වාගේම අනෙකුත් සියලු නිලධාරීන්ටත්, මාධ්‍යටත් ස්තුතිවන්ත වෙනවා. මට ප්‍රවාහනය සම්බන්ධයෙන් දැනුම ලබා දෙන්නේ ජනතාව. ඒ ජනතාවගේ recordings දහස් ගණන් මා ළඟ තිබෙනවා. මම කවදාහරි මේ අමාත්‍යාංශයෙන් යන දවසට ඔක්කෝම හොඳට හදලා ප්‍රවාහන අමාත්‍යාංශයට පරිත්‍යාග කරනවා. මෙච්චර මූලාශ්‍ර නැහැ වෙන කොහේවත්. ඒ නිසා අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා; මගීන්ට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපට ස්වේච්ඡාවෙන් වැඩ කරන volunteersලා රාශියක් ඉන්නවා. විශේෂයෙන්ම NIO Engineering (Pte.) Ltd. එකේ කණ්ඩායම අපට උපරිම වශයෙන් උදව් කරනවා. ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ ප්‍රවාහන, මහා මාර්ග කියන හැම අංශයක් ගැනම කථා කරන්න වෙලාවක් නැහැ. UDA එක ගැන කථා කළ යුතුවම තිබුණු නිසා මම කථා කළා.

කඩුගන්නාවේ ප්‍රශ්නය ගැනත් කථා කරන්න මට තත්පර 10ක් දෙන්න, ගරු සභාපතිතුමනි. කඩුගන්නාවේ ප්‍රශ්නය ඇත්තටම ඛේදවාචකයක්. මම අද RDA එකේ Director Generalටත් එන්න එපා කිව්වා. ඔහු කඩුගන්නාවේ ඉන්නේ. ඊයේ තත්ත්වය අනුව, අද උදේ ලැබුණු NBRI එකේ උපදෙස් මත ඒ වැටිච්ච ගලත්, ඒ ආශ්‍රිත වැටීමට ඉඩ තිබෙන ගලුත් slowly blast කරලා, ක්‍රමානුකූලව අයින් කරලා, අඩු ගණනේ දවස් දෙක තුනකින් පාරේ එක lane එකක්වත් විවෘත කරන්න අපි කල්පනා කළා. අර blink වෙන traffic lights දෙපැත්තට දාලා, - නමුත්, අද උදේ මට RDA DG කිව්වා, NBRI එක උපදෙස් දුන්නා කියලා, වහින වෙලාවේදී - තෙතමනය සහිත වෙලාවේදී - අපි blast කළොත් මේක තව වැඩිවෙන්න පුළුවන් කියන එක. දැනට 98වැනි කිලෝමීටරය අසළ පාර බැහැලා තිබෙනවා. ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ ගැන බැලුවා. කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිවරයෙක් වශයෙන් (වෛද්‍ය) දම්මික ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් ගොඩක් මහන්සි වුණා. අපි බලාපොරොත්තු වෙනවා, සාමාන්‍ය වියළි තත්ත්වයට ආවාට පසුව පාරේ ගිලා බැහැපු තැන් තාවකාලිකව ප්‍රතිසංස්කරණය කරලා NBRI එකේ උපදෙස් මත හෙට හෝ අනිද්දා නුවර පාරේ එක lane එකක් විවෘත කරන්න. ගරු රවුෆ් හකීම් මැතිතුමනි, විශාල overhaul එකකට අපට යන්න වෙයි. දැනටමත් GSMB එකෙන් drone surveys පටන්ගෙන තිබෙනවා. Geological Survey and Mines Bureau - GSMB - එක ගිහිල්ලා එතැන තිබෙන තත්ත්වය මොකක්ද කියලා බලලා physically ඒක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා කඩුගන්නාවේ තත්ත්වය ටිකක් බරපතළ තත්ත්වයක්. අපි බලාපොරොත්තු වෙනවා, දවසක් හෝ දෙකක් ඇතුළතදී එක lane එකක් විවෘත කරලා traffic එකට open කරන්න. නමුත්, එතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එහි සමස්ත වාර්තා අරගෙන, ගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කරලා උත්තර දෙන්න බලාපොරොත්තු වෙනවා. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Gnanamuththu Srineshan. You have ten minutes.

[பு.ப. 11.43]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தவிசாளர் அவர்களே, முதலில் இன்றைய விவாதத் தலைப்புகளுக்கமைவான சில விடயங்களைக் குறிப்பிட்டுவிட்டு, தொல்லியல் தொடர்பாக மட்டக்களப்பில் நடைபெறுகின்ற விடயங்கள் தொடர்பாகவும் இறுதியாகக் கூறலாமென நினைக்கின்றேன். அந்த வகையில் முதலாவதாக, போக்குவரத்துத்துறை பற்றிய விடயத்தில், கிழக்கு மாகாணம், மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டாலும், ஏன், வடக்கு, கிழக்கை எடுத்துக்கொண்டாலும், அங்கு இலங்கைப் போக்குவரத்துச் சபையில் பேருந்துச் சாரதிகள், நடத்துநர்கள் பற்றாக்குறை இருக்கின்றபடியால், இந்தச் சேவையை முழுமைப்படுத்துவதற்கு முடியாதவொரு நிலைமை காணப் படுகின்றது. சாரதிகள், நடத்துநர்களை நியமிப்பதற்கான நேர்முகப்பரீட்சைகள் தற்போது நடாத்தப்பட்டிருக்கின்ற தென்று நினைக்கின்றேன். அந்தப் பிரதேசங்களிலிருக்கின்ற பல இளைஞர்கள் இந்த நேர்முகப்பரீட்சைக்கு முகம் கொடுத்திருக்கின்றார்கள். எனவே, அந்தப் பிரதேசத்தைச் சேர்ந்தவர்களை குறித்த பதவிகளுக்கு இணைத்துக்கொள்வதன் மூலமாக அந்தப் பற்றாக்குறையை நிவர்த்தி செய்யுமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன். அதேபோன்றுதான் போக்குவரத்துச் சேவையில் பழைய பேருந்துகள் ஈடுபடுத்தப்பட்டுள்ளதோடு, பேருந்துகளுக்கான தட்டுப்பாடும் இருக்கின்றது. எனவே, அந்தப் பற்றாக்குறையை நிவர்த்திசெய்யும் வகையில், பேருந்துகளை வழங்குவதற்குரிய நடவடிக்கையை எடுக்குமாறும் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, நெடுஞ்சாலைகள் பற்றிய விடயத்தைக் குறிப்பிட வேண்டும். நெடுஞ்சாலைகள் அமைக்கப்படுகின்றன; குறுகிய காலத்தில் அவை பழுதடைந்தும் விடுகின்றன; மீண்டும் புதிதாக அவற்றை அமைக்க வேண்டிய நிலைமைகள் காணப்படுகின்றன. எனவே, நெடுஞ்சாலைகள் அமைக்கப் படுகின்ற விடயத்தில், என்ன நடைபெறுகின்றது? மோசடிகள் இடம்பெறுகின்றனவா? என்ன காரணத்தினால் பழுதடைதல் நடைபெறுகின்றது? எங்கு குறைபாடு இருக்கின்றது? என்ற விடயங்களைக் கண்டறிந்து, அதற்குரிய பரிகாரம் தேடப்பட வேண்டும்; அவை முறையாக அமைக்கப்பட வேண்டும் என்ற விடயத்தை இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இதைவிட, படுவான்கரை, எழுவான்கரை என்ற பிரதேசங்கள் இரண்டையும் இணைக்கின்ற பாலம் சம்பந்தமாக அடிக்கடி நான் பிரஸ்தாபித்திருக்கின்றேன். கடந்த காலத்தில் நரிப்புல் தோட்டப் பாலத்துக்குரிய ஆரம்ப வேலைகள் நடைபெற்று, பாறைகள் கண்டுபிடிக்கப்பட்டிருக்கின்றன. ஆனால், பாலம் அமைக்கப்படவில்லை. இதேபோன்றுதான் மண்டூர், அம்பிளாந்துறை, கிண்ணையடி பாலங்கள் அமைக்கப்பட வேண்டியிருக்கின்றது. ஒரு வரவு செலவுத் திட்டத்தில் ஒரு பாலத்தின் வேலைகளையாவது ஆரம்பித்தல் அல்லது முன்கொண்டு செல்லுதல் என்ற வேலைத்திட்டத்தின் அடிப்படையில் நீங்கள் செயற்படுகின்றீர்கள். அந்த வகையில், கிரான் மற்றும் பொண்டுகள்சேனை பாலங்களின் ஆரம்ப வேலைகள் நடைபெறுவதை அறிகின்றோம். அதற்காக நாங்கள் நன்றி தெரிவித்துக் கொள்கின்றோம்.

அதைவிட, விமான போக்குவரத்துச் சேவை தொடர்பாக சொல்ல வேண்டும். மட்டக்களப்பு வலையிறவு விமான

நிலையத்துக்குச் செல்வதற்கான பாதையொன்று மூடப் பட்டிருப்பது சம்பந்தமாகக் கடந்த காலத்தில் நான் Adjournment Motion ஒன்றைக் கொண்டுவந்தபோது, பிரதி அமைச்சர் அவர்கள் உத்தரவாதம் தந்திருந்தார், அந்தப் பாதையை திறந்துவிடலாம், அதற்குரிய வேலைகளைச் செய்யலாமென்று. அதற்கான ஆரம்ப கட்ட வேலைகள் செய்யப்பட்டிருக்கின்றன; இன்னும் நிறைவுபடுத்தப் படவில்லை. ஆகவே, அந்தப் பாதையைத் திறந்து, பயணத்தை இலகுபடுத்துவற்கு ஏற்ற நடவடிக்கையை எடுக்க வேண்டும். அதுமாத்திரமன்றி, வலையிறவு விமான நிலைய வளாகம் விஸ்தரிக்கப்பட்டதன் காரணமாக அங்கே காணிகளை இழந்தவர்களுக்கு எந்தவிதமான கொடுப்பனவுகளும் வழங்காமல், மாற்றுக் காணி வழங்கப்படும் என்ற உத்தரவாதம் கொடுக்கப்பட்டது. உங்களுடைய அமைச்சின் ஆலோசனைக்குழுக் கூட்டத்திலும்கூட, இந்த விடயம் பிரஸ்தாபிக்கப்பட்டிருந்தது. அதற்குரிய நடவடிக்கைகளையும் மேற்கொண்டு, மாற்றுக் காணிகளை வழங்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

இதைவிட, மட்டக்களப்பு புகையிரத போக்குவரத்துச் சேவை பற்றிக் குறிப்பிட வேண்டும். குறித்த புகையிரதச் சேவையானது, கடந்த காலத்தில் கொழும்பிலிருந்து இரவு 7.00 மணிக்குப் புறப்பட்டு, மட்டக்களப்புக்கு 4.00 அல்லது 5.00 மணிக்கு வந்தடையும் வகையில் நடத்தப்பட்டது; அது பயணிகளுக்குப் பொருத்தமானதாக இருந்தது. இப்போது அந்தச் சேவையானது, இரவு 11.00 மணிக்கு கொழும்பிலிருந்து ஆரம்பிக்கப்படுகின்றமையால், காலை 7.30-8.00 மணிக்கு வந்தடைவதன் காரணமாக அம்பாறை, கல்முனை போன்ற பிரதேசங்களுக்குச் செல்கின்றவர்களுக்கும் அலுவலகங்களுக்குச் செல்கின்றவர்களுக்கும் சிரமமாக இருக்கின்றது. எனவே, பழைய நடைமுறையில், கொழும்பில் இருந்து 7.00 மணிக்குப் புகையிரத சேவையை ஆரம்பிப்பது மிகப் பொருத்தமானதாக இருக்கும் என்று மக்கள் புகார் செய்திருக்கிறார்கள். தயவுசெய்து இந்த விடயத்தைக் கவனத்திற்கொள்ளவும். அத்துடன், கடந்த காலத்தில் இந்தப் புகையிரத சேவையில் முதலாம் வகுப்பிலும் இரண்டாம் வகுப்பிலும் உறங்கல் இருக்கை, sleeping berths போன்ற வசதிகள் இருந்தன. நான் நினைக்கிறேன், இப்போது அந்த வசதிகள் குறைக்கப்பட்டு, 3rd Class மட்டுமே இருக்கின்றது என்று. இதனால் அந்தப் புகையிரதத்தில் பயணம் செய்பவர்கள் மிகவும் சிரமப்படுகின்றார்கள் என்ற விடயத்தையும் உங்களுடைய கவனத்திற்குக் கொண்டுவர விரும்புகிறேன்.

அடுத்து, உங்களுடைய அமைச்சுக்கு அப்பாற்பட்ட விடயம் ஒன்றை நான் இங்கே சொல்லியாக வேண்டும். கடந்த காலத்தில் டெங்கு ஒழிப்பு உத்தியோகத்தர்களாக இருந்தவர்களில் 600 பேருக்கு நிரந்தர நியமனம் கொடுக்கப்பட்டிருக்கின்றது; இன்னும் 300 பேருக்கு நியமனம் வழங்கப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்களின் முடிவின்படி, அந்த 300 பேரும் O/L complete பண்ணி இருக்கின்றபடியால், அவர்களுக்குரிய நியமனத்தையும் வழங்க வேண்டும்; அவர்கள் அதனை எதிர்பார்த்துக் கொண்டிருக்கிறார்கள். O/L complete இல்லாதவர்கள் சிலருக்கும் கொடுக்கப்பட்டிருக்கின்றது; நல்ல விடயம். ஆனால், O/L complete பண்ணிய 300 பேருக்கும் அந்த நியமனத்தைக் கொடுக்குமாறு கௌரவ சுகாதார அமைச்சரை இந்த நேரத்தில் கேட்டுக் கொள்கிறேன்.

மேலும், தொல்லியல் சம்பந்தமான விடயம் பற்றியும் பேச வேண்டும். காவல் துறைக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் அவர்கள் இங்கே இருக்கின்றார். பொறுப்புமிக்க சிரேஷ்ட அமைச்சர்களும் இருக்கின்றபடியால், இந்த விடயம் தொடர்பில் கடந்த காலத்தில் ஏற்பட்ட ஓர் அனுபவத்தைச் சொல்லுகின்றேன். கடந்த காலத்தில் தொல்லியல் இடங்களை அடையாளம் காணும் விடயத்தில் பல பிரச்சினைகள் ஏற்பட்டன. இப்போது மட்டக்களப்பு மாவட்டத்தில் உள்ள 12 உள்ளூராட்சிச் சபைகளும் இயங்கிக்கொண்டு இருக்கின்றன; அங்கு பிரதேச செயலகங்களும் இருக்கின்றன. அங்குள்ள காணிகள் உள்ளூராட்சிச் சபைகளின் மேற்பார்வையில் - ஆளுகையில்- இருக்கும் நிலையில், அங்குள்ள தொல்லியல் இடங்களுக்குத் திடீரெனப் பதாகைகள் இடப்படுகின்றபோது, அங்கொரு சிரமமான, முறுகல் நிலை ஏற்படுகின்றது. இந்த விடயங்கள் தொடர்பில் கடந்த காலத்தில் மட்டக்களப்பில் மிகவும் மோசமான, அடாவடித்தனமான செயலில் ஈடுபட்ட ஒரு மதகுரு இப்போதும் இருக்கின்றார். அவர் மிகவும் கெட்ட வார்த்தைகளைப் பேசுவார்; இனமுறுகல்களை ஏற்படுத்துவார்.

நுகேகொடையில் எதிர்க்கட்சியினரின் கூட்டம் நடாத்தப்பட முனைப்புகள் நடைபெற்ற காலப்பகுதியில் அங்குள்ள தொல்லியல் இடங்களை அடையாளப்படுத்துகின்ற செயற்பாடுகள் நடந்தன. நாங்கள் திருகோணமலை, மட்டக்களப்பு, அம்பாறை மற்றும் வட புலத்திலிருந்து பல பாராளுமன்ற உறுப்பினர்கள் இங்கே வந்திருக்கின்றோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் நேற்றைக்கு முன்தினம் எங்களை அழைத்து, இலங்கையர் தினத்தைச் சகல இனத்தவரும் ஒன்றாக இணைந்து அனுஷ்டித்துக் கொண்டாட வேண்டும்; நாங்கள் எல்லோரும் ஐக்கியத்தை வெளிப்படுத்த வேண்டுமென்று சொல்கின்றவேளை, இப்போது மட்டக்களப்பில் நடைபெற்றிருக்கின்ற விடயம் கண்டிக்கத் தக்கதாகும். அங்கே மாநகர சபை முதல்வர், பிரதேச சபைத் தலைவர்கள், உப தலைவர்கள், மக்களால் தெரிவுசெய்யப்பட்ட உள்ளூராட்சிச் சபை உறுப்பினர்கள் என அனைவரும் இருக்கின்றார்கள். அவர்கள் எவருக்கும் தெரியாமல் அங்கு தொல்லியல் இடங்களுக்கான அடையாளப்படுத்தல்கள் நடைபெற்றிருக்கின்றன. இதனால் சில பிரச்சினைகள் ஏற்பட்டிருப்பதாக நான் பத்திரிகையைப் பார்த்தபோது அறிந்தேன். அடையாளப்படுத்தப்பட்ட சில இடங்களிலுள்ள பதாகைகள் பிடுங்கப்பட்டு இருப்பதாகக்கூட அறிகின்றேன்.

எங்களுக்குச் சட்டத்தை மீறி நடப்பதற்கு விருப்பமில்லை; சட்டத்தின்படி நடப்பதற்கே நாங்கள் விரும்புகின்றோம். ஆனால், கடந்த கால ஆட்சிகளின்போது இடம்பெற்ற இன நல்லிணக்கத்தைக் குழப்பக்கூடிய விதமான செயற்பாடுகள் பற்றி எங்களுக்குப் பல அனுபவங்கள் இருக்கின்றன. அதாவது, ஆர்ப்பாட்டங்கள், வழக்குகள், பொலிஸ் நடவடிக்கை என்றெல்லாம் பல குழப்பகரமான நிலைமைகள் காணப் பட்டன. இப்படியான குழப்பகரமான நிலைமைகள் இனவாதமற்ற, மதவாதமற்ற அல்லது மொழிவாதமற்ற ஒரு சூழலுக்குப் பொருந்தாது. உள்ளூராட்சிச் சபையின் உறுப்பினர்கள் அல்லது அச்சபையின் தலைவர்களை அழைத்துச் சொல்லிவிட்டு இந்த நடவடிக்கையை நீங்கள் செய்திருக்கலாம். ஏனென்றால், கடந்த காலத்தில் சில சந்தேகத்திற்கிடமான, முரண்பாடான செயற்பாடுகள் நடந்திருக்கின்றன. மிஹிந்தலையில் இருக்கின்ற ஒரு பௌத்த மதகுரு சொல்லியிருக்கின்றார், குருந்தூர்மலைப் பகுதியில் பௌத்த இடிபாடுகளின் சின்னங்களைக் கொண்டுசென்று போட்டுவிட்டு, அந்த இடத்தில் பௌத்த சின்னங்கள் இருந்திருக்கின்றது எனச் சொல்வதாக. இதனை நாங்கள் சொல்லவில்லை, அந்த பௌத்த மதகுரு சொல்கின்றார். இப்போது எங்களுடைய மக்கள் மத்தியில் சந்தேகங்கள் எழுந்திருக்கின்றன. அதேவேளை, தொல்லியல் ஆணைக்குழுவை அமைக்கின்றபோது ஒரே மதத்தைச்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

சேர்ந்தவர்களை மாத்திரம் இணைத்தால் பிரச்சினைகள் உருவாகும், மக்களுக்குச் சந்தேகம் ஏற்படுமென்று நான் உங்களிடம் சொன்னேன். அதற்கேற்ப, நீங்கள் தமிழ் பேசுகின்ற நான்கு உறுப்பினர்களை இணைத்திருப்பதாக அறிகின்றேன், நல்ல விடயம்!

இருந்தாலும், இந்த ஆணைக்குழுவில் இருப்பவர்களை அந்த இடத்திற்கு அழைத்து, கூட்டங்களைக் கூட்டி, அந்த உறுப்பினர்கள்மூலமாக மக்களுக்கு ஒரு விளக்கத்தைக் கொடுத்து, நாங்களும் அறியத்தக்கதாக அந்த விடயங்களைச் செய்திருக்கலாம். இப்போது பார்க்கப்போனால், வாகரை பிரதேசத்தின் கோரளைப்பற்று வடக்கு, கோரளைப்பற்று, மண்முனை தென்மேற்கு, மண்முனை மேற்கு, கோரைதீவுப் பற்று போன்ற நூற்றுக்கும் மேற்பட்ட இடங்கள் தொல்லியல் இடங்களாகப் பிரகடனப்படுத்தப்பட்டுப் பதாகைகள் நாட்டப்பட்டிருக்கின்றன. இதனால் பலரும் குழப்பம் அடைந்திருக்கின்ற அதேவேளை, யாரோ அதனைப் பிடுங்கியிருப்பதாகவும் அறிகின்றோம். இப்போது நீங்கள் அதற்கெதிராகச் சட்ட நடவடிக்கை, பொலிஸ் நடவடிக்கை, நீதிமன்ற நடவடிக்கை, வழக்கு என்று போகின்ற சூழ்நிலையில், "நாங்கள் எல்லோரும் ஐக்கியமாக இலங்கையர் தினத்தைக் கொண்டாட வேண்டும்" என்று சனாதிபதி அவர்கள் சொல்கின்றார். அப்படியிருக்கின்றபோது, இந்த விடயங்கள் முரண்பாடுகளையே ஏற்படுத்தும்.

கடந்த காலத்தில் மயிலத்தமடு - மாதவனை போன்ற இடங்களில் ஏற்பட்ட மேய்ச்சல் தரைப் பிரச்சினையின்போது, அந்த முறைகேடான செயற்பாட்டை நாங்கள் முனைந்து நின்று தடுக்க முற்பட்டபோது, பாராளுமன்ற உறுப்பினர்கள், பிரதேச சபை உறுப்பினர்கள் உட்படக் கிட்டத்தட்ட 33 பேருக்கு எதிராக வழக்குத் தாக்கல் செய்யப்பட்டு, ஒன்றரை வருடங் களாக நாங்கள் வழக்கிற்காக நீதிமன்றத்திற்கு அலைந்து கொண்டிருந்தோம். பின்னர் நீதிமன்றம் எங்கள்மீது குற்றமில்லையென்று எங்கள் மீதான வழக்கைத் தள்ளுபடி செய்திருந்தது. ஆகவே, நான் மீண்டும் சொல்கின்றேன், நாங்கள் இன நல்லிணக்கத்தோடு ஐக்கியமாக எங்களுடைய உரிமையைப் பெற்றுக்கொண்டு உங்களோடு கைகோர்த்துப் பயணிப்பதற்கே விரும்புகின்றோம். ஆகவே, தயவுசெய்து இந்த விடயங்களை எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள், உள்ளூராட்சிச் சபை உறுப்பினர்கள் போன்ற வர்களும் மற்றவர்களும் அறியத்தக்கதாக ஓர் இணக்கமான செயற்பாட்டுடன் செய்ய வேண்டும். அப்படிச் செய்கின்ற போது, முரண்பாடுகள் ஏற்படாமல் நாங்கள் அவற்றைக் கையாளமுடியும்.

தொல்லியல் பிரதேசங்கள் என்று சொல்லுகின்றபோது, அவை பௌத்த கலாசாரத்தோடு சம்பந்தப்பட்டதாக இருக்கலாம், இந்துக் கலாசாரத்தோடு சம்பந்தப்பட்டதாக இருக்கலாம், இஸ்லாமிய, கிறிஸ்தவ கலாசாரங்களோடு சம்பந்தப்பட்டதாக இருக்கலாம் அல்லது பொதுமையாக இருக்கலாம்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Gnanamuththu Srineshan, your time is up.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, give me one more minute.

ஆனால், எங்களுடைய கடந்த கால படிப்பினை என்னவென்றால், தொல்லியல் என்று சொன்னவுடன் அந்த இடங்களில் பௌத்த கலாசாரத்துக்குரிய விடயங்கள்தான் இருக்கின்றன என்பது போன்று அங்கிருக்கின்ற அம்பிட்டிய சுமண ரத்ன தேரர் என்பவர் மிகவும் அடாவடித்தனமாகச் செயற்படுகின்றார். அவருடைய செயற்பாடுகளை சமூக வலைத்தள video காட்சிகளில் பார்க்கக்கூடியதாக இருக்கும். அவர் பச்சை பச்சையாகக் கெட்ட வார்த்தைகளைப் பாவிக்கின்றார்; இன நல்லிணக்கத்தைக் குழப்புகின்றார். அவர் பல பொலிசாரைத் தாக்கியிருக்கின்றார்; பெண் பொலிசாரைத் தாக்கியிருக்கின்றார்; அலுவலகத்திற்குச் சென்று அரச உத்தியோகத்தர்களைத் தாக்கச் சென்றிருக்கின்றார். இப்படியானவர்கள் தொல்லியல் சார்ந்த விடயங்களில் தலையிடுகின்றபோது இன நல்லிணக்கம் குழப்பப்படும். ஆகவே, பொறுப்புவாய்ந்த அமைச்சர்கள் இதுசம்பந்தமாக நடவடிக்கை எடுக்க வேண்டும்.

கௌரவ புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் உணவுச்சாலையில் இருக்கும்போது, நானும் கௌரவ உறுப்பினர் இளையதம்பி சிறிநாத் அவர்களும் சென்று இந்த விடயத்தை அவரிடம் முறையிட்டோம். அவர் “இந்த விடயத்தைச் சாதகமாகப் பரிசீலிப்பேன், சாதகமாக அணுகுவேன்” என்று குறிப்பிட்டார். நாங்கள் அதனை நம்பியிருக்கின்றோம். இப்போது ஒரு பிரச்சினை எழுந்திருக்கின்றது. இதனை எல்லோருக்கும் அறிவித்து இணக்கப்பாட்டோடு செயற்பட்டிருந்தால் பிரச்சினை யில்லாமல் செய்ய முடியும். உள்ளூராட்சிச் சபைகளுக்கும் அதிகாரங்கள் இருக்கின்றன. எனவே, இவற்றைக் கருத்திற்கொண்டு இந்தக் கருமங்களைச் செய்யமாறு உங்களை மிகவும் அன்பாகக் கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම වාලච්චේනයි සහ කොක්කඩිචෝලේ ප්‍රදේශවල තිබුණු පුරාවිද්‍යා ස්ථාන ලකුණු කරන දැන්වීම් පුවරු නොවෙයි ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා ඉවත් කරලා තිබෙන්නේ. පුරාවිද්‍යා භූමියට යන දිශානතිය පෙන්වන, නැත්නම් මාර්ගය පෙන්වන දැන්වීම් පුවරු තමයි ඉවත් කරලා තිබෙන්නේ. ප්‍රාදේශීය සංවර්ධන කමිටුව තිබෙනවා, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව තිබෙනවා, ඔබතුමන්ලාගේ සභාපතිවරුන්ට යම් ගැටලුවක් තිබෙනවා නම්, ඒ තැන්වලදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින් එක්ක සාකච්ඡා කරලා එම ප්‍රශ්නය විසඳා ගන්න තිබුණා. නමුත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නීත්‍යනුකූලව සවිකළ දිශානතිය පෙන්වන පුවරු තමයි ඉවත් කරලා තිබෙන්නේ. එවැනි පුවරු හයක් ඉවත් කරලා තිබෙනවා. ඒ නිසා තමයි මේ සම්බන්ධයෙන් නීත්‍යනුකූල පියවර ගන්න කටයුතු කරන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක අපි පිළිගන්නවා. සාකච්ඡා කරලා අපි මේ ප්‍රශ්න විසඳාගන්න ඕනෑ. ශ්‍රී ලංකාවේ සියලු ජාතීන් සහජීවනයෙන් එකට ජීවත් වෙන්න ඕනෑ. ඒ පිළිබඳව කිසිදු ගැටලුවක් නැහැ. රජයේ අභිප්‍රාය ඒකයි. ගරු ජනාධිපතිතුමාත් හැම වෙලාවේම එම කාරණය අවධාරණය කරලා තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමාට ආරාධනා කරනවා, ඒ වාගේ ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳාගන්න කියලා. එහෙම නැති වුණොත් එම දැන්වීම් පුවරු ඉවත් කිරීම හරහා වෙනත් පණිවුඩයක් සමාජයට යනවා. මොකද, ප්‍රාදේශීය සභාව සතුව නොවෙයි එම ඉඩම්වල අයිතිය තිබෙන්නේ. අනික, ඒක ඉඩම්වල

අයිතිය පිළිබඳ ගැටලුවකුත් නොවෙයි. ඒවා පුරාවිද්‍යා භූමියට යන මාර්ගය, දිශාව පෙන්වන පුවරු. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එම පුවරු සවි කරලා තිබෙන්නේ නීත්‍යානුකූලව. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එවැනි බෝඩ්, නැත්නම් නාම පුවරු 110ක් සවිකරලා අවසන් බව කිව්වා. කිසිම කෙනෙකුට ඒවා ඉවත් කරන්න කිසිදු නීත්‍යානුකූල හැකියාවක් නැහැ. ඒ සම්බන්ධයෙන් තමයි අපි නීතිමය පියවර ගන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ සම්බන්ධව අධිකරණය තීන්දුවක් දෙයි. ඔබතුමා කිව්වා වාගේ අපි ඕනෑම වෙලාවක සූදානම්, සාකච්ඡා කරලා මේ වාගේ ගැටලු විසඳන්න. තවත් පාර්ශ්වවලට ජාතිවාදය අවුස්සලා, ආගම්වාදය අවුස්සලා කටයුතු කරන්න අපි කිසිසේත්ම ඉඩක් දෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාත් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරන්න අපි සූදානම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. ඒ කාලය ආණ්ඩු පක්ෂයෙන් ගන්න.

ගරු ශ්‍රීනේසන් මැතිතුමා ඉදිරිපත් කළ ගැටලුව සංවේදී කාරණයක්. අපි දන්නවා, මන්නාරමේත්, යාපනයේත් මේ විධියටම පුරාවිද්‍යා ස්ථාන ලකුණු කරලා තිබෙන බව. ඒවා අපේ රටේ උරුමයේ කොටස්. එම ප්‍රාදේශීය සභාවේ සභාපති මා වුණා නම්, මෙවැනි sites අපි tourismවලටත් වෙන් කරලා, universitiesවලටත් ඉගෙන ගන්න වෙන් කරලා ප්‍රයෝජනයක් ගන්නවා. කොහොම වුණත්, ඔබතුමන්ලාට අවශ්‍ය නම් අද දවසේදී බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාත්, ආනන්ද විජේපාල ඇමතිතුමාත් රැඳී සිටින අවස්ථාවක සාකච්ඡාවක් ලැහැස්ති කරලා දෙන්න පුළුවන්, තවමත් විසඳිලා නැති ගැටලු තිබෙනවා නම් ඒවා විසඳාගන්න.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Rauff Hakeem. You have 17 minutes and your time starts now.

[11.58 a.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Chairman, since that matter relating to the Department of Archaeology was raised a while ago, I would like to say that I also have certain comments to make. I think I will take it up during the Discussion on the Votes of the Ministry of Buddhasasana, Religious and Cultural Affairs. It is pertaining to an important religious place of worship for the Muslims for several centuries - "Daftar Jailani" in Balangoda - which has unnecessarily been desecrated due to intervention by the Urban Development Authority over a period of time. Now, several new structures have come up. That is beside the point. However, the areas occupied by Muslims are now being seriously hampered due to unnecessary intervention by the chief monk of the area. In this issue, the Department of Archaeology, too, is involved and in their name boards, they have not even mentioned the existence of "Daftar Jailani" or the historical evidence pertaining to it; there is only one-sided name board that had been erected. So, we will deal with it during the Discussion on the Votes of the Ministry of Buddhasasana, Religious and Cultural Affairs because I do not want take the time allotted for this Ministry to discuss it, though the Urban Development Authority has been responsible for having declared that area a sacred area and imposing various sanctions on the devotees of the "Daftar Jailani" Mosque and its precincts.

According to the Minister, the Urban Development Authority has identified 10 cities around the Island and also the Hon. President, in his Speech, referred to Jaffna, Eheliyagoda, Batticaloa, Chilaw and Matara and I do not know what other cities come under those ten cities. In fact, I represent Kandy, which is the second largest city in this country and the most important, sacred city for Buddhists, and there, several areas particularly need to be addressed when it comes to urban regeneration projects, especially for underserved settlements, where people live in tenements with less facilities. There are several such areas like Mahaiyawa, Katukele and Deiyannewela.

For instance, if we take Katukele, our young athlete Fathima Shafiya Yamick, whom we all praise for the big achievement by winning three gold medals and shattering three records including the 28-year old record of P.T. Usha, comes from those tenements, a very underserved settlement in Kandy. Sir, I record my appreciation for her wonderful achievement. All of us are very proud about of her.

අපි ඔක්කොම ආඩම්බර වෙනවා, ෂෆියා යාමික් කියන ක්‍රීඩිකාව පිළිබඳව. ඒ ක්‍රීඩිකාව ක්‍රීඩාවට පිවිසෙන්නේ කටුකැලේ ප්‍රදේශයෙන්. එච්චර දුෂ්කර ප්‍රදේශයක ඉඳන් ක්‍රීඩා කරන්න ආපු ඒ ක්‍රීඩිකාවට සහ ඇයගේ parentsලාට මම මේ අවස්ථාවේදී සුබ පතනවා, especially Mr. Yamik. I know him personally. He comes from a very underserved area and they have performed well despite all that. But, the fact is, when it comes to urban regeneration projects, තට්ටු ගෙවල් හදලා හොඳ පරිසරයක් ඇති කිරීමේ ප්‍රයත්නයේදී මහනුවර දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ම අපි සැලකිල්ලට අරගෙන නැහැ. විශේෂයෙන්ම මහයියාව, කටුකැලේ, දෙයියන්නෙවෙල යන ප්‍රදේශවල මෙවැනි අඩු ආදායම්ලාභී පවුල් ජීවත් වන බැවින්, අනිවාර්යයෙන්ම ඔවුන් සම්බන්ධයෙන් යම් ප්‍රයත්නයක් ගත යුතුයි කියලා මම යෝජනා කරනවා.

ඒ විතරක් නොවෙයි, මහනුවර නගරයේ තිබෙන බෝගම්බර හිර ගෙදර දීර්ඝ කාලයක ඉඳන් -2000 අවුරුද්දේ ඉඳන්- සම්පූර්ණයෙන්ම හිස් වෙලා තිබෙන්නේ. ඒ හිර ගෙදර සිටි රැඳවියන් අපි අරගෙන ගිහිල්ලා තිබෙනවා, පල්ලෙකැලේට. නමුත්, බෝගම්බර හිර ගෙදර සංවර්ධනය කිරීම පිළිබඳව ගැටලු තිබෙනවා. විදේශ ආයෝජකයින් එනවා කියලා ඒ පිළිබඳව විශාල සැලසුම් හැදුවාට තවම කිසි දෙයක් සිදු වෙලා නැහැ. විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරියට අයත් වැඩ පිළිවෙළක් හැටියට ඒ සම්බන්ධයෙන් වහාම යමක් කළ යුතුයි. නුවරට එන සංචාරකයින් එක රැයයි වැඩිපුරම එතැන ගත කරන්නේ. මොකද, එතැන විනෝදාංශයට වැඩි ඉඩකඩක් නැති

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

බව තමයි ඒකට හේතුව හැටියට කියන්නේ. එබැවින්, මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන බෝගම්බර හිර ගෙදර දැන් සම්පූර්ණයෙන්ම හිස්වෙලා තිබෙන නිසා එය සංවර්ධනය කරන්නට වහාම කටයුතු කළ යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා. දැනට සම්පූර්ණ කරලා තිබෙන්නේ කැප්පෙටිපොළ වලව්ව විතරයි. එතැන wax museum එකක් හදලා ඒ වලව්වේ කටයුතු විතරක් සම්පූර්ණ කර තිබෙනවා. ඒක හැර වෙන දෙයක් සිදු වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි, පැරැණි ගොඩනැඟිලි රාශියක් තිබෙනවා. අවුරුදු 200කට වැඩි පැරැණි ගොඩනැඟිලි සංරක්ෂණය කරන්න ජපන් ආධාර ලැබෙනවා කිව්වා, ඒකෙන් කිසි දෙයක් තවම සිදු වෙලා නැහැ. ඒ පිළිබඳවත් මම මතක් කරනවා.

ඒ වාගේම, තවත් කාරණාවක් ඇමතිතුමා සඳහන් කළා, ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව පිළිබඳව. ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව වැදගත් ආයතනයක්; මේ රටේ ගංවතුර පාලනය පිළිබඳව විශේෂඥ දැනුම තිබෙන ඉංජිනේරුවන් 400දෙනෙකුට වැඩිය ඉන්න සංස්ථාවක්. ඒ සංස්ථාව හරහා අපි මේ රටේ ගංවතුර පාලනය පිළිබඳව නොයෙකුත් සැලසුම් හදන සිරිතක් තිබෙනවා. අද පුවත්පතක පළ වෙලා තිබෙනවා, "Irrigation Department Issues Flood Warnings" කියලා. නොයෙකුත් ප්‍රදේශවල flood warnings පිළිබඳව. මේ flood warnings කිව්වාම, අපට මතකයට එන කාරණයක් තමයි, අකුරණ නගරයේ ජල ගැල්ම. ඒ පිළිබඳව නිතර නිතර මේ සභාවේත් කථා වෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් දවස් කිහිපයකට ඉහතදී මටත් දොස් පවරලා තිබුණා. අවුරුද්දක විතර කාලයක් නාගරික සංවර්ධන අධිකාරිය මගේ යටතේ තිබියදි මම පියවර කිහිපයක් ගත්තා. ඒ පිළිබඳව අපි නොයෙකුත් ආයතන එකතු කරලා Task Force එකක් හැදුවා. ඒ Task Force එක හරහා සමීක්ෂණය කරලා, විද්‍යානුකූලව ඒකට හේතු හොයලා, ඒවා නිරාකරණය කරන්න සැලසුම් කළ යුතුයි කියලා සාකච්ඡා කළා. ඒ පිළිබඳව වාර්තාවක් තිබෙනවා titled "Proposed Hydrology Study and Stormwater Drainage Design of Flood Mitigation Proposals for Akurana Town" done by the Sri Lanka Land Development Corporation. ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ලබා දුන්නු ශක්‍යතා අධ්‍යයන වාර්තාව සෑදීම සඳහා වූ මේ යෝජනාවට රුපියල් මිලියන 23ක් අය කරන්න නියම කරලා තිබෙනවා. ඒ මිලියන 23 ගෙවන්න කියලා මම ගිය ආණ්ඩුවෙනුත් ඉල්ලුවා. මේ ආණ්ඩුවේ ලාල් කාන්ත ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් මේ පිළිබඳව දෙතුන්වරක් මම සාකච්ඡා කරලා තිබෙනවා, යෝජනා කරලා තිබෙනවා. නමුත්, කිසි දෙයක් වෙලා නැහැ. මේ පිළිබඳව විකල්ප යෝජනාවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්වතුන් හරහා කරන්න කියලා යෝජනාවක් තිබුණා. මේක කවුරුත් පිළිගන්නවා, ඇමතිතුමාත් අද උදේ කිව්වා, ගංවතුර පාලනය පිළිබඳ විශේෂඥ දැනුම තිබෙන්නේ Sri Lanka Land Development Corporation එකට කියලා. SLLDC එක ඒ පිළිබඳව ලබා දීලා තිබෙන feasibility report එක හදන්න.

මේකේ නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. හුනන් ඔය, ඔවිස්ස ඔය, බලපිටිය ඔය, වහගල්ල ඔය වැනි ගංගා කිහිපයක් ඇවිල්ලා මහවැලි ගඟට එකතු වන ප්‍රධාන ගංගාවක් තමයි පිඟා ඔය කියන්නේ. පිඟා ඔය පිටාර ගැලීමේදී ඇති වන විශාල ප්‍රශ්නය නිසා, ගිය දශක දෙකක් තුළ හත්අටවාරයක් අකුරණ නගරය ජලයට යට වෙලා තිබෙනවා. මේ පිළිබඳව නිතර නිතර අපි කථා කළාට මේ ශක්‍යතා වාර්තාව නිම කරන්න ඒ මිලියන 23 ලබා දෙන්නැයි කියලා මම ගරු අමාත්‍යතුමාගෙන් බැගෑපත්ව ඉල්ලීමක් කරනවා. මොකද, මේක කිරීම තුළ මේ ප්‍රශ්නයට නීත්‍යානුකූලව කුමක්ද කළ යුත්තේ කියලා අපිට තීරණය කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, නාගරික සංවර්ධන අධිකාරිය නැවත නැවත කියනවා, අනවසර ඉදිකිරීම් තිබෙනවා කියලා. නමුත්, අනවසර ඉදිකිරීම් පිළිබඳව මම ප්‍රශ්න කළාම, විශාල ලැයිස්තුවක් ලබා දුන්නා. ඒ ලැයිස්තුවේ තිබෙන අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න නඩු පවරන්න කිව්වාම, තවම නඩු පැවරීමක් කළේ නැහැ. ඒ පිළිබඳවත්, නාගරික සංවර්ධන අධිකාරිය පිළිබඳවත් මම නිතරම අපේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී ප්‍රශ්න නඟලා තිබෙනවා. නමුත් කිසි දෙයක් කරලා නැහැ. අකුරණ ප්‍රාදේශීය සභාව යම් කාලයකදී මොකක් හරි දූෂණයක් සිදු කරලා තිබෙනවා නම් ඒ ගැනත් කටයුතු කරන්න, ඒ පිළිබඳව තොරතුරු සොයන්න, කියන්න. දොස් කිය කියා ඉඳලා හරියන්නේ නැහැ. හිටපු ඇමතිවරුන් ගත්ත ප්‍රයත්නවලට ස්තුති කරන්නේ නැතිව නිතර නිතර අපට දොස් කිය කියා, මේකට යමක් නොකර ඉන්න එක පිළිබඳව මගේ කනගාටුව පළ කරනවා. මම බලාපොරොත්තු වෙනවා අපේ ඇමතිතුමා අලුතෙන් භාර ගත්ත මේ ආයතන දෙක හරහා මේ ප්‍රශ්නයට යම් විසඳුමක් ලබා දේවි කියලා.

ගංවතුර ගැන කථා කරනකොට තව කාරණයක් කියන්න ඕනෑ. විශේෂයෙන්ම නැඟෙනහිර පළාතට වැහි කාලයේදී ප්‍රශ්න කිහිපයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. In Kalmunai area, Sir, the Kittange pump house and the surrounding areas always go under water. Regarding that also, there was a plan under the earlier project called Climate Resilience Improvement Project - CRIP. It had been in operation, but had been wound up. They had proposed a balloon dam near the Kallar Bridge to stop water from going into the sea. Since sand banks are formed, they proposed a deflatable dam so that when the water level rises, they could deflate the dam and allow the water to flow into the sea. So, that was a plan that had been submitted, but nothing had happened so far. The CRIP had suddenly been wound up and still, the Kittange pump house is unable to cope with the flood situation and therefore, that has to be implemented.

Not only that, there are also the issue in Sambukalappu and Periyakalappu areas, which my Friend, the Hon. M.S. Uthumalebbe had mentioned several times. There has to be a proper study of the drainage system in the entire area from Kallar up to Akkaraipattu and beyond up to Sinna Mugathuvaram area. So, that entire area has to be properly studied and I am sure the SLLDC could make an intervention to do a proper study. Several thousand acres of productive paddy fields could be restored, if that project to control floods in the Ampara area is undertaken. Therefore, I propose that the Hon. Minister undertakes that.

Together with that, my Friend, the Hon. M. S. Abthul Wazeeth mentioned about the problems in his area. Particularly when it comes to water supply for the Pottuvil area, it is an imperative necessity today to have the Heda Oya Reservoir Project started because that reservoir is important, both for irrigation and water supply. Unfortunately, because of some objections from the farmers of Siyambalanduwa, that is not happening. We know that several other projects nearby have already been approved, but this Heda Oya Project, we have been making efforts for several long years to start. I hope the Hon. Minister in charge of water supply would speak to the irrigation authorities and try to start work on the Heda

Oya Project. Of course, we will need some funding from abroad with the current debt situation in the country. So, to have the Heda Oya Project prioritized, it would be important to have discussions with the ERD so that you could start it.

Then, there is another issue which relates to Pottuvil. - *[Interruption.]* Hon. Deputy Minister, you can answer later when you speak. Sir, there is this issue relating to the Pottuvil Bus Stand. The Pottuvil Bus Stand serves a large number of foreign tourists coming from Colombo and returning to Colombo. But, that bus stand does not have any facilities, Sir; it is in a very bad state. So, if something could be done - *[Interruption.]* The depot is there. So, it has to be properly constructed and also the bus services have to be improved. In fact, if you could supply some long-distance buses to run on the Colombo - Pottuvil route exclusively, it would be a great help for development of tourism in the area as well.

Having said that, I would now like to mention a small matter relating to the area where I live in Kandy, the Mahakanda area. මගේ ඉල්ලීම පිට නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙන් යවපු ලියුමක් තිබෙනවා. එම ලිපියේ තිබෙනවා, මහනුවර දිස්ත්‍රික් මහකන්ද ග්‍රාම නිලධාරි වසමේ මහකන්ද නගර මධ්‍යයේ පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් පර්චස් 42ක භූමි ප්‍රමාණයකින් යුත් තනි ඉඩම් කැබැල්ල ලබා දෙන්න කියලා, එතැන බස් නැවතුම් පොළක් හදන්න. එම ලිපිය මම **සභාගත*** කරනවා.

මොකද, පේරාදෙණිය නගරයත්, ගලහ නගරයත් අතර තිබෙන විශේෂිත නැවතුම් පොළක් තමයි මහකන්ද කියන ප්‍රදේශය. එය මම ජීවත් වන ප්‍රදේශයද වෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට තමයි ඒ පොඩි ඉඩම් කැබැල්ල අයත් වෙන්නේ. ඒකේ පොඩි labourer facility එකක් තිබෙනවා, නවතින්න විතරක්. දැනට ඒකේ කවුරුත් නැහැ. ඒ පිළිබඳව අපි ඉල්ලීමක් කරලා තිබුණා එතැන බස් නැවතුම් පොළක් හෝ ඉන්ධන පිරවුම් හලක් වාගේ දෙයකට ප්‍රජාවේ අවශ්‍යතා සලකා බලා ලබා දෙන්න කියලා. ඒ පිළිබඳව සලකා බලන මෙන් ඉල්ලමින් මගේ කථාව සමාප්ත කරනවා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Deputy Minister? Please make it brief because we have one more Member to speak before we suspend for lunch.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු සභාපතිතුමනි, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා කරුණු තුනක්, ප්‍රධාන වශයෙන් නුවර ප්‍රදේශය ආශ්‍රිතව. පළමුවෙනි එක, මහයියාව ප්‍රදේශයේ තිබෙන අඩු ජීවන තත්ත්වය පිළිබඳව. ගරු මන්ත්‍රීතුමනි, මහයියාව area එකේ කොටස් දෙකක් තිබෙනවා, MC සහ MT කියලා. MT කියන area එක ජන වර්ගය අනුව වැඩි හරියක් ඉස්ලාම් භක්තිකයන් ඉන්නේ. නමුත් ඒ area එකේ ගුණාත්මක තත්ත්වයක් තිබෙනවා. MC කියන area එකේ තමයි අර්බුදය තිබෙන්නේ. ඒකේ තමයි ජීවන තත්ත්වය ගොඩක් අඩුවෙන් තිබෙන්නේ. ඒ ප්‍රදේශය අක්කර 10යි රූඩ් 2ක ප්‍රදේශයක්. මාසයකට කලින්, අමාත්‍යාංශය මාරු වෙලා සතියක් ඇතුළත අපි UDA එක, USDA එක සහ නගර සභාව එක්ක එකතු වෙලා රැස්වීමක් තියලා සැලසුමක් හැදුවා, අපි කොහොමද ඒ අයගේ ජීවන තත්ත්වය උඩට ගේන්නේ කියලා. එහිදී ඉස්සෙල්ලාම social survey එකක් කරන්න ඕනෑ. ඒගොල්ලන් එතැනින් මාරු වෙන්න කැමැතිද, කොයි ආකාරයටද මාරු වෙන්න ඕනෑ, නැත්නම් එතැනම නිවාස ඉදි කිරීම්වලට ගිහින් එතැනම settle වෙනවාද කියන එක බලන්න ඕනෑ. ඒ social survey එක නොමිලයේම කරන්න එදා පැමිණ සිටි විශ්වවිද්‍යාලයේ sociology faculty එකේ කට්ටිය එකඟ වුණා. අපි ඒගොල්ලන්ට transport විතරයි USDA එක හරහා දෙන්නේ. ඒ වැඩේ පටන් ගෙන තිබෙන්නේ. ඊට පස්සේ අපි feasibility study එකක් කරලා ඒගොල්ලන් කොයි විධියටද settle කරන්නේ කියන තීරණයට යනවා.

දෙවෙනි කාරණය, අකුරණ ජල ගැල්ම. අකුරණ ජල ගැල්ම ගැන DCC එකේ හැම රැස්වීමකදීම සාකච්ඡා කළා. ලාල් කාන්ත ඇමතිතුමා තමයි එහි සභාපතිත්වය දරන්නේ. එහිදී ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය ඉදිරිපත් කළ වාර්තාවට අනුව අපි ඉදිරි Action Plan එක කරගෙන යනවා.

ඊළඟට, බෝගම්බර heritage assessment එකක් කරනවා. ඒකට මාස 2ක කාලයක් යනවා. ඊට පස්සේ ලබන අවුරුද්දේ මැයි මාසය විතර වෙනකොට PPP project එකක් විධියට ඒකේ වැඩ පටන් ගන්න පුළුවන් වෙයි.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Jagath Vithana. You have 17 minutes.

[අ.භා. 12.17]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු සභාපතිතුමනි, අද දින ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් විවාද කරනවා. ගරු ඇමතිතුමා දන්නවා මම ප්‍රායෝගිකවම මේ කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයෙක් බව.

පළමුවෙන්ම මම කියනවා, මට ලැබෙන වරප්‍රසාද යටතේ මට ලැබීමට නියමිත කැබ් රථය ගෙන්වන්න එපා කියලා මා කියා තිබෙන බව. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න. මට එය අවශ්‍ය නැහැ. මම එය ලිඛිතව දීලා තිබෙනවා. ඒක මම ජනතාවට පොරොන්දු වෙච්ච දෙයක්.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ජගත් විතාන මහතා]

ගරු ඇමතිතුමනි, ඊට එහා දෙයක් මට කියන්න තිබෙනවා. අපට හදන්න තිබෙන, ලොකුම අඩුපාඩුකම් සහිත, නීති රීතිවලට යටත් නොවන පසුබිමක් සහිත කථාවක් තමයි මට ප්‍රවාහනය ගැන කියන්න තිබෙන්නේ. මෙය, ලංකාවේ මේ දක්වාම අනීතිකව දුවන කර්මාන්තයක් වෙලා තිබෙනවා. EPF, ETF, කම්කරු නීති රීති කිසිම දෙයක් අදාළ නොවන පරිදි කටයුතු කරන තත්ත්වයක් තමයි එහි තිබෙන්නේ.

බස්නාහිර පළාතේ විතරක් 12,000කට අධික සේවක සංඛ්‍යාවක් පෞද්ගලික බස් රථවල වැඩ කරනවා. ඒගොල්ලන්ට අත පය වාරු නැති වුණාම, වයසට යන්නත් ඉස්සෙල්ලා, අවුරුදු 45, 50 වන කොට ඒගොල්ලන් ශ්‍රමය කැප කරන්න බැරි අය ලෙස ගෙවල්වල අතරමං වෙනවා. ඒගොල්ලන්ට කිසිම පිළිසරණක් නැහැ. ඒ නිසා මම යෝජනාවක් කරනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්යාල ලංකාව පුරා දිස්ත්‍රික් මට්ටමින් තිබෙනවා. ඇයි රජයට බැරි, රියැදුරන්, කොන්දොස්තරවරුන් පුහුණු කරලා, ඒ අයට විනයානුකූලව කටයුතු කරන්න උගන්වලා ඒ අය සංචිතයක් විධියට තියා ගන්න. ඒ සංචිතයෙන් තමයි බස්වලට සේවක මහත්වරුන් ඉල්ලුම් කරන්න ඕනෑ. එහෙම තමයි එම ක්ෂේත්‍රය නියාමනය වෙන්න ඕනෑ. දැන් තිබෙන නියාමනය අනුව බස් රථ හිමිකරුවා තමයි අධිකාරිය. මාත් බස් රථ හිමිකරුවෙක්. දැන් තිබෙන ක්‍රමය අනුව මම මට අවශ්‍ය කරන රියැදුරන්, කොන්දොස්තරවරුන් ගන්නවා; මට අවශ්‍ය නැත්නම් ඒගොල්ලන් අයින් කරනවා; එහෙම නැත්නම් වැඩ තහනම් කරනවා; වෙන කෙනෙක් ගන්නවා. මේක මෙහෙම වෙන්න දෙන්න එපා. මේක මා සද්භාවයෙන්ම කරන යෝජනාවක්. ඒ නිසා ඒ නියාමන අධිකාරියේ, එහෙම නැත්නම් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්යාල හරහා අපට අවශ්‍ය කරන සේවක මහත්වරුන් ගන්න ක්‍රමයක් හදලා, ඒ අය නිවාඩු යන කොටත්, ඒ නිවාඩු යන කාලයට ගන්න ඕනෑ කට්ටියත් ඒ හරහා ගන්න ලෑස්ති කරලා දෙන්න ඕනෑ. මේක කරන්න පුළුවන් වැඩක්. එතකොට ඒගොල්ලන්ට වේතනයක් නියම කරන්න අපට පුළුවන්.

මම දන්නවා, ගරු ඇමතිතුමා දෙසැම්බර් 01වෙනිදා ඉඳලා card ක්‍රමයට shift වෙන්න බලාපොරොත්තු වන බව; එම ක්‍රමය ක්‍රියාත්මක කරන්න යන බව. එහිදී මුදල් පරිහරණය වෙන්නේ නැහැ. රියැදුරු මහත්වරු, කොන්දොස්තර මහත්වරු කොහොමත් කැමති නැති වෙනවා, ඒ කරන්න යන වැඩේට. මොකද, ඒගොල්ලන් කොහොම කිව්වත්, අපට පෙන්වන ආදායමට වඩා ආදායමක් ඒගොල්ලෝ ලබනවා. ඒගොල්ලන්ට වැටුපක් නියම කළොත්, ඒගොල්ලන්ට අදාළව තිබෙන නීති රීති ටික නීතිගත කර ගත්තොත්, අපට මේ card ක්‍රමයත් ක්‍රියාත්මක කරන්න පුළුවන්; විනීත රියැදුරු මහත්වරුන් හා විනීත කොන්දොස්තර මහත්වරුන් හරහා මේ සේවය ලබා දෙන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, මෙහිදී මා දකින ලොකු වෙනසක් තිබෙනවා. NTC එකයි, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියයි ක්‍රියාත්මක වෙන්නේ දෙයාකාරයකටයි. එහෙම වෙන්න දෙන්න එපා. මම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේත් නොයෙකුත් අවස්ථාවල විවිධ යෝජනා ඉදිරිපත් කළා. මා හිතන විධියට, අර රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්න ලොකු නිලධාරින්, ලේකම්වරු මෙය අහගෙන ඉන්නවා ඇති. මම ලිඛිතවත් යෝජනා ලබා දුන්නා. NTC permits තිබෙනවා. ඒ permits සියයට 85ක් දුවන්නේ power of attorney ගහගෙන. බස් එක විකුණනවා; power of attorney එකක් ගහ ගන්නවා; දුවනවා. දිව්වාට පස්සේ මොකක් හරි දෙයක් වුණාම, එහෙම නැත්නම් අයිතිකාරයා මිය ගියාට පස්සේ බස් එක ගත්තු මනුස්සයා දැඩි අසාධාරණයකට ලක් වෙනවා. මෙන්න මේකට නිසි ක්‍රමවේදයක් හදන්න. ඒකෙන් බිලියන ගණනක් සොයන්න පුළුවන් අමාත්‍යාංශයට. කැබිනට් අනුමැතිය තුන් වතාවක් හම්බ වෙලා තිබෙනවා. අයිතිය සංශෝධනය කරන්න අවස්ථාව දෙන්න; ඒ වෙනුවෙන් ගණනක් නියම කරන්න. ඔබතුමන්ලා නිර්දේශ කරන්න ගණන කීයද කියලා. මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාවට අදාළව නම්, රුපියල් ලක්ෂයක් දුන්නාම බස් රථයේ අයිතිය සංශෝධනය කරන්න පුළුවන්. එකම අමාත්‍යාංශය, එකම විෂයේදී දුර ගමන් සේවා බස් රථවලට එක් ක්‍රමයකුත්, මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා බස් රථවලට තවත් ක්‍රමයකුත් තිබෙන්න විධියක් නැහැ. මම මේ ගැන මෙතැන කථා කරන්නේ ඇයි? මේ ගැන කථා කරන්න මෙතැන හැර වෙනත් තැනක් කොහේද තිබෙන්නේ? මේකටත් ප්‍රතිචාරයක් දක්වන්නේ නැත්නම් මොකක්ද කරන්නේ? මේක කරන්නම වෙනවා. මම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී ලිපියක් මඟින් කරුණු ඉදිරිපත් කළා, ගරු ඇමතිතුමනි. අපේ රටේ දුර ගමන් සේවා බස්රථ සේවාව ගෙන බලන්න. උදාහරණයකට මතුගම ගනිමු. මතුගම ඉඳලා ත්‍රිකුණාමලයට බස් නැහැ; මතුගම ඉඳලා බදුල්ලට බස් නැහැ; මතුගම ඉඳලා කන්කසන්තුරේට බස් නැහැ; මතුගම ඉඳලා නුවරඑළියට බස් නැහැ. ඉතින්, ඒ දුර ගමන් සේවාවලට අදාළව ටෙන්ඩර් කැඳවන්න. මම කියන්නේ නැහැ, මට දෙන්න කියලා. ටෙන්ඩර් කළාම ලොකු ආදායමක් රජයට ලැබෙනවා. එහෙම කළාම බිලියන ගණනින් ආණ්ඩුවට සල්ලි හම්බ කර ගන්න පුළුවන් නේ. ප්‍රාග්ධන වියදම් කපා හැරලා භාණ්ඩාගාරය පිරුණා කියලා සන්තෝෂ වෙනවාට වඩා හොඳයි, මේ වැහිලා තිබෙන දොරවල් ටික අරින එක. ඒක තමයි වෙන්න ඕනෑ. එහෙම නැතිව ප්‍රාග්ධන වියදම් කප්පාදු කරලා වැඩක් නැහැ.

මට ලැබිච්ච විමධ්‍යගත අරමුදල්වලින් ලක්ෂ 40ක් කප්පාදු කළා, අනීතිකව; චක්‍රලේඛයට විරුද්ධව. කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී, එහි සභාපතිතුමා වශයෙන් සිටි අපේ ගරු නලින්ද ජයතිස්ස සහෝදර ඇමතිතුමාට, දිසාපතිතුමාට මම පෙන්නුවා, "මෙන්න චක්‍රලේඛය, මේ චක්‍රලේඛය තුළින් මන්ත්‍රීවරයෙකු වශයෙන් මට පහසුකමක් දීලා තිබෙනවා, ස්වයංරැකියා ව්‍යාපෘති ආරම්භ කරන්න" කියලා. මම ඒක කරන්න ලෑහැස්ති වුණා. නමුත්, මට එය කරන්න දුන්නේම නැහැ. මම මේ පාර්ලිමේන්තුවටත් ඒ කාරණය ඉදිරිපත් කළා. ඒවා අනීතිකව නැවැත්තුවා. ඒ සල්ලි තමයි ඔය භාණ්ඩාගාරයේ ඉතිරි වුණා කියන්නේ. ඊට වඩා මුදලක් හම්බ කරන්න පුළුවන් අවස්ථාවක්, මේක.

ගරු ඇමතිතුමනි, දැන් මෙන්න මේ වාගේ දෙයකුත් ක්‍රියාත්මක වෙනවා. ගරු ඇමතිතුමා මේ කාරණා ග්‍රහණය කර ගන්න. මා හිතන විධියට අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්නවා. ඒ අය දේශපාලන අධිකාරිය විසින් පත් කරලාද, කොහොම පත් වුණාද කියලා මම දන්නේ නැහැ. ඒ අයගේ නම් කියන්න මම කැමැති නැහැ. ඇහුවොත්, ඒ නම් පවා මම ගරු ඇමතිතුමාට පෞද්ගලිකව කියන්නම්. ඒගොල්ලන් ක්‍රියාත්මක වෙන්නේ ඒගොල්ලන්ට ඕනෑ නීති රීති අනුවයි. මොනවාද නීති රීති? අපේ බස් එකක් අබලන් වෙලා නම් අපට - ඒ බස් රථ හිමියාට - පුළුවන් ඒ බස් එකට අලුත් බස් එකක් දමන්න ඉල්ලීමක් කරන්න. එතකොට මාස 3ක කාලයක් දෙනවා. මාස 3න් පසුව බස් එක දැම්මේ නැත්නම් තව මාස 3ක් දෙනවා, අභියාචනා ඉදිරිපත් කරන්න. දැන් නීතියක් දමා තිබෙනවා, මාස 6න් පසුව පර්මිට් එක දෙන්නේ නැහැ කියලා බස් එකක් දමන්න. හොඳම වැඩේ මොකක්ද? Lanka Ashok Leyland company එකෙන් අසා බලන්න, මේ අවුරුද්දේ මේ වෙනකොට මේ රටට ගෙන්වා තිබෙන්නේ බස් 45යි. රුපියල් ලක්ෂය, ලක්ෂ 4, ලක්ෂ 5 ගෙවපු අටසියදෙනෙක් පෝලිමේ ඉන්නවා. මේ බස් රථ 800 ගෙනෙන්න කොච්චර කල් යයිද, ඇමතිතුමා? මේවාට සෘජුව මැදිහත් වෙන්න, ඇමතිතුමා. අපේ බස් කර්මාන්තකරුවන් හරිම අමාරුවක වැටිලා ඉන්නේ. ඔය අධ්‍යක්ෂවරුන් මේවා දන්නවා.

ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී මම ඔබතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. අපට NTC එකේ නිලධාරීන් ටිකයි, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිලධාරීන් ටිකයි, DMT එකේ නිලධාරීන් ටිකයි සම්බන්ධ කර දෙන්න. මොකද අපට කවදාවත් බැරි වුණා, මේ හැමෝම එක තැනකට ගෙනැල්ලා කථා කරන්න. මේ සියලු ආයතනවල නිලධාරීන් එක තැනකට ගෙන්වා කථා කළොත් හොඳ නැද්ද? මට මේ සම්බන්ධව අත්දැකීම් තිබෙනවා. මම වාහනයක් ගත්තා. මම වාහනය ගන්නකොට ඒ අදාළ නීති රීති සියල්ලම පිළිපැද්දා. ඇමතිතුමනි, ඔබතුමාගේ කාලයේදී හෝ මම මේ කියන කටයුතු ටික ඉටු කර දෙන්න. ඔබතුමා ඉතාම හොඳින් ඇහුම්කන් දෙන ඇමතිවරයෙක්. මම ඔබතුමාව දකින්නේ හොඳ ඇමතිවරයෙක් විධියට. මම මේ බටර් ගානවා නොවෙයි. ඔබතුමා සෘජුව තීරණ ගන්න නිසායි මම මෙහෙම කියන්නේ. මම ඔබතුමාට කියන්නේ, කාර්යක්ෂමව කටයුතු කර ගැනීම සඳහා ආයතනයක් පත් කරන්න කියන එකයි. ඒ කියන්නේ, වාහනයක් ගන්නකොට ක්ෂණිකව DMT එකෙන් check කරගන්න, ඕනෑ නම් DIEC එකෙනුත් check කරගන්න, Sri Lanka Customs එකෙන් CusDec එක ගන්න පුළුවන් විධියට ආයතනයක් පත් කරන්න. මේ ටික කරගන්නේ නැතුව ක්ෂණිකව වාහන ගත්තාම තමයි මිනිස්සු අමාරුවේ වැටෙන්නේ. එහෙම වාහන අරගෙන අමාරුවේ වැටිච්ච මිනිස්සු කොච්චර ඉන්නවාද? DMT එක කියන්නේ හොර ගුහාවක්. මේක තමයි ඇත්ත. මගේ වාහනයට අදාළව සිදු වෙච්ච දේට මම FR යටතේ නඩු දමා තිබෙන්නේ. ඒකට leave to proceed හම්බ වෙලා තිබෙන්නේ. මේක තමයි ඇත්ත. ඒ කියන්නේ ගත්ත වාහනයේ සියලු දේවල් පිළිඅරගෙන තිබෙනවා නම්, වාහනයට අදාළ පොත්පත් පවා තිබෙනවා නම්, ඊට වඩා අවශ්‍ය නීතිය මොකක්ද? එහෙම නම් අපට මේවා ක්ෂණිකව බලා ගැනීම සඳහා ආයතනයක් ඕනෑ, ඇමතිතුමා. DMT එකේ බැලීම මට ෂුවර් නැහැ, විශ්වාසයක් නැහැ.

ඊළඟට, අලුතින් ගෙන්වන වාහන ගැනත් මම කියන්න ඕනෑ. බලන්න, අලුතින් වාහන ගෙනැල්ලා පිරිලා. භාණ්ඩාගාරය පිරුණේ ඒවා ගෙන්වීමේදී ගහපු අධික බද්දෙන්. බද්ද සියයට 200යි, 300යි, 400යි, 500යි. එහෙම බදු මුදලක් අය කළේ. මමත් වාහනයක් ගත්තා. මමත් බද්ද ගෙවලා ගත්තේ. නමුත් ඉතින් වාහන ඕනෑවට වඩා රටට ගෙන්වීම නිසා දැන් රට තුළ වාහන අතිරික්තයක් තිබෙනවා. තවත් ගෙන්වනවා. ඊට පසුව මොකද වෙන්නේ? මේවා විකුණා ගන්න බැහැ. අනෙක් කාරණය තමයි, දවස් 90ක් ඇතුළත මේ අලුත් වාහන register කරන්න ඕනෑ. ඒක ආනයනකරුවන්ට දමා තිබෙන නීතියක්. දවස් 90 ගණනය කරන්නේ වාහනය ලංකාවට ගොඩ බාපු දවසේ ඉඳලා. ඒක එහෙම වෙන්න දෙන්න එපා. මට වෙලාව මදි නිසා මම ඉක්මනින් මේ කාරණා සඳහන් කරන්නම්. පුළුවන් නම්, මට තව සුළු වෙලාවක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි.

Hambantota Harbour එකට තමයි මේ වාහන ගොඩබාන්නේ. නමුත් ඒ harbour එකේ ඉඩ නැහැ. ඒකේ "මඩ පාර්ක්" කියලා එකක් තිබෙනවා. මා ළඟ ඒ photos තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ photos සහ ඊට අදාළ අනෙකුත් සියලු ලේඛන මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

ඒ මඩ පාර්ක් එකට තමයි කෙළින්ම brand new වාහන ගොඩබාන්නේ; මඩට බාන්නේ. ඒ අලුත් වාහන මඩේ එරිලා තිබෙන්නේ. ඒ වාහන එළියට ගන්නේ බැකෝ එකකින් ඇදලායි, ඇමතිතුමනි. මම මේ කියන්නේ සහතික ඇත්ත. එහෙම ගන්නකොට ඒ වාහන damage වෙනවා. එහෙම damage වුණාම මොකද වෙන්නේ? ඒ වාහන රක්ෂණය කරලාත් නැහැ නේ. එතකොට ආනයනකරුවාට තමයි ඒවාත් හදන්න වෙන්නේ. මේවා හරිම අශෝභන සිද්ධි. මම ඒවා ඡායාරූපගත කළා. මේවා මෙහෙම වෙන්න දෙන්න එපා. දැන් මේ ගෙනා වාහන ටිකට මොකද වෙන්නේ? මේ වාහන ගන්න මිනිස්සු කෝ?

අනෙක් කාරණය මෙයයි. අලුත් බස් 300ක්ද කොහෙදෝ පාරට දමනවා කිව්වා; 300ක්ද, 100ක්ද මම දන්නේ නැහැ. ඒ සඳහා Budget එකෙන් රුපියල් මිලියන 300ක්ද කොහෙදෝ වෙන් කරලාත් තිබුණා. ගරු ඇමතිතුමනි, මීට ඉස්සෙල්ලාත් අපි park-and-drive system එකක් ඇති කළා, මාකුඹුරේ. කාර් එකෙන් එතැනට ඇවිල්ලා එතැන කාර් එක park කරලා බස් එකේ නැඟලා කොළඹට යන්න පුළුවන් ක්‍රමයක් හැදීම තමයි ඒකෙන් බලාපොරොත්තු වුණේ. මම හිතන විධියට ඒ ක්‍රමය හැදුවේ පාඨලී චම්පික රණවක මැතිතුමාගේ කාලයේ. කොහොම වුණත්, ඒ ක්‍රමය අසාර්ථක වුණා. ඒකට හේතුව තමයි, පාරවල් නවීකරණය නොවීම. පාරවල් හදන්නේ නැත්නම්, පාරවල්වලට ඒ අවශ්‍ය ප්‍රවේශය නැත්නම්, ඉක්මනින් යන්න ක්‍රමයක් නැත්නම් මොකද වෙන්නේ? ඒකෙන් වුණේ ආපසු වතාවක් පරණ ක්‍රමයටම තමන්ගේ වාහනයෙන්ම එන එකයි. දැන් පවතින තත්ත්වය තුළ ත්‍රීවීලර් එකකින් හෝ මෝටර් සයිකලයකින් හෝ යන එක වේගවත්, අපි යන වාහනයක යනවාට වඩා. ඒක compulsory කියලා අපට නීතියක් දමන්න බැහැ. වාහනය එතැන නවත්වා බස් එකේ යන්න කියලා කාටවත් කියන්න බැහැ නේ. ඒක තමන්ගේ අභිමතය. මම කියන්නේ මිනිස්සු මේවාට ප්‍රායෝගිකව සම්බන්ධ කරගන්න කියලායි.

ඇමතිතුමා මට විවෘත ආරාධනාවක් කළා, මේ පාර්ලිමේන්තුවේදී. මම ඒකට ස්තුතිවන්ත වුණා. හැබැයි, මම වරදක් කළා. මොකක්ද, මම කළ වරද? මම කිව්වා, මට වැටුප් එපා, මට නිල වාහන එපා, මම මගේ සේවය දෙන්නම් කියලා. ඇමතිතුමාට මතක ඇති, මම මේ ස්ථානයේ ඉඳගෙනම ඒක කිව්වා. කොහොම හරි අද වෙනකල් මට ඒ ඉල්ලීම ඉදිරිපත් කළේ නැහැ. මම මේ කථා කරන්නේ මාලිමාව ගැනවත්, සමගි ජන බලවේගය ගැනවත්, යූඑන්පී එක ගැනවත් නොවෙයි. මා ළඟ තිබෙන දක්ෂකම දෙන්න මම සූදානම්.

දැන් බලන්න, කළුතර දිස්ත්‍රික්කයේ ඩිපෝ පහක් තිබෙනවා. හැබැයි, ඒ ඩිපෝ පහටම ජැක් එකක් නැහැ. ජැක් එකක් නැති වුණාම මොකද වෙන්නේ? තෙල් බලන්න විධියක් නැහැ, ග්‍රීස් ටික ගහන්න විධියක් නැහැ, හෝදන්න විධියක් නැහැ. එතකොට හැම තිස්සේම බස් කැඩෙනවා. අපි පෞද්ගලික වාහනයක් කොච්චර service කරනවාද? හැම කිලෝමීටර ගණනකටම සැරයක් service කරනවා නේ. ඩිපෝවලට අයත් බස් රථවලට ඒ දේවල් වෙන්නේ නැහැ. ඇමතිතුමනි, අන්න ඒකයි මම කියන්නේ මිනිසුන්ගෙන් ප්‍රායෝගිකව වැඩ ගන්න කියලා. මම මේ කථා කරන්නේ දේශපාලන වශයෙන් නොවෙයි. ඕක කරන්න එපා, ඕක වැරදියි කියලා අපේ පක්ෂයෙන් මට කිව්වත්, මට එහෙම නොකර ඉන්න බැහැ. ඒ ප්‍රදේශයේ ජනතාව මගෙන් අහනවා, ඔබතුමාගේ බස් විතරක් හොඳට දුවනවා නේද කියලා. ඔව්, මගේ බස් නිරුපද්‍රිතව දුවනවා. මගේ බස් යාපනය දක්වා වූ ලොකුම රූට් එකත් දුවනවා. දවස් 365ම දුවනවා; එක දවසකවත් නවත්වන්නේ නැහැ. මම බස් අමතරවත් ගෙනැල්ලා තියාගෙන ඉන්නවා, service එකට. මට ව්‍යාපාර ගොඩක් තිබෙනවා. බස්වලින් සල්ලි හම්බ කරනවාට වඩා මම කැමැතියි, ඒක service එකක් විධියට දිගටම ජනතාවට ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, බලන්න, SLTB එක අදටත් තිබෙන්නේ කොහොමද කියලා. දැන් DS වෙන්නේ කවුද? කොන්දොස්තර

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ජගත් විතාන මහතා]

කෙනෙක්, නැත්නම් රියදුරු මහත්මයෙක්. ඉංජිනේරු මහත්වරුන් කැමැතිද, විශේෂ දක්ෂතා තිබෙන අය කැමැතිද, කොන්දොස්තර මහත්මයෙක් නැත්නම් රියදුරු මහත්මයෙක් යටතේ පාලන කටයුතු කරගෙන යනකොට, ඒගොල්ලන්ට ඒ අයගෙන් නියෝග ලැබෙනකොට? නැහැ. ඒක වෙනස් වෙන්නම ඕනෑ. ඒක පසුගිය කාලයේ නිල්, කොළ, රතු කියන පාට, පක්ෂ භේදයෙන් තොරව වෙච්ච දෙයක්. ඒක වෙන්න දෙන්න එපා. මේ කර්මාන්තය ගොඩ ගන්න අපට පුළුවන්.

පසුගිය කාලයේ හොඳ වැඩක් පටන් ගත්තා. ඒකාබද්ධ කාල සටහනකට අනුව බස් ධාවනය කරන්න පටන් ගත්තා. ඒක ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා. හැබැයි ඒකත් limit වෙලා; ඒකත් නැවතිලා. ඒකයි මම කියන්නේ. දැන් නිලධාරි මණ්ඩලයත් අලුත් වෙලා, ගරු ඇමතිතුමනි. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේත් අලුත් වෙලා; ප්‍රාදේශීය කාර්යාලවලත් අලුත් වෙලා. ඒක හොඳයි. නමුත් මම කියන්නේ, ප්‍රායෝගික දැනුම තිබෙන බස් හිමියන් හතර පස්දෙනෙක් සම්බන්ධ කරගෙන මාස හයකට හෝ අවුරුද්දකට සැරයක්වත් වට මේස සාකච්ඡාවක් පවත්වා අපව සම්බන්ධ කරන ක්‍රමයක් හදන්න කියලායි. එහෙම කළොත්, මේ කර්මාන්තය ගොඩ ගන්න පුළුවන්. බලන්නකෝ, පෞද්ගලික අංශයට කිසිම උදව්වක් නැහැ නේ. භාණ්ඩාගාරයෙන් මොකක්වත් වියදම් වෙන්නේ නැහැ, පෞද්ගලික අංශයට. නමුත් SLTB එකට කොහොමද? සියයට 40ක්, 50ක් ප්‍රතිපූරණය වෙන්නේ භාණ්ඩාගාරයෙන්. ඒ නිසා පාඩු ලැබුවත්, ලාභ ලැබුවත් ඒගොල්ලන්ට කිසිම ගණනක් නැහැ. එහෙම වෙන්න බැහැ. ඒක එහෙම වෙන්න දෙන්නත් එපා. ඒගොල්ලන්ටත් ඉලක්කයක් තිබෙන්න ඕනෑ. අපි අපේ මිනිසුන්ට ඉලක්කයක් දීලා තිබෙනවා.

තවත් දෙයක් මම කියන්නම්, ගරු සභාපතිතුමනි. දැන් ගමනාගමන මණ්ඩලයේ ඉන්න රියදුරන්ගෙන් ඇහුවොත් කියාවි, "දවස පුරා අපි දුවනවා, අපි කෙටි මාර්ග දුවනවා" කියලා. අපේ බස් සේවාවත් ඒ විධියට ක්‍රියාත්මක කරන්නම්. අපටත් දෙන්න, තනි දොරේ බස් දුවන්න අවස්ථාව. දැන් බලන්න, දොර දෙකේ බස් දුවනවා, තනි දොරේ බස් දුවන පාරේ. ඒක වෙන්න බැහැ. දැන් ඔය ඒකාබද්ධ කාලසටහන ගෙනාවාට පස්සේ අපේ තරගය නැති වුණා, ඇමතිතුමා. SLTB එකයි, අපියි අතර තිබුණු තරගය ඇත්තටම නැති වුණා. මොකද හේතුව, ඒකාබද්ධ කාල සටහනට නේ, ගියේ. හැබැයි හොයලා බලන්න ඇමතිතුමා, දැන් ඒක නැවතිලා. ඒක නවත්වන්න දෙන්න එපා. ඒක හැම පාරකටම ක්‍රමානුකූලව අරගෙන එන්න. මම එතැන ඉන්නවා. මට ඒකට සක්‍රිය දායකත්වයක් දෙන්න පුළුවන්, කළුතර දිස්ත්‍රික්කයෙන්. මොකද, කළුතර දිස්ත්‍රික්කයේ මේ සම්බන්ධව විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඔබතුමන්ලාගේ Clean Sri Lanka වැඩ පිළිවෙළ පටන් ගත්ත දවසේත් මම කිව්වා, අඩු ගණනේ බස් නැවතුම්පොළකට වැසිකිළියක් තිබෙන්න ඕනෑ කියලා; හොඳ වැසිකිළියක්. ඒකෙන් මුදල් හම්බ කරන්නත් පුළුවන්. දෙන්නෙකුට තුන්දෙනෙකුට රස්සා දෙන්නත් පුළුවන්. හැබැයි ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

අද රියදුරන්ට, කොන්දොස්තරවරුන්ට විනයක් නැහැයි කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? ඒගොල්ලන්ට වතුර ටිකක් නා ගන්න හොඳ bathroom එකක් නැහැ, restroom එකක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන්ගේ රියදුරන් ගැනත් මම කියන්න ඕනෑ. කෝ, අපේ රියදුරන්ට පහසුකම්? අන්න අරහේ කාක්කෝ ජරා කරලා අලුත් වාහන ටිකත් ජරා වෙනවා. අලුත් වාහන ටික තියාගෙන ඒ අය ඉන්නවා, එතැනට වෙලා. කෝ, ඒගොල්ලන්ට වාහන දමන්න තැනක්? කෝ, ඒගොල්ලන්ට rest කරන්න room එකක්? විශේෂයෙන්ම යාපනය, මඩකලපුව වාගේ ප්‍රදේශවලට යන මන්ත්‍රීවරුන්ගේ ජීවිත අනාරක්ෂිතයි. අපි නම් expressway එකට දමලා පැයෙන්, පැය එකහමාරෙන් ගෙදරට යනවා. නමුත් දුර යන අය? මට ඒ රියදුරන් කථා කරලා කිව්වා, "ජගත් මහත්තයා, මේ ගැන කථා කරන්නකෝ" කියලා. මට දැනුයි මතක් වුණේ. අද ප්‍රවාහන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන විවාද කරන නිසායි මම මේ දේවල් කියන්නේ. ඇමතිතුමා, මේවාට විසඳුම් දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Jagath Vithana, your time is up now.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

මට තවත් කරුණු තිබෙනවා කියන්න, නමුත් කාලය නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම කියන්න බලාපොරොත්තුවෙන් හිටපු කරුණුවලට අදාළ ලේඛන සියල්ල මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා. ඔබතුමා මේ ලේඛන බලලා තීන්දුවක් දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, bus stands 50ක් අලුත්වැඩියා කරන වැඩ පිළිවෙළක් Clean Sri Lanka වැඩසටහනත් එක්ක අපි පටන් අරගෙන තිබෙනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ බස්වලත් card payments පටන් ගන්න කියලා. අද අපි එම වැඩසටහන පටන් ගත්තා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The ongoing Proceedings of the Committee of the whole Parliament shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 1.00]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අමාත්‍යාංශ 3ක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන මොහොතේ, ඒ මාතෘකාවට එන්න කලින් පොඩි වෙලාවක් අරගෙන කරුණු කිහිපයක් සම්බන්ධයෙන් අදහස් දක්වන්න මම කැමැතියි. ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ දෙනෙක් මේ මොහොතේදී සභාවේ නැති වුණත්, මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා සඳහන් කළා, බෝගම්බර පැරණි සිර කඳවුර සම්බන්ධයෙන් කිසිම දෙයක් මේ වෙනකොට සිද්ධ වෙලා නැහැ කියලා. ඇත්තටම බෝගම්බර පැරණි සිර කඳවුර පසුගිය කාලයේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් හැටියට සංවර්ධනය කරන්න තීරණය කරලා ඊට අවශ්‍ය කැබිනට් අනුමැතිය මේ වෙනකොටත් අරගෙන තිබෙනවා. ඒ වාගේම, RFPs call කරන්න අවශ්‍ය වන පුරාවිද්‍යාත්මක අගය කිරීම් සඳහා වාර්තාව කැඳවලා තිබෙනවා. ඉතාම ඉක්මනින්, ඒ වාර්තාව ලැබුණු වහාම RFPs call කරලා අපට ඒ සංවර්ධන කටයුතු කරගෙන යන්න පුළුවන්.

ඊළඟට, මරික්කාර් මන්ත්‍රීතුමා නිවාස සම්බන්ධයෙන් සඳහන් කළා. නිවාස, ඉදිකිරීම් අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ඉදිරිපත් කරාවි. කෙසේ වුණත්, 2026 වසරේදී නිවාස 10,000ක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 7,200ක් වෙන් කරන්නේ මේ අවුරුද්දේ ඉතිරි වෙච්ච සල්ලිවලින් කියලා එතුමා කියා සිටියා. එහෙම නොවෙයි. විසර්ජන පනත් කෙටුම්පතින් නිවාස ආධාර සඳහා රුපියල් මිලියන 7,200ක් වෙන් කළා. ඊට අමතරව ජනාධිපතිතුමා තමන්ගේ අය වැය කථාවේදී ඒ වෙනුවෙන් තවත් රුපියල් මිලියන 3,000ක් වෙන් කළා කියන එකත් මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වරාය සහ ගුවන් තොටුපොළ කියන්නේ, ඇත්තටම ජාත්‍යන්තර ගමනාගමනය සඳහා උපකාරී වන, ඒ වාගේම වෙළෙඳ ජාලයත් එක්ක රට සම්බන්ධ කරන, ගෝලීය වෙළෙඳ පොළත් එක්ක අපේ රට ඒකාබද්ධ කරන ප්‍රවේශ දොරටුව හැටියට අපට සලකන්න පුළුවන්. භාණ්ඩ ඵලදායී ලෙස කාර්යක්ෂමව රට තුළට ගෙන ඒමටත්, රටින් පිටතට භාණ්ඩ ප්‍රවාහනය කිරීමටත්, විදේශ ආදායම ජනනය වන ප්‍රවේශ හැටියට අපට වරාය සහ ගුවන් තොටුපොළ හඳුන්වන්න පුළුවන්. ජාතික ආර්ථිකයේ අතිශය සංකීර්ණ සහ වැදගත් කාර්යභාරයක් මේ හරහා ඉටු වෙනවා. විශේෂයෙන්ම 2026 අපේ අය වැය අරමුණු කරගෙන තිබෙන්නේ ආර්ථික ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහිල්ලා ආර්ථික සංවර්ධන වේගයක් අත්පත් කර ගැනීම නිසා, මේ වරාය සහ ගුවන් තොටුපොළට ඒ සඳහා විශේෂ වැදගත් කාර්යභාරයක් ඉෂ්ට කරන්න තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

කොළඹ වරාය 2021දී ලෝකයේ Container Port Performance Indexහි වරායන් 370ක් අතරින් 22වන ස්ථානයේ තිබුණා. එම ශ්‍රේණිගත කිරීම්වලට අනුව දකුණු ආසියාවේ පළමුවැනි වරාය බවටත් පත් වුණා. ඒ වාගේම, කොළඹ වරාය ඉන්දියන් සාගරයේ පිහිටා තිබෙන වරායන් අතරින් තුන්වැනි වරාය හැටියටත් පත්ව තිබුණා. නමුත්, අවාසනාවකට 2023 අවුරුද්දේදී ඒ ස්ථානය 40වන තැන දක්වා පසු බහින්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, තවමත් connectivity අතින් මුළු ලෝකයත් එක්ක ගනිද්දී සම්බන්ධතා ජාලය අතරින් වැදගත්ම වරායන් අතර 13වැනි ස්ථානයේ අපි ඉන්නවා. එහෙම බැලුවාම කොළඹ වරාය කියලා කියන්නේ ලංකාවට විතරක් නොවෙයි, මේ කලාපයටත්, මුළු ලෝකයටමත් අතිශයින්ම වැදගත් වරායක්. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පසුගිය අවුරුද්දේ performance දිහා බැලුවාම, 2024 අවුරුද්දේ ආදායම රුපියල් මිලියන 55,737යි. 2025 මේ වෙනකොට ඒ ආදායම රුපියල් මිලියන 63,119ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. ඒ අතින් ගත්තාම සියයට 13කින් තමන්ගේ ආදායම වැඩි කර ගන්න වරාය අධිකාරිය සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම, බද්දට පස්සේ ලාභය 2024 අවුරුද්ද වන විට තිබුණේ රුපියල් මිලියන 22,688යි. ඒක 2025 අවුරුද්දේ මේ වන විට රුපියල් මිලියන 39,914 දක්වා බිලියන 12.26කින් වැඩි කර ගන්න නව පාලනාධිකාරිය සමත් වෙලා තිබෙනවා. ඒක පසුගිය අවුරුද්දත් එක්ක බලද්දී සියයට 54ක වැඩිවීමක්. නමුත්, ආදායම් වැඩි කර තිබුණත්, ඒ ආදායම් ලැබෙන ප්‍රභව මොනවාද කියලා අපි විශ්ලේෂණය කර බලන්න ඕනෑ. ඒ වාගේම, ඒ විශ්ලේෂණය තුළින් අපි හඳුනා ගන්න ඕනෑ, මේ ආදායම තවදුරටත් වර්ධනය කර ගන්නා ආකාරය. විශේෂයෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන ජය බහලුම් පර්යන්තය තිබෙනවා; නැඟෙනහිර පර්යන්තය එකතු වෙන්න තිබෙනවා. ඒ වාගේම, අනෙක් පර්යන්තත් එක්ක සංසන්දනාත්මක විශ්ලේෂණයක් කරලා තවදුරටත් අපට වර්ධනය කළ හැකි ක්ෂේත්‍ර මොනවාද කියලා හඳුනා ගන්න අපි ඉක්මනින්ම කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම, මම කලින් සඳහන් කළා වාගේ අපි ගෝලීය කාර්යක්ෂමතා දර්ශකයේ 40වැනි තැන දක්වා පසු බැහැලා තිබෙනවා. විශේෂයෙන්ම කොළඹ වරාය ඇතුළු අපේ රටේ වරායන් ගැන කථා කරනකොට ඒවායේ කාර්යක්ෂමතාව, ඒ වාගේම මෙහෙයුම් තදබදය පිළිබඳ සාකච්ඡාවක් අදාළ ප්‍රජාවන් තුළ ඇති වෙලා තිබෙනවා.

අපි දන්නවා, 2024දී කොළඹ වරාය කන්ටේනර් මිලියන 7.78 දක්වා මෙහෙයුම් වැඩි කරගෙන තිබෙන බව. එය පසුගිය අවුරුද්දත් එක්ක බලද්දී සියයට 12.1ක් වාගේ ප්‍රමාණයක්. නමුත්, කොළඹ වරායේ විභවතාව තිබෙන්නේ මිලියන 8ක් විතර. ඕනෑම තැනක තමන්ගේ විභවතාවට ආසන්න වනකොට එහි කාර්යක්ෂමතාව පිළිබඳව ගැටලුවක් තිබෙනවා. එම නිසා අපි එක පැත්තකින් එම වරායේ මෙහෙයුම් පරිමාව වැඩි කරන්න කටයුතු කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, කාර්යක්ෂමතාව වැඩි කර ගන්නත් අපි කටයුතු කරන්න ඕනෑ. නැඟෙනහිර පර්යන්තයේ වැඩකටයුතු දැන් බොහෝ දුරට අවසන් කරලා තිබෙනවා. ලබන අවුරුද්දේ සැප්තැම්බර් මාසය වනකොට එම පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන්න පුළුවන් වෙයි. අපට ඒ තුළින් තවත් කන්ටේනර් - TEUs - මිලියන 2.5ක පරිමාවකින් වැඩි කර ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය 2024දී ගරු බිමල් රත්නායක මැතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් භාර ගන්නකොට වරායේ භෞතික ප්‍රගතිය තිබුණේ සියයට 30ත්, 35ත් අතර ප්‍රමාණයක්. මේ ගත වුණු වසරකට ආසන්න කෙටි කාලය තුළ එහි භෞතික ප්‍රගතිය සියයට 65.8 දක්වා වැඩි කර ගන්න සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම පසුගිය දවසක දෙවන නැව් තටාංගනයට පෙරහුරුවක් සඳහා ලෝකයේ ප්‍රධානම නැව් සමාගමක "MSC China" සහ "MSC Manasa F" කියන නැව් දෙක ආවා. ලෝකයේ තිබෙන ඕනෑම විශාල නැවකට නැඟෙනහිර පර්යන්තයේ තිබෙන නැව් තටාංගනයෙන් පෙරහුරු කටයුතු සඳහා අවශ්‍ය වන පහසුකම් ලබා දෙන්න අපට පුළුවන්.

අපේ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා, straddle carriers ගැන කිව්වා. දැන් ඒකේ 30කින් 15ක් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන procurement stage එකේ තිබෙන්නේ. මම කලින් සඳහන් කළා වාගේ, අපට සැප්තැම්බර් මාසය වනකොට ඒක සම්පූර්ණයෙන්ම install කරලා මෙහෙයුම් කටයුතු පටන් ගන්න පුළුවන්. ඒ හරහා කොළඹ වරායේ ධාරිතාව මිලියන 2.5කින් වැඩි කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා.

[අනුර කරුණාතිලක මහතා ]

ඊළඟට, බටහිර පර්යන්තයේ පළමු අදියරේ වැඩ ලබන අවුරුද්දේ අවසන් වෙයි. එතකොට තවත් මිලියන ගණනක් එම පරිමාවට එකතු වනවා. අපි logistics hub එකක් විධියට ඒක වැඩිදියුණු කරන්නේ කොහොමද? අපි දන්නවා, ආසියානු කලාපයේ ඉන්දියාව වාගේ රටවල වරායන් ශීඝ්‍රයෙන් දියුණු වන බව. එම වරායන් ශීඝ්‍රයෙන් දියුණු වනකොට අපි තරගකාරිත්වයට යනවාද, එහෙම නැත්නම් එහි කොටස්කරුවන් හැටියට අපේ වරාය සංවර්ධනය සඳහා යොමු කර ගන්නවාද කියන උපක්‍රමික තීරණය සහ තීන්දුව අපි ගන්න ඕනෑ. අපි හිතනවා competitive level එකට යනවාට වඩා collaboration level එකට ගියොත් තමයි අපට ඒ අවට කලාපයේ තිබෙන වරායන්වල දියුණුවේ කොටසක් බවට අපේ වරාය පත් කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ කියලා. අපි දැනටමත් ADB ආධාර යටතේ, ඒ වාගේම ලෝක බැංකු ආධාර යටතේ උතුරු වරාය ඇතුළු සම්පූර්ණ වරායන් සඳහා master plan එකක් හදන්නේ කොහොමද කියලා සාකච්ඡා කරනවා. ඒ වෙනුවෙන් ශක්‍යතා අධ්‍යයනයක් කිරීම සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව, එක පැත්තකින් කොළඹ වරායේ කාර්යක්ෂමතාව වැඩි කරලා, අනෙක් පැත්තෙන් පරිමාව වැඩි කරගෙන වඩා කාර්යක්ෂම සහ ඉහළ ධාරිතාවකින් යුතු වරායක් බවට පරිවර්තනය කරන්න අවශ්‍ය වැඩකටයුතු මේ වනකොටත් සිදු වෙමින් පවතින බව අපට පෙනෙනවා.

අපි දන්නවා, Port Community System එකක් ගැන කාලයක් තිස්සේ කථා බහක් තිබුණු බව. එයට කැබිනට් අනුමැතින් කිහිපයකුත් ලැබිලා තිබුණා. නමුත්, එය ක්‍රියාත්මක තලයට ගෙන යන්න බැරි වුණා. අපි මේ වනකොට Port Community System එකක් කොළඹ වරායට හඳුන්වා දීම සඳහා අවශ්‍ය වන කැබිනට් මණ්ඩල අනුමැතියත් අලුතෙන් අරගෙන, දැන් ඒ කටයුතුවල පියවරයන් වේගවත් කරන්න කටයුතු කරමින් ඉන්නවා.

Kerawalapitiya dry port එකක් ගැන සෑහෙන කාලයක් තිස්සේ කථා කළා. ඒ සඳහා ADB එකෙන් කළ අධ්‍යයනයක් තිබෙනවා. අපි ඉක්මනින්ම ඒ සඳහා කටයුතු කරන්න ඕනෑ. ගරු බිමල් රත්නායක මැතිතුමාගේ කාලයේ අපට මතකයි, එම ස්ථානයට ගිහිල්ලා අවශ්‍ය වන ඉඩමේ නීත්‍යානුකූල තත්ත්ව නිරවුල් කර ගන්න පුළුවන්කම ලැබුණා. නමුත්, ඒ සඳහා ක්‍රියාත්මක වීම තවමත් ප්‍රමාද වෙලා තිබෙනවා. Sri Lanka Customs යටතේ තමයි ඒක ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ. අපි Sri Lanka Customs එකත් එක්ක සාකච්ඡා කරලා ඒ සඳහා පියවර ගන්නත් බලාපොරොත්තු වනවා.

කන්කසන්තුරේ වරාය ගැනත් මා යමක් සඳහන් කරන්න ඕනෑ. දීර්ඝ කාලයක් තිස්සේ කන්කසන්තුරේ වරාය මගීන් ප්‍රවාහනය සහ logistics වරායක් හැටියට සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡාවක් තිබුණා. ඒ සාකච්ඡාවලදී සමහර ගැටලු නිරාකරණය කර ගත යුතුව තිබුණා. ඒ අවබෝධතා ගිවිසුමේ තිබෙන්න ඕනෑ කරුණු සම්බන්ධයෙන් විකල්ප යෝජනා ඉදිරිපත් කරලා, ඒවා දැන් අපි ඉන්දියාවට භාර දීලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ජනවාරි මාසයේ මුල් කාලය වෙනකොට අපට නැවතත් ඒ සාකච්ඡා ආරම්භ කරන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම කලින් යෝජනා කර තිබුණාට වඩා වෙනස් විධියට, ලංකාව සහ ඉන්දියාව joint venture එකක් හැටියට මේක operate කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඔවුන් මූලික එකඟතාව පළ කර තිබෙනවා. ඒ අනුව අපි හිතනවා, 2026 අවුරුද්දේදී අපට ඒ කටයුත්ත ආරම්භ කරන්න පුළුවන්කම ලැබෙයි කියලා. ඒ වාගේම මීට කලින් ණයක් හැටියට තමයි මේ සංවර්ධන කටයුතු කරන්න අපට මුදල් ලබා දෙන්න ඉන්දියාව තීරණය කර තිබුණේ. නමුත් දැන් ඔවුන් සූදානම් වනවා, එකඟතාව පළ කර තිබෙනවා, කන්කසන්තුරේ වරාය සංවර්ධනය කිරීම සඳහා ආධාර හැටියට ඩොලර් මිලියන 63.5ක් ලබා දෙන්න.

ඒ වාගේම සංචාරක ව්‍යාපාරය කේන්ද්‍ර කරගෙන ගාල්ල වරාය සංවර්ධනය කිරීම පිළිබඳවත් අපි අවධානය යොමු කර තිබෙනවා. ඒ සඳහා වූ යෝජනා එක්ක විවිධ ආයෝජකයින් ඇවිල්ලා තිබෙනවා; දැන් ඒ සම්බන්ධව සාකච්ඡා කරමින් ඉන්නවා. අපි බලාපොරොත්තු වනවා, ඉතාම ඉක්මනින් ඒ සඳහා අභිලාෂ යෝජනා කැඳවන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගුවන් තොටුපොළ පිළිබඳවත් මම කිසියම් විධියක අවධානයක් යොමු කරන්න කැමැතියි. අපි දන්නවා, සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම 2024ට සාපේක්ෂව තමන්ගේ ආදායම සියයට 25කින් වැඩි කර තිබෙන බව. විශේෂයෙන් මෙහෙයුම් ලාභය සියයට 58කින් වැඩි කරගෙන තිබෙනවා. ඒ අනුව, බදු ගෙවීමෙන් පසු තමන්ට ලැබෙන ලාභය 2024ට සාපේක්ෂව 2025දී සියයට 36කින් වැඩි කරගෙන තිබෙනවා. අපි දන්නවා, යාපනය ගුවන් තොටුපොළ ගත්තත්, 2024දී රුපියල් මිලියන 76ක් වෙච්ච ආදායම 2025 අවුරුද්දේ මුල් මාස 9 තුළ රුපියල් මිලියන 92 දක්වා වැඩි කර, ශුද්ධ ලාභයක් ලබාගන්න කටයුතු කර තිබෙන බව.

ඒ වාගේම කටුනායක ගුවන් තොටුපොළේ දෙවන අදියර සංවර්ධනය කිරීම සම්බන්ධව සෑහෙන කාලයක් තිස්සේ සාකච්ඡා කරමින් තිබුණා. නමුත්, විවිධ හේතු නිසා ඒ කටයුතු ප්‍රමාද වෙමින් තිබුණා. නමුත්, JICA එකේ මැදිහත්වීමත් එක්ක ඔවුන් එකඟ වුණා, JICA එක යටතේ තිබෙන විවිධ ව්‍යාපෘති 11ක් මේ රජය බලයට පත් වුණායින් පස්සේ නැවත ආරම්භ කරන්න සහයෝගය ලබා දෙන්න. මේ, කටුනායක ගුවන් තොටුපොළේ දෙවන අදියර සංවර්ධනය කිරීමේදී ඒ ව්‍යාපෘති 11ට ඇතුළත් වන තවත් ව්‍යාපෘතියක්. මේ වෙනකොටත් අදාළ technical bid evaluation එක සම්පූර්ණ කර තිබෙනවා. අදත් මේ සම්බන්ධව සාකච්ඡාවක් තිබෙනවා. ඒ අනුව අපි හිතනවා, ජනවාරි මාසය වනකොට price bids open කරන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා. ඒ අනුව අපි හිතනවා, 2026 අවුරුද්දේ ජූනි, ජූලි විතර වනකොට contract එක award කර, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන්න අපට පුළුවන් වෙයි කියලා.

අපි දන්නවා, මේ ගුවන් තොටුපොළේ second terminal එක නිසි කාලයට හදන්න අසමත් වෙච්ච නිසා මේ වනකොට ගුවන් තොටුපොළේ විශාල තදබදයක් ඇති වෙලා තිබෙන බව. නමුත් ඒ සඳහා අපි තාවකාලික පියවරක් ගෙන තිබෙනවා. විශේෂයෙන් පෞද්ගලික අංශයේ දායකත්වයත් එක්ක marquee එකක් හදලා ඒ තුළ තාවකාලික check-in counters 14ක් විවෘත කරන්න අපි කටයුතු කළා. ඒ තුළින් අපට පුළුවන්කම ලැබී තිබෙනවා, දවසකට තවත් ගුවන් යානා 18ක්, 20ක් අතර වාගේ ප්‍රමාණයකට අවස්ථාව ලබා දෙන්න. වැඩිපුර ගුවන් යානා සඳහා සේවා සම්පාදනය කරන්න ඒ තුළින් අපට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ වාගේම ජපාන රජයත් මැදිහත් වෙලා අපට IMO එකෙන් e-gates 4ක් ලැබී තිබෙනවා. ඒවා අපි සවි කර තිබෙනවා, පිටත් වීමේ පර්යන්තයේ. දෙසැම්බර් මාසයේ 01වැනි දා අපි ඒවාත් විවෘත කරනවා. ඒ හරහාත් ගුවන් තොටුපොළේ කාර්යක්ෂමතාව ඉහළ නංවන්න පුළුවන්කම ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

මේ වෙලාවේ මම මත්තල ගුවන් තොටුපොළ ගැනත් යමක් සඳහන් කරන්න ඕනෑ. අපි දන්නවා, මත්තල ගුවන් තොටුපොළ සාමාන්‍යයෙන් වසරකට රුපියල් බිලියන 2-3 අතර ප්‍රමාණයක් පාඩු ලබන බව. මේකේ සැලසුම් කළ ධාරිතාව තිබුණේ මගීන්

මිලියනයක වාගේ ප්‍රමාණයක්. නමුත්, දැනට අවුරුද්දකට ක්‍රියාත්මක වන්නේ ලක්ෂයකට වඩා අඩුවෙන්. ඒ කියන්නේ, එහි ධාරිතාවෙන් සියයට 10කට වඩා අඩුවෙන් තමයි දැනට මෙහි කටයුතු ක්‍රියාත්මක වන්නේ. ඒ වාගේම මෙය ආරම්භ කළ කාලය වන 2013 අවුරුද්දේ ඉඳලා දිගටම පාඩු ලබන ගුවන් තොටුපොළක් හැටියට තමයි ක්‍රියාත්මක වුණේ. 2024දී මේ ආයතනයේ පාඩුව රුපියල් බිලියන 3.409ක්. ඒ වාගේම 2025 ඔක්තෝබර් මාසය වන විට රුපියල් බිලියන 3.927ක් වශයෙන් මේ ආයතනය පාඩු ලබා තිබෙනවා. මෙහිදී සම්පූර්ණ වශයෙන් ගත්තාම 2013 ආරම්භක කාලයේ ඉඳලා මේ දක්වා වූ පාඩුව රුපියල් බිලියන 66කට වැඩියි. ඒ නිසා අපි දන්නවා, තවදුරටත් මේ පාඩුව දරාගෙන අපට ඉස්සරහට යන්න බැරි බව. විශේෂයෙන් අපේ ගුවන් තොටුපොළ ගැන බැලුවොත්, කටුනායක ගුවන් තොටුපොළ තුළින් අපි ලාභ ලබනවා, යාපනයත් ලාභ ලබනවා. නමුත්, අනෙක් ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් අපට පාඩුයි.

විශේෂයෙන්ම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් මොකක්ද කරන්න ඕනෑ කියලා අපි කල්පනා කර බලන්න ඕනෑ. 2023 අවුරුද්දේ ඉඳලා එහි කළමනාකාරිත්වය සඳහා අභිලාෂ කැඳවීම් ගණනාවක යෝජනා ඇවිල්ලා තිබුණා. නමුත්, ඒ එකක්වත් තවමත් සාර්ථක අදියරකට ගෙන එන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. අපි විශ්වාස කරනවා, එය හුදෙක් ගුවන් තොටුපොළක් විධියට ක්‍රියාත්මක කරන අතරම ඒකේ aviation school එකක්, ඒ වාගේම ගුවන්යානා අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් ආදී වශයෙන් විවිධ අභිලාෂ යෝජනා කැඳවන්න. අපි ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන්න ඕනෑ. මොකද, මේ බර තවදුරටත් රටේ පුරවැසියාගේ බදු මුදල්වලින් විතරක් දරමින් මේ ආයතනය ඉදිරියට ගෙන යන්න පුළුවන්කමක් නැහැ.

ඒ වාගේම අපි දන්නවා, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා අභ්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය කරන්න ඕනෑ බව. ඒ සඳහා හඟුරන්කෙත අභ්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සඳහා දැනටමත් අය වැයෙන් මුදලක් වෙන් වෙලා තිබෙනවා. අපි කල්පනා කරලා බලන්න ඕනෑ, කටුනායක ගුවන් තොටුපොළ තුළත් කිසියම් විධියකින් අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා වෙනම පර්යන්තයක් ඇති කරන්න ඕනෑ ද කියලා. ඒ සඳහා තිබෙන ශක්‍යතාව පිළිබඳ අධ්‍යයනයක් ලබන අවුරුද්ද තුළ කරන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගුවන් තොටුපොළ ගැන කථා කරනකොට පර්යන්තවල පහසුකම් වාගේම අපට වැදගත් වනවා, ඒකේ කාර්යක්ෂමතාව. ඒ කාර්යක්ෂමතාව ඇති කිරීම සඳහා ඇත්තටම airport communication system එකක් පිළිබඳවත් අපි කථා කරන්න ඕනෑ.

මම තවත් කෙටි කාලයක් ගන්නම්, ශ්‍රීලන්කන් ගුවන් සමාගම සම්බන්ධයෙනුත් කථා කරන්න. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ පාඩුව පිළිබඳව බොහෝ සාකච්ඡා ඇති වෙලා තිබෙනවා. පසුගිය අවුරුදු කිහිපය පුරාවටම මේ ආයතනය පාඩු පිට කරගෙන යන්නේ. SriLankan Catering සහ ground handlingවලින් ලාභ ලැබුවත්, විශේෂයෙන් ගුවන් සේවයත්, SriLankan Cargo එකත් හැම දාමත් පාඩුයි. 2024දී විතරක් පාඩුව රුපියල් බිලියන 34ක්. ඒක 2025දී රුපියල් බිලියන 33ක් වෙලා තිබෙනවා. ඒ වාගේම මේකේ මුළු හිඟ ණය ප්‍රමාණය රුපියල් බිලියන 188ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ පාඩුව ප්‍රධාන වශයෙන් ඇති වෙන්න හේතු ගණනාවක් තිබෙනවා. ඒ එක හේතුවක් මම ඉදිරිපත් කරන්නම්.

A320 වර්ගයේ ගුවන් යානා 6ක් 2017දී ගන්න සාකච්ඡා ආරම්භ කරලා 2018දී ඒ කටයුතු අවසන් කළා. මේකෙදි එවකට හිටපු පාලනාධිකාරිය තීරණය කළා, සාමාන්‍ය Rolls-Royce engines වෙනුවට CFM LEAP engines ගන්න. නමුත්, මේ CFM LEAP engines කියන්නේ ඒ වනකොට පර්යේෂණ මට්ටමේ මූලික අදියරේ තිබිලා market එකට ආපු එකක්. ඒකේ සැලසුම්වල failure එකක් තිබුණා. ඒ සැලසුම්වල failure එක නිසා engine failure එකක් ඇති වුණා. මුළු ලෝකයේම ගුවන් සේවා ආයතන ගණනාවකටම මේ ප්‍රශ්නය ඇති වෙලා ඒ engines fail වුණා. සමහර ගුවන් සේවාවන් වහලා දාන්න පවා මේ engine failure එක බලපෑවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මම මේ තත්ත්වය පැහැදිලි කරන්නම්. 2025 ඔක්තෝබර් 31දින වන විට මේ ගුවන් යානා හය මාස 131ක්ම තිබුණේ බිම, පියාසර කළේ නැහැ. මෙයින් එක ගුවන් යානයක් මේ මොහොතේත් වැඩ කරන්නේ නැහැ; ගුවන් ගමන්වල යෙදෙන්නේ නැහැ. මේ කාලය තුළ කිසිම ආදායමක් නැතිව තිබුණු යානාවලට ඩොලර් මිලියන 60ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම පාඩු ලබන්න තවත් වැදගත්ම කාරණාව වූයේ මේකයි. මේ ගුවන් යානා lease කරලා ගන්නකොට ඒ ගුවන් යානා අලුත්වැඩියා කරන්න ඕනෑ කොහොමද කියන එක සම්බන්ධයෙන් කිසිම maintenance agreement එකක් නැතිව තමයි මේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමට මේ ගුවන් යානා අරගෙන තිබෙන්නේ. ඒ නිසා මේ මොහොත වනකොට ඩොලර් මිලියන 70ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ පුරෝකථනය අනුව ඉදිරි අවුරුදු කීපය තුළ තවත් ඩොලර් මිලියන 172ක බර මුළු ජාතියටම දරන්න වෙනවා. එමෙන්ම 2025 අවුරුද්ද විතරක් ගත්තොත්, සම්පූර්ණ අලාභය ඩොලර් මිලියන 29ක්. ඉන් ඩොලර් මිලියන 23ක් ඇවිල්ලා තිබෙන්නේ මෙන්න මේ maintenance cost එක නිසායි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මට තව තත්පර කීපයක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම 2013, 2014 කාලයේ සිදු වුණු සුප්‍රකට එයාර්බස් ගනුදෙනුව, දූෂිත ගනුදෙනුවක්. සාමාන්‍යයෙන් ලෝකයේ ගුවන් යානා ක්ෂේත්‍රය තුළ මේ වාගේ අවස්ථාවකදී සිදු වෙන්නේ ගනුදෙනුව cancel කරනවාට වඩා ඒ අයත් එක්ක එකඟතාවට එන එකයි. නමුත්, මෙතැනදී එකඟතාවකට එනවාට වඩා ගනුදෙනුව cancel කරපු නිසා penalty එක හැටියට ඩොලර් මිලියන 115ක් ගෙවන්න සිද්ධ වුණා. ඒ වාගේම Airbus A330 වර්ගයේ පරණ ගුවන් යානා 2ක් මාර්කට් එකේ තිබෙන rate එකට වඩා ඉහළ මිලකට අපට ගන්න සිද්ධ වුණා. ඒ අවස්ථාවේදීත් ඩොලර් මිලියන 50ක් පාඩු වුණා. මේ ගනුදෙනුව cancel කිරීම නිසා ඩොලර් මිලියන 400කට ආසන්න ප්‍රමාණයක් SriLankan Airlines එකට දරන්න සිද්ධ වෙලා තිබෙනවා.

[අනුර කරුණාතිලක මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි දන්නවා, ජාතික ගුවන් සේවයත්, වරායත් කියන්නේ ඉතා වැදගත් ඒවා බව. SriLankan Airlines එක පාඩු ලබන හින්දා ගුවන් යානයක යන්න තියා, කවදාවත් ගුවන් යානයක් දැකපු නැති අහිංසක පුරවැසියන් පවා මේකේ බර දරාගෙන ඉන්නවා. හැබැයි, හැමදාමත් අපට මේ තත්ත්වය ඉස්සරහට ගෙනියන්න බැහැ. අපි වගකීමක් තිබෙන රජයක් හැටියට මේ තත්ත්වය තේරුම් ගෙන අපේ වරාය වාගේම ගුවන් තොටුපළ සංවර්ධනය කිරීමටත් කටයුතු කරන්න ඕනෑ.

අවසාන වශයෙන්, මේ අය වැය යෝජනා ඉදිරිපත් කිරීමේදී අපට සහයෝගය දුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා, ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්තුමා, සියලු ආයතන ප්‍රධානීන්, පෞද්ගලික කාර්ය මණ්ඩලය, අපේ නියෝජ්‍ය ඇමතිතුමා, විශේෂයෙන් මට කලින් මේ අමාත්‍යාංශය භාරව සිටි බිමල් රත්නායක ඇමතිතුමා ඇතුළු සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.22]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ අවස්ථාවේදී මම ප්‍රථමයෙන්ම කියන්න ඕනෑ, එකම දිනයේ වැදගත් අමාත්‍යාංශ දෙකක් පිළිබඳව විවාද කරන නිසා අපට ඒ සම්බන්ධයෙන් කථා කිරීමේ හැකියාව අඩු වන බව. නමුත්, අපිට ලැබී තිබෙන සීමිත කාල වේලාව තුළ අපි ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න අවශ්‍යයි. මේ අවස්ථාවේදී බිමල් රත්නායක ඇමතිතුමා විෂය භාරව සිටින අමාත්‍යාංශය මඟින් දුම්රිය දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම අපි අගය කරනවා. මොකද, ඒක කළ යුතු දෙයක්මයි. දුම්රිය දෙපාර්තමේන්තුව modernize කරනකොට රැඩිකල් විය යුතුයි. රැඩිකල් වුණේ නැත්නම් මොකද වෙන්නේ? ලාල් කාන්ත වාගේ ඒක රැඩිකල් විධියට කරන්න ඕනෑ. කරන්න බැරි නම් යන්න කියන්න ඕනෑ. ඒ වාගේ අවස්ථා ඇති කරන්න අවශ්‍ය බව මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම රජයේ සේවකයින්ට wake-up calls දෙන එක යම් විධියකට අපි අගය කරන්න ඕනෑ. ඒ වාගේම කොන්දේසි ඇතුව ඒක කියන්න පුළුවන් වෙන්නත් ඕනෑ. හැබැයි, මේ සම්බන්ධයෙන් කියලා වැඩක් නැහැ. අපි overtime payments විධියට තවමත් මිලියන 5ක් ගෙවනවා. පඩි නඩි විධියට ලොකු මුදලක් ගෙවනකොට ඒ වාගේම සියයට සියයක් overtime payments කරනවා නම්, එතැනින්ම ප්‍රශ්නය පටන් ගන්නවා.

මම කැමැතියි, කොළඹ දිස්ත්‍රික්කයේ Kelani Valley line එක electrify කරන එකට. මම හිතන විධියට, ඒක කරන්නම අවශ්‍ය දෙයක්. එය තුළින් මීට වඩා ලාභදායි තත්ත්වයක් ඇති කරන්න අවශ්‍යයි. නමුත්, මම හිතනවා, මේක මුලින්ම කළ යුතු දෙයක් කියලා. මට ලැබී තිබෙන්නේ සීමිත වේලාවක් නිසාත්, අමාත්‍යාංශ දෙකක් ගැන කථා කරන්න තිබෙන නිසාත් මම පුළුවන් තරම් ඉක්මනින් ඒ ගැන කියන්නම්.

අනෙක් කාරණය තමයි, පෞද්ගලික අංශයේ track sharing and engine sharing. රජයේ තිබෙන ප්‍රාග්ධන හිඟය අනුව කවදාවත් මේ දුම්රිය අලුත්වැඩියා කරන්න බැහැ. පෞද්ගලික අංශයේ තිබෙන ඉලක්ක තකා මේක කවදාවත් රජයට පවත්වාගෙන යන්නත් බැහැ. මේ අවස්ථාවේදී track sharing and engine sharing කරන්න පුළුවන් නම් ලොකු වෙනසක් එතැන ඇති කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. මේක භය නැතුව ගන්න පුළුවන් තීන්දුවක්. නැත්නම් අවුරුදු 76ක් නොවෙයි, තව අවුරුදු 2ක් ගිහිල්ලා ආපසු අවුරුදු 78නුත් ඔබතුමන්ලා කියන්නේත් මේකම වුණා කියන එකයි. ඒ නිසා භය නැතුව එවැනි තීන්දු ගත යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

Expressway එකේ කඩවත-මීරිගම කොටසේ වැඩකටයුතු නැවත ආරම්භ කිරීම හොඳයි. නමුත්, එදා පඩුකරඳ ගහක් තිබෙනවා, ඒ ගහ කපන්න දෙන්න බැහැ කියලා ඒක බදාගෙන හිටපු දේවානි නිසා, රුපියල් බිලියන 158කින් අවසන් කරන්න තිබුණු මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අද වනකොට රුපියල් බිලියන 375ක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් බිලියන 217ක් වැඩිපුර දැන් වැය කරන්න සිදු වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේක මොන විධියකින් කිව්වත් cost-to-delivery. - *[Interruption.]* කමක් නැහැ, ඒ ගැන මම දන්න විධියට කියනවා. 2028 අවුරුද්ද වනකොට එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනවාය කියලා ඔබතුමන්ලා කිව්වාට ඒ ගැන බලන්න. *[බාධා කිරීමක්]* කමක් නැහැ. හැබැයි, ඒක realistic cost එක. අන්තිමට සිදු වෙන්නේ ඒකයි. Rs. 375 billion ගැන මම එදා කිව්වා වාගේ Yuan එක hedge කරන එක විතරයි අවශ්‍ය වෙන්නේ. නැත්නම් port එකේ Yen loan එකේ තිබුණු ප්‍රශ්නය වාගේ එකක් තමයි මෙතැනත් ඇති වෙන්නේ. මම එහෙම කියන්නේ Yuan එක ටිකක් ශක්තිමත්ව ඉදිරියට යන බවක් පෙනෙන නිසායි.

ඊළඟට, කරන්න ඉතුරු වෙලා තිබෙන දේ තමයි, Ruwanpura Expressway එක ඉදිකිරීම. මම හිතනවා, ඒක රජයට කරන්න බැරි වෙයි කියලා. ඒකත් design-build-operate-transfer concept එක අනුව කරන්න. Deficit financing දෙන්න ඕනෑ. නැත්නම් වෙන්නේ කවදාවත් ඔය ප්‍රශ්නය ඉවර කරන්න බැරි වෙන එකයි.

ඒ වාගේම තමයි, Kelani Bridge එක. කොළඹ දිස්ත්‍රික්කයේ කැලණියෙන් පටන් ගන්න මාර්ගය අතුරුගිරියට යනතුරු ගෙනියන්න යෝජනා වෙලා තිබුණා. ඒ මාර්ගය අතුරුගිරිය වෙනුවට කොස්වත්තට ගෙනියන්න දැන් plan කරගෙන යනවා. කරුණාකරලා ඒක අතුරුගිරියට හෝ පන්නිපිටියට connect කරන්න පුළුවන් නම් වැදගත් වනවා. ඒකත් private sector එකේ සහභාගීත්වයෙන් කරගෙන යන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Judgment එකක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Judgment එකේ තිබෙනවා නම් ටෙන්ඩර් එක අලුත් කරන්න. ඒවා පොඩ්ඩක් වෙනස් කරලා පාරවල් මතින් elevated expressway එක ගෙන යන්න පුළුවන් නම් ප්‍රශ්නයක් නැහැ. දැන් තායිලන්තයේ කරලා තිබෙන්නේ ඕකයි. Wetlands කියලා ඒවා නොකරනවාට වඩා, මේ රටේ ජනතාව ජීවත් කරන එක ඉස්සෙල්ලාම කරන්න අවශ්‍යයි. මේකේදී environmental overemphasis එකක් කරන්න යන එක නොවෙයි මෙතැන තිබෙන වැඩේ. සීගිරිය වාගේ එකක් දැන් කවදාවත් අපට ලංකාවේ හදන්න බැරි වෙනවා. ඒ නිසා අපි පරිසරය ගැන

හිතන්න ඕනෑ. එහෙම හිතන ගමන් ඊට වැඩිය අපේ ජනතාව ගැන හිතන්න අවශ්‍යයි. අපේ ජනතාව ගැන හිතලා තමයි පරිසරය ගැන හිතන්න අවශ්‍ය වෙන්නේ. පිට රට සුද්දෝ ඒගොල්ලන්ගේ රටේ පරිසරය කාලා, ඊට පස්සේ ලංකාව වාගේ දියුණු වෙන රටකට ඇවිල්ලා අහනවා, කොහොමද අපි පරිසරය රකින්න අවශ්‍ය වෙන්නේ කියලා. මම හිතන විධියට, ඊට වඩා ඕනෑකමින් මේ කටයුත්ත කරන්න අවශ්‍යයි.

UDA එක තිබෙන එක ලොකු දෙයක්. කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු කොළඹින් හදන්න පටන් ගත්ත ගෙවල් ටික අපි ජනතාවට පරිත්‍යාග කරනකොට, තවම ඒ ජනතාවට ඔප්පු පරිත්‍යාග කරලා නැති ගෙවල් 23,000ක් කොළඹ දිස්ත්‍රික්කයේම තිබෙනවා. කරුණාකරලා ඒ කටයුතු නිර්දේශපාලනීකරණය කරන්න. එදා අපි කළේ ජනතාවට අයිතිවාසිකමක් පවරා දෙන එකයි. ඒ ගෙවල් දුන්නාම ඒගොල්ලන් ව්‍යවසායකයින් බවට පරිවර්තනය වෙනවා. අද වනකොට ගෙවල් 3,800ක් තිබෙනවා. තවම ඒවාට පදිංචිකරුවෝ ඉදිරිපත් වෙලා නැහැ. ඒ නිසා කරුණාකරලා ඒ කටයුතු නිසි පරිදි කරන්න. ඒ වාගේම public-private partnership එකක් එක්ක කටයුතු කරන්න තිබෙන හොඳම වෙලාව තමයි, මේ අවස්ථාව. රජයේ තිබෙන ඉඩම් අවශ්‍ය ප්‍රමාණයට වැඩිය තක්සේරු කරන්නේ නැතුව පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධව වැඩ කරන්න. ඒ ඉඩම් විකුණන අවස්ථාවේදී ඒ ඉඩම්වල තිබෙන වටිනාකම බලලා ඒ අනුව වැඩ කටයුතු කරන්න කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

මොකද, මම හිතන විධියට UDA එක තුළින් අපේ රටේ ආර්ථිකය transformation එකකට යොමු කරන්න පුළුවන්. මුලින්ම රජයේ තක්සේරුව අනුව ඒ කටයුතු කරන්න ගියොත් අපට කවදාවත් ඉදිරි සංවර්ධනයකට යොමු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න බැරි වේවි. ඒක නිසා කරුණාකරලා වාණිජකරණය වාගේම එහි ප්‍රායෝගිකභාවය පාවිච්චි කරලා කටයුතු කරන්න. මම හිතන විධියට, අපි මේ වනකොට ගෙවල් 53,000ක් හදලා තිබෙනවා. එහි තක්සේරුව මුලින් බැලුවා නම් කවදාවත් එතැන ගෙවල් හදන්නේ නැහැ. නමුත්, රජයක් එතැන තිබෙන cost-benefit analysis එකක් ගන්න අවශ්‍යයි. හැම වෙලාවේදීම රුපියල් ශත බලන්නේ නැතුව cost-benefit analysis එක අනුව ගෙවල් මෙච්චර ප්‍රමාණයක් හදන්න පුළුවන් නම් මම හිතන විධියට ඒක තමයි UDA එකෙන් කරන්න පුළුවන් වැදගත්ම ආයෝජනය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, Port and Civil Aviation කියන්නේ තවත් වැදගත් අමාත්‍යාංශයක්. Civil Aviation Authority එකට SriLankan Airlines එක බිලියන 26ක් ගෙවන්න තිබෙනවා. බැරි වෙලාවත් පෞද්ගලික අංශයේ කෙනෙක් රුපියල් 25,000ක් ගෙව්වේ නැත්නම් රජයේ සල්ලි අවභාවිත කළා කියලා ඒ පුද්ගලයා උසාවියට ගෙන්වනවා. නමුත්, SriLankan Airlines එක Civil Aviation Authority එකට බිලියන 26ක් ගෙවන්න තිබෙනවා. AirAsia එක මිලියන 88ක්, Thai AirAsia එක මිලියන 221ක්, FitsAir එක මිලියන 2,100ක් ගෙවන්න තිබෙනවා. ඇයි මේවා එකතු කරන්නේ නැත්තේ? සුද්දන්ගෙන් බිලියන 28ක් - මිලියන 28,000ක් - පෞද්ගලික අංශයෙන් එකතු කරලා තිබෙනවා. නමුත්, ඒ මුදල Civil Aviation Authority එකට ලබා දීලා නැහැ.

අපි අද කටුනායක ගුවන් තොටුපොළ ගැන කථා කරනවා. ඔබතුමා කිව්වා, කටුනායක ගුවන් තොටුපොළේ check-in counters ගණන වැඩි කරනවාය කියලා. ඇයි ඇමතිතුමනි, එහෙම කරන්නේ? ඔබතුමාගේ සංකල්පය තමයි, ඇමතිවරුන්ට ගෙවල් දෙන්නේ නැහැ කියන එක. අපේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අපේ කථානායකතුමාගේ නිල නිවස වෙන දෙයකට දෙනවා. ඔබතුමන්ලාට VIP passage එක ගන්න පුළුවන් නේ. ඒක කවුරුවත් පාවිච්චි කරන්නේ නැහැ නේ.

මොකද, යන්නේ normal terminal එකේ නේ. අඩුම ගණනේ එතැන counters 15ක්, 20ක් විතර ගහන්න පුළුවන්. මෙතැන තිබෙන ලොකුම බාධාව තමයි, slot arrangement එක. Slots 30ක් මදිවෙලා තිබෙනවා. ඉතින්, counters 14කින් ඒක හදන්න පුළුවන් කියලා කිව්වත්, ඊට වැඩිය හොඳයි දකුණු පැත්තේ තිබෙන VVIP terminal එක මේ සඳහා පාවිච්චි කරන එක. මොකද, නිදසුනක් වශයෙන් අරන් තිබෙන්නේ කථානායකතුමාගේ නිවස. වෙනත් තැන්වලට අමාත්‍යාංශය 5කට අයත් ගෙවල් දීලා තිබෙනවා. ඉතින්, ඒ VVIP terminal එක වෙනත් දේකට පාවිච්චි කරන්නේ නැත්නම්, මේ සඳහාවත් පාවිච්චි කරන්න.

ඒ වාගේම මේ සංකල්පය ගැන අපි එදාත් කිව්වා. මේ පාර්ලිමේන්තුවට උඩින් පියාසර කරන්න බැරි නිසා ප්‍රශ්නයක් තිබෙනවා කියලා කිව්වා. මෙහාට බෝම්බ ගහන්න එන කෙනෙක් ඕවා බලාගෙන එන්නේ නැහැ. ඒ සඳහා අවස්ථාව ගන්නවා, අරගෙන බෝම්බ දාලා යනවා. ඊට වැඩිය මේ කටයුත්තේ තිබෙන වාණිජකරණයේ වටිනාකම ලබා ගන්න. එදා, සැප්තැම්බර් 11වැනි දා වොෂින්ටන් නුවරට ගිහිල්ලා බෝම්බ ගැහුවේ. එදා කියලා තිබුණාද, නිව්යෝර්ක්වල LaGuardia Airport එකට එන්න බැහැ කියලා? නැහැ. ත්‍රස්තවාදියෙක් හිතන ආකාරයට අපි හිතන්න ගියොත්, මේ රට ත්‍රස්තවාදී විධියට තමයි අරගෙන යන්න වෙන්නේ. අපි ඊට වැඩිය වාණිජමය පැත්තෙන් බලන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව තිබෙනවා, ඒකට රැකවරණය දෙන්නත් පුළුවන් කියලා හිතලා ඒ සමගම රත්මලාන ගුවන් තොටුපළ develop කරන්න ඕනෑ. ඒකේ තිබෙන විධියට, Dash 8, ATR 72, Bombardier, Learjets වාගේ ඒවායින් business sector එක මෙහාට ගෙන්වා ගන්න අපට පුළුවන් වෙයි. රත්මලාන ගුවන් තොටුපොළට වර්ග අඩි 5,800ක් තිබෙනවා. අපට පුළුවන් නම්, එක පැත්තකින් තිබෙන කුණු කන්දේ ඉඩ ප්‍රමාණය මේකට සම්බන්ධ කරන්න, අපට Airbus 320 එකක් හෝ Airbus 737 එකක් land කරන්න පුළුවන්. මම ඒ කුණු කන්ද ගැන කිව්වාට පස්සේ ඒ සම්බන්ධව කථා කරලා තිබුණා. කරුණාකරලා බලන්න, ඒ කුණු කන්ද තිබෙන ඉඩ ප්‍රමාණය මේකට ගන්න පුළුවන්. ඒ සඳහා හදපු proposal එක මම ඔබ දෙපළටම එවන්නම්. මොකද, ගරු බිමල් රත්නායක ඇමතිතුමා ඉන්න කාලයේ ඒ සඳහා උනන්දුවක් දක්වනවා. මේ ගුවන් තොටුපොළ හරහා high-end tourism දියුණු කරන්න පුළුවන්. කරුණාකරලා ඒක කරන්න. ඒ සඳහා වැඩිය සල්ලි දමන්න අවශ්‍ය නැහැ. සල්ලි දමන්නේ නැතුව public-private partnership එකකට යන්න. මේවා තමයි කරන්න ඕනෑ. එදා අපට බැන්නත්, අද මම සතුටු වෙනවා, ඔබතුමන්ලා ජාතික ජන බලවේගය ජාතික පක්ෂය පටන් ගත් වාණිජකරණය කරා යන ගමන ගැන. මේක පෞද්ගලිකකරණයක් නොවෙයි, වාණිජකරණය. අපට ප්‍රාග්ධනය නැත්නම් ඒකේ තිබෙන අදහස පාවිච්චි කරලා ඒ වත්කම තුළින් profit එකක් ලැබෙන විධියට කටයුතු කරන්න.

ඒ වාගේම, ඔබේ නියෝජ්‍ය ඇමතිතුමා කියලා තිබුණා, "Sri Lanka could have reached three million tourist arrivals if BIA terminal had been expanded" කියලා. මේක නිකම්, "මෙහේ යුද්ධයක් තිබුණේ නැත්නම් තායිලන්තයට වඩා දැන් මේ රටට සුද්දෝ එනවා" කියලා කියනවා වාගේ එකක්. ඒක නොවෙයි කරන්න තිබෙන්නේ. ප්‍රශ්න තිබෙනවා. පෙළපාළි ගියා, බෝම්බ වැදුණා, ඒ වගේ ප්‍රශ්න තිබුණානේ. ඉතිහාසයට බණින්නේ නැතුව ඉදිරියට අරගෙන යන්න පුළුවන් කොහොමද කියලා බලන්න. මම කලින් කිව්වා වගේ, VVIP terminal එක පාවිච්චි කරන්න. එතැනින් පස්සේ ඉබේම ඉදිරියට යන්න පටන්

[රවී කරුණානායක මහතා]

ගනීවි. සුද්දන්ට දෙන ටෙන්ඩර් එක පුළුවන් තරම් ඉක්මන් කරන්න. L&T සමාගමෙන් පටන් ගත්ත එක දැන් වෙනත් එකකට ගිහිල්ලා තිබෙනවා. ජපානයේ තායිසෙයි සමාගමේත් ප්‍රශ්නයක් තිබෙනවා. ඔක්කෝම එකතුවෙලා ඒ සඳහා එක තීන්දුවක් ගන්න. භය වෙන්න එපා, ඔක්කෝම ඉඳගෙන තීන්දුවක් ගත්තොත් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. තීන්දු නොගැනීමේ ප්‍රශ්නය නිසා තමයි මේ කාල පරිච්ඡේදය ගතවෙලා තිබෙන්නේ. මේ වෙනකොටත් අවුරුද්දක් ගිහිල්ලා තිබෙනවා. දැන් කියන්න බැහැ, මේවා ඉතිහාසයේ තිබුණු ප්‍රශ්න කියලා. ඒ නිසා තමයි මම කියන්නේ, decision-making is very important කියලා. විපක්ෂයේ ඉන්නකොට තිබුණු සුන්දරභාවය දැන් නැහැ කියලා, මේක කොතරම් අමාරුද කියන එක ඔබතුමන්ලා ආණ්ඩුවට ගියාට පස්සේ තේරෙනවා ඇති නේ. ඒ නිසා භය නැතුව තීන්දු ගන්න එක තමයි කරන්න තිබෙන්නේ. කරුණාකරලා ඒක කරන්න.

ඒ වාගේම මම මේ අවස්ථාව තව කාරණයක් කියන්න උපයෝගී කර ගන්නවා. දැනට මේ රටට සංචාරකයින් මිලියන 2.3ක් විතර එනවා. ඒ නිසා දැන් දවසකට aircraft 170ක් එනවා. ඒ හරහා දවසකට 15,000ක පමණ සංචාරකයින් පිරිසක් එනවා. ඒ වාගේම, මම කිව්වා වාගේ VVIP terminal එක හැදුවා නම් additional flights 14ක් ගෙන්වන්න පුළුවන්.

ඒ වාගේම ඉතිරිවෙලා තිබෙන තවත් වැදගත්ම ප්‍රශ්නයක් තමයි, නැව්ගත කිරීම - shipping - සම්බන්ධ ප්‍රශ්නය. අද "Ceylon Tea" වාගේ, "Ceylon Cricket" වාගේ, ලලිත් ඇතුලත්මුදලි 1978දී "Ceylon Ports" ලෝකයට එකතු කරන්න පුළුවන් මාවත සකස් කරන්නේ කොහොමද කියලා සොයා බැලුවා. එදා ගත් ඒ විශිෂ්ට ක්‍රියාව නිසා containerization තුළින් අද ලංකාව තිබෙන්නේ ලෝකයේ 18වැනි ස්ථානයේ. මේ අවස්ථාවේ එය ඉදිරියට අරගෙන යන්න කටයුතු කිරීම අවශ්‍යයි. එය කරනකොට අප විසින් පාවිච්චි කළ යුතු එක දෙයක් තිබෙනවා. Connectivity එකට compete කරන්න පුළුවන් වෙන්නේ කොහොමද කියලා සොයා බැලිය යුතුයි. Connection එක තුළින් තමයි අපට compete කරන්න පුළුවන් වෙන්නේ. ඉන්දියාවට තමයි අපේ වරායේ market එක තිබෙන්නේ. මොකද, අපි මෙහේ යම් ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවා. නමුත්, ඉන්දියාව තමයි නිෂ්පාදනය කරලා අපනයනය කරන්නේ. ඒගොල්ලන්ගේ වරායවල තිබෙන ප්‍රශ්න නිසා තමයි ලංකාවේ වරාය ඉදිරියට අරගෙන යන්න පුළුවන් වෙන්නේ. 2018දී කන්ටේනර් මිලියන 7ක් හුවමාරු කළත්, 2025 වෙනකොට එය මිලියන 8 දක්වා වැඩිවෙලා තිබෙනවා. ඒ කියන්නේ, මිලියනයක් - ලක්ෂ 10ක් - වැඩි කර ගන්න අවුරුදු 7ක් ගියා. මේ ප්‍රදේශයේ නිෂ්පාදනය සියයට 20ක්, 22ක් විතර වැඩිවෙනකොට ලංකාවේ වරායවල් සියයට 30කින් විතර වර්ධනය වෙන්න අවශ්‍යයි. නමුත්, එහෙම වුණේ නැත්තේ -ඒක, එක්සත් ජාතික පක්ෂය පාලන කාලයේ වෙන්න පුළුවන්, මීට පෙර පැවති ආණ්ඩු කාලයේ වෙන්න පුළුවන්. මම ඒ ගැන කියන්නේ නැහැ- ප්‍රශ්න ඇති වුණු නිසා. ප්‍රශ්න තුළින් ඉදිරියට ගමන් කරන්න අවශ්‍යයි. ඉතිහාසයට බැණ බැණ හිටියොත්, අපට මේ නැව්ගත කිරීම් ඉන්දියාවට භාර දෙන්න වෙනවා. අද Visakhapatnam Port එක, deep port එකක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ ඇයි? ඒගොල්ලන් දැන ගත්තා, ලංකාවේ තිබෙන පෙරළිය නිසා ප්‍රශ්නයක් ඇති වෙනවා කියලා. ප්‍රශ්නයක් ඇති වුණාම ඒකට උත්තර දෙන්න බැහැ, එහෙම වුණාම mother vessels මෙහෙට එන්නේ නැතිව ඉන්දියාවට යන්න පටන් ගත්තා. ඒ නිසා මේක වෙනස් කරන්න පටන් ගන්න අවශ්‍යයි. අපි මේ අවස්ථාවේදී industry-driven policy එකක් ඇති කරන්න ඕනෑ. අපට port strategy එකක් ඇති කරන්න ඕනෑ. අද වරායට professionalsලා ගන්න අවශ්‍යයි. අපට professionalism තුළින් තමයි ඉදිරියේදී කටයුතු කරන්න පුළුවන් වෙන්නේ. අපි රටක් හැටියට මේ ගැනත් කථා කරන්න අවශ්‍යයි. අද මෙහෙන් vessels bypass කරගෙන යනවා. ඒක බොහොම භයානක තත්ත්වයක්. නැව් අයිතිකරුවන් දැන ගත්තොත්, ලංකාවේ vessels bypass කරගෙන යනවා කියලා, ඒක අපට ලොකු තර්ජනයක්.

මට මතක විධියට 1972දී, සිංගප්පූරුවේ අගමැති ලී ක්වාන් යූ ලංකාවට පැමිණි අවස්ථාවේදී කිව්වේ, "මම 1950 ගණන්වල ලංකාවට ආවාම බැලුවේ ලංකාවේ වරාය කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ කොහොමද, අපි ඒක පාවිච්චි කරලා සිංගප්පූරුවක් හදන්නේ කොහොමද කියලා" යනුවෙන්. එතුමා 1972දී එනකොට දැක්කේ මොකක්ද? අපේ එදා තිබුණු ගුණාංග පාවිච්චි කරලා සිංගප්පූරුව හැදුවා. හැබැයි, මෙහේ strikes වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා කවදාවත් ආයෙත් ලංකාවේ වරායක් වාගේ වෙන්න දෙන්නේ නැහැ කියලා තමයි සිංගප්පූරුවේ අනාගතය හැදුවේ. මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට කියන්න කැමැතියි, මේ තත්ත්වය ඇතිවෙන්න දෙන්න එපා කියලා. එහෙම bypass කරනවා කියලා කිව්වොත්, ඒගොල්ලෝ හිතයි ලංකාව නැතිව ඉදිරියට යන්න පුළුවන් කියලා. ඒ අය ඉන්දියාවේ ආයෝජනය කරන්න පටන් ගත්තොත් අපට කවදාවත් ලංකාවේ වරායවල, අපේම නිෂ්පාදන තුළින් කටයුතු කරගෙන යන්න බැහැ, ගරු ඇමතිතුමනි. ඒ නිසා මේ අවස්ථාව පාවිච්චි කරන්න.

එදා, port ඒකේ hub-and-spoke concept එක සාර්ථක වුණා. දැන්, ඒකේ logistics centre එක බවට පරිවර්තනය වෙන්න අවශ්‍යයි. මේ logistics centre එක ඇති කිරීමට කටයුතු කරන්න අවශ්‍යයි. ඇයි, අපි මේ අවස්ථාවේදී vessels bypass කරන්න පටන් ගත්තේ? ECT එකේ සංවර්ධනයක් ඇති නොවුණු නිසා. එදා තිබුණා ටෙන්ඩරයක්. ඒ ටෙන්ඩරය හරි නැහැ කියලා cancel කළා. ඒ cancel කිරීම තුළ straddle carriers 30 cancel වුණා. අපි straddle carriers 15කට order එකක් දමලා ටෙන්ඩර් කැඳවලා තිබුණා. ටෙන්ඩර් එකේ 15ක් දැම්මත්, 30ක් තමයි අවශ්‍ය වෙන්නේ. මොකද, ඒකේ ARMG cranes හුවමාරු කරන්න අවශ්‍යයි. ඒවා කරනකොට මේ වාගේ straddle carriers අත්‍යවශ්‍යයි. ඒ තුළ නිෂ්පාදනය කරන්න මාස 18ක් යන නිසා 30ක් අවශ්‍ය වෙන තැනකට 15ක් මදි වෙනවා. ඒකේ සිදුවුණු දේවල් නොවෙයි මම මේ කියන්නේ. ඒක සිදුවුණේ නැත්තේ ඇයි කියන එකට උත්තරයක් තමයි මම අහන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මෙතැන මා මිත්‍ර,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

අද වැඩිපුර කාලය දෙන්න විධියක් නැහැ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අද දෙන්න බැහැ ලු. ඔබතුමාගෙන් විතරයි නේ මට අහන්න පුළුවන්. මිනිත්තු 2ක් නිසා මම පුළුවන් තරම් ඉක්මනින් මේ ටික කියන්නම්. ඒ කාල පරිච්ඡේද පුළුවන් තරම් ඉක්මනට අල්ලා ගන්න වෙයි. නැත්නම් අපට ලොකු ප්‍රශ්නයක් වෙනවා.

Logistics සම්බන්ධයෙන් ගත්තොත්, Logistics Performance Index එක අනුව අපි 73වන ස්ථානයේ ඉන්නේ. Port එකේ අපි 15, 18 ඉන්නකොට මේ Logistics Performance Index එක අපි අනිවාර්යයෙන්ම මීට වඩා හොඳ තැනකට ගෙනයන්න අවශ්‍යයි. අපේ transshipment hub එක වාගේම අපේ logistics centre එකත් ඉදිරියට ගෙනයෑම අවශ්‍යයි. මේකේ execution strategy එක තීන්දු ගන්නවා, නමුත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ ප්‍රශ්නය ලොකුවට බලපානවා. Sri Lanka Ports Authority එකට port strategy එකක් අවශ්‍යයි. ඒක කොළඹ වරායට විතරක් නොවෙයි, හම්බන්තොට වරායටත්, ත්‍රිකුණාමල වරායටත් අවශ්‍යයි. මේවා ඔක්කෝම එකට develop කරන්න port strategy එකක් අවශ්‍යයි.

ඊළඟට, regional carriers. අපේ මේ රට දූපතක් වශයෙන් තිබුණාට, Ceylon Shipping Corporation එක නැව් නැති කොම්පැනියක් බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ. මේක regional carrier එකක් බවට පරිවර්තනය කර ගන්න ඕනෑ. ඒක තිබෙන්නේ, යාපනයේ ඉඳන් කොළඹට. Internationally ගෙනියන්න පුළුවන් විධියට regional carrier එකක් බවට පත් කරන්න. ඔබතුමන්ලා capital expenditure දමන්න ඕනෑ නැහැ. වෙනත් තැන්වල තිබෙන නැව් මෙහාට ගෙනැල්ලා, බද්ධ කරලා කටයුතු කරගෙන යන්න. ඔබතුමන්ලා ගල් අඟුරු -coal- සම්බන්ධව ඒ වාගේ වැඩකටයුතු කරනවා නම්, මේ සම්බන්ධව ඉදිරියට කටයුතු කරගෙන යන්න බැරි ඇයි? හම්බන්තොට වරායට port containerization අවශ්‍යයි. නවීන යන්ත්‍ර සූත්‍ර නැතිව අපි කොහොමද එතැන කටයුතු කරන්නේ? ඒක දැන් පෞද්ගලික අංශයට දීලා තිබෙනවා. ඒගොල්ලන්ට කියන්න ඕනෑ, "ඔබතුමන්ලා කරන්නේ නැත්නම් අපට අරගෙන කරන්න වෙනවා" කියලා. *[බාධා කිරීමක්]* හැබැයි, තවම ඒ සම්බන්ධයෙන් උත්තරයක් දීලා නැහැ. ඒගොල්ලන් කියලා තිබෙන්නේ ඒගොල්ලන්ට economically survive වෙන්න production මදි කියලායි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තවත් තත්පර කීපයයි ගන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මම කියන්නේ මේකයි. මේ අවස්ථාවේ අපට තිබෙන ලොකුම ගැටලුව අපේ handling සම්බන්ධවයි; කොච්චර ඉක්මනට නැවක් එවනවාද කියන එකයි. South Africaවල 2.8යි; ඕස්ට්‍රේලියාවේ 1.8යි; UAEවල 1.1යි. ඉන්දියාව 0.9 තරම් ඉක්මනට එවන තත්ත්වයක් තමයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* බොහොම භයානක දෙයක්. ඉන්දියාව අපේ මිත්‍රශීලී රටක් වාගේම අපේ තරගකරුවෙකුත් වෙනවා. ඒ වාගේම අපේ containers මේ වන කොට පාවිච්චි කරන එක- *[බාධා කිරීමක්]* එම නිසා අපි ඒකාබද්ධව වැඩ කරන්න අවශ්‍යයි කියන එක මතක් කරනවා. පුළුවන් තරම් ඉක්මනට මේ කියපු කටයුතු කරන්න. මට කාලය හරස් වෙලා තිබෙන නිසා කරන්න දෙයක් නැහැ. කථාව නතර කරන්න සිදු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.41]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අපේ අමාත්‍යාංශයට නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන කියන විෂයන් තුන ප්‍රධාන වශයෙන් වෙන් වෙලා තිබුණාට, මේ විෂය පථයට සනීපාරක්ෂක වාගේම නැවත පදිංචි කිරීම් කියන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද කටයුතු කරන්න ලැබී තිබෙනවා.

2026 අය වැය ගත්තාම, ප්‍රාග්ධන වියදම් විධියට සංවර්ධන වැඩ කටයුතු සඳහා දළ වශයෙන් රුපියල් බිලියන 70ක මුදලක් වෙන් වෙලා තිබෙනවා. ආයතන විධියට ගත්තොත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තමයි නිවාස, ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධානම ආයතනය. ඒ වාගේම ජනතාවට සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කිරීම සඳහා ඇති ප්‍රධාන ආයතන දෙකක් අපේ අමාත්‍යාංශයට අයිති වෙලා තිබෙනවා. එකක් තමයි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - National Water Supply and Drainage Board එක. අනෙක තමයි, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව.

ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව ගත් විට, ප්‍රධාන වශයෙන් CIDA - Construction Industry Development Authority, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව සහ State Engineering Corporation වාගේ ආයතන කීපයක්ම ඉදිකිරීම් කර්මාන්තයට අදාළව රජයේ පංගුව නියෝජනය කරන, රජය සතු ආයතන වශයෙන් පවතිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම සනීපාරක්ෂාව කියන විෂය සම්බන්ධයෙන් සාකච්ඡා කළා. විශේෂයෙන්ම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජලාපවහනය සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඉදිකිරීම් සඳහා වන සැලකිය යුතු මට්ටමක වැඩ කොටසක්, ඒ සම්බන්ධයෙන් වන වගකීමක් ඒ අමාත්‍යාංශයට පැවරී තිබෙනවා.

මේ ක්ෂේත්‍ර ගැන සාකච්ඡා කරද්දී අපේ නියෝජ්‍ය ඇමතිතුමා වන ගරු ටී.බී. සරත් මැතිතුමා නිවාස සම්බන්ධයෙන් වැඩිදුර, සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කරාවි. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා 2025 වසරේදී අප ක්‍රියාත්මක කළේ මොනවාද, 2026ට අප කරන්න බලාපොරොත්තු වෙන්නේ මොනවාද, අපේ සාර්ථකත්වය මොකක්ද සහ අප අනුගමනය කරපු ක්‍රමවේද මොනවාද කියලා සාකච්ඡා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගෙයක් රුපියල් ලක්ෂ 10කින් හදා ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා වෙනවා. මම දැක්කා අද උදේ අපේ ගරු මරික්කාර් මන්ත්‍රීතුමාත් ඇහුවා, රුපියල් ලක්ෂ 10කින් කොහොමද ගෙයක් හදා ගන්නේ කියලා. ඒවා පොතේ විධියට නැතිව ප්‍රායෝගිකව කරන්න කියලා එතුමා කිව්වා. ප්‍රායෝගිකව තමයි අපි ඒ වැඩ කරමින් යන්නේ. අපි ඒ සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු ජනාධිපතිතුමා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා නැවත අය නොකර ගන්නා ආධාරයක් යටතේ අඩු ආදායම්ලාභීන්ට නිවසක් ඉදි කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 10 ගාණේ දෙන්න රුපියල් මිලියන 10,200ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ජාතික නිවාස සංවර්ධන

[(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

අධිකාරියේ නිවාස අරමුදල තිබෙනවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ඒ අරමුදල හරහා සහ ණය ව්‍යාපෘතිය හරහා ලබා දෙන අරමුදල්වලින් දළ වශයෙන් අඩුම තරමින් ගෙවල් 12,000ක්වත්, 13,000ක්වත් ඉදි කිරීමට උපකාරයක් කරන්න පුළුවන් වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ජල සම්පාදන කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කළොත්, අපි දන්නවා, අපේ රටේ සුරක්ෂිත පානීය ජලය - safe drinking water - සම්පාදනය කිරීම සඳහා ඇති ප්‍රධානම ආයතනය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය බව. පානීය ජලය ලබා දීම සම්බන්ධයෙන් ගත් කල, මේ වනකොට ලංකාවේ පවුල් සියයට 52ක විතර ප්‍රමාණයක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආවරණය කර තිබෙනවා. නමුත් අපි දන්නවා, ඒ ආවරණය කළ ප්‍රමාණයේත් ගැටලු තිබෙන බව. සමහර තැන්වල පැය දෙකයි වතුර දෙන්නේ. සමහර තැන්වල වතුරවල මඩ. සමහර තැන්වල දවසක් ඇර දවසක් තමයි වතුර දෙන්නේ. ආරුගම්බේ, පොතුවිල් වාගේ ප්‍රදේශ ගත්තාම, ඒවා සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වන හොඳම පැති. ඒවාට උපරිම ධාරිතාවෙන් ජලය ලබා දෙන්න අපට බැරි වෙලා තිබෙනවා. එවැනි ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ සඳහා වන පිළිතුරු සොයන්න අපි බලාපොරොත්තු වෙනවා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා; ඒ සංවර්ධන වැඩ කටයුතු හරහා. විශේෂයෙන්ම 2026 අය වැයෙන් අවුරුද්දේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැඩ කටයුතු සඳහා රුපියල් බිලියන 45ක් වෙන් කර තිබෙනවා. 2025 අවුරුද්දේ අපි ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘති 4ක් අවසන් කරන්න සැලසුම් කර තිබෙනවා. දැනටමත් එකක් අවසන් කර තිබෙනවා. මේ දිනවල ඒවායේ වැඩ කටයුතු සිදු වෙමින් තිබෙනවා. ඒ කටයුතු අවසන් අදියරේයි තිබෙන්නේ. ඒ වාගේම, 2026දී ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘති 5ක් අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ දවස්වල ඒවායේ වැඩ කටයුතුත් සිදු වෙමින් තිබෙනවා. ඒ සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා. අපි ඒ පිළිබඳව සොයා බලනවා; අධීක්ෂණය කරනවා; ආයතනය මෙහෙයවන කටයුතු ද කරනවා. 2026දී තවත් ප්‍රධාන ව්‍යාපෘති 3ක් ආරම්භ කරන්න අපි සැලසුම් කර තිබෙනවා. 2026 අය වැයෙන් ඒ සඳහා මුදල වෙන් කර තිබෙනවා.

දිස්ත්‍රික්ක විධියට ගත්තොත් යාපනය, කිලිනොච්චිය, කොළඹ, කෑගල්ල, මහනුවර, අනුරාධපුර, කළුතර, කුරුණෑගල, පුත්තලම කියන දිස්ත්‍රික්ක 9 තමයි මේ ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්නේ. ඒ සඳහා තමයි මුදල් වෙන් කරලා තිබෙන්නේ. අනෙකුත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතිවල ධාරිතාව වැඩි කිරීම, ඒ වාගේම ජල සම්බන්ධතා ලබා දීම සහ ජලයේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා වන ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා පමණක් රුපියල් මිලියන 9,000ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2026 Budget එකෙන් වෙන් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ ව්‍යාපෘති සියල්ල ඉතා කාර්යක්ෂමව, ඉතා ගුණාත්මක විධියට අවසන් කරන්න. 2026 වසර ඇතුළත අදාළ වැඩ කොටස අවසන් කරලා ජනතාවට ඒ සේවාව ලබා දීම සඳහා මේ ආයතන මෙහෙයවන්න සහ ඒ වැඩසටහන් සාර්ථක කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ජල සම්පාදනය සම්බන්ධයෙන් කථා කරන විට, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ආවරණය කරන්න බැරි, ආවරණය කරලා නැති ප්‍රදේශවල පානීය ජල සැපයුම් කටයුතු සිදු කරන, එහෙම නැත්නම් නළ ජලය ලබා දෙන්න කටයුතු කරන අනෙක් දෙපාර්තමේන්තුව තමයි අපේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව. එමඟින් තමයි ග්‍රාමීය ජල ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක වෙන්නේ. සමහර තැන්වල පවුල් 150කට, සමහර තැන්වල පවුල් 300කට, සමහර තැන්වල පවුල් 400කට වශයෙන් ග්‍රාමීය මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. මේවා අතිශය වැදගත් වනවා. ඒවා මෙහෙයවන්නේම ජනතාවයි. ග්‍රාමීය සමිති මඟින් තමයි ඒවා මෙහෙයවන්නේ. නමුත් එහි ප්‍රශ්නයක් තිබෙනවා. ඒවායේ ජලයේ ගුණාත්මකභාවය අඩුයි. එහිදී යොදා ගෙන තිබෙන උපකරණ වෙන්න පුළුවන්, යොදා තිබෙන නළ වෙන්න පුළුවන්; ඒවායේ ගුණාත්මකභාවය අඩුයි. ඒවා කල් පවතින්නේ නැහැ. ඒ නිසා ඒවා දියුණු කිරීම අනිවාර්යයෙන් අවශ්‍යයි. ඒවා තවත් සංවර්ධනය කරන්න ඕනෑ.

රටේ ජල සම්පාදනය සිදු කරන්න බැරි වෙලා තිබෙන ගම්මාන ගොඩක් තිබෙනවා, ප්‍රදේශ ගොඩක් තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන ව්‍යාපෘති එනකල් ග්‍රාමීය ජල ව්‍යාපෘති හරහා තමයි අපට කටයුතු කරගෙන යන්න වෙන්නේ. ඒ නිසා තමයි ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සඳහා රුපියල් මිලියන 3,000ක මුදලක් වෙන් කරලා තිබෙන්නේ, 2026 අවුරුද්දේ. මේ අවුරුද්දට -2025 අවුරුද්දට- වෙන් වෙච්ච මුදල්වලින් එවැනි නව ජල ව්‍යාපෘති 203ක් ආරම්භ කරන්න කටයුතු කර තිබෙනවා. එවායෙන් ප්‍රතිලාභ ලබන පවුල් ගණන 72,690ක් වනවා. එහි සමහර ව්‍යාපෘති 2025 අවුරුද්දේම අවසන් කරන්න නියමිතයි; ව්‍යාපෘති 53ක් අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ කියන්නේ, 2025 අවුරුද්ද අවසන් වන විට ග්‍රාමීය ජල ව්‍යාපෘතිවලින් දළ වශයෙන් පවුල් 12,000කට විතර ප්‍රතිලාභ ලැබෙනවා. ඒ වාගේම, පානීය ජලයේ ගුණාත්මකභාවය රැක ගන්න ගම්වල නැනෝ පිරිපහදු පද්ධති සවි කරලා තිබෙනවා. එවැනි ව්‍යාපෘති 10ක වැඩ කටයුතුත් අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා, 2025 අවුරුද්දේ. කෙසේ වෙතත් මේ අවුරුද්දේ ආරම්භ කරපු මේ ව්‍යාපෘති 203න් 2026 අවුරුද්දේ ක්‍රියාත්මක වන, ඉදිරියට යන ව්‍යාපෘතිත් ඇතුළු වැඩ කටයුතු වෙනුවෙන් තමයි රුපියල් මිලියන 3,000ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම දැනට තිබෙන ව්‍යාපෘති තුළින් ජලයේ ගුණාත්මකභාවය වැඩි කරන්න, ඒවාට පෙරන සවි කරන්න සහ වෙනත් සංවර්ධන කටයුතු වෙනුවෙනුත් මුදල් වෙන් වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒවායේ ගුණාත්මකභාවය වැඩි කරන්න.

අපි දන්නවා, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව පිහිටුවීම සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙන බව. දෙපාර්තමේන්තුව කිච්චාට කොටසක් විතරයි තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් බලනකොට එහෙම දෙපාර්තමේන්තුවක් නැහැ. ඒ නිසා මේ සේවාව සැපයීමේ ගැටලුවක් තිබෙනවා. අපි අමාත්‍යාංශය විධියට මේ සඳහා මුල් වෙලා, ඒ වෙනුවෙන් වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ දෙපාර්තමේන්තුව නිශ්චිතව පිහිටුවන්න ඕනෑ. ඒ දෙපාර්තමේන්තුවෙන් මේ කර්තව්‍ය කරන්න පුළුවන් වෙන මට්ටමට එය හදන්න ඕනෑ. විශේෂයෙන්ම මෙහි තාක්ෂණික දායකත්වය - technical capacity එක - අඩුයි. එම නිසා ඒ වෙනුවෙන් National Water Supply and Drainage Board එකේ දායකත්වය ලබා ගන්නවා. දෙපාර්තමේන්තුව හදනවාද කියන මූලික වැඩ කොටසත් අපට කරන්න තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉතා කඩිනමින් වැඩ කටයුතු කරලා, ග්‍රාමීය ජල ව්‍යාපෘති ක්‍රමවේදය තුළින් ග්‍රාමීය ජනතාව වෙත ජල සම්පාදනය ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ ව්‍යාපෘතිය තුළින් ලොකු සේවාවක් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ අමාත්‍යාංශය යටතේ තමයි නැවත පදිංචි කිරීම් සම්බන්ධවත් කටයුතු කරන්නේ. මේ අවුරුද්දේ වෙන් කරපු මුදල්වලින් උතුරු නැගෙනහිර ප්‍රදේශවල නැවත පදිංචි කිරීමේ කටයුතු සහ නැවත පදිංචි කරපු ජනතාවගේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු ඉතා හොඳින් සිද්ධ

වෙනවා. මම පසුගිය දවසක පෞද්ගලිකවම දිස්ත්‍රික් ලේකම්තුමා සහ ප්‍රාදේශීය ලේකම්තුමන්ලා සමඟ යාපනය දිස්ත්‍රික්කයට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් සොයා බැලුවා. එහි ප්‍රගතිය සමාලෝචනය කළා. ඒ වැඩකටයුතු ඉතා සාර්ථකව සිදු වෙනවා. යුද්ධය අවසන් වෙලා මේ වනකොට අවුරුදු 16ක්, 17ක් ගෙවිලා තිබෙනවා. නමුත්, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් ඔවුන්ගේ ජන ජීවිතය ඉහළ නංවන්න අපට තවම බැරි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි විශේෂ අවධානයක් යොමු කරන්න කැමතියි. නැවත පදිංචි කිරීමේ වැඩකටයුතු සඳහා රුපියල් මිලියන 3,850ක් තමයි මෙවර අය වැයෙන් වෙන් වෙලා තිබුණේ. නමුත්, ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා, එය රුපියල් මිලියන 5,000 දක්වා වැඩි කරන බව. එතරම් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා, උතුරු නැඟෙනහිර පළාත්වල මේ වැඩකටයුතු සම්බන්ධයෙන්. භූමිය සම්බන්ධයෙන් තිබෙන අත්දැකීම මොකක්ද, විය යුත්තේ මොකක්ද සහ එහි තිබෙන වටිනාකම මොකක්ද කියන එක සම්බන්ධයෙන් වන්නි දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට අපේ ජෙගදීස්වරන් මැතිතුමාගේ කථාවේදී විස්තර කරයි.

ඉදිකිරීම් කර්මාන්තය - construction sector එක - සඳහා අවශ්‍ය වැඩකටයුතු සම්පාදනය කිරීම තමයි අපේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙන්නේ. CIDA එක තිබෙන්නේ අපේ අමාත්‍යාංශය යටතේ. ඒ වාගේම රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව - Department of Government Factories, State Engineering Corporation එක ඇතුළු ආයතන කිහිපයක් රජයේ පංගුව නියෝජනය කරන රජය සතු ආයතන විධියට තිබෙනවා. අපි දන්නවා ඉදිකිරීම් ක්ෂේත්‍රය කියන්නේ, කෘෂිකර්මය හා වෙනත් සේවාවන් වාගේම වැදගත් ක්ෂේත්‍රයක් බව. එය දළ වශයෙන් සියයට 4.5ක විතර පංගුවක් දළ දේශීය නිෂ්පාදිතයට එකතු කරන ක්ෂේත්‍රයක්. මෙකේ සංකීර්ණත්වය පෙන්වා දුන්නොත්, මිලියනයකටත් අධික ප්‍රමාණයක් විවිධ සේවාවල -රැකියාවල- නියුතු වෙලා ඉන්නවා. ගමේ ඉන්න නුපුහුණු කම්කරුවෙකුගේ - unskilled labourer කෙනෙකුගේ - සිට ඉහළම දක්ෂතා දක්වන පශ්චාත් උපාධි තිබෙන ඉංජිනේරු මහත්වරු දක්වා පුළුල් පරාසයක රැකියාවල නියුතු බොහෝදෙනෙක් මේ ක්ෂේත්‍රයේ ඉන්නවා. ඒ වාගේම ගමක ගෙදරක කරන පොඩි ඉදිකිරීමක් එහෙම නැත්නම් තීන්ත ගාන - paint කරන - පොඩි වැඩක ඉඳලා කොළඹ වාගේ තදාසන්න ප්‍රදේශවල ඉදිකෙරෙන මහල් නිවාස, අතිශය දැවැන්ත ඉදිකිරීම් දක්වා වෙච්ච පුළුල් පරාසයක ඉදිකිරීම් මේ තුළින් සිද්ධ වෙනවා. මේ ක්ෂේත්‍රයේ ව්‍යාපාරිකයින් විධියට තනි පුද්ගලයින් ඉන්නවා; කණ්ඩායම් ඉන්නවා; සමාගම් තිබෙනවා; සමිති තිබෙනවා. විවිධ මට්ටමේ ව්‍යවසායකයින්, ව්‍යාපාරිකයින් මේවායේ කටයුතු කරනවා. අනෙක් ක්ෂේත්‍ර එක්ක සන්සන්දනය කරලා බැලුවාම ඇත්තටම අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වයක් සැපයිය හැකි ක්ෂේත්‍රයක් තමයි, මේ ඉදිකිරීම් කර්මාන්තය. ඒ නිසා එම ඉදිකිරීම් කර්මාන්තය දියුණු කිරීම සඳහා අපි බොහෝ දේවල් කළ යුතුව තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු එක්කෙනෙක් හෝ දෙදෙනෙක් යෝජනා කරනවා අපි දැක්කා, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පිරිවැය වැඩියි, ඒ පිරිවැය අඩු කිරීම සඳහා වැඩ කටයුතු කරන්න ඕනෑ, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා. එවැනි යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධව අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම අපි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා.

ඉදිකිරීම් කර්මාන්තය තුළින් කරන්න ඕනෑ කරුණු කිහිපයක් තිබෙනවා. පළමුවන කාරණය හැටියට රැකියා නියුක්තිය වැඩි කරන්න ඕනෑ. දෙවන කාරණය හැටියට ඉදිකිරීම්වල ප්‍රමිතිය අපි හදන්න ඕනෑ. ඒ වාගේම කල් පැවැත්ම සම්බන්ධයෙන් වාගේම quality එක සම්බන්ධයෙන් අපි හිතන්න ඕනෑ, මේ දේවල් කරන්න ගියාම. අපි දන්නවා, ඉදිකිරීම් කර්මාන්තයේ රජයේ පංගුවක් තිබෙනවා වාගේම පෞද්ගලික අංශයත් ඒ තුළ ඉන්නවාය කියන එක. කොන්ත්‍රාත්කරුවන් ඉන්නවා. සමාගම් තිබෙනවා. ඔවුන්ට අදාළ කටයුතු කිරීම සඳහා අපි පහසුවක් වෙන්න ඕනෑ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමනි, ජාතික නිවාස ප්‍රතිපත්තියක්,-

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

අපි හදපු ප්‍රතිපත්තියක් තිබෙනවා. අපි ඒ ප්‍රතිපත්තිය දැනට නැවත සමාලෝචනය කරන්න, update කරන්න බලාපොරොත්තු වනවා. ඔබතුමා ඒ ප්‍රශ්නය අහපු නිසාම මම මේ කාරණයත් කියන්නම්. නිවාස ක්ෂේත්‍රය ගත්තාම, රජයේ පංගුවක් තිබෙනවා; රජයේ ආයතනයක් තිබෙනවා. ප්‍රධාන වශයෙන් රජය තමයි, නිවාස ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මැදිහත් වෙලා වැඩ කරන්නේ. නමුත් නිවාස ක්ෂේත්‍රයේ වැඩ කරන රාජ්‍ය නොවන ආයතන - NGOs - තිබෙනවා; සංවිධාන තිබෙනවා. ඒ වාගේම donorsලා විධියට තනි පුද්ගලයින් ඉන්නවා. එමෙන්ම UN-Habitat වැනි development partnersලා ඉන්න බවත් අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ඉන්දියානු රජය, චීන රජය අපට විශාල වශයෙන් උදවු කරනවා. අපට මේ සම්බන්ධයෙන් ඔවුන් විශාල වශයෙන් සහයෝගය දක්වනවා. අපි ඔවුන්වත් මේ අවස්ථාවේදී අගය කරන්න ඕනෑ. අපේ නිවාස ප්‍රතිපත්තිය update කරනවා වාගේම අමාත්‍යාංශයක් විධියට අපේ රටේ තිබෙන නිවාස ප්‍රශ්නය විසඳන්න මේ හැම දෙනෙකුගේම දායකත්වය ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අපට ඒ සඳහා සැලැස්මක්, ප්‍රතිපත්තියක්, මාර්ග සැලැස්මක් තිබෙන්න ඕනෑ. ඒ මාර්ග සැලැස්ම පිළිබඳව අපි දැනටමත් යම් යම් රාජ්‍ය නොවන සංවිධාන සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ පංගුව දායක කර ගන්නේ කොහොමද කියලා අපි කථා කරලා තිබෙනවා. අපි දන්නවා, ඉන්දියානු රජයේ ආධාර මත ඉදිවන නිවාස ව්‍යාපෘති බොහොමයක් තිබෙනවාය කියලා. මලෙයහම් ජනතාව සඳහා නිවාස ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. ඒවායේ ගැටලු තිබෙනවා. ඉන්දියානු රජය අපට උදවු කරලා තිබෙනවා. නමුත්, අපි ගැටලු හඳාගෙන තිබෙනවා. අපි ඒ ව්‍යාපෘති හරියට ක්‍රියාත්මක කරලා නැහැ. එම නිසා අපි ඒ ප්‍රයෝජනය හරියටම ගන්නවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ ගැටලු විසඳා ගැනීම සඳහා අපි මැදිහත් වෙමින් ඉන්නවා. අනිවාර්යයෙන්ම ඒ ගැටලු අපි නිරාකරණය කරගන්න ඕනෑ. කොහොමත් නිවාස ප්‍රශ්නය රජයට තනියම විසඳන්න බැහැ කියන එක අපි හැමෝම පිළිගන්න ඕනෑ. හැබැයි, වැඩි පංගුවක් රජයෙන් කරන්න ඕනෑ. ඒ නිසා තමයි ජනාධිපතිතුමා ඇත්තටම රුපියල් මිලියන 2,500ක් විතර 2025දී ඒ වෙනුවෙන් වෙන් කරලා තිබුණේ. එය රුපියල් මිලියන 10,200ක් දක්වා වැඩි කළේ මේ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ නිසායි.

2026 අවුරුද්දේ නැවත පදිංචි කිරීම යටතේ නිවාස 2,500ක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 5,000ක් තමයි වෙන් කරලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය අපි ඉක්මනට නිරාකරණය කර ගන්න ඕනෑ. හැබැයි, අපි 2,000දී "සැමට සෙවණ", 2010දී "සැමට සෙවණ", 2020දී "සැමට සෙවණ", 2025දී "සැමට සෙවණ" කියලා බොරු නම් කියන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒක අපට කරන්න බැහැ. බොරු කියලා මේක දේශපාලනයට පාවිච්චි කරන්න ඕනෑ නැහැ. අපට ඕනෑ මේ නිවාස ප්‍රශ්නය විසඳන්නයි. ඒ සඳහා අවශ්‍ය උපරිම දායකත්වය අපි ලබා දෙන්න කැමතියි.

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

මට තව විනාඩියක් විතර ඉතුරු වෙලා තිබෙන නිසා මම නැවත ඉදිකිරීම් කර්මාන්තය ගැන කථා කරන්න කැමැතියි. පාර්ශ්ව ගණනාවක් මේ ඉදිකිරීම් කර්මාන්තයට දායක වෙලා තිබෙනවා. රජයේ පංගුව අඩුයි. මෙහි පෞද්ගලික අංශය තමයි විශාල වශයෙන් ඉන්නේ. ඉදිකිරීම් ක්ෂේත්‍රයට ඔවුන්ගේ දායකත්වය ගන්නේ කොහොමද, ඉදිකිරීම් ක්ෂේත්‍රය දියුණු කරන්නේ කොහොමද, එහි රැකියාවල නියුතු labourersලා ඇතුළු කට්ටියගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරන්නේ කොහොමද, ඔවුන්ට ඇත්තටම හොඳ පඩියක් ලබා දෙන්නේ කොහොමද, ඔවුන්ගේ රැකියාව සුරක්ෂිත කරන්නේ කොහොමද කියලා ඔවුන් සියලුදෙනා එක්ක සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් වැඩසටහනක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා, ඉදි කිරීම් කර්මාන්තයේ යෙදී සිටින ගොඩක් සමාගම් දැන් කථා කරනවා, බංග්ලාදේශයෙන්, නේපාලයෙන් labourersලා ගෙන්වන්න. ඇයි ඒ? අපේ රටෙන් ඒක සම්පාදනය කරන්න පුළුවන් ඒ සඳහා වෙච්ච වටපිටාවක් නැහැ, ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා වහ වහා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ කියලා අපි හිතනවා. අපි දැනටමත් ජාතික කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය හමු වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් professional bodies ගොඩක් තිබෙනවා. අපි ඒ සියලුදෙනා සම්බන්ධ කර ගන්න බලාපොරොත්තු වෙනවා. මේ ඉදි කිරීම් ක්ෂේත්‍රය ඉහළට ගන්න, ඔවුන්ට යෝජනා දෙන්න කියලා අපි ආරාධනා කරන්න කැමැතියි. ඒක අපේ රටට වටිනවා.

මොන අමාත්‍යාංශයෙන් සංවර්ධන වැඩ කටයුතු සඳහා මුදල් වෙන් කළත්, ඉදි කිරීම් කටයුතු හැම තැනම වාගේ සිදු වෙනවා. ඒවායේ නියමිත ගුණාත්මකභාවය, දිගු කල් පැවැත්ම අපි තහවුරු කළොත්, රටක් විධියට අපට ඒක ඉතිරියක් වෙනවා. අපි ඒ මුදල් වෙන් කරන එකේ වාසිය, ප්‍රයෝජනය වැඩි වෙනවා. කඩුගන්නාවේ සිද්ධියේදී වුණත් එක පැත්තකින් බැලුවොත්, ඉදි කිරීම් ක්ෂේත්‍රයේ අපේ සමහර අයගේ නොසැලකිල්ල තමයි තිබෙන්නේ; අපි දුරදිග බලන්නේ නැතුව අනුගමනය කරපු ක්‍රමවේදවල ප්‍රශ්න. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් ඉදි කිරීම් ක්ෂේත්‍රයේ දැවැන්ත වර්ධනයක්, විධිමත්කරණයක් අපි බලාපොරොත්තු වෙනවා. ඒ අදාළ කටයුතු අපි සම්පාදනය කරගෙන යනවා. අපේ අමාත්‍යාංශයට අදාළව නිවාස ප්‍රතිපත්තිය විතරක් නොවෙයි, ප්‍රතිපත්ති අටක් විතර තිබෙනවා. ඒ ප්‍රතිපත්ති සමාලෝචනය කරලා, update කරන්න අපි කටයුතු කරමින් තිබෙනවා. තව බොහෝ දේ කියන්න තිබෙනවා. අපේ නියෝජ්‍ය ඇමතිවරයා හා මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරයි.

මට වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.00]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට හරියට විනාඩි 11 ආරක්ෂා කරලා දෙන්න, එච්චරයි.

Madam Deputy Chairperson, I am glad that I have been given the opportunity to speak immediately after the Hon. (Dr.) Susil Ranasinghe, Minister of Housing Construction and Water Supply. මොකද, Budget Session එක පටන් ගත්තාට පස්සේ portfolios එහාට මෙහාට වෙනස් වුණා. ඒ නිසා අපිට සමහර වෙලාවට හරියට සොයා ගන්න බැරි වෙනවා. So, I am happy that I am speaking after the Hon. Minister. And, I also know, Hon. Minister, that you have a good Secretary in your Ministry, Engineer Kumudu Lal Bogahawatta. He had performed very well in the Colombo Municipality and now, you have taken him away from the Colombo Municipality and appointed him to your Ministry. I believe, both of you, together, would provide the right solutions to the housing issues at the national level in this country. I wish you the very best!

ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරනකොට මම ඇහුම්කන් දීගෙන හිටියා. ඔබතුමා උතුරු, නැඟෙනහිර ගැන කථා කළා. හොඳයි, ඒක ඔබතුමාගේ වගකීම. ඒ වාගේම දකුණේ අනෙක් ප්‍රදේශ ගැන කථා කළා. ඒකත් හොඳයි. ඒ වාගේම මලෛයහම් ජනතාව ගැන කථා කළා. හැබැයි, මලෛයහම් ජනතාවගේ ඉඩම්, එහෙම නැත්නම් නිවාස ප්‍රශ්නය භාර දීලා තිබෙන්නේ වෙනත් අමාත්‍යාංශයකට. එහෙම නේ තිබෙන්නේ. මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා ඒක වෙනස් කරලා, ජාතික නිවාස ප්‍රතිපත්තියක් හදන්න. ඒ අමාත්‍යාංශය යටතේම උතුරු නැඟෙනහිර වේවා, මලෛයහම් වේවා, දකුණේ වේවා, එහෙම නැත්නම් රටේ invalid citizens ඉන්නවා, ඒගොල්ලන්ටත් නිවාස හදන්න ඕනෑ. හැමදෙනාටම නිවාස හදන කාර්යභාරය එක් අමාත්‍යාංශයක් යටතට ගේන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒක කරන්න ඕනෑ. ඒකට මම ඔබතුමා හරහා, පාර්ලිමේන්තුව හරහා, ගරු ජනාධිපතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ඒක හොඳයි.

මොකද, අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ අපිත් අමාත්‍යාංශ භාරව අමාත්‍යවරුන් වශයෙන් හිටියා. ඒ නිසා අපි දන්නවා. එතකොට යුද්ධය ඉවර වෙලා මුල් අවුරුදු පහ තිබුණේ. එතකොට අපිට අවධානය යොමු කරන්න වෙනත් වුවමනාවන් තිබුණා. යුද්ධය නිසා උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල සුවිශේෂී ප්‍රශ්න තිබුණා. ඒකට අපි අවධානය යොමු කරන්න තිබුණා. ඒ සඳහා වෙනම අමාත්‍යාංශ තිබුණා. ඒ වාගේම කඳුකරයේ, මලෛයහම් ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය ගැන අපි විශාල වශයෙන් සාකච්ඡා කළා. නරේන්ද්‍ර මෝදි අගමැතිතුමා සමඟත් සාකච්ඡා කළා. ඒ සාකච්ඡා කරලා, නිවාස 14,000ක් හදන්න උදවු උපකාර කරනවා කියන පොරොන්දුව ලබා ගත්තා. අද වෙනකොට ඒගොල්ලන් එක් ගෙයක් සඳහා රුපියල් ලක්ෂ 28ක් දෙන්න ලැහැස්තිවෙලා තිබෙනවා. ලක්ෂ 28, 14,000න් වැඩි කරලා බලන්නකෝ. ඒක ලොකු ප්‍රමාණයක්. ලබන අවුරුද්දේ සමහර වෙලාවට මිල ගණන් වැඩි වුණා නම්, ඒකත් වැඩි කරන්න ලැහැස්තියි. ඒගොල්ලෝ නිවාස ගණන තමයි කියලා තිබෙන්නේ, වටිනාකම නොවෙයි. ඒ නිසා වැඩි වෙනවා, ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා ඔබතුමා ඔක්කොම එකතු කරගෙන, මේ සම්බන්ධයෙන් වගකීමෙන් වැඩ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, අනෙක් කාරණය මේකයි. National Housing Policy කියන කොට අපි බලාපොරොත්තු වන්නේ, to make the best or the maximum use of the land available. රටේ තිබෙන ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා නේ; දෙමළෙන්, "කාණි" කියලා කියනවා; සිංහලෙන්, "ඉඩම්" කියලා කියනවා; ඉංග්‍රීසියෙන්, "land" කියලා කියනවා. මේ ඉඩම් ටික අපි use කරන්න ඕනෑ, to the maximum possible level. නැත්නම් බැහැ, හරියන්නේ නැහැ. ඒක policy එකේ ප්‍රධාන cornerstone එක වෙන්න ඕනෑ කියලා මම බලාපොරොත්තු වෙනවා.

අනෙක් එක තමයි, all housing constructions shall be in close proximity to townships, villages or highways. මහ පාර තිබෙනවා. මහ පාර ළඟම වෙන්න ඕනෑ ගෙවල් හදන්න; නැත්නම් බැහැ. මලෙයෙහම් ජනතාව ජාතික ප්‍රවාහයට ඇතුළත් කිරීම ගැන දැන් වැඩියෙන් කථා කරනවා, වේදිකාවලට නැඟලා කථා කරනවා. නමුත් මම ඔබතුමාට කියන්න ඕනෑ, මේකත්. කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ලේ පුවක්පිටියේ තිබෙනවා පෙන්රිත් වත්ත. පෙන්රිත් වත්ත උඩ කරුන්ගාලි කියලා division එකක් තිබෙනවා. ළඟදී එතැන fire accident එකක් වුණා. මම ගියා එතැනට. මගේ වැල්ලවත්ත ගෙදර ඉඳලා පුවක්පිටියට යන්න මට පැයක් ගියා. I travelled in my vehicle, in my Prado. ප්‍රශ්නයක් නැහැ, පැයකටත් අඩුවෙන් ගියා. එතැන ඉඳලා උඩට යන්න මට පැය 2ක් ගියා. Prado එකෙත් පැය 2ක් ගියා. වෙනත් vehicle එකක් නම් පැය 3ක්, 4ක්වත් යයි. ඒකෙන් තේරුම් ගන්න ඕනෑ කාරණය මොකක්ද? ඒ ජනතාව හුදකලා වෙලා ඉන්නේ; ඒගොල්ලන් isolate වෙලා ඉන්නේ; කොන් වෙලා ඉන්නේ; තනි වෙලා ඉන්නේ. ඒ ජනතාව පහළට ගේන්න ඕනෑ. කොහොමද ගේන්නේ?

සාමාන්‍යයෙන් රාජ්‍ය පරිපාලන ව්‍යුහයේ තැපැල් නිලධාරියා - postal services officer - ඉන්නවා, ග්‍රාම නිලධාරිවරයා ඉන්නවා, ප්‍රාදේශීය ලේකම්තුමා ඉන්නවා, දිස්ත්‍රික් ලේකම්වරයා ඉන්නවා. එහෙම නේ, ගරු ඇමතිතුමා. දිස්ත්‍රික් ලේකම්වරයා, ප්‍රාදේශීය ලේකම්වරයා, තැපැල් නිලධාරියා - postal services officer - ග්‍රාම නිලධාරිවරයා කවදාවත් එතැනට යන්නේ නැහැ; යන්න බැහැ. කොහොමද යන්නේ? මගේ වාහනයේ, සුපිරි වාහනයේ යන්නත් පැය 2ක් ගියා නම් කොහොමද ඒ අය යන්නේ? බැහැ නේ, ප්‍රායෝගිකව බැහැ. ඒ නිසා ඒ අයව පහළට ගෙනැල්ලා පාර අයිනේ ඉඩම් දෙන්න ඕනෑ, ගෙවල් හදලා දෙන්න ඕනෑ. ඒක housing policy එකේ ප්‍රධාන කාරණයක් වෙන්න ඕනෑ කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා උත්සාහ කරන්න. මොකද, දැන් ඔබතුමන්ලා housing policy එක හදනකොට, වැඩි දියුණු කරනකොට අපිටත් ආරධනා කරන්න, සාකච්ඡා කරන්න අපිත් එන්නම්. ප්‍රශ්නයක් නැහැ අපි ඔබතුමන්ලාට යෝජනා දෙන්නම්. මොකද, අපි ඔක්කෝම එකතු වුණොත් තමයි රට හදන්න පුළුවන්, නැත්නම් බැහැ. ඒ මිනිසුන්ගේ ගෙවල් හදන එක පමණක් නොවෙයි නේ කරන්න ඕනෑ, කන්ද උඩ තිබෙන සමාජය පහළට ගෙනැල්ලා ජාතික ප්‍රවාහය ඇතුළට දාන්න ඕනෑ. අපි බලාපොරොත්තු වෙනවා, මේ අයව ශ්‍රී ලාංකික රාමුව තුළට ගේන්න. පිට කරන්න නොවෙයි, ඇතුල් කරගන්න ඕනෑ. මගේ බලාපොරොත්තුව එච්චරයි, වෙන බලාපොරොත්තුවක් මට නැහැ. ඒක හොඳට තේරුම් අරගන්න, ගරු ඇමතිතුමා. ඒ නිසා ඒ ප්‍රතිපත්ති හදනකොට අපට කියන්න; අපි සුබ පතනවා. ඒ සාකච්ඡාවලට අපේ යෝජනා ගෙනැවිත් දෙන්නම්, කරන්න ඕනෑ විධිය ගැන. ඒක අවශ්‍ය වෙනවා.

අනෙක් කාරණය, උතුරු, නැඟෙනහිර ජනතාව යුද්ධයෙන් පසුව දැන් තමයි නැඟිටලා එන්නේ. ඒ අයටත් උදවු කරන්න ඕනෑ. ඒ වාගේම දකුණේ දියුණු නොවුණු, අඩු ආදායම්ලාභීන් සිටින දිස්ත්‍රික්ක, ප්‍රදේශ තිබෙනවා. ඒ අයටත් ඉඩම් ලබා දෙන්න ඕනෑ, ඒ වැඩ කටයුතු කරලා දෙන්න ඕනෑ. ඒ ගැන විශාල වගකීමක් ඔබතුමාට තිබෙනවා. ඔබතුමා ඒ කටයුතු ඉෂ්ට කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඔය කටයුතු කරනකොට ඔබතුමාගේ NHDA තුළ, වෙන වෙන segmentsවලට - ඒගොල්ලන්ගේ සුවිශේෂී ප්‍රශ්න තිබෙනවා නේ - අවශ්‍ය වෙන විධියට වෙන වෙනම අධ්‍යක්ෂවරු සහ නිලධාරින් පත් කර ගත්තා නම් ඒ නිලධාරින් හරහා ඒ අයගේ සුවිශේෂී වුවමනා ඔබතුමාට අවබෝධ කර ගන්න පුළුවන්. එක අමාත්‍යාංශයක් යටතට, එක වහලක් යටතට ගේනවා කිව්වාට, ඔක්කෝටම එක විධියට සලකන්න බැහැ නේ, ගරු ඇමතිතුමා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

අනෙක් එක, අපි මධ්‍යම කඳුකරයේ survey එකක් කරලා මේ වෙනකොට දැනගෙන තිබෙනවා, ගෙවල් units ලක්ෂ 2ක් අවශ්‍ය වෙනවා කියලා. එතැන ලක්ෂ 10ක විතර ජනතාවක් ජීවත් වෙනවා. ලක්ෂ එකහමාරක්, දෙකක් විතර තමයි වතුවල වැඩ කරන්නේ. අනෙක් අය වැඩ කරන්නේ නැතිව ජීවත් වෙනවා. ඒක ඒගොල්ලන්ට ලබා දෙන charity එකක් නොවෙයි, sympathy නොවෙයි. We do not want sympathy; ඒ ජනතාවට අනුකම්පාව එපා, සාධාරණත්වයයි ඕනෑ. මොකද අවුරුදු 200ක් ඒ ජනතාව මේ රටට තමන්ගේ ශ්‍රමය - labour - ලබා දීලා තිබෙනවා. ඔබතුමන්ලා හැම වෙලාවේම අවුරුදු 76ක ශාපය ගැන කථා කරනවා. අවුරුදු 76ක ශාපයට වග කියන්න ඕනෑ කවුද කියන එක ගැනත් ලොකු තර්කයක් රටේ යනවා. මම ඒකට ඇතුල් වෙන්න කැමැති නැහැ. නමුත් අපි මේ මලෙයෙහම් ජනතාව ගැන කියන්න ඕනෑ ඒ ශාපය ඒ අයට අවුරුදු 76ක් නොවෙයි අවුරුදු 200ක් තිස්සේ තිබෙනවා. ඒ අවුරුදු 200න් පළමුවෙනි අවුරුදු 125 සුද්දන්ගේ ශාපය, සුද්දන්ගේ පාලනය තිබුණා. අවසාන අවුරුදු 75 කළු සුද්දන්ගේ පාලනය. දැන් ඒ ජනතාව කළු සුද්දන්ගේ පාලනයේ ඉන්නවා, ඒගොල්ලන් සුද්දාගේ පාලනයේ හිටියා. එහෙම ඉඳලා රට හදලා දීලා තිබෙනවා. ඒ අය තේ වතු බලනවා, රබර් වතු බලනවා, කෝපි වතු බලනවා. කොළඹ ඉඳලා කඳුකරයට යන මහ පාර හදලා දුන්නා, රේල් පාර -කෝච්චි පාර- හදලා දුන්නා, වරාය හදලා දුන්නා. ඒ ඔක්කෝම ඉතිහාසයේ කරපුවා. ඒ අය රටට ලොකු දායකත්වයක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ වැඩි වැඩියෙන් ඒ අයව ශ්‍රී ලාංකික රාමුව තුළට අරගන්න කියලායි. එච්චරයි ඕනෑ. මමත් ශ්‍රී ලාංකිකයෙක් හැටියට නේ කථා කරන්නේ. ඒක තමයි අපට අවශ්‍ය වෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
හරියට ගණන් ගත්තාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
හරියටම ගත්තා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
හොඳයි, මම ඉක්මනින් කථාව ඉවර කරන්නම්.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ මේ නිවාස නිර්මාණය කිරීමේ වැඩසටහන සම්බන්ධව බලන්න ඕනෑ. ඒක ඔබතුමා හරියට කරයි කියා මම බලාපොරොත්තු වෙනවා.

ප්‍රජා යටිතල පහසුකම් සම්බන්ධව කටයුතු කරන්නේ ගරු සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා. එතුමා මගේ මිත්‍රයා. එතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දවසට ඒ ගැන මම කථා කරන්නම්. ඒ සම්බන්ධව කථා කිරීම ප්‍රශ්නයක් නැහැ. එතැන යටිතල පහසුකම් තියාගෙන, ඒ අමාත්‍යාංශයට පුළුවන්, ඔබතුමන්ලාට ඕනෑ වෙන

[ගරු මනෝ ගනේසන් මහතා]

ඉඩම් ටික ලබා දෙන්න. ඉඩම් ලබා දෙන්න පුළුවන් නේ. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ඒ ඒ කාර්යභාරය බෙදා ගන්න ඕනෑ. එහෙම නැතුව ඒ අමාත්‍යාංශයෙන්ම ගෙවල් ටිකත් හදන්න ගියා නම්, හදන්න බැහැ. ගරු ඇමතිතුමා, ඔබතුමා කථා කරනකොට එක තැනකදී කිව්වා, ඒ කාලයේ හරි කොයි කාලයක හරි ඔබතුමා බොරුවක් කියන්න ලැහැස්ති නැහැ කියලා. හරි, ප්‍රශ්නයක් නැහැ. ගරු ඇමතිතුමා, මම මේක කියලාම ඉවර කරන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අවුරුද්දේ මාර්තු මාසයේ 14වන දා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අවස්ථාවේදී සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා සද්භාවයෙන් තමයි මේ කථාව කිව්වේ. මම එතුමාගෙන් ඇහුවා, මලෙයහම් ප්‍රදේශවල ගෙවල් කීයක් හදන්න යනවාද කියලා. පසුගිය රනිල් වික්‍රමසිංහ ආණ්ඩු කාලයේ ගෙවල් 1,300ක් හැදුවා; ඉවර වුණේ නැහැ. එතුමන්ලා අලුතෙන් 4,700ක් හදනවා කිව්වා. එතකොට කීයක්ද කියලා ඇහුවා. ගෙවල් 6,000ක් හදනවා කිව්වා. 6,000ක් කියන්නේ, දෙසැම්බර් 31වෙනි දා වෙනකොට. හැදුවේ නැහැ. හදන්න බැහැ, දැන්. මම ඒක බොරුවක් කියලා කියන්නද? නැහැ නේ. මට ඕනෑ නම්, ඒක බොරුවක් කියලා දේශපාලනය කරන්න පුළුවන්. මම එහෙම කරන්න කැමැති නැහැ. මම කියන්නේ, ඒකට කමක් නැහැ කියලා. මොකද උත්සාහ කළා, බැරි වුණා. ඉතින් ඒක බැරි වුණා නේ. පොරොන්දු කැඩුණා. ඒක මුළු රටම දැනගන්න ඕනෑ. අපට බණින්න ඉස්සෙල්ලා මේවා දැනගන්න ඕනෑ. ඔබතුමා නොවෙයි, ඇමතිතුමා නොවෙයි. මලෙයහම් ජනතාව නියෝජනය කරමින් ඔබතුමන්ලාගේ පක්ෂයත් එක්ක එකතු වෙලා මේ සභාවට ආපු අය ඉන්නවා. අනුර කුමාර දිසානායක සහෝදරයා කිව්වා වාගේ පාපිසි, නැත්නම් සුන්බුන් විධියට සමහරු ඉන්නවා. ඒ අයට කරන්න දෙයක් නැහැ. අපි දැක්ක ගමන්ම තරහක් ඇති වෙනවා; කෑ ගහනවා. නමුත් අපි ලොකු වැඩ කරලා තිබෙනවා. ලොකු වැඩක් කළා, ඉන්දියාව එක්ක කථා කරලා, නිවාස 10,000ක් හදන්න මුදල් අරන් දීලා, ප්‍රාදේශීය සභා හදලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හදලා, පාසල්වලට ඉඩම් ලබා දීලා අපි අවුරුදු 4න් ලොකු වැඩක් කළා. අපි නිකම් හිටියේ නැහැ. අපි පාර්ලිමේන්තු ආවේ පොල් ගාන්න නොවෙයි; බම්බු ගහන්නත් නොවෙයි; වැඩ කරන්න. අපි වැඩ කළා. වැඩ කරලා අපි පෙන්වා දීලා තිබෙනවා. මේවා මම කියන්නේ ඔබතුමාට නොවෙයි. අර අයට පමණක් කියන්නේ. නමුත් ප්‍රශ්නයක් නැහැ. අපි වැඩ කරලා තිබෙනවා. ඔබතුමා පටන් ගත්ත වැඩේ කරගෙන යන්න. නමුත් නිවාස ඉදිකිරීම් භාර ඇමතිතුමා කරුණාකර එය ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට ගන්න. ඔබතුමා හරහා අතිගරු ජනාධිපතිතුමාගෙන් අපි එම ඉල්ලීම කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමා මා දිහා බලාගෙන, මටම eye contact තියාගෙන කථා කරපු නිසා මට පොඩි අවස්ථාවක් දෙන්න. *[බාධා කිරීමක්]* හොඳයි, හොඳයි. එතුමාගේ ප්‍රධාන යෝජනා දෙකක් තිබුණා. එකක්, නිවාස ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් එතුමන්ලාගෙන් අදහස් ගන්න කියන එක. අපේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව ඒ සඳහා ඔබතුමන්ලාට විවෘත කරනවා. ඒ වාගේම නිවාස ප්‍රතිපත්තිය සඳහාත් ඔබතුමන්ලාගේ යෝජනා ගන්න අපි ලැහැස්තියි. එම යෝජනා අපට ලිඛිතව දෙන්න; උපදේශක කාරක සභාවටත් එන්න.

දෙවැනි කාරණය, නිවාස ඉදිකිරීම හා සම්බන්ධ ක්‍රියාදාමය. අපි දන්නවා, අමාත්‍යාංශ කිහිපයකින් නිවාස හැදෙන බව. ඒ කටයුතු කෙරෙනවා නේ. ඒ සම්බන්ධයෙන් අපි වැඩිදුරටත් කල්පනා කරලා තිබෙනවා. හෙට අපි යොදාගෙන තිබෙනවා, නිවාස සම්බන්ධයෙන් වැඩ කරන හැම අමාත්‍යාංශයකම, හැම ආයතනයකම නියෝජනයක් අරගෙන steering committee එකක් හදන්න. එතකොට අපි එක තැනකින් දන්නවා, නිවාස කීයක් හැදෙනවාද, කාටද යන්නේ, මොකක්ද ප්‍රතිපත්තිය, මොන මට්ටමින්ද යන්නේ කියලා. එක තැනකින් මෙහෙයවන, අපි එකතු වෙලා සාකච්ඡා කරන coordination එකක් අපි ගන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගේ යෝජනාවට පිළිතුරක් විධියටයි මම මේ දේවල් කිව්වේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 2.13]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම රටේ ආර්ථිකයට වාගේම මේ රටේ මහජනතාවට ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක් -කිහිපයක් කියන්නත් තිබුණා- පිළිබඳව විවාද කරන අවස්ථාවේ මේ විෂය පථය පිළිබඳව කථා කරන්න පෙර, යම් කාරණයක් සඳහන් කරන්න මම කැමැතියි. නමුත් අද මේ කාරණය ගැන මතක් කරන එකත් හොඳ නැහැ. මොකද, අද ගරු ජනාධිපතිතුමාගේ උපන් දිනය. එතුමාට සුබ උපන්දිනයක් වේවා කියා ප්‍රාර්ථනා කරන

ගමන්ම රණ විරුවන් සහ ආබාධිත පොලිස් නිලධාරින් සම්බන්ධ කාරණයක් මම මතු කරනවා. ගරු ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශයකට තමයි මෙය අයිති වන්නේ. නියෝජ්‍ය අමාත්‍යතුමා නම් සභාවේ ඉන්නවා. ඒ ආබාධිත රණ විරුවන්ට, ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ නිලධාරින්ට තිබෙන ගැටලුවලට විසඳුම් සොයන්න ඔබතුමන්ලා මැදිහත් වෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය මේ අවස්ථාවේ මට අහන්න වෙනවා. මොකද, ප්‍රායෝගිකව බැලූ බැල්මට ඔවුන්ට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. අද පාර්ලිමේන්තුවට එනකොටත් ඒ අය පාර්ලිමේන්තුව ඉස්සරහ හිටියා. විෂය භාර ගරු අමාත්‍යවරයා වන්නේ ගරු ජනාධිපතිතුමා. එතුමා නොසිටියත්, නියෝජ්‍ය ඇමතිවරයා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හිටපු හමුදා නිලධාරියෙක්; වගකිව යුතු නිලධාරියෙක්. මම විශ්වාස කරනවා, ඔබතුමා ඒ රණ විරුවා සෙබළෙක් විධියට දකින එකක් නැහැ, ඒ රණ විරුවා කළ කැප කිරීම තුළින් ඔබතුමා ඔහුව රණ විරුවෙක් විධියටම දකීවි කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ කරුණාකරලා මේ අයට ඇහුම්කන් දෙන්න; මේ අයගේ ප්‍රශ්නය විසඳන්න කියලායි. මොකද, දැන් ඉන්නේ ආබාධිත රණ විරුවන් 14,000ක් වාගේ පිරිසක්. මේ පිරිස එන්න එන්න වැඩි වෙන්නේ නැහැ නේ, අඩු වෙනවා මිසක්. මොකද, දැන් යුද්ධය අවසන්. ඒ අයගේ සාධාරණ ඉල්ලීම් ගණනාවක් තිබෙනවා. ඔබතුමා ඒ අයගේ සාධාරණ ඉල්ලීම්වලට ඇහුම්කන් දීලා, ජනාධිපතිතුමා එක්කත් කථා කරලා ඔවුන්ගේ ප්‍රශ්නවලට ප්‍රායෝගික විසඳුමක් ලබා දෙන්න. එහෙම නැතුව ඔවුන් පාරට ගෙන්වා, පොලීසිය දමා අවහිර කරන තැනට කටයුතු කරන්න එපා. ඒක හරි නැහැ, ඒක හොඳ නැහැ. මොකද, ඔබතුමාත් හමුදාව නියෝජනය කරපු වගකිව යුතු නිලධාරියෙක් වාගේම ක්‍රියාන්විතයේ හිටපු කෙනෙක් නිසා ඔබතුමාටත් එම වගකීම තිබෙනවා.

අද දින අප කථා කරන විෂය සම්බන්ධවත් අදහසක් දැක්විය යුතුයි. ඔබතුමන්ලා ඒ කාලයේ පාරවල් දැක්කේ හරිම භයානක රකුසෙක් විධියට. ඒ කාලයේ ඇහුවා, පාරවල් කන්නද කියලා. කාපට් කන්නද කියලා අහපු යුගයක් තිබුණා. 2005 වර්ෂයෙන් පසුව හදපු පාරවල් පිළිබඳව මම පොඩි හැඳින්වීමක් කරන්නම්. මොකද, 76 අවුරුදු ශාපයක් ගැන ඔබතුමන්ලා කියනවා නේ. 77වැනි අවුරුද්දේ ශාපය ගැන අපි ඊළඟට කථා කරමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 76 අවුරුදු ශාපය පැවති කාල සීමාව තුළ මේ රට තුළ highways කිලෝමීටර 250ක්, "A" සහ "B" grade පාරවල් කිලෝමීටර 7,500ක් සහ ග්‍රාමීය මාර්ග 35,000ක් හැදිලා තිබෙනවා. 2005 සිට 2014 දක්වා වූ අවුරුදු 9යි, දවස් 50ක - මුළු දින 3,335ක- කාල සීමාව තුළ දළ වශයෙන් දවසකට කිලෝමීටර 12.8ක් මේ රටේ පාරවල් හදලා තිබෙනවා. දවසකට කිලෝමීටර 12.8ක්. ඒ, අවුරුදු 9යි, දවස් 50ක් කියන කාල සීමාව ඇතුළත.

නිවාස අමාත්‍යාංශය ගැනත් අද කථා කරනවා. පසුගිය පාලන කාලය තුළ අවුරුදු 2ක් ඇතුළත ග්‍රාමීය නිවාස 20,000ක් හදලා අවසන් කරන්න හැකියාව ලැබුණා, එක් නිවසකට ලබා දුන් රුපියල් ලක්ෂ 6 බැගින් වූ ආධාරත් සමඟ. රවී කරුණානායක මැතිතුමාත් කථා කළා, කොළඹ මහල් නිවාස ගැන. පැල්පත් නිවාස 68,000ක් තිබෙනවා. අපේ භාෂාවෙන් කියනවා නම්, ඒවාට 'වත්තු' කියලා කියන්නේ. ඒවාට 'වත්තු' කියන නම අයින් කරලා 'මහල් නිවාස' කියන සංකල්පයට යෑමේ වැඩ පිළිවෙළක් 2011 අවුරුද්දේදී පටන් ගත්තා. ඒ අනුව 2011 අවුරුද්දේ ඉඳලා 2014 අවුරුද්ද වෙනකොට පවුල් 4,900ක් මහල් නිවාසවල පදිංචි කර තිබෙනවා. 2020 අවුරුද්ද වෙනකොට පවුල් 18,000ක් පදිංචි කර තිබෙනවා, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි. සමස්තයක් විධියට ගත්තාම තවත් නිවාස 24,000ක වැඩ ආරම්භ කර තිබුණා. මේ වෙනකොට තව නිවාස 3,000ක් තිබෙනවා, මිනිස්සු පදිංචි කරවන්න පුළුවන්කම තිබෙන. ඔබතුමන්ලා ඒ ජනතාව ඒ නිවාසවල පදිංචි නොකරන්නේ ඇයි කියන කාරණය පිළිබඳව අපි දන්නේ නැහැ. හැබැයි, පදිංචි කරන්න පුළුවන්.

අධිවේගී මාර්ග ගැනත් අද කථා කළා. එදා නම් කිව්වේ, අධිවේගී මාර්ග නිසා බල්ලන්ට, බළලුන්ට පාර මාරු වෙන්න විධියක් නැහැ කියලායි. හැබැයි, අද ඔබතුමන්ලාත් අධිවේගී මාර්ග හදන්න උත්සාහ කරනවා. දැන් ඔබතුමන්ලා පොතුහැර සිට රඹුක්කන දක්වා කිලෝමීටර 13ක කොටසක වැඩ පටන් ගෙන තිබෙනවා, නුවරට යන අධිවේගී මාර්ගයේ. ඒක හරි හදා ගත්තොත් හොඳයි. ඊට පසුව එම අධිවේගී මාර්ගයේම කඩවත සිට මීරිගම දක්වා වූ කිලෝමීටර 37ක කොටස හදන්නත් ඔබතුමන්ලා යෝජනා කර තිබෙන බව කියනවා. *[බාධා කිරීමක්]* පටන් අරගෙනද තිබෙන්නේ? හොඳයි, නේද? බොහොම හොඳයි. අපි කරපු දේවල් ඔබතුමන්ලා ඉදිරියට අරගෙන යනකොට අපටත් සතුටුයි. මොකද එදා ඔබතුමන්ලා බැන්නා නේ, බල්ලන්ට, බළල්ලුන්ට පාර මාරු වෙන්න විධියක් නැහැ, මේ අධිවේගී මාර්ග හරියන්නේ නැහැ කියලා. නමුත් අද ඔබතුමන්ලා ඒ කටයුතු කරනකොට අපට සතුටුයි. ඒකයි මම මේවා මතක් කරලා දෙන්නේ. හැබැයි, ඉතින් ඒ කිලෝමීටර 37ත් ඉක්මනට හැදුවොත් හොඳයි කියලා අපි හිතනවා. දැන් අර කිලෝමීටර 13ට අමතරව ගලගෙදර දක්වාත් කිලෝමීටර 37ක් හදන්න තිබෙනවා. ඒකේ ඉතුරු වැඩ ටිකත් කඩිනමින් අවසන් කිරීමට ඔබතුමන්ලා කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට ඔබතුමන්ලා ගුවන් තොටුපොළ, වරාය වාගේ දේවල් සම්බන්ධවත් අදහස් දැක්වූවා. මම දැක්කා, ඇමතිවරයා මත්තල ගුවන් තොටුපොළ ගැන කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්තල ගුවන් තොටුපොළ භාවිතයට ගෙන අවුරුදු කීපයක් යනකොට ආණ්ඩුව මාරු වුණා. ඊට පසුව ඒකේ වී ගබඩා කළා. එසේ වී ගබඩා කළ කටයුත්තට ඔබතුමන්ලාත් සම්බන්ධයි. කාලයක් ගුවන් තොටුපොළ වසා තිබුණා. ගුවන් තොටුපොළක් හදලා එහෙම වසා තිබුණාම, ඒකෙන් ආදායමක් උත්පාදනය වෙන්නේ නැහැ. සමස්ත සැලැස්මක් තිබුණා. නමුත් මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් කරලා, වසා දමලා, ගුවන් යානා හරවලා යැව්වා. ඒ ආකාරයට ඒක වැහෙන තැනට එදා පැවති ආණ්ඩුව කටයුතු කරනකොට, තමුන්නාන්සේලාත් එදා ඒ කටයුත්තට සම්බන්ධ වුණා. *[බාධා කිරීමක්]* ඔව්, ඔව්. ඉන්නවා, ඉන්නවා. එතුමාත් ඉන්නවා; ඔබතුමාත් ඉන්නවා. *[බාධා කිරීමක්]* එතුමාත් ඉන්නවා; ඔබතුමාත් ඉන්නවා. හැබැයි, අනෙක් පැත්තෙන් එදා හම්බන්තොට වරාය විකුණනකොට ඔබතුමන්ලා මොකක්ද කළේ? එදා හම්බන්තොට වරාය විකුණනකොටත් ඔබතුමන්ලා මැදිහත් වෙලා ඒක විකුණන තැනට කටයුතු කළා. හැබැයි, එතැනින් එහාට ඒකේ සංවර්ධනය ගැන ඔබතුමන්ලා කථා කරන්නේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා කථා කරන මේ 76 අවුරුද්දක ශාපය තුළ වරායවල් හැදුණා; ගුවන් තොටුපොළවල් හැදුණා; මහාමාර්ග හැදුණා; අධිවේගී මාර්ග හැදුණා; මහල් නිවාස හදන්න පටන් ගත්තා; ග්‍රාමීය නිවාස හදන්න පටන් ගත්තා; 20,000ක් හදලා අවසන් කළා, අවුරුදු දෙකකින්; ඒ සියල්ලම සිද්ධ වුණා.

දැන් අපි බලමු, මේ එක අවුරුද්දක ශාපය, 77වන අවුරුද්දේ ශාපය ගැන. පසුගිය පෙබරවාරි මාසයේ ඔබතුමන්ලා අය වැයක් ඉදිරිපත් කළා. ඉතාම ප්‍රායෝගිකයි කියලා අතිගරු ජනාධිපතිතුමාත් ලස්සනට පාර්ලිමේන්තුවේ කථා කරලා, අය වැය ඉදිරිපත් කරලා ගියා. එතකොටත් කිව්වා, එතුමාගේ ගම වන තඹුත්තේගම දුම්රිය ස්ථානයත් හදනවාය කියලා. හැබැයි, තවම ඒක හදා ගන්නත් බැරි වුණා. ඒක හැදුවේත් නැහැ. රුපියල් මිලියන 250ක් වෙන් කළා කිව්වා, අලුත් දුම්රිය මැදිරි හදන්න. දැන් අපි අහන්න කැමැතියි, දුම්රිය මැදිරි කීයක් අලුතෙන් හැදුවාද, නවීකරණය කළාද කියලා. ඊළඟට, සන අපද්‍රව්‍ය කළමනාකරණය

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

කරන්න රුපියල් මිලියන 750ක් වෙන් කළා, අනුරාධපුර පූජා නගරයේ. නමුත්, කළේ නැහැ. මම මේ ජනාධිපතිතුමාගේ ගමේම ටික කියන්නේ. මොකද, ජනාධිපතිවරයාගේ ගමේ ටික කර ගත්තේ නැතිකොට ඉතින් අනෙක් පැති ගැන කථා කරලා වැඩක් නැහැ නේ, ඇමතිතුමනි. ජනාධිපතිතුමාවත් ඇන්දුවා නම් ඔබතුමන්ලා එකතු වෙලා, ආපසු ඉතින් එතැනින් එහාට ඒ ගැන කථා කරලා වැඩක් වෙන්නේ නැහැ. එප්පාවල ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළේ නැහැ; පටන් අරගෙනත් නැහැ. 77වන අවුරුද්දේ ශාපය ගැන දැන් මම මේ කථා කරන්නේ. අවුරුදු 76ක ශාපය ගැන මම කිව්වා. 77වන අවුරුද්දේ ශාපය ගැන තමයි මම මේ දැන් ඔබතුමන්ලාට මතක් කරන්නේ.

ඊළඟට, ගුවන් තොටුපොළේ baggage scanning system එකට ඔබතුමන්ලා රුපියල් මිලියන 1,000ක් වෙන් කළා. නමුත්, අද වෙනකල් ඒවා සවි කළේ නැහැ. උතුරු ප්‍රදේශයේ පාරවල් හදන්න රුපියල් මිලියන 500යි; ප්‍රගතිය සියයට 25ක්වත් නැහැ. අනෙක් පළාත්වල පාරවල් හදන්න රුපියල් මිලියන 400යි; සියයට 20ක්වත් ප්‍රගතිය නැහැ. දැන් ඔබතුමන්ලා,- *[බාධා කිරීමක්]* මොකක්ද? *[බාධා කිරීමක්]* ඔව්. ඒ කියන්නේ, මේ මාසයට ඉතුරු සියයට 70 හදලා ඉවරයි. හොඳයි! අවුරුද්දක් තිස්සේ හදා ගන්න බැරිව ඉඳලා මේ මාසයට ඉතුරු ටික හදලා ලු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්න ඉතින්, කියන කථාව. ඔක්තෝබර් මාසය වෙනකොටත් ප්‍රගතිය සියයට 20යි. *[බාධා කිරීමක්]* ඔක්තෝබර් මාසය වෙනකොටත් ප්‍රගතිය සියයට 20යි. හැබැයි, අන්තිම මාසය බලලා කියනවා, ඔක්තෝබර් ඉඳලා මේ වෙනකොට ඉතුරු සියයට 70 හදලාය කියලා.

මේ කාරණයත් කියා විනාඩියෙන් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කටුනායක ගුවන් තොටුපොළේ expansion එක වෙන්න ඕනෑ. ඔබතුමන්ලා තමයි ඒක නැවැත්වූවේ. මොකක්ද ඒකට හේතුව? වහලේ design එක හොඳ නැහැ කියලා. ඊට පස්සේ කොවිඩ් වසංගතය නිසා ඒ කටයුතු නතර වුණා; ආපසු තවත් හේතුවක් නිසා එහි වැඩ කටයුතු නතර වුණා; තවමත් එහි කටයුතු නතර වෙලා. හැබැයි, මාලදිවයිනේ ගුවන් තොටුපොළ හදන්න අපිත් එක්ක පටන් ගත්තේ. අද වනකොට මාලදිවයින passengersලා ලක්ෂ 70කට ඒ ගුවන් තොටුපොළ තුළින් සේවය සපයනවා.

ඊළඟට, කොළඹ වරාය උදාහරණයකට ගනිමු. දැන් කන්ටේනර් ගැන කථා කරනවා. කන්ටේනර් 323 පන්නපු කෙනාව තවම හොයා ගන්න බැහැ. කන්ටේනර් 323 පන්නන්න අවසර දීපු කෙනා කවුද කියලා අද වෙනකල් දන්නේ නැහැ. හැබැයි, පසුගිය කාලයේ වරාය පොලීසියෙන් සිගරැට් ඇල්ලුවා. ඒක අල්ලපු නිලධාරියාව transfer කළා. ඒ නිලධාරියා transfer කරන්න හොයා ගන්න පුළුවන් වුණා. හැබැයි, බුද්ධි අංශ වාර්තා තිබියදීත්, බුද්ධි අංශවලින් තොරතුරු ලබා දීලා තිබියදීත් කුඩු කන්ටේනර් දෙක එළියට දැම්මා, check කරලා කුඩු නැහැ කියලා. ඒ කන්ටේනර් දෙක එළියට දමපු කෙනා කවුද කියලා දන්නේත් නැහැ. කන්ටේනර් 323 එළියට දමපු කෙනා කවුද කියලා දන්නේත් නැහැ. හැබැයි, හොර සිගරැට් අල්ලපු පොලිස් නිලධාරියා මාරු කළා. ඒ නිලධාරියා හොයා ගන්න පුළුවන් වුණා. ඇයි, ඒ? සිගරැට් අල්ලපු නිසා. හැබැයි, හොරෙන් කන්ටේනර් පන්නපු අය හොයා ගන්න බැහැ.

ඒ වාගේම, එදා අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කළා මට මතකයි, වරායේ තදබදය නවත්වන්න කියලා. හැබැයි, පසුගිය දවසක කියනවා මම අහගෙන හිටියා, ආපසු වරායේ තදබදයක් ඇති වෙන්න පුළුවන් කියලා. ඒ කියන්නේ මොකක්ද? ආපසු කන්ටේනර් පන්නන්න පුළුවන් කියන එක. පසුගිය කාලයේ පැන්නුවේත් තදබදය පෙන්වලා නේ. හැබැයි, වෙන් කරපු රුපියල් මිලියන 500 ඒ විධියටම තිබෙනවා. අපි මේවා සද්භාවයෙන් කියන්නේ. ඔබතුමන්ලා මේවා අහගන්න. ඔබතුමන්ලා මේ අය වැය ලේඛනවලට කොච්චර ලකුණු දමා ගන්න බැලුවත්, ජනාධිපතිතුමා පැය හතරහමාරක කථාවක් කළත්, ඔබතුමන්ලා දෙන පොරොන්දු ප්‍රායෝගිකව බිමේ පැළ වෙන්නේ නැහැ. එතුමාගේ උපන් දිනය දවසේ මෙහෙම කියන එකත් හොඳ නැහැ. නමුත්, ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ, මේ අය වැයෙන් ඉදිරිපත් කළ යෝජනාවලින් සියයට සියයක් නොවෙයි, අඩුම ගණනේ සියයට 50ක්වත් ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියායි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන අද දවසේ ඒ සම්බන්ධයෙන් යම් අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වාගේම, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ පැත්තෙන් විශේෂයෙන්ම සද්භාවයෙන් මතු වන කරුණු ඉතා හොඳින් භාර ගන්න අපි කැමැත්තෙන් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 9යි දවස් කිහිපයක් ඇතුළත අපේ රටේ පාරවල් ගණනාවක් හදලා තිබෙනවා තමයි. ඒ වාගේම, දවසකට කිලෝමීටර 9ක පමණ දුරකට පාරවල් හදලා තිබෙනවා තමයි. හැබැයි, ඒ හදපු කිලෝමීටර ගණනට වඩා වැඩියෙන් කොයි තරම් මුදල් ප්‍රමාණයක් ගැහුවාද කියන එක ගැන හොයන්නත් අපි මැදිහත් වෙමින් ඉන්නවා. ඒක තමයි ඔබතුමන්ලා සහ අපි අතර තිබෙන වෙනස. වෙනස ඒකයි. *[බාධා කිරීමක්]* හොයනවා, හොයනවා. *[බාධා කිරීමක්]* හරි, හරි. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශයට අදාළ කරන සංවාදයට මැදිහත් වෙන්න කැමැතියි. විශේෂයෙන්ම අපි දන්නවා, නාගරික සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව ආයතන 5ක් තිබෙන බව. මට ලැබී තිබෙන සීමිත කාලය තුළ මෙම ආයතන 5 ගැනම කථා කරන්න වේලාවක් නැති වෙයි. විශේෂයෙන්ම නාගරික සංවර්ධනය කියන ක්ෂේත්‍රයට අපේ රටේ සෑම ආණ්ඩුවකින්ම, සෑම අය වැයකින්ම විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරන බව අපි දන්නවා. නමුත්, මේ මොහොතේදී අපට අභියෝගාත්මක කාලයක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම, නාගරික සංවර්ධනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අපි වියදම් කළත්, ඒකට අදාළ කරන උපරිම ප්‍රයෝජන අපට ගන්න පුළුවන් වුණාද, නැද්ද කියන එක සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. මොකද, මේ ක්ෂේත්‍රය තුළ අභියෝග ගණනාවක් තිබෙනවා. මේ ක්ෂේත්‍රය තුළින් අපි එක පැත්තකින් නාගරික සංවර්ධනය ක්‍රමවත් කරන්න ඕනෑ. ඒ වාගේම, අපි නිවාස හා යටිතල පහසුකම් ක්‍රමවත් කරන්න ඕනෑ.

භෞතික සැලසුම්කරණය කරන්න ඕනෑ; ගංවතුර පාලනය කරන්න ඕනෑ; තෙත් බිම් කළමනාකරණය කරන්න ඕනෑ; ඉඩම් සංවර්ධනය කරන්න ඕනෑ; ජනගහනය පාලනය කරන්න ඕනෑ. ඒ වාගේම මහජනතාවගේ ගමනාගමන පද්ධතිය නවීකරණය කරන්න ඕනෑ. එමෙන්ම, ඉඩම් හිඟය සහ නිවාස ගැටලුව සම්බන්ධයෙන් අපි මැදිහත් වෙන්න ඕනෑ. පරිසරය සංරක්ෂණය කරන්න ඕනෑ. ඒ වාගේම, අනවසර ඉදිකිරීම් සම්බන්ධවත් අපි මැදිහත් වෙන්න ඕනෑ. ඒ සියල්ල පදනම් කර ගනිමින් තමයි මොනම රජයක් ඇතුළේ වුණත් මේ නාගරික සංවර්ධන කටයුත්ත කරන්න පුළුවන් වෙන්නේ.

නාගරික සංවර්ධනය වාගේම නිවාස ඉදිකිරීම පිළිබඳවත් දැන් අපට තිබෙන අත්දැකීම - experience එක - හොඳම එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් අවස්ථා කිහිපයකදීම මේ කාරණය ගැන කිව්වා. විශේෂයෙන්ම නාගරික සංවර්ධන කටයුතු කරද්දී හුදෙකලාව, නිශ්චිතව, සමහර විට දේශපාලන අරමුණක් වෙනුවෙන් නැත්නම් කවුරු හෝ පිරිසක් එළවා දැමීමේ ක්‍රියාවලියක් වෙනුවෙන් අපට නගරයක් සංවර්ධනය කරන්න බැහැ. ඒ සංවර්ධන කටයුතු කරද්දී එම භූමිය තුළ ජීවත් වන මිනිසුන්ගේ ආර්ථික, සමාජ, සංස්කෘතික, පාරිසරික තත්ත්වයන් මත තමයි අපි එම තීන්දු තීරණ ගත යුත්තේ. හැබැයි, ඉතිහාසය අධ්‍යයනය කරද්දී අපට දකින්න තිබෙන්නේ ඒ අත්දැකීම නොවෙයි. මොකද, සෑම ආණ්ඩු කාලයකදීම විශේෂයෙන්ම නාගරික සංවර්ධනයට අදාළව යම් භෞතික ඉදිකිරීම් ගණනාවක් කළාට විශේෂයෙන්ම අද වනකොට නාගරික ජනතාව මුහුණ දෙන ගැටලුවලට උත්තර ලැබිලා නැහැ. අපට තිබෙන අභියෝගය මේකයි. මෙන්න මේ නාගරික සංවර්ධනය කරද්දී ඒ අදාළ කරන මූලික තත්ත්වයන් මත හිඳිමින් ඒවාට අදාළ කරන වැඩ කටයුතු තෝරා ගත්තේ නැත්නම් ඒකට නිශ්චිත උත්තරයක් ලැබෙන්නේ නැහැ. ආර්ථික වශයෙන් යම් උත්තරයක් ලැබෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම පෙරළා නැවතත් අපායවල් ප්‍රමාණයක් නිර්මාණය වෙන්නත් පුළුවන්කම තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම මෙතැන සිටින අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු දන්නවා.

පසුගිය ආණ්ඩු අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ගණනාවක් හදලා තිබෙනවා. ඒ මිනිසුන්ට ඕනෑකම තිබුණා, එම නිවාස සංකීර්ණය ඇතුළේ තිබෙන නිවසකට ගිහිල්ලා පදිංචි වෙන්න. හැබැයි, කරපු දේ තමයි ඒ මිනිස්සු අරගෙන ගිහිල්ලා ඒ තැන්වල ගාල් කරපු එක. ඒ නිවාස සංකීර්ණ ඇතුළේ සිදු වූ ඛේදවාචක ගණනාවක් තිබෙනවා. පොදුවේ ගත්තොත්, අපි හිතනවා ඒ අත්දැකීම් ප්‍රයෝජනයට අරගෙන අප නව රජයක් ලෙස එය කළමනාකරණය කර ගත යුතුයි කියලා. ඒ තත්ත්වයන් තුළ ඇති වෙලා තිබෙන වායු දූෂණය, ජල දූෂණය සහ ශබ්ද දූෂණය පිළිබඳව අපි දැන් නැවත කල්පනා කරන්න ඕනෑකම තිබෙනවා. ඒ වාගේම, කැළි කසළ සහ අපජලය පිළිබඳව ගැටලු තිබෙනවා. එමෙන්ම තෙත් බිම් ආශ්‍රිත ජලාශ සංරක්ෂණය කරන්න ඕනෑ ගැටලුවක් දැන් ඒ මත නැවත පැනනැඟී තිබෙනවා. ඒ වාගේම, නාගරික උද්‍යාන නිර්මාණය කරමින්, මිනිසුන්ට සුව පහසු ලෙස මානසික සුවය සහ කායික සුවය අත්පත් කර ගැනීම වෙනුවෙන් අපි දැන් වැඩ පිළිවෙළක් හදා ගන්න ඕනෑකම තිබෙනවා. එම නිසා ඉතිහාසයේ තිබුණු ඒ අඳුරු අත්දැකීම් වෙනස් කරමින් අපි ඉදිරියට යා යුතුයි කියලා මම හිතනවා. විශේෂයෙන්ම මීට පෙර මේ විෂය භාර ඇමතිතුමා විධියට කටයුතු කළ ගරු අනුර කරුණාතිලක මැතිතුමාටත්, අපේ නියෝජ්‍ය ඇමතිතුමාටත් මම මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමන්ලා පසුගිය වසර තුළදී මේ සැලසුම් පිළිබඳව පූර්ණ මැදිහත්වීම් කරලා තිබුණා. එම නිසා අපි මේ අමාත්‍යාංශයට නැවත මැදිහත් වෙමින් ඇමතිතුමාත්, අපිත් කණ්ඩායමක් ලෙස සාකච්ඡා කරමින් ඒ සැලසුම් සියල්ල දැන් සකස් කරමින් තිබෙනවා. එම නිසා අපට ඒ පිළිබඳව සතුටක් තිබෙනවා. දැන් අපට තිබෙන්නේ, ගරු ඇමතිවරයාත්, නියෝජ්‍ය ඇමතිවරයාත් හදා ගත්ත නිශ්චිත සැලැස්ම ඉතා වේගයෙන් ජනතාව අතරට ගෙනියලා අදාළ කරන ක්‍රියාමාර්ග ටික ගන්නයි. ඒ පිළිබඳව හිටපු අමාත්‍යවරයාටත්, නියෝජ්‍ය අමාත්‍යවරයාටත් මම ස්තුතිවන්ත වනවා.

මම විශේෂයෙන්ම නාගරික ජනාවාස පිළිබඳව යම් අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් හදපු නිවාස ව්‍යාපෘති මේ වෙද්දී 24කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, අද මොකක්ද ඒවායේ තත්ත්වය? අද ඒවා මිහිපිට අපායවල් බවට පත් වෙලා තිබෙන්නේ. ඒවා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ග්‍රහණයට පත් වෙලා තිබෙනවා. ඒවායේ lift එක පැත්තකින් කැඩෙනවා; අනෙක් පැත්තෙන් කඩනවා. අපි ගිය අවුරුද්දෙත් ඒවා වෙනුවෙන් සැලකිය මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම කුණු බැහැර කරන්න සැකසූ නිශ්චිත ක්‍රියාවලියක් නැහැ. ඒවා මත්ද්‍රව්‍ය තිප්පොළවල් බවට පත් වෙලා තිබෙනවා. අඩුම තරමේ අද ඒ නිවාස සංකීර්ණවල ඉන්න තරුණයෙකුට, තරුණියකට එළියට ගිහිල්ලා job එකක් කරද්දී තමන් මෙන්න මේ තැන තමයි පදිංචි වෙලා ඉන්නේ කියන්න ලජ්ජා වන තැනකට එහි සමාජ වටපිටාව සහ පාරිසරික තත්ත්වය පත් වෙලා තිබෙනවා. ඒක වෙනස් කිරීමේ අභියෝගය අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වනාතමුල්ල ප්‍රදේශයේ තිබෙන "මෙත්සර උයන" වාගේ මහල් නිවාස සංකීර්ණයක් අරගෙන බලන්න. අද එම නිවාස සංකීර්ණවල තිබෙන ඛේදවාචකය මොකක්ද? හැබැයි, ඊට කිලෝමීටර කිහිපයකට එහා තිබෙනවා "ඔලුවිල් විලා" කියලා නිවාස සංකීර්ණයක්. වනාතමුල්ල කියන ප්‍රදේශයේ "මෙත්සර උයන" කියලා නිවාස සංකීර්ණයක් තිබෙනවා; ඊට ටිකක් එහා පැත්තෙන් තව සුපිරි නිවාස සංකීර්ණයක් තිබෙනවා. එසේ තිබීම ගැන අපට ගැටලුවක් නැහැ. හැබැයි, ඒ සුපිරි නිවාස සංකීර්ණය හොඳට තිබෙන්නත්, "මෙත්සර උයන" නිවාස සංකීර්ණය අර්බුදයට යන්නත් මොකක්ද හේතුව? ඒවායේ මිනිස්සු පදිංචි කළා නොවෙයි, ගාල් කළා. එම නිසා ඒවා ඇතුළේ දැවැන්ත ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඒ ඉතිහාසය පිළිබඳව නැවත නැවත කථා කරනවා වෙනුවට එයට උත්තර හොයන්න ඕනෑකම තිබෙනවා. අපි ඒ වෙනුවෙන් නිශ්චිත ක්‍රමවේදයකට අනුව මැදිහත් වෙන්න සූදානම් වෙමින් ඉන්නවා. අපි ක්‍රමානුකූලව ඒ මහල් නිවාස ව්‍යාපෘති 24ම-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් අඩු කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද කියනවා නම්, ඒවායේ lifts තිබෙනවා නේ. ඒවා වැඩ කරන්නේ නැහැ. ඔබතුමාට මම යෝජනාවක් කරනවා. කරුණාකරලා ඒවා outsource කරන්න. Lifts වැඩ කරන්නේ නැති එක ලොකු ප්‍රශ්නයක්. බලන්න, ඒවායේ මහල් 12ක්, 13ක්, 14ක් තිබෙනවා. පහළට එන්නත් බැහැ. උඩට යන්නත් බැහැ. ඒක ලොකු ප්‍රශ්නයක්.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ පිළිබඳව මැදිහත් වන මන්ත්‍රීවරයෙක් කියලා මම දන්නවා. ඔබතුමාත් ඇත්තෙන්ම දන්නවා, lifts කැඩෙනවාට වඩා කඩන තත්ත්වයක් තිබෙන බව.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ඒක තමයි.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

ඔව්. හැබැයි, අපට lift එකේ ප්‍රශ්නය ගැන විතරක් සිතා උත්තරයක් හොයන්න බැරි වනවා, ගරු මන්ත්‍රීතුමනි. හේතුව තමයි, එය පද්ධතියක අර්බුදයක්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ඒවා outsource කරන්න. Company එකකට දුන්නා නම් ඒගොල්ලෝ ආරක්ෂා කරලා දෙයි. ආරක්ෂාව නැති එකයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

Right.

මගේ කථාවේ ඉතුරු ටිකත් දැන් කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට අදාළව පොදුවේ කියන දේ මේකයි. එවැනි flats 24ක් තිබෙනවා. ඒ 24 ඇතුළේ මම කියපු අර බේදවාචකය තිබෙනවා. මම ඒකයි කිව්වේ, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි. "ඔලුවිල් විලා" කියන සුපිරි නිවාස සංකීර්ණයේ ඉන්න තරුණයෙක් - මේ දවස්වල trend එක තමයි, apartment එකක් ගන්න එක - වනාතමුල්ලේ තිබෙන නිවාස සංකීර්ණයෙන් ගැහැනු ළමයෙක් යාළු කර ගන්න කැමැති නැහැ. එතැන තමයි බේදවාචකය තිබෙන්නේ. එම නිසා අපි ඒක address කරන්න ඕනෑ; ඒකට මැදිහත් වෙන්න ඕනෑ. ඒක හුදෙකලා, lifts පිළිබඳව විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුදයක ප්‍රතිඵලයක් තමයි එතැන තිබෙන්නේ.

විශේෂයෙන්ම එවැනි නිවාස සංකීර්ණ 24ක් තිබෙනවා. ඇමතිතුමාත්, අදාළ නිලධාරින් එක්ක අපි මේ වෙද්දිත් සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. අප සූදානම් වනවා, ලබන වසර ඇතුළත අදියර කිහිපයක් යටතේ ක්‍රමානුකූලව ඔවුන්ට ඉන්න පුළුවන් තැනක් බවට ඒවා පත් කරන්න. ඒ වෙනුවෙන් අපි දැනටමත් මූලික සැලසුම් ටික සකස් කරමින් යනවා. අපි බලාපොරොත්තු වනවා පළමුව, ඒ හැම නිවාස සංකීර්ණයක්ම පදනම් කරගෙන ඒ ජනතාව බලාත්මක කරන්න යම් කමිටු ව්‍යුහයකට මැදිහත් වෙන්න. ඒ ඉන්න මිනිසුන්ට එහි අයිතිය, එහි ආරක්ෂාව සහ එහි වගකීම තහවුරු කරන වැඩසටහනකට යන්න අපි බලාපොරොත්තු වනවා.

ඒ විතරක් නොවෙයි. අමාත්‍යාංශයෙන් වෙන් කරන සල්ලි මදි නම්, -ඔබ දන්නවා අපේ නාගරික සංවර්ධන අධිකාරිය සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් උපයාගෙන තිබෙන බව- ඒකට තවත් මුදල් ප්‍රමාණයක් එකතු කරලා ඒ ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අපට පුළුවන්ද කියලාත් අපි සාකච්ඡා කරමින් සිටිනවා.

මේ නිවාස සංකීර්ණ 24ම අපට වසරක් ඇතුළත එතැනට ගෙනෙන්න බැරි වෙයි. හැබැයි, අපි දැන් උත්සාහ කරමින් සිටිනවා. මේ මහල් නිවාස සංකීර්ණ 24න් 4ක් ලබන අවුරුද්ද තුළ සැලසුම් කරලා, ඒ මිනිස්සුන්ට ඉන්න පුළුවන් තැනක් බවට පත් කිරීමට වන වැඩ පිළිවෙළට අප ලබන වසරේ මැදිහත් වෙනවා කියන කාරණය මම කියන්න කැමැතියි.

ඊළඟට, තව කාරණයක් තිබෙනවා. මරික්කාර් මන්ත්‍රීතුමාත් මේ කාරණය මතු කළා. විශේෂයෙන්ම අපට දැන් ඉඩම් තිබෙනවා. ඒ වාගේම නීත්‍යනුකූල නොවන හෝ නීත්‍යනුකූල වශයෙන් අඩු ආදායම්ලාභීන් ලෙස ඉන්න ජනතාවක් ඉන්නවා. අපි ඒක හඳුනාගෙන තිබෙනවා. 50,000කට වැඩි පවුල් ප්‍රමාණයක් ඉන්නවා මෙහි අප නැවත පදිංචි කරගත යුතු. ඒ නිසා අපි දැන් එයට නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් කරගන්න ඕනෑ. මම වෙලාව එක්ක සටනක ඉන්න නිසා කරුණු කාරණා කෙටියෙන් සඳහන් කරන්නම්. අපට ගෙවල් 50,000ක අවශ්‍යතාවක් තිබෙනවා. 14,714කට වඩා වැඩි ප්‍රමාණයක් දැන් අපි settle කරගෙන තිබෙනවා. එතකොට ලොකු ප්‍රමාණයක් අපට සොයන්න ඕනෑකම තිබෙනවා. ඉදිරි අවුරුදු දෙක ඇතුළේ අපි බලාපොරොත්තු වෙනවා නිවාස 7,000කට වඩා වැඩි ප්‍රමාණයක් නිර්මාණය කරගන්න. ඒක ඇතුළේ අපි ලබන වසරේ බලාපොරොත්තු වෙනවා 2,000කට වැඩි පිරිසකට නිවාස ලබා දෙන්න. ඒ සඳහා අපි අමාත්‍යාංශය විධියට කටයුතු කරමින් යනවා. ඒ නිවාස දෙන වැඩ පිළිවෙළට අප ක්‍රමානුකූලව මැදිහත් වෙමින් සිටිනවා.

ඒ වාගේම city branding පැත්ත ගත්තොත්, ඒ සඳහා අපි ගියවර සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කළා. මෙවර අපි රුපියල් මිලියන 1,300කට වැඩි ප්‍රමාණයක් වෙන් කරගෙන තිබෙනවා. ඒ නිසා අපි බලනවා මේක සංචාරක කර්මාන්තය එක්ක පදනම් කරගෙන කරන්න. විශේෂයෙන්ම කතරගම, අනුරාධපුරය, මහනුවර, කොළඹ කොටුව කියන කේන්ද්‍ර 4 මූලික කරගෙන සිදු කරන city branding ව්‍යාපෘතියේ සැලකිය යුතු ප්‍රමාණයක් දැන් අවසන් කර තිබෙනවා. ලබන වසරේත් මේ මුදල් ටික සම්බන්ධ කරගෙන ඒ ප්‍රධාන නගර 4 brand කරන්න අපි අමාත්‍යාංශයක් ලෙස මැදිහත් වෙන්න අවශ්‍ය මූලික කටයුතු සකස් කරමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. නාගරික සැලසුම්කරණය පිළිබඳව ගත්තොත්, UDA එක විධියට අපි යම් නගර ප්‍රමාණයක් සැලසුම් කරන්න සකස් කරගෙන තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා ලබන වසර ඇතුළතදී, ඒ කටයුත්ත කරන්න. ගිය වසරේ ඉලක්ක කර ගත් ප්‍රමාණයම අපට සැලසුම් කරගන්න පුළුවන් වෙලා තිබුණා. ඒවා දැන් යම් ප්‍රමාණයක් අනුමත කරගෙන තිබෙනවා, ගැසට් කරගෙන තිබෙනවා. ඉදිරි වසර තුළත් ලංකාවේ ප්‍රාදේශීය සහ නාගරික වශයෙන් තිබෙන ඒ ගම්මාන ටිකට අදාළව සැලසුම් සකස් කිරීම අප ඉලක්කයක් බවට පත් කරමින් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළේත් සමහරවිට අපි plan එක හැදුවාට ඒක භෞතිකව ඉදිකරන්න යම් මැදිහත්වීමක් කළේ නැති වුණොත් ඒක plan එකක් බවට විතරක් පත් වෙන බව. ඒ නිසා විශේෂයෙන්ම ජනාධිපතිතුමා මැදිහත් වෙලා රුපියල් මිලියන 2,000කට වැඩි ප්‍රමාණයක් වෙන් කරලා නගර 10ක් ඉලක්කගත කරන සැලසුමකට යන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපේ ඇමතිතුමා කිව්වා වාගේම ඒ අදාළ දිස්ත්‍රික් ලේකම්වරු, අදාළ දිස්ත්‍රික්කවල මන්ත්‍රීවරු එක්ක අපි දැන් සාකච්ඡා කරනවා, ලබන වසර ආරම්භයේදීම මේකට මැදිහත් වෙන්න.

අවසාන වශයෙන් මට එක් කරුණක් කියන්න ඕනෑකම තිබෙනවා, ගංවතුර සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා විශේෂයෙන්ම කොළඹ නගරයත්, ගම්පහ වාගේ දිස්ත්‍රික්කත් පසුගිය කාලය පුරාම එක් පැත්තකින් ගංවතුරෙන්, අනෙක් පැත්තෙන් වැසි ජලයෙන් දැවැන්ත පීඩාවකට පත් වුණු බව. කියන්න සතුටුයි, පසුගිය කාලය තුළ දිස්ත්‍රික් ලේකම්වරු, අපේ අමාත්‍යාංශවල හිටපු සහ ඉඩම් සංවර්ධන අංශයේ හිටපු නිලධාරින් සියලු දෙනාම මැදිහත් වෙලා සැලසුම් සහගතව කටයුතු කිරීම තුළ අපට පුළුවන් වුණා කොළොන්නාව, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ අර වැසි වතුරෙන් එන පීඩාව කළමනාකරණය කරන්න. නාගරික සංවර්ධන විෂය පථය ඇතුළේ ඒකට මැදිහත් වෙමින්, ඒකට සම්බන්ධ වෙමින් නිලධාරින් රාශියක් ඉන්නවා. අපි පසුගිය කාලය තුළ ඔවුන් එක්ක සාකච්ඡා කළා. අපේ හිටපු ඇමතිතුමා සැලසුම් කර ගත් වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ඉතාම ශක්තිමත්ව ලබන වසර තුළදී ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්, මේ වසරේදී අපට යම් අඩුපාඩුකමක් වෙලා තිබෙනවා නම් ඊටත් වඩා වැඩි ප්‍රමාණයෙන් ඒක සාර්ථක කර ගැනීම වෙනුවෙන්, ලස්සන නගරයක් සහ සුව පහසු ජීවිතයක් ඇති කර ගැනීම වෙනුවෙන් අපි සියලු දෙනාම මැදිහත් වෙනවා කියන පොරොන්දුව ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, lifts කඩනවා කියන එක මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය තමයි කරන්නේ. ඒ නිසා මේක අපට තව lift එකක් දාලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව කරන fight එකත් මේකට සම්බන්ධයි. අපි ඇත්තටම කල්පනා කරමින් ඉන්නවා මොකක්ද ප්‍රායෝගික විසඳුම කියලා. මොකද, ඔබතුමාත් දන්නවා lifts කඩන කඩන ගාණට දමනවා කියන එකත් ප්‍රායෝගික නැහැ කියලා. අනික් පැත්තට මිනිස්සු විඳින දුක ගත්තාම, ඒකත් පිස්සු හැදෙන එකක්. ඇත්තටම මත්ද්‍රව්‍ය උවදුරත් එක්ක තමයි මේ ප්‍රශ්නය ඇති වන්නේ. මේක ලංකාවට විතරක් තිබෙන ප්‍රශ්නයකුත් නොවෙයි, ලෝකයේත් තිබෙනවා. නමුත්, අපි මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහ කරනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමනි, මම යෝජනා කළේ ඒක නොවෙයි. මම යෝජනා කළේ තවත් lift එකක් දාන්න ඕනෑ කියලා නොවෙයි. Lift එක outsource කරන්න; වෙනත් ආයතනයකට දෙන්න. එතකොට ඒක ආරක්ෂා වෙනවා. මට තේරෙනවා ඔබතුමා කියන එක. කඩනවා, හොරකම් කරනවා, දූෂණ කරනවා, ඒ වාගේ හුඟාක් දේවල් වෙනවා. ඒ නිසා outsource කළා නම් කවුරුන් හෝ security guard කෙනෙක් ඉන්නවා නේ, ඒක බලා ගන්නවා නේ. වගකීමක් තිබෙනවා නේ, එතකොට. ඒක තමයි මම දන්නා හැටියට ප්‍රායෝගික යෝජනාව. ඒක කරලා බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[ පි.ව. 2.40]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இரண்டு பிரதான அமைச்சுக்கள் சம்பந்தமாக இடம்பெறும் விவாதத்தில் எனக்கும் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்காக நன்றியைத் தெரிவிக்கின்றேன். உண்மையில் கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களின் போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சினூடாக வட மாகாணத்தில், குறிப்பாக எமது மாவட்டங்களில் பாரிய நிதி ஒதுக்கீடுகள்மூலம் பல வேலைத்திட்டங்கள் நடைபெற்றிருக்கின்றன. குறிப்பாக, வீதிகள், பாலங்கள் போன்ற வேலைத்திட்டங்களுக்கு பல்லாயிரம் மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தாலும், இந்த வருடத்தில் அதன் நடைமுறைக் காலம் குறுகியதாக விருப்பதால் அந்த நிதிக்குரிய வேலைகள் இன்னும் முடியவில்லை; பல வேலைகள் ஆரம்பக் கட்டத்தில் இருக்கின்றது. இருந்தாலும், கௌரவ அமைச்சர் அவர்களுக்கு இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, நகர அபிவிருத்தி சம்பந்தமாகப் பார்த்தால், உண்மையில் எமது பகுதிகளில் இலவச மின்சார இணைப்பு, நீர் இணைப்பு போன்ற ஏனைய பல பாரிய வேலைத் திட்டங்கள் நடைபெறுகின்றன. வீடமைப்பை எடுத்துக் கொண்டாலும், கடந்த காலங்களைப் போன்று தொடர்ச்சியாக வீடமைப்பு வேலைத்திட்டங்கள் மேற்கொள்ளப்படுவதற்கான ஏற்பாடுகளைச் செய்திருப்பதற்காகவும் கௌரவ அமைச்சர் அவர்களுக்கு இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக்

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

கொள்கிறேன். குறிப்பாக, வீடு கட்டுவதற்கு உதவித் தொகையாக முன்னர் போன்று பத்து இலட்சம் ரூபாய்தான் வழங்கப்படுகின்றது. சில பகுதிகளில் கிராம மட்ட அமைப்புகளின் அல்லது சில உதவி அமைப்புகளின் ஈடுபாட்டுடன் அந்தத் தொகைக்குள் வீடு கட்டலாம் எனக் கூறுகின்றார்கள். ஆனால், எமது பகுதிகளில் இன்னும் அவ்வாறான ஏற்பாடுகள் இல்லை. எதிர்காலத்தில் பத்து இலட்சம் ரூபாய் வீட்டுத் திட்டத்தின்போது, அவ்வாறான நிலைமைகளை ஏற்படுத்தி, அந்தத் தொகைக்குள் வீடுகளைக் கட்டக்கூடிய வகையில் ஏற்பாடுகளைச் செய்யுங்கள்!

எமது பகுதி யுத்தத்தால் கடுமையாகப் பாதிக்கப்பட்ட பகுதி என்று உங்களுக்குத் தெரியும். மீள் குடியேற்றமும் இந்த நகர அபிவிருத்திக்குள்தான் வருகின்றது. கடந்த காலங்களில் மீள் குடியேற்றம் திட்டமிட்ட அடிப்படையில் முறையாக நடைபெறவில்லை என்பதுதான் என்னுடைய கருத்து. அதனால் அது சம்பந்தமாக ஒரு குழுவை நியமித்து, சரியான தரவுகளை எடுத்து, அந்த வேலைத்திட்டத்தை மேற்கொள்ளுமாறு கேட்டுக் கொள்கிறேன். இனிமேல் மீள்குடியேற்றத்துக்கெனத் தனியான ஓர் அமைச்சு தேவையில்லை என்ற நிலைப்பாடு உங்களிடம் இருக்கலாம். ஆனால், இன்னும் மீள்குடியேற்றம் பூரணப்படுத்தப் படவில்லை. இடம்பெயர்ந்த குறிப்பிட்ட ஒரு சமூகத்தினர் இன்னும் புத்தளத்தில் இருக்கின்றார்கள். அவர்களை மீள் குடியேற்றுவதற்கான திட்டங்கள் சரியான முறையில் செயற்படுத்தப்படவில்லை. நீண்ட காலமாக இடம்பெயர்ந் திருக்கின்ற மக்களை மீள்குடியேற்றுவதென்ற வேலைத்திட்டம் முன்பு இருந்த அமைச்சின் மீள்குடியேற்றப் பிரிவால் ஆரம்பிக்கப்பட்டது. அதனுடன் இணைந்ததாக ஆரம்பிக்கப் பட்ட பல பாடசாலைக் கட்டிடங்கள், கலாசார மண்டபங்கள் போன்றவற்றின் வேலைகளும் அரைவாசியோடு இடை நிறுத்தப்பட்டிருக்கின்றது. ஏன் கடந்த காலங்களில் இவற்றைச் செய்ய முடியாது போனதென்றால், அந்த நேரத்தில் நாட்டில் பொருளாதாரத் தாக்கமொன்று ஏற்பட்டது. பிறகு அவற்றைச் செய்வதற்குரிய முயற்சிகள் மேற்கொண்டு நிதி ஏற்பாடைச் செய்யும்போது, தேர்தல் வந்துவிட்டது. நாட்டில் ஊழலை ஒழிக்க வேண்டும் என்பதற்காகவும் நேர்மையான ஆட்சி நடைபெற வேண்டும் என்பதற்காகவும் மக்கள் உங்களைத் தெரிவு செய்தார்கள். எனவே, அவ்வாறு இடைநிறுத்திய அந்த வேலைத்திட்டங்களைக் கைவிடாமல், செய்து முடித்து மக்கள் பாவனைக்குக் கொடுக்குமாறு நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கிறேன்.

அடுத்து, 2024 மார்ச் 18ஆம் திகதி வெளியிடப்பட்ட ஐரோப்பிய ஆணைக்குழுவின் அறிக்கையின்படி, புதிய 'கார்' கள் மற்றும் 'வேன்'களின் காபனீரொட்சைட் - $CO_2$. வெளியேற்றம் பற்றிய உண்மையான அளவுக்கும் வாகனப் பரிசோதனைச் சான்றிதழ் அறிக்கைக்குமிடையில் பல வித்தியாசங்கள் காணப்படுகின்றன. வாகனங்கள் பரிசோதனைக்காகக் கொண்டு செல்லப்படாமலே அந்தச் சான்றிதழ்கள் சில இடங்களில் கொடுக்கப்படுவதாக நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. இவ்வாறான நிலைமைகள் சுகாதாரச் சீர்கேடு மற்றும் பாரிய சூழல் பாதிப்பை ஏற்படுத்தும் என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். அண்மையில் நான் இது தொடர்பில் 27(2)இன்கீழ் கௌரவ அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்டதற்கு, கௌரவ அமைச்சர் அவர்கள் வழங்கிய பதிலின் அடிப்படையில், இந்தப் பரிசோதனையின்மூலம் ஒரு வருடத்துக்குரிய வருமானமாக கிட்டத்தட்ட 484 கோடி ரூபாய் கிடைப்பதாகவிருந்தால், அதில் 364 கோடி ரூபாய் தனியார் துறையினருக்குப் போவது தெரிய வருகின்றது. எதையெதையோ அரச நிறுவனங்கள் செய்யக்கூடியதாக இருக்கையில், ஏன் இவ்வளவு பெரிய தொகையை அரசு வருமானமாகப் பெற முடியாது? இதை மீதப்படுத்திச் சுற்றாடல் அதிகாரசபைக்குக் கொடுத்தால், வீதியோரங்களில் அல்லது தேவைப்படும் ஏனைய இடங்களில் மரங்களை நாட்டி சுற்றாடலைப் பாதுகாப்பதற்கு அவர்கள் நடவடிக்கை எடுப்பார்கள். அந்த அடிப்படையில், கௌரவ அமைச்சர் அவர்கள் இதுபற்றி கொஞ்சம் பரிசீலனை செய்ய வேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக் கொள்கிறேன்.

பாராட்டக்கூடிய விடயங்களை எடுத்துக்கொண்டால், கடவத்தை - மீரிகம Expresswayஐ அவசரமாகச் செய்வதற்கான ஏற்பாடுகளைச் செய்வது உண்மையில் பொருத்தமானது. அதேபோல, புத்தளம் இலவங்குளம் ஊடாக மன்னாருக்குப் போகின்ற அந்தப் பாதையைத் திறப்பது தொடர்பாகப் பல இடங்களிலும் கேட்டோம், பல முயற்சிகளை எடுத்தோம், எங்களுடைய மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் கதைத்திருக்கின்றோம். நீதிமன்றத் தடை உத்தரவால் அது நிறுத்தப்பட்டுள்ளது. அதனால், புத்தளம்-மன்னார் கடலோரமாக ஒரு வீதியை அமைப்பது சம்பந்தமாகவும் யோசித்தோம். அதற்குரிய ஏற்பாடுகளைச் செய்வதுபற்றி கௌரவ அமைச்சர் அவர்கள் பரிசீலிக்க வேண்டும். அந்த வீதி அமைக்கப்படும்போது அந்தப் பகுதிகளில் பாரிய அபிவிருத்தியை மேற்கொள்ளக்கூடியதாக இருக்கும். உண்மையில் அந்த வீதி எதற்காக மூடப்பட்டது என்பது உங்களுக்குத் தெரியும். இது தொடர்பாக நாங்கள் கூடுதலாகப் பேசி அந்த விடயத்தைப் பெரிதாக்குகிறோ மென்பதல்ல. ஆனால், போக்குவரத்துக்கான தேவைப்பாடு இருக்கிறது. சிலரின் திட்டமிட்ட ஏற்பாட்டால்தான் இந்த வீதியின் அபிவிருத்தி நிறுத்தப்பட்டிருக்கின்றது என்பது கௌரவ அமைச்சர் அவர்களுக்கும் தெரியும். அந்த அடிப்படையில், அவசரமாக அதற்கான ஏற்பாடுகளையும் செய்து தரவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

2024இல், "இதோ! தலைமன்னார் - இராமேஸ்வரம் ferry service ஆரம்பிக்கப் போகிறது; Tender கோரப்படப் போகின்றது" என்றெல்லாம் கூறப்பட்டது. ஒன்றுமே நடைபெறவில்லை. இந்த Budgetஇன் ஊடாகவும் எதுவும் நடைபெறும்போலத் தெரியவில்லை. எமது நாட்டினுடைய அபிவிருத்திக்கும் பொருளாதார எழுச்சிக்கும் இந்த ferry service பாரிய உந்துசக்தியாக அமையுமென்று நான் நினைக்கிறேன். தலைமன்னார் - இராமேஸ்வரம் ferry serviceஐ அவசரமாக ஏற்பாடு செய்வதற்கான பல விசேட meetings மன்னாரில் நடைபெற்றது. கடைசியில் tender கோருகின்ற நிலைமையில்தான் இருந்தது என்று சொன்னார்கள். ஆகவே, அதை முடிப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டுமென்று நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வவுனியா, நெடுங்கேணி பகுதியில் விலாசிக்குளம் என்ற ஒரு பாலத்திற்கு அடிக்கல் நாட்டினோம். அதற்கான வேலைகளை ஆரம்பிக்கவிருந்தவேளை பொருளாதார நெருக்கடியால் அது நிறுத்தப்பட்டது. அதேபோல் கல்மடு, காக்கையன்குளம் கிராமங்களை இணைக்கக்கூடிய பாலத்திற்கான கட்டுமானப் பணிகள் கைவிடப்பட்ட நிலையிலுள்ளது. எருக்கலம்பிட்டி மீனவர்களுக்கான கல்லடிப் பாலம் ஒப்பந்தம் செய்யப்பட்டு, ஒப்பந்தகாரர்களுக்கு வழங்கப்பட்டு, கட்டுமானப்பணிகள் ஆரம்பிக்கவிருக்கையில் தேர்தல் வந்து விட்டது. அதனால் அதற்குரிய எந்தவித முன்னேற்றமும் இல்லாமல்

போய்விட்டது. குறிப்பாக, இந்த 3 பாலங்களும் பிரதானமாகத் தேவையானவை. கடந்த அரசாங்கம் ஆரம்பித்த வேலைத்திட்டங்களில் தேவையானவற்றை நீங்கள் செய்திருக்கிறீர்கள். அந்த அடிப்படையில் இவற்றையும் எடுத்துச் செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களில் SLTB ஊடான போக்குவரத்துச் சேவையை எடுத்துக்கொண்டால், எல்லாப் பகுதிகளிலும் அவர்களுக்கு வழங்கப்பட்ட சேவை அட்டவணையில் உள்ளவற்றில் கிட்டத்தட்ட 60 சதவீத சேவைகள்தான் நடைபெறுகின்றது. முழுமையான சேவையைச் செய்யமுடியாததற்கான காரணம், பல பஸ்கள் பழுதடைந்திருப்பதாகும். அவற்றின் enginesஇற்குரிய உதிரிப்பாகங்கள் பற்றாக்குறையால் அவற்றைப் பழுதுபார்க்க முடியாதிருக்கின்றது. இதனால் மாணவர்கள் முதல் அரச உத்தியோகத்தர்கள் மற்றும் பொதுமக்கள் வரை எல்லோரும் பாரிய போக்குவரத்துக்குப் பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். உண்மையிலே, யாழ்ப்பாணத்தில் இருந்து மன்னாருக்கும், வவுனியாவுக்கும் எந்தநாளும் அதிகாரிகள் பயணம் செய்கின்றார்கள். அந்த அடிப்படையில், அவர்களுக்குத் தேவையான பஸ் வசதிகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அத்துடன் சாரதிகள் மற்றும் conductors போன்றவர்களுக்கான தேவைகளையும் அடையாளங்கண்டு விரைவாக அவர்களை நியமிக்க வேண்டும். இப்போது அவர்களை நியமிப்பதற்காக விண்ணப்பம் call பண்ணியிருக்கின்றீர்கள். எனவே, அதை விரைவுபடுத்திச் செய்து தருமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, மன்னார் SLTBஇற்குரிய 12 ஏக்கர் காணி இன்னமும் எல்லைப்படுத்திக் கொடுக்கப்படவில்லை; அதற்குரிய எல்லை வேலிகள் போடப்படவேண்டி இருக்கின்றது. ஏனைய bus depotsஉம் மோசமான நிலையிலான உள்ளக வீதிகள் மற்றும் பழமைவாய்ந்த கட்டிடங்களைக் கொண்டுள்ளன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அங்கு போயிருப்பீர்கள்; அந்த நிலைமைகள் உங்களுக்குத் தெரியும். அந்த அடிப்படையில், அவற்றையும் நிவர்த்திசெய்து தருவதற்குரிய வேலைத் திட்டங்களையும் மேற்கொள்ள வேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, மன்னார்த் தீவுப் பகுதிகள் சாதாரணமாகச் சிறிய மழைக்கும் பாரிய வெள்ளக்காடாக மாறும் நிலை காணப்படுகின்றது. ஒரு சிறிய மழைக்கும் அவர்கள் இடம்பெயரவேண்டிய நிலை ஏற்படுகின்றது. இப்போது பெய்கின்ற மழைக்கும் அப்படித்தான் இருக்கின்றது. இதனால், அப்பிரதேச மாணவர்களின் கல்விச் செயற்பாடு மற்றும் அந்த மக்களுடைய பொருளாதாரம் பாரிய ஒரு வீழ்ச்சியை நோக்கிச் செல்கின்றது. எனவே, வெள்ள அனர்த்தத்திலிருந்து மன்னார் மக்களைப் பாதுகாக்கும் வகையில் அதற்குரிய திட்டங்களைச் சரியாக வகுத்து, வடிகால் அமைப்பை ஒழுங்குபடுத்திக் கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதுபோல, NHDA வீட்டுத் திட்டங்களைப் பொறுத்தவரை கடந்த அரசாங்கம் ஏதேனும் காரணத்தினால் அவற்றை விரைவாக முடித்துக் கொடுப்பதற்குரிய ஏற்பாட்டைச் செய்யா விட்டாலும், அந்த வீட்டுத் திட்டத்தில் ஆரம்பிக்கப்பட்ட வீடுகளைக் கட்டி முடிப்பதற்கான நிதியை நீங்கள் கொஞ்சம் கொஞ்சமாகவேனும் வழங்க வேண்டும். அந்தநேரம் அது ஐந்து இலட்சம் ரூபாய் பெறுமதியில் ஆரம்பிக்கப்பட்ட வீட்டுத் திட்டம்! இப்போது அது போதுமானதல்ல. அதைக் கட்டி முடித்தவர்களைவிட, கட்டி முடிக்காதவர்களுக்கு அந்த நிதியைப் பத்து இலட்சம் ரூபாயாக அதிகரித்துக் கொடுக்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

மன்னார், முல்லைத்தீவு மற்றும் வவுனியா மாவட்டங்களை எடுத்துக்கொண்டால், 3 மாவட்டங்களிலுமாக கிட்டத்தட்ட 3,000க்கும் மேற்பட்ட குடும்பங்களுக்கு வீடுகளை முடித்துக் கொடுக்கவேண்டிய நிலைப்பாடு இருக்கின்றது என நான் நினைக்கின்றேன். அந்த வீட்டுத் திட்டத்திற்கு வழங்கப்பட்ட நிதி முதலில் 500,000 ரூபாயாக இருந்து, பின்னர் 750,000 ரூபாயாக அதிகரிக்கப்பட்டது. எனவே, அதை இப்பொழுது 1,000,000ஆக அதிகரித்து அவர்களுக்குக் கொடுக்கக்கூடிய விதத்தில் ஏற்பாடுகளைச் செய்து கொடுங்கள்! ஏனென்றால், ஏற்கெனவே இந்த வீட்டுத் திட்டத்தில் அவர்களை உள்வாங்கி இருப்பதால், வேறு எந்த வீட்டுத் திட்டத்திலும் அவர்களை உள்வாங்க முடியாது. அவர்கள் குடிசை வீடுகளில் இருந்தாலும் அதை உடைத்துத்தான் வீடு கட்ட ஆரம்பித்தார்கள். அத்துடன், 2009க்கு முன்னர் கல்யாணம் செய்தவர்களுக்குத்தான் 1,000,000 ரூபாய் வீட்டுத் திட்டம் வழங்கப்படுகின்றது; அது ஒரு பாரிய குறைபாடு. ஏனென்றால், ஊனமுற்றவர்களும் கடும் நோயினால் பாதிக்கப்பட்டவர்களும் இதில் உள்வாங்கப்பட வேண்டும். அந்தவகையில், உங்களுடைய திட்டத்தை மீள்பரிசீலனை செய்து அவர்களையும் அந்த வீட்டுத் திட்டத்தில் உள்வாங்க நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ உறுப்பினர் கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள். உங்களுக்கு ஒன்பது நிமிடங்கள் இருக்கின்றது.

[பி.ப. 2.52]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போக்குவரத்து நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு மற்றும் நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு ஆகியவற்றின் இன்றைய குழுநிலை விவாதத்தில் பேசுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். விசேடமாக, இந்த அமைச்சுகளுக்கு இந்த வருடம் அதிகளவான நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. கடந்த காலத்திலே கூடுதலான ஊழல், மோசடிகள் நடந்த ஓர் அமைச்சாகக் காணப்பட்ட இந்த நெடுஞ்சாலைகள் அமைச்சு, தற்பொழுது ஒரு சிறந்த நிருவாகக் கட்டமைப்போடு புனரமைக்கப்பட்டுச் செயற்படுவதைக் காணக்கூடியதாக

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

இருக்கின்றது. அந்த வகையிலே, இங்கேயிருக்கின்ற கௌரவ அமைச்சர் அவர்கள் எங்களது பிரதேசத்தை மையப்படுத்திப் பல வேலைத்திட்டங்களைச் செய்து தருவதாக வாக்குறுதி யளித்ததையிட்டு நான் மகிழ்ச்சியடைகின்ற அதேவேளை, அவருக்கு எனது நன்றியையும் வாழ்த்துகளையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

விசேடமாக, கிராமிய வீதிகள் புனரமைப்பு வேலைத்திட்டத்திற்குக் கூடுதலான நிதி ஒதுக்கப் பட்டிருக்கின்றது. அம்பாறை மாவட்டத்திலே மிகவும் பாதிக்கப்பட்ட வீதிகளைக்கொண்ட பிரதேசங்கள் உள்ளன. அந்தப் பிரதேசங்களுக்கான நிதி வழங்கல் கடந்த கால ஆட்சியாளர்களால் திட்டமிடப்பட்ட முறையிலே மிகவும் குறைக்கப்பட்டிருந்ததனால் வீதி அபிவிருத்தி என்பதும் அங்கு மிகவும் குறைவாக இருந்தது. உதாரணமாக, ஆலையடிவேம்பு, திருக்கோவில், பொத்துவில், காரைதீவு, நாவிதன்வெளி, கல்முனை, மல்வத்தை, வளத்தாப்பிட்டி போன்ற பிரதேசங்களிலே கூடுதலான கிராம வீதிகள் புனரமைக்கப்படாமல் இருக்கின்றது. இந்தப் பிரதேசங்களிலே செறிந்து வாழுகின்ற மக்கள் மிகவும் துன்பமான, இக்கட்டான நிலையிலேயே போக்குவரத்துச் செய்ய வேண்டியுள்ளது. அங்கு மிகவும் அவசரமாகப் புனரமைப்புச் செய்ய வேண்டிய நிலையில் கிட்டத்தட்ட 72 கிலோமீற்றர் நீளமான வீதிகள் இருக்கின்றது. அதில் அரைவாசியையாவது - அடையாளங் காணப்பட்ட சில கிராமிய வீதிகளையாவது - நீங்கள் விரைவில் புனரமைத்துத் தரவேண்டுமென்று இந்த உயரிய சபையினூடாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அதுமட்டுமல்ல, அங்குள்ள ஆலையடிவேம்பு பிரதேசத்தில் மழை நீர் வழிந்தோடுவதற்கான சரியான வடிகாலமைப்பு - drainage system - இல்லாததன் காரணமாக மழை காலத்திலே கிட்டத்தட்ட 3-4 மாதங்கள் அந்த ஊரே வெள்ள நீரில் தாழ்ந்திருக்கும். இதனால் ஒவ்வொரு வருடமும் அந்த மக்கள் பாதிக்கப்பட்டு வருகிறார்கள். போன வருடமும் அவர்கள் கூடுதலாகப் பாதிக்கப்பட்டிருந்தார்கள். கிட்டத்தட்ட 10,000இற்கும் மேற்பட்ட மக்கள் ஒவ்வொரு வருடமும் இடம்பெயர்ந்திருக்கிறார்கள். இது சம்பந்தமாக இதற்கு முன்பும் இந்தச் சபையிலே குறிப்பிடப்பட்டது. அந்தப் பிரதேசத்திலே கிட்டத்தட்ட 37,000 பேர் வாழுகின்றார்கள். அங்குள்ள ஏனைய பிரதேசங்களிலே இருக்கின்ற நிலங்கள் நிரப்பப்பட்டதன் காரணமாக இப்பிரதேசத்திலே அனைத்து நீரும் உள்வாங்கப்பட்டுக் காணப்படுவதே இந்த நிலை ஏற்படுவதற்குக் காரணமாகும். ஆகவே, அந்தப் பிரதேசத்திற்கு உரிய வகையில் சிறந்த ஒரு drainage systemஐ ஏற்படுத்தித் தரவேண்டும். கிட்டத்தட்ட 7 - 8 கிலோமீற்றர் அளவிலான மிதமான ஒரு drainage systemஐ ஏற்படுத்தித் தருவீர்கள் என்றால், அங்குள்ள பாடசாலை மாணவர்கள், பொதுமக்கள் ஆகிய அனைவரும் மழைக்காலத்திலே எந்தவிதப் பிரச்சினையும் இல்லாமல் தத்தமது நடவடிக்கைகளில் ஈடுபடக்கூடிய சூழ்நிலை ஏற்படும். எனவே, தயவுசெய்து அதிலே கூடுதல் கவனத்தைச் செலுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதுமட்டுமல்லாமல், அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற கிட்டங்கி பாலம் மிகவும் பழைமை வாய்ந்தது. இது புனரமைக்கப்படாமையால் காலத்திற்குக் காலம் - வருடத்தில் மூன்று மாதம் - கிட்டத்தட்ட ஓரிலட்சத்துக்கும் மேற்பட்ட மக்களின் பிரயாணம் தடைப்பட்டுக் காணப்படுகின்றது. இது அமைச்சர் அவர்களுக்கும் தெரியும் என்று நான் நினைக்கின்றேன். ஏனென்றால், DCC meeting இலும்கூட இந்த விடயம் சம்பந்தமாகக் கதைக்கப்பட்டது. மழை பெய்தால் அதனூடாக மாணவர்களோ, வயல் வேலைக்குச் செல்பவர்களோ, வேறு தொழில்களுக்காகச் செல்பவர்களோ அல்லது வேறு எவருமே போக்குவரத்துச் செய்யமுடியாத நிலை காணப்படுகின்றது. இதன் காரணமாக அந்தப் பிரதேசங்களில் அவர்கள் முடக்கப்படும் நிலை ஏற்படுவதுடன், ஒவ்வொரு வருடமும் உயிரிழப்புகள்கூட ஏற்பட்டிருப்பதை நாங்கள் காணக்கூடியதாக இருந்தது. மழை காலத்திலே இவ்வாறான துர்ப்பாக்கிய நிலை காணப்படுவதால், நாவிதன்வெளி, சம்மாந்துறைப் பிரதேசங்களில் இருக்கின்ற மக்கள் 54 கிலோமீற்றர் வரை சுற்றித்தான் கல்முனை போன்ற பிரதேசங்களுக்குச் செல்ல வேண்டிய ஒரு நிலை காணப்படுகின்றது. ஆகவே, இதில் கவனமெடுத்து, கிட்டங்கி பாலத்தைப் புனரமைத்துத் தரவேண்டுமென்று இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், விசேடமாக மட்டக்களப்பிலிருந்து பொத்துவில் வரை railway பாதைக்கான தண்டவாளங்களை அமைத்து - அது கிட்டத்தட்ட 90 கிலோ மீற்றர் தூரம் என்று நான் நினைக்கின்றேன் - railway systemஐ செய்வீர்களானால், அது உற்பத்திப் பொருட்களைக் கொண்டுசெல்வதற்கும், மக்களின் பிரயாணத்தை இலகுபடுத்துவதற்கும் உதவியாக இருக்கும். அந்த வகையில், கூடுதலான மக்களுக்குப் பிரயோசனமாக இருப்பதோடு, அங்கு உல்லாசப் பிரயாணத் துறையை மேலும் வளர்த்துக்கொள்ளக்கூடிய ஒரு சந்தர்ப்பத்தையும் அது உருவாக்கும். 25- 30 வருடங்களுக்கு முன்னர் பிரேமதாஸவின் ஆட்சிக் காலத்தில் ஈரானின் நிதி உதவியுடன் இந்தப் பாதையை அமைக்கத் திட்டமிடப்பட்டிருந்தும் ஏதோ வகையில் அது நிறுத்தப்பட்டது. ஆகவே, இது சம்பந்தமாகவும் கூடுதலாக கவனம் எடுத்துக்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, மிக முக்கியமான விடயம், ஒரு வருடத்துக்கு முன்னர் வவுனியாவில் இருந்து அதிகாலை 3.45 மணி மற்றும் 5.15 மணிக்கு கொழும்புக்குப் பயணங்களை மேற்கொண்டிருந்த 'ரஜரட்ட ரெஜின' புகையிரத சேவை கடந்த ஒரு வருடகாலமாக நிறுத்தப்பட்டு, தற்பொழுது அநுராதபுரத்தில் இருந்துதான் நடைபெறுகிறது. இதனால் அதில் பயணஞ்செய்த பிரயாணிகள் அனைவரும் இக்கட்டான ஒரு நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். அதிகாலை 3.45 மணிக்கு நடைபெறும் train சேவையினை start பண்ணாவிட்டாலும் பரவாயில்லை, அதிகாலை 5.15 மணிக்கான புகையிரத சேவையை ஆரம்பித்தால், யாழ்ப்பாணம், முல்லைத்தீவு, மன்னார் மற்றும் கிளிநொச்சி பகுதிகளிலிருந்து வருகின்ற அனைத்துப் பயணிகளும் இலகுவாகப் பயணிக்கக்கூடிய ஒரு சூழ்நிலை ஏற்படும். ஆகவே, அதிகாலை 5.15 மணிக்கு வவுனியாவில் இருந்து கொழும்பு நோக்கிய புகையிரதச் சேவையை நீங்கள் மேலும் விஸ்தீரணப்படுத்தி, மீள ஆரம்பிப்பதற்கான ஒழுங்குகளைச் செய்ய வேண்டுமென்று இந்தச் சபை ஊடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அந்த வகையில், அந்தச் சேவையினை மீளவும் ஆரம்பிக்க வேண்டும்.

அடுத்ததாக, கல்முனைப் பிரதேசத்திலுள்ள நீலாவணை மாடி வீட்டுத் திட்டம் மற்றும் குருந்தையடி வீட்டுத் திட்டம் - condominium system - ஆகியவற்றுக்காக அமைக்கப்பட்டுள்ள toilet pit அனைத்தும் உடைந்து,

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Hon. Presiding Member, please give me a minute.

மழைக் காலத்தில் மூன்று மாதங்கள் அந்த மலசலகூடத் தண்ணீர் இடுப்புக்கு மேலே வரையில் தேங்கி நின்று, அந்தப் பிரதேசம் மிகவும் துர்நாற்றம் வீசுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலை காணப்பட்டது. கிட்டத்தட்ட ஐந்நூறு வீடுகள் அந்த வீட்டுத் திட்டத்தில் இருக்கின்றன. எனவே, அந்த வீட்டுத் திட்டத்தின்மீது முழுக் கவனத்தையும் செலுத்தி, Clean Sri Lanka திட்டத்தின் ஊடாக அதனை நிவர்த்தி செய்ய நடவடிக்கை எடுக்க வேண்டும். DCC meetingஇல் இது தொடர்பில் பல தடவை விவாதிக்கப்பட்டு, அதனைச் செய்ய வேண்டுமென ஒரு முன்மொழிவும் கொண்டுவரப்பட்டது. இந்த விடயங்களைக் கவனத்தில் எடுத்து, உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවිර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.02]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගමත්, නගරයත්, මුළු ලෝකයත් යාවෙන අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ සම්බන්ධයෙන් තමයි අද අපි කථා කරන්නේ. විශේෂයෙන් ගත්තොත්, අපේ ආණ්ඩුව බලයට පත් වෙන්නේ ජනතාවගේ මූලික ප්‍රශ්න අනිවාර්යයෙන්ම විසඳීමේ අරමුණ සහිතවයි. හැබැයි, රටේ පෙළ ගැහිලා තිබෙන දැවැන්ත ප්‍රශ්න කන්දරාව විග්‍රහ කර බලද්දී අමාත්‍යාංශයක් හෝ අමාත්‍යාංශ කිහිපයක් සම්බන්ධ කරගෙන මේ ප්‍රශ්න විසඳන්න යන එක සරල කාරණයක් නොවෙයි. ඒක නිසා මට විශේෂයෙන් කියන්න ඕනෑකම තිබෙන්නේ මෙයයි. අපි යථාර්ථය දකින්න ඕනෑකම තිබෙනවා. මීට පෙර ඉදිරිපත් කෙරුණු අදහස් තිබුණා. ඒවාට අපි ලොකු අදහසක් කියන්න යන්නේ නැහැ. සියලු දේවල් නිමා කරලා අපට කරන්න මොකුත් නැහැ කියන අදහසක් සමාජගත කරන්න තමයි විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් උත්සාහ කරමින් හිටියේ. විශේෂයෙන්ම මම කථා කරන්නම්, මට අදාළ දිස්ත්‍රික්කය වන නුවරඑළිය දිස්ත්‍රික්කය ගැන. ඉතාම සංවේදී දිස්ත්‍රික්කයක අපි ඉන්නේ. මේ දිස්ත්‍රික්කය ඇතුළේ දැවැන්ත ආර්ථිකයක් තිබෙනවා. හද්දා පිටිසර ගම්මාන ඇතුළේ තමයි මේ කෘෂි කර්මාන්තයට සම්බන්ධ ආර්ථිකය ගොඩනැඟෙමින් තිබෙන්නේ.

මේ ආර්ථිකය නගරයට යන්න ඕනෑ. ගමේ ප්‍රශ්න කෝටියක් තිබෙනවා; වතුර ප්‍රශ්න, පාරවල් ප්‍රශ්න, නිවාස ප්‍රශ්න රාශියක් තිබෙනවා. දැන්, ඉස්සෙල්ලා නුවරඑළිය ගැන කථා කරපු මන්ත්‍රීවරයෙක් පුරාජේරුවකුත් කිව්වා, ඒ ප්‍රදේශවල ඔක්කෝම කරලා තිබෙනවා වාගේ. මම ඒ අයට ආරාධනා කරනවා, පුළුවන් නම් නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙන ගම්මානවලට, නගරවලට ඇවිල්ලා යන්න කියලා. නගරයට ගියාම නගරයේ මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? නගරයේ වතුර ටික නැහැ. ටොයිලට් පද්ධතියක් නැහැ. ලෝකයේ අනෙකුත් රටවල නගරයකුයි, විශේෂයෙන්ම ලංකාවේ ගම්මාන ආශ්‍රිතව තිබෙන නගරයකුයි බැලුවාම අපේ ලංකාවේ තිබෙන ඒවා නගර නොවෙයි. අපි නුවරඑළිය දිස්ත්‍රික්කය විධියට ගත්තොත්, ගම්මාන සංවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් අපට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි නගර සංවර්ධනය සම්බන්ධයෙන් දැවැන්ත වැඩ කොටසක් අපට කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා, ආණ්ඩුව මේ අය වැය හරහා නගර සංවර්ධන සැලැස්ම යටතේ හැටන් නගරය සංවර්ධනය සඳහා රුපියල් මිලියන 500ක මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, ඒක ප්‍රමාණවත් මදි කියලා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඈත පිටිසර තිබෙන පූඩලුඔය, ගිනිගත්හේන, මස්කෙළිය, බගවන්තලාව, ඩයගම, කොටගල, තලවාකැලේ, රාගල යන නගර පිළිවෙළකට සංවර්ධනය කිරීමේ වගකීම වත්මන් ආණ්ඩුවට පැවරිලා තිබෙනවා. මේ අමාත්‍යාංශ හරහා අපි 2025 වර්ෂයේ යම් වැඩ කොටසක් කරන්න පටන් ගෙන තිබෙනවා. 2026, 2027, 2028 කාල සීමාවේ ගෙන එන අය වැය හරහා මේ අමාත්‍යාංශ ඒකාබද්ධ කරගෙන අපි අනිවාර්ය ලෙසම නගර ටික පිළිවෙළට හදන වැඩේ පටන් ගන්නවා.

මම විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ සංවේදී කාරණයක් තිබෙනවා. අපේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන පාරවල් අබලන් වෙලා තිබෙන්නේ. ඒවා ප්‍රතිසංස්කරණය සඳහා දැවැන්ත හයියක් අපේ ප්‍රවාහන ඇමතිතුමා -බිමල් රත්නායක ඇමතිතුමා- ලබා දෙනවා. එතුමා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාරවල් හදන්න විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. අද දවසේත්, මාර්ග අබලන් වීම නිසා බස් රථ ධාවනය නොකරන පාරවල් තිබෙනවා. මම ඒ සඳහා උදාහරණයක්, දෙකක් මතක් කරන්නම්. නිල්දණ්ඩාහින්න මල්ලාගම හරහා තෙරිපැහැ මාර්ගය ගත්තොත්, - මම හිතන විධියට අපේ බිමල් ඇමතිතුමාටත් පසුගිය දවස්වල message එකක් ඇවිල්ලා තිබුණා. මටත් message එකක් ආවා - එම පාරේ බස් වැඩ කරන්නේ නැහැ, බස් එකක් දුවන්න බැරි පාරක් කියලා. ඒ වාගේම, පදියපැලැල්ල-ගුඩ්වුඩ් මාර්ගය කියා මාර්ගයක් තිබෙනවා. ඒ පාරේත් බස් වැඩ කරන්නේ නැහැ. විශේෂයෙන් ගත්තොත්, අදටත් මාර්ගය අබලන් වෙලා බස් ධාවනය බැරි තරමට අබලන් වූ පාරවල් 24ක් තිබෙනවා. ඒ මාර්ග සම්බන්ධයෙන් වූ නාම ලේඛනයක් මම **සභාගත*** කරනවා.

මාර්ග 24ක් තිබෙනවා. ඒවායේ බස් දුවන්නේ අමාරුවෙන්. දවසක් දිව්වොත් දවස් දෙකක් බස් එක කැඩිලා. ඒ තරම් ලොකු වළවල් සහිත පාරවල් තිබෙනවා. හැබැයි, ඔක්කෝම ආධ්‍යා කරලා තිබෙනවා, වැඩේ ගොඩ දමලා තිබෙනවා කියලා තමයි විපක්ෂය පැත්තෙන් කියන්නේ. ගමයි, නගරයයි යා කරන ප්‍රවාහනයේ ප්‍රධාන මෙවලමක් තමයි බස් රථ. අපිට නුවරඑළියේ වැඩිපුර තිබෙන්නේ SLTB බස්. අද වනවිට බස් රථ නොමැතිකම නිසා පාරවල් 20ක අද බස් නැහැ; බස් රථ දුවන්නේ නැහැ. එහෙම අර්බුදයක් තිබෙනවා. මෙන්න මේ වාගේ තත්ත්වයක් තමයි මේ මොහොත වන විට අපේ රටේ තිබෙන්නේ. ඒක තමයි යථාර්ථය. මේ යථාර්ථයෙන් ඔබ්බට යන්න තමයි අපිට මේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

ජනවරම දීලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් අපට ලොකු වැඩ කොටසක් කරන්න තිබෙනවා. ඒකෙදී අපි කල්පනා කරනවා, විශේෂයෙන්ම රටේ ආර්ථික ශක්තිය පදනම් කරගෙන පිළිවෙළකට නගර ටික හදන්න, ග්‍රාමීය පාරවල් ටික හදන්න. ගිය අවුරුද්ද - 2025 වසර - ගත්තොත්, ඒ වෙනුවෙන් අපිට මිලියන 3,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් රජය විසින් දීලා තිබෙනවා. ඊට අනුරූපව පාරවල් 44ක් මේ වෙනකොට කාපට් යොදා සකස් කරමින් තිබෙනවා. පළාත් සභාව හරහා, PRDA එකත් පාරවල් විශාල ප්‍රමාණයක් සකස් කරමින් තිබෙනවා. මිලියන 1,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් වැය කර පාරවල් සකස් කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට දැවැන්ත වැඩ කොටසකට අපි මූලාරම්භය සපයා තිබෙනවා. ජනතාවගේ පැත්තෙන් නඟන එකම මැසිවිල්ල තමයි, අපි යන හැම තැනකදීම - මහජන දිනයක් වෙන්න පුළුවන් - "මන්ත්‍රීතුමා, සහෝදරයා, පාර හදලා දෙන්න" කියන එක. වතුර නැතත් කමක් නැහැ, අපට පාර හදලා දෙන්න කියන එක තමයි ඔවුන්ගේ මැසිවිල්ල වෙලා තිබෙන්නේ. දීර්ඝ කාලයක් තිස්සේ පීඩා ලැබූ ජනතාව වෙනුවෙන් වත්මන් ආණ්ඩුව අනිවාර්ය ලෙසම වගකීමක් අරගෙන තිබෙනවා. අපි මේ වගකීමෙන් පළා යන්නේ නැහැ. වගකීමට වගවෙමින්, කැප වෙමින් අනිවාර්යයෙන්ම මේ මූලික ප්‍රශ්න විසඳමින් අපි රටක් විධියට ඉස්සරහට යන්න කටයුතු කරනවා. ඒ සඳහා දෙන්න පුළුවන් සහාය දෙමින් ඉදිරියට යන්න අපිත් එක්ක සම්බන්ධ වෙන්න කියලා විපක්ෂයට අපි ආරාධනා කරනවා. එම ඉල්ලීම කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ඉම්රාන් මහරුෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 3.10]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂ පිළිබඳව කථා කරන අද දවසේ මටත් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. කාරණා ගොඩාක් පිළිබඳව කරුණු කියන්නට තිබුණත්, මේ ලැබී තිබෙන කාල සීමාව තුළ එක කාරණාවක් පිළිබඳව තමයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

විශේෂයෙන්ම ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ තිබෙන දුම්රිය දෙපාර්තමේන්තුව ගැන තමයි මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ. මම විශ්වවිද්‍යාලයට තේරුණාට පස්සේ මාතර ඉඳලා කොළඹටත්, කොළඹ ඉඳලා මාතරටත් ප්‍රවාහන මාධ්‍ය විධියට යොදා ගත්තේ දුම්රියයි. ඇත්තටම ඒ කාලයේ ලබපු අත්දැකීම් එක්ක සහ දවස ගාණේ දුම්රිය භාවිත කරන ලක්ෂ සංඛ්‍යාත ජනතාව මුහුණ දෙන ගැටලු එක්ක තමයි මම මේ යෝජනාව කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඇත්තටම දුම්රිය භාවිත කරන මගීන්ට කාලය කළමනාකරණය කිරීමේ පහසුව සඳහාත්, දුම්රිය කාලසටහන පිළිබඳ තොරතුරු ලබා දීම වෙනුවෙනුත් දුම්රියේ ගමන් කරන තරුණ කණ්ඩායමක් මීට අවුරුදු 9කට කලින් mobile app එකක් හැදුවා, RDMNS.LK කියලා. ඔවුන් මේක ලාභ නොලබන රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කර තිබෙනවා, RDMNS Railway Network යනුවෙන්. මේ app එක මේ මොහොත වන විට ලක්ෂ 6ක්, 7ක් විතර download කර තිබෙනවා. ඒ වාගේම දවසකට 1 million විතර views තිබෙනවා; එහෙම නැත්නම්, visits තිබෙනවා. ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවන්, තරුණයින් විසින් නිර්මාණය කරපු මේ app එක කොච්චර දුරට පාවිච්චි කරනවාද කියන කාරණාව. දුම්රියේ ගමන් කරන සාමාන්‍ය මනුස්සයා විතරක් නොවෙයි, ඇත්තටම Sri Lanka Railwaysහි වැඩ කරන සේවකයින්, ඒ නිලධාරින් පවා අද මේ app එක පාවිච්චි කරලා තමයි දුම්රිය එන වෙලාව හරියටම තහවුරු කර ගන්නේ. ඒ විතරක් නොවෙයි. අද විදේශිකයන් පවා, සංචාරකයින් පවා මේ app එක පාවිච්චි කරලා තමයි railway තොරතුරු ලබා ගන්නේ.

මේ app එක කොච්චර වටිනවාද කියනවා නම්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් දැවැන්ත දත්ත ප්‍රමාණයක් ගබඩා කරගන්න අවශ්‍ය පහසුකම මේ සඳහා නොමිලේ ලබා දී තිබෙනවා. මොකද, මේක ලාභ නොලබන ආයතනයක් විධියට ලියාපදිංචි කරපු නිසා. ඒ වාගේම free survey පහසුකම් ද දීලා තිබෙනවා. ඒ වාගේම unlimited capacity එක දීලා තිබෙනවා. හරි නම් මේ වාගේ app එකක් හඳුන්වා දීම රජය මැදිහත් වෙලා කරන්න ඕනෑ දෙයක්. නමුත්, රජය මැදිහත් වෙලා මේ වාගේ දෙයක් ආරම්භ කරලා නැහැ. අනෙක් කාරණාව තමයි, railway/train schedule එක බලාගන්න අද official sources නොමැති වීම. කොටින්ම කිව්වොත්, අපි Sri Lanka Railways website එකට ගියොත්, බලන බලන සැරේට ඒක down වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම කියන්න ඕනෑ තවත් කාරණාවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ app එක GPS තාක්ෂණය හරහා ක්‍රියාත්මක වන එකක් කියලා තමයි බැලූ බැල්මට තාක්ෂණය පිළිබඳව දැනුම තිබෙන කෙනෙකු හිතන්නේ. නමුත් ඇත්තම කාරණාව ගත්තොත්, මෙම app එක ක්‍රියාත්මක වෙන්නේ මෙම දුම්රියේම ගමන් කරන මගීන් කණ්ඩායමක් ස්වේච්ඡාවෙන් ඇඩ්මින්වරු විධියට වැඩ කිරීමෙන්. තවත් කණ්ඩායමක් - 1,000කට වැඩි ප්‍රමාණයක් - train වෙලා, register වෙලා ඔවුන් විසින්ම ලබා දෙන දත්ත ඔස්සේ තමයි මේ app එක ක්‍රියාත්මක වෙන්නේ. සාමාන්‍යයෙන් අපි කෝච්චියක යනකොට සින්දුවක් අහගෙන යාවි, එහෙම නැත්නම් film එකක් බලමින් යාවි, නැත්නම් යාළුවොත් එක්ක විනෝද වෙයි. ඒ තරුණ කණ්ඩායම තමන්ගේ වටිනා කාලය කැප කරලා, තමන්ගේම සහෝදර ජනතාව වෙනුවෙන් සේවයක් කරලා තිබෙනවා. එතකොට රජයක් විසින් කරන්න ඕනෑ දෙයක් තමයි මේ යම් තරුණ කණ්ඩායමක් මැදිහත් වෙලා විශාල සේවයක් ලබා දෙන තත්ත්වයට පත් කර තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මේ කටයුත්තේදී ඔවුන්ගේ අහිංසක පොඩි ඉල්ලීමක් තිබෙනවා. ඔවුන්ගේ ඉල්ලීම තමයි, මේ සේවාව ඵලදායී ලෙස සහ කාර්යක්ෂම ලෙස ලබා දෙන්නත්, ඒ වාගේම මගීන්ගේ කාලය කළමනාකරණය කිරීම සඳහාත් දැනට දුම්රිය කාලසටහන් සංශෝධනය, දුම්රිය ප්‍රමාදවීම්, විශේෂ දුම්රිය එකතු කිරීම, දුම්රිය අවලංගු කිරීම් වැනි නිල දැනුවත් කිරීම් කරමින්, stationsවලට WhatsApp කරලා යවන STN document එක මේ අයගේ ඇඩ්මින් කණ්ඩායමටත් එවන්න කියන එක. මේක මහා ලොකු දෙයක් නොවෙයි. මීට පෙර හිටපු රජයන්හි අමාත්‍යවරු වුණත් මේ කණ්ඩායම් කැඳවා සාකච්ඡා කරලා මේ කටයුත්ත සම්බන්ධව බොහොම පැහැදුණා. විශේෂයෙන්ම Legal Department එක මැදිහත් වෙලා මේ සම්බන්ධව agreement එකක් ගහලා තිබෙනවා, 2024.06.09වැනි දා. Agreement එක ගැහුවාට එදා ඉඳන් මේ දේ ක්‍රියාත්මක වෙලා නැහැ. ඇත්තටම මේකට මූලිකම හේතුව වෙලා තිබෙන්නේ unions; මේ unionsවලින් එන ප්‍රශ්න. මේ සම්බන්ධයෙන් මාෆියාවක් තිබෙනවා, ටිකට් මාෆියාවක් තිබෙනවා. ඕනෑ නම් අපට ඒ පිළිබඳව සාක්ෂිත් ඉදිරිපත් කරන්න පුළුවන්. විශේෂයෙන්ම ඔය unionsවල ඉන්න, මෙගොල්ලන්ම පෝෂණය කරපු leadersලා අද මේකට විරුද්ධව කථා කරන දුරකථන සංවාද පවා අපි ළඟ තිබෙනවා. ඒගොල්ලන් කෙළින්ම කියනවා, "ඔයගොල්ලන්ම ඕක කරගන්න අපි මේකෙන් අයින් වෙන්නම්" කියලා. එහෙම දුරකථන සංවාද තිබෙනවා. ආරංචි විධියට, මේ රජය ආවාට පසුවත් නියෝජ්‍ය ඇමතිතුමා ඒ කණ්ඩායම ගෙන්වා සාකච්ඡා කර තිබෙනවා. එතැනදීම එතුමා දුම්රිය සාමාන්‍යාධිකාරීවරයෙකුට call කරලා නියෝග කර තිබෙනවා, වහාම මේක ක්‍රියාත්මක කරන්න කියලා. නමුත්, අද වනකල් එය ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ අතර තමයි දුම්රිය ටිකට් මාෆියා කතන්දරය එන්නේ. මේ app එක නිසා තමයි මේ මාෆියා කතන්දරය වුණත් ඉස්සරහට එන්නේ, තොරතුරු ගොඩක් අනාවරණය වෙන්නේ. ඒ නිසා තමයි මේ අය හතුරන් ලෙස සලකා, ඔවුන්ට ඒක ලබා නොදෙන තැනට පත්වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමාත් මේ කණ්ඩායම කැඳවා මේ සම්බන්ධව සාකච්ඡා කරලා තිබෙනවා. සාකච්ඡා කරලා ඒ අනුව නැවත වතාවක් මේ ආයතනයට ගිහිල්ලා presentations කරලා, ඒ සියලුම කාරණා නැවත වතාවක් තහවුරු කරලා තිබෙනවා. මේ app එක දුම්රිය දෙපාර්තමේන්තුවටත් කොච්චර ප්‍රයෝජනවත් වෙනවාද කියන කාරණය ලිඛිතව දීලා තිබුණත්, ඒ දේවල් සිද්ධ වෙලා නැහැ. මේ වෙනකොට මේ ආණ්ඩුවට අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. මේ අවුරුද්දක කාලය තුළ මෙවැනි සරල දෙයක්වත් කර ගන්න බැරිවෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම කිව යුතු දෙයක් තිබෙනවා. RDMNS කණ්ඩායමේ සේවය ගැන පැහැදිලා, විශේෂයෙන්ම "දැයට සවිය" කියන සංවිධානය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව Sri Lanka Railways එකෙන් තොරතුරු අරගෙන තිබෙනවා. ඒ කියන්නේ, මේ සම්බන්ධයෙන් Sri Lanka Railways එක ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් RTI application එකක් මඟින් අහලා තිබෙනවා. මොකක්ද, ලැබුණු උත්තරය? උත්තරය තමයි, එහෙම ගිවිසුමක් ඔවුන් ළඟ නැහැ කියන එක. හිතාගන්න බැහැ, මේක කොහෙන් හිනාවෙන්න ඕනෑ කාරණාවක්ද කියලා. මේ ගිවිසුම අපේ අතේ තිබියදීත් Sri Lanka Railways එක කියනවා, එහෙම ගිවිසුමක් නැහැ කියලා. ඉතින් මේ රාජ්‍ය සේවය කොතැනද තිබෙන්නේ කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. එදා අපේ රජය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගෙනා වෙලාවේ ඒකට අත උස්සපු අය අද මේ රටේ නායකයෝ වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, අද ඒ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මේ ආණ්ඩුවට හිසරදයක් වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට, ජනාධිපති මාධ්‍ය අංශයට අනුයුක්ත නිලධාරින්ගේ තොරතුරු ඇහුවාම කියනවා, ඒක ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් ලු. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ ඒ තොරතුරු අරගෙන පට්ට ගැහුවා. ඒ නිලධාරින්ගේ පඩි නඩි, ඔවුන් පාවිච්චි කරන වාහන ගැන කියලා පට්ට ගැහුවා. නමුත්, මේ අය කරන ඥාති සංග්‍රහය; ඒ තැන්වල කවුද ඉන්නේ, කාගේ පුතාද ඉන්නේ කියන කාරණා අනාවරණය වෙනවාට භයේ දැන් කියනවා, ජාතික ආරක්ෂාවට ඒක ප්‍රශ්නයක් කියලා.

අනික් කාරණාව මෙයයි. අපි අහනවා, මේ තීන්දුව ගන්න ඇයි භය කියලා. ගරු ඇමතිතුමනි, අපි දන්නවා, ඔබතුමා විපක්ෂයට සද්ද බද්ද දානවා කියලා. නමුත්, unionsවලට භයේද අද ඒ සද්ද බද්ද දමන්නේ නැත්තේ කියලා අපි අහනවා. මේක බොහොම සරල දෙයක්. ඔබතුමා අද අමාත්‍යාංශයට ගිහිල්ලා එහි සිටින නිලධාරින්ට කිව්වොත්, තරුණයින්ගෙන් සමන්විත ඒ admin කණ්ඩායමට කරුණාකරලා ඔය STN document එක WhatsApp හරහා share කරන්න කියලා, මේක වෙනවා. ඒකයි කරන්න තිබෙන්නේ. මේක බොහොම සරල දෙයක්. ඒ දේ නොකර කල් මැරීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවසාන වශයෙන් මේ සම්බන්ධව කිව යුතු තවත් කාරණයක් තිබෙනවා. මේ පිළිබඳව සාකච්ඡා කිරීම විතරයි වෙන්නේ. අමාත්‍යාංශ දෙකේම සාකච්ඡාවලට ඒ කණ්ඩායම ගියා, හිනාවෙලා ආපහු ඔවුන් එව්වා. ජනාධිපතිතුමා හම්බවෙන්න බොහෝ දෙනෙක් පෝලිමේ ඉන්නවා. ඇතැම් අයට සාකච්ඡා සඳහා අවස්ථාව ලැබෙනවා. එතුමා අහිංසක හිනාවක් දමන එක විතරයි කරන්නේ. හිනාව විතරක් මදි. වැඩ කෙරෙන්න ඕනෑ. මේ වාගේ පොඩි දේවල්වලින් වුණත් බොහෝ ජනතාවකට විශාල සේවයක් කළ හැකියි. එම නිසා මේ සඳහා හැකි ඉක්මනින් පියවර ගන්න කියන ඉල්ලීම ගරු ඇමතිතුමා ඇතුළු කණ්ඩායමට ගෞරවයෙන් යුතුව මා ඉදිරිපත් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙන් සෙනසුරාදාත් RDMNS එකට සාකච්ඡාවක් දීලා තිබෙනවා. නමුත්, ඔවුන් ඇවිල්ලා නැහැ. ඊට මාසයකට කලිනුත් දිනයක් දීලා තිබෙනවා. ඒත් ඇවිල්ලා නැහැ. එතැන නීතිමය කරුණු වගයක් තිබෙනවා, timetables එළියට දීම සම්බන්ධව. නමුත් ඔබතුමා කියපු කතන්දර ටික ඇත්ත. මම වුණත් ඔය app එකෙන් තමයි තොරතුරු බලන්නේ. වැඩිදෙනෙක් ඒකෙන්ම තමයි එම තොරතුරු බලන්නේ. මමත් පෞද්ගලිකව මේ කණ්ඩායම ගෙන්වා කථා කරලා, කලින් හිටපු පරිපාලනයට දැනුම් දුන්නා, පුළුවන් විධියට නීතිමය කාරණා ටික බේරලා මෙය අවශෝෂණය කර ගන්න කියලා. මේ සඳහා අපිත් උපරිම උත්සාහ දරනවා. අපි ආරාධනා කරනවා, ඒගොල්ලන්ට එන්න කියලා. නීතිමය කරුණු ඇතුළත අපට කටයුතු කරන්න පුළුවන්. මේක රජයේ ආයතනයක්. පෞද්ගලික ආයතනත් එක්ක ගනුදෙනු කරනකොට නීතිමය කරුණු කාරණා ටිකක් තිබෙනවා. තරුණ පිරිසක් එකතු වෙලා ස්වේච්ඡාවෙන් තමයි ඒ කටයුතු කරන්නේ. එය හරිම ආකර්ෂණීයයි. නමුත්, රජයේ ආයතනයක් විධියට නීතිමය රාමුව ඇතුළත වැඩ කරන්න අපි බැඳිලා ඉන්නවා. ඒ බැඳීම ඇතුළත අපිත් එක්ක එකතු වෙලා සුහදව ඒ වැඩේ කරන්න කියලා අපි ආරාධනා කරනවා.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර කිහිපයක් දෙන්නම්.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මම තත්පර දෙකක කාලයක් පමණයි ගන්නේ.

විශේෂයෙන්ම මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කිව්ව විධියට මේ සම්බන්ධයෙන් හොඳ ප්‍රතිචාරයක් ලැබුණා. සාමාන්‍යාධිකාරීතුමාට කථා කරලා ඔබතුමා ඒ වෙලාවේම මේ සම්බන්ධව කිව්වා. නමුත්, ඒක සිදු නොවුණු ප්‍රශ්නය තමයි තිබෙන්නේ. විශේෂයෙන්ම Legal Department එකත් එක්ක මේ සම්බන්ධව agreement එකක් ගහලා ඉවරයි නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඉතින් මේක ක්‍රියාත්මක කරන්න නීතිමය ගැටලුවක් නැහැ. ඒ නිසා මේක ක්‍රියාත්මක කරන්නයි තිබෙන්නේ. මේක කරන එක ඔබතුමන්ලාට බොහොම සුළු දෙයක්. පොඩි උපදෙස් කිහිපයක් විතරයි අවශ්‍ය වෙන්නේ.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ඔබතුමා සහ මම මේ සම්බන්ධයෙන් කියන වචන ටික හැන්සාඩ්ගත වෙනවා. ඒ නිසා මේක ලිඛිත ආරාධනයක් විධියට අරගෙන අපිත් එක්ක එකතු වෙලා වැඩේ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (නීතිඥ) චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.20]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ කථාව පටන් ගන්න කලින් කඩුගන්නාව ප්‍රදේශයේ සිදු වුණු ඛේදවාචකයෙන් මිය ගිය සියලු දෙනාටත්, තුවාල ලැබූ සියලු දෙනාටත් අපගේ කනගාටුව පක්ෂයක් විධියටත්, පෞද්ගලිකවත් මම පළ කරන්න කැමතියි. විනාඩි 8ක් පමණක් තිබෙන නිසා මම බොහොම කෙටියෙන් මගේ කථාව කරන්නම්.

මම මුලින්ම ශ්‍රීලන්කන් ගුවන් සේවය සම්බන්ධයෙන් යම් අදහසක් ප්‍රකාශ කරන්න කැමැතියි. ශ්‍රීලන්කන් ගුවන් සේවයට 2025 අවුරුද්ද සඳහා රුපියල් බිලියන 20ක මුදලක් වෙන් කරලා තිබුණාය කියා අපි පසුගිය අවුරුද්දේ කථා වුණා. නමුත්, දැන් එය රුපියල් කෝටි 759ක් අලාභ ලබා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් බලධාරින් මොකක්ද කරන්නේ කියලා අපි දැනගන්න කැමැතියි. මේ අලාභය පුරුදු වෙන්න සිදු කරපු දෙයක් නොවෙයි. මොකද, ශ්‍රීලන්කන් ගුවන් සේවය අලාභ ලබා තිබෙනවා වාගේම ලාභත් ලබා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි තිබෙන ප්‍රශ්නය තමයි ශ්‍රීලන්කන් ගුවන් සේවයට මාස 8ක් තිස්සේ ප්‍රධාන විධායක නිලධාරියෙක් නොමැතිකම. ප්‍රධාන විධායක නිලධාරියෙක් නැතුව ශ්‍රීලන්කන් ගුවන් සේවය මාස 8ක් ක්‍රියාත්මක වෙනවා කියන එකේ භයානකකම ආණ්ඩුව වටහාගෙන නැද්ද කියන්න මම දන්නේ නැහැ. මොකද, අපේ ශ්‍රීලන්කන් ගුවන් සේවය ඉතිහාසයේ ඉඳන්ම බොහොම හොඳ, ආරක්ෂිත සේවාවක් සපයන ගුවන් සේවයක්. මේක, මිනිසුන්ගේ ජීවිත සමඟ කරන වැඩක්. යම්කිසි අනතුරක් සිද්ධ වුණොත් ඒකට වගකිව යුතු ප්‍රධාන විධායක නිලධාරියෙක් පත්කර ගන්න බැරි වෙන තැනට මේ ගුවන් සේවය පත්වෙලා තිබෙනවාය කියන කාරණයත් මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

මම හිතන්නේ අවුරුදු 14ක් විතර පරණ plane එකක් ගෙනැල්ලා, උඩ යවලා, අඬලා එහෙම සන්දර්ශනයක් කළා. නමුත්, අපි නැවත නැවතත් පාඩු ලබනවා. මම හිතන හැටියට, Ground Handling, SriLankan Catering වාගේ අංශ ලාභ ලබනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා මම යෝජනාවක් විධියට ඉදිරිපත් කරන්න කැමැතියි, මේවාට මුදල් ආයෝජනය කරලා යම්කිසි ලාභයක් උපයා ගන්න, තවදුරටත් ලාභය වැඩි කරගන්න කටයුතු කළොත් හොඳයි කියන එක. කොවිඩ් වසංගතය එනකම් තිබුණු ප්‍රමාණයට, මම හිතන්නේ SriLankan Catering එකේ production එක දැන් හදන්න බැහැ. ඒ නිසා කොවිඩ් වසංගතය එනතුරු තිබුණු ප්‍රමාණයටවත් ඒ production එක දැන් වැඩි කර ගන්න. ඒ වාගේම එමිරේට්ස් ගුවන් සමාගමට වාගේම අනෙකුත් ගුවන් සමාගම්වලටත් ඒ සේවාව ලබා දීලා, ඒ තුළින් ආදායමක් ලබා ගනිමු කියන කාරණයත් මම කියන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ශ්‍රීලන්කන් ගුවන් සේවයේ නව අධ්‍යක්ෂ මණ්ඩලය සහ සභාපතිවරයා ගැනත් මම කථා කරන්න ඕනෑ. මේක, මේ ආණ්ඩුව පත් වෙච්ච දවසේ ඉඳලා, අපි මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා තිබෙන ප්‍රශ්නයක්. හේලීස් සමූහ ව්‍යාපාරයත්, මේ ශ්‍රීලන්කන් ගුවන් සේවයත් අතර තිබෙන සම්බන්ධය මොකක්ද, ගරු ඇමතිතුමනි? සරත් ගනේගොඩ සහ රොහාන් පීරිස් ගුණතිලක කියන මහත්වරු දෙදෙනා හේලීස් සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂකවරු වශයෙන් සේවය කරන ගමන් ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සභාපතිවරයා සහ

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු විධියට වැඩ කිරීම සම්බන්ධව පවතින ප්‍රශ්නයට අද වනතුරු කිසිම උත්තරයක් ලබා දීලා නැහැ. ඒ වාගේම අපට ඒ සම්බන්ධයෙන් කිසිම විස්තරයක් දැනගන්නට ලැබිලාත් නැහැ. ඇත්තටම ඒකත්, අනෙක් ඒවා වාගේම තමයි. ඇහුවොත් කියනවා, වැටුප් ගන්නේ නැහැ කියලා. නමුත්, සබඳතා අතර ගැටුමක් තිබෙනවා කියන එක ඕනෑම කෙනෙකුට තේරෙන්නට අවශ්‍යයි. මොකද, හේලීස් සමූහ ව්‍යාපාරයටත් ගුවන් සේවයක් තිබෙනවා නේ. දැන් ඒකවත් මදිද කියායි මම අහන්නේ. ඒ සුළු කාරණාවම ඇති, මම හිතන්නේ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න.

වසන්ත සමරසිංහ ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවේ නැහැ. අන්තර් සමාගම් සේවක සංගමය කියන්නේ, එතුමා කලින් හිටපු ස්ථානය. අන්තර් සමාගම් සේවක සංගමය සමස්ත සේවකයින් වෙත නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, "විෂමාචාර සහ අකාර්යක්ෂමතා පිළිබඳ චෝදනා" කියලා. "දූෂණය, වංචාව, විෂමාචාර පිළිබඳ දැනුම් දී ඇති නමුත්, ඒවා නිරාකරණය කිරීමට අදාළ කළමනාකරණ සහ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය අපොහොසත් වී ඇත. ඒ අනුව මෙම සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ අසාර්ථකභාවය තහවුරු වෙනවා" කියලා ඔවුන්ම කියනවා. ඇමතිතුමනි, ඔබතුමා මේක දැකලා ඇති නේ. අන්තර් සමාගම් සේවක සංගමයෙන් තමයි මේ නිවේදනය නිකුත් කරලා තිබෙන්නේ. මෙහෙම කියන්නේ අපි නොවෙයි. ඒ නිසා ඒගොල්ලන් කියන දේ ගැන හිතලාවත් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා මම කියන්න කැමතියි. මේක පෞද්ගලීකරණය කරනවාද, නැද්ද කියන කාරණය ගැන දෙවනුව හිතන්න. සබඳතා අතර ගැටුමක් හදාගෙන මේක මේ විධියට ඉදිරියට ගෙනියන්න එපා කියන එකයි අපි කියන්නේ.

අවසාන වශයෙන් උප දුම්රිය ස්ථානාධිපතිවරු ගැනත් මම කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔවුන් සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඔවුන් ඒ සම්බන්ධයෙන් මාස ගණනාවක් ඇතුළත මේ පාර්ලිමේන්තුවට පත් වෙච්ච අපව දැනුවත් කරලා තිබෙනවා. ලංකාවේ උප දුම්රිය ස්ථාන 165ක් තිබියදීත්, 137කට පමණයි උප දුම්රිය ස්ථානාධිපතිවරු ඉන්නේ. ඔවුන් කිසිම විටෙක අය වැයකින්වත්, කිසිම අවස්ථාවකදීවත් අවධානය යොමු වෙලා නැති කණ්ඩායමක්. 1906 පැරණි සේවා ගිවිසුම අනුව ඔවුන්ව අද වනකොට තනිකරම වහල් සේවයේ තමයි යොදවන්නේ. පැය 24ම ඔවුන් වැඩ කරන්න අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට මම කියන්නම්, ඔවුන්ගේ වැටුප සම්බන්ධයෙන්. ඔවුන්ට වැටුපක් නැහැ, දීමනාවක් විතරයි තිබෙන්නේ. රුපියල් 7,200ක දීමනාවක් තමයි ඔවුන්ට ලැබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ජීවන වියදම් දීමනාව හැටියට රුපියල් 7,800ක් ලැබෙනවා. ඒ දෙක එකතු වුණාම රුපියල් 15,000ක් ලැබෙනවා. මේ අවුරුද්දට රුපියල් 10,000කින් වැඩි කරපු ජීවන වියදම් දීමනාවවත් මේ අයට මේ වනවිට ලබා දීලා නැහැ. ඒ නිසා වැටුප වශයෙන් ලැබෙන්නේ රුපියල් 15,000යි. ඊළඟට, තමන් සේවය කරන උප දුම්රිය ස්ථානය ලාභ ලබන තත්ත්වයට පත් කළොත් ඒ ලාභයෙන් යම්කිසි කොමිස් මුදලක් ලැබෙන ක්‍රමයක් තමයි හදලා තිබෙන්නේ. හැබැයි, ඒකත් අවමය රුපියල් 10,000ක් වෙනකම් තමයි ලබා දෙන්නේ. ඒ අනුව රුපියල් ලක්ෂ තුන හමාරක විතර ලාභයක් උපයන්න ඕනෑ, රුපියල් 10,000ක් ලබා ගන්න. රුපියල් ලක්ෂ තිහක, ලක්ෂ හතළිහක ලාභයක් ලැබෙන්නේ නැහැ. ඒ රුපියල් 10,000ත් එකතු වුණාම ඔවුන්ට ලැබෙන්නේ රුපියල් 25,000යි.

නමුත්, ගරු ජනාධිපතිතුමා කියන ආකාරයට අනුව රජයේ සේවකයින්ගේ අවම වැටුපත් රුපියල් 31,000ක්, රුපියල් 32,000ක්. පෞද්ගලික අංශයේ සේවකයෙකුගේ අවම වැටුපත් රුපියල් 30,000ක් විතර වෙනවාය කියලා අපට කියනවා. හැබැයි, ආණ්ඩුවේම රස්සාවක් කරන මේ පුද්ගලයින්ට මේ වෙනකොටත් වැටුප විධියට ලැබෙන්නේ රුපියල් 25,000ක් බව මතක තියා ගන්න. රුපියල් 25,000ක් තමයි ඔවුන්ට වැටුප විධියට ලැබෙන්නේ. හැබැයි, ඔවුන්ට උසස්වීම් ලබා දෙන්නේත් නැහැ. ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීමේ පටිපාටියට අනුව අවුරුදු 5කට සැරයක් විභාගවලින් ඔවුන්ව පත් කර ගන්නට හැකියාව තිබෙනවා. හැබැයි, මතක තබා ගන්න, 2019 අවුරුද්දේ ඉඳලා මේ විභාගය පවත්වා නැහැ කියන එක. හැබැයි, එහෙම තිබියදී එළියෙන් බඳවා ගැනීම් කරලා ස්ථානාධිපති තනතුරට පත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුතින් නිලධාරින් බඳවා ගත්තාම ඔවුන්ව train කරන්න ඕනෑ. ඒ පුහුණුවීම්වලට, ඒ බඳවා ගැනීමේ පටිපාටිවලට යන වියදම අඩු කිරීමේ හැකියාව තිබෙනවා, උප දුම්රිය ස්ථානාධිපතිවරුන් මේ තනතුරුවලට පත් කර ගත්තොත්. එම නිසා වහල් සේවයේ යෙදෙන උප දුම්රිය ස්ථානාධිපතිවරුන් වෙනුවෙන් කරුණාකරලා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියාත් මම අපේ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඇත්තෙන්ම පැය 24ක් වැඩ කරලාත් ඔවුන්ට රුපියල් 25,000ක අවම වැටුපකට තමයි මෙතැන වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශාල පිරිසක් සහායකයෙක් අරගෙන තමන්ගේ වැටුපෙන් ඒ පුද්ගලයාට ගෙවලා මේ වැඩේ කර ගන්න තත්ත්වයට මේ වනකොට පත් වෙලා තිබෙනවා. එම නිසා ඔවුන් සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ කියන එක මම අවසාන වශයෙන් ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමැතියි.

මම විස්තරයක් ලියාගෙන ආවා, ඇත්තටම කොළඹ පවතින මාර්ග තදබදය සම්බන්ධයෙන්. රුපියල් බිලියනයක් විතර දවසකට නැති වෙනවා කියලා තක්සේරු කරලා තිබෙනවා, කොළඹ තිබෙන මේ මාර්ග තදබදය නිසා. හැබැයි, “Regional Plan for Western Province" යටතේ කොයි එකද ඔබතුමන්ලා අනුගමනය කරන්නේ, "CoMTrans study 2012” කියන එකද අනුගමනය කරන්නේ කියලා ගරු ඇමතිතුමා හෝ කවුරු හරි පිළිතුරු කථාවක් කරන වෙලාවට පැහැදිලි කරයි කියා මම බලාපොරොත්තු වනවා. මොකද, එතැන LRT වාගේම BRT තිබෙන බවත් ඔබතුමා දන්නවා. සමහර තැන්වල ඒ දෙකම ගැන කියලා තිබෙනවා. නමුත්, මොකක්ද අනුගමනය කරන්නේ කියලා අපට පැහැදිලි නැහැ. මොකද, වසන්ත සමරසිංහ ඇමතිතුමන්ලා කරපු ප්‍රකාශත් එක්ක මිනිස්සුන්ට LRT එක එපා වුණු බව අපි දන්නවා. දැන් මේ සම්බන්ධයෙන් දරන මතය මොකක්ද කියන එකත් මම විශේෂයෙන් ඔබතුමාගෙන් අහන්නට කැමැතියි.

ඒ වාගේම වසන්ත සමරසිංහ ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා නම් හොඳයි. Monorail එක එක් පැත්තකට යන්නේ කියලා ඊට පස්සේ එ්ක දෙපැත්තටම යනවාය කියා එතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම එතුමා විශේෂයෙන් සඳහන් කළා, මේ රටට එන පාඩුව, ලාභය ගැන feasibility study එකක් නැහැ කියලා. මගේ ළඟ ඊට අදාළ report එක තිබෙනවා. පිටු 147ක් තිබෙන නිසා මම ඒක print කර ගෙන ආවේ නැහැ. මෙහේ එහෙම print කරන තැනක් නැහැ. 2018දී හදපු මේ report එකේ ඉතාම පැහැදිලිව ලාභ-අලාභ, හැකියාව-නොහැකියාව කියන ඔක්කෝම සඳහන් වෙලා තිබෙනවා. එම නිසා ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් දරන මතය මොකක්ද කියන එක මම අහන්න කැමැතියි. “Preparatory Survey on the Project for Establishment of New Light Rail Transit System in Colombo: Draft Final Report 2018” කියන මේ වාර්තාවටත් ඔබතුමා අවධානය යොමු කරන්න. මම මේ වාර්තාව සභාගත කරන්නේ නැහැ, මේක සම්පූර්ණ වාර්තාව නොවන නිසා. මේ වාර්තාව අපේ පුස්තකාලයෙන් අරගෙන බලන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු කාරණාවලට මම පිළිවෙළටම පිළිතුරු දෙන්නම්. පළමුවැනි කාරණය හැටියට එතුමා ඇහුවා, LRT එක ගැන. ඒ, transport expertsලා සහ අපේ රටේ තිබෙන මුදල් තත්ත්වය එක්ක මේ වෙලාවේදී ඒක කරන්න අපි තීරණය කරලා නැහැ. ඒ වාගේම ඒක අපි නතර කරනවා කියලා අවසාන තීන්දුවකට ඇවිල්ලා නැහැ. නමුත්, බොහෝ විට මේ අවුරුදු හතර තුළදී අපි LRT එක පටන් ගන්න යන්නේ නැති වෙයි. කොළඹ නගරයේ තිබෙන තදබදය වෙනස් කරන්න සහ පාරවල් හදන්න අපි ගොඩක් මුදල් වෙන් කරනවා. මොකද, LRT එකෙන් ගෙන යන්න පුළුවන් සෙනඟ ප්‍රමාණය ගත්තාම අපට ඒ ප්‍රමාණය මදි වාගේ එකක් තමයි දැනට ලැබී තිබෙන තොරතුරු අනුව පෙනෙන්නේ.

දෙවැනි කාරණය මේකයි. "CoMTrans study 2012", ඔබතුමා කිව්වා වාගේම සැලකිය යුතු ලෙස update කරන්න තිබෙනවා. ඒ update එකට අපි යනවා. ඒ වාගේම multimodal centres දියුණු කිරීම අපි ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන තිබෙනවා සහ multimodal centres 15ක් විතර දියුණු කරන්න අපි සැලසුම් කරගෙන යනවා. අවුරුදු හතරක් තුළ multimodal centres 50කට වාගේ යන්න තමයි අපි plan කරන්නේ.

ඊට පසුව ඔබතුමා ශ්‍රීලන්කන් ගුවන් සේවය ගැන කිව්වා. ගරු ඇමතිතුමා මේ සභාවේ නැති නිසා එ් ගැන මම කාරණයක් කියන්න කැමැතියි. ඔබතුමා එහි සභාපති සරත් ගනේගොඩ මහතා ගැනත් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සේවය අතිවිශාල ණය කන්දරාවක ඉන්න බව ඔබතුමා දන්නවා. විවිධ ආණ්ඩු උත්සාහ කළා, මේ ගුවන් සේවය ගොඩනඟන්න. නමුත්, ඒක කරන්න බැරි මට්ටමක තිබෙන්නේ. කවුරුවත් ඒ ගුවන් සේවය ගන්න එන්නේවත් නැහැ. මේ විෂයය කරන්න වෙන්නේ අනිවාර්යයෙන්ම මේ විෂයය ගැන දන්න අයට නේ. මට නම් ඒ ගැන තේරෙන්නේ නැහැ. ඉතින්, මේක නිකම් engineering ගැන විතරක් දැනගෙන කරන්න බැහැ. වෙලාව ඉතුරු කර ගන්න ඕනෑ නිසා මම ඒ ගැන ඉක්මනික් කියන්නම්.

සරත් ගනේගොඩ මැතිතුමා ඔබතුමා කියන සමාගමේ වාගේම තව විවිධ සමාගම්වල ඇති. මම අවංකවම ඒ ගැන දන්නේ නැහැ. මම එතුමාව දන්නවා. නමුත්, එතුමාගේ සමාගම් ගැන මම ලොකුවට දන්නේ නැහැ. එතුමා voluntarily වැඩ කරනවා කියන එක සරල එකක් නොවෙයි. එතුමා දැවැන්තම සමාගමක ප්‍රධානියෙක්. මිනිස්සුන්ගේ ක්‍රියාවෙන් ඒ ගැන බලන්න පුළුවන් නේ, ගරු මන්ත්‍රීතුමනි. බැලූ බැල්මට සම්බන්ධයක් තිබෙනවා තමයි.

පොඩි domestic airline එකක් තිබෙන්න පුළුවන්. මොනවාද කරගෙන තිබෙන්නේ; ප්‍රායෝගික වාසි විධියට මොනවාද අරගෙන තිබෙන්නේ? දැන් ඒගොල්ලන් operationally profitable. HIPG ගත්තොත්, හම්බන්තොට, lossmaking, but operational profit එකක් තිබෙනවා. SriLankan Airlines එකෙත් මේ කාලය තුළ operational profit එකක් තිබෙනවා. අර ණය කන්ද එකතු වුණාම තමයි ණය වෙන්නේ. ඔබතුමා වාගේ උගත් මන්ත්‍රීවරයෙකුගෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, කරන වැඩ තුළින් බලන්න වැරැද්ද, පුද්ගලයා තුළින්ම බලන්නේ නැතිව කියන එකයි.

අවසාන වශයෙන් මම අදහස් දක්වන්න කැමතියි, ජගත් විතාන මැතිතුමා ඉදිරිපත් කරපු කාරණාවක් ගැන. එතුමා ප්‍රවාහන කර්මාන්තයේ ප්‍රවීනයෙක්.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තත්පරයක් දෙන්න පුළුවන්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මගේ කථාව අවසන් වුණාම ඔබතුමා අවස්ථාව ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කිව්වා වාගේ පෞද්ගලික බස් රථවල හිමිකාරිත්වය පැවරීම සම්බන්ධයෙන් විශාල ගැටලුවක් තිබෙනවා. අයිතිකරු මැරුණට පසුවත් විකුණද්දී හිමිකාරිත්වය මාරු කරගන්න බැහැ. ඒ සම්බන්ධයෙන් අපි නීතිය සංශෝධනය කරනවා. රෙගුලාසිවල යම් ප්‍රමාදයක් තිබුණා. දැන් මට අමාත්‍යාංශයේ නීති නිලධාරි මහත්මිය දැනුම් දී තිබෙනවා, ඒ කටයුත්ත මේ මාසය තුළදී සකස් කරන්න පුළුවන් කියලා. අපි රෙගුලාසි හදන්න මහන්සි වුණා. මේ මාසය තුළදී ලංකාවේ සියලුම පෞද්ගලික බස් රථ හිමියන්ට බස් රථයේ අයිතිය මාරු කර ගැනීමට අදාළ කරන රෙගුලාසි අපි සකස් කරනවා. ඒ නිසා ජනවාරි මුල ඉඳලා ඒගොල්ලන්ට ඒ අයිතිය ලැබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 15ක් දෙන්නම්.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි ප්‍රශ්නය මේකයි. එතුමා වැඩ කරනවා ඇති, ඒක හරි. එතුමන්ලාමනේ මේකට bid කරලාත් තිබෙන්නේ. එතකොට එතුමාගේ දූෂණ, අක්‍රමිකතා තිබෙනවා කියලා,- *[බාධා කිරීමක්]* bid කරපු එක ඔබතුමා දන්නවා නේ. ඒ, bid කරපු හයෙන් එකක්. ඒ නිසා මේක සුළුවට තකන්න එපා. *[බාධා*

*කිරීමක්]* ඉන්නකෝ, ඉන්නකෝ. වැඩ කරන්න දන්න මිනිස්සුන්ව මෙතැනට දමන්න අවශ්‍ය නම් ඔබතුමන්ලා CEO කෙනෙක් මාස 8ක් තිස්සේ දාලා නැහැ නේ. දැන් ඔබතුමන්ලාට ඉතිරි වෙලා තිබෙන්නේ ධම්මික පෙරේරා ඒකේ CEO කරලා දමන්න. එතකොට වැඩේ ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.32]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව, කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසනයට එරෙහිව ගෝලීය දවස් 16ක ක්‍රියාකාරිත්වය හෙට දිනයේදී ආරම්භ වෙනවා. අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමාට, කාන්තාවන් හා ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොදු ප්‍රවාහන සේවාවල CCTV යන්ත්‍ර සවි කිරීමට ගන්නා ලද තීරණය සම්බන්ධයෙන්. මොකද, සියයට 90ක් කාන්තාවන්ගේ අත්දැකීම වෙන්නේ, පොදු ප්‍රවාහනය තුළ තමන් හිංසනයට ලක් වීමයි. ඒ නිසා එවැනි බරපතළ හිංසනයක් නවත්වා ගැනීමට අවශ්‍යයි. ඒ සඳහා අපේ රජය යටතේ කටයුතු කිරීම අවශ්‍යයි. ඒ සඳහා මෙවැනි ප්‍රගතිශීලී ක්‍රියාවක් සිදු කිරීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. CCTV එකක් සවි කළාම බස් රථය තුළ මොකක්ද වෙන්නේ කියලා හොයා ගන්න පුළුවන්. දැනට ඒක දකින්නේ කවුද, මොකක්ද වෙන්නේ කියලා කාටවත් පේන්නේ නැහැ. එහෙම වුණාම අපට ඒ හිංසනයට ලක් කරන කෙනාව හඳුනා ගන්න බැහැ. පැමිණිලි කරන්න කෙනකු ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ නිසා මේ කටයුත්ත හරහා ප්‍රවාහනය තුළ සිදුවෙන හිංසන සැහෙන තරම් ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකියාවක් ලැබෙයි.

පොදු ප්‍රවාහනය ගැන කථා කරද්දී මම අවධානයට ලක් කරන්න කැමැතියි, මේ අවුරුද්ද තුළ -2025 අවුරුද්ද තුළ- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පහසුකම් දියුණු කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ගන්නා ලද පියවර සම්බන්ධයෙන්. එහිදී ඩිපෝ සංවර්ධනය කිරීමට, විනාශ වී ගිය ඩිපෝ නැවත ගොඩ නැඟීමට, ඩිපෝවල ගොඩනැඟිලි, බස්රථ ගාල් සහ රියදුරු විවේකාගාර 10ක් ගොඩ නැඟීමට අමාත්‍යාංශය කටයුතු කර තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට 700කට අධික සේවක පිරිසක් -රියදුරන් හා කොන්දොස්තරවරුන් පිරිසක්- බඳවා ගැනීමට අමාත්‍යාංශය විසින් මේ වෙනකොට කටයුතු කරමින් සිටිනවා. ඊට අමතරව ධාවනයෙන් ඉවත් කර තිබූ luxury buses සහ සාමාන්‍ය බස් රථ 200ක් ප්‍රතිසංස්කරණය කරමින් නැවතත් bus fleet එකට එකතු කිරීමටත් කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම එතැනින් එහාට ගොස් මේ අය වැය තුළත් මුදල් වෙන් කරලා තිබෙනවා, විශේෂයෙන්ම ඩිපෝ සංවර්ධනය කිරීමට. අපි දන්නවා, කොළඹ නගරය පුරාම පවා නිසි සංවර්ධන කටයුත්තකට භාජන කරලා නැති ඩිපෝ තිබෙන බව. පොදු ප්‍රවාහනය සඳහා සාර්ථක ලෙස සම්බන්ධ විය නොහැකි, නොසලකා හරින ලද ඩිපෝ හැටියට වසර ගණනාවක් පවතින ඩිපෝ රාශියක් කොළඹ නගරයේත් තිබෙනවා; රට පුරාමත් තිබෙනවා. ඒ නිසා මේවා සංවර්ධනය කිරීමට මුදල් වෙන් කිරීම ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ගන්නා හොඳ තීරණයක් කියලා අපි හිතනවා. ඊට අමතරව, ශ්‍රී ලංගම බස් රථ 307ක ගෙවී ගිය එන්ජින් කට්ටල ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහාත්, පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය ශක්තිමත් කරමින් දුර ගමන් සේවා සඳහා බස් රථ 600ක් එකතු කිරීම සඳහාත් මෙවර අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම මම මේ කාරණය විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මේ අය වැය තුළ මුදල් වෙන් කරලා තිබෙනවා, ප්‍රමාණවත් ආදායමක් නොලබන මාර්ගවලට බස් රථ යෙදවීමට. මේක ප්‍රශ්නයක් හැටියට තිබෙනවා. ගොඩක් වෙලාවට පෞද්ගලික අංශයෙන් මේ මාර්ගවලට බස් රථ යොදවන්නේ නැහැ, ලාභ ලබා ගන්නට බැරි නිසා. ඒ නිසා පොදු ජනතාවගේ පොදු ප්‍රවාහනය නංවාලීමට මෙවර අය වැය තුළින් ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම ප්‍රවාහන ඇමතිතුමාට මේ කාරණය මතක් කරන්න කැමැතියි. කොළඹ නගරය තුළත් අඩු ආදායම්ලාභී ජනතාව විශාල වශයෙන් ගමන් කරන bus routes තිබෙනවා. ඒ bus routes බොහොමයක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා ග්‍රාමීය මාර්ග ගැන හිතනකොට කොළඹ නගරය තුළ තිබෙන ඒ bus routes ගැනත් හිතන්න කියලා ප්‍රවාහන අමාත්‍යාංශයටත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයටත්, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවටත් මතක් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය මේකයි. පොදු ප්‍රවාහනයට අවශ්‍ය පහසුකම් සඳහා ප්‍රතිපාදන වෙන් කරන ගමන් පොදුවේ පෞද්ගලික සහ පොදු ප්‍රවාහනය නියාමනය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. අපි මේ අවුරුද්දේ ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනත සංශෝධනය කරමින් ප්‍රවාහනය නියාමනය කිරීම සඳහා ඓතිහාසික පියවරක් තබලා තිබෙනවා. අපි දන්නවා, ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනත 1991දී සම්මත වුණාට මේ අවුරුද්ද වෙනකම් ඒ පනත යටතේ කිසිම රෙගුලාසියක් පැනවීම, එහෙම නැත්නම් නියාමනක් සිදුකරලා තිබුණේ නැහැ කියලා. අපි මේ වසරේ සිට පටන් අරගෙන නියාමන කටයුත්ත ශක්තිමත්ව කරගෙන යනවා. ඒ අනුව, ධාවනය සඳහා යොදවන බස් රථ සහ පොදු ප්‍රවාහනයේ යෙදෙන අනෙකුත් වාහන - විශේෂයෙන්ම බස් රථ - මාර්ගයට සුදුසුයිද - road worthiness - කියා බලන එක, ඒ වාගේම මත්ද්‍රව්‍ය භාවිත කිරීම සම්බන්ධව - ඒක මම හිතන්නේ පොලීසිය සහ RMV එක හරහා සිද්ධ කළ යුතු දෙයක්- රෙගුලාසි සකස් කිරීම එහෙම නැත්නම් නියාමනය කිරීම; පොදු ප්‍රවාහනයේ යෙදෙන බස් රථ, ත්‍රිරෝද රථ, පාසල් වෑන් රථ, staff service යන සියලු දේ නියාමනය කිරීම සඳහා ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව - National Transport Commission එක - විසින් මේ අවුරුද්දේ සිට කටයුතු කරමින් යනවා. ලබන අවුරුද්ද වෙනකොට road safety සඳහා නීතියක් පවා සකස් කිරීමට මේ වනවිට කටයුතු කරමින් යනවා. මම හිතන විදියට මේවා කවදාවත් ලංකාවේ සිද්ධ වෙච්ච දේවල් නොවෙයි. ඒ නිසා ඒක අගය කරන්නම අවශ්‍යයි.

අපි අද මේ පාර්ලිමේන්තුවේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය සම්බන්ධයෙනුත් විවාද කරන නිසා මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. නාගරික සංවර්ධනය සඳහා මේ අය වැය යටතේ ගෙවල් 27,000ක් ලබන අවුරුද්දේ හදන්න මුදල් වෙන් කර තිබෙනවා. ඒ අතරින් ගෙවල් 6,000කට වඩා කොළඹ නගරය තුළ ගොඩ නැඟීමට නැත්නම් ඉදිකිරීමට

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

මුදල් වෙන් කර තිබෙනවා. මේක නාගරික ප්‍රජාවට තිබෙන ඉතාම බරපතළ ප්‍රශ්නයක්. අපේ නගර තුළ ස්ථිර නිවසක් නැති අනවසර පදිංචිකරුවන් විශාල වශයෙන් ඉන්නවා. ඒ කාරණය සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු විය යුතුමයි. ඒ නිසා මෙවැනි නිවාස ගොඩනැඟීම සම්බන්ධයෙන් ඉතාම ඉක්මනින් කටයුතු කළ යුතුයි. ගෙවල් හදන එක විතරක් නොවෙයි. ඒ මිනිසුන්ව ඒ ගෙවල්වලට ගෙනයන එක, relocate කිරීම සම්බන්ධව ඉතාම සංවේදීව කටයුතු කරමින් මේ ක්‍රියාවලිය කරන්න ඕනෑ කියන එකත් මම යෝජනා කරනවා. ඒ වාගේම අපි ගිය අවුරුද්දේ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තත්පර 30ක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ගිය අය වැයෙන් රුපියල් ලක්ෂ 10 බැගින් ලබා දෙමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ නිවාස 3,800ක් හැදුවා. ලබන අවුරුද්දේ අපි නිවාස 10,000ක් හදන්න නිවසකට රුපියල් ලක්ෂ 10 බැගින් මුදල් වෙන් කරන්න කටයුතු කර තිබෙනවා. ඒ ආකාරයට ලබන අවුරුද්ද අවසන් වන විට නිවාස 27,000කට වඩා රජයේ වියදම යටතේ සකස් කිරීමට, ගොඩ නැඟීමට කටයුතු යොදා තිබෙනවා. නිවාස සංවර්ධනය, පොදු ප්‍රවාහනය දියුණු කිරීම වැනි දේවල් විශේෂයෙන් අඩු ආදායම්ලාභී ජනතාවට විශේෂ වරප්‍රසාද, ප්‍රතිලාභ ලැබෙන දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කාරක සභා අවස්ථාවේ අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.40]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන වශයෙන් කරුණු තුනක් මම අද දිනයේ ඉදිරිපත් කරනවා. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කම්කරු තනතුරේ සිට රසායනාගාර සහකාර තනතුර දක්වා මැන්පවර් සේවකයින් 2,000ක් වාර්ෂිකව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබෙනවා. අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම වසර 25ක් වැනි විශාල කාල පරාසයක් තුළ සේවයේ නියැළී සිටින, විවිධ කුසලතා, දක්ෂතා තිබෙන, මැන්පවර් සේවකයන් හැටියට මණ්ඩලය තුළ කටයුතු කරන සියලුදෙනා ස්ථිර කරන්න කටයුතු කරන්න කියලා. විශේෂයෙන්ම වත්මන් අය වැයෙහි සේවකයන් 9,800ක් ස්ථිර කිරීමේ යෝජනාවක් තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ යටතේ, මේ කියන සේවකයන් 2,000ගේත් සේවය ස්ථිර කරන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඒ වාගේම, දීර්ඝ කාලයක් සේවයේ නියැළී සිටීම තුළින්, ඒ අයට ඒ සේවා කාර්ය භාරය ඉෂ්ට සිද්ධ කිරීම සම්බන්ධයෙන් ලොකු අත් දැකීමක් තිබෙනවා. හැබැයි, Scheme of Recruitment එකක් අලුතින් නිර්මාණය කරලා, මැන්පවර් සේවකයින්ට අවස්ථාව ලබා දීමෙන් ඒ අය බාහිර අපේක්ෂකයන් ලෙස සැලකීමේ අසාධාරණයටත් ලක් කර තිබෙනවා. ඒ ප්‍රශ්නයත් එක් වරම විසඳෙනවා, මේ කියන සේවකයන් 2,000 ස්ථිර කිරීමේ කාර්ය භාරය ඉෂ්ට කළොත්. ඒ නිසා ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්න කියා මම බොහොම ගෞරවයෙන් රජයෙන් සහ අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, මම තවත් කාරණයක් විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. අද පෙර වරුවේ ඉඳලා පොල්දූව හන්දියේ ඉන්නවා, අපේ රට දැය බේරා ගන්නට, ත්‍රස්තවාදය පරාජය කරන්නට ඇස්, ඉස්, මස්, ලේ, අවයව පරිත්‍යාග කරමින්, සුවිශාල කාර්ය භාරයක් ඉෂ්ට කරපු වීරෝදාර රණ විරුවන්; විශේෂයෙන්ම ආබාධිත රණ විරුවන්. ඒ අයගේ අයිතිවාසිකම් අහිමි වීම තුළ ඒ අය බරපතළ ගැටලුවකට පත් වෙලා තිබෙනවා.

2025 අය වැය යටතේ සියලු රාජ්‍ය සේවකයන්ගේ සහ සන්නද්ධ සේවා නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කළද, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ ආබාධිත විශ්‍රාමිකයන්ගේ සහ මිය ගිය රණ විරුවන්ගේ වැන්දඹුවන් වෙනුවෙන් හිමි විය යුතු අයිතිවාසිකම් අහිමි කර තිබෙනවා. ඒ වාගේම, වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගත් ආබාධිත රණ විරුවන්ට විශේෂ වරප්‍රසාද ලෙස වැටුප් සහ විශ්‍රාම වැටුප් ලබා දීමට පෙර සිටම නීතිමය පදනමක් තිබුණද, අද ඔවුන්ට එම හිමිකමත් නොලැබෙමින් පවතිනවා. ඒ වාගේම, වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු ආබාධිත, මිය ගිය රණ විරුවන්ගේ දෙමාපියන්ට සහ බිරින්දෑවරුන්ට හිමි වන ස්ථාවර දීමනාව රජය නීති විරෝධී ලෙස මේ වන විට අත් හිටුවා තිබෙනවා. ඒ වාගේම, අතුරුදහන් වූ රණ විරුවන්ගේ පවුල්වලට හිමි විය යුතු දීමනා ද 'අනුමාන' කියන ප්‍රතිපත්තිය මත නතර කර තිබෙනවා. ඒ වාගේම, පරිපාලන ප්‍රමාදයන් හේතුවෙන් වෛද්‍ය මණ්ඩල වෙත ප්‍රමාදව යොමු වූ ආබාධිත රණ විරුවන්ට විශ්‍රාම වැටුප් සංශෝධනය සහ දුබලතා දීමනා ද අහිමි කර තිබෙනවා. ඒ නිසා අපි දැඩි ලෙස රජයෙන් ඉල්ලා සිටිනවා, ඒ වීරෝදාර රණ විරුවන්ගේ සියලු අයිතිවාසිකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු කරන්න කියලා; ඒ වාගේම ගෙවිය යුතු හිඟ දීමනා ගෙවීමට කටයුතු කරන්න කියලා. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ ආබාධිත රණ විරුවන්ට හිමි වරප්‍රසාද නීතියක් මාර්ගයෙන් ස්ථිරව ඒ අයට ලැබෙන ආකාරයේ අණ පනත් නිර්මාණය කිරීම යෝග්‍යයි කියන යෝජනාවත් මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා.

අවසාන කාරණාව හැටියට මම විශේෂයෙන්ම සඳහන් කළ යුත්තක් තිබෙනවා. මේ මොහොත වන විට පොලීසියකින් පොලිස් සහතිකය ලබා ගැනීමේදී සෘජුව හෝ වක්‍රව සිවිල් ආරක්ෂක කමිටුවේ අනුමැතිය -සභාපතිවරයා ප්‍රමුඛ එම කමිටුවේ අනුමැතිය- ලබා ගැනීමේ තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා කියන කාරණය අපි පසුගිය දවසක ඉදිරිපත් කළා. ඒක සත්‍යයක්. අපි ඊට අදාළව විශේෂයෙන්ම හක්මණ පොලිස් බල ප්‍රදේශයේත්, කඹුරුපිටිය පොලිස් බල ප්‍රදේශයේත් උදාහරණ දෙකක් පෙන්වා දුන්නා. ඒ කාරණාව රටට එළි දක්වපු, ඒ කියන්නේ පොලීසියෙන් ඒ සහතිකය ලබා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් සිවිල් ආරක්ෂක කමිටුවේ අනුමැතිය ලබා ගන්න ඕනෑ කියන කාරණාව පිළිබඳව වාර්තාකරණය කරපු ඒ මාධ්‍යවේදීන් අද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබෙනවා. වර්තමාන රජය කරන අය විපක්ෂයේ ඉන්න කොට කථා කළේ ප්‍රජාතන්ත්‍රවාදය

රැක ගැනීම, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම ගැනයි. ප්‍රජාතන්ත්‍රවාදයේ සුරක්ෂිතභාවය සඳහා මාධ්‍ය විසින් කරනු ලබන කාර්ය භාරය පිළිබඳව එදා ඔබතුමන්ලා ඉතාම ප්‍රශංසා මුඛයෙන් කථා කළා. නමුත් අද දවස වන විට, ඒ නිවැරැදි තොරතුරු රටට එළි දක්වපු ඒ මාධ්‍යවේදීන් කැඳවා තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. මම පැහැදිලිවම කියන්න කැමැතියි, සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපතිවරයා ඇතුළු කමිටුවේ අනුමැතිය වර්තමාන රජය සෘජුව හෝ වක්‍රව අනිවාර්ය කර තිබෙන බව. ඒක වැරැදි ක්‍රියාවක්; වෙනදා සිදු නොවුණු ක්‍රියාවක්. විශේෂයෙන්ම රජයට වගකීමක් තිබෙනවා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන මාධ්‍ය ක්ෂේත්‍රය සුරක්ෂිත කරන්න වාගේම මාධ්‍යවේදීන්ගේ තොරතුරු වාර්තාකරණයට නිදහස ලබා දෙන්න.

මම තවත් ඉල්ලීමක් රජයෙන් කරනවා. Online Safety Act එක ඉවත් කරනවා කිව්වා. මන්ත්‍රී ධුර 159ක් තියාගෙන, තුනෙන් දෙකේ බලයක් තියාගෙන ඇයි Online Safety Act එක කඩිනමින් ඉවත් කරන්න බැරි? මාධ්‍යවේදීන්ගේ වටිනාකම තේරෙන්නේ බලය නැතිව ඉන්න කොටද කියා මම අහන්න කැමැතියි. මම රජයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නට මාධ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය නිදහස ලබා දීලා ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂා කිරීමේ වැදගත් කුලුනක් වන නිදහස් මාධ්‍ය සුරකින්නට කටයුතු කරන්න කියලා. නිවැරැදිව කරුණු කාරණා ඉදිරිපත් කළ පමණින් මාධ්‍යවේදීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා අපේ රටේ නිදහස් මාධ්‍ය විනාශ කරන්න කටයුතු කරන්න එපා කියා මම රජයට ප්‍රකාශ කරන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ආණ්ඩු පක්ෂය පැත්තෙන් එයට පිළිතුරු ලබා දිය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළමුවෙනි කරුණ තමයි මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරුන්ගේ අනුමැතිය ලබා ගත යුතු නැති බවට, එහෙම චක්‍රලේඛනයක් නිකුත් කර නැති බවට මේ ගරු සභාවේදී Minister of Public Security and Parliamentary Affairs ඉතා වගකීමෙන් ප්‍රකාශ කළා. ඒ නිසා කරුණාකර රට ගිනි තියන්න උත්සාහ කරමින් බොරුවෙන් දේශපාලනය කරන්න හදන්න එපා, විපක්ෂ නායකතුමනි. ඔබතුමා කොහෙන් හරි උදාහරණයක් දෙකක් අරගෙන කියන බව ඇත්ත. නමුත්, මේ සභාවේදී අමාත්‍යවරයෙකු වගකීමෙන් දෙයක් කිව්වාම ඒක පිළිගන්න. මොකද, ඊට පස්සේ අපට ඔබතුමාගේ තනතුර මොකක් වුණත් ඔබතුමා කියන දේවල් පිළිගන්න බැරි වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී source එක ඔබතුමායි කියලා දත්ත වගයක් කිව්වා. මේවා බොරු නේ. මිනිස්සු මේවායින් අසරණ වෙනවා නේ. සමර විට ඔබතුමාට දේශපාලන වාසියක් එයි. හැබැයි අපි ජනතාවට කියන දේ තමයි, Minister of Public Security and Parliamentary Affairs කියලා තිබෙනවා, ඒ කියන චරිත සහතිකයක් හරි මොකක් හරි ගන්න ඕනෑ නම්, මහජන ආරක්ෂක කමිටුවලින් අනුමැතියක් ගන්න ඕනෑ නැහැ කියලා. එහෙම ගන්න ඕනෑ නැහැ කියලා ඇමතිවරයා පාර්ලිමේන්තුවේ කිව්වාට පසුව තවත් මොකක්ද?

විපක්ෂ නායකතුමා කියන්නේ මේ රටේ වග කිව යුතු පුද්ගලයෙක්. ඔබතුමාගේ තනතුර ඉතා ඉහළ තනතුරක්. ඇයි ඔබතුමා එහෙම කරන්නේ? ඔබතුමාට ඇයි බැරි, මහජන ආරක්ෂක ඇමතිතුමා එක්ක වාඩි වෙලා කථා කරලා තව මොනවා හරි තිබෙනවා නම් clear කර ගන්න? අපි මෙහෙමද මේ රට කරන්න යන්නේ? ඔබතුමා මේ රට බාර ගන්න ඉන්න පුද්ගලයෙක් කියලා නේ ඔබතුමා කියන්නේ. ඉතින් කොහොමද බාර දෙන්නේ? *[බාධා කිරීමක්]* හිතුනත් බාර දෙන්න බැහැ නේ, මේ විධියට වැඩ කරන කොට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවෙනි කාරණය මේකයි. මට ඒ මාධ්‍යවේදියා ගැන හරි අවබෝධයක් නැහැ. නමුත්, මාධ්‍යවලින් මේ රට ගිනි තියලා තිබෙනවා. Dr. Shafi ත්‍රස්තවාදියෙකු කරලා මේ රට අමු මිනී කනත්තක් කරන්න ඔය මාධ්‍යම තමයි- *[බාධා කිරීමක්]* මොකද, පෙරහැරට ඉස්සෙල්ලා කසකාරයෝ ඇවිල්ලා මාර්ගයේ ඉඩ හදන්න ඕනෑ. ඒ වාගේ, ඉස්සෙල්ලා කියන්න ඕනෑ, ත්‍රස්තවාදයයි, අරකයි, මේකයි කියලා. ඒ නිසා මාධ්‍ය කියන්නේ නිකම් අහිංසක දෙයක් නොවෙයි. මාධ්‍ය නිදහස වෙනුවෙන් අපි උපරිමයෙන් පෙනී සිටිනවා. හැබැයි මාධ්‍ය නොවෙයි දෙවියන් වහන්සේ වුණත් ජනතාවට බොරු කියනවා නම් ඒ බොරුවට විරුද්ධව ඔබතුමා හිටගන්න, විපක්ෂ නායකතුමනි. ඔබතුමා ඔය තනතුරට තිබෙන වගකීමවත් ඉටු කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාවක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට අවස්ථාව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ගරු සභානායකතුමාට ඕනෑ නම් නම් ගම් සහිතව ඉදිරිපත් කරන්නම්. හක්මණ පොලිස් ස්ථානයෙනුත්, කඹුරුපිටිය පොලිස් ස්ථානයෙනුත් Police Clearance Certificate එක ලබා ගන්න යනකොට සිවිල් ආරක්ෂක කමිටුවේ අනුමැතිය ලබා ගන්න ඕනෑ කියපු තොරතුරු, දත්ත බොරු නොවෙයි. මම සත්‍යවාදීවයි ඒවා කිව්වේ. *[බාධා කිරීමක්]* අපි නොවෙයි නේ කිව්වේ, බොරුව ඇත්ත කරන්න පුළුවන්, ඇත්ත බොරුව කරන්න පුළුවන් කියලා. මේවා, සත්‍ය තොරතුරු. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමා.

මීළඟට, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි, mike එක off කළේ?*[බාධා කිරීම්]* Mike එක දෙන්න. *[බාධා කිරීම්]* මගේ අවස්ථාව. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Mike එක දෙන්නත් ඔබතුමාට සිවිල් ආරක්ෂක කමිටුවේ අනුමැතිය ඕනෑද දන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාට උත්තර දෙන්න මට අවස්ථාවක් දුන්නේ නැහැ නේ. කොහෙන් හරි පණිවුඩයක් ආවා, mike එක off කරන්න කියලා.

කඹුරුපිටිය පොලීසියේ, හක්මන පොලීසියේ- *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, කඹුරුපිටිය පොලීසියේ, හක්මන පොලීසියේ ඒ තොරතුරු ටික මම ඉදිරිපත් කළා. ඒ තොරතුරු සත්‍ය තොරතුරු. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම එක දෙයක් කියන්නම්. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මූලාසනයට අපහාස කරන්න එපා. *[බාධා කිරීමක්]* දැන් එහෙම කළා නේ. ඔබතුමා වැරදි ප්‍රවෘත්තියක් කියද්දීත්, අර ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා කථාව කරන්න නැඟිටලා සිටිද්දී වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නැවත mike එක දුන්නා. ඔබතුමා මූලාසනාරූඪ මන්ත්‍රීතුමාට කියනවා, mike එක off කරන්න කියලා එතුමාට කවුද කිව්වා කියලා. මූලාසනයට අපහාස කර ගන්නවා නම්, එහෙම අපහාසාත්මක මූලාසනයක් ඉස්සරහා කථා කරන්න එපා. මූලාසනය එහෙම නම්, අපි නම් කථා කරන්නේ නැහැ. ඔබතුමා කථා කළාට පසුව ආණ්ඩු පක්ෂයේ ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමාට අදහස් දක්වන්න තිබෙනවා. එහෙම නම් අපි මේ Discussion එක මෙහෙම කරගෙන යමු. කරුණාකරලා විපක්ෂ නායක තනතුරේ ගරුත්වය සහිතව කටයුතු කරන්න, විපක්ෂ නායකතුමා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සෑම ගරු මන්ත්‍රීවරයෙකුම අවධානය යොමු කරන්න. අපට කාලය වැදගත් වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට විනාඩියක අවස්ථාවක් දෙන්නම්. හැබැයි පාර්ලිමේන්තුවේ කාලය කළමනාකරණය කර ගන්නා එක ඉතාම වැදගත්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක අවස්ථාවක් දෙන්න.

මම අභියෝගයක් කරනවා. ලේකම් මණ්ඩලයට කියන්න, වාර්තාවක් දෙන්න කියලා; රාජ්‍ය පාර්ශ්වයෙන් මන්ත්‍රීවරයෙකු නැඟිටලා කථා කරන කොට mike එක on කරන එකයි, off කරන එකයි, විරුද්ධ පක්ෂයේ අප නැඟිටලා කරුණු ඉදිරිපත් කරන කොට mike එක on කරන එකයි, off කරන එකයි පිළිබඳ වාර්තාවක් දෙන්න. එතකොට බලාගන්න පුළුවන්, එක එක ඒවා එක එක විධියට off වෙන්නේ කොහොමද කියලා.

මම ගරු සභානායකතුමාට වගකීමෙන් කියනවා, මා කිව්වේ බොරුවක් නොවෙයි කියලා. හක්මන පොලිස් ස්ථානයේත්, කඹුරුපිටිය පොලිස් ස්ථානයේත් ඒ කාරණා නිදසුන් සහිතවයි කිව්වේ. එය බොහොම පැහැදිලියි. මම එක කාරණයක් කියන්නම්. මම මූලාශ්‍රයක් නොමැතිව කරුණු කියන්නේ නැහැ. බොරුව ඇත්ත කරන්න, ඇත්ත බොරුව කරන්න අපි සූදානම් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමනි. අමතරව කාලය ලබාගෙන කථා කරන සෑම මන්ත්‍රීවරයෙකුගේම කණ්ඩායමෙන් ඒ ගන්නා වෙලාව අනිවාර්යයෙන් අඩු කරනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු විපක්ෂ නායකතුමනි, දැන් ටිකකට කලින් ඔබතුමා කරුණු ගෙනහැර දැක්වූවා, රණ විරුවන්ගේ, විශේෂයෙන්ම ආබාධිත රණ විරුවන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන්. අපේ රජය විසින් ආබාධිත රණ විරුවන්ගේ ආබාධිත දීමනා, ස්ථාවර දීමනා, විශ්‍රාම වැටුප්, අවුරුදු 55ට පස්සේ අහිමි වන වැටුප් සම්බන්ධව විශේෂ සැලකිල්ලක් යොමු කරලා ඒ සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක් දාලා, මුදල් අමාත්‍යාංශයත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සමඟත් කථා කරලා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ඒවා අත්හිටුවීමක්වත්, නැවැත්වීමක්වත් කරලා නැති බව ගරු ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මේ සභාවේදී මම කීප වතාවක්ම කියා සිටියා. ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය දවසේත් විශේෂයෙන් එය දැනුම් දුන්නා. අද උදේත් දැනුම් දුන්නා. ඒක තේරෙන්නේ නැත්නම් මට කරන්න දෙයක් නැහැ. විශේෂයෙන්ම ඒ සම්බන්ධව අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම, රණ විරුවන්ගේ දෙමව්පියන්ගේ "මා පිය රැකවරණ දීමනාව" කොහෙත්ම අත්හිටුවා නැහැ කියලා අද උදේත් මම විශේෂයෙන්ම ගෙනහැර දැක්වූවා. ගරු විපක්ෂ නායකතුමනි, තුන් සැරයක් කිව්වාට පස්සේත් ඔබතුමාට තේරෙන්නේ නැත්නම්, ඒ ඇයි කියලා මම දන්නේ නැහැ. රණ විරුවන්ට නම් ඒක තේරෙනවා; හොඳට තේරෙනවා. මටත් තේරෙනවා. රණ විරුවන්ට විශේෂයෙන් තේරෙනවා. ඔවුන්ගේ ප්‍රශ්නය සැලකිල්ලට අරගෙන අපි කටයුතු කරලා තිබෙන බව දන්වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.55]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ සාමාන්‍ය ජන ජීවිතයට විශාල වශයෙන් බලපාන අමාත්‍යාංශයක වැය ශීර්ෂ ගැන කථා කරන දවසක් අද. වර්තමාන ඇමතිවරයාට අපි සුබපතනවා. මොකද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයකුටයි නිවාස විෂය සම්බන්ධව වගකීම භාර වෙලා තිබෙන්නේ. එතුමාගේ කථාව මම අහගෙන හිටියා. එතුමා කිව්වා, අහවල් වසරේ "සැමට සෙවණ" කියන නිවාස ව්‍යාපෘති ඉලක්කයට යන්න එතුමන්ලාට බැහැ කියලා. එහෙම කියමින් එතුමා කථාවට ආරම්භයක් ගත්තා.

අපේ දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙකු වන නිසා අපි එතුමාට සුබ පතනවා. හැබැයි, මේ වාගේ සෘණ විධියට හිතන්න එපා. අපි ඉලක්කයක් නැතුව ඔය වගේ ගමන් කරන්න ගියොත්, අපේ target එකට යන්න බැරි වෙනවා. ගරු ඇමතිතුමනි, වසර 30කින් කරන්න යෝජනා වෙලා තිබ්බ මහවැලිය වසර 5කින් අවසන් කර ගන්න අපට පුළුවන් වුණේ හිතේ ධෛර්යයත් එක්ක ඉලක්කයක් ඇති කර ගැනීම නිසායි. නමුත්, ඔබතුමා එවැනි සෘණාත්මක කථාවක් කියලාම ඔබතුමාගේ අමාත්‍යාංශය දෙසට තම අවධානය යොමු කරන්න ගත්තාම දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන් විධියට අපිත් අපහසුතාවට පත් වෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඔබතුමා දන්නවා, අපි නිවාස ලක්ෂයේ වැඩසටහන, නිවාස දස ලක්ෂයේ වැඩසටහන, නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන වාගේ ඉලක්ක තියාගෙන වේගයෙන් කටයුතු කරගෙන ගිහිල්ලා, එම ඉලක්ක සපුරා ගත්තු බව.

ගරු ඇමතිතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඔබතුමාට මේ අමාත්‍යාංශය ලැබීම ගැන අපි සතුටු වෙනවා; අපි ඔබතුමාට සුබ පතනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කරපු නිවාස ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා, අතරමඟ නතර වෙලා. ඒ හේතුවෙන් ඒ ජනතාව අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ණය වශයෙන් අරගෙන, ඒ වාගේම ආධාර වශයෙන් අරගෙන පටන් ගත්තු ඒ සියල්ල අතරමඟ නතර වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ අයට සාධාරණයක් ඉටු කරලා දෙන්න, දේශපාලන ඇහින් බලන්නේ නැතුව. ඒ ව්‍යාපෘති අතරමඟ නතර වෙන්න හේතු සොයලා, අවශ්‍ය කරන මුදල් ටික ලබා දීලා සහනයක් සලසන්න. මොකද, ඒ ව්‍යාපෘති අතරමඟ නතර වෙලා තිබෙන නිසා ණය අය කර ගන්නත් බැහැ. විවිධ ගැටලු ගණනාවක් මේ හරහා මතු වෙනවා. ඉතින් ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා.

විශේෂයෙන්ම රණ විරුවන් සම්බන්ධව කථා කරපු අපේ ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්න හින්දා රණවිරු නිවාස හා සම්බන්ධ කාරණයක් කියන්න ඕනෑ. අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු රටේ සමස්ත දිස්ත්‍රික්කවල ඉපලෝගම රණවිරු ගම්මානය ඇතුළුව රණවිරු ගම්මාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ රණවිරු ගම්මානවල ඉන්න නිවාස හිමියන්ගේ නිවාසවලටත් ඔප්පු ලබා දීමට අද වනකල්ම හැකියාවක් ලැබිලා නැහැ. ඒ නිසා විශේෂ අවධානයක් ඒ කෙරෙහිත් යොමු කරලා කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

රණ විරුවන් ගැන කථා කරපු නිසා විශේෂයෙන් මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී සඳහන් කළා, ත්‍රිවිධ හමුදාවේ රණවිරුවෝ 46,000 ගණනක් සේවය අත් හැරලා ගිහින් කියලා. හැබැයි, මා දැනුවත් විධියට නම් ඒ ප්‍රමාණය 15,000ක් පමණ සංඛ්‍යාවක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ 15,000 ගණන ගත්තොත්, අද පාතාලයේ වැඩිම වෙඩික්කරුවන් බවට පත් වෙලා තිබෙන්නේ හමුදාව අත් හැර ගිය ඒ අයයි. ඒ අයට පොදු සමාවක් ලබා දීලා, එක්කෝ නීත්‍යනුකූලව හමුදාවෙන් අයින් වෙන්න, එහෙම නැත්නම් නැවත හමුදා සේවයට ඇතුළත් වෙන්න හෝ අවස්ථාවක් ලබා දුන්නොත් හොඳයි. මොකද, හැංගිලා ඉන්න නිසා තමයි ඒ අය පාතාලයට යොමු වෙන්න තිබෙන ඉඩ කඩ වැඩි වෙලා තිබෙන්නේ. ඔබතුමාගේ ඉලක්කම් අනුව 46,000 ගණන කොයි විධියට ආවාද කියන එක හමුදාවේ ඉන්න නිලධාරීන්ටත් ගැටලුවක් වෙලා තිබෙනවා. 15,000 ගාණක් විතර තමයි ඉන්නවා කියන්නේ. ඔබතුමන්ලාට පුළුවන් නම්, ඒ අයට පොදු සමා කාලයක් දීලා එක්කෝ හමුදාවෙන් කැමැත්තෙන් විශ්‍රාම ගන්නට, එහෙම නැත්නම් නැවත හමුදා සේවයට බැඳෙන්නට පුළුවන්කම සලස්වන්න. එහෙම කළොත් ඒ අය පාතාලයට යන ඉඩ කඩ අහුරා ගැනීමේ හැකියාව බොහෝ දුරට තිබෙනවා.

නිවාස සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා පිළිබඳ විශාල චෝදනාවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මා හිතන විධියට ඔබතුමා වෙන්න ඕනෑ, මේ 17වෙනි දා රැස්වීමක් කැඳවලා තිබුණේ. ඒ විනාඩි 45ක රැස්වීමට ඔබතුමාම ඇමතිතුමා විධියට උපදෙස් දීලා තිබෙනවා, ඒකට දිස්ත්‍රික් කළමනාකරුවන් කැඳවන්න අවශ්‍ය නැහැ කියලා. නමුත් හිතුවක්කාර විධියට, එතුමාගේ තනි කැමැත්තට දිස්ත්‍රික් කළමනාකරුවන් ඔක්කෝම කැඳවලා තිබෙනවා. ඒ සඳහා ලක්ෂ 8කට වඩා දෛනික වියදමක් දරලා තිබෙනවා. ඒ අයට කෑම වේලක් කාලා යන්නද කොළඹට කැඳෙව්වේ කියන ප්‍රශ්නය තිබෙනවා. මොකද, ඔබතුමාගේ මතයටත් උඩින් එය කරලා

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

තිබෙන්නේ. ඒ අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරු කියන්නේ එයා පැලවත්තෙන් plant කරපු කෙනෙක්; ඒ නිසා ඔහු ඇමතිවරයාටවත් ඇහුම්කන් දෙන්නේ නැති, හිතුවක්කාර විධියට කටයුතු කරන කෙනෙක් කියලායි.

ඔබතුමන්ලා දැන් කැබ් රථ ගැන කථා කරනවා නේ. එතුමාත් රථය ගැන ලොකු කැක්කුමක් ඇති වෙච්ච කෙනෙක්. එතුමාට දීලා තිබුණු හයිබ්‍රිඩ් වාහනය අත් හැර දාලා එතුමාගේ වාහනය පාවිච්චි කරලා තිබෙනවා; ඒකට අදාළව ඉන්ධන පාවිච්චි කරලා තිබෙනවා. ඒකට විරෝධතා එනකොට ආපසු අමාත්‍යාංශයෙන් දීලා තිබෙනවා, කැබ් එකක්. ඔබතුමන්ලා කැබ් එක නිල රථය කරගෙන ඉන්න කාලයේ එතුමා කැබ් එක ප්‍රතික්ෂේප කරලා ආපසු මොන්ටෙරෝ එකක් අරගෙන තිබෙනවා. ඒක හදන්න 26 ලක්ෂ ගාණක් වියදම් කරලා තිබෙනවා. ඒකට වෙනම ඉන්ධන වියදම ආදි ඔක්කෝම ගන්නවා කියන චෝදනාත් තිබෙනවා. ඔබතුමන්ලා කැබ් එක නිල රථය කරගෙන ඉන්න කොට එතුමා මොන්ටෙරෝ එකක් අරගෙන ඉන්නවා. ඒ වාගේ කටයුතු කරන ගමන් එතුමාගේ තනි කැමැත්තට ලක්ෂ 90කට එහා ගිය, ජල සම්පාදනයට අදාළ ජල කුලුනක් ඉවත් කිරීමේ කටයුත්ත එතුමාගේ හිතවතුන්ට ප්‍රසම්පාදනයෙන් තොරව ලබා දුන්නා කියලා චෝදනාවකුත් තිබෙනවා. අමාත්‍යාංශයේ වැඩ කරන නිලධාරින් තමයි කියන්නේ, එතුමා එක්ක වැඩ කරන්න බැහැ, හිතුවක්කාර විධියටයි වැඩ කරන්නේ, ඇහුම්කන් දෙන්නේ නැහැ කියලා. ඒ වාගේම එතුමා, වැඩ තහනමට ලක් වෙච්ච, රැකියා දෙනවා කියලා සල්ලි ගත්තු, දූෂණයන් කරපු නිසා රැකියාව අහිමි කර ගත් කෙනෙකු තමන්ගේ ළඟම තියාගෙන, ඔහුගේ උපදෙස් මත කටයුතු කරනවා කියලා මේ අමාත්‍යාංශයේ වැඩ කරන නිලධාරින් කියනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා දූෂණය සිදු කරන අයට චෝදනා කරමින් දූෂණයට එරෙහිව කටයුතු කරන්න ආපු උදවිය. එක පැත්තකින් කැබ් රථයක් සම්බන්ධ චෝදනා ලබපු, අනෙක් පැත්තෙන් ටෙන්ඩර් පටිපාටියෙන් තොරව කොන්ත්‍රාත් ලබා දීපු, තවත් පැත්තකින් ඔබතුමාගේ කීමටත් පිටින් කටයුතු කරපු කෙනෙක්, එතුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඒ කාරණා වාගේම කිව යුතු තවත් කරුණු ගණනාවක් තිබෙනවා. නමුත් මට තිබෙන කාලය සීමිතයි. අද විවාදය ප්‍රවාහන ක්ෂේත්‍රයටත් අදාළ වන නිසා ඒ ගැනත් සඳහන් කරන්න ඕනෑ. අපි දන්නවා, විශේෂයෙන් පසුගිය කාල සීමාවේ මහව ඉඳලා අනුරාධපුරය දක්වා දුම්රිය මාර්ගය අලුත්වැඩියා කිරීම් සිදු වුණු බව. ඒ කාල සීමාවේදී, ඊට පෙර සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වෙච්ච දුම්රිය සේවාවන් ක්‍රියාත්මක වුණේ නැහැ; කොළඹ ඉඳලා යාපනය දක්වා වූ දුම්රිය ගමනාගමනය සිදු වුණේ නැහැ. අද ඒ දුම්රිය මාර්ගයේ වැඩ අවසන් කරලා තිබෙනවා. නමුත් කලින් ධාවනය වෙච්ච දුම්රිය තවම ධාවනය වන්නේ නැහැ. විශේෂයෙන් "උත්තර දේවි" කියලා දුම්රියක් ධාවනය වුණා, කොළඹින් පෙර වරු 11.55ට. නමුත් අද වෙනකම් එය ධාවනය කිරීමේ කටයුතු නැවත ආරම්භ කරලා නැහැ. ඒ වාගේම තලෙයිමන්නාරම දක්වා ගිය තැපැල් දුම්රියේත් ධාවන කටයුතු තවම ආරම්භ කර නැහැ. ඒ දුම්රිය දෙකේම ධාවන කටයුතු තවම ආරම්භ කර නැහැ. ඒ වාගේම මහව සහ අනුරාධපුරය අතර නිවැරදි සංඥා ක්‍රමයක් අනුගමනය කරන්නේ නැහැ. ඒ නිසා දුම්රිය නතර කරන්නේ කොතැනද, station එකේ නිලධාරි මහත්මයෙක් එතැනට දුවගෙන ගිහිල්ලා තමයි tablet එක දෙන්නේ. මොකද, ඒක එන්ජින් රියැදුරාටම දෙන්න ඕනෑ. ඒ නිසා මේවා සම්බන්ධව ඉක්මනින් අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මොකද, දැන් මාර්ග එහෙම අලුත්වැඩියා කර තිබෙනවා. දැන් හොඳින්, වේගයෙන් දුම්රිය ධාවනය කරන්න හැකියාව තිබෙනවා. ඒ නිසා මම සඳහන් කළ මේ වාගේ ප්‍රමාදයන් නතර කරන්න කටයුතු කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

දුම්රිය දෙපාර්තමේන්තුව තමයි එම දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් ඌන පරිභෝජන තත්ත්වයකින් තබා ගෙන ඉන්නේ. අනුරාධපුරය දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම ඉඩම් සම්බන්ධව නිවැරදි කළමනාකරණයකින් කටයුතු කළ යුතුයි. එක්කෝ, ඒවා පෞද්ගලික අංශයට ලබා දී හෝ නැත්නම් රාජ්‍ය අංශයෙන්ම කළමනාකරණය කරලා හෝ ඒවායෙන් ලබා ගත හැකි උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට කටයුතු කරන්නය කියන කාරණයත් මා ඔබතුමන්ලාට මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු ප්‍රවාහන සේවය ගැන කථා කරනකොට, දුම්රිය සේවය රජය විසින් නඩත්තු කරන එකක් නිසා ඒ ගැන තමයි අපි අවධානය යොමු කරන්නේ. බස් රථ ගත්තාම, පෞද්ගලික අංශයේ මැදිහත්වීම තුළ බස් රථ මඟින් යම් කිසි ආකාරයක හොඳ ප්‍රවාහන සේවයක් ජනතාවට ලැබෙමින් තිබෙනවා. නමුත් ඒ තුළත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මම හිතන විධියට CCTV සවි කරන්නට පවා අවධානය යොමු වෙන්න ඇත්තේ ඒ නිසා තමයි. ජනතාවට හොඳ ප්‍රවාහන සේවයක් ලබා දීම වෙනුවෙන් ප්‍රවාහන පද්ධතිය කාර්යක්ෂම කරන්න නම්, ඒ වාගේම පෞද්ගලික අංශයේ ඒකාධිකාරිත්වය බිඳ දමන්න නම්, ලංගම බස් රථ සේවය වැඩිදියුණු කිරීමේදී නවීන තාක්ෂණයට අවධානය යොමු කරන්න කියාත්, නවීන බස් රථ ලබා දීම සඳහා කටයුතු කරන්න කියාත් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ මන්ත්‍රීතුමා මගේ කථාව පාදක කරගෙන යම් ප්‍රකාශයක් කළා. 2000දී සැමට සෙවණ දෙනවා කියලා, අද වනවිට අවුරුදු 25ක් ගත වෙලා තිබෙනවා. සැමට සෙවණ දුන්නාද? ඊළඟට, 2010දීත් සැමට සෙවණ දෙනවා කියලා, අද වනවිට අවුරුදු 15ක් ගත වෙලා

තිබෙනවා. නමුත් සැමට සෙවණ දුන්නාද? 2025දීත් සැමට සෙවණ දෙනවා කියලා, අන්න ඒ දේශපාලන බොරුව අපි කරන්නේ නැහැ කියලායි මම කිව්වේ. *[බාධා කිරීමක්]* ඒක තමයි පාවිච්චි කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා කිව්වා, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ගෙවල් හදපු, - *[බාධා කිරීමක්]* කට්ටියගේ ප්‍රශ්න විසඳන්න කියලා. 2015-2019 කාලය තුළ ඔබතුමාගේ නායකයා නිවාස ව්‍යාපෘති 22ක් ආරම්භ කර තිබෙනවා. *[බාධා කිරීමක්]* 2019 පැවැති ජනාධිපතිවරණයට කිට්ටු කරලා සිමෙන්ති කොට්ට 20කුයි, රුපියල් 20,000කුයි බෙදලා මිනිස්සු අනාථ කළා. ඔබතුමන්ලාගේ නාම ලේඛනවලට අනුව ඒවා දුන්නේ. ගෙවල් නැති මිනිස්සුන්ට නොවෙයි, දුන්නේ. 2015-2019 කාලය තුළ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිවාස ව්‍යාපෘති 167ක් පටන් ගෙන තිබෙනවා. *[බාධා කිරීම්]* ගෙවල් 4,981ක් හදන්න plan කර තිබෙනවා. නමුත් තවම ගෙවල් 4,525ක් භාගෙට හදලා තිබෙන්නේ. ඔන්න කෙරුවාව. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, අවසන් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

අපි ඒ දේශපාලන බොරුව කරන්නේ නැහැ කියලා තමයි මම කිව්වේ. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එහෙම නම් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් පුළුවන්, කථාවෙන් කථාවට නැඟිටින්න. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
බෙහෙවින්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්] අද දින ප්‍රවාහන, මහා මාර්ග - [බාධා කිරීම්]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එහෙම නැඟිටින්න බැහැ. එහෙම නැඟිටින්න පුළුවන් නම් ඉතින්,- *[බාධා කිරීම්]* මොකක්ද? අපි නැඟිට්ටේ නැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. UPUL KITHSIRI left the Chair, and THE HON. KAVEENTHIRAN KODEESWARAN took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Danushka Ranganath, you may commence your speech now. - *[Interruption.]*

[අ.භා. 4.04]

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
මේක කාරක සභා අවස්ථාව නේ. ගරු මන්ත්‍රීතුමා, මට අවස්ථාව දීලා ඔබතුමාත් වාඩිවෙන්නකෝ. මුජිබුර් මන්ත්‍රීතුමා, වාඩිවෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරක සභා අවස්ථාවේ පැවැත්වෙන මෙම විවාදය සඳහා සහභාගිවීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීම්]* විපක්ෂයේ ඔය කෑ ගහන සමහර මහත්වරුන් පොඩි දේටත් මේ වාගේ කෑ ගහන්නේ මොකද කියලා අපි දන්නවා. මේ රටේ ආර්ථිකය ස්ථාවර කරලා, මේ රට නිවැරදි මාර්ගයකට ගෙන යන්න ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කටයුතු කරද්දී, මේ වාගේ අය මේ විධියට කෑ ගහන්න ඕනෑ තමයි. මේ අය මේ වාගේ කෑ ගහන්නේ නැත්නම්, කවුද කෑ ගහන්නේ? මෙතුමන්ලා කෑ ගහන්නේ බලය වෙනුවෙන්ම තමයි. ඒ නිසා අපි විපක්ෂයේ මේ අයට කියන්න කැමැතියි, ඔයගොල්ලන් ඔය විධියට කෑ ගහගෙන යන්න, ඔහොම කරලා ඔයගොල්ලන්ගේ වේදිකාව, ඔයගොල්ලන්ගේ ගැලරිය පිනවන්න කියලා. හැබැයි. අපි මේ රටේ ජනතාවත් එක්කයි සම්බන්ධ වෙලා ඉන්නේ; අපි මේ රටේ ජනතාවත් එක්ක සම්මුතියකට බැඳිලා ඉන්නේ. මේ විධියට කෑ ගහන, බොරු කියන විපක්ෂයත් එක්ක නොවෙයි, අපි සම්මුතියකට බැඳී ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටික වෙලාවකට කලින් ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් අදහස් දක්වා ගියා. එතුමන්ලාගේ පාලන කාලයේ දවසකට-දෙකකට අච්චර, මෙච්චර පාරවල් හැදුවා කිව්වා. හැබැයි, කොච්චර හැදුවත් ඒවා මේ රටේ ආර්ථිකයට දායක වුණේ නැහැ. මේ රටේ ආර්ථිකයට ඒවා දායක වුණා නම්, අර විධියට රට බංකොලොත් වෙන්නේත් නැහැ. ඒ නිසා ඒගොල්ලන්ගේ බාප්පලා "Mr. Ten Percent"ලා බවට පත් වුණේ කොහොමද කියලා හොයා ගත්තා නම්, රට බංකොලොත් වුණේ කොහොමද කියලා අපට හොයා ගන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සිදු කරන මේ වැය ශීර්ෂ විවාදය අවස්ථාවේදී විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනෑ. ආණ්ඩුවක් විධියට පසුගිය කාලයේදී මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ඒකාබද්ධ කාල සටහනකට බස් රථ ධාවනය කිරීමට අපි උත්සාහ කළා. ලංගම බස් රථ සේවාවත්, පෞද්ගලික බස් රථ සේවාවත් ඒකාබද්ධ කරලා මේ රටේ ජනතාවට වඩා ගුණාත්මක ප්‍රවාහන සේවයක් ලබා දෙන්නට අපි උත්සාහ කළා. මේ රටේ ජනතාවට වඩා ගුණාත්මක, වඩා සුරක්ෂිත පොදු ප්‍රවාහන පද්ධතියක් හදා දෙන එක තමයි අපේ අරමුණ වන්නේ. එතැනදී අපට පෞද්ගලික අංශයද, රාජ්‍ය අංශයද කියලා බෙදීමක් නැහැ. සියලුදෙනා ඒකාබද්ධ කරගෙන වඩා ගුණාත්මක ප්‍රවාහන සේවයක් ඇති කිරීම තමයි අපේ ප්‍රධාන අරමුණ. ඒකට අදාළව රජයක් විධියට, අමාත්‍යාංශයක් විධියට අපි ජාතික වශයෙන්

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

ඒකාබද්ධ කාල සටහනකට අනුව බස් රථ ධාවනය කරන්න කටයුතු කළා. කළුතර දිස්ත්‍රික්කය තුළත් අපි ඒ සඳහා සැලැස්මක් හැදුවා. ඒකට අදාළව අපි මේ වර්ෂය මුලදී මාර්ග කිහිපයක් සඳහා ඒකාබද්ධ කාල සටහනක් සකස් කළා. සමහර මාර්ගවල වඩා සාර්ථකව දැන් බස් රථ ධාවනය වෙනවා. ඒ හරහා මේ අංශ දෙක අතර තිබෙන තරගකාරිත්වය, එකිනෙකා අතර ගැටලු අඩු වෙනවා වාගේම, දෙපැත්තටම වඩා හොඳ ආදායමක් ලැබෙනවා. ඒ වාගේම ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවයක් ලබා දීමට හැකි වීමත් ඒ හරහා සිද්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ 1,200කට ආසන්න පෞද්ගලික බස් රථ සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වාගේම 270කට ආසන්න ලංගම බස් රථ සංඛ්‍යාවක් තිබෙනවා.

ලංගමයේ ගැටලු තිබෙන බව අපි පිළිගන්නවා. කළුතර දිස්ත්‍රික්කයේ ලංගම ඩිපෝ පහක් තිබෙනවා. ඒ ඩිපෝ පහම පාඩු පිට තමයි පවත්වාගෙන යන්නේ. ගැටලු තිබෙනවා. රජයත් මැදිහත් වෙලා ඒ ගැටලු නිරවුල් කරගෙන, ඒවා ලාභ ලබන ආයතන බවට පත් කරන්න අපට අවශ්‍යයි. ඒ නිසා, එම ගැටලු විසඳාගෙන, අලාභය අවම කරගෙන, ලංගමය වඩා කාර්යක්ෂම ආයතනයක් බවට පත් කරන්න, දියුණු කරන්න අප සමඟ එකතු වෙන්න කියලා ඒ සියලු නිලධාරින්ට මේ මොහොතේත් අපි අරාධනා කරනවා. අපි ඔබත් එක්ක එකතු වෙනවා, ආණ්ඩුවක් විධියට අපි ඔබත් එක්ක සමීපව වැඩ කරනවා. ඉහළ සිට පහළ දක්වා සියලු නිලධාරින්ට සහ සේවකයන්ට මේ වෙනුවෙන් දායක වෙන්න කියලා අපි ආරාධනා කරනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග 45ක් සඳහා අපි ඒකාබද්ධ කාල සටහනක් සකස් කරලා තිබෙනවා. කළුතර මාර්ග 4ක, පානදුර මාර්ග 15ක, මතුගම මාර්ග 4ක, හොරණ මාර්ග 5ක, අලුත්ගම මාර්ග 8ක ඒකාබද්ධ කාල සටහනකට බස් රථ ධාවනය වෙනවා. ඒවායේ යම් යම් ගැටලු තිබෙනවා. අපි ඒකාබද්ධ කාල සටහනකට අනුව එම බස් රථ ධාවනය වන සියලු මාර්ග පිළිබඳව නැවත වටයකින් විමසා බැලීමක් කරන්න ඔවුන් කැඳවා තිබෙනවා. ඒ හරහා වඩාත් ඵලදායී ලෙස ඒකාබද්ධ සේවය ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කලින් කථා කළා වාගේම ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය හරහා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් තත්ත්වයට පත් වෙනවා වාගේම, ඒ තුළින් ඔවුන් රටේ ජාතික ආදායම උත්පාදනය කර ගැනීමට දායක කර ගැනීම සඳහාත් අවස්ථාව ලැබෙනවා. ඒ නිසා ආණ්ඩුවක් විධියට අපි මේ රටේ ග්‍රාමීය මාර්ග පද්ධතිය දියුණු කරන්නත් මැදිහත් වෙමින් ඉන්නවා. විශේෂයෙන්ම පසුගිය කාලයේ RDA එක මැදිහත් වෙලා විශාල සේවාවක් ඉටු කළා. ප්‍රාදේශීය සභා මඟින් නඩත්තු කරන්නේ නැති මාර්ග පද්ධතිය RDA එක භාර අරගෙන, ඔවුන් වඩා හොඳින් ඒ සඳහා මැදිහත් වුණා. RDA එක මැදිහත් වෙලා විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ මාර්ග 74ක්, ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් මාර්ග 426ක් වශයෙන් මාර්ග 500ක වැඩ කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසුගිය කාලයේදී iRoad ව්‍යාපෘතිය යටතේ පටන් ගත් බොහොමයක් මාර්ගවල කටයුතු අතරමඟ නතර කරලා තිබුණා, අපට මතකයි. රාජ්‍ය අමාත්‍යවරයෙක් හිටියා, දයා ගමගේ කියලා. එතුමා මුළු කළුතර දිස්ත්‍රික්කයේම මාර්ග පද්ධතිවල වැඩ අතරමඟ නතර කරන්න කටයුතු කළා. ඒ අනුව iRoad ව්‍යාපෘතිය යටතේ පටන් ගත් මාර්ග විශාල ප්‍රමාණයක් තවමත් ජනතාවට භාවිත කරන්න බැරි තත්ත්වයේ තිබෙනවා. ආණ්ඩුවක් විධියට අන්න ඒ මාර්ග සියල්ල සංවර්ධනය කිරීම අපේ වගකීම බවට පත් කරගෙන, ඒ මාර්ගවලින් වැඩි ප්‍රමාණයක් සාදා නිම කරන්න දැන් අපි කටයුතු කරමින් යනවා. ඒකට අදාළව කළුතර දිස්ත්‍රික්කය තුළ අතරමඟ නතර කර තිබෙන මාර්ග 24ක් iRoad ව්‍යාපෘතිය යටතේ හදන්න දැන් අපි ටෙන්ඩර් කැඳවා තිබෙනවා. මේ වන විට ඒකේ අවසාන කටයුතු සිදු වෙමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් වඩාත් වේගයෙන් රට සංවර්ධන මාවතකට ගෙනයන්න අපි අපේක්ෂා කරනවා. හැබැයි, විපක්ෂයේ ඉන්න ගොඩක් අය මේ තත්ත්වය තේරුම් අරගෙන නැහැ. අපි එහෙම කියන්නේ ඇයි? අපි භාර ගත්තේ වට්ටපු ආර්ථිකයක් සහිත රටක්; නැවතුණු ආර්ථිකයක් සහිත රටක්. ආර්ථික, දේශපාලන, සමාජයීය වශයෙන් වූ සෑම ක්ෂේත්‍රයකම වර්ධනය නතර කරලා තිබිච්ච රටක් අපි භාර ගත්තේ. නතර කර තිබිච්ච රටක් එතැනින් එහාට අපි පණගන්වාගෙන යන අවස්ථාවක් තමයි දැන් තිබෙන්නේ. ඒ නිසා මේ කඩඉම වඩා සාර්ථකව අපි සපුරනවා කියා ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Sujith Sanjaya Perera. You have been allotted seven minutes.

[අ.භා. 4.11]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන අද දිනයේ ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රවාහන අමාත්‍යාංශය කියන්නේ රටේ ජනතාවට විශාල සේවාවක් සිදු කරන, ඒ වාගේම විශාල ජනතාවකට අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් වෙලා තිබෙන අමාත්‍යාංශයක්. විශේෂයෙන්ම ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් කාඩ්පත් හරහා බස් ගාස්තු ගෙවීමට අවස්ථාව සලසා දීමේ කටයුත්ත අද ආරම්භ කිරීම පිළිබඳව අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි බලාපොරොත්තු වනවා, ඉදිරි කාලයේදී මේ කටයුත්ත දීප ව්‍යාප්තව සිදු කරන්නත්, ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ දක්වාත් ක්‍රියාත්මක කරන්නත් කටයුතු කරයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයට කාඩ්පත්වලින් ගාස්තු ගෙවීමේදී සමහර වෙලාවට යම්කිසි කොමිස් මුදලක්, එහෙම නැත්නම් බැංකුවලින් කොමිස් මුදලක් අය කිරීම වැනි තත්ත්වයක් තිබෙනවා ද කියලාත් අපේ පාරිභෝගික ජනතාව අතර යම් සැකයක් මතුව තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමාගෙනුත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් මම ඉල්ලා සිටින්න කැමැතියි, කාඩ්පත්වලින් ගාස්තු ගෙවීමේදී එවැනි ආකාරයට කොමිස් මුදලක් අය කර ගන්නේ නැහැ කියන එක ගැන මේ රටේ ජනතාවට යම්කිසි තහවුරුවක් ලබා දෙන්න කියලා. එවැනි තහවුරුවක් ලබා දෙනවා නම් එය ඉතා හොඳයි.

ගරු ඇමතිතුමනි, ප්‍රවාහන අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරද්දි විශේෂයෙන්ම තවත් කරුණු කිහිපයක් සාකච්ඡා කරන්න ඕනෑ. එකක්, සේවකයන්ගේ ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, මීට කලින් කථා කරපු මන්ත්‍රීවරුන් සේවකයින්ගේ අඩුපාඩු ගැන කියා සිටියා. අද බස් රථ ධාවනය කරන්න අවස්ථාව තිබුණත්, සමහර වෙලාවට රියදුරන්ගේ, කොන්දොස්තරවරුන්ගේ හිඟය නිසා කාල සටහන් අනුව ධාවනය කළ යුතු බස් රථ ධාවනය කරගන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. මට දැනගන්න ලැබී තිබෙනවා, මේ අය බඳවා ගැනීමේ කටයුතු දැන් සිදු කරනවා කියලා. මම ඉල්ලා සිටින්න කැමැතියි, කරුණාකර රියදුරන්ගේ සහ

කොන්දොස්තරවරුන්ගේ බඳවා ගැනීම් කඩිනම් කරලා, ඒ සේවාවන් යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. ඒ වාගේම ගරු ඇමතිතුමාත් ප්‍රකාශ කළා, නව බස් රථ ලබා ගන්න කටයුතු කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල නොයෙකුත් ආකාරයෙන් කථාබහට ලක් වුණු කාරණයක් තිබෙනවා. ඒ තමයි, ලොරි වැසිවලට බස් බොඩි ගසා ධාවනය කරනවා කියන කාරණය. එවැනි දේවල් අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. අවුරුදු 40ක්, 50ක් තිස්සේ ඉඳන් ඉන්දියාවේ සිට ගෙන්වන බස් රථවලින් තමයි අපේ ප්‍රවාහන කටයුතු සිද්ධ වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චීනයෙන් බස් රථ ආනයනය කරන්න, ජපානයෙන් බස් රථ ආනයනය කරන්න ගියොත් ඒ වෙනුවෙන් විශාල පිරිවැයක් දරන්න සිද්ධ වනවා. ඒක ලංකා ගමනාගමන මණ්ඩලයට කිසිසේත්ම දරන්න පුළුවන්කමක් නැහැ. ඉන්දියාවේ ධාවනය වන්නේත්, අනෙකුත් රටවල ධාවනය වන්නේත් වැඩිපුරම ඉන්දියාවේ හදන බස් රථ. එම නිසා මේ බස් රථම නැවත වරක් අපේ ගමනාගමන ක්ෂේත්‍රයට එකතු කර ගන්න කටයුතු කරන්න කියලා මම කියන්න කැමැතියි. මොකද, විශේෂයෙන්ම මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, නොයෙකුත් ආකාරයේ දුෂ්කරතා තිබෙන පාරවල් තමයි අපේ දිස්ත්‍රික්කයේ තිබෙන්නේ. එවැනි මාර්ගවල ජපන් වාහන, චීනයෙන් ගෙන්වන අති සුඛෝපභෝගී වාහන ධාවනය කරන්න පුළුවන්කමක් නැහැ. අපේ රටට මේ බස් රථවල දැඩි හිඟයක් තිබෙන බව අපි දන්නවා. කුඩා ප්‍රමාණයේ බස් රථ, ඒ කියන්නේ type "C" බස් රථ අවශ්‍ය ප්‍රමාණයවත් ආනයනය කිරීම පසුගිය කාල සීමාව තුළදී ඉතාම මන්දගාමී වෙලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද වන විට දුෂ්කර මාර්ගවලට අත්‍යවශ්‍ය සේවාවක් සපයන type "C" බස් රථ නැවත ලබා ගැනීමට අපි කටයුතු කළ යුතු වනවා. එම නිසා මේ පිළිබඳව අපි ගරු ඇමතිතුමාගේත්, මේ ආණ්ඩුවේත් අවධානය යොමු කරවන්න කැමැතියි. මේ කුඩා බස් රථ ටික ග්‍රාමීය මාර්ගවල ගමනාගමන කටයුතු සඳහා යොදවා ගන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

ඊට අමතරව සේවකයන්ගේ වැටුප් ප්‍රශ්න පිළිබඳවත් මම කියන්න ඕනෑ. අපි දන්නවා, ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ගේ වැටුප් සම්බන්ධව යම්කිසි අක්‍රමිකතාවක් තිබෙන බව. පසුගිය කාලයේ වැටුප් වැඩි වීමක් සිදු වුවත් එය ක්‍රමවත්ව, ක්ෙතයක් අනුව සිදු නොවුණු නිසා දැන් ඒ සේවකයින්ට එම වැටුප් වැඩි වීම ලබා ගන්න හැකියාවක් නැහැ කියලා මැසිවිල්ලක් තිබෙනවා. ඒ සම්බන්ධවත් අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරන්න කියලා ගරු අමාත්‍යතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ලංකා ගමනාගමන මණ්ඩලය කියන්නේ, දීර්ඝ කාලයක සිට වෘත්තීය සමිතිවලට යට වෙලා තිබුණු ආයතනයක්. ඒ සම්බන්ධව වර්තමාන ආණ්ඩුවට විතරක් මම චෝදනා කරන්නේ නැහැ. හැබැයි, තමුන්නාන්සේලා බලයට පත් වුණාට පසුවවත් එය වෙනස් වෙලා නැහැ. එහි ප්‍රශ්න රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම එහි ආණ්ඩු පක්ෂයට සම්බන්ධ වෘත්තීය සමිතිවල සාමාජිකත්වය ලබා ගත්තේ නැත්නම් කුඩම්මාගේ සැලකිලි තමයි ලැබෙන්නේ. සමහර වෙලාවට හොඳ ධාවන තත්ත්වයේ තිබෙන බස් රථ ලබා ගැනීමේ අවස්ථාව නැතිවනවා. සමහර වෙලාවට ඔවුන් ධාවනයෙන් ඉවත් කරනවා. සමහර විට standby තබන අවස්ථා තිබෙනවා. ආණ්ඩු පක්ෂයට සම්බන්ධ වෘත්තීය සමිතිවල සාමාජිකත්වය ලබා නොගන්නා අයට මෙවැනි අසාධාරණකම් ආයතනය තුළ සිද්ධ වනවා. එම නිසා මම ගරු ඇමතිතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, එම තත්ත්වය නැති කරන්න කියලා. මොකද ඔබතුමන්ලා කිව්වේ, සර්ව සාධාරණ පාලනයක් ගෙන එන බව සහ දේශපාලන වශයෙන් කාගෙන්වත් පළිගැනීම් නොකරන බවයි. එම නිසා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, එම සේවකයන්ට අසාධාරණයක් කරන්න එපා කියලා. ඒ අය විවිධ වෘත්තීය සමිතිවලට සම්බන්ධ වෙලා ඉන්න පුළුවන්. විවිධ දේශපාලන පක්ෂවලට සම්බන්ධ වෙලා ඉන්න පුළුවන්. එම නිසා ඒ අයගෙන් පළිගැනීමක් කරන්න එපා කියලා තමයි මට මේ අවස්ථාවේ කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැලණිවැලි දුම්රිය මාර්ගය සම්බන්ධයෙනුත් කාරණයක් කියලා කථාව නතර කරන්නම්. පසුගිය දවස්වල ගරු ඇමතිතුමා නිරන්තරයෙන් ප්‍රකාශ කළා, ආණ්ඩුවෙනුත් ප්‍රකාශ කර තිබුණා, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කරන්න කටයුතු කරන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළව තවත් නොයෙකුත් ආකාරයේ යෝජනා තිබුණු බව අපි දන්නවා. මාලබේ ඉඳන් ක්‍රියාත්මක කරන්න තිබුණු LRT ව්‍යාපෘතිය අත්හිටුවන්න පසුගිය කාලයේ කටයුතු කළා. මේ රටේ තිබෙන මුදල් තත්ත්වයත් එක්ක, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුරය දක්වා දීර්ඝ කරන්න පුළුවන් වෙයිද කියන එක ගැන අපට ලොකු සැකයක් තිබෙනවා. මම ඉල්ලා සිටින්න කැමැතියි, තිබෙන දුම්රිය මාර්ග ටික වැඩිදියුණු කරන්න කටයුතු කරන්න කියලා. අපි දන්නවා, අවිස්සාවේල්ලේ ඉඳලා කොළඹ දක්වා වූ දුම්රිය මාර්ගය හරියට හැදුවොත් හයිලෙවල් පාරේ තිබෙන වාහන තදබදය සම්පූර්ණයෙන්ම නැති කරන්න පුළුවන් බව. කැලණිවැලි දුම්රිය මාර්ගය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කරලා, නවීන තාක්ෂණය අනුව සංවර්ධනය කරන්න කටයුතු කළොත් හයිලෙවල් මාර්ගයේ තිබෙන වාහන තදබදය අඩු කරන්න පුළුවන් වෙයි. දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම ගැන කථා කරනවාට වඩා ඒ සම්බන්ධව අවධානය යොමු කරනවා නම් ඉතා වැදගත් කියලා මම කියන්න කැමැතියි. එහෙම වුණොත් අවිස්සාවේල්ලේ සිට කොළඹ කොටුව හෝ මරදාන දක්වා පැයක් වැනි කාල සීමාවක් ඇතුළත එන්න පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලබා දුන් කාල වේලාව ඉක්මවා ගිහින් තිබෙන නිසා මහාමාර්ග අමාත්‍යාංශය ගැන කාරණා දෙකක් කියලා මම කථාව නතර කරනවා. මාර්ග සංවර්ධනය සඳහා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙන බව කියනවා. ගරු ඇමතිතුමනි, එහෙම නම් මම ඔබතුමාට විශේෂයෙන්ම කියන්න කැමැතියි, පසුගිය ආණ්ඩුවෙන් පටන් ගත් කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩසටහන ගැන. අපි දන්නවා, එම වැඩසටහනේදී විශාල වශයෙන් මුදල් නාස්තියක් වුණු බව. එම ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කළත්, අවසන් කරන්න කටයුතු කළේ නැහැ. මාර්ග සංවර්ධනය සඳහා මුදල් යොදවනවා නම්, -විශේෂයෙන් කාපට් මාර්ග සඳහා මුදල් යොදවන්න කටයුතු කරනවා නම්- අනිවාර්යයෙන්ම ඔබතුමන්ලා ප්‍රමුඛතාව දෙන්න, පටන් අරගෙන අතරමඟ නතර කරලා තිබෙන ව්‍යාපෘති ටිකේ වැඩ අවසන් කරන්න. එම ඉල්ලීම මම ඔබතුමන්ලාගෙන් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයට අදාළ කාරණයක් විතරක් කියලා කථාව අවසන් කරන්නම්. යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ තිබෙන ගරාගොඩ පාලම ගම්මාන රාශියකට

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

සම්බන්ධ වනවා. එම පාලමේ වැඩකටයුතු ආරම්භ කරලා මේ වනකොට අවුරුදු තුනකට වැඩියි. ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. මොකද, මේ සම්බන්ධව මම උපදේශක කාරක සභාවේදීත් කිව්වා. අද එම පාලමේ වැඩකටයුතු සිදු වන්නේ ඉතා මන්දගාමී ලෙසයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මා ඉල්ලා සිටිනවා, එම පාලම කඩිනමින් හදන්න රජයේ අවධානය යොමු කරන්න කියලා. මොකද, වැඩි පිරිසකට ඒ තුළින් ප්‍රතිලාභ ලැබෙනවා. එම ඉල්ලීම කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Dilip Wedaarachchi. You have seven minutes.

[අ.භා. 4.19]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය කියන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව කෙරෙන කාරක සභා අවස්ථා විවාදයේදී අපේ දිස්ත්‍රික්කයට සහ රටට බලපාන නිවාස අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් යොමු කරන්න මා බලාපොරොත්තු වනවා, මට ලැබී තිබෙන කාල වේලාවේ හැටියට.

මම විශේෂයෙන්ම කථා කරන්න කැමැතියි, නිවාස පිළිබඳව. අද හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ මුළු රටේම ඉන්න 47,093දෙනෙක් තමන්ගේ නිවස හදාගත නොහැකිව, රජයෙනුත් හදලා නොදෙන තත්ත්වයක් තුළ ළතැවෙන මොහොතක තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. පසුගිය අය වැය විවාදයේදීත් මම මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. නමුත්, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. විශේෂයෙන්ම 2025 වර්ෂයේදී රුපියල් මිලියන 104,532ක් නිවාස අමාත්‍යාංශයෙන් නිවාස ඉදිකිරීමට වෙන් කර තිබුණා. නමුත්, ඒකෙන් සියයට 35යි වැඩ කරලා තිබුණේ. අනෙක් සල්ලි ඔක්කොම ආපසු භාණ්ඩාගාරයට ගියා. මම එදා ඉදිරිපත් කරපු ඒ යෝජනාව ඔබතුමන්ලා ක්‍රියාත්මක කළා නම්, අර අහිංසක, දුප්පත්, හිසට සෙවණක් නැති, ණයවෙලා ඉන්න මිනිස්සුනේග් නිවාස 47,093හි වැඩ නිම කරන්න තිබුණා. මේ වාගේ කුහකකම් කරන්න එපා. සජිත් ප්‍රේමදාස මැතිතුමා යහ පාලන රජය කාලයේ නිවාස විෂය භාර ඇමති හැටියට මුළු රටේම ගම්මාන 2,561ක් ආරම්භ කළා. නිවාස 64,679ක ඉදිකිරීම් ආරම්භ කළා. එයින් නිවාස 17,522ක වැඩ නිම වුණා. වැඩ නතර වුණා, නිවාස 47,093ක. මෙන්න මේ වැඩ නතර වෙච්ච නිවාස 47,093හි ඉදිකිරීම් නැවත ක්‍රියාත්මක කරන්න කියලා මම අදත් මේ සභාවට වාගේම අපේ ඇමතිතුමාට යෝජනා කරනවා. අපේ රජය කාලයේ අපි ඉඩම ලබා දුන්නා. එදා කාලයේ හැටියට නිවස හදා ගන්න රුපියල් 600,000ක මුදලක් ලබා දුන්නා. නමුත්, ආණ්ඩු පෙරළියත් එක්ක අපේ ජනතාවට ඒ නිවාස හදා ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ. සිමෙන්ති, ගල්, වැලි, යකඩ, මේසන් බාස්වරුන්ගේ කුලී ගාස්තු වැඩි වුණු නිසා ඒ මිනිස්සුන්ට නිවාස හදා ගන්න බැරි තත්ත්වයක් උදා වුණා.

අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේත් ගම්මාන 337ක ගෙවල් 8,663ක වැඩ නිම වුණා. තව ගෙවල් 5,798ක් හදන්න තිබෙනවා. අද දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට යනකොට ගම්මාන 3ක්, 4ක් හමු වෙනවා. ඒ ගම්මාන 3, 4ම අද වනකොට ජරාවාස වෙලා තිබෙනවා. ඉටි කොළ ඇඳලා, බිත්ති බැඳලා, පියස්ස නැතුව, විදුලි බලය වාගේම වතුර නැතුව ඒ මිනිස්සු අසරණ තත්ත්වයට පත් වෙලා සිටිනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මුළු රටේම එවැනි නිවාස 41,000ක් තිබෙනවා. එදා සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ නිවාස සෑදීම ආරම්භ කළා. අපේ ආණ්ඩුව පෙරළුණා. මේ ජනතාව ගෝඨාභය රාජපක්ෂට ඡන්දය දුන්නා, මේ නිවාස ටික හදා ගන්න. ගෝඨාභය රාජපක්ෂ ඒ ජනතාවට පොල්ල තැබුවා. ඊට පස්සේ ඒ වේදනාවට මේ නිවාස හිමි සියයට 90ක් පමණ වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දුන්නා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු පස්දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ එක් කෙනෙක්වත් මේ ගැන කථා කරන්නේ නැහැ. නමුත්, ඒ අය එම ගම්මාන මැදින් යනවා. ඒ ගම්මානවලට ගිහින් එතුමන්ලා ඡන්දය ගත්තා. නමුත්, අද ඒ මිනිස්සුන්ට වතුර ටික නැහැ, විදුලි බලය නැහැ. එම නිසා ඒ මිනිස්සුන්ට ඒ නිවාසවල ඉන්න විධියක් නැහැ. දරු පවුල්, පොඩි එවුන් බොහොම අසරණයි. ඇවිල්ලා බලන්න, හම්බන්තොට දිස්ත්‍රික්කයට. මම අපේ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ වර්ෂයේ මේ නිවාසවල වැඩකටයුතු නිම කරන්න කියලා. ඔබතුමන්ලා දැන් රුපියල් ලක්ෂ 10ක් ලබා දෙනවා, නිවාස හදා ගන්න. මේ ණය වශයෙන් දීපු රුපියල් ලක්ෂ 6 නැවත අය කරගන්න අද ගාල්ලෙන් එනවා, නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින්. ඒ නිලධාරින් ඇවිල්ලා ජනතාවට බල කරනවා, මේ සල්ලි ගෙවන්න කියලා. නිවාස හදාගෙන නැත්නම් ඉටි කොළ ගහගෙන හරි පදිංචි වෙලා මේ සල්ලි ගෙවන්න කියලා ජනතාවට කියනවා. ඒ ජනතාවට විදුලි බලයත් නැහැ, වතුරත් නැහැ. මේ වාගේ දුප්පත්, අහිංසක ජනතාවට මේ රජයෙන් ඇයි මෙහෙම කරන්නේ? මම අද ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. සියලු දිස්ත්‍රික් නිලධාරින්ට මේ පිළිබඳව දැනුම් දෙන්න. ඒ ගැන වාර්තාවක් ලබා ගන්න. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, සියලු දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් වාර්තාවක් අරගෙන, ඒ නිවාස හැදීම වෙනුවෙන් කොච්චර මුදලක් වැය වනවාද කියා මේ සභාවට ඉදිරිපත් කරන්න.

අද ගරු ජනාධිපතිතුමාගේ උපන් දිනය. මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එතුමාගේ උපන්දිනය දවසේදීවත් හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාව ආදර්ශයට ගන්න කියලා. රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා එතුමාගේ උපන්දිනය වෙනුවෙන් එදා ගම්මාන දහස් ගණනක් සකස් කර ජනතාවට බෙදුවා. සජිත් ප්‍රේමදාස මැතිතුමාත් එතුමාගේ පියාගේ උපන්දිනය වෙනුවෙන් නිවාස නැති අහිංසක ජනතාවට නිවාස ලබා දුන්නා, ආධාර ලබා දුන්නා. අන්න ඒක ආදර්ශයට ගන්න කියලා මම කියන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම ගෙනෙන යෝජනාව මේකයි. නිවාස අමාත්‍යාංශය හරහා ඔබතුමන්ලා රුපියල් ලක්ෂ 10 ගණනේ ලබා දෙන ඒ මුදල වැඩ නතර වෙලා තිබෙන නිවාස 47,093ටත් ලබා දීලා, ඒ නිවාස සකස් කර මේ වර්ෂයේදී ජනාධිපතිතුමා හෝ ඇමතිතුමා ගිහිල්ලා ඒවා විවෘත කරන්න.

දැන් ඔබතුමන්ලා මන්ත්‍රීවරුනේග් විශ්‍රාම වැටුප අහෝසි කරන්න හදනවා, තුනෙන් දෙකක බලය යොදාගෙන. මේ රුපියල් ලක්ෂ 6ක ණය මුදල ලබා ගත් අයගේ ලැයිස්තුව අරගෙන ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඔබතුමන්ලාගේ තුනෙන් දෙකක බලයයි, අපේ බලයයි ඔක්කෝම භාවිත කරලා, මේ අහිංසක මිනිස්සුන්ගේ ණය අහෝසි කරලා, මේ නිවාස සකස්

කරන්න රුපියල් ලක්ෂ 10 බැගින් ආධාර ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රුපියල් ලක්ෂ 10 නොමිලේ ලබා දුන්නොත් ඒ මිනිස්සු ඒ රුපියල් ලක්ෂ 6ක ණය මුදල ගෙවන්න කැමතියි. ඒ ණය මුදල ගෙවන්න ඒ ජනතාවට එතකොට අවස්ථාව ලැබෙනවා. ඔවුන්ට මේ නිවාස හදා ගන්න ඕනෑ. ඒ නිසා මේ නිවාස හදා ගන්න ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න ඕනෑ.

විශේෂයෙන්ම මේක හොඳ අමාත්‍යාංශයක්; රණසිංහ ප්‍රේමදාස මැතිතුමා රටටම නිවාස ලබා දුන්නු අමාත්‍යාංශයක්. සජිත් ප්‍රේමදාස මැතිතුමා නිවාස වැඩ පිළිවෙළවල්, ගම්උදා වැඩ පිළිවෙළවල්, සෙවිලි ආධාර වැඩ පිළිවෙළවල්, සිමෙන්ති ආධාර ලබා දීමේ වැඩ පිළිවෙළවල් විශාල වශයෙන් ක්‍රියාත්මක කළේ මේ අමාත්‍යාංශය යටතේයි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. Mayilvaganam Jegatheeswaran. You have been allotted five minutes.

Order, please! The Hon. Sujeewa Dissanayake will now take the Chair.

***අනතුරුව ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KAVEENTHIRAN KODEESWARAN left the Chair and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

[பி.ப. 4.28]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு, நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு ஆகிய இரண்டு பிரதான அமைச்சுக்களின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதம் இடம்பெறுகின்றது.

எமது அரசாங்கமானது, கடந்த முறை 5,000 மில்லியன் ரூபாயை வடக்கு மாகாணத்திலுள்ள கிராமிய வீதிகளைப் புனரமைப்பதற்காக ஒதுக்கியிருந்தது. அதற்கு மேலதிகமாக 3,000 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது. அது தவிர இன்னும் 800 மில்லியன் ரூபாயையும் ஒதுக்கியிருக்கிறது. மொத்தமாக 8,800 மில்லியன் ரூபாய் வடக்கு மாகாணத்துக்கு ஒதுக்கப்பட்டு, அதற்குரிய வேலைத்திட்டங்களும் தற்போது நடைபெற்று வருகின்றன. இதைவிட, மன்னார் மாவட்டத்துக்கு 2,200 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. மேலும், 200 மில்லியன் ரூபாய் வடக்கு மாகாண கிராமிய வீதிகளின் புனரமைப்புக்காக ஒதுக்கப்பட்டுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வீதிகள் என்பது ஒரு நாட்டுக்கு முதுகெலும்பு போன்றது. போக்குவரத்தானது நாட்டின் பொருளாதாரத்துக்கு மிகவும் முக்கியத்துவம் வாய்ந்ததாக இருக்கின்றது. அங்குள்ள கிராமிய வீதிகள் பல வருடங்களாகப் புனரமைக்கப்படாமல் இருந்ததால், அந்தப் பகுதிகளில் வசிக்கின்ற மக்கள் மிகுந்த அசௌகரியங்களுக்கு உள்ளானார்கள். இதனைக் கருத்திற்கொண்டு எங்களுடைய அரசாங்கமானது இப்பொழுது கிராமிய வீதிகளை carpet இடும் பணியில் மும்முரமாக ஈடுபட்டுக்கொண்டு இருக்கின்றது. அந்த வகையில், இந்த வருடம் ஒதுக்கப்பட்ட நிதிமூலம் 60 சதவீதத்துக்கும் அதிகமான வீதிகள் carpet இடப்பட்டு இருக்கின்றன. மிகுதியாக இருக்கின்ற வீதிகளும் விரைவாக carpet இடப்படும். ஒதுக்கப்பட்ட நிதி மீண்டும் திரும்பிச் செல்லாத வகையில், வேலைத்திட்டங்கள் நடைமுறைப்படுத்தப்படும் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த காலங்களில் வீதிகளின் அபிவிருத்திக்கு எந்தளவு நிதி ஒதுக்கப்பட்டாலும், அதில் அரசியல்வாதிகளின் தலையீடு காணப்பட்டது. குறிப்பாக, அரசியல்வாதிகளால் commission அறவிடப்பட்டு வந்தது. உதாரணத்துக்கு, அரசியல்வாதிகள் commission கேட்டதால், வவுனியா மாவட்டத்திலுள்ள சில வீதிகள் புனரமைக்கப்படாமல் நீண்ட காலம் இழுத்தடிப்புச் செய்யப்பட்டன. தற்போது, நாங்கள் அந்த வீதிகளை முழுமையாகப் புனரமைத்து வருகின்றோம். அதுமட்டுமல்ல, இவ்வாறான commission பெறுதல் மற்றும் ஏனைய நடவடிக்கைகளைத் தடுத்து, வீதிப் புனரமைப்புக்காக ஒதுக்கப்பட்ட நிதியை மீதப்படுத்தியும் இருக்கின்றோம். இந்த வருடம் 4,963 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருந்தது. அதில் 44 மில்லியன் ரூபாயை நாங்கள் மீதப்படுத்தி இருக்கின்றோம். இந்த நிதியும் கிராமிய வீதிகளின் புனரமைப்புக்காக வழங்கப்பட இருக்கின்றது. மேலும், செட்டிக்குளம் - மெனிக்பாம் வீதிக்கு ஒதுக்கப்பட்ட 11 மில்லியன் ரூபாயில் 2,278,000 ரூபாய் மீதப்படுத்தப்பட்டு இருக்கின்றது. அதேபோல், பாலவிநாயகர் - தோணிக்கல் வீதிக்கு ஒதுக்கப்பட்ட 17 மில்லியன் ரூபாயில் 487,999 ரூபாயை மீதப்படுத்தி இருக்கின்றோம். இலங்கை போக்குவரத்துச் சபையை மேம்படுத்தும் பொருட்டு சாரதிகள், நடத்துநர்கள் என 750 பேர் புதிதாக நியமிக்கப்பட இருக்கிறார்கள். இதனூடாக கிராமப் புறங்களில் பாடசாலை மாணவர்கள், நோயாளிகள் போன்றவர்களுக்கான போக்குவரத்துச் சேவைகள் அதிகரிக்கப்பட இருக்கின்றன. Clean Sri Lanka வேலைத்திட்டத்தின் ஊடாக வவுனியா, யாழ்ப்பாணம், மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சியிலுள்ள பேருந்து நிலையங்களும் மன்னார், வவுனியா, கிளிநொச்சி மற்றும் யாழ்ப்பாண புகையிரத நிலையங்களும் புனரமைப்புச் செய்யப்பட இருக்கின்றன. இந்த வருடம் மேலதிமாக 24,000 மில்லியன் ரூபாயை கிராமப்புற வீதிப் புனரமைப்புக்காக ஒதுக்கியிருக்கின்றோம்.

அடுத்து, வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை பற்றி பார்ப்போம். அதிலும், கடந்த காலங்களில் வீடமைப்புத் திட்டங்கள் எவ்வாறு மேற்கொள்ளப்பட்டன என்பதைப் பார்ப்போம். அவை வெறுமனே அரசியல் நோக்கங்களின் அடிப்படையிலும் திட்டமிடப்படாத வகையிலுமே மேற் கொள்ளப்பட்டன. அதனால் இப்போது மக்கள் நிர்க்கதியான நிலையில் இருக்கின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
தயவுசெய்து, ஒரு நிமிடம் தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

வீட்டின் நிர்மாணப் பணிகளை எவ்வாறு முடிப்பதென்று தெரியாமல் இப்பொழுது மக்கள் அங்கலாய்த்துக்கொண்டு இருக்கிறார்கள். இவ்வாறு திட்டமிடப்படாத வகையிலும் முழுமையாக அரசியல் நோக்கத்திற்காகவும் அவை மேற்கொள்ளப்பட்டு, மக்கள் ஏமாற்றப்பட்டு இருக்கிறார்கள். வடக்கு மாகாணத்தில் மீள்குடியேற்றத்துக்காக இந்த வருடம் 3,855 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. சனாதிபதி அவர்களால் மேலதிகமாக நிதி ஒதுக்கப்பட்டு, மொத்தமாக 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இதன்மூலம் 2,445 வீடுகள் அமைக்கப்பட இருக்கின்றன. அத்தோடு, அவற்றுக்கு இலவச மின்சார வசதி, குடிநீர் வசதி, மலசலகூட வசதி போன்றவையும் செய்து கொடுக்கப்பட இருக்கின்றன.

இறுதியாக, ஒரு விடயத்தைக் கூறி முடிக்கிறேன். யாழ். மாவட்டத்திலுள்ள தீவுப் பகுதிகளில் போக்குவரத்து வசதிகள் போதியளவு இல்லாமை காரணமாக, அங்கு வீடுகளைக் கட்டுவதற்கான கட்டிடப் பொருட்களைக் கொண்டு செல்வதற்குக் கூடுதலான நிதி தேவைப்படுகின்றது. இதை கௌரவ அமைச்சர் அவர்கள் கருத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.33]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் மிக முக்கிய அமைச்சுக்களான நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு, போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதம் நடைபெறுகின்றது. அதில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

நகர அபிவிருத்தி அமைச்சானது, இந்த நாட்டின் நகரங்களையும் கிராமங்களையும் ஒழுங்குபடுத்துகின்ற மிக முக்கியமான ஓர் அமைச்சாகக் காணப்படுகின்றது. கடந்த காலங்களில் இந்த அமைச்சைத் தன்னகத்தே வைத்திருந் தவர்கள், அதனூடாக எதைச் செய்தார்கள் என்பதற்கு நாங்கள் பதில் தேட வேண்டியவர்களாக இருக்கின்றோம். அவ்வாறான தேடலின்போது கிடைக்கப்பெற்ற ஒரு விடயம் தொடர்பில் நான் இங்கு கருத்துக் கூற விரும்புகின்றேன். அதாவது, இந்த அமைச்சை முதலில் வைத்திருந்த ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள், கிழக்கு மாகாணத்திலுள்ள அம்பாறை மாட்டத்தின் கல்முனையை டுபாய் போன்ற நகரமாக மாற்றுவதாகக் கூறி, இன்று வரை அந்த மக்களை ஏமாற்றிக்கொண்டு வருகின்ற விடயம் தொடர்பில் அந்த மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்துபவன் என்ற அடிப்படையில் சில விடயங்களைக் கூற விரும்புகின்றேன்.

வீடமைப்பு அதிகாரசபைக்குச் சொந்தமான ஒரு கட்டிடத்தொகுதி கல்முனையில் இருக்கின்றது. அதில் பல நிறுவனங்கள் வாடகை அடிப்படையில் தமது அலுவல கங்களை நடத்தி வருகின்றன. அந்தக் கட்டிடத்தொகுதி சுமார் 40 வருடங்கள் பழைமைவாந்ததென நான் நினைக்கின்றேன். இன்று அந்தக் கட்டிடத்தொகுதி எவ்வித புனரமைப்பும் செய்யப்படாத நிலையில், இடிந்து விழக்கூடிய நிலையில் காணப்படுகின்றது. அந்தக் கட்டிடத்தொகுதியை அகற்றி விட்டு, அவ்விடத்தில் 10-15 அடுக்கு மாடிகளைக் கொண்ட ஒரு கட்டிடத்தொகுதியை உருவாக்கி, அதன்மூலம் கல்முனை நகரத்தை அழகுபடுத்த வேண்டிய பொறுப்பு இந்த அமைச்சுக்கு இருக்கின்றது. கல்முனை பொதுச் சந்தையும் அவ்வாறானதொரு காலப்பகுதியில் நகர அபிவிருத்தி அதிகாரசபைமூலம் நிறுவப்பட்டதென நான் நினைக் கின்றேன். அது இன்றும் அதே நிலைமையிலே இருக்கின்றது. அங்கு மலசலகூட வசதிகூட இல்லை. அங்கு வியாபார நடவடிக்கைகளுக்காகச் செல்கின்ற மக்களுடைய அடிப்படைத் தேவைகளைப் பூர்த்திசெய்ய முடியாத அளவிலே அந்த சந்தைக் கட்டிடத்தொகுதி காணப்படுகின்றது. எனவே, இதனை கௌரவ அமைச்சர் அவர்கள் கவனத்தில் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் உள்ளூராட்சி மன்றங்களோடு இணைந்து இந்த நாட்டில் அதிலும் குறிப்பாக, நான் சார்ந்திருக்கின்ற அம்பாறை மாவட்டத்தில் கழிவு முகாமைத்துவத்தை சரிவரச் செய்ய வேண்டும். அந்தக் கடமைப்பாடு உங்களுக்கு இருக்கின்றது. அங்கிருக்கின்ற உள்ளூராட்சி மன்றங்களுக்கு வசதிகள் குறைவாக இருக்கின்றன. எனவே, நீங்கள் நகர அபிவிருத்தி அமைச் சினூடாக அவற்றுக்கான வளங்களை வழங்கி, அவற்றோடு இணைந்து அங்கிருக்கின்ற வேலைகளை முன்னெடுக்க வேண்டிய தேவைப்பாடு காணப்படுகின்றது. மேலும், அங்கு சுனாமியால் பாதிக்கப்பட்ட மக்களுக்கான அடுக்கு மாடிக் குடியிருப்புத் தொகுதிகள் அமைக்கப்பட்டு இருக்கின்றன. இன்று வரை அவற்றுக்கான வசதி வாய்ப்புகளும் இல்லை; அந்த மக்கள் அங்கு வாழக்கூடிய வகையில் சுற்றுச் சூழலும் இல்லை. வெள்ள அனர்த்தம் ஏற்படும்பொழுது, கழிவகற்றல் செயற்பாடுகளை ஒழுங்காகச் செய்யக்கூடிய வசதிகள் அங்கு இல்லை. அவை மாநகர சபைக்கு உட்பட்ட பிரதேசங்களாகக் காணப்படுகின்றன. அங்கும் அதனை அகற்றுவதற்கான வசதிகள் இல்லாமல் மக்கள் இன்னலுறுகின்றார்கள். எனவே, நீங்கள் அங்குள்ள மாநகர சபையின் ஒத்துழைப்போடு, அந்தப் பிரதேசத்தில் இருக்கின்ற வளங்களைப் பயன்படுத்தி அல்லது அவற்றுக்குத் தேவையான வளங்களைப் பெற்றுக்கொடுத்து, அந்தப் பிரதேசத்தில் இருக்கின்ற இந்தப் பாரிய பிரச்சினையைத் தீர்த்து வைக்க வேண்டுமென நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கழிவு முகாமைத்துவம் இன்மையால், அங்குள்ள வீட்டுக் கழிவுகளை அகற்றுவதை ஒழுங்குமுறைப்படுத்த முடியாமல் அங்கிருக்கின்ற உள்ளூராட்சி மன்றங்கள் குறிப்பாக கரையோரப் பிரதேசத்தில் இருக்கின்ற உள்ளூராட்சி மன்றங்கள் மிகவும் கஷ்டப்படுகின்றன. அந்தக் கழிவுகளைச் சேகரித்து அல்லது தரம் பிரித்து ஒழுங்குபடுத்துவதற்கான காணி வசதி அங்கு இல்லாமல் இருக்கின்றது. அம்பாறை, உகண, மகாஓயா போன்ற பிரதேசங்களில் கூடுதலான காணிகள் காணப்படுகின்றன. அந்த இடங்களில் நீங்கள் இதற்கான வேலைத்திட்டங்களை ஒழுங்குபடுத்து வீர்களானால், அந்த மக்கள் மிகவும் பிரயோசனம் அடைவார்கள். நான் பிரதேச சபையின் தவிசாளராக இருந்த காலத்தில் இது எங்களுக்குப் பாரியதொரு சவாலாக இருந்தது.

அந்த நேரத்தில் அட்டாளைச்சேனையின் ஒரு பிரதேசத்தில் 25 ஏக்கர் நிலத்தை UNOPS நிறுவனத்தின் மூலமாக நாங்கள் பெற்றுக் கொண்டோம். அங்கு 25 வருடங்களுக்கு குப்பைகளைக் கொட்டலாமென நாங்கள் எண்ணி இருந்த போதும், வெறும் 5 வருடங்களிலே அந்த 25 ஏக்கர் காணி குப்பைகளால் நிரம்பி விட்டது. அது பல அசௌகரியங்களை ஏற்படுத்துகின்றது. அதற்கான ஒரு தீர்வையும் நீங்கள் பெற்றுத்தர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நிந்தவூரின் வெளவா லோடை பிரதேசத்தில் நகர அபிவிருத்தி அமைச்சின்மூலம் பலகோடி ரூபாய் செலவில் beach park ஒன்று அமைக்கப்பட்டது. அந்த beach park சுற்றுமதில்களோடும் ஒரு கட்டிடத்தோடும் வெறுமனே காட்சியளிக்கின்றது. அதனைப் பராமரிக்கும் பொறுப்பை ஏற்குமாறு நிந்தவூர் பிரதேச சபையைக் கோரியதன் அடிப்படையில், அப்பிரதேச சபை அதைப் பொறுப்பெடுத்து, அதன் பாதுகாப்புக்காக watchersஐ நியமித்தது. அதற்கு அந்தப் பிரதேச சபை வருடம் ஒன்றுக்கு 20 இலட்சம் ரூபாய் மக்களுடைய வரிப் பணத்தைச் செலவு செய்கின்றது. அண்மையில்தான் அந்தக் கட்டிடம் மாதம் 35,000 ரூபாய் அடிப்படையில் ஒருவருக்கு வாடகைக்குக் கொடுக்கப்பட்டு இருக்கிறது. அதனைப் பராமரிப்பதற்கு வருடமொன்றுக்கு 20 இலட்சம் ரூபாயைச் செலவு செய்ய வேண்டிய துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது. அதற்கான நிதி ஒதுக்கீட்டை உங்களுடைய அமைச்சு வழங்கி இருக்கின்றது. எனவே, அந்த இடத்தைப் பார்வையிட்டு, அங்கு மேலதிகமாகச் செய்யவேண்டிய வேலைத்திட்டங்களுக்கான நிதியை ஒதுக்கி, அந்த வேலைகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதன் அயல்புறத்தில் வெளவாலோடை என்ற நீர்நிலை காணப்படுகின்றது. நீங்கள் அதனைச் சுத்தப்படுத்தி, கூடுதலான வேலைத்திட்டங்களைச் செய்து அழகுபடுத்து வீர்களானால், அந்த இடத்தை சுற்றுலாத்துறைக்குப் பயன்படுத்த முடியும். அது பயன்படுத்தப்படாமல் இருக்கின்ற காரணத்தால் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற காணிச் சொந்தக்காரர்கள் அந்த இடத்தை அடாத்தாகப் பிடிக்கின்ற, தங்களுக்குச் சொந்தமாக்கிக்கொள்கின்ற நிலைமையை நாங்கள் பார்க்கின்றோம். வெளவாலோடை என்ற நீர்நிலை - களப்பு - நீண்ட காலமாக மீனவர்களுடைய வாழ்வாதாரத் துக்கான வசதிகளைச் செய்துகொண்டு இருந்தது. மேற்படி கட்டுமானம் அமையப்பெற்றதற்குப் பிறகு, அதை மக்கள் பயன்படுத்த முடியாதுள்ளது. அந்த அளவுக்கு அது போக்குவரத்துக்குத் தடையாக இருக்கின்றது. அந்த மக்கள் போக்குவரத்துக்குச் செய்வதற்குக்கூட அங்குள்ள பாதைகள் தடையாக இருக்கின்றன. மக்கள் பாவிக்க முடியாத நிலையிலே இன்று அந்த நீரோடை காணப்படுகின்றது. அதேநேரம், அதை சுற்றுலாத்துறை சார்ந்த ஓர் இடமாக மாற்றுவதற்கான சந்தர்ப்பமும் இல்லாமல் இருக்கின்றது. எனவே, நீங்கள் நிச்சயமாக இந்த வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அகில இலங்கை மக்கள் காங்கிரஸின் தலைவர் அவர்களால் முன்மொழியப்பட்டு, 20 சதவீதமான வேலைகள் பூர்த்திசெய்யப்பட்டு இருக்கின்ற மன்னார்-சிலாவத்துறை கலாசார மண்டபத்துக்கு இன்னும் 470 மில்லியன் ரூபாய் மேலதிகமாகத் தேவையாக இருக்கின்றது. இதற்கு முன்பு இருந்த அமைச்சர் அவர்கள் இதைச் செய்து தருவதாக எங்களுடைய கௌரவ றிஸாட் பதியுதீன் அவர்களிடத்தில் வாக்குறுதி அளித்திருந்தார். இப்போது இருக்கின்ற புதிய அமைச்சர் அவர்களிடத்தில் நான் இந்தக் கோரிக்கையை முன்வைக்கலாமென நினைக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்கு வழங்கப்பட்டு இருக்கின்ற நிதிமூலம் இந்த நிதியைப் பெற்றுக்கொடுக்குமாறு அந்த மக்கள் சார்பில் கேட்டுக் கொள்கின்றேன்.

இன்று உல்லாசப் பிரயாணத்துறையில் மிகவும் பிரசித்தி பெற்றிருக்கின்ற கிழக்கு மாகாணத்தில் திருகோணமலை, நிலாவெளி, பாசிக்குடா, அறுகம்பை, பானம போன்ற பிரதேசங்களை இணைக்கின்ற வகையில் புகையிரதப் போக்குவரத்தை ஏற்படுத்தித் தருமாறு அந்தப் பிரதேச மக்கள் சார்பாகவும் உல்லாசப் பிரயாணத்துறை சார்ந்த தொழில் முயற்சியாளர்கள் சார்பாகவும் வெளிநாடுகளிலிருந்து இந்த நாட்டைப் பார்க்க வருகின்ற மக்கள் சார்பாகவும் கேட்டுக் கொள்கின்றேன். மேலும், தென்கிழக்குப் பல்கலைக் கழகத்துக்கு நாடு பூராவுமிருந்து வருகின்ற 5,000க்கும் மேற்பட்ட மாணவர்களும் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற ஏனைய தொழில் சார்ந்தவர்களும் பிரயாணம் செய்வதற்கு உகந்த வகையில், இந்தப் புகையிரதப் போக்குவரத்து அமையுமாக இருந்தால் மிகவும் பிரயோசனமாக இருக்கும். எனவே, இதனைக் கவனத்திற்கொண்டு இந்த விடயத்தைச் செய்யுமாறு நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

ஒலுவில் துறைமுகமானது, இரண்டு வகையான துறைமுகங்களை உள்ளடக்கியது. ஒன்று, வர்த்தகம் சார்ந்தது. மற்றையது, மீன்பிடித்துறை சார்ந்தது. அந்தப் பிரதேசத்தில் நேடியாகவும் மறைமுகமாகவும் மீன்பிடித்துறையில் ஈடுபடுகின்ற 25,000க்கும் மேற்பட்ட மக்கள் இருக்கிறார்கள். அதையும்விட, அந்தத் துறைமுகத்தின் அபிவிருத்தி காரணமாக ஏற்பட்ட கடலரிப்பின் விளைவாக 125 ஏக்கருக்கும் மேற்பட்ட வயல் காணிகளும் தென்னந்தோப்புகளும் பாதிக்கப் பட்டுள்ளன. எனவே, இந்தப் பாதீட்டின்மூலம் அதற்கான நஷ்டஈடுகளை வழங்குவதற்கு நீங்கள் நடவடிக்கையெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். பொத்துவில் பிரதேசத்தில் இருக்கின்ற ஹிதாயாபுரம் வீதி புனரமைக்கப்பட வேண்டிய தேவை இருக்கின்றது. பொத்துவில் பிரதேச சபையின் முன்னாள் தவிசாளர் பாஸித் அவர்கள், தவிசாளராக இருந்த காலத்தில் அங்கு park ஒன்றை அமைத்திருந்தார். இன்று அந்த park கைவிடப்பட்ட நிலையில் இருக்கின்றது. Clean Sri Lanka திட்டம்மூலம் இந்த வேலைத்திட்டத்தையும் நீங்கள் செய்துதர வேண்டுமென இந்த அவையில் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ රටේ සාම්ප්‍රදායික විපක්ෂය පොදුවේ හැමදාම කරන වැඩේම තමයි අදත් කළේ. කිසිදු සාධනීය විවේචනයක් අප වෙත ඉදිරිපත් කළේ නැහැ වාගේම, මේ රටේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් අලුත් යෝජනා ගෙනාවේ නැහැ කියන අදහස තමයි මම මුලින්ම ඉදිරිපත් කරන්නේ.

මේ රටේ ජනතාවගේ දුප්පත්කම සහ නූගත්කම තමන්ගේ බලය වෙනුවෙන් විකුණපු කණ්ඩායම් මෙතැනට ඇවිල්ලා අවුරුද්දක් තිස්සේ අඬන එක, කෙඳිරි ගාන එක, ළතෝනි දෙන එක, විලාප දෙන එක හැර වෙනත් දෙයක් කළේ නැහැ. එම නිසා විපක්ෂයේ මෙතුමන්ලාට 2026 වසරේදීත් කළ හැකි වන්නේ නැවත නැවතත් එසේ විලාප නඟන එක විතරයි. ඒ හැර වෙනත් දෙයක් කළ නොහැකි බව මම අවධාරණය කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මෙතෙක් ආණ්ඩුවල අවධානයට ලක් නොවුණු වර්තමාන ආණ්ඩුවේ අවධානයට ලක් වුණු කාරණක් මම මේ ගරු සභාවට -මේ පාර්ලිමේන්තුවට- ඉදිරිපත් කරන්න කැමැතියි. ජලය කියන්නේ අපේ රටේ ජනතාවගේ ජීවිතයයි. ඒක වෙළෙඳ භාණ්ඩයක් නොවෙයි. අපේ නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබෙනවා, මේ රටේ සමස්ත ජනතාව අද වන කොට මුහුණ දෙන ප්‍රශ්න කිහිපයක්. ඒවා තමයි, ජල සැපයුම සෑම ප්‍රදේශයකම නිරන්තරයෙන් සිදු නොවීම, ජල ධාරාවෙහි පීඩනය අඩු වීම, හදිසි ජල කප්පාදුව, ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව ජනතාවගේ විශ්වාසය අඩු වීම. මේවා රට පුරා බරපතළ ගැටලු බවට පත් වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, ජල ධාරාවෙහි අඩු පීඩන තත්ත්වය නිසා සහ නිරන්තර ජල සැපයුම සිදු නොවීම නිසා විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම, කඩුවෙල, මහරගම ජනතාව මේ වන කොට මුහුණ දෙන බරපතළ ගැටලු ගොඩක් තිබෙනවා.

ඒ නිසාම තමයි වර්තමාන ආණ්ඩුව විශේෂයෙන්ම 2026 අය වැය යෝජනා ඇතුළේ ජල කළමනාකරණය ඉලක්ක කරගෙන දැවැන්ත ව්‍යාපෘති ගණනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒවා අතුරින් කෙටි කාලීන ව්‍යාපෘති දෙකක් ගැන, එනම් 2026 වසරේ නිම කරන්න ඉලක්ක කරගෙන ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා දෙකක් ගැන කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. මෙම ව්‍යාපෘතිය අරමුණු කරගෙන තිබෙන්නේම අපතේ යන නළ ජලය සුරැකීමයි. නළ ජලයෙන් සියයට 50ක් අපතේ යනවා කියලා මේ වනකොට ඇස්තමේන්තු කරලා තිබෙනවා. එම නිසා අපතේ යන එම නළ ජලය ප්‍රමාණය අඩු කිරීම තමයි මෙම ව්‍යාපෘතියේ ප්‍රධානම අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ. එසේ අපතේ ගිය සියයට 50ක් පමණ වූ ජල ප්‍රමාණය සියයට 18 දක්වා අඩු කරන්න මෙම ව්‍යාපෘතිය මඟින් මේ වන කොට සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම ජලය කියුබික් මීටර් 90,000ක් ඉතිරි කර ගන්න, මුදලින් ගත්තොත් රුපියල් බිලියන 4ක ඉතිරියක් කර ගන්න මෙම ව්‍යාපෘතිය මඟින් බලාපොරොත්තු වෙනවා. එම නිසා, අදාළ ආයතනත් එක්ක සහසම්බන්ධතා ගොඩනඟා ගනිමින් මෙම ව්‍යාපෘතිය 2026 වසරේ ජූනි මාසය වන කොට ක්‍රියාත්මක කරන්න වර්තමාන ආණ්ඩුව සියලු සැලසුම් යොදා තිබෙනවා.

ඒ වාගේම, මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි, විශේෂයෙන්ම අඹතලේ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය. එම ව්‍යාපෘතියට රුපියල් මිලියන 3,995ක් වෙන් කර තිබෙනවා. එම ව්‍යාපෘතියෙහි අරමුණු ගොඩක් තිබෙනවා. එහි පළමුවෙනි අරමුණ තමයි, අඹතලේ ජල පවිත්‍රාගාරයට සපයන බලශක්තිය අඩු කිරීම. එහි තිබෙන පරණ යන්ත්‍ර සූත්‍ර ඉවත් කරලා නව යන්ත්‍ර සූත්‍ර සවි කිරීම මඟින් කාර්යක්ෂමතාව වැඩි කිරීම තමයි ඊළඟ අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ. එහි තවත් අරමුණු කීපයක් තමයි, අඹතලේ සිට Ellie House Reservoir දක්වා නළ එළීම, ගොතටුවේ සිට මාලිගාකන්ද දක්වා නළ එළීම, අවුරුදු 70ක් විතර පරණ පොම්ප ඉවත් කර අලුත් පොම්ප සවි කිරීම, ස්කාගාර system එකක් හඳුන්වා දීලා ඒ ආයතන, ඒ යන්ත්‍ර සූත්‍ර ස්වයංක්‍රියව ක්‍රියාත්මක වන තැනකට ගෙනැල්ලා අප ජලය නැවත පවිත්‍ර කරලා ජනතාවට බෙදා දීමේ system එකක් හැදීම.

පොදුවේ ගත් විට, මේ රටේ ජනතාව මුහුණ දෙන ජල ප්‍රශ්නය දෙස ගැඹුරින් කල්පනා කර විසඳුම් ලබා දීමේ අරමුණ ද පෙරදැරිව තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි මෙවර අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසාම විපක්ෂයට වන දේ මා නැවත වතාවක් කියන්න කැමැතියි. විපක්ෂයට සිදු වන්නේ ඊළඟ වසරේත් අඬන්නයි; කෙඳිරිගාන්නයි; විලාප නඟන්නයි. ඒ හැර මේ රටේ තවත් කරන්න දෙයක් විපක්ෂයට ඉතිරි වන්නේ නැහැ කියන කාරණාව මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.50]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்று போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு, நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு ஆகியவற்றின்மீது இடம்பெறும் விவாதத்தில், எனக்கு ஒதுக்கப்பட்டு இருக்கின்ற நேரத்தைக் கருத்திற்கொண்டு எங்களுடைய மாவட்டத்தில் காணப்படுகின்ற சில பிரச்சினைகளை இந்த இடத்தில் முன்வைக்கலாமென நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்பொழுது திருகோணமலையிலிருந்து கொழும்புக்கு இரவு மற்றும் காலை நேர சாதாரண ரயில் சேவைகள் மாத்திரமே நடைபெறுகின்றது. குறிப்பாக, இரவு நேரத்தில் குறிப்பிடத்தக்களவு மக்கள் பிரயாணம் செய்தாலும், பாதுகாப்பு காரணமாகப் பலர் பகல் நேர சேவையையே விரும்புகின்றார்கள். திருகோணமலையிலிருந்து கொழும்புக்கு பகல் நேரத்தில் சேவையில் ஈடுபடுத்தப்பட்டிருந்த குளிரூட்டப்பட்ட கடுகதிப் புகையிரதச் சேவை கடந்த 10 மாதங்களாக இடைநிறுத்தப்பட்டிருக்கின்றது. திருகோணமலை அதிகமான வெளிநாட்டு, உள்நாட்டு சுற்றுலாப் பயணிகள் வருகைதருகின்ற இடமாகக் காணப்படுகின்றது. இந்தச் சுற்றுலாப் பயணிகள் பொதுவாகப் பகல் நேரங்களில் பயணத்தை மேற்கொள்வதையே

விரும்புகின்றார்கள். இச்சேவை இடைநிறுத்தப்பட்டிருப்பது உண்மையிலேயே அவர்களைப் பொறுத்தவரையில் ஏமாற்றத்தை ஏற்படுத்து கின்ற ஒரு விடயமாகக் காணப்படுகின்றது. அந்த அடிப்படையிலே, பகல் நேர குளிரூட்டப்பட்ட கடுகதிச் சேவையை மீள ஆரம்பிக்க வேண்டுமென்ற எதிர்பார்ப்பு மக்கள் மத்தியிலே காணப்படுகின்றது. எனவே, பல மாதங்களாக இடைநிறுத்தப்பட்டிருக்கின்ற திருகோணமலை - கொழும்பு பகல் நேர குளிரூட்டப்பட்ட கடுகதி புகையிரதச் சேவையை விரைவாக மீள ஆரம்பிப்பதற்கான நடவடிக்கை களைக் கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமென இந்தச் சபையிலே நான் கேட்டுக் கொள்கிறேன்.

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சைப் பொறுத்தவரை, இறக்கக்கண்டி, குச்சவெளி, புல்மோட்டை ஆகியவற்றுக்கு இடைப்பட்ட இடங்களுக்கு நீர் விநியோகம் விஸ்தரிக்கப்படாததனால் அங்கு வாழுகின்ற மக்கள் குடிநீருக்கு மிகவும் சிரப்படுகின்ற நிலைமை காணப் படுகின்றது. எனவே, குச்சவெளியிலிருந்து புல்மோட்டை வரையில் குடிநீர் இணைப்புக்களை விஸ்தரிப்பதற்கான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமென இந்த இடத்திலே கேட்டுக் கொள்கிறேன்.

கிண்ணியாப் பிரதேசத்திலே குழாய் நீர் வாடிக்கை யாளருடைய எண்ணிக்கை அதிகரித்திருக்கின்றது. ஆனால், அங்கு நீர் விநியோகத்துக்காகப் பொருத்தப்பட்டிருக்கின்ற குழாய் சிறியதாகக் காணப்படுகின்ற காரணத்தால், பகல் நேரங்களில் போதியளவு நீரைப் பெற முடியாமல் அங்குள்ள மக்கள் கஷ்டப்படுகின்றார்கள். எனவே, அதற்கேற்றவாறு பெரிய குழாய்களைப் பொருத்துவதற்கான நடவடிக்கையையும் எடுக்க வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கிறேன். அத்துடன், கிண்ணியா நீர் வழங்கல், வடிகாலமைப்புச் சபையின் பிராந்திய அலுவலகத்தால் அங்குள்ள முழு பிரதேசத்தையும் நிருவகிக்க முடியாத நிலைப்பாடு காணப்படுவதன் காரணமாக, கிண்ணியா பிரதேச சபைக்குட்பட்ட பிரதேசத்தில், குறிப்பாக கச்சக்கொடி தீவில் மற்றுமொரு அலுவலகத்தை அமைப்பதற்கான நடவடிக்கை யையும் இந்த அரசாங்கம் முன்னெடுக்க வேண்டுமென இந்த இடத்திலே கேட்டுக் கொள்கிறேன்.

கடந்த காலங்களிலே வீடமைப்பு அமைச்சினால் மேற் கொள்ளப்பட்ட பல வீடமைப்புத் திட்டங்கள் பூர்த்தி செய்யப்படாமல் பாதியிலே நிறுத்தப்பட்டிருக்கின்றது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் அந்த விடயத்திலே கவனம் செலுத்தி அவற்றைப் பூர்த்திசெய்வதற்கான வேலைத் திட்டங்களை முன்னெடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதுபோல, திருகோணமலை மாவட்டத்திலே பல வீதிகள் அபிவிருத்தி செய்யப்பட வேண்டிய நிலையிலே காணப்படு கின்றது. அதிலே குறிப்பாக 2021ஆம் ஆண்டு எவ்வித மாற்றுப் பாதைகளும் இல்லாமல் நிர்மாண நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டதன் காரணமாக, 2021 நவம்பர் 23ஆம் திகதி இடம்பெற்ற படகுப் பாதை விபத்திலே 8 பேர் மரணமடைந்த இடமான குறிஞ்சாக்கேணிப் பாலம்கூட வெள்ளத்தினால் சேதமடைந்திருக்கின்றது. அந்த விபத்து இடம்பெற்று நேற்றுடன் 4 வருடங்கள் பூர்த்தியடைந் திருப்பதையும் இந்தச் சபையிலே ஞாபகப்படுத்திக் கொள்வதோடு, மரணமடைந்தவர்களுடைய மறுமை வாழ்வுக் காகவும் நாங்கள் இந்த இடத்தில் பிரார்த்தித்துக் கொள்கின்றோம்.

கிண்ணியா பிரதேசமானது சுமார் ஓரிலட்சம் மக்களைக் கொண்ட ஒரு பிரதேசமாகக் காணப்படுகின்ற காரணத்தினால், யுத்தத்திற்குப் பின்னர் பல இடங்களிலே பாலங்கள் அமைக்கப்பட்டதற்குப் பின்னர் முழு கிழக்கு மாகாணத்திற்கு மான போக்குவரத்தும் திருகோணமலை - மட்டக்களப்பு வீதி ஊடாக, கிண்ணியா - மூதூர் வழியாகவே இடம்பெறுகின்றது. இன்று அதிகரித்திருக்கின்ற போக்குவரத்துக் காரணமாக இந்த வீதியில் நெரிசல் ஏற்படுகின்றது. எனவே, இதை இரண்டு வழி வீதியாக, அதாவது two-lane roadஆக மாற்றுவதற்கான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டும். அதேபோன்றுதான் கிண்ணியா பிரதான வீதிகூட சிறியதாக இருக்கின்ற காரணத்தால் அடிக்கடி விபத்துகள் ஏற்பட்டு, உயிரிழப்புகளும் ஏற்படுகின்றது. அதிகரித்திருக் கின்ற சனத்தொகையின் காரணமாக போக்குவரத்து அதிகரித்திருப்பதைக் கவனத்திற்கொண்டு, இந்த வீதியை அகலமாக்குவதற்கான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்கவேண்டும். அண்மையில்கூட, வாய்மூல விடைக்கான வினாவாக கௌரவ அமைச்சரிடம் இந்த விடயத்தை முன்வைத்திருந்தேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

முடித்துக் கொள்கின்றேன்.

அதேபோன்றுதான், மூதூர் பிரதேச செயலகப் பிரிவில் அமைந்திருக்கின்ற தோப்பூர் அல்-ஹம்ரா உள்வீதியின் அபிவிருத்திச் செயற்பாடுகளுக்கு நல்லாட்சிக் காலத்தில் நிதி ஒதுக்கிடப்பட்டு, கற்கள் போடப்பட்டு, bulldoze செய்யப்பட்ட நிலையிலே, ஆட்சி மாற்றத்தின் பின்னர் அந்த வீதி வேலை கைவிடப்பட்ட நிலையில் காணப்படுகிறது. கௌரவ அமைச்சர் அவர்கள் அதனைக் கருத்திற்கொண்டு உரிய நடவடிக்கையை முன்னெடுக்க வேண்டும்.

அதேபோன்று, இன்று எங்களுடைய பிரதேசங்களில் RDD அல்லது நகர சபை, பிரதேச சபைகளுக்குச் சொந்தமானதாகப் பல வீதிகள் காணப்படுகின்றன. RDA வீதிகள் என்ற வகையில் மிகக்குறைவான வீதிகளே காணப்படுகின்றன. ஆகையால், நகர சபை, பிரதேச சபைகளால் இந்த வீதிகளைப் புனரமைக்க முடியுமா? என்ற ஒரு கேள்வி எழுகின்ற காரணத்தால், இன்னும் கூடுதலான வீதிகளை RDD அல்லது RDAக்கு உள்வாங்குவதற்கான நடவடிக்கைகளையும் கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டும் என்பதையும் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அத்துடன், நீண்ட காலமாகச் சர்ச்சைக்குரிய விடயமாகக் காணப்படுகின்ற முத்துநகர் காணிப் பிரச்சினைக்கும் ஒரு தீர்வைக் காண வேண்டும். குறிப்பாக, அந்தக் காணி துறைமுக அதிகாரசபைக்குச் சொந்தமாக உள்ள காரணத்தால், 350 குடும்பங்கள் அங்கிருந்து வெளியேற்றப்பட்டிருக்கின்றன. அங்கிருந்த குளங்கள்கூட அழிக்கப்பட்டு, மூடப்பட்டிருக் கின்றன. அண்மையில்கூட, இந்தப் பாராளுமன்றத்தில் அந்த விடயம் தொடர்பாக ஒரு தனிநபர் பிரேரணையைக் கொண்டுவந்தபோது, அங்கு குடியிருக்கின்ற மக்களுக்கு அந்தக் காணிகளை வழங்குவதற்கான நடவடிக்கைகளை

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

மேற்கொள்வதாகக் கூறப்பட்டபோதும், இன்னும் எந்தவொரு நடவடிக்கையும் எடுக்கப்படவில்லை. அந்தப் பகுதி மக்கள் தொடர்ச்சியாகத் தங்களுடைய எதிர்ப்பை திருகோணமலை மாவட்டக் கச்சேரிக்கு முன்னால் அமர்ந்து தெரிவித்தவண்ணம் இருக்கின்றார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் அந்த மக்களுக்குக் காணி வழங்குவதைப்போன்று அவர்களுக் கான வீட்டு வசதிகளையும் ஏற்படுத்துவதற்கான நடவடிக்கை களையும் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டம் மட்டுமல்லாது, கிழக்கு மாகாணம் முழுவதும் இன்று சர்வதேச ரீதியில் சுற்றுலாச் செயற்பாடுகளில் பிரபல்யமடைந்து வருகின்ற காரணத்தால், சீனக்குடாவில் அமைந்துள்ள விமான நிலையத்தின் செயற் பாடுகளை மேம்படுத்த வேண்டிய பொறுப்பு காணப்படு கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
අවසන් කරනවා.

ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தையும் கருத்திற்கொண்டு, தங்களது அரசாங்கத்தின்கீழ் தேவையான நடவடிக்கைகளைத் தொடர்ச்சியாக முன்னெடுக்க வேண்டு மெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නන්ද බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.57]

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කිරීමට පෙර, පෙරේදා දවසේ මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රදේශයේ පහළ කඩුගන්නාවේ සිදුවූ ඛේදවාචකයෙන් මිය ගිය සහ දේපොළ අහිමි වූ අයගේ පවුලේ ඥාතීන් වෙනුවෙන් අපගේ දැඩි ශෝකය ප්‍රකාශ කරන ගමන්ම, ඉදිරි කාලයේදී එවැනි ඛේදවාචක අත් නොවීම වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම සිදු කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව ආරම්භ කරන්නම්.

අද දවසේ කථා කරන ප්‍රධාන මාතෘකා අතරින් නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරමින් සිටින වෙලාවේ මා කරුණු දක්වන්නේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ගැනයි. එම දෙපාර්තමේන්තුව 2025 වසර සඳහා කළ වැඩ කොටසත්, අපි 2026 දී සිදු කිරීමට අපේක්ෂිත වැඩ කොටසත් පිළිබඳව කෙටි සමාලෝචනයක් කිරීමට කැමැතියි. 2025 වසරේදී ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 2,701ක් සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරනු ලැබුවා. ඒ වාගේම 2026 වසර සඳහා රුපියල් මිලියන 3,000කට අධික මුදලක් වෙන් කරලා තිබෙනවා.

මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට, යටියන්තොට, රුවන්වැල්ල ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සුවිශේෂී ජල ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වන අතර, මා නියෝජනය කරන අරණායක ආසනයේ සුන්දර අසුපිනි ඇල්ලෙන් ආරම්භ වන මා ඔය නදියේ දෙපස උස්බිම්වල සිටින ජනතාවට දැඩි ජල හිඟයක් තිබෙනවා. ඉතා කෙටි වියළි කාලයකින් පවා ජලය නැතිවෙලා ඔවුන් අපහසුතාවට පත් වෙනවා. ඒ අතර, විශේෂයෙන්ම මලයගම් ජනතාව ජීවත්වෙන දෝතල් ඔය ජනපදය, **දෙපත්ගම වත්ත** ජනපදය, ඓතිහාසික සැලව කියන ප්‍රදේශය, දීවෙල උඩගම, කන්දේවත්ත ආදී ප්‍රදේශ ගණනාවකම, කොට්ඨාස ගණනාවකම ජීවත් වන ජනතාව දැඩි ජල හිඟයකින් පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම බතලේගල, බුළුගම්මන සහ අඹදෙණිය වැනි ප්‍රදේශවල ජනතාවට ප්‍රජා ජල සැපයුම ලබා දීම සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ සක්‍යතා අධ්‍යයනයක් කරගෙන යනවා. ඉදිරි වර්ෂයේදී අපට ඒක සම්පූර්ණ කරන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. අපේ ජනාධිපතිතුමන් මෙවර අය වැයෙන් වැඩි මුදලක්, රුපියල් මිලියන 3,000කට ආසන්න මුදලක් ඒ සඳහා වෙන්කර තිබෙන නිසා,

ඉදිරි කාලයේදී අපට සෑහෙන වැඩ කටයුතු ප්‍රමාණයක් සාර්ථක කර ගන්න පුළුවන් කියා විශ්වාස කරනවා. 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදලින් නව ජල ව්‍යාපෘති 203ක් අපි ආරම්භ කරලා තිබෙනවා. පවුල් 72,690කට ජල සම්බන්ධතා 11,955ක් ලබා දීමට අපි අපේක්ෂා කරනවා. ඒ සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම දිවයින පුරාම ක්‍රියාත්මක වන ප්‍රජා ජල ව්‍යාපෘතිවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 700ක් වෙන් කරලා තිබෙනවා. එමඟින් අත්‍යවශ්‍ය ප්‍රජා ජල ව්‍යාපෘති 226කින් වැඩි ප්‍රමාණයක වැඩ කටයුතු මේ වෙනකොට කරගෙන යනවා. බෙදා හැරීම් පද්ධති වැඩි දියුණු කිරීම, නව ජල ටැංකි ඉදි කිරීම, ජල මූලාශ ඉදි කිරීම සහ පිරිපහදු පද්ධති ඉදි කිරීම ආදී වැඩ කටයුතු එයින් සිදු වෙනවා.

මෙයින් පවුල් අටදහසකට වැඩි ප්‍රමාණයකට ජල පහසුකම් ලැබෙනවා. ඒ වාගේම තමයි ප්‍රජා ජල ව්‍යාපෘතිවල තිරසරභාවය ඉහළ නැංවීමට පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් දිගටම පවත්වාගෙන යනු ලබනවා. 2026 වසර සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 3,000කට ආසන්න මුදලක් වෙන් කර තිබෙනවා. එය ආසන්න වශයෙන් රුපියල් මිලියන 2,982ක්. එම ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 2,000ක වැඩ ආරම්භ කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)
මට තත්පර 30ක් දෙන්න. ඒ වාගේම ඉදිරියේදී, වැඩ ආරම්භ කර ඇති ව්‍යාපෘති 146ක වැඩ අවසන් කිරීමට නියමිතයි. ඒ අනුව ඉදිරි කාලයේදී දිවයිනටම බලපාන පරිදි ප්‍රජා ජල ව්‍යාපෘති, අනෙකුත් ජල ව්‍යාපෘති සාර්ථකව කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ

බොහෝ උස්බිම් ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතාව සඳහා මේ රජය විශේෂ අවධානයක් යොමු කර තිබෙන බව ප්‍රකාශ කරමින්, අවස්ථාව ලබා දුන්නාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඉතා සීමිත කාලයක් ලැබිලා තිබෙන්නේ. මම මේ අමාත්‍යාංශ ගැන කථා කරන්න ආසයි. මොකද, මේ අමාත්‍යාංශ කිහිපයම රටට ඉතාම වැදගත්. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය කියන්නේ රටේ අනාගතය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරන්න පුළුවන් අමාත්‍යාංශ කිහිපයක්. මෙහිදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, නිවාස වාගේම මහාමාර්ග කියන්නේත් රටේ ජනතාවට අත්‍යවශ්‍ය යටිතල පහසුකමක්. මේ කාරණා දිහා බැලුවාම අපට පෙනෙනවා, පසුගිය කාලය තුළ විශේෂයෙන්ම රට බංකොලොත්වීම නිසා අධිවේගී මාර්ග ඉදිකිරීම් අතරමඟ නැවතිලා තිබුණා. ඒ වාගේම ඊට නොයෙකුත් බාධාවන් ඇති වුණා. අපි දැක්කා, අධිවේගී මාර්ගයේ කඩවත - මීරිගම කොටසේ තිබුණු පඩු කරඳ ගහක් සම්බන්ධයෙන් පැන නැඟුණු ප්‍රශ්නයත් එක්ක දීර්ඝ කාලයක් ඒ ඉදිකිරීම් කටයුතුවලට බාධා ඇති වුණු ආකාරය.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
නැහැ නොවෙයි, ගරු ඇමතිතුමා. බාධා ඇති වුණු නිසායි මම කියන්නේ. ඔබතුමාගේ කාලයේ නොවෙයි, ඊට කලින් සිද්ධියක් ගැනයි මම මේ කියන්නේ. ඒ ඇති වුණු තත්ත්වය තුළ අපට ලොකු මුදලක් වැය කරන්නට සිද්ධ වෙලා තිබෙනවා, මොන ක්‍රමයකින් හරි එය ප්‍රමාද වීම නිසා. ඇත්තටම ඒකේ පාඩුව තිබෙන්නේ අපට. අපේ වයඹ පළාතේ කුරුණෑගලට, එහෙම නැත්නම් අනුරාධපුරය දක්වා යන අයට විශාල ප්‍රමාදයක් ඇති වෙලා තිබෙනවා. මොකද, මේ කොටසේ ඉදිකිරීම් කටයුතු නිම කරන්න තිබුණු කාලය ඉවර වෙලා තිබෙනවා. කොහොම වුණත් දැන් ආපසු ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ පිළිබඳව අපි සතුටු වනවා, ගරු ඇමතිතුමා. කඩවත -මීරිගම කොටසේ වැඩ කටයුතු අවසන් වෙන්නේ කොයි කාලයේද කියා ඔබතුමා අපට කිව්වොත් හොඳයි. මොකද, ඒක ඉතා වැදගත් මාර්ගයක්.

විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අදත් අපි මේ ගරු සභාවේ කරපු කථා අහගෙන ඉන්නකොට, මන්ත්‍රීතුමන්ලා ගොඩාක් දෙනෙකු 76 වසර ගැන තමයි කිව්වේ. ඒ සම්බන්ධයෙන් පොඩි කාරණා කිහිපයක් කියන්න ඕනෑ. නිවාස ගැන කථා කරද්දී අපට රණසිංහ ප්‍රේමදාස මැතිතුමා අමතක කරන්න බැහැ. මොකද, එතුමා 1977 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජයේ නිවාස ඇමතිවරයා හැටියට එතුමා අලුතින් හිතලා කටයුතු කළා. එදා අපේ රට තිබුණු තත්ත්වයත් එක්ක බලනකොට ගොඩාක් තිබුණේ තාවකාලික නිවාස. පොල් අතු, පිදුරු සෙවිලි කළ නිවාස. නමුත් ඒවා ස්ථිර වහලවල් ඇති නිවාස බවට පත් කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න එතුමාට පුළුවන් වුණා. ඒ අනුව, එතුමා නිවාස ලක්ෂයේ ව්‍යාපෘතිය ආරම්භ කළා. "ගම්උදාව" වැඩසටහන යටතේ පීඩාවට පත් වුණු, දුක්බදායී තත්ත්වයෙන් ජීවත් වුණු පිරිස්වලට ගම්මාන හදලා දීලා ඒ කාලයේ විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ තුළින් අලුත් ප්‍රබෝධයක් ඇති වෙලා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජය කාලයේ නිවාස ක්ෂේත්‍රයේ විශාල සංවර්ධනයක් ඇති කරන්න එතුමාට අවස්ථාව උදා වුණා. පැහැදිලිවම කියන්න ඕනෑ, 1987 ජාත්‍යන්තර නිවාස වර්ෂය,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පුතා ගැනත් කියන්න.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
අපි මුල ඉඳලාම කියන්න ඕනෑ නේ. මොකද, ඔබතුමන්ලා 76 වසරක් ගැන නේ කථා කරන්නේ. ඒ නිසා අපි ඒවා ගැන කියන්න ඕනෑ නේ. පුතා ගැනත් අපි කියමු. 1987 ජාත්‍යන්තර නිවාස වර්ෂය ලෙස නම් කිරීමට එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 35 වැනි සැසිවාරයේදී යෝජනා කළා. ඒක පිළිගෙන පළමුවැනි වතාවට ජාත්‍යන්තර නිවාස වර්ෂයක් ප්‍රකාශයට පත් කරන්න පුළුවන් වුණා. අපේ රටේ හිටපු නිවාස ඇමතිවරයාට; ඒ හිටපු අගමැතිවරයාට එම ගෞරවය ලබා දෙන්න ඕනෑ. මේ නිවාස ගැන කථා කරද්දී අපට එතුමා ගැන කථා නොකර ඉන්න බැහැ. ඒ වාගේම සෑම වසරකම ඔක්තෝබර් මාසයේ පළමුවැනි සඳුදා දින ලෝක ජනාවාස දිනය ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ යෝජනාවත් එතුමා ගෙනාපු යෝජනාවක්. ඇත්තටම එතුමා කරපු හොඳ දේවල් ගැන අපි කථා කරන්න ඕනෑ; තමුන්නාන්සේලා මේ කාල සීමාවේ කරන හොඳ දේවලුත් අපි අමතක කරන්න හොඳ නැහැ. ඒවා ගැන කථා කරන්න ඕනෑ. මේවා පටන් අරගෙන කරන්න කියන එක තමයි කියන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට පොඩි වෙලාවක් තිබෙන්නේ.

මේ තත්ත්වය තුළ මාර්ග සම්බන්ධයෙන් කථා කළොත්, විශේෂයෙන්ම පොතුහැර - ගලගෙදර මාර්ගය මාගේ ආසනයේ මැදින් තමයි යන්නේ. ඉතින්, ඒකේ යම් කොටසක -කිලෝමීටර් 12ක- වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. ගලගෙදර දක්වා ඉතිරි වැඩකටයුතු ටික කඩිනමින් ආරම්භ කරන්න අවශ්‍ය පියවර ගන්න කියලා අපි ඔබතුමාට මතක් කරනවා. මොකද, අපේ යහපාලන රජය කාලයේදීම මේවාට අදාළ වන්දි ගෙවලා, ඒ ඔක්කෝම ඉඩම් අත්පත් කරගෙන, ඒ කටයුතු අවසන් කරලා තිබෙනවා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

ඒ වාගේම තවත් වැදගත් මාර්ගයක් වන කුරුණෑගල - දඹුල්ල මාර්ගයේ වැඩ කටයුතු පොඩ්ඩක් පස්සට ගිහිල්ලා තිබෙනවා. මේක ප්‍රධාන වැදගත්ම මාර්ගයක් හැටියට තමයි මම දකින්නේ. මොකද, අපේ රටේ උතුරු ප්‍රදේශයටත්, ඒ වාගේම නැඟෙනහිර ප්‍රදේශයටත් යන ප්‍රධාන මාර්ගය ගත්තාම දඹුල්ලේ ඉඳලා ඇත්තටම තදබදය අඩුයි. නමුත්, දඹුල්ල දක්වා විශාල තදබදයක් තිබෙනවා. ඉතින්, මේ මාර්ගය සඳහාත් මේ වෙනකොට ඉඩම් අත්පත් කර ගෙන තිබෙනවා. ඒ වාගේම ගොඩක් වියදම් කරලා තිබෙනවා. නමුත්, එහි ඉදිරියක් ගැන, ආරම්භයක් ගැන මේ අය වැයේවත්, එහෙම නැත්නම් ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කිරීමේදීවත්, පසුගිය අවුරුද්දේවත්, මේ අවුරුද්දේවත් කථා කරනවා මම දැක්කේ නැහැ. ඒකත් වැදගත් මාර්ගයක්. අපේ රටේ වැදගත්ම ප්‍රදේශයකට යන්න තිබෙන ප්‍රධාන මාර්ගයක් ඒක. මොකද, දඹුල්ලේ ඉඳලා අනුරාධපුරයට, ඒ වාගේම පොළොන්නරුවට, ත්‍රිකුණාමලයට යන්න වෙනම මාර්ග තිබෙනවා. ඒවායේ තදබදය අඩුයි. ඒ වැදගත් පාරත් මේ වෙලාවේ මතක් කරනවා.

මේ වෙලාවේ තවත් කරුණු කීපයක් ගැන කියන්න ඕනෑ. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ පිරිසක් නැවත සේවයේ පිහිටුවන්න කියලා මේ වෙනකොට කම්කරු උසාවියෙන් නියෝග දීලා තිබෙනවා. නමුත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් තවමත් ඒ අයව සේවයේ පිහිටුවන්න කටයුතු කරලා නැහැ. උසාවි නියෝගයක් ලබා දීලා තිබියදීත් එහි රැකියා කරපු එම පිරිස නැවත සේවයේ පිහිටුවන්නට කටයුතු නොකිරීම ඉතාම කනගාටුදායක තත්ත්වයක්. එම උසාවි නියෝගයට **අදාළ කොටස** මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ විශාල පිරිසකට අදාළව ලැබුණු එම අධිකරණ තීන්දුව ක්‍රියාත්මක කරන්නේ නැතිව කටයුතු කිරීම පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම මේක ඔබතුමාට මතක් කරලා තිබෙනවා. අධිවේගී මාර්ගය තුළ බෝඩ් සකස් කිරීම ගත්තොත්, එම සංවිධානය අපව දැනුවත් කරලා තිබෙනවා, මේ වෙනකොට ඒක වෙනස් කරන්න පියවර ගනිමින් ඉන්නවා කියලා. අධිවේගී මාර්ග පද්ධතිය දෙපස පිහිටි බාහිර වෙළෙඳ ප්‍රචාරක පුවරු සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා අපි ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මොකද, එක පැත්තකින් ව්‍යාපාරයක් හැටියට, වෙළඳ දැන්වීම්කරුවන් විශාල පිරිසක් මේ වෙනකොට එම ව්‍යාපාරයේ යෙදිලා ඉන්නවා. ඒ වාගේම විශාල පිරිසක් ඒ ආශ්‍රිතව රැකියා කරනවා. ඒ වාගේම තමයි වෙළෙඳ දැන්වීම් බෝඩ් එක ගහන ඉඩම් හිමියාට විශාල මුදලක් හම්බ වෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, කුරුණෑගල හන්දියේ බෝඩ් එක තිබෙන ඉඩමේ හිමියාට මාසයකට රුපියල් ලක්ෂ පහක් විතර ඉඩමට විතරක් හම්බ වෙනවා. ඒ වාගේ ආදායම් ලබන ව්‍යාපාරයක් තමයි මේකෙන් කඩා වැටෙන්නේ. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඊට අදාළ ලිපි කිහිපයක් මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

ඒ වාගේම පුවත්පත් සම්බන්ධයෙන් කථා කිරීමේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ වෙනකොට පුවත්පත් කර්තෘවරුන්ට ඔවුන්ගේ නිදහස අහිමි වෙමින් පවතින බව. මෙන්න මේක, අනිවාර්යයෙන්ම තමුන්නාන්සේලා අවධානය යොමු කරන්න ඕනෑ කාරණාවක්. ඒ මොකද? අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට වාර්තාවක් සම්බන්ධයෙන් මෙතැන ප්‍රකාශයක් කළා මට මතකයි. එම පුවත්පත් වාර්තාව සම්පූර්ණයෙන් වැරැදියි කියන්න අපට බැහැ. විපක්ෂ නායකතුමා පැහැදිලිවම කිව්වා, ස්ථාන ගණනාවක් ගැන. අපේ ප්‍රදේශයෙත් එහෙම වෙලා තිබෙනවා. අපට ඒවා කියන්න පුළුවන්. ඇත්තම තත්ත්වය ගත්තොත්, ස්ථාන ගණනාවක පොලිස් ස්ථානාධිපතිතුමන්ලා ග්‍රාම නිලධාරි සහතිකයට අමතරව මේ කමිටුවල සභාපතිවරුන්ගේ නිර්දේශ ඉල්ලනවා. ඉතින්, ඒක වාර්තා කළා කියලා පුවත්පත් කර්තෘවරුන්ට මේ විධියට හිරිහැර කරනවා නම්, ඒක හරි කියලා මම හිතන්නේ නැහැ. ඔබතුමන්ලා විපක්ෂයේ සිටි කාලයේත් මේ අයගේ සහයෝගය, මේ හැම අංශයකම සහයෝගය විශාල වශයෙන් ලැබුණා. එතකොට හොඳයි. නමුත්, මේ වෙනකොට ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඊයේ වෙනකොට අරුණ පත්තරයේ කර්තෘතුමාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබෙනවා කියලා මම දැක්කා. අනෙකුත් කර්තෘවරු සියලුදෙනාම ඒකට විරුද්ධ වෙලා තිබෙනවා. මේ තත්ත්වය හොඳ දෙයක් නොවෙයි. මොකද, ඔවුන්ට පුවත් වාර්තා කිරීමේ අවස්ථාව දෙන්න ඕනෑ. එතැන වැරැද්දක් තිබෙනවා නම් ඇමතිතුමාට පුළුවන්, ඒක නිවැරදි කරන්න. කොයි කාලයේත් ඒක තමයි කළේ. යම් පුවතක් නිවැරදි කළාම ඒක පුවත් පතේ පළවනවා. මේ සිද්ධියත් ඒ විධියටම වෙලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මධ්‍යම අධිවේගී මාර්ගය ගැන ඇහුවා. අපේ නිලධාරින් තොරතුරු එවලා තිබෙනවා, මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටස අවසන් කරන්න ඒගොල්ලන් බලාපොරොත්තු වන්නේ 2028 සැප්තැම්බර් 01 කියලා. අපි හිතනවා, ඊට මාස කිහිපයකට කලින් එම කොටසේ වැඩ ඉවර කරන්න පුළුවන් කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ආසනය හරහා දිවෙන පොතුහැර-රඹුක්කන කොටසේ වැඩ අවසන් කරන්නේ 2027 මාර්තු කියලා තිබෙනවා. මම හිතනවා, ඒක 2026 දෙසැම්බර් 31ට පෙර අවසන් කරන්න පුළුවන් වෙයි කියලා. මෙහිදී දඹුල්ලේ ඉඩම්වලට වන්දි ගෙවන්න ජනාධිපතිතුමා සල්ලි වෙන් කරලා තිබෙනවා. අපට funding source එකක් ඇවිල්ලා තිබෙනවා. අපි ඒක පිළිබඳව කල්පනා කරමින් ඉන්නවා, මොකටද ගන්නේ කියලා. මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ නම්, 2029 අවුරුද්ද වනකොට අවසන් කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, advertisements සම්බන්ධව නම් අපි යම් අධ්‍යයනයක් කරන්න ඕනෑ. මාර්ග ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයත් එක්ක තමයි advertisements දිහා බලන්න වන්නේ. වැදගත් දේ

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වන්නේ පාර. නමුත් මම පිළිගන්නවා, monetize කරන්න පුළුවන් දේවල් monetize කරන්න ඕනෑ කියලා. ඒක තමයි ඒ සම්බන්ධව මට කියන්න තිබෙන්නේ.

මාධ්‍ය සම්බන්ධව නම් කියන්න තිබෙන්නේ මාධ්‍යවලට ලියන්න පුළුවන්, ප්‍රබන්ධ පළ කරන්න පුළුවන්, නමුත් ජනතාව උසිගන්වන දේවල් කරන්න හොඳ නැහැ කියලායි. මම මීට කලිනුත් මේ කාරණය කිව්වා. දොස්තර ෂාෆිව ත්‍රස්තවාදියෙක් කළේත් ඔය සමහර මාධ්‍යම තමයි. අපි රටේ දේවල් context එකෙන් අයින් කරලා කථා කරලා තේරුමක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. සමහර මාධ්‍ය ඇති තරම් මේ රට ගිනි තියලා තිබෙනවා. ඒකත් ඔළුවේ තියාගෙන වැඩ කරමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.14]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න කිහිපයකට උත්තර දෙන්න තිබෙනවා. ජගත් විතාන මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයක් තිබෙනවා, නව බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව. නව බලපත්‍ර ක්‍රමවේදය සඳහා ලකුණු දෙන හරිහමන් ආකාරයක් මෙච්චර කාලයක් තිබුණේ නැහැ. ඒ ආකාරය සකස් කරලා දැන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අරගෙන, කැබිනට් අනුමැතිය ගන්න තිබෙන්නේ. ඊට පස්සේ එම නව බලපත්‍ර නිකුත් කරන්න පුළුවන්.

උප දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ ගැටලුවකුත් මතු කළා, අපේ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. උප දුම්රිය ස්ථානාධිපතිවරුන් ස්ථිර කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට - Management Services Department එකට - ලිඛිතව දැනුම් දීලා තිබෙනවා, ඒ ලැබෙන තොරතුරුත් එක්ක අපි ඉදිරියේදී ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම ලංකා ගමනාගමන මණ්ඩලයට රියදුරන් සහ කොන්දොස්තරවරුන් බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වෙන්න බැරි වුණු අය පිළිබඳ ගැටලුවකුත් මතු කළා. ඒ අය වෙනුවෙන් වෙනත් දිනයක් ලබා දීලා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබෙනවා. ඒ ප්‍රශ්නය මතු වුණේ එම දිනවල තැපැල් සේවකයින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක නියැළුණු නිසා, ඒ අයට තැපැල්පත් නොලැබිච්ච නිසායි. ඉදිරියේදී ඒ අයට දෙවන වටයේ සම්මුඛ පරීක්ෂණ පවත්වා නිසි ආකාරයෙන් බඳවා ගැනීම් සිදු කරනවා.

අද දවසේ සාධනීය විවේචන - constructive criticism - වශයෙන් තමයි විපක්ෂයේ වැඩි මන්ත්‍රීවරුන් පිරිසක් යෝජනා ඉදිරිපත් කළේ. ඒ වෙනුවෙන් එතුමන්ලාට ස්තුතිවන්ත වනවා. හැබැයි, එක මන්ත්‍රීවරයෙක් -ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා- හැර. පිලිපීනයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ෆර්ඩිනන්ඩ් මාකෝස් ඒකාධිපතිත්වයක ඉඳලා 1986දී බලයෙන් පහ කරනවා. හැබැයි, එතුමාගේ පුතා වන Bongbong අවුරුදු ගණනකට පස්සේ -2022දී- පිලිපීනයේ ජනාධිපති වනවා. ඒ, අවුරුදු 36කට පස්සේ. අවුරුදු 80දී පුළුවන් වෙයි, සමහර විට නාමල්ට ජනාධිපති වෙන්න. හැබැයි, ලෝකයේ සමාජ සිද්ධීන් වෙනකොට දළ වශයෙන් පළමුවැනි සිද්ධිය මිනිස්සු වැලඳගන්නවා, උත්කර්ෂවත් විධියට අරගෙන. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි සිද්ධිය ගන්නේ ජෝක් එකක් විධියට. මම හිතන්නේ නැහැ, ජනතාව මේ රටේ ජනාධිපති පුටුවේ Bongbongලා වාඩි කරවයි කියලා. ජෝකර්ලා වාඩි කරවන්නේ නැහැ, එවැනි පුටුවල.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා දිගටම කරුණු-කාරණා කිව්වේ අපේ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව අරගෙන. මේ ප්‍රගති වාර්තාව නිකුත් කරලා තිබෙන්නේ 2025.09.30වැනි දා. මේ වාර්තාව නිකුත් වෙලා මාස එකහමාරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. අපේ පළමු අය වැය සම්මත වන්නේ මාර්තු 21වැනි දා. ඊට පස්සේ අවුරුදු කාලය තිබුණා. අනතුරුව පළාත් පාලන මැතිවරණය තිබුණා. අපි මාස පහක් තමයි වැඩ කරලා තිබෙන්නේ. මේ කිසිවක් කියන්නේ සමාවට - excuse එකකට - නොවෙයි. අපි යම්කිසි standard එකක් maintain කරනවා. හැබැයි, ඒ standard එකට සියයට 100ක් ළඟා වෙන්න බැරි වෙලා තිබෙනවා. ලබන අවුරුද්දේ එතැනට ළඟා වන්න පුළුවන් වෙයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග ක්ෂේත්‍රය ගත්තොත්, 2021 අවුරුද්දේ සම්පූර්ණ ප්‍රගතිය තිබෙන්නේ සියයට 59.3යි. 2022 අවුරුද්ද ගත්තොත්, ප්‍රගතිය සියයට 79.01යි. 2023 අවුරුද්ද ගත්තොත්, ප්‍රගතිය සියයට 66.32යි. 2024 අවුරුද්ද ගත්තොත්, ප්‍රගතිය සියයට 71.36යි. 2025.10.31 වනකොට මේ ක්ෂේත්‍රයේ ප්‍රගතිය සියයට 65.83ක් තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, 2025.12.31 වනකොට මේක සියයට 88ක ප්‍රගතියක් දක්වා අරගෙන යන්න. අපට ඒ තැනට යන්න පුළුවන්. මේ කිසිවක් අපි excusesවලට කියන කාරණා නොවෙයි. අපි බලාපොරොත්තු වුණු standardsවලට ලබන අවුරුද්දේ යා යුතුයි. මොකද, මේ ප්‍රගතිය සියයට 95කට වඩා ගත යුතුයි කියන මතයේ අපි ඉන්නවා.

ඊළඟට, දේශීය අරමුදල් සහ විදේශීය අරමුදල් කියලා කොටස් දෙකක් ලංකාවේ තිබෙනවා. විදේශීය අරමුදල්වලින් ගත්තොත් අපි දන්නවා, 2022 අවුරුද්දේ අරගෙන තිබෙන ප්‍රගතිය සියයට 22යි කියලා. 2023 අවුරුද්දේ සියයට 28යි. 2024 අවුරුද්දේ සියයට 31යි. හැබැයි, මේ වනකොට අපි ඒ ප්‍රගතිය සියයට 42කට අරන් තිබෙනවා. අපි හිතනවා, එය සියයට 71ක් දක්වා ගෙන යන්න පුළුවන් වෙයි කියලා. අපි දන්නවා, වැඩි ප්‍රමාණයක් අපට විදේශීය ණයකරුවන් එක්ක සාකච්ඡා මට්ටමින් තමයි මේක කරන්න තිබෙන්නේ කියලා. ඒකට යම්කිසි කාලයක් ගත වුණා. මේ ආකාරයෙන් තමයි අපේ ප්‍රගතිය තිබෙන්නේ.

මම වැඩි අවධානයක් යොමු කරන්න කැමැතියි, අමාත්‍යාංශය විධියට අපි යා යුතු දිශානතිය සම්බන්ධව. මහාමාර්ග ක්ෂේත්‍රය ගත්තොත්, අපි සැහෙන මුදල් ප්‍රමාණයක් කාලයක් තිස්සේ මේ ක්ෂේත්‍රයට යොමු කරලා තිබෙනවා. අපි මාර්ගවල සනත්වය - road density - ගත්තොත්, ලංකාවේ මාර්ග සනත්වය වර්ග කිලෝමීටරයකට දළ වශයෙන් කිලෝමීටර් 1.82ක් වනවා. එය දකුණු ආසියාවේ තුන්වැනි තැන. මාර්ගවල වැඩිම සනත්වය තිබෙන්නේ ඉන්දියාවේ. දෙවැනියට තිබෙන්නේ බංග්ලාදේශයේ. ජර්මනිය ගත්තොත්, වර්ග කිලෝමීටර් 1,000කට තිබෙන්නේත් කිලෝමීටර් 1.8යි. UK ගත්තොත්, කිලෝමීටර් 1.75යි, USA ගත්තොත්, කිලෝමීටර් 69ක් වාගේ වනවා. ඒ රටවලට සාපේක්ෂව ගත්තාම අපි හොඳ තැනක ඉන්නවා. ඒ වාගේම පුද්ගලයන් - inhabitantsලා - එක්ක ගණන් හදලා බැලුවාම වර්ග කිලෝමීටර් 1,000ට කිලෝමීටර් 5.46ක් තිබෙනවා, අපේ රටේ. ඒ අනුවත් ලංකාව තමයි දකුණු ආසියාවේම ඉහළම තැන ඉන්නේ. ඉන්දියාව කිලෝමීටර් 5.13යි. බංග්ලාදේශයේ කිලෝමීටර් 2.3යි.

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

ඒ වාගේම roadsවල surface quality එක මනින්නේ IRI - International Roughness Index - එකෙන්. මේ දර්ශකයෙනුත් අපි යම්තාක් දුරකට හොඳ තත්ත්වයේ ඉන්නවා. හැබැයි, පසුගිය අවුරුදු 4 තුළ මහාමාර්ග ක්ෂේත්‍රයේ ඉදිකිරීම් සඳහා මුදල් වැය නොකළ නිසා යම්කිසි පසුබෑමක් තිබෙනවා. හැබැයි අපි හිතනවා, අවුරුදු 2ක්, 3ක් ඇතුළත අපි බලාපොරොත්තු වන ඉලක්කයට ලෙහෙසියෙන් ළඟා වෙන්න පුළුවන් කියලා.

හැබැයි මහාමාර්ග ක්ෂේත්‍රය හා සමානව ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තොත්, 1950 සහ 2000 අතර අවුරුදු සංසන්දනය කළොත්, 1950 අවුරුද්දේදී පොදු මගී ප්‍රවාහනයට පොදු බස් රථ - public buses - මඟින් සියයට 70ක දායකත්වයක් ලබා දුන්නා. හැබැයි, 2000 අවුරුද්ද වනකොට ඒක සියයට 60 දක්වා අඩු වනවා. 1950 අවුරුද්දේදී පොදු මගී ප්‍රවාහනයට දුම්රියෙන් සියයට 25ක දායකත්වයක් ලබා දුන්නා. ඒක 2000 අවුරුද්ද වනකොට සියයට 4 දක්වා අඩු වනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? මේ අඩුවීම නිසා පෞද්ගලිකව තම තමන් ප්‍රවාහන අවශ්‍යතා සපුරාගන්නවා. 1950 අවුරුද්දේ සියයට 5ක්ව තිබුණු එම ප්‍රමාණය දැන් සියයට 36 දක්වා වැඩි වනවා. අතීතයට යන්නේ නැතුව මෑත කාලය ගත්තොත්, 1995 අවුරුද්ද වනකොට පොදු ප්‍රවාහනයෙන් මගී ප්‍රවාහනයට සියයට 60ක දායකත්වයක් ලබා දුන්නා. 2024 අවුරුද්ද වනකොට ඒක අඩු වනවා, සියයට 35 දක්වා. මේක නිසාම වාහන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ලංකාවේ ජනගහනය බැලුවාම, 1,000කින් 270කටම වාහන තිබෙනවා. නිකම් ඉලක්කම්වලින් ගත්තොත්, DMT එකේ register වෙලා තිබෙනවා, වාහන ලක්ෂ 85ක්. දෙකෝටි විසිලක්ෂයක ජනගහනය ගත්තත්, එතැනත් අනුපාතය වැඩියි. ඒ වාගේම ඒකෙන් සියයට 1.5ක් තමයි, පොදු මගී ප්‍රවාහනයෙන් සියයට 69ක් මිනිස්සු අරගෙන යන්නේ. එතකොට මෙතැන අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. වියදම ගත්තොත් සාමාන්‍යයෙන් වැඩි වියදමක් යනවා, පෞද්ගලික ප්‍රවාහනය සඳහා. එතකොට අපි මොකක්ද කළ යුත්තේ? මෙහෙම වෙන්න හේතුව මොකක්ද?

කාලයක් තිස්සේ අපි වැඩි වශයෙන්ම මුදල් වෙන් කළේ සාපේක්ෂව ගත්තාම පොදු ප්‍රවාහනයට වඩා මහාමාර්ග ක්ෂේත්‍රයට. 2021 අවුරුද්ද ගත්තොත්, සම්පූර්ණ පොදු ප්‍රවාහනය සහ මහාමාර්ග වෙනුවෙන් වෙන් කළ මුදල්වලින් සියයට 94ක් වෙන් වන්නේ මහාමාර්ගවලට. පොදු ප්‍රවාහනයට වෙන් වන්නේ සියයට 6යි. 2022 අවුරුද්දේදී මහාමාර්ගවලට සියයට 94ක් වෙන් වනවා. අපි මේක ක්‍රමිකව වෙනස් කරනවා. 2025 අවුරුද්ද වනකොට අපි සියයට 10ක් දක්වා වැඩි කරනවා, ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් වන මුදල් ප්‍රමාණය. 2026 අවුරුද්දේත් මහාමාර්ගවලට සියයට 90ක් වෙන් වනකොට, ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් වන මුදල් ප්‍රමාණය අපි සියයට 10ක් දක්වා ක්‍රමිකව වැඩි කරනවා. මොකද, මහාමාර්ග ක්ෂේත්‍රය වෙනුවෙන් අපි වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කළා, ඒකේ යම්කිසි ගුණාත්මක බවක් දැන් අපට දකින්න තිබෙනවා. අපි ඉදිරි අවුරුද්ද තුළ පොදු ප්‍රවාහනය වෙනුවෙන් වැඩි බරක් දමා, ඒ සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණයත් වෙනස් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ අපි "ලංකා මෙට්‍රෝ බස් සමාගම" කියලා සමාගමක් පටන් ගත්තා. අපි ඇත්තටම මේ සමාගම හදන්නේ ළමයෙක් හදනවා වාගේයි. එහි තිබෙන්නේ වෙනම වැටුප් ක්ෂේත්‍රයක්, වෙනම uniform එකක්, වෙනම බඳවා ගැනීමේ පටිපාටියක්. ඒක වෙනම culture එකක්, වෙනම vibe එකක් විධියටයි අපි හදන්නේ. ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ලංකා මෙට්‍රෝ බස් සමාගම තමයි අපි සංවර්ධනය කරන්න බලාපොරොත්තු වන්නේ, අනාගතයේ ලංකාවේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය අරන් යා යුතු තැන, model එක විධියට. අපි හිතනවා, ලබන අවුරුද්ද ඇතුළත ඉස්සෙල්ලාම කොළඹ දිස්ත්‍රික්කයත්, ගම්පහ දිස්ත්‍රික්කයත් යා වන විධියට ලංකාවේ ජනතාවට ඒ සේවාව අත්විඳින්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම අපි bus stands 50ක් සංවර්ධනය කරනවා. ඒක Clean Sri Lanka වැඩසටහනත් එක්ක අනුබද්ධ වෙලා ක්‍රියාත්මක වනවා.

ඒ වාගේම අද විවාදයේදී තව කරුණක් මතු වුණා; ඇමතිතුමාත් ඒක මතක් කළා. හැබැයි ඒක මේ සමහර මන්ත්‍රීතුමන්ලාගේ ඔළුවට ගිහිල්ලා නැහැ වාගේයි. බස් ගාස්තු ගෙවීමට හඳුන්වා දුන් card paymentsවලදී මිනිස්සුන්ට වැඩිපුර ශතයක්වත් වැය වන්නේ නැහැ. බස් හිමියාගේ ගාස්තුව රුපියල් 255යි නම්, ඊට වැය වන්නේ රුපියල් 255ම තමයි. ඊට වැඩියෙන් ශතයක්වත් වැය වන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමෙක් යොමු කරපු ප්‍රශ්නයට අදාළව තමයි මම ඒ කාරණය කිව්වේ. මේ ආකාරයෙන් තමයි අපි ප්‍රවාහන ක්ෂේත්‍රයට මාරු වෙන්න බලාපොරොත්තු වෙන්නේ. මහාමාර්ග ක්ෂේත්‍රයට මුදල් වෙන් කරන ගමන් ප්‍රවාහන ක්ෂේත්‍රය සංවර්ධනය කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා, අපේ අමාත්‍යාංශය වෙනුවෙන් කැපවීම් කරන සියලුම රාජ්‍ය නිලධාරින්ට. ඒ වාගේම ස්වේච්ඡාවෙන් වැඩ කරන ආයතන ගොඩක් තිබෙනවා. එකී නොකී වැඩි පිරිසක් මේ වෙනුවෙන් දායක වෙනවා. ඒගොල්ලන් සියලුදෙනාට අමාත්‍යාංශය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. (MRS.) THUSHARI JAYASINGHE took the Chair.*

[பி.ப. 5.23]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு முதலில் எனது வணக்கத்தை தெரிவித்துக் கொள்கின்றேன். இன்றைய தினம் நடைபெறுகின்ற போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு மற்றும் நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன்.

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சினூடாக மட்டக்களப்பு மாவட்டத்தின் கிரான் பாலம் மற்றும் பொண்டுகல் சேனைப்

பாலத்தின் புனர்நிர்மாணப் பணிகள் தொடங்கப்பட இருக்கின்றன. அதற்காக நான் இந்த இடத்தில் கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் போக்குவரத்து சார்ந்த பல விடயங்களைச் செய்யவேண்டிய தேவை இருக்கின்றது. குறிப்பாக, புகையிரதம் மற்றும் பெருந்தெருக்கள் சார்ந்த விடயங்களைச் செய்யவேண்டிய தேவை இருக்கின்றது. அங்கு புகையிரத சேவைகள் மட்டுப்படுத்தப்பட்ட அளவிலே இடம்பெறுகின்றன. அதுமாத்திரமன்றி, நேர மாற்றமும் செய்யப்பட்டு இருக்கின்றது. அதை மாற்றியமைத்துத் தருவதாக கௌரவ அமைச்சர் அவர்கள் கடந்த மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் உறுதியளித்திருந்தார். அந்த அடிப்படையில், அதை மாற்றித் தருமாறு கேட்டுக் கொள்கின்றேன். மேலும், second class, third class compartments மிக நெருக்கடியாக இருக்கின்றன. மிகக் குறைந்தளவு பயணிகளுக்குத்தான் - 45 பேருக்குத்தான் - அதில் ஆசனங்களைப் பெற்றுக்கொள்ளக்கூடியதாக இருக்கின்றது. எனவே, அதற்கு மேலதிக compartmentsஐ வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஒரு மாதத்துக்கு முன்னர் booking செய்வதன் மூலம்தான் A/C compartmentஇல் ஆசனங்களைப் பெற்றுக் கொள்ளக்கூடியதாக இருக்கிறது. எனவே, பாரிய தேவையாக இருக்கின்ற இந்த விடயத்தைக் கருத்திற்கொண்டு, இதற்குரிய தீர்வைப் பெற்றுத்தர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கிழக்குப் பல்கலைக்கழகத்துக்கு அண்மையில் railway substation ஒன்றை அமைத்துத் தரவேண்டுமென நாங்கள் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் விண்ணப்பம் செய்தோம். ஆயிரக்கணக்கான மாணவர்கள் படிக்கின்ற கிழக்குப் பல்கலைக்கழகத்துக்கு அண்மையில் railway substation ஒன்றை அமைப்பதன்மூலம் புகையிரத சேவையை மேலும் சிறப்பாகக் கொண்டுசெல்லக்கூடியதாக இருக்கும். எனவே, அந்த வசதியையும் ஏற்படுத்தித் தர வேண்டுமென வேண்டிக் கொள்கின்றோம். வாகரை பகுதியில் இருக்கும் railway substation மூடப்பட்டு இருக்கின்றது. அது பற்றியும் நாங்கள் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் கூறியிருந்தோம். அதிகளவு பொதுமக்கள் வாழுகின்ற அந்தப் பிரதேசத்தில் போக்குவரத்து வசதிகள் குறைவாக இருப்பதுடன், சில இடங்களிலுள்ள மக்கள் பஸ் வண்டிகளைக்கூட காணாத நிலை இருக்கின்றது. அந்த இடங்களில் பஸ் வண்டிகளே செல்வதில்லை. இதனால் பாடசாலைகளுக்குச் செல்வது மிகவும் சிரமமாக இருக்கின்றது.

மேலும், வாழைச்சேனை பேருந்து நிலையம் மிக மோசமான நிலையில் இருக்கின்றது. அதைச் சீர்செய்து, அங்கு காணப்படுகின்ற ஆளணிப் பற்றாக்குறையையும் நிவர்த்தி செய்து, போக்குவரத்துக்குரிய பஸ் வண்டிகளையும் வழங்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். எங்களுடைய சக பாராளுமன்ற உறுப்பினர் கூறியதுபோன்று, நீங்கள் கிரான் பாலம் தொடர்பிலான முயற்சி ஒன்றைத் தொடங்கி இருக்கிறீர்கள். அது அப்பிரதேச மக்களுக்கு மிகவும் பிரயோசனமாக அமையும்.

படுவான்கரை பிரதேசத்தை அங்குள்ள வாவி பிரிக்கின்றது. அங்கும் கிராமிய வீதிகள் உட்பட பல உட்கட்டுமான வசதிகளை அபிவிருத்தி செய்யவேண்டி இருக்கின்றது. நரிப்புல் தோட்டம் மற்றும் பங்குடாவெளி பகுதிகளுக்குரிய பாலத்தை அபிவிருத்தி செய்வதற்கான நிதியை அடுத்த வரவு செலவுத்திட்டத்திலாவது ஒதுக்கி, அந்தப் பணிகளைத் தொடங்கவேண்டிய தேவை இருக்கின்றது.

மேலும், படகுப் போக்குவரத்துச் சேவைகூட பல இடங்களில் இல்லாமல் இருக்கின்றது. குறிப்பாக, கிண்ணியடி பிரதேசத்திலிருந்து பிரம்படி தீவுக்குப் போவதற்கு படகு வசதி இல்லாமல் இருக்கின்றது. இதையும் சீர்செய்ய வேண்டிய பாரிய பொறுப்பு இருக்கின்றது. ஏனெனில், வெள்ள காலங்களில் அந்தப் பகுதிக்கான போக்குவரத்தானது, இரண்டு சிறிய தோணிகளை இணைத்துக்கட்டி, பாதுகாப்பற்ற நிலையிலேயே இடம்பெறுகின்றது. எனவே, அங்கு சீரான படகுச் சேவையை உருவாக்கித் தரவேண்டிய பொறுப்பு போக்குவரத்து அமைச்சுக்கு இருக்கின்றது. இந்த விடயத்தைச் செய்து தர வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் நகர அபிவிருத்தி, நீர்ப்பாசனம் சம்பந்தப்பட்ட விடயங்களில் பாரிய செயற்றிட்டங்களை முன்னெடுக்கவேண்டி இருக்கின்றது. மட்டக்களப்பு நகரை அழகுபடுத்துவதற்காக அங்குள்ள வாவியை ஆழப்படுத்தி, அதற்குரிய செயற்றிட்டத்தை முன்னெடுக்க வேண்டும். மட்டக்களப்பு நகரத்தில் கழிவுநீரைச் சுத்திகரித்து வெளியேற்றுவதற்கு எந்தவொரு முழுமையான செயன்முறையும் இல்லாமல் இருக்கின்றது. மக்கள் நெருக்கமாக வாழுகின்ற இடங்களிலிருந்து வெளியேற்றப்படு கின்ற கழிவுநீர் எல்லாம் வாவியில் வந்து சேர்வதனால், அது அசுத்தமடைந்துகொண்டு இருக்கின்றது. எனவே, அது தொடர்பான ஒரு செயற்றிட்டத்தையும் ஆரம்பிக்க வேண்டிய பொறுப்பு இந்த அமைச்சுக்கு இருக்கின்றது.

அடுத்து, மட்டக்களப்பு மாவட்டத்தில் நீர் வழங்கலில் பாரிய பிரச்சினை இருக்கின்றது. தற்போது அங்கிருக்கின்ற குடிநீர் திட்டத்தின்மூலம் முழுமையாக நீர் வழங்கல் வசதியைச் செய்ய முடியாத நிலை இருக்கின்றது. நீர்த்தேக்கங்கள் இருக்கின்ற பகுதிகளான வவுணதீவு மற்றும் படுவான்கரையின் பகுதியான செங்கலடிக்கு முழுமையாக குடிநீர் வசதியைப் பெற்றுக்கொடுக்க வேண்டிய தேவை இருக்கின்றது. அந்தப் பகுதிகள் பாறைகள் மிகுந்த பகுதிகளாக இருப்பதனால், வறட்சியான காலங்களில் அங்குள்ள மக்கள் பிரதேச சபை ஊடாக வழங்கப்படுகின்ற நீர்மூலமே தங்களது நீர்த் தேவையைப் பூர்த்தி செய்யக்கூடியதாக இருக்கின்றது. அதை முழுமையாக பிரதேச சபையால் வழங்க முடியாதிருக்கின்ற காரணத்தால், அங்குள்ள பிரதேச சபைகளால் தொடர்ச்சியாக இந்தச் செயற்றிட்டங்களைச் செய்ய முடியாத நிலை காணப்படுகின்றது. எனவே, மட்டக்களப்பின் படுவான்கரை பகுதியில் நீர் வழங்கல் செயற்றிட்டத்தை வினைத்திறனான முறையில் செய்ய வேண்டிய பாரிய பொறுப்பு இருக்கின்றது. மேலும், மட்டக்களப்பு நகர் சன நெரிசல் மிகுந்த பகுதியாக மாறி வருவதால், அதனை நகர அபிவிருத்தித் திட்டத்தின் ஊடாகச் சிறந்த முறையில் முகாமைத்துவம் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று நடந்த ஒரு நிகழ்வை இந்த இடத்தில் சுட்டிக்காட்ட வேண்டிய பொறுப்பு எனக்கு இருக்கின்றது. அதாவது, மட்டக்களப்பு மாவட்டத்தில் தொல்பொருள் திணைக்களத்தின் பதாதைகள் அகற்றப்பட்ட நிகழ்வு தொடர்பில் எழுந்துள்ள பிரச்சினையைச் சுமுகமான முறையில் கையாண்டு, அதற்குரிய தீர்வைப் பெற்றுத் தர வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன். இது பாரியதொரு பிரச்சினையாக எதிர்காலத்தில் மாறி விடக் கூடாது. இதனை இனவாதம் மிகுந்தவர்கள் பயன்படுத்தி, நெருக்கடி நிலைமையை உருவாக்குவதற்கு இடமளிக்கக் கூடாது என்பதற்காக நாங்கள் எல்லோரும் கலந்தாலோசித்து, இதற்குரிய திட்டத்தை வகுத்து, சுமுகமான முறையில் இந்தப் பிரச்சினையைத் தீர்த்துக்கொள்ள வேண்டும். இதற்குப் பொறுப்பான

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

அமைச்சுகள் இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு முழுமையான ஒத்துழைப்பைத் தர வேண்டும். நாங்களும் எங்கள் சார்பில் பிரதேச சபைகளுக்கு அறிவுறுத்தல்களை வழங்கி, இறுக்கம் இல்லாத ஒரு நிலையை ஏற்படுத்துவோம். இவ்வாறான நிலைமைகள் ஏற்படுவதற்குக் காரணம், கடந்த காலங்களில் தொல்பொருள் திணைக்களத்தின் செயற்பாடுகள் சம்பந்தமாக மக்களுக்கு ஏற்பட்ட மனப் பதிவுகளும் வேதனைகளும் ஆகும். இந்தப் பிரச்சினை பிரதேச சபையால் ஏற்படுத்தப்பட்டு இருந்தால், அதனைச் சுமுகமான முறையில் தீர்த்துக் கொள்வதற்கான ஏற்பாடுகளை கலந்தாலோசனைகள்மூலம் செய்துகொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

போக்குவரத்துத்துறை அமைச்சருக்கு நான் நன்றி கூறக் கடமைப்பட்டு இருக்கிறேன். ஏனெனில், அவர் எங்களுடைய மாவட்ட மக்களுக்குப் பிரயோசனம் அளிக்கக்கூடிய வகையில், கிரான் பாலம் தொடர்பான வேலைகளை ஆரம்பித்து இருக்கிறார். அந்த வேலையைத் தொடர்ச்சியாக முன்னெடுத்து நிறைவு செய்வதன்மூலம் பாரிய வெள்ளப் பெருக்கைத் தவிர்த்துக்கொள்ள முடியும். அத்துடன், படுவான்கரை மக்கள் தங்களது விளை நிலங்களில் கிடைக்கின்ற நெல் போன்ற விவசாய உற்பத்திகளை டிசம்பர் அல்லது சனவரி மாதமளவில் அதனூடாகக் கொண்டுசெல்லக் கூடியதாகவும் இருக்கும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Madam, I will wind up in 30 seconds.

நான் இங்கு மிகப் பிரதானமாக முன்வைத்த விடயங்களான வாகரையிலுள்ள railway substationஐ மீளத் திறப்பது, கிழக்குப் பல்கலைக்கழகத்துக்கு அண்மையில் railway substation ஒன்றை அமைப்பது, railway திணைக்களத்தை வலுப்படுத்தி மேலதிக சேவைகளை ஆரம்பிப்பது போன்ற விடயங்களை கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.31]

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ප්‍රථමයෙන්ම මම, අද දවසේ මතු වුණු ප්‍රශ්න කිහිපයක් ගැන අවධානය යොමු කරන්නම්. Embarkation Levy එක ගැන කථා කළා. ඒක අපි ආපහු අය කරගන්නේ කොහොමද කියලා ඇහුවා. මම හිතන විධියට, කලිනුත් මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වුණා. ඒ වෙලාවේදී අපට Finance Act එකේ යම්කිසි amendments වගයක් කරගන්න අවශ්‍යතාවක් තිබුණා. ඒ සම්බන්ධයෙන් අපි මේ වෙනකොට Attorney-General's Department එකේ concurrenceවලට දාලා තිබෙනවා. ඊට අමතරව නීතිමය කටයුතුවලට යන්න කලින් සියලුම සමාගම් සමඟ අපි සාකච්ඡා මාර්ගයෙන් කටයුතු කරනවා. මේ වෙනකොට ඒ සියලුදෙනා අපට payment plan එකක් දීලා තිබෙනවා සහ ඒ payment plan එක ඒගොල්ලන් follow කරනවා.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා මතු කළා Ratmalana Airport එක අපට පාවිච්චි කරන්න පුළුවන්ද කියන කාරණය. ඇත්ත, පුළුවන්. අපි මේ වෙනකොට සාකච්ඡා පවත්වනවා. Akuregoda Defence Headquarters සහ Parliamentary Complex එක උඩින් no-fly zone එකක් තිබෙනවා, nautical mile එකක radius එකකින්. මේ වෙනකොට අපි Defence Ministry එකත් එක්ක සාකච්ඡා කරමින් පවතිනවා, මේක nautical mile භාගයකට අඩු කරගෙන පොඩි gliding path එකක්, channel එකක් open කරගන්න. ඒක කරගන්න හැකියාව ලැබුණොත් අපට පුළුවන් වෙනවා, Ratmalana Airport එක private jetsවලට open කරන්න. අපි දන්නවා ඒක විතරක් ප්‍රමාණවත් නැහැ කියලා. ඒකට Instrumental Landing System - ILS - එකකුත් එකතු කරන්න වෙනවා. එහෙම නැත්නම් අපට මේකේ night-time operation එකක් කරගන්න බැහැ. Ratmalana Airport එක සම්බන්ධයෙන් ඒක තමයි කියන්න තිබෙන්නේ.

මත්තල ගුවන් තොටුපොළ ගැන නාමල් රාජපක්ෂ මැතිතුමා කථා කළා. එතුමා කිව්වා, වී ගබඩා කළා, කැලෑව වැවුණා කියලා. අපි වී ගබඩා කරන්නෙත් නැහැ. කැලයත් අයින් කරලා තිබෙන්නේ. මිලියන 400කට ඇස්තමේන්තුගතව තිබුණු outer perimeter, inner perimeter දෙකම අපි හදලා තිබෙනවා. නමුත් අපි තවමත් දැඩි පරිශ්‍රමයක් දරනවා ඒකට airlines ගේන්න ගන්න. මම හිතන්නේ ඒකේ වී ගබඩා කරපු එකවත්, කැලෑව වැව්ච්ච එකවත් නොවෙයි ප්‍රශ්නය. ඒ, අනවශ්‍ය තැනක, feasibility study එකකින් තොරව, crosswind එකවත් බලන්නේ නැතුව හදපු airport එකක්.

ඊට අමතරව කිව්වා, Terminal 2 එකත් පරක්කු වුණේ වහලයක ප්‍රශ්නයක් නිසා කියලා. අපි දන්න විධියට නම් වහලයක ප්‍රශ්නයක් නොවෙයි තිබුණේ. කොමිස් ඉල්ලා contractor සහ donor ඒක දාලා ගිය ප්‍රශ්නයක් තමයි තිබුණේ.

ඒ වාගේම වරාය bypass කරලා නැව් යන එක ගැනත් රවී කරුණානායක මන්ත්‍රීතුමා මතක් කළා. ගිය අවුරුද්දටම වරාය bypass කරලා නැව් 7ක් ගිහිල්ලා තිබෙනවා. ඒ නැව් 7ම CICT එකට bound වෙච්ච නැව්. අපේ ප්‍රශ්නයක් නිසා නොවෙයි, Terminal එකේ තිබිච්ච ගැටලුකාරී තත්ත්වයක් මත ඒ නැව් 7ම divert කරලා තිබෙනවා. ඒ, congestion එක නිසාම නොවෙයි. හැබැයි අපට වරායේ ගැටලුවක් නැතුවාම නොවෙයි. වරායේ තිබෙන capacity එකට අනුව තමයි අපි business එක කරන්නේ. නමුත් අපට මේ region එකේ තිබෙන volume එකට අදාළව business එකක් ගොඩ නඟාගන්න බැරි වෙලා තිබෙනවා. අපේ strategic plan එකක් නැහැ කියලා එතුමා මතු කළාට, strategic plan එකක් තිබෙනවා. 2050 වෙනකම්ම අපට වරායට අදාළ Master Plan එක තිබෙනවා. ඒක අවුරුදු පහෙන් පහට revise වෙනවා.

හැබැයි, මේ Master Plan එකට අදාළ infrastructure grow වෙනවාද කියන එක ගැන අපට ගැටලුවක් තිබෙනවා. උදාහරණයක් කිව්වොත්, ECT එක ගැන දිගින් දිගටම ප්‍රශ්න මතු කළා. ECT එකට මොකද වුණේ, ECT එක පරක්කු වුණාද, දැන් කරගන්න බැරිද කියලා කථා කළා. මේ ECT කියන ව්‍යාපෘතිය පටන් ගන්නේ 2022 ජනවාරි 04වැනි දා. මෙහි contract කාලය අවුරුදු තුනයි. ඒ කියන්නේ, 2025 ජනවාරි 03වැනිදා වෙනකොට ECT එක fully operational වෙන්න ඕනෑ. ඒකේ ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් තිබෙනවා. එකක්, quay wall construction එක; අනෙක, yard construction එක. නමුත් පසුගිය අවුරුදු තුනටම physical progress එක ගත්තොත්, අපි භාරගන්නකොට, quay wall construction සියයට 55ක් ඉවර කරලා තිබුණා; yard construction සියයට 31යි ඉවර කරලා තිබුණේ. ඒ කියන්නේ, අවුරුදු තුනට, contract එක ඉවර වෙන්න ඕනෑ කාලය වනකොට. ඒ speed එකේ ගියා නම් ECT එකේ කටයුතු ඉවර වෙන්නේ 2029දී. නමුත් අපේ නිලධාරින්ගේ සහ අමාත්‍යාංශයේ මැදිහත් වීම මත අපි මේ අවුරුද්ද තුළ quay wall එකේ සියයට 90ක සහ yard එකේ සියයට 77ක ප්‍රගතියක් ලබාගෙන තිබෙනවා. අපි මේ progress එකත් සියයට 50ක් operate කරන්න පුළුවන් මට්ටමට milestone එකක් හදලා කරගෙන ගියේ. ඒ නිසා පහුගිය මාසය වෙනකොට දෙවැනි නැව berth කරන්න අපට හැකියාව ලැබුණා. අපට දැන් සාමාන්‍යයෙන් මීටර් 350කට කිට්ටු වෙන ලොකු නැව් දෙකක් berth කරගන්න හැකියාව තිබෙනවා, quay wall එකේ. මේ වෙනකොට yard එකේ construction සියයට 50ක් ඉවර වෙලා, ARMGsවල testing යනවා.

ඊළඟට, අපේ straddle carriers ගැනත් දිගින් දිගටම ප්‍රශ්න මතු කළා. ඔව්, ප්‍රශ්නයක් තිබුණා. Straddle carrier tender එක cancel වුණා. ඒ cancel වුණේ පළමුවැනි වතාවට නොවෙයි. Straddle carrier procurement එක පටන් ගෙන තිබුණේ 2021දී. විවිධ හේතූන් මත මේක දිගින් දිගටම cancel වුණා. අපි එනකොටත් මේකේ පැහැදිලි මට්ටමක් තිබුණේ නැති නිසා අපට cancel කරන්න සිද්ධ වුණා. හැබැයි, straddle carriers කියන්නේ වරායේ Terminal එකේ efficiency එක වැඩි කරන්න දාලා තිබෙන equipment එකක්. වරායේ අනෙක් Terminalsවල straddle carriers වෙනුවට trucks use කරනවා. අපි මේ වෙනකොට සැලසුම් හදලා තිබෙනවා, මාස 11කින් straddle carriers එනකම් trucks සහ prime movers use කරගෙන වරායේ තිබෙන මෙහෙයුම් කටයුතු ටික, Terminal එකේ තිබෙන මෙහෙයුම් කටයුතු ටික කරගෙන යන්න. ඒ නිසා ECT එක පරක්කු වුණා සහ අපි ඇවිල්ලා පරක්කු කළා කියන කාරණාව සම්පූර්ණයෙන් සාවද්‍යයි.

ඊට අමතරව, ECT එකෙන් අපි මේ කටයුත්ත ඉවර කරනවාද? මෙච්චර කල් වුණේ අපි එක Terminal එකක් හදලා බලාගෙන හිටපු එකයි. නමුත් අපට මේ continuation එක දිගටම තියාගෙන යන්න වෙනවා, මේ regional volume එකත් එක්ක අපි fight කරනවා නම්. ඒක නිසා අපි ආපු ගමන් WCT 2 එකේ තිබෙන detailed design එක පටන් ගත්තා. අපි හිතනවා, ලබන අවුරුද්දේ ජූලි, අගෝස්තු වෙනකොට මේ detailed design එකේ interim report එක base කරගෙන WCT 2 එකටත් අපට EoIs call කරගන්න පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ වෙනකොට North Port එකෙත් feasibility study එක කරගෙන යනවා. අපේ අමාත්‍යාංශයේ ආයතන අටක් තිබෙනවා. කාලය නොමැති නිසා එක ආයතනයක් ගැන විතරයි පොඩි හැඳින්වීමක් කරගන්න පුළුවන් වෙන්නේ.

මම විශේෂයෙන් මේ කාරණය කියන්න ඕනෑ. වරාය අධිකාරිය විධියට 1971 සිට 2024 වෙනකම් ඒකාබද්ධ අරමුදලට ගෙවලා තිබුණේ රුපියල් බිලියන 10.3යි. අපි මේ අවුරුද්දේ විතරක් ඒකාබද්ධ අරමුදලට රුපියල් බිලියන පහක් ගෙවනවා. අන්න එහෙමයි රාජ්‍ය ආයතන විධියට ලාභ ලබලා Treasury එකට fund කරන්නේ. අපි හිතනවා, ලබන අවුරුද්දේ මේ ප්‍රමාණය ඊට වඩා වැඩි කරගන්න පුළුවන් වෙයි කියලා. අපට මේ මුදල Treasury එකට දෙන්න පුළුවන් වුණේ ශුද්ධ ලාභයේ සියයට 54ක වර්ධනයක් තිබෙන නිසායි. එතැනදී අපට රුපියල් බිලියන 12ක වාගේ වැඩිපුර මුදලක් ලැබිලා තිබෙනවා. ඒක අපට Treasury එකට යොමු කරන්න හැකියාව ලැබුණා.

මම තව වැදගත් කාරණයක් කියන්න කැමැතියි. පසුගිය අවුරුද්ද පුරාවට, අපේ අනෙක් ආයතනවල කාර්ය සාධනයත් ඉතාම හොඳයි. ඔක්කොගේම positive growth එකක් තිබෙන්නේ. මේ ආයතන මේ මට්ටමට ගේන්න අමාත්‍යාංශයේ නිලධාරින්, රාජ්‍ය නිලධාරින් සහාය දුන්නා වාගේම කලින් හිටපු අමාත්‍යතුමාගේ -ගරු බිමල් රත්නායක අමාත්‍යතුමාගේ- නායකත්වය සහ අමාත්‍යාංශ ලේකම්තුමාගේ මැදිහත්වීම අපට නොමඳව ලැබුණා. ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් මම කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Mujibur Rahuman. You have 21 minutes.

[අ.භා. 5.40]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේත්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී මට කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. 2025 අවුරුද්දේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ ප්‍රගතිය දිහා බැලුවොත්, ඉතාම අඩු ප්‍රතිශතයක් තමයි ළඟා කරගෙන තිබෙන්නේ; සියයට 12ක් වාගේ ප්‍රගතියක් තමයි වාර්තා කරන්නේ. හැම ආණ්ඩුවක් කාලයේම සාමාන්‍යයෙන් නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රගතිය සියයට 90කට වඩා වාර්තා වෙනවා. නමුත්, 2025 අවුරුද්දේ ප්‍රගතිය බැලුවාම, සියයට 12ක් වාගේ තමයි වාර්තා වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය අය වැය යෝජනා ඉදිරිපත් කරද්දී අලුත් යෝජනා රාශියක් ඉදිරිපත් වනවා අපි දැක්කා. නමුත්, ඒ යෝජනා එකක්වත් ක්‍රියාත්මක වුණේ නැහැ. විශේෂයෙන්ම ගත්තොත්, ජනාධිපතිතුමා අනුරාධපුරයේ කසළ කළමනාකරණය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හරහා රුපියල් මිලියන 750ක් වෙන් කළා. එතුමා රුපියල් මිලියන 750ක් වෙන් කරපු ඒ ව්‍යාපෘතියවත් පටන් ගන්න බැරි වුණා.

පසුගිය ආණ්ඩුව කාලයේ විදේශීය ණය යටතේ අඩු ආදායම්ලාභීන්ට නිවාස හදන්න අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 4,000ක වාගේ ප්‍රමාණයක් ලැබුණා. ඒ නිවාස හදන ව්‍යාපෘතියේ ප්‍රගතිය ගෙන බලමු. පසුගිය ආණ්ඩුව කාලයේයි ඒ ව්‍යාපෘති පටන් ගත්තේ. එකක් තමයි, කොළඹ මාලිගාවත්තේ නිවාස 700ක ව්‍යාපෘතිය. තවත් එකක් තමයි, කොළඹ මට්ටක්කුලිය ෆර්ගියුසන් පාරේ නිවාස 700ක ව්‍යාපෘතිය. ඒ නිවාස

[ගරු මුජිබුර් රහුමාන් මහතා ]

ව්‍යාපෘති දෙකම අද වන කොට මන්දගාමී ස්වරූපයෙන් තමයි කෙරීගෙන යන්නේ. ඒවායේ වැඩ වෙන්නේ නැහැ. ඉතාම හෙමින් තමයි ඒවායේ වැඩ කෙරෙන්නේ. ඒ ව්‍යාපෘතියට ලැබුණු විදේශ ණය ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් විතර දැන් ඉතිරි වෙලා තිබෙනවා. ඒ මුදල් ඉතිරි වෙලා තිබෙනවා කියන්නේම, ඒ වැඩේ වෙන්නේ නැහැ කියන එකයි. දැන් සෑහෙන්න කාලයක් වෙනවා, ඒක ඉතා මන්දගාමීවයි සිදු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නාගරික සංවර්ධන අධිකාරියේ ජාතික භෞතික සැලැස්මක් තිබෙනවා. දැන් අපට පෙනෙනවා, ඒ ජාතික භෞතික සැලැස්ම අත් හැර තිබෙන බවක්. දැන් ඒ සැලැස්ම ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙන් මෙහෙන් එකක්, දෙකක් ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන නමුත් ඒ ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක කරන එක අද වනකොට අත්හිටුවලාද කියන ප්‍රශ්නය තිබෙනවා.

අපි දැක්කා, පසුගිය කාලයේ ගරු ඇමතිතුමා පිටකොටුව, ඕල්කට් මාවතේ තිබෙන ප්‍රධාන බස් නැවතුම් පොළ නවීකරණය කරන්න රුපියල් මිලියන 450ක් වෙන් කළා. ඒකට අදාළව භෞතික සැලැස්මක් තිබෙන බව අපි දන්නවා. ඒ යටතේ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදි කිරීමට නියමිතව තිබෙනවා. ඕල්කට් මාවතේ, ඒ වාගේම පරණ මැනිං මාර්කට් එකත් එක්ක transport hub එකක් එනවා. ඒ transport hub එකට අදාළව තිබෙන ශක්‍යතා අධ්‍යයනයන් තවම කරලා නැහැ. නමුත්, අපට පෙනෙනවා, පරණ බස් නැවතුම් පොළ නවීකරණය කරන්න රුපියල් මිලියන 450ක් වෙන් කර තිබෙන බවක්. ඒක කළා කියලා පිටකොටුවේ තිබෙන ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මොකද, පිටකොටුවේ බස් නැවතුම් පොළවල් තුනක් තිබෙනවා. එකක් තිබෙනවා, බැස්ටියන් මාවතේ. ඊළඟ එක, ගුණසිංහපුර තිබෙනවා. ඒ ප්‍රධාන බස් නැවතුම් පොළවල් තුනම එක තැනකට ගෙන එන්න තමයි බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ගොඩ නඟන්න ඕනෑ කියන concept එක අනුවයි වැඩ කරගෙන ආවේ. දැන් අපට පෙනෙනවා, ඒ ව්‍යාපෘතිය ඉස්සරහට යන්නේ නැති බව. ඒක ඉස්සරහට කරගෙන යන්නේ නැතුව, අර පරණ ඒවා repair කරගෙන යන්න හදනවා. නමුත්, ඒකට වෙන් කරන මුදල දිහා බැලුවාම එය විශාල මුදලක්; රුපියල් මිලියන 450ක්. ඇත්තටම ඒ මුදලට තවත් රුපියල් මිලියන 400ක් දැම්මා නම්, පිටකොටුවේ තිබෙන ප්‍රධාන බස් නැවතුම් පොළවල් තුනම මැනිං මාර්කට් එකට ගේන්න පුළුවන්. එහෙම ගෙනාවා නම් දැනට තිබෙන විශාල වාහන තදබදය නැති වෙනවා. ප්‍රධාන බස් නැවතුම් පොළවල් තුනම එක ස්ථානයකට ගෙන ඒම මඟීන්ටත් විශාල පහසුවක් වෙනවා. නමුත්, අපට පෙනෙනවා දැන් ඒ සංකල්පය අත් හැර දාලා තිබෙන බවක්; පසුගිය කාලයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොඩනඟපු ඒ ජාතික භෞතික සැලැස්ම අත් හැරලා දාලා තිබෙන බවක්. ඒක අත් හැර දාලා තැනින් තැන ටික ටික හදාගෙන ඒම තුළ අපි බලාපොරොත්තු වන, තමුන්නාන්සේලාත් බලාපොරොත්තු වන, ගමනාගමන ප්‍රශ්නයට සහ කොළඹ නගරය සංවර්ධනය කිරීමේ වැඩසටහනට පිටුවහලක් වෙන්නේ නැහැ.

පසුගිය කාලයේ මම නිතරම පෙන්වා දුන්නා, විශේෂයෙන්ම නිවාස සංවර්ධන අධිකාරියට අයිති ඉඩම් පිළිබඳව. ඒ ඉඩම් පසුගිය කාලයේ, එනම් 2020-2024 කාලයේ නොයෙකුත් ජාවාරම්කාරයන්ට අයථා ලෙස ලබා දීලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලා දැන් අවුරුද්දක් වෙනවා. මම මෙතැන ප්‍රශ්න පවා අසමින්, හිටපු විෂය භාර ඇමතිතුමාට කිහිප වතාවක්ම ඒ ගැන කිව්වා. මාලිගාවත්ත නිවාස සංකීර්ණවල ජනතාවට වාහන නවත්වන්න තිබුණු රථ ගාල පවා අයුතු ලෙස දීලා තිබෙනවා ගබඩාවලට. එය ජනාකීර්ණ ප්‍රදේශයක්. මම මේ පැමිණිල්ල එතුමාට කිහිප වතාවක්ම ඉදිරිපත් කළා. නමුත් කිසිම දෙයක් වුණේ නැහැ. ඉතින් මම දන්නේ නැහැ, ඇයි ඒක වෙන්නේ නැත්තේ කියලා. හිටපු ඇමතිතුමාට මම එය කිහිප වතාවක්ම කිව්වා; වාචිකවත් කිව්වා, වීඩියෝ දාලාත් පෙන්නුවා. ඒ ජනතාවගේ පරිභෝජනය සඳහා තිබෙන රථ ගාලවල්, ඒ නිවාස සංකීර්ණයේ ඉන්න ජනතාවගේ වාහන නවත්වන්න තිබෙන රථ ගාලවල් 2020-2024 කාලය තුළ දීලා තිබෙනවා, බඩු ගබඩා කරන්න. කොහොම දුන්නාද දන්නේ නැහැ. නමුත් ඒවා නිවැරැදි කිරීම වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා නිවාස විෂය භාර ඇමති හැටියට ඉන්න නිසා ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවමින් මම කියනවා, වහාම ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න කියලා.

මාර්ග සංවර්ධන අධිකාරියට 2025 වර්ෂයට රුපියල් බිලියන 324ක් වෙන් කරලා තිබෙනවා. ඒ වෙන් කිරීමෙන් සියයට 40ක වියදමක් මුදල්වලින් කරලා තිබෙනවා. RDA එක මෙවැනි ප්‍රගතියක් තමයි ලබාගෙන තිබෙන්නේ. RDA එකේ හිටපු ඉංජිනේරුවන් 200ක් විතර අද වන කොට රට අත් හැර දමා ගිහින් තිබෙනවා. ඒ නිසා එම ආයතනයේ සිටින ඉංජිනේරුවන් සංඛ්‍යාව අඩුයි. RDA එකට අවුරුදු 4කින් විතර ඉංජිනේරුවන් බඳවාගෙනත් නැහැ. ඉංජිනේරුවන්ගේ මෙවැනි විශාල හිඟයක් එහි තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ දීමනා සහ නොයෙකුත් වරප්‍රසාද සම්බන්ධයෙන් ද ගැටලු තිබෙනවා. ඒ ඉංජිනේරුවරු කිහිප වතාවක්ම ගරු ඇමතිතුමාගෙන් සාකච්ඡා ඉල්ලා තිබෙනවා. ඔවුන්ට සාකච්ඡාවක් ලැබුණේ නැහැ කියලා තමයි ඔවුන් කියන්නේ. ඔවුන් මේ 27වන දාට වැඩ වර්ජනයකට ලෑහැස්ති වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවමින් මම කියනවා 27වන දාට වැඩ වර්ජනයට යන්න කලින් වහාම එතුමන්ලාත් එක්ක කථා කරලා එතුමන්ලාට තිබෙන දීමනා ප්‍රශ්න ඇතුළු අනෙකුත් ආකාරයේ ගැටලු සම්බන්ධව විසඳුම් ලබා දෙන්න කියලා.

පාර්ලිමේන්තුවට එහා පැත්තේ තිබෙන ජපන් මිත්‍රත්ව පාරේ කිලෝමීටර එකහමාර කාපට් කරන්න දැන් මාසයකට වැඩි කාලයක් අරගෙන තිබෙනවා. තවම ඒක ඉවර නැහැ. කිලෝමීටර එකහමාරයි තිබෙන්නේ. එය හදන්න අරගෙන මාසයකටත් වඩා වැඩියි. මම දන්නේ නැහැ, ඇයි මෙච්චර හෙමින් ඒක යන්නේ කියලා. මම ඒ කෙරෙහිත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ ගැනත් බලන්න. මාසයකට වඩා වැඩි කාලයක් ගිහින් තිබුණත් ඒ කිලෝමීටර එකහමාර තවම කාපට් කර ගන්න බැරි වෙලා තිබෙනවා. තවම එහි භාගයයි අවසන් කරලා තිබෙන්නේ.

පසුගිය දවස්වල අපි කථා කළා වර්තමානයට බලපාන ගැටලු කිහිපයක් ගැන. එකක් තමයි, විගණකාධිපතිවරයකු තවම පත් නොකිරීම. ජනාධිපතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට විගණකාධිපතිවරයකු - Auditor-General කෙනෙකු - පත් කිරීමට නමක් නිර්දේශ කර එව්වා. ඒ නම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ප්‍රතික්ෂේප කළා. එය ප්‍රතික්ෂේප කළාට පස්සේ මාස 6ක වැඩ බලන කාලයක් ලබා දුන්නා. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිතුමා තමයි දැන් වැඩ බලන විගණකාධිපතිවරයා හැටියට ඉන්නේ. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. නැවත වතාවක් එතුමාගේ වැඩ බලන කාලය දීර්ඝ කරන්න ඉල්ලුවාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒක ප්‍රතික්ෂේප කළා. එය කරන්න බැහැ කිව්වා, දෙපාරක් ඒ අවස්ථාව දුන්නු හින්දා. අපට තේරෙන්නේ නැහැ ජනාධිපතිවරයා ඒ නිලධාරියාව වැඩ බලන විගණකාධිපතිවරයා හැටියටම නැවත නැවත තියා ගන්න හදන්නේ ඇයි කියලා. ඒ නිලධාරියා අවුරුදු 30ක් විතර විගණකාධිපති කාර්යාලයේ වැඩ කරලා, හැම ක්ෂේත්‍රයක් පිළිබඳවම අත්දැකීම් තිබෙන කෙනෙක්. වර්තමානයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරයා හැටියටයි

එතුමා වැඩ කරන්නේ. එතුමා දැන් මාස 6ක් වැඩ කරලා තිබෙනවා වැඩ බලන විගණකාධිපතිවරයා හැටියට. ඇයි එතුමාව ස්ථිර කරන්න බැරි? ඇයි එතුමාව ස්ථිර කරන්නේ නැත්තේ? ඔබතුමන්ලා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන පොතේ පිටු අංක 198හි රාජ්‍ය සේවය පිළිබඳව පැහැදිලිව කියලා තිබෙනවා. ඔබතුමන්ලා දක්ෂතා තිබෙන අයට, ජ්‍යෙෂ්ඨ අයට උසස්වීම් ලබා දෙනවා කියලා පැහැදිලිව කියලා තිබෙනවා. එහෙම කියලා තිබියදීත් ඇයි එතුමාව ඒ තනතුරේ ස්ථිර කරන්නේ නැත්තේ? මට ඒක තේරෙන්නේ නැහැ. ජනාධිපතිතුමා බලාපොරොත්තු වෙනවාවත්ද, එතුමාගේ Kelaniya Campus එකේ batchmate කෙනෙකු ගෙනැල්ලා දාන්න? කලින් එහෙම දාන්න හැදුවා. කලින් දාන්න හැදුවාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒක reject කළා, එයා හරියන්නේ නැහැ කියලා. රාජ්‍ය සේවයේ නැති කෙනෙකු තමයි විගණකාධිපති කරන්න හැදුවේ. මට පුදුමයි, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ගැන. මොකද, එදා එතුමා රාජ්‍ය සේවය ගැන විශේෂයෙන් කථා කළා. ඒ වාගේම එතුමා ඒ කථා කරපු දේවල් එක්ක කොහොමද පෞද්ගලික අංශයේ කෙනෙක්ව ගෙනැල්ලා විගණකාධිපති කරන්නේ? එතුමා එහෙම කෙනෙක් ගෙනාවා, නමුත් ප්‍රතික්ෂේප වුණා. දැන් නැවත වතාවක් මේ ඉන්න කෙනාගේ සේවය දීර්ඝ කරන්න බලනවා. ඔබතුමන්ලාට කෙනෙක් නැද්ද, විගණකාධිපති විධියට පත් කර ගන්න? මුදල් අමාත්‍යාංශයේ ලේකම් අයින් වුණාම, ඔබතුමන්ලාට ලේකම් කෙනෙක් නැතුව, හිටපු නියෝජ්‍ය ඇමතිවරයාව මුදල් අමාත්‍යාංශයේ ලේකම් කළා. මම කියනවා, එහෙම නම් විගණකාධිපති විධියට ඔබතුමන්ලාට පත් කර ගන්න කෙනෙක් නැත්නම් මේ COPE එකේ සභාපතිතුමා හරි විගණකාධිපති විධියට පත් කරන්න කියලා. මොකද, ඔබතුමන්ලා ඒ practice එක නේ දිගටම කරගෙන යන්නේ. මේ පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයාව මන්ත්‍රී ධුරයෙන් අස් කරගෙන මුදල් අමාත්‍යාංශයේ ලේකම් කළා. නමුත් කබ්රාල් ගිහිල්ලා මහ බැංකුවේ අධිපති වෙලා ඉන්නකොට ඔබතුමන්ලා ඒක විවේචනය කළා. ඒක වැරදියි කිව්වා. නමුත් ඔබතුමන්ලා ඒ වැරැද්දම නැවත කරනවා. ඒ හින්දා තමයි මම මේ දේවල් කියන්නේ. එතුමාට සුදුසුකම් තිබියදී - එතුමා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අවුරුදු 30ක් සේවය කරලා තිබියදී - ඒ පත්වීම ස්ථිර කරන්න බැරි ඇයි? එහෙම නම් ජනාධිපතිතුමා බලාපොරොත්තු වනවා ඇති, එතුමාට ඕනෑ කෙනෙක් ගෙනැල්ලා මේ තනතුරට පත් කර ගන්න. රාජ්‍ය සේවය ඒ තත්ත්වයට පත් කරන්නද ඔබතුමන්ලා බලය ගත්තේ? එවැනි රාජ්‍ය සේවයක් ගැනද ඔබතුමන්ලා කථා කළේ? එවැනි පාරදෘශ්‍යභාවයක් - විනිවිදභාවයක් - ගැන ද ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට කථා කළේ? ඔය දේවල් කරන්නද ඔබතුමන්ලා කථා කළේ? ඔය දේවල් කරන්න නොවෙයි, ඔබතුමන්ලා බලය ගත්තේ. නමුත් අපට පෙනෙනවා, දැන් ඔබතුමන්ලා වෙන තැනකට ගමන් කරනවා කියලා. *[බාධා කිරීමක්]* රන්වල? ඒ degree එක නොවෙයි නේ තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

ඔබතුමන්ලා කථා කළා, විශේෂයෙන්ම උත්තර දුන්නා, "අරුණ" පත්තරේ ගැන. අරුණ පත්තරේ දැම්ම news එක මොකක්ද? අරුණ පත්තරේ news එකක් දැම්මා, චරිත සහතික ගන්න මහජන ආරක්ෂක කමිටුවේ සහතිකය ඕනෑය කියලා. ඒ පත්තරේ වාර්තා කළා, ඒක ග්‍රාම නිලධාරිවරුන් කියලා තිබෙනවා කියලා. එදා මෙතැන විවාදයේදී පොලීසිය භාර ඇමතිතුමා ඒක ප්‍රතික්ෂේප කළා, එහෙම එකක් නැහැයි කියලා. එතකොට අපිත් නැඟිටලා කිව්වා, එහෙම එකක් තිබෙනවා කියලා. මගේ ප්‍රදේශයේ සමහර පොලිස් ස්ථානවලින් පසුගිය කාලයේ එහෙම සහතිකයක් ගේන්න කිව්වා. ඉතින් මමත් ඒක කිව්වා. මම ඇමතිවරයාට පෞද්ගලිකව ඒ පොලිස් ස්ථානයේ නමත් ලියලා දුන්නා. එහෙම වෙලා තිබෙනවා කියලා. එතුමා ඇහුවා, මොකක්ද පොලිස් ස්ථානය කියලා. මම ඒ පොලිස් ස්ථානයේ නමත් එතුමාට ලියලා යැව්වා, මේ පොලීසියෙන් තමයි ගේන්න කියන්නේ කියලා. ඔබතුමන්ලා කියනවා, එහෙම එකක් නැහැ කියලා. හරි, එහෙම එකක් නැත්නම්, ඒ ප්‍රශ්නය විසඳුණා. එතකොට ඇයි මේ කර්තෘවරයාව ගේන්න යන්නේ, CID එකට? ඒකයි ප්‍රශ්නය. අද වනකොට සියලු මාධ්‍ය සංවිධාන ඒකට විරුද්ධ වෙලා තිබෙනවා, එතුමාව මේ විධියට CID එකට ගේන එක වැරදියි කියලා. එතකොට මේක වැරදියි කියලා ඒගොල්ලන් කියලා තිබෙනවා. අද වනකොට තමුන්නාන්සේලා කියනවා, "නැහැ, ඔහු ගේන්න ඕනෑ; මේ බොරු news දාන එකට මට්ටුවක් කරන්න ඕනෑ" කියලා. ඇමතිතුමාට අයිතියක් තිබෙනවා, බොරු news එකක් පළ වුණාම, ඒක නිවැරදි කරන්න. ඒ ප්‍රවෘත්තිය මාධ්‍ය නිවැරදි කරලා තිබෙනවා නම්, ඒක ප්‍රමාණවත්. එතකොට ඊට එහා ගිහිල්ලා, කර්තෘව CID ඒකට ගේනවා කියන්නේ, ඒ යන්නේ දේශපාලන වුවමනාවක් උඩ මාධ්‍ය නිදහසට වැට බැඳීමට. මාධ්‍ය නිදහසට වැට බැඳීම හා මාධ්‍ය භය කර ගන්න. ඒක වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මෙතැනදී ෂාෆි ගැනත් කථා වුණා. අපේ බිමල් රත්නායක ඇමතිතුමා කිව්වා හරියට හරි. බිමල් රත්නායක ඇමතිතුමා කිව්ව දේට සියයට සියයක් මම එකඟයි. ෂාෆිගේ ප්‍රශ්නය මාධ්‍ය විසින් ඇවිළුවා. ඉතින් මාධ්‍යට ඒ ප්‍රශ්නය අවුළුවන තැනට කවුද වැඩ කළේ? ඒ පිළිබඳව ශානියි, රවියි පරීක්ෂණයක් කළා නේ, 2019දී. පරීක්ෂණයක් කරලා ශානියි, රවියි කුරුණෑගල මහෙස්ත්‍රාත් උසාවියට වාර්තාවක් දුන්නා. මොකක්ද, ඒ වාර්තාවේ තිබෙන්නේ? ඒ වාර්තාවේ පැහැදිලිවම කියනවා, ඒ මාධ්‍යවේදියාට ෂාෆි ගැන ලියන්න කියලා දුන්නේ, දැන් දකුණු පළාත භාරව ඉන්න ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් කියලා. ඔබතුමන්ලා තවම ඔහු තියාගෙන ඉන්නවා. ඊළඟට, ඒ කුමන්ත්‍රණයේ ඉන්න අනික් කෙනා කවුද? එදා කුරුණෑගල හිටපු SP මහින්ද දිසානායක. ඔබතුමන්ලා පසුගිය දවස්වල DIG promotions දෙනකොට මහින්ද දිසානායකව DIG කළා. දැන් ඒක ගැන කථා කරන්නේ නැහැ නේ. දැන් ඒ මාධ්‍යයන්ට ඕනෑ විධියට මේ කුමන්ත්‍රණය කරපු දෙන්නාම තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් promotions ලැබුවා. ඒ, Dr. Shafiට වෙච්ච අසාධාරණයට මූලික වෙච්ච දෙන්නා. මහින්ද දිසානායකව DIG කළා, කිත්සිරි ජයලත් Senior DIG දකුණු පළාතේ. කිසි ප්‍රශ්නයක් නැහැ. අපේ බිමල් රත්නායක ඇමතිතුමා කියපු එක හරි. මාධ්‍ය මේක උස්සන් දිව්වා. නමුත් මාධ්‍යයට මේක උස්සන් දුවන්න මේ වැඩේ පත්තු කළේ කවුද? මේක පත්තු කරපු කෙනාට ඔයගොල්ලන් දඬුවම් කළේ නැහැ නේ. ඒ වැඩේ කරපු අය තවම නිදැල්ලේ නේ.

2024 නොවැම්බර් මාසයේ 07වැනි දා Police Headquartersවලට ෂාෆි පැමිණිල්ලක් දැම්මා, ඔහුට වුණු අසාධාරණය නිවැරදි කරන්න කියලා. ඒ පැමිණිල්ල තවම විභාග කළේ නැහැ. ඒ පැමිණිල්ලට අනුව ෂාෆිව ගෙනැල්ලා කටඋත්තරයක් අරගෙන තවම පරීක්ෂණ පැවැත්වූයේ නැහැ. අද වනකොට අවුරුද්දක් පහු වෙලා. ඒකයි අපි කියන්නේ. තමුන්නාන්සේලා මේ රටේ ජනතාවගේ නැඟිටීමත් එක්ක බලයට ආපු ආණ්ඩුවක්. ඒ තුළ ජනතා අපේක්ෂා විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි දන්නවා, පරණ දේශපාලන ක්‍රමය වෙනස් වන්න ඕනෑ බව. ජනතා මතය අනුව පරණ දේශපාලන ක්‍රමය හරහා අපට ඉදිරියට යන්න බැහැ. විශේෂයෙන්ම පාරදෘශ්‍යභාවය - විනිවිදභාවය - සම්බන්ධව, ආණ්ඩුකරණය සම්බන්ධව තමයි පසුගිය මැතිවරණ වේදිකාවලදී අපි දෙගොල්ලන්ම කථා කළේ. නමුත් ජනතාව අපව විශ්වාස කළේ නැහැ, තමුන්නාන්සේලා විශ්වාස කරලා බලයට ගෙනාවා. හැබැයි, තමුන්නාන්සේලා එදා බලය අරගන්න කියපු දේවල්ද දැන් මේ වෙන්නේ? ඒවාට පරස්පර දේවල් තමයි දැන් වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දින සභාවේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. -***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது. -*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. -*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩි කීයක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමාට තව විනාඩි 10ක් දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නැහැ, නැහැ, එච්චර ඕනෑ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 4කුත්, තත්පර 35ක කාලයක් ලැබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම ස්තුතියි.

මම කියමින් සිටියේ ඔබතුමන්ලාට මේ ජන මතය ලැබුණු ආකාරය ගැනයි. අපි දෙගොල්ලන්ම එකම දේවල් ගැන කථා කළා. නමුත් ජනතාව අපට වඩා තමුන්නාන්සේලාව විශ්වාස කළා. ඒ මත තමයි තමුන්නාන්සේලාට මේ බලය ආවේ. මතක තබා ගන්න, එදා ඒ ජනතා නැඟිටීමත් එක්ක, ඒ ආස්වාදයත් එක්ක, මේ රට සමාජමය, දේශපාලනමය පරිවර්තනයකට ලක් කරනවාය කියා ඇති කරගත් විශාල බලාපොරොත්තු එක්ක තමයි ජනතාව එසේ ඡන්දය දුන්නේ කියලා. නමුත් තමුන්නාන්සේලා දැන් ඒ ගමන යනවාද කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය.

මම කලින් සඳහන් කළා, "අරුණ" පත්තරයේ පළ වුණු පුවතක් සම්බන්ධව. ඔබතුමන්ලා බලයට ගෙනෙන්න වැඩියෙන්ම වැඩ කරපු, Facebook එකේ තවම ජනාධිපතිතුමාට සහයෝගය පළ කරලා ලියන කෙනෙක් තමයි, උවිඳු කුරුකුලසූරිය. උවිඳුගේ Facebook page එකේ පළකර තිබෙනවා, පොලීසිය භාර ඇමතිතුමා නිකුත් කළ ප්‍රශ්න සහගත චක්‍රලේඛය පිළිබඳව; ඒ ප්‍රශ්නය සම්බන්ධව. බලන්නකෝ, ඒකට තිබෙන comments ටික. ඒකේ comment කර තිබෙන අයගෙන් සියයට 90ක් විතර කියා තිබෙනවා, අපට මේ ප්‍රශ්නය ආවා කියලා; "අපි ගියාම අපේ ගම්වල පොලීසියෙනුත් කිව්වා, මේ සහතිකය අරගෙන එන්න කියලා" යනුවෙන්. මේවා උවිඳුගේ Facebook page එකේ පළ වන්නේ. උවිඳු කියන්නේ ආණ්ඩු විරෝධී කෙනෙක් නොවෙයි නේ. අපි කියන ඒවාට නම් කියන්න පුළුවන් නේ, අපි තමුන්නාන්සේලාට විරුද්ධ නිසා බොරු කියනවාය කියලා. උවිඳු බොරු කියන්නේ නැහැ නේ. උවිඳු කියන්නේ, තමුන්නාන්සේලාව බලයට ගේන්න සැහෙන වැඩ කරපු කෙනෙක්; තවම තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආරක්ෂා කරගෙන කථා කරන කෙනෙක්. ඔහුම දැන් ලියනවා, මේක වැරදි වැඩක් කියලා. ඒ නිසා මේවා පෙන්වා දෙනකොට, ඒ ගැන වෛරක්කාරී විධියට හිතන්න එපා. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. සමහර පොලිස් ස්ථානවලින් මේ සහතිකය ඉල්ලා තිබෙනවා. මා ජීවත් වන ප්‍රදේශයේ පොලීසියත් ඉල්ලා තිබෙනවා. මම ඇමතිතුමාට ඒ නමත් එක්ක දුන්නා, මා ජීවත් වන ප්‍රදේශයේ තිබෙන පොලිස් ස්ථානයෙනුත් මේ සහතිකය ඉල්ලා තිබෙනවා කියලා. සමහර විට මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට එන්න කලින් ඉඳලා වෙන දෙයක් වෙන්නත් පුළුවන්. ඒක එහෙම වෙන්න පුළුවන්. ඒක එහෙම නැහැයි කියලා මම කියන්නේ නැහැ. නමුත් කොහොම හරි මෑතක් වනතුරුම - ඔබතුමන්ලාගේ පොලීසිය භාර ඇමතිතුමා මේක පත්තරෙන් දැකලා ඒකට උත්තරය දෙනකම් - යම් යම් පොලිස් ස්ථානවල මේ සහතිකය ඉල්ලා තිබ්බා. දැන් ඒ දේවල්වලට ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබෙනවා. ඔහු ඒ ප්‍රවෘත්තිය පළ කර තිබෙන්නේ ග්‍රාම නිලධාරින්ගේ source එකක. එතකොට ඒක නිවැරදි කිරීමේ අයිතිය තිබෙනවා, ඇමතිතුමාට. ඒ සම්බන්ධ නිවැරදි කිරීමක් පත්තරේ පළ කර තිබෙනවා නම් මම හිතන්නේ නැහැ, තවදුරටත් ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම සුදුසුයි කියලා. ඒ තුළින් මේ ප්‍රශ්නය තවත් අවුලකට යනවා. ඒ වාගේම මාධ්‍ය නිදහස සම්බන්ධවත් විශාල ප්‍රශ්නයක් ඇති වනවා.

විශේෂයෙන්ම නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් විවාද කරන මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි, තවත් විශේෂ කාරණයක්. ගරු ඇමතිතුමනි, කොළඹ නගරයේ නඩත්තු කළ යුතු නිවාස විශාල ප්‍රමාණයක් තිබෙනවා.

නමුත්, ඒ නිවාස විශාල ප්‍රමාණයක් අද වෙනකොට ඉතාම ශීඝ්‍රයෙන් පරිහානියට යන ආකාරය අපට පෙනෙනවා. සමහර නිවාස සංකීර්ණවල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අණ පනත්වලට පරිබාහිරව වෙන වෙන නීති විරෝධී ව්‍යාපාර කරගෙන යන තත්ත්වයක් අපට දකින්නට ලැබෙනවා. ඒ නිසා ඇමතිතුමාට මම කියනවා, ඒ ගැන අවධානය යොමු කරලා එක්කෝ ඒ නිවාස නැවත ගන්න, නැත්නම් ඔවුන්ව ගෙන්වලා අවවාද කරන්න කියලා. මොකද, අනෙකුත් නිවාස හිමියන්ට, ඒ නිවාසවල වාසය කරන අයට ඒක විශාල කරදරයක් බවට

පත්වෙලා තිබෙනවා. සමහර තැන්වල ඔබතුමන්ලාගේ නියෝජිතයන් ඉන්නවා. ඔවුන්ට පැමිණිලි කළත්, ඔවුනුත් සමහර තැන්වලදී ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොකද, මම පෞද්ගලිකව කිහිප වතාවක් එම නිලධාරීන්ට කොළඹ නගරයේ තිබෙන, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ පාලනය වන නිවාස සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා නිවාස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

මට කාල වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතන විධියට අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියපු කාරණය දැන් දවස් හතරක් පහක් තිස්සේ විවාදයට ලක් වුණා. අපි ඒ ප්‍රශ්නය අවසන් කළා. අවසන් කළාට පස්සේ තමයි නැවතත් මේ clearance certificate එකක් පිළිබඳව සාකච්ඡා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා හරි වචනයක් පාවිච්චි කළා, "ඒ කාලයේත් වෙන්නට ඇති" කියලා. ඇත්තටම ඒ කාලයේ ඒක වුණා. අපේ කාලයේ ඒක වෙන්නේ නැහැ. ඒක තමයි වෙනස. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඒගොල්ලන් දන්නවා; ඒගොල්ලන්ගේ හෘදය සාක්ෂිය දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ ප්‍රශ්නය අපි බේරුවා නේ. දැන් දවස් තුනක් - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අවසාන වශයෙන් මම මේකත් කියන්න ඕනෑ. ඩී.වී. චානක මන්ත්‍රීතුමා ලේඛනයක් සභාගත කළා. එම ලේඛනය මොරටුමුල්ල පොලීසියේ - *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඉක්මනින් කියන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට තත්පර 30ක් දෙන්න.

මම අවස්ථාව ඉල්ලුවේ මෙන්න මේ කාරණය කියන්නයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා ඒක ඉවර වුණාය කියලා. ඒක ඉවර වුණේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. "අරුණ" පුවත්පතේ කර්තෘට CID එකට එන්න කියලා තිබෙන ලියුමත් එක්ක තමයි ඒ ප්‍රශ්නය ඉවර වුණේ නැත්තේ. නැත්නම් ඒ ප්‍රශ්නය ඉවරයි. ඔබතුමා කියන එක හරි. මම එකඟයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නමුත් ඔබතුමාට මම පැහැදිලිව කිව්වා, පොලීසිය භාර ඇමතිතුමාටත් කිව්වා, මගේ ප්‍රදේශයේ පොලිස් ස්ථානවලිනුත් තවම ඒ ලිපිය ඉල්ලනවා. ඒ නිසා තමයි මමත් ඒ ගැන කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂ නායකතුමාටත් අපි මඟින් මහට කිව්වා, එහෙම විශේෂ සහතිකයක් ගන්නේ නැහැ කියලා. දැන් මේ තිබෙන්නේ වෛරී දේශපාලනය හැරෙන්න

[ගරු බිමල් රත්නායක මහතා]

වෙන කිසි දෙයක් නොවෙයි. දැන් Dr. Shafiගේ ප්‍රශ්නයත් - ඒ ගිනි තියපු එකේ, කවුද දැන් වැරදි? මේගොල්ලන්ට අනුව ඒ වාර්තාව ලියපු පොලිස් නිලධාරියා. *[බාධා කිරීමක්]* ඒ කියන්නේ කොහොම හරි දුෂ්ට විධියට - *[බාධා කිරීමක්]* මම ඇත්තටම කනගාටු වෙනවා. අප්‍රසන්නයි. *[බාධා කිරීමක්]* මම ඒකයි ඇත්තටම එළියට ගියේ. *[බාධා කිරීමක්]* මේ වාගේ අප්‍රසන්න දේශපාලනඥයෝ - *[බාධා කිරීමක්]* මේ රට ගිනි තියපු, ශාෆිලාව හිරේ දමපු, ඒ මාධ්‍ය ගිනි තියපු අයගේ - *[බාධා කිරීමක්]* දැන් වැරදි කවුද? වැරදි ශාෆියි, පොලීසියේ කවුද - *[බාධා කිරීමක්]* මේ වාගේ වෛරී සහගත දේශපාලනයක් එක්ක ඉස්සරහට යන්නේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි?

බොහොම ස්තුතියි, ඔබතුමිය අවස්ථාව ලබා දුන්නාට.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මට තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදයකට යන්න අවශ්‍ය වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.03]

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශයේත්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව පැවැත්වෙන මේ විවාදයේදී විපක්ෂය මතු කළ කරුණු ගණනාවකට උත්තර දෙන්න වුවමනාව තිබෙනවා. මේ විවාදයේදී කම්කරු උසාවියේ විභාග වුණු, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නඩුවක් පිළිබඳව විපක්ෂය පැත්තෙන් මතු වුණා. මේ ප්‍රශ්නය වර්තමාන ආණ්ඩුව කාලයේ ඇති වෙච්ච ප්‍රශ්නයක් නොවෙයි. 2015-2019 ආණ්ඩුව කාලයේ රැකියා දුන්නා නේ, "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු" කියලා; ගස් යට රක්ෂා දුන්නා නේ. අන්න ඒ වෙලාවේ දීපු රක්ෂා ප්‍රමාණයක් තිබෙනවා, මේ අමාත්‍යාංශය ඇතුළේ. 2020-2021 ආණ්ඩුවෙන් ඒ අයව දොට්ට දැම්මා. රැකියාවෙන් දොට්ට දැම්මාම මේ අය නඩුවකට ගියා. රජයේ සේවයක් කරපු කෙනෙකුව එළියට දමන්න හොඳ නැහැ කියන එක අපි ආණ්ඩුවක් විධියට පිළිගන්නවා. හැබැයි, දැන් මේ සම්බන්ධයෙන් නඩුවක් තිබෙනවා. මේ නඩුවේ තීන්දු එකිනෙකට පරස්පරව ඇවිල්ලා තිබෙනවා. එම නිසා මේ නඩුව දැන් appeal කරලා තිබෙනවා. ඒ appeal එකෙන් පසුව එන තීන්දුවට අනුව තමයි අපට අද කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එම නිසා නඩුවක් තිබෙන කාරණාවක් සම්බන්ධයෙන් අපට වෙනත් තීන්දුවක් දෙන්න හෝ ඒ අයගේ රැකියා ස්ථිර කරන්න හෝ අපට හැකියාවක් නැහැ. නඩුව අවසානයේදී ලැබෙන තීන්දුව අනුව තමයි අපට කටයුතු කරන්න සිද්ධ වෙන්නේ.

ඒ වාගේම ගෙවල් 47,000ක් හදලා නැහැ; මේ ගෙවල් 47,000 හදන්න කියලා ඉල්ලීමක් කළා. එදා අය වැයෙන් වෙන් කරපු මුදලටත් වඩා වැඩියෙන් වියදම් කරලා ගෙවල්වල වැඩ ආරම්භ කරලා තිබෙනවා. පසුගිය කාලයේ ලක්ෂ හයක මුදලක් වෙන් කළාම, රුපියල් 25,000, 25,000 බැගින් දෙමින් ගෙවල් 367,000කට වැඩි ප්‍රමාණයක වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඒක සාමාන්‍යයෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. අවසානයේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ ණය දීපු මිනිස්සු 58,596ක්ම කියනවා, මේවා ආයේ අපට එපා කියලා. දැන් මේ නිවාස 47,000 ගණනක් ඉදිරිපත් කරපු එක සම්බන්ධයෙන් විවිධ සංඛ්‍යාලේඛන තිබෙනවා. එක තැනක තිබෙනවා, ඒක 45,117ක් කියලා. එක එක සංඛ්‍යාලේඛන තමයි මේක ඇතුළේ තිබෙන්නේ. ඒ කාලයේ වාර්තාවල සඳහන් වෙලා තිබෙන්නේ එහෙමයි. කොහොම නමුත්, රුපියල් 25,000ක්, රුපියල් 50,000ක් දීලා ගෙවල් හැදුවාට, මේ ගෙවල් 45,000 ඇතුළෙත් පදිංචි නැති ගෙවල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ මොහොත වන විටත් ඒ පදිංචි ගෙවල්වලට අපි ගිය අවුරුද්දේත් ලක්ෂ 2,000කට වඩා වියදම් කරලා ඒ ගෙවල් සම්පූර්ණ කරන්න කටයුතු කර තිබෙනවා. ඒ ගෙවල් හදලා සම්පූර්ණ කිරීම සඳහා මේ අය වැය ලේඛනයෙනුත් රුපියල් ලක්ෂ 6,830කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා. එහෙම ගෙවල් හදන්න ආරම්භ කරපු යුගයේ මේවා ගැන හිතන්නේ, පතන්නේ නැතිව ආරම්භ කරපු ක්‍රියාවලිය ඇතුළේ තමයි මෙවැනි දේවල් සිද්ධ වෙලා තිබෙන්නේ.

මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කියා සිටියා, කොළඹ නගරයේ රථ ගාල්වල මීට පෙර සිදුවූ අක්‍රමිකතා ඒ විධියටම තවමත් සිද්ධ වෙනවා කියලා. නමුත්, අපේ ආණ්ඩුව පත්වෙලා ගෙවී ගිය පසුගිය වසර ඇතුළේ අපි ඒ දේවල් වළක්වන්න කටයුතු කර තිබෙනවා. ඔය කියන එක රථගාලක් තමයි, ප්‍රදීපා මාවතේ තිබෙන රථගාල. එම රථගාල දැන් නිවාස සංවර්ධන අධිකාරියේ භාරයට අරගෙන තිබෙනවා. එම රථගාල සම්බන්ධයෙන් ඉදිරියේදී ටෙන්ඩර් කටයුතු කරලා එය දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, "C" රථගාලට අවසාන දැනුම්දීමත් සිදු කර තිබෙනවා. බදු පදනමට අදාළ ඒ කොන්දේසිවලට අනුව කටයුතු කරන්න, නැත්නම් ඒක පවරා ගන්න කටයුතු කරනවා කියලා අපි දැනුම් දීලා තිබෙනවා. අපි දැන් "A" හා "B" රථගාල් දෙක පවරා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. ඒක සම්බන්ධයෙන් නව ඇස්තමේන්තුවක් කරලා අපි ටෙන්ඩර් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟ කාරණාව තමයි, අඩු ආදායම්ලාභීන්ට සාදා දෙන නිවාස පිළිබඳ ප්‍රශ්නය. මරික්කාර් මන්ත්‍රීතුමාගේ කථාවේදී අවධාරණය කළා, රුපියල් ලක්ෂ 10කින් නිවසක් හදලා දෙන්නේ කොහොමද කියලා. රුපියල් ලක්ෂ 10කින් නිවසක් හදන්න බැහැ කියලා එතුමා කියා සිටියා. අපේ අමාත්‍යාංශයේ අරමුණ තමයි, ජන සහභාගිත්වය ඇතිව සංවර්ධනයේ මූලධර්ම මත පදනම්ව නිවාස හදන එක. ඒ ආකාරයට නිවාස හදන්න තමයි වර්තමාන ආණ්ඩුව කටයුතු කළේ. "සැමට නිවසක්" කියන ඒ පාඨය ඇතුළේ තමයි අපි මේ ගෙවල් හදන්නේ. 2015දීත් "සැමට නිවසක්" කියලා වැඩසටහනක් ආවා. ඊට පස්සේ 2016දීත් එහෙමයි. හැබැයි, මේවා කවදාවත් අවසන් වෙන්නේ නැහැ. ඒ නිසා වර්තමානයේ අපි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දිළිඳු හා අඩු ආදායම්ලාභී නිවාසවල පාඨයත් වෙනස් කළා, "තමන්ගේම තැනක්-ලස්සන ජීවිතයක්" කියලා. "තමන්ගේම තැනක්-ලස්සන ජීවිතයක්" කියන ඒ පාඨය ඇතුළේ හදන ගෙවල් ජන සහභාගිත්වය ඇතිව සංවර්ධන මූලධර්ම ඇතුළේ තමයි හදන්නේ. රුපියල් ලක්ෂ 10කින් සම්පූර්ණ ගෙයක් හදන්න බැහැ තමයි. හැබැයි, අපි රුපියල් ලක්ෂ 10ක් දුන්නාම, ඒ ගෙදර අයිති කෙනාටත් පුළුවන් මේකට රුපියල් ලක්ෂයක්, දෙකක් වියදම් කරන්න. ඒ විතරක් නොවෙයි. මේ සඳහා උදව් උපකාර කරන්න කැමැති හැමෝම මේවාට උදව්

උපකාර කරනවා. පසුගිය වසර තුළ ගෙවල් 3,800කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා මේ ආකාරයට "තමන්ගේම තැනක්-ලස්සන ජීවිතයක්" වැඩසටහන යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විධියට ප්‍රදානයන් හරහා අපි හදලා තිබෙනවා. ඒ සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා සිවිල් ආරක්ෂක බලකාය, ව්‍යාපාරිකයින්, අපේ ජාතික ජන බලවේගයේ ඒ ගම්මානවල තිබෙන කමිටුවලින් උදවු කරලා තිබෙනවා. අපි ජන සහභාගිත්වය කියන චින්තනය තුළින් තමයි ඒ ගෙවල්වල වැඩ කටයුතු සම්පූර්ණ කරලා තිබෙන්නේ. එම නිසා විපක්ෂයෙන් නඟන තර්කයට මට දෙන්න තිබෙන උත්තරය තමයි, අපි ඒ නිවාස හදන්නේ ජනතාවගේ උදවු උපකාර ඇතුළේ කියන එක. මීට කලින් කළේ, රුපියල් ලක්ෂ හයකට කොන්ත්‍රාත් එක දීලා, කොන්ත්‍රාත්කාරයෝ පොහොසත් කරන එක. ඒ කියන්නේ, කොන්ත්‍රාත්කාරයෝ පොහොසත් කිරීමේ න්‍යාය ඇතුළේ තමයි වෙනදා නිවාස හැදුවේ. දැන් නිවාස හදන්නේ එහෙම නෙවෙයි. එම නිසා දැන් රුපියල් ලක්ෂ 10කින් නිවසක් හදන්න පුළුවන්.

ඊළඟට, කොළඹ නගරය ආසන්නයේ තිබෙන ස්ටේඩියම්ගම, ඇපල් වත්ත, කොළඹගේ මාවත හා අරුණෝදය මාවත කියන ප්‍රදේශවල නිවාස 3,000ක් හදන්න තමයි අපි මෙවර අය වැයෙන් රුපියල් බිලියන 15ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, රුපියල් මිලියන 15,000ක් වෙන් කරලා තිබෙනවා, නිවාස 3,000ක් හදන්න. හැබැයි, නිවාස 50,000ක අවශ්‍යතාව තිබෙනවා. ඒවා ඉදිරි අවුරුදු 4 ඇතුළත හදන්න තමයි අපි කටයුතු කරන්නේ. ඒ වගේම දිවයින පුරාම වෙසෙන වතු ජනතාවට නව නිවාස 2,500ක් හදන්න මෙවර අය වැයෙන් රුපියල් බිලියන 5.6ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ගැටුම්වලින් පීඩාවට පත් වුණු පවුල් නැවත පදිංචි කිරීම සඳහා උතුරු, නැඟෙනහිර පළාත්වල නිවාස 2,445ක් හදන්න රුපියල් බිලියන 3.8ක් - මිලියන 3,800කට ආසන්න මුදලක් - වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පසුගිය කාලවල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් භාගෙට ඉදිකරන ලද නිවාස හදන්නත් අපි මෙවර අය වැයෙන් රුපියල් ලක්ෂ 6,800ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම නාය යෑම් සහිත ප්‍රදේශවල නිවාස හදන්න රුපියල් බිලියනයක් වෙන් කර තිබෙනවා. මේ ඔක්කෝම ගත්තාම, අපේ අමාත්‍යාංශයත්, නාගරික සංවර්ධන අධිකාරියත් නිවාස 27,000කට වඩා හදන්න මුදල් වෙන් කරලා තිබෙනවා. අපි ලබන අවුරුද්දේ මධ්‍යම පාන්තිකයන්ට සුදුසු පරිදි පෞද්ගලික සහ රජයේ හවුල්කාරිත්වය සහිතව - PPP යටතේ - නිවාස හදන්න බලාපොරොත්තු වනවා. ඒ අනුව මෙවර අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා, නිවාස හදන්න. නිවාස 27,000කට වඩා හදන්න මුදල් වෙන් කරලා තිබෙනවා. එම නිසා විපක්ෂය පැත්තෙන් මතු කරපු බොහෝ කරුණු තර්කානුකූල නැහැ කියලා මම කියනවා.

අද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් සියයට 80කට වඩා මේ අය වැයට ස්තුති කළා. ඒ අයට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මෙම අය වැය සාර්ථක කරගන්න සහයෝගය දීපු ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා ඇතුළු සියලු නිලධාරීන්ට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෙනින් සහෝදරයාගේ පාඨයකින් මගේ කථාව අවසන් කරන්න කැමැතියි.

"සුපුරුදු ධනපති සම්බන්ධකම් පිළිබඳ පැරණි රජදහන තුළ සිට කටයුතු කිරීම සරලය, පහසුය. නමුත් අලුත් මාවතක යාමට අපට වුවමනා වී තිබේ. එම මාර්ගයේ යාම සඳහා අප සියලු ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥානයක් හා සංවිධානයක් අවශ්‍යය. ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන අතර, එහිදී වඩාත් බරපතළ අඩුපාඩුකම්, වැරදි සිදුවීමට හැක. නමුත්, වැරදි නොකරන්නේ ප්‍රායෝගික වශයෙන් යමක් කිරීමට ප්‍රයත්න නොදරන අය පමණක් බව අපි දනිමු."

වර්තමාන ආණ්ඩුව වැඩ කරනකොට යම් අඩුපාඩු සිදු වෙන්න පුළුවන්, වැරදි වෙන්න පුළුවන්. හැබැයි, අපි වැඩක් කරන්න පටන් අරන් තිබෙනවා. එම නිසා තමයි ඒ හැම දෙයක්ම සිදු වන්නේ. 2026 අය වැය තුළින් අපේ අමාත්‍යාංශයට වෙන් කළ මුදල්වලින් ඉටු කරන්න යෝජිත සියලු කාර්යයන් සියයට සියයක් ඉටු කර අවසන් කරන්න අපි කටයුතු කරනවා වාගේම, පසුගිය අය වැයෙන් වෙන් කළ මුදල්වලින් සියයට 90කවත් වැඩ අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි.

## ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
## போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு
## MINISTRY OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION

| | | |
|---|---|---|
| පුනරාවර්තන | රු. | 56,000,000,000 |
| මූලධන | රු. | 390,000,000,000 |

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"18 වන පිටුවේ, 18, 19 හා 20 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතම ආදේශ කළ යුතුය:

'ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| පුනරාවර්තන | රු. | 58,515,000,000 |
| මූලධන | රු. | 438,744,000,000 ' " |

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 58,515,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 438,744,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 58,515,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 438,744,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 58,515,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 438,744,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 117 වන ශීර්ෂය.- ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,044,000,000; මූලධන වියදම, රු. 47,000,000

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 17,250,000,000; මූලධන වියදම, රු. 352,428,000,000

### தலைப்பு 117.- போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு , ரூபாய் 1,044,000,000; மூலதனச் செலவு, ரூபாய் 47,000,000

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 17,250,000,000; மூலதனச் செலவு, ரூபாய் 352,428,000,000

### HEAD 117.- MINISTER OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,044,000,000; Capital Expenditure, Rs. 47,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 17,250,000,000; Capital Expenditure, Rs. 352,428,000,000

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 117 වන වැය ශීර්ෂය සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

*මතු පළ වන යෝජනාව සභා සම්මත විය:*
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"19 වන පිටුවේ, 1, 2 හා 3 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

ශීර්ෂ 117 ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යවරයා

| | | |
|---|---|---|
| වැඩසටහන 01 | | |
| මෙහෙයුම් වැඩසටහන | රු. 1,314,000,000 | රු. 63,000,000 |
| වැඩසටහන 02 | | |
| සංවර්ධන වැඩසටහන | රු. 19,480,000,000 | රු.401,203,000,000"' |

[ගරු බිමල් රත්නායක මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව අමාත්‍යාංශයේ නම වෙනස් කිරීම,

2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 117 - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා යටතේ වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 325,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 3,431,000,000ක් වැය ශීර්ෂ අංක 176 - වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වෙත මාරු කිරීම,

2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා යටතේ වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 825,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 34,222,000,000ක් වැය ශීර්ෂ අංක 117 - ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යවරයා වෙත මාරු කිරීම, සහ

අය වැය යෝජනා අංක 39, 40, 41, 49 හා 51 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 117 - ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යවරයා සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන රු. 2,000,000,000කින් සහ මූලධන ප්‍රතිපාදන රු. 18,000,000,000කින් වැඩි කිරීමයි.)

"117 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,314,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

117 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"117 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 63,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

117 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"117 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 19,480,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

117 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"117 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 401,203,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

117 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 1,314,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 63,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 19,480,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 401,203,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 117, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 1,314,000,000, for Head 117, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 117, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 63,000,000, for Head 117, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 117, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 19,480,000,000, for Head 117, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 117, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 401,203,000,000 for Head 117, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 117, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 306 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 34,612,000,000

"306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 34,612,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 35,538,000,000

"306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 35,538,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 307 වන ශීර්ෂය.- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,891,000,000

"307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,891,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,915,000,000

"307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,915,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### தலைப்பு 306.- இலங்கை புகையிரதத் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 34,612,000,000

“தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 34,612,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 35,538,000,000

“தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 35,538,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

### தலைப்பு 307.- மோட்டார் வாகனப் போக்குவரத்துத் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,891,000,000

“தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,891,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 1,915,000,000

"தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 1,915,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 306. - DEPARTMENT OF SRI LANKA RAILWAYS

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 34,612,000,000

Question, "That the sum of Rs. 34,612,000,000, for Head 306, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 306, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 35,538,000,000

Question, "That the sum of Rs. 35,538,000,000 for Head 306, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 306, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 307.- DEPARTMENT OF MOTOR TRAFFIC

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 2,891,000,000

Question, "That the sum of Rs. 2,891,000,000, for Head 307, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 307, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,915,000,000

Question, "That the sum of Rs. 1,915,000,000 for Head 307, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 307, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 336 වන ශීර්ෂය.- වෙළඳ නාවික ලේකම් කාර්යාලය
### தலைப்பு 336.- வணிகக் கப்பற்றுறைச் செயலகம்
HEAD 336. - MERCHANT SHIPPING SECRETARIAT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 336 වන වැය ශීර්ෂය සඳහා මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 8 සහ 9 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'ශීර්ෂ 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

වැඩසටහන 01

| | | |
|---|---|---|
| මෙහෙයුම් වැඩසටහන | රු. 218,000,000 | රු. 25,000,000' " |

[ගරු බිමල් රත්නායක මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය යටතේ වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 203,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 72,000,000ක් වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත මාරු කිරීම සහ 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 218,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 25,000,000ක් ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතට ඇතුළත් කිරීමයි)

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
## நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு
MINISTRY OF URBAN DEVELOPMENT, CONSTRUCTION AND HOUSING

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 3,500,000,000 |
| මූලධන | රු. 100,000,000,000 |

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"21 වන පිටුවේ, 4,5 හා 6 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 2,457,000,000 |
| මූලධන | රු. 69,903,000,000' " |

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 2,457,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 69,903,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 2,457,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 69,903,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 2,457,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 69,903,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 123 වන ශීර්ෂය.- නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,310,000,000; මූලධන වියදම, රු. 97,000,000

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 380,000,000; මූලධන වියදම, රු. 96,619,000,000

### தலைப்பு 123.- நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,310,000,000; மூலதனச் செலவு, ரூபாய் 97,000,000

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 380,000,000; மூலதனச் செலவு, ரூபாய் 96,619,000,000

HEAD 123.- MINISTER OF URBAN DEVELOPMENT, CONSTRUCTION AND HOUSING

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,310,000,000; Capital Expenditure, Rs. 97,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 380,000,000; Capital Expenditure, Rs. 96,619,000,000

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 123 වන වැය ශීර්ෂය සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"21 වන පිටුවේ, 8, 9 හා 10 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

'ශීර්ෂ 123 නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යවරයා

වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන රු. 715,000,000 රු. 70,000,000

වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 150,000,000 රු. 66,574,000,000' "

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව අමාත්‍යාංශයේ නම වෙනස් කිරීම,

2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා යටතේ නාගරික සංවර්ධන විෂයට අදාළව වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 825,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 34,222,000,000ක් ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත මාරු කිරීම, සහ

අය වැය යෝජනා අංක 32 හා 33 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 123 - නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යවරයා සඳහා රු. 4,150,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 715,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 70,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 150,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 66,574,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“ தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 715,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“ தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 70,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 150,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 66,574,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 715,000,000, for Head 123, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 123, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 70,000,000, for Head 123, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 123, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 150,000,000, for Head 123, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 123, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 66,574,000,000 for Head 123, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 123, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 309 වන ශීර්ෂය.- ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 201,000,000

"309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 201,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 12,000,000

"309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 12,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 524,000,000

"309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 524,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 61,000,000

"309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 61,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 310 වන ශීර්ෂය.- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 227,000,000

"310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 227,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 186,000,000

"310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 186,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 309.- கட்டடத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 201,000,000

“தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 201,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 12,000,000

“தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 12,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 524,000,000

“தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 524,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 61,000,000

"தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 61,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 310.- அரசாங்கத் தொழிற்சாலை திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 227,000,000

"தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 227,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 186,000,000

"தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 186,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 309.- DEPARTMENT OF BUILDINGS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 201,000,000

Question, "That the sum of Rs. 201,000,000, for Head 309, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 12,000,000

Question, "That the sum of Rs. 12,000,000, for Head 309, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 524,000,000

Question, "That the sum of Rs. 524,000,000, for Head 309, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 61,000,000

Question, "That the sum of Rs. 61,000,000, for Head 309, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 310.- DEPARTMENT OF GOVERNMENT FACTORIES

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 227,000,000

Question, "That the sum of Rs. 227,000,000, for Head 310, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 310, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 186,000,000

Question, "That the sum of Rs. 186,000,000, for Head 310, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 310, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**311 වන ශීර්ෂය.- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**
**தலைப்பு 311.- தேசிய பௌதிகத் திட்டமிடல் திணைக்களம்**
HEAD 311.- DEPARTMENT OF NATIONAL PHYSICAL PLANNING

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 311 වන වැය ශීර්ෂයේ 01 වන වැඩසටහන සඳහා මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"21 වන පිටුවේ, 16, 17 පේළි ඉවත් කරන්න."

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ, 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 218,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 25,000,000ක් ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත මාරු කිරීමයි.)

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**332 වන ශීර්ෂය.- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 640,000,000

"332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 640,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 3,000,000,000

"332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,000,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 332.- தேசிய சமுதாய நீர் வழங்கல் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 640,000,000

"தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 640,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 3,000,000,000

"தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 3,000,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01 மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 332.- DEPARTMENT OF NATIONAL COMMUNITY WATER SUPPLY

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 640,000,000

Question, "That the sum of Rs. 640,000,000, for Head 332, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 332, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 3,000,000,000

Question, "That the sum of Rs. 3,000,000,000, for Head 332, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 332, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"30 වන පිටුවේ, 14 පේළියට ඉනික්බිතිව නව "වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය" ස්ථාපිත කිරීම පිණිස පහත අයිතම ඇතුළත් කළ යුතුය.

'වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 617,000,000 |
| මූලධන | රු. 3,511,000,000 |

ශීර්ෂ 176 - වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා

වැඩසටහන 01

| | | |
|---|---|---|
| මෙහෙයුම් වැඩසටහන | රු. 414,000,000 | රු. 19,000,000 |

වැඩසටහන 02

| | | |
|---|---|---|
| සංවර්ධන වැඩසටහන | - | රු. 3,420,000,000 |

ශීර්ෂ 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය

වැඩසටහන 02

| | | |
|---|---|---|
| සංවර්ධන වැඩසටහන | රු. 203,000,000 | රු. 72,000,000' " |

[ගරු අනුර කරුණාතිලක මහතා ]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ, 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා සඳහා ශීර්ෂ අංක 176, නව වැය ශීර්ෂය ඇති කිරීම හා වැය ශීර්ෂ අංක 117 - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා යටතේ වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 325,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 3,431,000,000ක් ඉන් ඉවත් කර වැය ශීර්ෂ අංක 176 - වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වෙත මාරු කිරීම,

2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදනයෙන් පුනරාවර්තන ප්‍රතිපාදන රු. 89,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 8,000,000ක් ඉන් ඉවත් කර වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත මාරු කිරීම,

2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව අලුතින් ඇති කරන ලද වැය ශීර්ෂ අංක 176 - වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා සඳහා වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන යටතේ පුනරාවර්තන ප්‍රතිපාදන රු. 414,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 19,000,000ක් හා වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන යටතේ මූලධන ප්‍රතිපාදන රු. 3,420,000,000ක් වෙන් කිරීම, සහ

2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව, වැය ශීර්ෂ අංක 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය යටතේ වන පුනරාවර්තන ප්‍රතිපාදන රු. 203,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 72,000,000ක් වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතට ඇතුළත් කිරීමයි.)

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අ.භා. 6.28ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මූලාසනයෙන් ඉවත් විය.*

*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 25වන අඟහරුවාදා.*

*பி.ப.6.28 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத் தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 நவம்பர் 25, செவ்வாய்க்கிழமை.*

*At 6.28 p.m., the Hon. Presiding Member left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Tuesday, 25th November, 2025.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශීර්ෂ අංක 117, 123, 176, 311 සහ 336 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 306, 307, 309, 310 සහ 332 සංශෝධන රහිතව ද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

## සිවිල් ගුවන් සේවා පනත: නියෝග
## குடியியல் வான்செலவுச் சட்டம்: ஒழுங்குவிதிகள்
## CIVIL AVIATION ACT: REGULATIONS

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 8 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2) වගන්තියේ (ඩ) සහ (ණ) ඡේද යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත: නියෝග
## இலங்கை சிவில் விமானப் போக்குவரத்து அதிகாரசபைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## CIVIL AVIATION AUTHORITY ACT: REGULATIONS

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 වගන්තියේ (ජ) සහ (ණ) ඡේද සහ 9 වගන්තිය සමඟ කියවිය යුතු 39 වගන්තිය යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

## වෙරුගල් ප්‍රා.ලේ. කොට්ඨාසයේ ඉඩම් ගැටලු
## வெருகல் பிரதேச செயலாளர் பிரிவிலுள்ள காணிப் பிரச்சினைகள்
## LAND ISSUES IN VERUGAL DS DIVISION

[பி.ப. 6.29]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை மாவட்டம் 11 பிரதேச செயலகப் பிரிவுகளாகப் பிரிக்கப்பட்டுள்ளது. இதில் வெருகல் பிரதேச செயலாளர் பிரிவும் ஒன்றாகும். இப்பிரதேச செயலாளர் பிரிவில் வாழும் பொதுமக்கள் எதிர்கொள்ளும் சிக்கல்கள் தொடர்பில் ஒத்திவைப்புவேளைப் பிரேரணையொன்றை முன்வைத்து எனது கருத்துகளை எடுத்துரைக்க விரும்பு கின்றேன்.

திருகோணமலை மாவட்டத்திலுள்ள வெருகல் பிரதேச செயலாளர் பிரிவில் 4,809 குடும்பங்களைச் சேர்ந்த 16,156 பேர் வாழ்கின்றார்கள். இப்பிரதேச செயலாளர் பிரிவானது 10 கிராம அலுவலர் பிரிவாகப் பிரிக்கப்பட்டுள்ளது.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

வனவிலங்குத் துறையானது அதில் 7 கிராம சேவையாளர் பிரிவுகளை முழுமையாகவும், 3 கிராம சேவையாளர் பிரிவுகளைப் பகுதியாகவும் உரிமை கோருகின்றது. அதாவது, வெருகல் பிரதேச செயலாளர் பிரிவின் மொத்த நிலப்பரப்பில் 78.78 சதவீதமான நிலப்பரப்பை வனவிலங்குத் துறையும் 37.16 சதவீதமான நிலப்பரப்பை வனத் துறையும் உரிமை கோருகின்றன. இவை இரண்டையும் கூட்டிப் பார்க்கும் பொழுது 100 சதவீதத்துக்குப் பதிலாக 115.94 சதவீதம் வருகின்றது. இதனைப் பார்க்கும்பொழுது இவர்கள் வெருகல் பிரதேச மக்களின் காணிகளைப் பிடிப்பத்தில் மனம்போன போக்கில் செயற்படுவது புலனாகின்றது.

வெருகல் பிரதேச செயலாளர் பிரிவின் மொத்த நிலப்பரப்பு 32,042 ஏக்கராகும். இதில் 25,242 ஏக்கரை வனவிலங்குத் துறையும் 11,906 ஏக்கரை வனத்துறையும் உரிமை கோருகின்றன. இந்தப் பிரதேச செயலாளர் பிரிவின் பரப்பைவிட இது 5,106 ஏக்கர் அதிகமானதாகும். 32,042 ஏக்கர் நிலப்பரப்புள்ள இடத்தில், இவ்வாறு வனத்துறையும் வனவிலங்குத் துறையும் 37,148 ஏக்கர் நிலத்தை உரிமைகோர முடியுமென மக்கள் கேலியாகப் பேசுவதோடு, மேற்படி வனவிலங்குத் துறை அதிகாரிகளுக்குக் கணிதத்தில் நோபல் பரிசு வழங்கப் பரிந்துரைக்குமாறும் கூறுகின்றார்கள். இத்துறைகள் உரிமைகோரும் இடங்களுக்கு நில அளவைப் படம் எதுவுமில்லை. மக்கள் மற்றும் அரசாங்க அதிகாரிகள் எந்த இடத்தில் எந்த வேலையைச் செய்ய முனைந்தாலும், அந்த இடம் தமக்குரியதென வனத்துறை அதிகாரிகள் சொல்லித் தடுக்கின்றார்கள். எனினும், நிலஅளவைத் திணைக்களத்தின் வரைபடத்தில் வனவிலங்குத் துறைக்குரிய காணியென எந்த இடமும் அடையாளப்படுத்தப்படவில்லை.

பொதுமக்களின் காணிகளை வனத் துறையும் வனவிலங்குத் துறையும் தமது காணிகளென வர்த்தமானி அறிவித்தல் செய்யுமுன் எந்தவிதமான அறிவித்தலோ கள ஆய்வுப் பயணமோ மேற்கொள்ளப்படவில்லை என்பதோடு, காணிகளைக் கையகப்படுத்தும் சட்ட நடைமுறைகள் எதுவும் பின்பற்றப்படவுமில்லை. ஆனால், பொதுத் தேவைகள் கருதி காணிகளை விடுவிக்க பிரதேச செயலாளர் கோரிக்கை வைக்கும்பொழுது, "சட்ட அடிப்படையில் விடுவிக்க முடியாது" என்று கூறுகின்றார்கள். இது எந்த வகை நீதி?

வனவிலங்குத் துறையினால் வர்த்தமானி அறிவித்தல் செய்யப்பட்ட காலப்பகுதிக்கு முன்பிருந்தே வெருகல் பிரதேச செயலாளர் பிரிவில் பொதுமக்கள் வாழ்ந்து வருகின்றமை குறிப்பிடத்தக்கது. வனவிலங்குத் துறையும் வனத் துறையும் உரிமைகோரும் பகுதியில் வாழும் 4,778 குடும்பங்கள் நில ஆவணங்களை வைத்திருக்கின்றனர். அந்தப் பகுதியில் 18 பாடசாலைகள் அமைந்துள்ளன; இவற்றில் 3,300 மாணவர்கள் கல்வி கற்கின்றனர். 102 சமய வழிபாட்டு இடங்களும் அமைந்துள்ளன. இவற்றுள் இந்து, பௌத்தம் மற்றும் கிறிஸ்தவ வழிபாட்டு இடங்கள் அடங்கும்.

வனவிலங்குத் துறை உரிமைகோரும் பகுதியில் பிரதேச செயலகம், 10 கிராம அலுவலர் அலுவலகங்கள், மருத்துவமனை, அஞ்சல் அலுவலகங்கள், நீர் வழங்கல் சபை, வங்கிகள், கால்நடை சுகாதாரத் திணைக்களம், கமநல சேவை நிலையம், காவற்றுறைப் பணிமனை முதலிய அரச நிறுவனங்கள் அமைந்துள்ளன. அந்தப் பகுதியில் மக்கள் மரபு வழியாக மேய்ச்சல் தரையாக பயன்படுத்திவரும் ஆவணமுள்ள, ஆவணமற்ற நிலங்களும் காணப்படுகின்றன. வெருகல் மக்கள் நெற்செய்கை மேற்கொள்ளப் பயன்படுத்தும் 18 குளங்களும் அங்கு அமைந்துள்ளன.

வனவிலங்குத் துறை உரிமை கோரும் பகுதியில் இன்று மக்கள் எந்த அபிவிருத்தி வேலையையும் செய்ய முடியாதுள்ளது. மக்கள் மட்டுமன்றி பிரதேச செயலாளர், பிரதேச சபைத் தலைவர், அரச திணைக்களத் தலைவர்கள் முதலியோரும் அபிவிருத்தி வேலைகளைச் செய்ய முடியாது வனவிலங்குத் துறை தடைபோடுகின்றது. வெருகலில் உள்ள அரச பணிமனைகள், மக்கள் உள்ளிட்ட அனைவரும் தத்தம் இடங்களில் எந்தச் செயற்பாட்டை மேற்கொள்வதாயினும் வனவிலங்குத் துறையிடம் ஒப்புதல் பெற வேண்டியுள்ளது. இந்த ஒப்புதலைப் பெறுவது எளிதான விடயமல்ல. இது மிகவும் சிக்கலான செயற்பாடாக உள்ளது. இதனால் மக்கள் உரிய காலத்தில் தாம் விரும்பும் பொருளாதார நடவடிக்கைகளை மேற்கொள்ள முடியாமல் நட்டத்தை எதிர்கொள்கின்றனர்.

மேலும், அபிவிருத்தி நோக்கம் கருதி நீண்ட காலக் குத்தகைக்கு காணிகளைக் கோரும் விண்ணப்பங்கள், அரச திணைக்களங்களால் விடுக்கப்படும் காணிக் கோரிக்கைகள் சார்ந்த விண்ணப்பங்கள், சுடுகாடு மற்றும் இடுகாடுகள், சிறுவர் பூங்காக்கள், பொது விளையாட்டரங்குகள் முதலியன சார்ந்த காணிக் கோரிக்கை எவற்றுக்கும் காணி வழங்கும் நடவடிக்கை எதனையும் பிரதேச செயலாளரால் முன்னெடுக்க முடியாத சூழல் காணப்படுகின்றது.

அங்குள்ள பூநகர் கிராம அலுவலர் பிரிவில் அடங்கும் கல்லரிப்பு கிராமத்தினூடாகப் பாய்ந்து கடலில் விரயமாகக் கலக்கும் மகாவலி நீரைப் பயன்படுத்தி அண்ணளவாக 2,000 ஏக்கரில் இருபோக நெற்செய்கையையும் மேற்கொள்ள முடியும். இதன்பொருட்டாக ஒரு மீற்றர் அகலமானதும் ஒன்றரை மீற்றர் ஆழமானதும் இரண்டு கிலோமீற்றர் நீளமானதுமான வெட்டு வாய்க்காலை மறுசீரமைக்க 2024ஆம் ஆண்டு 10 மில்லியன் ரூபாய் அரச நிதி ஒதுக்கீடு செய்யப் பட்டது. இந்த வாய்க்காலை மறுசீரமைக்க வனவிலங்குத் துறை ஒப்புதல் வழங்க மறுக்கின்றது. ஏற்கனவே இந்த வாய்க்கால் அரைக் கிலோமீற்றர் நீளம் வரை மறுசீரமைக் கப்பட்ட நிலையில், இடைநிறுத்தப்பட்டுள்ளமை குறிப்பிடத் தக்கது.

வெருகலில் உள்ள அரச அதிகாரிகள், மக்கள் உள்ளிட்ட அனைவரும் தத்தம் இடங்களில் எந்தச் செயற்பாட்டை மேற்கொள்வதாயினும், ஒப்புதலளிக்க மறுக்கும் வனவிலங்குத் துறையினர், தாம் விரும்பியவாறு காடுகளை அழித்து ஆறு மீற்றர் அகலமானதும் ஏழு கிலோமீற்றர் நீளமானதுமான வீதியை அமைக்கின்றனர். இதனை எந்த வகை வாதம் என்று சொல்வது?

வனவிலங்குத் துறையானது, கால்நடை வளர்ப்பாளர்கள் மரபு வழியாகப் பயன்படுத்தி வந்த அங்கோடை, மாவிலாறு பகுதியிலுள்ள மேய்ச்சல் தரைகளைப் பிடித்து வைத்துக்கொண்டு, இந்த இடத்தில் காட்டு விலங்குகள் மட்டும் மேயலாம், வீட்டு விலங்குகள் மேய முடியாது எனத் தடுத்து வருகின்றது. 2008ஆம் ஆண்டில் 600 கால்நடை வளர்ப்பாளர்களும், 28,000 கால்நடைகளும் வெருகல் கோட்டத்தில் காணப்பட்டன. இவற்றில் சில ஆயிரம் கால்நடைகள் போதிய உணவின்றி நோயினால் பாதிக்கப் பட்டு இறந்து போயுள்ள சூழலில், இப்பொழுது 15,200 கால்நடைகள் மட்டுமே அங்கு எஞ்சியுள்ளன. கால்நடைகளின் இழப்புக்கும் கால்நடை வளர்ப்பாளர்களின் பொருளாதார இழப்புக்கும் பொறுப்புக் கூறுவது யார்? கால்நடைகளின் எண்ணிக்கை மேலும் குறையாமல் பாதுகாப்பது எப்படி?

வனத் துறையும் வனவிலங்குத் துறையும் உரிமை கொண்டாடும் பகுதியில் வெருகல் பிரதேச செயலாளர் பிரிவின் எல்லைகள் அமைந்துள்ளன. இந்த எல்லைகளைத் தெளிவாக அடையாளப்படுத்த வனவிலங்குத் துறை சிக்கல் கொடுப்பதால், மூதூர் மற்றும் சேருவில பிரதேச செயலகப் பிரிவோடு பிணக்குகள் தோன்றுகின்றன.

வெருகல் பிரதேச மக்கள் எதிர்கொள்ளும் மேற்படி சிக்கல்கள் பற்றி சுற்றாடல் துறை அமைச்சர் அறிவாரா? அறிந்திருந்தால், இதற்கு அமைச்சர் என்ன தீர்வை வழங்கப் போகின்றார்? வெருகல் பிரதேசத்தில் வனவிலங்குத் துறை உரிமை கோரும் வர்த்தமானி அறிவித்தலை அவர் மீளப் பெறுவாரா என்பதை இந்த அவைக்குக் கூறுவாரா?

நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[பி.ப. 6.36]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ குகதாசன் ஐயா அவர்களால் கொண்டுவரப் பட்டிருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணையின் முன்மொழிவுகளை வழிமொழிந்தவனாக நான் சில கருத்துகளைக் கூற விரும்புகிறேன்.

திருகோணமலை மாவட்டத்தின் வெருகல் பிரதேசத்திலே காணப்படுகின்ற இந்தக் காணி கையகப்படுத்தப்படுகின்ற விடயம் அந்தப் பிரதேசத்தை மிகவும் பாதிக்கின்ற ஒரு பிரச்சினையாக இருக்கின்றது. குறிப்பாக நாங்கள் சொல்லப்போனால், 32,042 ஏக்கர் நிலப்பரப்பைக் கொண்ட அந்த வெருகல் பிரதேசத்திலே காணப்படுகின்ற 25,242 ஏக்கர் நிலத்தை வன விலங்குத்துறை உரிமைகோருகின்ற அதேவேளை, அதிலே மீதமாகக் காணப்படுகின்ற 6,800 ஏக்கரைக்கூட சம்பந்தப்பட்ட பல அமைப்புக்கள் உரிமை கோருகின்றன. அதிலும் எல்லை சம்பந்தமான பல பிரச்சினைகள் காணப்படுகின்றன. ஆகையால் அந்த அடிப்படையையும் கருத்திற்கொள்ள வேண்டும். நான் நினைக்கின்றேன், இலங்கையிலே வேறு எந்தவொரு பிரதேச செயலகமும் இவ்வாறு இருப்பதற்கான வாய்ப்புகள் இல்லையென்று. குறிப்பாக, இன்று வனவிலங்குத் துறை உரிமை கோருகின்ற பிரதேசத்திலேயுள்ள காணிக்குள்தான் பிரதேச செயலகம், பிரதேச சபை, 10 கிராம அலுவலர் காரியாலங்கள், மருத்துவமனை, அஞ்சல் அலுவலகம், நீர் வழங்கல் சபை போன்ற அரசாங்க நிறுவனங்களின் கட்டிடங்கள் அமைந்திருக்கின்றன. அந்தப் பிரதேசத்திலே முன்னெடுக்கப்படுகின்ற அபிவிருத்திச் செயற்பாடுகளிலே குறித்த விடயம் பெரிதும் தாக்கம் செலுத்துகின்ற காரணத்தினால், அரசின் அங்கம் என்ற வகையிலே இந்த விடயத்திற்கான ஒரு தீர்வைக் காண குறித்த அமைச்சு முன்வர வேண்டும்.

மேலும், இந்த விடயம் சம்பந்தமாக பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டம், மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலே பேசப்பட்டிருக்கின்றது என்று நான் நினைக்கின்றேன். ஆகையால், இதற்கான ஒரு தீர்வை வழங்க வேண்டிய பொறுப்பு அரசுக்கு உள்ளது. ஏனென்றால் வெருகல் பிரதேசமானது பல பிரச்சினைகளுக்கு முகங் கொடுத்த ஒரு பகுதியாகக் காணப்படுகின்றது. குறிப்பாக, யுத்தத்தினால் கூடுதலான அழிவுகளை எதிர்நோக்கிய அந்தப் பிரதேசம் வெள்ளப்பெருக்கு போன்ற இயற்கை அனர்த்தங் களினாலும் கூடுதலான பாதிப்புகளை எதிர்கொண்டதாகக் காணப்படுகின்றது. ஆகையால், வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் உரிமை கோருகின்ற இந்தக் காணி விடயத்திற்கான ஒரு தீர்வை நாங்கள் எட்டாவிடின், அது வெருகல் பிரதேசத்திலே இனிமேல் எவராலும் மேற்கொள்ளப் படுகின்ற அபிவிருத்தி விடயங்களுக்குத் தடையாக அமையக் கூடிய வாய்ப்புகள் காணப்படுகின்றன.

அரசாங்கம் சார்பாகப் பல ஒதுக்கீடுகள் வழங்கப் பட்டாலும், இவ்வாறான பிரச்சினைகள் இருக்கின்றபோது அந்த ஒதுக்கீடுகளை அந்தப் பிரதேச செயலகத்தினால் சரியாகப் பயன்படுத்த முடியாத சூழல் ஏற்படும். பிரதேச செயலாளர், அதேபோன்று பிரதேச சபையினுடைய தவிசாளர் மற்றும் உறுப்பினர்களால் மேற்கொள்ளப்படுகின்ற பல அபிவிருத்தி விடயங்கள்கூட தடைப்பட்டுக் கொண்டிருக் கின்றன. பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலே எடுக்கப்படுகின்ற பல தீர்மானங்களைக்கூட அந்தப் பிரதேசத்திலே அமுல்படுத்த முடியாத ஒரு சூழல் காணப்படுகின்றது.

ஆகையால், எங்களுடைய மாவட்டத்தில் உள்ள இந்த வெருகல் பிரதேசம் சம்பந்தமாக குகதாசன் ஐயாவினால் கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணை யானது உண்மையிலேயே பாராட்டுக்குரியதொன்றாக இருக்கின்றது. இந்த முன்மொழிவானது அந்தப் பிரதேசத் திலிருக்கின்ற மக்களுக்குச் செய்கின்ற ஒரு நல்ல விடயமாக இருக்கப்போகின்றது. இந்தப் பிரதேசத்திற்கு இழைக்கப்பட்ட அநீதியை, அங்கு ஏற்பட்டிருக்கின்ற விளைவுகளை யாரும் ஏற்றுக்கொள்ள மாட்டார்கள் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. இதை யாரும் எதிர்க்காமல் ஏற்றுக் கொள்வார்கள் என்று நான் நினைக்கிறேன். ஆகையால் இந்த அரசாங்கம், இந்த விடயத்திலே கரிசனையோடு செயற்பட்டு, இதற்கான ஒரு தீர்வை வழங்குவதற்கு முன்வர வேண்டும் என்று கேட்டுக் கொள்வதோடு, கௌரவ குகதாசன் ஐயாவினால் இன்று கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்பு வேளைப் பிரேரணையை நான் மீண்டும் ஒருமுறை வழிமொழிகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.40]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා සභාව කල් තැබීමේ යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙන්නේ, වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉඩම් හා සම්බන්ධ ගැටලුවක් ගැනයි. වෙරුගල් ප්‍රාදේශීය ලේකම්

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

කොට්ඨාසය -එතුමා ඔය කියන ප්‍රදේශය- අයත් වන්නේ සේරුවිල අලෙයි කියන අභය භූමි ප්‍රදේශයටයි. ඒ අභය භූමිය 1970.10.09වැනි දින ගැසට් කරලා ප්‍රකාශයට පත් කරන ලද්දක්.

අභය භූමියක් ගැසට් කළාම, එය ගැසට් කරන අවස්ථාවේ ඒ ඉඩම්වල අයිතිය ඒ ප්‍රදේශයේ හිටපු ජනතාවට ඒ ආකාරයෙන්ම භුක්ති විඳීම සඳහා, පරිහරණය කිරීම සඳහා අයිතියක් තිබෙනවා. අභය භූමියක් නම් කරපු පළියටම එහි ජනතාව එළියට දමන්නේ නැහැ. මේක 1970දී සිදු වෙච්ච ක්‍රියාවලියක්. උදාහරණයක් හැටියට ගත්තොත්, අප ඉන්න මේ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලත්, ඒ වාගේම මේ වටේ තිබෙන ප්‍රදේශයත් ශ්‍රී ජයවර්ධනපුර අභය භූමියට අයිති කොටසක්. ඇත්තටම ගත්තොත්, මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට තම ඉඩම් පරිහරණය පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. මොකද, ඒ අයට සින්නක්කර ඔප්පු තිබෙනවා. තමන්ට අවශ්‍ය කරන ආකාරයේ ඉදි කිරීම් ආදි කටයුතු සිදු කරන්න පුළුවන්.

අභය භූමියක සින්නක්කර ඔප්පුවකින් ඉඩම් අයිතිවාසිකමක් නැති, එහෙත් රජයේ ඉඩම්වල යම් යම් ඉදිකිරීම් කර ගන්න කොට අවසර ලබා ගැනීමේදී යම් ගැටලු ප්‍රමාණයක් නිර්මාණය වෙනවා. අපිත් ඒක පිළිගන්නවා.

ගරු කුගදාසන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු, වෙරුගල් ප්‍රදේශයේ තිබෙන ගැටලුව එතැනට විතරක් සීමා වූවක් නොවෙයි. උතුර, නැඟෙනහිර ප්‍රදේශවලත්, අනෙකුත් ප්‍රදේශවලත් -පොළොන්නරුව, අනුරාධපුර ආදි දිස්ත්‍රික්කවලත්- ඒ ආකාරයේ ගැටලු විශාල ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබෙනවා, විශේෂයෙන්ම අභය භූමි සහ රක්ෂිත හැටියට නම් කිරීමේදී. විශේෂයෙන්ම උතුර සහ නැඟෙනහිර තිබෙන සමහර ප්‍රදේශ රක්ෂිත හැටියට නම් කරන කොට විශාල ගැටලු ප්‍රමාණයක් නිර්මාණ වෙලා තිබුණා. 2023 තිරසාර වනාන්තර කළමනාකරණය යටතේ Cabinet approval එකක් අනුව කමිටුවක් නම් කරලා ඒ අසාධාරණයට ලක් වෙච්ච අයගේ ඉඩම් නිදහස් කරන්න, ඒ වාගේම ඒ රක්ෂිත degazette කරන්න අවශ්‍ය කරන ප්‍රතිපාදන ලබා දුන්නා. ඒක ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. නමුත් අපි දන්නවා, ඒ වාර්තා ඉදිරිපත් කරලා නිම වෙනකොට ඒ ප්‍රදේශයේ ඒ ගැටලුව හරියාකාරව නිරාකරණය වෙලා තිබුණේ නැති බව. අපිත් ඒක පිළිගන්නවා. ඒ නිසා අපේ රජය බලයට පත් වුණාට පසුව අපේ කැබිනට් මණ්ඩලය විසින් 2025.08.25වැනි දා තිරසාර වනාන්තර කළමනාකරණය යටතේ Cabinet approved කමිටුවක් නම් කරනු ලැබුවා. මාස හයක් ඇතුළත ඒ අදාළ කටයුත්ත ඉෂ්ට කරලා නිර්දේශ ලබා දෙන්න කියන ඉල්ලීමත් එක්ක ඒ කාර්යය ඒ කමිටුවට පැවරුවා. මේ වන කොට ඒ කමිටුව ඒ ප්‍රදේශවල දිස්ත්‍රික් ලේකම්තුමා එක්ක සම්බන්ධ වෙමින්, සාකච්ඡා කරමින් අදාළ කටයුතු කරමින් ඉන්නවා. ඒ භූමිවල මායිම - boundary එක - හරියට ලකුණු කරලා, ඒ ඉඩම් භුක්ති විඳපු, එහෙම නැත්නම් ඒ ඉඩම් අයිතිය තිබෙන අයට, ඔප්පු තිබෙන ඉඩම් ටික නිදහස් කරලා, ඒ රක්ෂිතය, එහෙම නැත්නම් ඒ ප්‍රදේශය කොහොමද degazette කරන්නේ කියන එක ගැන සාකච්ඡා කරමින් පවතිනවා.

ගරු කුගදාසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පමණක් නොවෙයි, මුළු ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයටම මේ ගැටලුව තිබෙනවා. ගැසට් කරන ලද විවිධාකාරයේ රක්ෂිතවලට, වනාන්තරවලට අදාළව මේ ගැටලුව තිබෙනවා. මේ ගැටලුව ගැන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් සාකච්ඡා කෙරෙනවා. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් හැටියට එය degazette කිරීමේ ක්‍රියාවලිය ඉස්සරහට යනවා. අයිතිය තහවුරු කර ගන්න පුළුවන්, දීර්ඝ කාලයක් බුක්ති විඳපු ඒ ඉඩම් එම කමිටුවේ නිර්දේශ මත ඒ ආකාරයෙන්ම නිදහස් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම කියන්න ඕනෑ, ඔබතුමා විසින් මතු කරන ලද වෙරුගල් ප්‍රදේශයේ තිබෙන සේරුවිල අලෙයි අභය භූමියේ දැනට භුක්ති විඳිමින් සිටින, දීර්ඝ කාලයක් තිස්සේ භුක්ති විඳිමින් සිටින, ඉඩම් අයිතිය තිබෙන ගොවීන්, මහ ජනතාව ආදි කිසිවෙකුට හෝ රජයේ කාර්යාල, පූජනීය ස්ථාන, පාසල් ආදි කිසිම දෙයකට හෝ කිසිම අගතියක් සිදු වෙන්නේ නැති බව. ඒ වාගේම, අන්තර් අමාත්‍යාංශ කමිටුවේ සහ දිස්ත්‍රික් ලේකම්තුමාගේ කමිටුවේ නිර්දේශ මත ඉදිරියේදී එම ඉඩම්, 1970 සිටම භුක්ති විඳපු ආකාරයටම ඒ අදාළ ප්‍රදේශයේ ගොවීන්ට, ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට නිදහස් කිරීම සඳහා අපි මේ වන කොටත් කටයුතු කරමින් සිටින බවත් දැනුම් දීමට කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ගරු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමාට දුන්නු මිනිත්තු 2ක කාලය එතුමා සම්පූර්ණයෙන්ම පාවිච්චි කළේ නැහැ කියලායි මා හිතන්නේ. ඒ මිනිත්තු 2ක කාලය මට නැවත ලබා දෙන්න පුළුවන්. මම ගරු කුගදාසන් මන්ත්‍රීතුමාට මිනිත්තු 2ක කාලයක් දුන්නා. එතුමා ඒකෙන් ටිකයි පාවිච්චි කළේ.

**රු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබුණා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට මිනිත්තු 4ක කාලයක් තිබුණා. ඒකෙන් මිනිත්තු 2ක් දුන්නා. එතුමා එය සම්පූර්ණයෙන්ම පාවිච්චි කළේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.47]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින කල් තැබීමේ යෝජනාවෙන් කථා කරන්නේ වැදගත් දෙයක්. ඒ ගැන කියන්න ඉස්සෙල්ලා මට මිනිත්තු භාගයක් ගන්න වෙනවා විශේෂ කාරණයක් ගැන කියන්න. මම ඇතුළු මන්ත්‍රීවරු අද උදේ

පාර්ලිමේන්තුවට ආවාම buttonhole කරලා badge එකක් ගැහුවා, "16 Days of Activism against Gender-Based Violence" කියන වැඩසටහනට අදාළව. ඒ වෙලාවේ මන්ත්‍රීවරුන් වට කරගෙන සිටියේ පාර්ලිමේන්තුවේ සේවිකාවන් විතරයි. මම ඒත් කල්පනා කළා ඇයි ඒ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගෙනුත් එක්කයි මම ඒ ප්‍රශ්නය අහන්නේ. මේ කියන gender-based violence ගත්තාම, සියයට 35ක් පිරිමින්ට විරුද්ධවත් සිදු වෙනවා; අපට විරුද්ධවත් හිංසනයන් සිදු වෙනවා. මොකද, fake identities create කරලා, online මුදා හැරීම ස්ත්‍රීන්ට පමණක් සීමා වුණු ගැටලුවක් නොවෙයි. අප සියලුදෙනාටම වගකීමක් තිබෙනවා, ඒ පිළිබඳව දැනුවත් වීමට. Thank you.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கௌரவ குகதாசன் ஐயா அவர்களால் கொண்டுவரப்பட்ட பிரேரணையானது வட, கிழக்கைப் பொறுத்தவரையில் தமிழ் பேசும் தமிழ், முஸ்லிம் மக்களுக்கு உண்மையில் முக்கியமான விடயம். கிழக்கில் வாழும் தமிழ் பேசும் தமிழ், முஸ்லிம் மக்களின் நிலங்களைக் கையகப்படுத்தி, அங்கிருக்கின்ற தமிழ் பேசும் மக்களுடைய விகிதாசாரத்தைக் குறைப்பதற்கு, பேரினவாதத்தை முன்வைத்துச் செயற்பட்ட முன்னைய அரசாங்கத்தினர் மூன்று திணைக்களங்களைப் பாவித்தார்கள். அவை: வனவிலங்குகள் பாதுகாப்புத் திணைக்களம், கரையோரப் பாதுகாப்புத் திணைக்களம், தொல்பொருளியல் திணைக்களம். இந்தத் திணைக்களங்களைப் பாவித்துத்தான் தமிழ் பேசும் தமிழ், முஸ்லிம் மக்களின் நிலங்களைக் கிழக்கு மாகாணத்தில் கையகப்படுத்தினார்கள். ஆனால், இந்த அரசாங்கம் அவ்வாறான செயற்பாட்டைச் செய்யாதென நாங்கள் மிகவும் நம்புகின்றோம். ஏனென்றால், இந்த அரசாங்கம் பேரினவாத சக்திகளின் கைப்பொம்மையாகாமல், அவர்களுடைய அழுத்தத்துக்குள் மாட்டிக்கொள்ளாமல், சுதந்திரமாக, நியாயமாகச் செயற்படுமென்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

தற்போது கிழக்கு மாகாணத்தின் திருகோணமலை மாவட்டத்தில் வெருகல் செயலகப் பிரிவில் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் ஏற்படுத்தும் பிரச்சினைகளைப் போல் அந்த மாவட்டத்தில் இன்னும் நிறையப் பிரச்சினைகள் இருக்கின்றன. உதாரணமாக, வாழைமடு, பனிச்சங்குளம் பிரதேசத்தில் உள்ள பல வயல் நிலங்கள் மேட்டு நிலங்களாக மாற்றப்பட்டன. உண்மையாகவே அங்குள்ள மக்கள் நீண்டகாலமாக ஆயிரக்கணக்கான ஏக்கர் நிலங்களில் வேளாண்மை செய்து வந்தார்கள். திடீரென அந்த வயல் நிலங்களை மேட்டு நிலமாக மாற்றி, அந்த நிலங்களைப் பறிப்பதற்கு முயற்சி எடுக்கப்பட்டது. அங்கிருக்கின்ற ஆடு, மாடுகளின் உணவுக்காக மேட்டு நிலங்களும் வழங்கப்பட வேண்டும். அதேநேரம், நாங்கள் வயல் நிலங்களையும் காப்பாற்றிக்கொள்ள வேண்டும்.

මට පෙර කථා කරපු ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා ඒ පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධව විශේෂ කාරණාවක් කිව්වා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. උතුරු, නැඟෙනහිර පළාත්වල තිබෙන මේ ඉඩම් ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවාය කියලා එතුමා කිව්වා. අපි ඒ ගැන බොහොම උනන්දුවෙන් ඉන්නවා. ඒ කමිටුවට අපේ සහයෝගය වාගේම අපේ අදහස් ලබා දෙන්න ක්‍රමවේදයක් තිබෙනවා නම් කරුණාකරලා අපට ඒ ගැන කියන්න. ඒ වාගේම ඒ කමිටුවේ නිර්දේශ පිළිබඳව අපව දැනුවත් කරන්න. මොකද, උතුරු, නැඟෙනහිර පළාතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් අභය භූමි සම්බන්ධයෙන් හුදෙක් objectively, ඒ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා අපේ සම්පූර්ණ සහයෝගය අපි ලබා දෙනවා.

නමුත් ඒ අරමුණු මුවාවෙන් ජනතාවගේ කුඹුරු ඉඩම්, ජනතාව වෙසෙන ඉඩම් නැවත ලබා ගැනීමට කිසිවක් නොකළ යුතුයි. ඒ නිසා කමිටුවක් තිබෙනවා නම්, මේ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ ඉන්න උතුරු, නැඟෙනහිර දෙමළ කථා කරන මන්ත්‍රීවරුන්ටත් ඒ සඳහා සහභාගී වීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 6.57]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது திருகோணமலை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ குகதாசன் ஐயா அவர்கள் மிகவும் முக்கியமான விடயத்தை சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையாக முன்வைத்திருக்கின்றார். கடந்த பல வருடங்களாக நாங்களும் இந்த விடயம் தொடர்பாக அணுகுமுறைகளை மேற்கொண்டு வருகின்றோம். ஆனால், நீண்டகாலம் தீர்க்கப்படாத இந்தப் பிரச்சினைக்கு ஒரு தீர்வை எமது அரசாங்க காலப்பகுதியில் முன்வைக்கவிருப்பது தொடர்பில் நாங்கள் மிகுந்த மகிழ்ச்சியடைகின்றோம். கௌரவ சுற்றாடல் பிரதி அமைச்சர் அன்ரன் ஜயக்கொடி அவர்கள் இந்த விடயம் பற்றி மிகவும் தெளிவாக விளக்கியிருந்தார். அதாவது, 1970ஆம் ஆண்டு காலப்பகுதியில்தான் இந்த விடயங்கள் வர்த்தமானிமூலம் அறிவிக்கப்பட்டது. அது மாத்திரமல்ல, வர்த்தமானிமூலம் அறிவிக்கப்படாது, ‘முன்மொழியப்பட்ட வனாந்தரம்’ - proposed forest - என்ற பெயரில்கூட பல காணிகள் கடந்த காலங்களில் கையகப்படுத்தப்பட்டன. அந்த அடிப்படையில், நாங்கள் இந்தப் பிரச்சினையை நிரந்தரமாகத் தீர்ப்பதற்குக் கடமைப்பட்டிருக்கின்றோம்.

2024ஆம் ஆண்டு இந்த விடயம் தொடர்பாக ஒரு குழு நியமிக்கப்பட்டு, அந்தக் குழுவிடமிருந்து அறிக்கை பெறப்பட்டுமிருந்தது. அந்த அறிக்கையின் பிரகாரம், திருகோணமலை மாவட்டத்தில் வெருகல் மாத்திரமல்ல, அங்கிருக்கின்ற 11 பிரதேச செயலாளர் பிரிவுகளிலும் இந்தப் பிரச்சினை மிகவும் உக்கிரமாகக் காணப்பட்டது என்ற விடயம் தெட்டத் தெளிவாகின்றது. அதாவது பதவிசிறிபுர, குச்சவெளி, கோமரங்கடவல, மொரவெவ, கிண்ணியா, திருகோணமலை பட்டினமும் சூழலும், மூதூர், தம்பலகாமம், சேருவில, கந்தளாய், வெருகல் ஆகிய 11 பிரதேச செயலாளர் பிரிவுகளிலும் இந்தப் பிரச்சினை மிகவும் பாரதூரமாகக் காணப்பட்டிருப்பதாக அறிக்கை வெளியாகியிருக்கின்றது.

அவ்வாறு அறிக்கை வெளியிடப்பட்டிருந்தபோதும், கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் சரியான வகையில் இது தொடர்பில் தீர்க்கமான முடிவை எடுக்காததன் காரணமாக, நாங்கள் மீண்டும் 2025ஆம் ஆண்டு ஓகஸ்ட் மாதம் 25ஆம் திகதிய 25/1560/826/020ஆம் இலக்க அமைச்சரவைப்

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

பத்திரத்தினூடாக, பல்வேறு துறைசார்ந்தவர்களை உள்வாங்கி ஒரு துணைக் குழுவை நியத்திருக்கின்றோம். அதாவது, வனப் பரிபாலனத் திணைக்களம், வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் தொல்பொருளில் திணைக்களம் மற்றும் யாழ்ப்பாணம், முல்லைத்தீவு, கிளிநொச்சி, மட்டக்களப்பு, மன்னார், திருகோணமலை, வவுனியா ஆகிய மாவட்டங் களைப் பிரதிநிதித்துவப்படுத்தும் மாவட்டச் செயலாளர்கள், வடக்கு, கிழக்கு மாகாண காணிப் பணிப்பாளர்கள், மாவட்டச் செயலகத்தின்கீழ் வருகின்ற காணிப் பிரிவின் உத்தியோகத் தர்கள், குறிப்பாக மாகாவலித் திணைக்களம், கரையோரப் பாதுகாப்புத் திணைக்களம் ஆகியவற்றின் கீழிருக்கின்ற காணி சம்பந்தப்பட்ட விடயங்கள் தொடர்பாகத் தீர்மானங்களை எடுக்கக்கூடிய அதிகாரிகள், நிறுவனங்களை உள்வாங்கி துணைக் குழுவை உருவாக்கியிருந்தோம். அந்தக் குழுவானது எதிர்வரும் 6 மாத காலப் பகுதியினுள் இந்த விடயம் தொடர்பாக நிரந்தரமான ஒரு தீர்வு சம்பந்தமான அறிக்கை யினைச் சமர்ப்பிக்கவிருக்கின்றது. அந்த அறிக்கையின் மூலமாக இந்த மக்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைக்கு நிச்சயமாக ஒரு நிரந்தரமான தீர்வினை எங்களால் முன்வைக்கமுடியுமென்று நம்புகின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, your time is over.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
Okay, Madam. මට තව පොඩි වේලාවක් දෙන්න.

அதுமாத்திரமல்ல, எங்களுடைய மாவட்ட ஒருங் கிணைப்புக் குழுவிலுள்ள எமது மாவட்டத்தின் 4 பாராளுமன்ற உறுப்பினர்கள் தற்பொழுது இந்த உயரிய சபையிலே இருக்கின்றோம். கௌரவ குகதாசன் ஐயா இருக்கின்றார், கௌரவ இம்ரான் மஹ்ரூப் அவர்கள் இருக்கின்றார், கௌரவ றொஷான் அக்மீமன அவர்கள் இருக்கின்றார், நான் இருக்கின்றேன். நாங்கள் அனைவரும் இந்த விடயம் தொடர்பாக எமது மாவட்ட ஒருங்கிணைப்புக் குழு உள்ளிட்ட பல்வேறுதரப்பட்ட அமைப்புகள் ஊடாகத் தீர்வு யோசனைகளை முன்வைத்துக் கொண்டிருக்கின்றோம். அதுமாத்திரமல்ல, எமது ஆட்சிக் காலத்தில் புதிதாக ஓர் அங்குல நிலம்கூட அரசாங்கத்தினால் கையகப்படுத்தப் படவில்லை; மாறாக, திருகோணமலை மாவட்டத்தில் குச்சவெளி, மூதூர் போன்ற பிரதேசங்களில் காணிகளை விடுவிப்பதற்கு நாங்கள் ஆரம்பித்திருக்கின்றோம் என்பதையும் சந்தோஷமாகக் கூறிக்கொள்ளக் கடமைப்பட்டிருக்கின்றோம். குறிப்பாக வனப் பாதுகாப்புத் திணைக்களம், வன சீவராசிகள் பாதுகாப்புத் திணைக்களங்களிலிருந்து காணிகளை விடுவித்து மக்களுக்கு வழங்குவதற்கான ஆரம்பகட்ட வேலைகளை நாங்கள் முடித்திருக்கின்றோம். ஆகவே, இந்த வேளையில் நாங்கள் அனைவரும் வழமைபோன்று ஒன்றுபட்டுச் செயற்படுவோம் என்று கூறிக்கொண்டு, விடைபெறு கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Thurairasa Ravikaran. You have three minutes.

[பி.ப. 6.56]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை, வெருகல் பிரதேசத்தில் வனசீவராசிகள் திணைக்களத்தின் நில அபகரிப்பு நிலைமைகள் தொடர்பாக கௌரவ சண்முகம் குகதாசன் அவர்களால் கொண்டுவரப்பட்ட ஒத்திவைப்பு வேளைப் பிரேரணையை நான் வரவேற்கின்றேன். இப்பொழுது, கௌரவ பிரதி அமைச்சர் அவர்களும் ஏனைய உறுப்பினர்களும் பலவாறாகத் தங்களுடைய கருத்துகளைச் சொல்லியிருந்தாலும், வன்னித் தேர்தல் மாவட்டத்தில் நாங்கள் இந்தத் திணைக்களத்தால் மிக மோசமாகப் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றோம் என்ற அடிப்படையில், நானும் சில கருத்துகளைச் சொல்லலாமென நினைக்கின்றேன்.

வெருகல் பிரதேச செயலாளர் பிரிவில் 10 கிராம அலுவலர் பிரிவுகள் உள்ளன. அவற்றின் மொத்த நிலப்பரப்பு 32,041.66 ஏக்கர் ஆகும். இவற்றில் 25,242.13 ஏக்கர் காணி தமது காணியென வனசீவராசிகள் திணைக்களத்தினர் 1970.10.09ஆம் திகதிய அல்லை அபயபூமி வர்த்தமானி மூலமும் 424/24ஆம் இலக்க, 1986.10.24ஆம் திகதிய திரிகோணமடு வர்த்தமானி மூலமும் உரிமை கோருகின்றனர். மேலும், வன இலாகா 13,906 ஏக்கர் காணிகளை உரிமை கோருவதாக அறிகின்றேன். அப்படியானால், இரு பகுதியினரதும் மொத்த அபகரிப்பு 39,148 ஏக்கர் ஆகும். வெருகலில் இருக்கும் மொத்த காணியோ 32,041.66 ஏக்கர்! அப்படியாயின், அப்பகுதியில் இல்லாத 7,106 ஏக்கர் காணிக்கும் இந்தத் திணைக்களத்தினர் உரிமை கோருகின்றனர். இதுதான் Google வரைபடத்தின் மூலம் காணி பிடிக்கும் இத்திணைக்களத்தின் செயற்பாடு! இது உங்களுக்குப் பிழையாக அல்லது கேவலமாகத் தெரிய வில்லையா? இவர்கள் தகுதியான அதிகாரிகளா? என்பதை நீங்கள்தான் சொல்ல வேண்டும். இது உங்களுடைய ஆட்சியில் அல்ல, முன்னர்தான் நடந்தது. இருந்தாலும், இதை நாங்கள் சுட்டிக்காட்ட வேண்டிய கட்டாயத்தில் இருக்கின்றோம். இந்தப் பிரதேசத்தில் 4,809 குடும்பங்கள் இருப்பதுடன், 16,156 பேர் வாழ்கின்றார்கள். எல்லோரும் குறிப்பிட்ட மாதிரி, பாடசாலைகள், இந்து ஆலயங்கள், கிறிஸ்தவ தேவாலயங்கள், கிராம அலுவலகங்கள், வைத்தியசாலைகள், தபால் நிலையங்கள், விளையாட்டு மைதானங்கள் உள்ளடங்களாக இந்த வெருகல் பிரதேசத்துக் குரிய காணிகளை இந்த இரண்டு திணைக்களங்களும் அபகரித்து வைத்திருக்கின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please wind up, Hon. Member.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Give me one more minute, please.

குறிப்பாக, முல்லைத்தீவு மாவட்டத்தில் வவுனிக்குளம் சரணாலயம், நந்திக்கடல் இயற்கைக் காப்பகம், நாயாறு இயற்றைக் காப்பகம், கொக்கிளாய் சரணாலயம் என்ற அடையாளங்களுடன் பாரியளவிலான நில ஆக்கிரமிப்பை வனசீவராசிகள் திணைக்களம் மேற்கொண்டுள்ளது. கரியல்வயல், சுண்டிக்குளம் பகுதியிலுள்ள தமிழர்களது பூர்வீக

விவசாய நிலங்கள், சுண்டிக்குளம் தேசிய பூங்காவாகப் பிரகடனப்படுத்தப்பட்டு, 131 விவசாயிகளுக்கு எதிராகவும் வழக்குத் தொடரப்பட்டுள்ளது. அண்மையில், மன்னார் சிலாவத்துறை கடற்பரப்பையும் வனசீவராசிகள் திணைக்களம் கடல்சார் பாதுகாக்கப்பட்ட பிரதேசத்துக்கெனக் கோரியிருக்கிறது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் காணிகளை அபகரிக்க மாட்டீர்கள் என்ற எண்ணம் எங்களுக்கு இருக்கின்றது. தயவுசெய்து, வடக்கு, கிழக்குப் பகுதிகளில் அபகரிக்கப்பட்டுள்ள இந்த மக்களுடைய காணிகளை உங்களுடைய அரசாங்கம் விடுவிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු දම්මික පටබැඳි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 7.00]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඒ ජනතාව මුහුණ දෙන මේ ගැටලුව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවක් ලබා ගැනීම සම්බන්ධව. ඔබතුමා ඉදිරිපත් කරපු ඒ ගැටලුසහගත තත්ත්වය සම්බන්ධයෙන් පරිසර නියෝජ්‍ය ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමති අරුන් හේමචන්ද්‍ර මැතිතුමාත් කිසියම් දුරකට කරුණු පැහැදිලි කළා. ඊට තවත් කරුණු කිහිපයක් එකතු කරමින් තවදුරටත් ඒ ගැන පැහැදිලි කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, අභය භූමියක් කියලා ප්‍රකාශයට පත් කළාට පස්සේ, ඒ අභය භූමිය තුළ තිබෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් විතරක් නොවෙයි. අභය භූමියක් තුළ පෞද්ගලික ඉඩම්, රජයේ විවිධ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම්, විවිධාකාරයේ අයිතීන් තිබෙන ඉඩම් තිබෙන්න පුළුවන්. අභය භූමියක් වූ පළියට ඒ ඉඩම්වල හිමිකාරිත්වය වෙනස් වෙන්නේ නැහැ. නමුත්, අභය භූමිය කියන එක කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. ඒ නිසා අභය භූමියක් තුළ කිසියම් සංවර්ධන කටයුත්තක් කෙරෙනවා නම්, තිබෙන තත්ත්වය කිසියම් දුරකට වෙනස් කරනවා නම් ඒ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ලබාගෙන කළ යුතුයි කියන එකඟතාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරපු වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේරුවිල අලෙයි අභය භූමිය තුළත් ඒ අනුව තමයි කටයුතු කෙරෙන්නේ. මේ ඉඩම, අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ, 1970 ඔක්තෝබර් මස 09වැනිදා. එදා ඉඳලා මෙය අභය භූමියක් හැටියට ක්‍රියාත්මක වෙනවා. ඒ තුළ පෞද්ගලික ඉඩම් තිබෙනවා, රජයේ ඉඩම් තිබෙනවා, විවිධ දෙපාර්තමේන්තුවලට අයිති ඉඩම් තිබෙනවා. කවුරුහරි කිසියම් සංවර්ධන කටයුත්තක් හෝ ඒවායේ පවතින තත්ත්වයේ වෙනසක් කරනවා නම්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ගත යුතුව තිබෙනවා.

මේ ඉඩම් සම්බන්ධයෙන් ගැටලු පවතිනවා කියලා ඔබතුමන්ලා පැවසුවා. ඒ වාගේම මේ ප්‍රදේශය තුළ ග්‍රාම නිලධාරි කාර්යාල 10ක්, රෝහලක්, තැපැල් කාර්යාලයක්, ජල සම්පාදන මණ්ඩලය වාගේ එදිනෙදා කටයුතු සිදුවෙන රාජ්‍ය ආයතන තිබෙනවා කියලා කිව්වා. අභය භූමියක් තුළ එහෙම ආයතන තිබෙන්න පුළුවන්. මේක, 1970දී අභය භූමියක් හැටියට ප්‍රකාශයට පත් වෙච්ච ඉඩමක්. ඒ අභය භූමිය තුළ එම අර්ථය වෙනස් වෙන විධියේ භාවිතාවක් දැනට සිදුවෙලා තිබෙනවාද කියන එක ගැන අපට සලකා බලන්න සිදු වෙනවා. ඒ වාගේම ඉඩම් ප්‍රශ්නය ගැනත් අපේ නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කළා. යුද්ධය පැවති ප්‍රදේශවල ඉඩම් ප්‍රශ්නය ඇති වී තිබෙන බවත්, එය තවම විසඳිලා නැහැ කියන කාරණයත් අපි තේරුම්ගෙන තිබෙනවා.

ඒ නිසා යුද්ධයෙන් පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, එම ප්‍රදේශ සලකුණු කරද්දී ඒ ප්‍රදේශවලට ගිහිල්ලා, ඒ භූමිය තුළ හිඳිමින් සලකුණු කර ගන්න අවස්ථාව ලැබුණේ නැහැ. එම නිසා GPS ඛණ්ඩාංක මඟින් තමයි මේ සලකුණු කිරීම් සිදු කරලා තිබෙන්නේ. එම නිසා මේක ඇතුළේ කිසියම් අතපසුවීමක් සිදු වෙන්න පුළුවන් කියන එක අපි පිළිගන්නවා. ඒ නිසාම පසුගිය ආණ්ඩු කාල තුළ "තිරසර වනාන්තර කළමනාකරණය තුළින් ඉඩම් ගැටලු නිරාකරණය කිරීම" නමින් විශේෂ වැඩසටහනක් හඳුන්වා දී තිබුණා. ඒ තුළින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ගැසට් කරපු, සලකුණු කරපු ඉඩම්වලින් මෙන්න මේ මේ ඉඩම් නිදහස් කළ යුතු යැයි කියලා හඳුනා ගත් ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. නමුත් එම වැඩ පිළිවෙළ යටතේත් මේ ගැටලුව හොඳාකාරව විසඳුනේ නැහැ කියලා අපි දන්නවා. එම නිසා අපේ රජය තේරී පත් වුණාට පසුව අපි ඔබතුමන්ලා සමඟත් සාකච්ඡා කරමින්, 2025 අගෝස්තු මස 25වැනි දා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගත්තා. මේ සම්බන්ධයෙන් තව මොනවා හරි දුක්ගැනවිලි තිබෙනවා නම් ඒවාත් සලකා බලා, තවදුරටත් නිදහස් කළ යුතු යැයි හඳුනා ගතයුතු ඉඩම් තිබෙනවා නම් ඒවා ගැනත් සලකා බැලීම වෙනුවෙන් අපි විශේෂ කමිටුවක් පත් කළා. ඒ කමිටුව 2025.10.15වැනි දා පත් කළා. කමිටුව 2025.10.28වැනි දා රැස්වෙලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරන තීන්දු තීරණ අරගත්තා. ගරු මන්ත්‍රීතුමනි, පරිසර අමාත්‍යාංශයට අමතරව කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඒ වාගේම උතුරු, නැඟෙනහිර පළාත්වලට අයත් දිස්ත්‍රික් ලේකම්වරු කියන මේ සියලුදෙනා එකතු කරගත් කමිටුවක් තමයි රැස් වුණේ. ඔබතුමන්ලා මතු කරපු ඇතැම් ගැටලු පිළිබඳව එම කමිටුව තුළ සාකච්ඡා වෙලා තිබෙනවා. එම නිසා තවදුරටත් මේ ගැටලු සාකච්ඡා කරමින් ඒවාට අවශ්‍ය කරන විසඳුම් ක්‍රියාවලියක තමයි අපි දැන් ඉන්නේ. ඒ වාගේම ජාතික මට්ටමේ එම කමිටුවට අමතරව, එම කමිටුව තුළින් එක් එක් දිස්ත්‍රික්කයට අදාළ අනුකමිටු පිහිටුවන්නත් අපි අනුමැතිය දීලා තිබෙනවා, තීරණය කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩලයේ තීන්දුව තුළම ඒ තීරණය තිබෙනවා. එම නිසා දිස්ත්‍රික් මට්ටමිනුත් මේ සඳහා කමිටු කැඳවෙනවා. අන්න ඒ කමිටුවලට ගිහිල්ලා, තිබෙන ගැටලු මොනවාද, ඔබතුමන්ලාගේ පැත්තෙන් ඒවා සාධාරණයි කියලා කියන්නේ ඇයි කියන කරුණු ටික ඉදිරිපත් කරන්න ඔබතුමන්ලාට පුළුවන්.

එහෙම වුණොත්, ඒ ගැටලු හඳුනා ගෙන මේ කමිටුවල තීන්දුව ඇතුළේ එම ප්‍රශ්නවලට විසඳුම් සොයන්න අපට පුළුවන්. අපේ රජය යටතේ මේ ගැටලු විසඳා ගැනීම සඳහා අපි ඔබතුමන්ලාට පුළුල් ඉඩකඩක් ඇති කරලා තිබෙනවා. අපි මේ රජය යටතේ කිසිවිටකත් ජාතිවාදී පදනමින් -සිංහල ජාතිවාදී හෝ මුස්ලිම් ජාතිවාදී හෝ දෙමළ ජාතිවාදී පදනමකින්- මේ ප්‍රශ්න දිහා බලන්නේ නැහැ. අපට ඕනෑ වන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් කවුරුත් මේ රටේ සමගියෙන් ජීවත් වෙන වටපිටාවක් ඇති කර ගන්න. ඒ වාගේම අපි කිසිදු ආගමකට එරෙහිව කටයුතු කරන්නේ

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

නැහැ. සියලු ලබ්ධිකයන් සමානව, සහයෝගයෙන් ජීවත් වන රටක් ගොඩ නඟන්න අපට අවශ්‍යයි. සිංහල, දෙමළ, මුස්ලිම් අපි කවුරුත් එකතු වෙලා; හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම්, බෞද්ධ මේ කවුරුත් එකතු වෙලා, මේ රට ගොඩ නැඟීම තමයි අපේ වුවමනාව වන්නේ. අන්න ඒ වෙනුවෙන් මේ සියලු ප්‍රශ්න සමඟිව විසඳා ගන්න අවශ්‍ය කරන ඉඩකඩ අපි ඕනෑ වෙලාවක විවෘත කරන්න සූදානම් කියන පැහැදිලි කිරීම මම කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගැටලුවක් තිබෙනවා නම් අහන්න පුළුවන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු ඇමතිතුමනි, නම ඇතුළත් වෙනවාද? ඔබතුමා කියන කාරණාව අනුව කැබිනට් මණ්ඩල තීන්දුවට මඩකලපුව, ත්‍රිකුණාමලය කියන දිස්ත්‍රික්ක ඔක්කොම, -

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

අයිති වෙනවා. උතුරු, නැඟෙනහිර පළාත් දෙකේම දිස්ත්‍රික්ක ටික අයිති වෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 7.08ට, 2025 නොවැම්බර් 13වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 25වන අඟහරුවාදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 7.08க்கு, பாராளுமன்றம் அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 25, செவ்வாய்க்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m.,THE HON.PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 7.08 p.m. until 9.00 a.m. on Tuesday, 25th November,2025, pursuant to the Resolution of Parliament of 13th November,2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.